පාළි - සිංහල

පිරිත් පොත

සම්පාදක

කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර

නායක ස්ථවිර

1954

පාළි – සිංහල

පිරිත් පොත

විද්‍යාලඞ්කාර පරිවේණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍යපාඩ්‍යාය

කිරිවත්තුඩුවේ ධම්මකීර්ති ශ්‍රී ප්‍රඥාසාර

ප්‍රධාන සඞ්ඝනායක සථවිරපාදයන් වහන්සේ විසින්

සම්පාදිතයි.

ආචාර්‍ය ඔව්විගමුවේ සිරි ධම්මකඛණ්ඩ

සථවිරපාදයන් වහන්සේගේ

ප්‍රඥාවනා සහිතයි.

කොටුවේ පුස්පදන සමිතියේ

පී. ජේ. පෙරේරා, කේ. ඩී. ඩේවිඩ්

මහතුන් විසින්

සමාරාධිතයි.

කැලණියේ

විද්‍යාලඞ්කාර යන්ත්‍රාලයෙහි

මුද්‍රිතයි.

2496

1954

4 - 50

පටුන

		පිටුව
සරණගමනය – සිංහලානුවාදය හා දහම් විසතර		I — 4
දස සික්ඛාපද	,,	4 — 7
සාමණෙර පඤ්හ	,,	7 — 13
ඛතතිංසාකාර	,,	14 — 16
පවවෙක්ඛණා	,,	17 — 19
දසධම්ම සුත්ත	,,	19 — 24
මහා මඞ්ගල	,,	24 — 29
රතන	,,	29 — 46
කරණීය මෙත්ත	,,	46 — 58
ඛන්ධ පරිත්ත	,,	58 — 62
මෙත්තානිසංස	,,	62 — 69
මිත්තානිසංස	,,	69 — 78
මෝර පරිත්ත	,,	78 — 81
වන්ද පරිත්ත	,,	81 — 83
සුරිය පරිත්ත	,,	83 — 86
ධජඟ්ග පරිත්ත	,,	83 — 96
මහාකස්සපත්තෙරඛෝයිඬ්ඩඔග	,,	94 — 100
මහාමොග්ගල්ලානත්තෙර	,,	100 — 103
මහාචුන්දත්තෙර	,,	103 — 105
ගිරිමානන්ද	,,	105 — 120
ඉසිගිලි	,,	120 — 127
ආටානාටිය	,,	127 — 150
ධම්මචක්කාපපවත්තන	,,	150 — 161
මහාසමය	,,	161 — 183
පරාභව	,,	183 — 191
ආලවක	,,	191 — 211
අඟුලිමාලාරඛාජ	,,	212 — 223
කසීභාරඛාජ	,,	223 — 238
සච්චවිභඞග	,,	238 — 250
උපග්‍රන්ථයෙහි		
බණපිරිත් විධිය		251 — 254
බණ පිරිත් කතිකාවත		255 — 257
ආරාධක වත		257 — 259

පිටුව

ආවාසික වත	259
මහාසඞ්ඝයාගේ වත	260 — 261
උපසථායක වත	261
කාරක සඞ්ඝසභාවේ වත	261 — 262
ලිත කිම	262
විහාර අස්න	262 — 265
දේවාල පත්‍රය ලිම	256
දෙරකඩ අස්න	266 — 268
අනුශාසනාව	268 — 272
වැසි පිරිත	272
ඇණවුම් පිරිත	272 — 273
මහාජිනපඤ්ජරය	273 — 275
අඞ්ගුලිමාල පිරිත	275
ජය පිරිත	275 — 276
හිනි පිරිත	276 — 277
අටවිසි පිරිත	277
ජයමඞ්ගල ගාථා	278 — 279
මහා ජයමඞ්ගල ගාථා	279 — 280
අටවිසි ජ්වර පිරිත	280 — 283
චූළ ජිනපඤ්ජරය	283
රන් දෙණ ගාථා	284
වත් පිරිත	285 — 290
පබ්බජ්ජා පරිවෙජ්දය	290 — 293
හෙරණ සිඛ	293 — 295
දිනචරියාව	295 — 296
බුද්ධානුසමෘති කම්සථානය	296 — 297
මෛත්‍රී කම්සථානය	297
අශුභ කම්සථානය	298
මරණානුසමෘති කම්සථානය	298
අෂ්ටමහාසංවේගවස්තු	298 — 299
සෙඛියා	299 — 305
ශික්ෂාකාමීන්ට අවවාද	305 — 306
සාමණෙර ශික්ෂාසඞ්ග්‍රහය	306 — 307
පූජා ගාථා	307
පළාත්බද පිරිත් වාරිත්‍ර විධි	308 — 311
දෙවියන්ට පින්දීම	312

පාළි - සිංහල පිරිත් පොත

ශ්‍රද්ධා හකනියෙන් ආධාරකළ උපාසිකාවන්ගේ

නාමලේඛනය

			රු:
කොළඹ	ඩී. ඒ. හේවාවිතාරණ	මැනිනිය	500
පැලියගොඩ	එච්. ටී. පීරිස්	,,	400
කිරිබත්ගොඩ	ඩී. ඒ. පී. අබයසේකර වෙද	,,	250
පැලියගොඩ	චන්ද්‍රාවතී මදනායක	,,	250
කොළඹ	ඇන්. ඩී. ඒ. සිල්වා	,,	250
පස්යාල	ඇම්. ඇල්බට් පොන්සේකා	,,	250
කොළඹ	ස්නෙහලතා අමරසිංහ	,,	250
වෙදමුල්ල	ඒ අල්පේනිස් ද සිල්වා වෙද	,,	150
ජාඇල	අසි. උපමල්ලිකා දිසානායක	,,	150
කොළඹ	ඇම්. ඩබ්ලිව්. ඇප් අබයකෝන්	,,	150
සේදවත්ත කොටුවිල	පී. ජේ. පෙරේරා	,,	150
කොළඹ	කේ. ඩී. ඩෙවිඩ්	,,	150
කැලණිය	ඇම් ඩී. සෝමපාල	,,	100
කොළඹ	ප්‍රැන්සස් විට්ටච්චි	,,	100
මත්තුමගල	ඩී. ඇස්. අතුකෝරළ	,,	50
මත්තුමගල	පියසීලි අතුකෝරළ	,,	50
මත්තුමගල	ප්ලෝරන්ස් නිලකරත්න	,,	50
වේවැල්දූව	බියට්‍රිස් මුනසිංහ	,,	50

සංඥාපනය

පරිත්‍රාණය සියලු සඞ්ගයන්ට හිත කර ය. දුක පදනම් කොට ඇති ලෝකයාට සුඛකර ද වේ. ලෝවැස්සන් පිළිබඳව ඇතිවන උවදුරු රැසෙකි. හෙ වකාහි රෝගයන් නිසා ද, යක්ෂ ප්‍රේතාදි භූතයන් නිසා ද, දුර්භික්ෂාදි භය ජනක හේතූන් නිසා ද, තවිත්ගේ උපක්‍රම නිසා ද, ශත්‍රුන්ගේ උපක්‍රමවලින් දැයි මේ ආදි නානා ප්‍රකාර දෙයින් සිදුවෙයි. **පිරිත**

ලෙඩ රෝගාදියක් සැදුණු කල්හි එය සුව කර ගැනීමට බෙහෙත් පිළියම් තිබේ. එමෙන් උවදුරු ඇතිකල්හි ද එය නැති කර ගැනීමට උපාය මාර්ග ද තිබිය යුතු ය. සාමාන්‍ය ලෝකයා එබඳු දේ ගැන යොදන නොයෙක් උපක්‍රම පිළිවෙත් ඇතත් නුවණැති බෞද්ධ ලෝකයාට **පරිත්‍රාණය** හෙවත් පිරිත තරම් උභයාර්ථ සංසිද්ධියට හේතු වූ අන්කිසි උපාය මාර්ගයක් නැත්තේ ය.

එහෙයින්:

"විපත්තිපටිබාහාය සබ්බසම්පත්තිසිද්ධියා
සබ්බදුක්ඛවිනාසාය පරිත්තං බ්‍රූථ මඞ්ගලං
සබ්බරෝගවිනාසාය පරිත්තං බ්‍රූථ මඞ්ගලං
සබ්බභයවිනාසාය පරිත්තං බ්‍රූථ මඞ්ගලං"

යනුවෙන් මේ ගයින් ආතුරයෝ පිරිතට ආරාධනා කෙරෙති.

මෙහි තේරුම නම්: සියලු විපත් දුරුවීම පිණිසත් හැම දුක් රෝ–බිය නැතිවීම පිණිසත් මෙලොව පරලොව දෙක්හි ඉෂ්ටාර්ථසංසිද්ධියට හේතුවූ **පිරිත** වදාරනු මැනව යනුයි.

"පරි සමන්තතෝ තායති රක්ඛතීති පරිත්තං, අනතරායං පරිහරතීතං තායතීති පරිත්තං, පරිතෝ වා සබ්බුපද්දවතෝ තායතීති පරිත්තං" යනු මේ පරිත්ත ශබ්දය පිළිබඳ නිර්වචන කිප යෙකි.

මෙයින් සැදැහැයෙන් හා භක්තියෙන් ද තෙරුවන් ගුණ සත්‍ය ය සි නුවණින් පිළිගෙන ඉගෙනීම්, දැරීම්, ඇසීම්, බැලීම් වශයෙන් පිරිත් ධර්මය ඇසුරු කළ පුද්ගලයා පරලොව සතර අපායාදි දුකෙන් ද මේ ලොව නානාවිධ රෝගයන්ගේ ව්‍යුපශමයෙන් හෙවත් සන්සිදීමෙන් හා යක්ෂ ප්‍රේත භූත පිසාචාදි අමනුෂ්‍යයන්ගේ නොයෙක් ප්‍රකාර උපද්‍රව දුරලීමෙන් ද පාලනය කෙරේ නුයි ආරක්ෂා කෙරේනු යි **පිරිත්** නම් වේ යනු මෙහි අර්ථයි.

මෙහි නානාවිධ රෝග යන්නෙන් අදහස් කරන්නේ ඒ ඒ ශාරීරික වස්තූන්ගේ වශයෙන් උපදනා චක්ෂුරොග

රොගඋපද්‍රව ශ්‍රොත්‍රරෝග ඝ්‍රාණ රොග ජිහ්වා රොග කාය රොග ශීර්ෂරොගාදි අනෙක ප්‍රකාර රෝග යන්ය. මේ රෝගයන් පිළිබඳ නොයෙක් භේද ඇතත් ඔවුන්ගේ ඉපදීමට හේතුවූ මූලකාරණ වශයෙන් ඇත්තේ රෝග අටෙකි.

එනම්: පිත්ත සමුට්ඨානික ආබාධය, සෙම්හ සමුට්ඨානික ආබාධය, වාත සමුට්ඨානික ආබාධය, සන්නිපාතික (යට කී සියල්ල එකතු වී උපදනා) ආබාධය, උතුපරිණාමජ ආබාධය, විෂම පරිහාරජ ආබාධය, ඔපක්කමික ආබාධය, කම්මවිපාකජ ආබාධය යන අටයි.

මොවුන් අතුරෙහි පිත කෝපවීමෙන් උපදනා යට කී රොගයෝ **පිත්ත සමුට්ඨානික** ආබාධ නම් වෙත්, සෙම් කෝපයෙන් හටගන්නා රෝග **සෙම්හසමුට්ඨානික** ආබාධ නම් වෙත්. වාතය කිපීමෙන් හටගන්නා රෝග **වාතසමුට්ඨානිකාබාධ** නම් වෙත්. වා පිත් සෙම්යන තුන් දෙස් එකතුවීමෙන් හෝ එ දෙකක් එක් වී මෙන් හෝ උපදනා රෝග **සන්නිපාතික** නම් වෙති. ඉතා අධික වූ ශීතොෂ්ණයන් නිසා උපදනා රෝග **ඍතුපරිණාමජ** නොහොත් දේශගුණය වෙනස්වීමෙන් ඇති වන රෝග නම් වෙති. තමන්ගේ කායිකශක්තිය ඉක්මවා කරන විෂම අධිෂ්ඨාන, උපවාස, බරඉසිලීම්, අධික වෙහෙස ගෙන දෙන ගමන් බිමන් ආදියෙන් හටගන්නා රෝග **විෂමපරිහාරජාබාධ** නම් වෙති. අන්‍යයන් විසින් කරනු ලබන තාඩන පීඩන වධබන්ධනාදි වශයෙන් ඇතිවන රෝග **ඕපක්‍රමිකාබාධ** නම් වෙත්. මෙකී සත් වැදෑරුම් කරුණු හැර භූදෙක් පෙර කළ අකුශල කර්මයන්ගේ වශයෙන් වකවුපාල, පූනිගතතාපස, වතීමාන කර්මයන්ගේ වශයෙන් දේවදත්ත, කොකාලිකා දින්ට සෙසින් උපදනා රෝග **කම්මවිපාකජාබාධ** නම් වෙති.

"ආබාධාති දුක්ඛාවහනතෝ ආබාධා, තතොයෙව සීතුණ්හ-ජිඝච්ඡාපිපාසාළවාරපස්සාවානම්පි ආබාධසංගහෝ" යනු වෙන් සියලු කායික දුක් උපදවන හෙයින් ආබාධ නම් වේ. එහෙයින් ම අධික ශීතොෂ්ණ, බඩ ගිනි, පැන් පිපාසා, මල මූත්‍ර පහකිරීම් ආදිහු ද ආබාධ පදයෙහි සංග්‍රහ වෙති.

මෙසේ හෙයින් ලෝකයෙහි සෘෂිවරයන් විසින් බෙහෙත්, යන්ත්‍ර මන්ත්‍රාදිය නියම කරනලද්දේත් බුදුවරයන් විසින් පිරිත් නියම කරන ලද්දේත් යට කියනලද පිත්තසමුට්ඨානික ආබාධය පටන්

ඖපක්‍රමික ආබාධය කෙළවර කොට ඇති සත් වැදෑරුම් රෝග ව්‍යප-සමය හා යක්ෂ ප්‍රේත පිශාචාදි අමනුෂ්‍යයන්ගෙන් වන අනෙක ප්‍රකාර උපද්‍රවයන්ගේ වැළැක්ම පිණිස ම වේ.

අතීත ජාතිවල රැස්කරන ලද නානා ප්‍රකාර අකුශල කර්මයන්ගේ විපාක වශයෙන් උපදනා රෝගයන්ගේ සන්සිඳුවීම සඳහා ලෝක-යෙහි ඇතිනාක් බෙහෙත්, යන්ත්‍රමන්ත්‍රාදි පිළියම් කළ ද ශාසනයෙහි ඇතිනාක් සියලු පිරිත් කළ ද ඒ කිසිවකිනුත් කර්මවිපාකජ ආබාධ යන්ගේ වැළැක්මෙක්, සන්සිඳුවීමෙක් නො වන්නේය.

එහෙයින්

"තඤ්ච හි පුරිමෙහි සඤ්ඤාහි කාරණේහි උපපන්නං සක්කා පටිබාහිතුං, කම්මවිපාකජානං පන සබ්බභෙසජ්ජානි පි සබ්බ පරිත්තානි පි නාලං පටිසේධාය" යනු අටුවායෙහි කියන ලදි. එසේ ද වුවත් බලවත් වූ උපඝාතක අකුශලකර්ම හැර එයට වඩා දුර්ලභවූ උපපීඩක අකුශල කර්මවල ශක්තිය පවා පිරිතෙන් දුර්ල කළ හැකි බව දීඝායු කුමාරයාගේ කථාවෙන් පැහැදිලි වෙයි.

හෙ මෙසේ යි:

දීඝායු කුමාරයාගේ කථාව

අතීතයෙහි දීඝලම්බක නම් නුවර වසන බමුණෝ දෙදෙනෙක් මෙ සත්තෙන් පිටත් තාපසප්‍රව්‍රජ්‍යායෙන් පැවිදිව අවසාන්හි (48) හවුරුද්දක් තපස් කොළෝ ය. උන් දෙදෙනාගෙන් එක් තවුසෙක් දරුවකු නැතිකලට පරම්පරාව නසී යයි සිතා තවුස් වෙස් හැර ගිහි ව වසනු සපය්‍ය ධනවත් බිරින්දක් හා කුටුම්බසණ්ඨා-පනය කොට (පවුල්ව) වසන්නේ නොබෝකලකින් ධන්‍යපුණ්‍ය ලක්ෂණ ඇති ගෙවන් වාසනාවන්න පුත්කුමරුවකු ලැබුවේ ය.

මැන භාගයෙහි අනික් යහළු තවුසාණන් දුරරටක සිට පෙරළා එනුවරට පැමිණි බව දැන තෙමේ සියලු අඹුදරුවන් සහිතව බමුණා-ණන් දක්නා පිණිස ඒ අසපුවට ගොස් පුතණුවන් මැණියන් අතව වඩා තෙමේ පළමුකොට වැන්දේ ය. මැණියෝ ද පුතණුවන් පියාණන් අනට දී දෙවනුව තුමූත් වැන්දෝ ය. උන් දෙදෙනාටම බොහෝ කලක් ජීවත් වේවා; සි තවුස් හෙමේ ආශීර්වාද කෙළේය. තුන්වෙනුව පුතණුවන් ලවා වැන්දවූ කල ඈපුරුදු හෙයින් බැණ නො නැහෙන්නා සේ ඔහුගේ ආයුශක්තිය දුර්ල බව දැන ආශීර්වාද නො කොට තූෂ්ණීම්භූත විය.

එසින් පුදුමයට පත් වූ ඔහු; "සවාමීනි, අප වදනාඇළ දිගාසිරි ලැබේවා'; සි ආශිර්‍වාද කරන්වත් අපගේ දරුවා වදනා කල කිසිවක් නොකියා තූෂ්ණීම්භූත වීමටත් හේතු සවරේ දැ;සි විචාළේ ය. බමුණ, මේ දරුවා වැඩි දවසක් ජීවත් නොවන්නේ යයි තවුස් තෙම කිවේ ය. සවාමීනි, කෙතෙක් දවස් ජීවත්වන්නේ දැයි ඇසී ය. සත්දවසෙක යි කී ය. මේ උවදුර දුරලන්ට කිසි උපායක් ඇත්දැයි විචාළ බමුණාට තාපස තෙම නැතැයි නොකියා මම නොදනිමි" සි කී ය.

"සවාමීනි, එසේ නම් ඒ කාරණය කවරෙක් දනී ද' සි ඇසූ බමුණාට, තෙපි මහණගොයුම් කරා ගොස් හෙවත් බුදුන් කරා ගොස් අසව්. උන්වහන්සේ එයට පිළියම් කියති සි කියේය. එසේ කල අපගේ ලබ්ධියට හානියක් වන්නේ නොවේ" ද? එහෙයින් මම එයට කිය වෙමි සි හෙතෙම කී ය. එකල තාපස තෙම කියනුයේ "බමුණ ඉදින් නුඹ දරුප්‍රේමයක් ඇත්තෙහි නම් ලබ්ධි පරිහානියක් නොසලකා මහණගොයුම්හු කරා ගොස් ඊට උපදෙස් විචාරව" සි කී ය.

මෙසේ තවුසාගේ දැඩි අවවාදය පිළිගත් ඒ බමුණු තෙම අඹු දරුවන් සමග බුදුන් වෙත ද ගොස් පෙර සේ ම ඒ දෙදෙනා වෙත වෙත ම වැඳ පසුව දරුවා ලවා වැන්ද විය. භාග්‍යවතුන් වහන්සේ ද පළමු තපසයා කි ලෙසින් ම දෙමවුපියන් වඳිද්දී බොහෝ කලක් ජීවත් වේවා සි ආශිර්‍වාද කොට දරුවා වැන්දකල කිසිවක් නොවදරා තූෂ්ණීම්භූත වූසේක.

එකල්හි බමුණු තෙම පළමුයේ ම ශාස්තෘන් වහන්සේගෙන් කරුණු විචාළේ ය. ශාස්තෘන් වහන්සේ ද පළමු තවුසාණන් කි ලෙසින් ම එය වදාළසේක. ඒ තවුසාණන් වනාහි තමහට සවිනේ දත් නුවණ තැතත් ඔහුගේ නිර්වේදය දත් නුවණින් එසේ කිය හැකි වුව ද ඒ අන්තරායෙන් වළක්වාලිය හැකි උපායඥතයක් උහුට නොවී ය.

එහෙයින් ඒ බමුණු තෙම් සවාමීනි, 'ඒ අන්තරාය වළක්වාලිය හැකි උපායයෙක් ඇත්දැ" සි ශාස්තෘන් වහන්සේගෙන් විචාළේ ය. 'ඇත බමුණ "සි උන්වහන්සේ වදාළහ. "ඒ කිමෙක් ද"සි නැවත විසි බමුණට බුදුහු මෙසේ වදාළසේක.;

"සචෙ තවං අන්තානෙවා ගෙහදාරෙ මණ්ඩපං කාරෙත්වා තස්ස මජ්ඣෙ පීඨකං කාරෙත්වා තං පවිසාපෙත්වා අට්ඨ වා සොළස වා ආසනානි පඤ්ඤපෙත්වා තෙසු මම සාවකෙ නිසිදාපෙත්වා සත්තාහං නිරන්තරං පරිත්තං භාතුං සක්කුණෙය්‍යාසි එවමස්ස අන්තරායෝ නාසෙසය්‍ය."

යනුවෙන් ඉදින් තෙපි තොපගේ ගෘහද්වාරයෙහි හෙවත් ගෙදොර ඉදිරිපිට මණ්ඩපයක් කරවා ඒ මැද පීඨයක් සදා එය වට කොට ආසන අටක් හෝ දහසයක් පනවා මගේ ශ්‍රාවකයන් එහි වඩා හිඳුවා සතියක් මුළුල්ලෙහි තොං කඩ කොට පිරිතක් කියවා ගත හැක්කොහි නම් ඒ උවදුර හෙවත් කුමරුවාගේ ජීවිතාන්තරාය වළකින්නේ ය යි වදාළ සේක.

මහාකාරුණික වූ තථාගතයන් වහන්සේ ඒ ළදරුවාගේ ජීවිතාන්තරාය වළකාලිය හැකි අසදෘශොපාය මෙසේ වදාළ කල්හි ඒ බමුණු තෙම "පින්වත් සවාමීන් වහන්ස, නුඹවහන්සේ වදාළ ලෙසින් ම මණ්ඩපාදිය කරවාලන්ට මට හැකි ය. එසේ වුව ද ඔබවහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේලා කෙසේ ලැබේම් දැ"යි සැලකෙළේ ය

එවිට භාග්‍යවතුන්වහන්සේ "තොප මෙතෙක් දෑ කොට නිම වූ කල්හි මම මාගේ ශ්‍රාවකසංඝයා එවම්" යි වදාළසේක. ඉක්බිති බමුණු තෙම "මැනව සවාමීනි" යි ගිවිස ගෙන ගෙදොරට ගොස් බුදුන් වදාළ ලෙසින් ම සියලු කටයුතු කොට නිමවා සවස බුදුන් කරා එළඹ එ පවත් සැලකළකල්හි බුදුහු සංඝයා එහි යැවූසේක. ආයෂ්මත් වූ මහා සංඝයා වහන්සේ එහි ගොස් එ මණ්ඩපය වට කොට වීදි වූ පරිදි පනවනලද අසුන්හි වැඩහිඳ ඒ ආතුර කුමරුවා ගෙනවා මිහැසහන මැද බිම පිළ වැද හොවා සත් රැදුවලක් විචෙජ්දයක් නැතිව හෙවත් සතියක් මුළුල්ලෙහි නොං කඩ කොට පිරිත් බිණුසේක. සත්වන දවස් සවස් කාලයෙහි ත්‍රිවිධොපද්‍රවයන් සන්හිඳුවන්නට විශාලා මහනුවරට වැඩියා සේ බුදුහුත් එතැනට වැඩිසේක.

මෙසේ සම්බුදුයන්වහන්සේ එතැනට වැඩිකල්හි සියලු දෙවියෝ එහි රැස්වූහ. එක් අවරුද්ධක නම් යක්ෂයෙක් දෙලොස් හවුරුද්දක් වෛශ්‍රවණහට බැළමෙහෙ කොට ඔහුගෙන් ජීවිකා වෘත්තියක් ලබන්නේ "මෙසින් සත්වැනි දින මේ දරුවා ගනුව" යි වරය ලද්දේ ය එහෙයින් ඔහුගේ නියෝගය පරිදි ඒ අවරුද්ධ නම් යක්ෂ තෙමේ ද අවුත් එහි සිටියේ ය.

බුදුහු එතැනට වැඩිකල්හි මහෙශාක්‍ය දෙවියන් එහි රැස් වෙත් මෙ අල්පේශාක්‍ය දෙවියෝ ඉඩ දී දෙලොස් යොදුනක් තන් පසු බැස සාන ඒ වරය ලත් අවරුද්ධක තෙමේ ද පසු බැස්සේ ය. තථාගතයන් වහන්සේ ද මුළු රැය ම පිරිත් වදාළසේක. මෙසේ සතිය ඉක්මුණු කල්හි අවරුද්ධක යක්ෂ තෙම එකුමරුවා නොං ලැබියයි අටවන දින අරුණු නැගෙන කල්හි දරුවා විඩාගෙනවුත් බුදු රජාණන් වහන්සේට වැන්දවූහ. ශාස්තෘන් වහන්සේ "දීඝායුකොහොහි" යනුවෙන් 'කුමර නුඹ දීඝායුෂ්ක වෙහි"යයි සෙත් වැඩූ සේක.

"පින්වත් ගෞතමයන්වහන්ස, මේ කුමාර තෙම කොතෙක් කල් ජීවත්වන්නේ ද" යි බමුණ ඇසූ කල "බ්‍රාහ්මණය, මේ කුමාරයා එක සිය විසි හවුරුදුද්දක් ජීවත්වන්නේ ය"යි වදළසේක. මේ කුමරුහට ආයුෂවඩන කුමරු යයි හෝ දීඝායු කුමරු යයි නම් විය. ඒ දීඝායු කුමාර තෙම අභිවාදියට පැමිණ පන්සියයක් උපාසකවරුන් විසින් පිරිවරන ලද්දෙක්ව හැසිරුණේ ය.

ඉක්බිත්තෙන් එක්දවසක් ධර්මසභාමණ්ඩපයට රැස් වූ භික්ෂූහු මෙසේ කථාවක් ඉපදවූහ, "ඇවැත්නි, බලනු මැනව, සත්දිනකින් මැරෙන්ට සුදුසුව සිටි දීඝායු කුමාරයා දැන් මරණයෙන් මිදී එකසිය විසි වයසකට ආයුෂ ලැබ සිටින්නෙක් වෙයි. පන්සියයක් උපාසකයන් පිරිවරා හැසිරෙන්නෙක් ද වෙයි. මෙයින් මේ ලෝකයෙහි ජීවත් වන්නවුන්ට ආයුෂ වැඩිවීමට හේතු උපක්‍රම ඇතිබවක් පෙනෙයි." යන මේ කථාව යි.

එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ ඒ ධර්මසභා මණ්ඩපයට වැඩ මහණෙනි, "මෙහි ඊමට පළමුවෙන් කවර තම් කථාවකින් යුක්තව හුන්නහු දැ" යි විචාරා "මේ තම් කථාවකිනි භාග්‍යවතුන් වහන්සැ, යි සැල කළ කල්හි බුදුහු මහණෙනි, ගුණයෙන් වැඩිහිටියන් වඳනා පුදනා සත්ත්වයන්ට ආයුෂය පමණක් නො ව ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥ යන සම්පත් වැඩෙයි. අමනුෂ්‍යෝපද්‍රව වැළකෙයි. දියුණු ආයුෂඇත්තකුව අතුරු මරණයෙන් විපතක් නො ව සැප සේ කල් යැවියහැකි වේ ය"යි වදාරා දහම් දෙසනසේක් මේ ගාථාව වදළසේක.

"අභිවාදන සීලිස්ස නිච්චං වඩ්ඪාපචායිනෝ
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති ආයු වණ්ණෝ සුඛං බලං" යනුයි.

මේ ගාථායෙහි අභිවාදන සීලිස්ස යනු ගුණ සීලාදියෙන් වැඩි හිටියන් වඳනා ගති ඇත්තාහට ද, නිරතුරු වන්දනාමානන කටයුතු වල යෙදුණහුට ද යන අර්ථ යි. වඩ්ඪාපචායිනෝ යනු වයෝවෘද්ධ ගුණවෘද්ධ ඥානවෘද්ධයන් පුදන්නාහට ද, -ගිහියන්හට වනාහි එදවස පැවිදි වූ ළදරු සාමණේරයන්ට ද පැවිද්දන්ට වූ කලී පැවිද්දෙන් හෝ උපසම්පදාවෙන් හෝ වැඩිමහලු වූ ගුණවෘද්ධයන් පුදනු ලබන්නාහට ද වන්දන මානනාදියෙන් නිරතුරු පුදන්නාහට ද යන අර්ථ යි. චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති යනු ආයුෂය දියුණු වන කල ඒනාක් වර්ණය ද, සැපය ද, ශක්තිය ද, නුවණ ද, ඒ සමග ම දියුණුවෙයි ; වැඩෙයි.

යමකු විසින් නුවණින් වෘද්ධාපචායන (වැඩිහිටියන් පිදීම්) ආදි කුශලයක් කරනලද්ද තරුණ වයසේදී හෝ ඔහුට ජීවිතාන්තරායක්

එළඹ සිටියේ වී නමුත් එය අභිවාදනාදිය හේතුකොට ගෙන සත් සිදෙන්නේ ය. වළකින්නේ ය, හෙතෙම නියම්ත ආයු ඇත්තකුවි ඒ සමග ම වණ්ණාදි සෙසු කරුණුවලින් ද වැඩෙන්නෙක් වන්නේ ය.

මේ ධම්දේශනාවශානයෙහි දීඝායු කුමාර තෙම පන්සියයක් උපාසකවරුන් හා සමග සෝවාන් ඵලයෙහි පිහිටියේ ය. අනික් බොහෝ දෙනකුන්ට ද ධම්ාභිසමය විය.

මෙයින් මේ සම්බුදුසසුන්හි **සනිපිටින්** පහළ වූ සැටින් එහි ඇති විශෙෂ ආනුභාව මහත්වයත් දතයුතු යි.

බුද්ධක්ෙෂත්‍රය

එසේම **ජාතික්ෙෂත්‍රය**, ආඥාක්ෙෂත්‍රය, විෂය ක්ෙෂත්‍ර ය යි බුද්ධ **ක්ෙෂත්‍රය** ත්‍රිවිධ වේ. **ජාතික්ෙෂත්‍රය** නම් දසදහසක් සක්වළයි එක චන්ද්‍රයෙක් එක සූර්යයෙක් දශදිශාවන්හි දිලිසෙමින් ඇවිදින්නා **තාක්** තැන් එක් සක්වළෙක් වෙයි. එබඳු සක්වළ දසදහසක් **ජාතික්ෙෂත්‍ර** යට ඇතුළත් වේ. එය වනාහි මහබෝසතාණන් මවුකුස පිළිසිඳ ගන්නා කාලයෙහි ද, මවුකුසින් බිහිවන කාලයෙහි ද, බුදුවන කාල යෙහි ද, දම්සක් පවත්වන කාලයෙහි ද, පිරිනිවෙන කාලයෙහිදු සි යන මේ අවස්ථාවන්හි කම්පාවෙයි. කෙළලක්ෂයක් සක්වළ **ආඥාක්ෙෂත්‍ර** නම් වේ. ආටානාටියපරිත්ත, මොරපරිත්ත, ධජග්ග– පරිත්ත රත්නපරිත්තාදි, පිරිත්වල ආනුභාවය මෙහි පවත්නේ ය. **විෂයක්ෙෂත්‍රය** නම් සර්ව්ඥතා ඥානයට ගෝචර වූ ධම්ාර්ථසමූහ යයි. මෙයින් පිරිත ආඥාක්ෙෂත්‍රයට ඇතුළත් ධම්යෙකැයි දතයුතු.

දැන් පවත්නා පිරිත් පොත්වහන්සේ වනාහි පස්මහාසඟියෙන් ආනුභාව සම්පන්න සූත්‍රාගත ධම්යන් අඩංගුකොට පුරාතන මහාසථ– විරයන් වහන්සේලා විසින් සකස්කරන ලද්දකි. **භාණවාර** (බණවර) යනු ධම්ය පිළිබඳ කිසියම් ප්‍රමාණයෙකි.

මෙය සම්මත වූයේ **වළගම්** අබා රජු දවස මාතලේ **අලුලෙන් විහාර** යෙහි රැස් වූ මහාසංඝයා වහන්සේ **චතුභාණවාර පාළිය** සේ කටපාඩම්න් ගෙන ආ බුදු ධම්ය පොත් වල ලියූ පසු ය. උන්වහන්සේලා අකුරු වශයෙන්, පද වශයෙන්, ග්‍රන්ථ වශයෙන් ගැණ බලා නිරවුල්ව පිරිසිදුව සකස් කළ බව පෙනේ. එහි අකුරු අටදහසක් නිම්කළ **ඛණවර** යයි සම්මත කළහ.

හෙ මෙසේ ය; අකුරු අටක් එක් පදයෙකි, එබඳු සතර පදයක් ගාථාවෙකි. මෙයට ග්‍රන්ථයයි ද කියනු ලැබේ. ග්‍රන්ථයකට අකුරු

තිස්දෙකකි. එබඳු ග්‍රන්ථ දෙසියපනසක් පමණ වූ ධම්කොවඨාසය එක් බණවරෙකි. එවිට බණවරකට අ.න්තේ අකුරු අට දහසෙකැයි සැලකිය යුතු.

චතුභාණවාර පාළිය හා පරිවාර ග්‍රන්ථ

මහාභූතාව සම්පන්න සූත්‍රාගත ධම් ඇතුළත් කොට මහාවිහාරාධිපති ගත පුරාතන මහාසඨවිරයන් වහන්සේලා විසින් පිරුවාතා පොත පිළිසෙළ කරතලද්දේ විය. මෙකල සම් බුද්ධ ශාසනය යථාසථාතයට පැමිණ වූ බොධිසත්ත්වගුණොපෙත වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ **සරණංකර සඞ්ඝරාජ** මහා සවාම්පාදයන් වහන්සේ විසින් එකල සෙංකඩගල නුවර රජසිරි පැමිණි **ශ්‍රී විජය රාජසිංහ, ශ්‍රී වීරපරාක්‍රම, නරෙන්ද්‍රසිංහ** යන ශාසනොදයකාම් උතුම් මහාරජවරුන්ගේ ආරාධනායෙන් බොහෝ ධම්ග්‍රන්ථ නිෂපාදනය කොට ඒ උත්තම කාරුණික වූ සංඝරාජොත්තමයන් වහන්සේ විසින් ම පැවිද්දන් සතර බණවරෙහි පුහුණු කරවනු සඳහා **සාරත්‍ථදීපනී** නම් වූ සත්‍ර බණවර සන්නය ද කරන ලද්දේ ය.

මෙය කරන උන්වහන්සේට මේ සඳහා අන්‍ය පණ්ඩිතොත්තම කෙනකුන් විසින් ලියූ සංක්ෂෙප අර්ථවණනාවක් ද දක්නට ලැබුණු හෙයින් එය ද ඇසුරු කොට මේ සතර බණවර සන්නය පිළියෙළ කරන ලද බැව් උන්වහන්සේ විසින් ම තම ව්‍යාඛ්‍යායෙහි සඳහන් කරන ලද්දේ ය.

පස්මහානිකායයෙහි ඒ ඒ තැනින් උපුටාගත් පිරිත් බණ සංග්‍රහය නම් වූ පිරුවාතාපොතට පස්මහසඟි අටුවාවල අර්ථවිවරණ ඇතත් පිරිත්පොත භාවිතා කරන්නවුන්ගේ පහසුව සලකා **රාජගුරු ආනන්ද වනරතන** මාහිම්යන්ගේ ශිෂ්‍ය තෙරුන් විසින් **සාරත්‍ථසමුච්චය** නමින් **සතර බණවර අටුවාව** කරන ලදි.

එය අර්ථකථාවාය්‍ය **බුද්ධඝොෂ** මාහිමියන් වහන්සේ විසින් විනය පිටකයට **සමන්තපාසාදිකා** නම් වූ විනය අටුවාව කරතිබිය දී ප්‍රාතිමොක්ෂයෙහි විනයශික්ෂාවන් පහසුවෙන් ඉගෙනීම සඳහා **කඞ්ඛාවිතරණී** නම් වූ ප්‍රාතිමොක්ෂ අටුවාවත් උන්වහන්සේ විසින්ම කර තිබෙන්නාක් මෙනි.

බණපිරිත් කතිකාවත

සම්බුදු සස්න නිමිලව පවත්නේ අන්‍යොන්‍ය ගිහිපැවිදි සම්බන්ධය හේතු කොට ගෙන ය. ශාසනයෙහි ගෘහස්ථයෝ උපාසක උපාසිකා වශයෙන් හෝ, දායක දායිකාවන් වශයෙන් හෝ හඳුන්වනු ලබන දෙපිරිස ය, සෙසු පිරිස ප්‍රතිග්‍රාහක පක්ෂයෙහි වූ

භික්ෂු පිරිසය. මේ දෙපිරිසෙනුත් ප්‍රධාන පිරිස භික්ෂුපිරිස ය. ඒ ප්‍රතිග්‍රාහක පක්ෂයෙහිවූ භික්ෂුපිරිස නො පහන් වූවන්ගේ ප්‍රසාදය ඇතිකරලීමටත් පහන්වූවන්ගේ ප්‍රසාදය දියුණු කරලීමටත් නුවණින් සලකා ගත් කල භික්ෂුප්‍රතිපත්තිය ආරක්ෂා වෙයි. ප්‍රතිපත්තිය රැකුණුකල, ගෘහස්ථයන් ද ඔවුන් අනුගමනය කොට තම තමා අයත් ගිහිසාමීචි ප්‍රතිපදාව ද දියුණු කෙරෙමින් ශාසන සංවර්ධනයට උත්සාහ කෙරෙයි. කතිකාවත්වල ප්‍රයෝජනය නම් ශාසන පරිහානිය වළක්වා දුෂ්ප්‍රතිපත්ති දුරුකොට් ධර්මවිනය දෙක ස්ථාවස්ථානයට පමුණුවා ශාසනය රැකගැනීමය.

පොළොන්නරු රාජධානි සමයෙහි **මහා පරාක්‍රමබාහු** මහරජතුමා විසින් ඇරඹූ මේ **කතිකාවත් ක්‍රමය** තත් තත් කාලීන බෞද්ධ නරපතීන් විසින් ශාසන දියුණුවට රුකුලක් කොට ගත ද සිංහල රාජ්‍යයේ පිරිහීම දක්වා හිලෙමින් මතුවෙමින් පවත්නා අතර සිංහල බෞද්ධ රාජ්‍යය පිරිහෙනු සමග ම කතිකාවත් ද පිරිහෙන්ට පටන් ගත්හ.

එයින් පසු ශාසනදියුණුව පිණිස යම් යම් කතිකාවත් පිහිටුවා ගන්ට යෙදුණේ බෞද්ධ රජුන්ගේ සහයෝගය නැතිව සැදැහැවත් සාමාන්‍ය බෞද්ධ ජනතාවගේ ඕනෑකම් පිටය. මේ **බණපිරින් කතිකාවත** ද එබන්දෙකි. සිංහල රාජ්‍යය පිරිහීමෙන් ශාසනය ද පසුබස්නා සමයෙහි පහළවූ ශ්‍රී **සරණංකර** සංඝරාජයන් වහන්සේ විසින් යළිත් තහා සිටුවනලද ශාසනොද්දීපනියෙන් පසු උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරානුයාත සුපේශල භික්ෂු සංඝයා විසින් සම්මත කරගත් මේකල බොහෝ සෙයින් ක්‍රියාවේ යෙදෙන කතිකාවත තම් මේ **බණපිරින් කතිකාවත ය**. හේ මෙහි උප ග්‍රන්ථයෙහි සඳහන් වේ.

එහි ව්‍යවස්ථා දශයෙකි, ඒ හැම ව්‍යවස්ථාවක්ම ඉතා වැදගත්ය ප්‍රයෝජනවත්ය. එයට අනුව පරිත්තභාණක භික්ෂූන් හැසී ගැසිය යුතුය. එපමණකුදු නොව එයට අනුව සලකා තම තමන් තුළ තව තවත් ප්‍රසාදජනක කරුණු ඇතිකරගත යුතුය. මෙය ප්‍රියවූ බෞද්ධසංගීතයක් හෙයිනි. විනෝදකාමී ලෝකයා සංගීතයට ප්‍රියය. එහෙත් එයින් බොහොමයක් කෙලෙස් වැඩෙන සංගීතයෝය. එහෙයින් සිත්වල වැඩෙන්නේ අකුසල්ය. පිරිත් ඇසීම තම තුන්සරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකරගැනීමෙන් මෙලොව පරලොව දෙක්හි වැඩ සිදුකරගන්නා මහ සලසා ගැන්මකි. පිරිත තරම්

බෞද්ධයන්ට පමණක් නොව අබෞද්ධයන්ටත් කණ්ඩායනවූ එහෙයින්ම පින් කිුයාවෙහි යෙදිය හැකිවූ අනිත් පහසු මාර්ගයක් නැත. ඒ නිසා මේ කතිකාවතෙහි පෙනෙන 8, 9, 10 වෙනි ව්‍යවස්ථාවන් ගැන අප සිත් තැබිය යොමුවිය යුතුය.

මෙකල පරිහානාභාතක භික්ෂූන්වහන්සේලාගේ යම් යම් අඩු පාඩු කම් දුර්වලකම් තිබේ. එයින් කිපයක් නම් යුගපිරිත් දේශනාවේ දී පිරිස අඩු නම් හෝ කිසිවෙක් නැත් නම් පිරිත් නොවදරා පෞද්ගලික දේ ගැන කථා කෙරෙමින් නිකම් හිඳීමය. එය පරිත්‍රාණධර්මයට නමස් නොදැක්වුවත්ව ඉබේම කෙරෙන අගෞරවයකි. යුග පිරිතට දෙනමක්ව වැඩහිඳින්නේ කුමනට දැයි සැලකිය යුතුය. එක නමකට කිමෙහි අපහසු කමක් වේ නම් අනික් නම පිරිත නොකඩවා කිම සඳහාය. විශෙෂ අවස්ථාවක් නොවේ නම් දෙනමම පිරිත් නොබැණ නිකම් හිඳීම් සුදුසු නොවේ.

මෙකල තවත් පෙනෙන දුර්ලභ කමක් නම් ප්‍රමාණයට වඩා හඬ නගා කිමත් ඕනෑවාට වඩා අකුරු ඇදීමත් ය. **න ආයතඤ්ඤන ගීතස්සරෙන සමෙමා භාසිතබ්බෝ** යනු වදළ බැවින් සම ප්‍රමාණයකට මිස ඉතා දික් නොට හඬ නගා කියන ගීතස්වරයෙන් පිරිත් කිම ධර්ම විනය විරෝධ බව සැලකිය යුතුය. දේශනානුකූලවූ අර්ථ සලකමින් අක්ෂරශුද්ධිය හා වචනශුද්ධියත් ඇතිව කියන්නවුන්ගේ හා අසන්නවුන්ගේත් ප්‍රසාදය හා භක්තියත් උපදවන අයුරු පිරිත් කිය යුතුය.

දෙවනි බණවරෙහි **ජෙතෝ ජයන්තෝ** යන ආදි ගාථා දෙක ළඟට තවත්වා යළින් පළමුවන බණවරෙහි **බුද්ධං සරණං ගච්ඡාමි** යන තැනින් පුරාගෙන කිය යුතුය. බණවර මැදින් පටන් නොගත යුතුය. පිරිතෙහි දී "ජෙතෝ ජයන්තෝ" යන ආදි ගාථාව කිව යුත්තේ අවසාන කිරීමේ දී එක්වරක් පමණෙකි. මෙය දෙතුන් වරක් නොකිය යුතු ගාථා ගෙයින් පෞරාණිකාචාර්‍යවරයන් විසින් මේ ගාථාවන්ට **අනුත්තරෙය්‍යා ගාථා** යි විශෙෂ නමක් දී තිබේ. තවත් කරුණක් නම්- මහ පිරිතට වැඩහිඳින කාල පළපුරුදු යුග වශයෙන් ළඟ ළඟ හිඳීමෙන් පුරන දෙනම "එවං මෙ සුතං" යි කියන විට ඒ ළඟ වැඩ හිඳිනා වියත් ප්‍රතිබල අනික් දෙනම "එකං සමයං" යි කියමින් සෙසු භික්ෂූන්ට අඟ කොවස සම්පූර්ණ කිරීමට ඉඩ තැබිය යුතු බවත්ය. පුරන දෙනමට පද ගණනාවක් කියන්ට ඉඩ හැරීම පිරිත ලක්ෂණ නොවිමටත් අසන්නවුන්ගේ අප්‍රියබවටත් හේතුවකි.

දෙස ලෙස පිරිත් කිය හැකි ඇතැම් පරිත්තභාතකයෝ තමන් මිය තවත් කිසිවෙක් පදය අල්ලා කියනවාට කැමති නැති බවක් පෙනේ. එයින් සජ්ඣායනා විලාසය ශ්‍රවණමාධුර්‍යයට බාධාවක් වන හෙයින් පිරිත ලක්ෂණ නොවේ..

පිරිත පිරිහුණොත් බෞද්ධයන්ගේ ආගම ශ්‍රද්ධාවත් සමඟ ශාසනයත් පිරිහෙනබව ප්‍රඥප්‍රභේදය යෙන් සලකා පරිත්ත-භාතකයන් තුළ මෙකල පෙනෙන්නට නිබෙන බොහෝ අඩුපාඩු කම් ගැන තම තමන් සාවධානව කලපනා කොට හෝ නැතහොත් කල්‍යාණමිත්‍ර ගිහිවත් මහාසඵවිරවරුන්ගේ අවවාදයන්ට අවනතවී මෙන් සකස් කර ගත යුතුය. සංඝයාවහන්සේගේ රැස්වීම්වලදී හෝ පෞද්ගලික සාකච්ඡාවල දී හෝ තම තමන්ගේ අඩුපාඩු කම් හා දුර්ශීල ප්‍රතිපත්ති ගැනත් කථාබස් කොට ඒ හැම දෙයක්ම සතස් කරගත හැකිය.

ක්‍රි: ව: 1906 පෙබරවාරි 3 වෙනි දින පිරිත් කතිකාවතක් සම්පාදනය කොට **මහනුවර ශ්‍රී සුමඟලාරාම විහාරාධිපති පිරිත් කතිකාවතක්** මහානායක සඵවිරාදී සඝාමිඳුරුවන් වහන්සේ **ඇති කිරීමට හේතුව** සේලා වෙත භක්තිප්‍රේමයෙන් ගෞරව බුහුමන් සහිතව ආරාධනා කර තිබෙන ආරාධනා පත්‍රයේ පිටපත මෙසේයි.

"මෙකල්හි අප උඩ පාත දෙරටේ ශ්‍රද්ධාසම්පන්න ගෘහස්ථයන් විසින් සංඝයාවහන්සේලාට නිමන්ත්‍රණය කොට මහොත්සවයෙන් යුක්තව පවත්වනුලබන **පිරිත් සජ්ඣාය** පැවැත්වීමෙහි ඒ ඒ තැන එක පිළිවෙළක් නොමැත්තෙන් ගිහි පැවිදි දෙපක්ෂයටම කොයෙක් පළිබොධ පැමිණෙන හෙයින් ද බෙහෙවින් ශ්‍රද්ධා සම්පන්නයන්ගේ ප්‍රසාදභග්නව අන්‍යථාභාවයට පත්වන හෙයින් ද ගිහි පැවිදි දෙපක්ෂය විසින් ඒ බණ පිරිත් පින්කම්හි පිළිපැදිය යුතු ක්‍රමය ධර්මවිනයාවිරුද්ධ ලෙස බහුශ්‍රැතයන් වහන්සේලාගේ සම්මතමතා-යෙන් කතිකා කොට බණපිරිත් **කතිකාවතක්** පිහිටුවන ලෙස යාඥා කොට ඉල්ලාසිටීම" යි.

එහි **දායකයෝ** නම් —

1 කොළඹ තොටමුණේ මාළිගාකන්දේ **විද්‍යෝදය පිරිවෙනේ** ප්‍රධාන නැපකරු දායක තැන්පත් **සිමන් ද්‍රේරා ධර්මගුණවර්ධන** බෞද්ධ විවාහ රෙජිස්ත්‍රාර් මුහන්දිරම් තැන. 2 කොළඹ පළාතේ **පැලියගොඩ විද්‍යාලඞ්කාර** පිරිවෙන්හි විද්‍යාලඞ්කාර දායක සභාවේ උපසභාපති තැන්පත් **දෙන් දුනියෙල් ජයතිලක** මහතායන

භාර්දිසේ ආරච්චි තැන. 3 ජයවර්ධන කෝඩිවේ රජමහවිහාරේ ප්‍රධාන දායක තැන්පත් කෝට්ටේ පදින්වි වාසල තනත්‍රිගේ දෙන් සාලමොන් ප්‍රේරා සේනානායක ජයවර්ධන මුහන්දිරම් තැන. 4 රසිගම් කෝරළේ කුඹුක්ක පත්තුවේ කුඹුක්කේ දෙන් පිරිස් දසනායක විජය භූණවර්ධන පොලිස් මුලාදැනි තැන. 5 කොළඹ නව කෝරළයට ඇතුළත් රසිගම් කෝරළය බද පාණදුරේ තොටමුණේ දෙන් ආබ්‍රහම් ලියොනාර්ඩ්ස් අබයසේකර. 6 පස්දුන් කෝරළේ කළුතර තොටමුණේ මහතිතවියන්ගල දෙන් සලමොන් ඩිවිටහඳිවි 7 සියතැකෝරළේ ගඟඔඩ පත්තුවේ දෙම්පේ පදිංචි ඩී. ඩබ්ලිව්. සිල්වා ජයසේකර මුහන්දිරම් තැන යන මේ පින්වත්හුය.

මේ ආරාධනාව ගෞරවයෙන් පිළිගත් මහනුවර මහාසංඝසභාව මෙසේ මේ කතිකාවත සථිරව පවත්වන ලෙසට නියම කොට මෙහි 262 වෙනි පිටේ නම් සඳහන් පරිදි තමන් වහන්සේලාගේ අත්සන් පිහිටුවා සම්මත කොට භාර දෙන ලදි.

ඒ මේ බණ පිරිත් කතිකාවත විද්‍යෝදය විද්‍යාලඞ්කාර දෙපිරි වෙන්හි නායක සවාමීන්‍ද්‍රයන් වහන්සේලා හා ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහා සඞ්ඝසභාවේ මහානායක සවාමීන්‍ද්‍රයන් වහන්සේත් පිළිගෙන වදාළ බව උන්වහන්සේලාගේ අත්සන් පිහිටුවා දෙන ලද ලියුම්වලින් පෙනේ.

ඒ ලියුම් මෙසේය–

15. 3. 1906.

විද්‍යෝදය පිරිවෙණ

පාලිමුත්තාක විනය විනිශ්චයේ ආ ක්‍රමය කොපිරිහෙළා මේ බණ පිරිත් කතිකාවත බලා පරිත්‍රාණ ධර්මදේශනා පැවැත්වීම පිළිගනිමි.

හිස් ශ්‍රී සුමඞ්ගල නායක සථවිර.

විද්‍යාලංඞ්කාර පිරිවෙන

මෙහි කියන ලද්දවූ ද නදනුගතවූ ද සිරිත් කොපිරිහෙළමින් ධර්ම විනයාගත පරිත්‍රාණ දේශනාව වීඩිවූ පරිද්දෙන් පැවැත්විය යුතු බව පිළිගනිමු.

රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ඛේමාරාමාභිධාන
කොළඹ හලාවත දෙදිශාවේ නායක සථවිර.

මේ බණපිරිත් කනිකාවතේ නියම කර තිබෙන ලෙස පරිත්‍රාණ ධර්මදේශනා පැවැත්වීමට එකඟවූ බවට මෙහි අත්සන් කෙළේ.

ශ්‍රී කල්‍යාණී සාමග්‍රිධර්මී මහාසඞ්ඝ සභාවේ
නායක පදප්‍රාප්ත ධර්මකීර්ති ශ්‍රී විමල-
තිස්සාභිධාන කොළඹ තවකෝරළේ
නායක ස්ථවිර.

ශ්‍රී. ධ. විමලතිස්ස

පිරිත් කනිකාවත්හි ප්‍රථම මුද්‍රණය

මෙහි සඳහන් ආරාධනා පත්‍රයෙන් සම්භාවිත මහනුවර මල්වතු විහාරීය මහාසඞ්ඝසභායෙන් සම්මත කළ තත් තත් පණ්ඩිතොත්තමී නායක ස්ථවිර-යන් වහන්සේලා විසින් සමානඡන්දයෙන් පිළිගත් මේ **බණ පිරිත් කනිකාවත** මෙකල මුද්‍රණාධාරයෙන් ප්‍රචාරය කළහොත් මැනවයි සැලකූ රසිගම් කෝරළයෙහි ස්‍යාමනිකායික මහාසඞ්ඝයා වහන්සේ විසින් මේ සඳහා කෘත්‍යාධිකාරී කොට සම්මතකරනලද රසිගම් කෝරළයේ පුනුවල ගංගාතිලක විහාරාධිපති ගෞරවාර්හ **ලබුගම සොභිතනාහරාභිධාන** මහාස්ථවිර පාදයන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවූ චිත්‍ර පරිත්තනාභනක **දඹර සිරිනිවාසාභිධාන** මහාස්ථවිරපාදයන් වහන්සේ විසින් පණ්ඩිතාචාර්‍යවරයන් වහන්සේලාගේ උපදේශාශ්‍රයෙන් පිරිසුදු කරවා ගත්තාලද විහාර අස්ත හා අනුශාසනාදිය ද ඇතුළත් කොට සඞ්ග්‍රහකරනලද මෙම බණ පිරිත් කනිකාවත් ප්‍රකරණය ගාහස්ථ ප්‍රව්‍රජිත සියලු පින්වතුන්ගේ උභයාර්ථසංසිද්ධිය සඳහා ශාසනාලය පෙරටු කොට **මොල්ලිගොඩ ඩී. බී ජයතිලක** වෛද්‍යවාසස්පතිතුමන් ලවා එකල පැලියගොඩ **සත්‍යසමුච්චය** යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවනලදි.

පිරිතෙන් නියමගුණ ලැබෙන නොලැබෙන සැටි

ලක්වැසි බෞද්ධ සාධුජන සමූහයාගේ සිරිත නම් අනිතව ගෘහයක් සැදූ කල්හි ද සැදූ ගෙයක් ප්‍රතිසංස්කරණය කළ කල්හි ද කම්මැන්ත ශාලාවක් පටන් ගත්තා කල්හි ද පිරිතක් කියවීමයි. එසේම වසංගත රෝගාදියක් පැතිර යන කල නුවර මැද හෝ මණ්ඩපයක් තනා පිරිත් කියවීම ද අවුරුද්දක් ගෙවී යන කල හෝ මඩහලාවස්ථාවක් දී හෝ පිරිත්කියවීම ද බෞද්ධ ලෝකයාගේ සිරිතය. මේ අවස්ථාවෙහි

උඩුපියත් අල්ලාගෙන සාධුනාද පවත්වමින් හේවිසි ශබ්ද පූජාදිය සහිතව ධාතුකරඬුවත් පිරුවානාපොත්වහන්සේ හා මහා සංඝයා වහන්සේත් යන රතඤ්ඤය මහත් ගෞරවයෙන් පිරිත් මණ්ඩපයට වැඩම්මාගෙන යනු ලැබේ.

එතැන් පටන් ඒ ස්ථානය ධාතුකරඬුව ඇතිතාක් විහාරගෙයක් ලෙස ද- පිරිත් දහම් දෙසනතාක් ධර්මශාලාවක් ලෙස ද- සංඝයා වැඩ සිටිනතාක් සංඝාරාමයක් ලෙස ද- සැලකිය යුතුය. එසේ සලකා ගුරුරුවන් කෙරෙහි මනාබයෙන් ගරුබයෙන් තමන් යටත් පහත් පැවතුම් ඇතිව අසන්නා වූ සැදැහැවතුන්ට පිරිතෙහි ගුණ නො අඩුව ලැබිය හැකිය.

මෙහි තත්ත්ය නියම සැටියෙන් නොදන්නාවූ ද දැන දැනත් නොසලකන්නාවූ ද ඇතැම් බෞද්ධයෝ පාවහන් නොගලවා මණ්ඩප ද්වාරයෙන් ඔබ මොබ යෙති. සුරුට්ටු සිගරැට් බොමින් නොමනා ලෙස හැසිරෙති. මඩ්පැන් පානය කොට හෝ එහා මෙහා යෙති. මණ්ඩපයෙන් පිටත්හි වුව ද නොසිලන්ව උසස්සන් ගෙන සිටිති. මහහඬින් කථා කෙරෙති. මහහඬින් සිනා සෙති, මෙබඳු අවිනීත පැවතුම් ඇත්තවුන්ට පිරිතෙන් නියම ගුණයක් නො ලැබෙයි

එබැවින් විහාරස්ථානයකදී කරන පින්කමක් මෙන් සිය නිවේ- සෙහි නෙරෙන පින්කම් ගැනත් ගෞරවයෙන් සලකා පිළිවෙත් කඩ නොකොට පිරිත් කියවන්නවුන්ට පිරිතෙහි නියම ගුණය ලැබිය හැක්කේය. එසේම මෙලොව අර්ථසිද්ධිය පරලොව අර්ථසිද්ධිය දැයි යන උභයාර්ථ සංසිද්ධිය ද ඉටු කර ගත හැකිය. ගිහි පැවිදි දෙපක්ෂ යෙහිම අභ්‍යන්තර බාහිර පිරිසිදු කම හා සන්හුන් කමත් පිරිතෙහි ගුණලැබීමට විශෙෂයෙන් හේතු වේ.

අපගේ සංස්කරණය

අප විසින් මේ ග්‍රන්ථය පිළියෙළ කරනලද්දේ හුදෙක් අපේ බෞද්ධ මහාජනයාට යහපත සලසා දීමේ කරුණානු ග්‍රහයෙනි. මෙහි චතුභාණවාරයෙහි පෙළ හා සිංහලානුවාදය සහිත දහම් විස්තරත් ලියා තිබේ. පිරිත්පොත ඉගෙනීමට කැමති භික්ෂූන්ට හා උපාසක උපාසිකාවරුන්ටත් මෙයින් සැලසෙන ප්‍රයෝ- ජනය ඉමහත් විය හැකිය

පිරිත් නාමයෙන් සලකනු ලබන බොහෝ කොටස් ද දින පතා භික්ෂූන් විසින් සජ්ඣායනා කළ යුතු චන්පිරිත් ද මෙහි ඇතුළත් වේ. පළමු මුද්‍රිතව තිබුණු බණ පිරිත් කතිකාවත ද මෙහි ම ඇතුළත්ය.

ශාසනයෙහි කුලදරුවකු පැවිදිකිරීමේ චාරිත්‍රානුග්‍රහත පිළිවෙළ හා හෙරණ පැවිද්දන් පිළිපැදියයුතු ශික්ෂා ද ඔවුන්ගේ දිනචරියාව ද මෙහි එක් පරිවේඡදයක් වශයෙන් දැඩිංතු වේ. ඒ ඒ පළාත් බද සිරිත් විරිත් ද මෙහි සඳහන් වේ.

මෙය සකස්කිරීමේ දී මෙහි යම් යම් කොටස් පිටපත් කර දී මෙන් තාරන්ගොඩපාලුවේ රත්නත්‍රිඝනාරාමවාසී **යාඋගාඩ පේමරතන** සථවිර, ශ්‍රී කල්‍යාණිරජමහාවිහාරවාසී **වන්නල සිලරතන** සථවිර දඹදෙණියේ සාලියාලේ ශ්‍රී වඩිනාරාමවාසී **මඩුගල්ලේ ගුණරතන** භික්ෂු, වතවාසල පුරාණවිහාර වාසී **රන්මිණිකේ සිවලිජොති මැවිවිලියේ පියරතන** යන සථවිර භික්ෂූන්ගේ ද උපස්ථාඹ කර්‍ය මෙහිලා වැදගත් කොට සලකමු.

එසේම මෙහි ආථානාටිය සූත්‍රය පිළිබඳ සිංහලානුවාදය හා දහම් විස්තරයත් ලියතලද්දේ විද්‍යාලඞ්කාර පිරිවෙන්හි සාහිත්‍යාචාර්‍ය පණ්ඩිත **දෙගම්මැද සුමනජොති** සථවිරයන් විසිනි. මෙහි ඇතුළත් **පිරිත් ප්‍රභාවනාව** මෙකල බොහෝ දෙනා නොදත් නො සැලකූ කරුණු හේතු සහිතව විසඳ, ඉතා සාරවත් ලෙසත් වැදගත් ලෙසත් ලියන ලද්දේ විද්‍යාලඞ්කාර පිරිවෙන්හි උසස් ආචාර්‍ය වරයකු වශයෙන් මහත් ලොකශාසනාර්‍ථයකට සහායව සිටි ධර්මචින්තය දෙක්හි විචාරාත්මක \ බුද්ධිමතකු වශයෙන් පණ්ඩිතයන් අතර පිළිගැනුණු කීර්තියක් ඇති මාතර **ඔඩිවිගම්වේ සිරි ධම්මකිත්ති** සථවිරයන් වහන්සේ විසිනි.

මෙසේ මේ ග්‍රන්ථය ධර්මවිනයානුගතවූ ද බෞද්ධ සම්ප්‍රදායානුගතවූ ද කරුණු රැසකින් ප්‍රතිමණ්ඩිත කොට විශාල ග්‍රන්ථයක් වශයෙන් මුද්‍රණය කරවිය හැකිවූයේ අප විසින් ගුදු ශාසනාලයෙන් සකස් කළ මේ ධර්මග්‍රන්ථයේ ප්‍රයෝජනයන් වැදගත් කමත් වටහාගත් මෙහි නම් සඳහන් අපේ සැදැහැවත් උපාසිකාවරුන්ගේ ශ්‍රද්ධාධ්‍යාශයෙන් අප වෙත ලැබුණු යම් කිසි ප්‍රමාණයක ආධාරයක් හේතුකොටගෙනය. එහෙයින්ම මෙයින් ලැබෙන යම් ප්‍රයෝජනයක් වේ නම් එය **ගිලන් උපස්ථානය** හා **අසරණ සංග්‍රහය** සඳහාත් පිරිනැමෙන ලෙස යොදවන බැවින් එයින් අපටත් මෙයට සහභාගිවූ පිනැතියන්ටත් නිවන් සැප ලැබේවා යි මෙත්සිතින් ප්‍රාර්ථනාකරමු.

මේ බවට ලෝසසුන් වැඩ කැමති

කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නායක සථවිර.

7. 2. 1954,
විද්‍යාලඞ්කාර පිරිවෙන්හිදී ය.

ප්‍රස්තාවනා

භාග්‍යවත් අප සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදාළ ආරක්ෂක දේශනාව **පිරිත්ධර්ම** නම්. මෙයට "පරිත්ත" "පරිත්‍රාණ" "පිරිත්" යයි කියනු ලැබේ.

"පරිත්තං තු පරිත්තාණේ
පරිත්තෝ තිසු අපපතෙ"

යනු **අභිධාන** ශාස්ත්‍ර බැවින් පරිත්ත ශබ්දය පරිත්‍රාණාර්ථ (ආරක්ෂා) අල්පාර්ථ දෙක්හි වැටේ. මෙහි වනාහි පරිත්‍රාණාර්ථ වේ. මෙසේ ලා පුරාතනයෝ **"අනන්තරායං පරිහරණං තායතී ති පරිත්තං" "පරිතෝ වා සබ්බූපද්දවතෝ තායතීති පරිත්තං" "මහාතේජවන්තතාය සමන්නතෝ සත්තානං භයං උපද්දවං උපසග්ගං ච තායති රක්ඛතීති පරිත්තං"** යි නිර්වචන දැක්වූහ.

පිරිත් ධර්මය

පරි යන උපසර්ගය පූර්වවූ "තා" පාලනෙ යන ධාතුවෙන් නිෂ්පන්නවූ මේ පරිත්ත ශබ්දයෙන් අනන්තරාය දුරුකරමින් රකී; හාත්පසින් සියලු උවදුරෙන් රකී; මහා තේජවන්ත බැවින් හාත්පසින් සත්වයන්ගේ භය ද, උවදුරු ද, අනන්තරා ද රකී, ආරක්ෂාකරයි යන අර්ථ දෙයි.

කතා මෙ රක්ඛා, කතා මෙ පරිත්තා, අනන්තගුනියා අනන්තරක්ඛාය අනන්තපරිත්තාය, ඉමං සෝ පරිත්තං කත්වා යනාදීන් ආරක්ෂාවූ මේ **පරිත්ත** ශබ්දය දේශනා පාලියෙහිම ඇතුළත් වෙයි.

පිරිත් ධර්ම දේශනා සංග්‍රහය

භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පිරිත් සූත්‍ර කෙනෙක් වදාරන ලද ද ඒවා පුරාතන ආචාර්‍යවරයෝ සියලු උවදුරු නැසීම පිණිස පැවැත්වූහ. එසේම නිකාය යන්හෙන් එකතුකොට **චතුභාණවාරපාළි** යයි බහා තැබූහ. එය **පිරුවානා පොත-පිරිත් පොත** යයි ද ප්‍රකට විය. පිරිත් යයි වෙන්ව ගත් මේ ධර්ම භාණකයන් විසින් ධජග්ගාවසාන වාරයෙක. ඉසිගිලි සූත්‍රාවසාන වාරයෙක, ආටානාටිය සූත්‍රයෙහි දේවභාසිත වාර, බ්‍රහ්මභාසිතවාර, වශයෙන් වාර දෙකෙකැයි භාණකවාර සතරක් කොට පිරිසිඳ පවත් වන ලද්දේය. ගාථා දෙසියපණසකින් හා අකුරු අටදහසකින් ප්‍රමාණ කරන ලද ඛණවරගණනින් මෙහි අසම්පුණ්ණ සතර ඛණවරක්

ඇතිවුව ද පරිහාන භාණකවාර සතරකින් යුත් පාළියක් බැවින් **චතුභාණවාර පාළි** නමින් ව්‍යවහාර යයි සැලකියයුතු මේ-

පිරිත් පොත වනාහි පරිහාන සූත්‍ර දේශනාය, සූත්‍ර දේශනායයි දෙකොටසකින් යුක්තය. එහි බොහෝසෙයින් පරිත්‍රාණාර්ථ සුවකවූ චතුභාණවාර පාළියට ඇතුළත්වූ සූත්‍රයෝ පරිහාන සූත්‍ර දේශනා වශයෙන් **ද ධම්මචක්කා** සූත්‍රාදිය සූත්‍ර දේශනාවශයෙන්ද වෙන්වෙත්. ධම්මචක්කාදි සූත්‍ර සහ සමග පිරිත්පොත පස් ඛණවරක් පමණ. මේ යයි සැලකිය යුතු මේ-

නිසඛණ විෂයෙහි:— **"නිස්සය මුඛවනඤ්ච උපසම්පදය පඤ්ච වස්සානි සඛ්ඛනෑමේන පරිච්ඡෙදෙන දෙ මාතිකා පගුණා වාචුගතා හවෙ, පඤ්චඞ්ගෙසු ධම්මස්සවණස්සාය සූත්තං- නතෙ, චත්තාරෝ භාණවාර, සඞ්ඝත්තානං පඞ්ගණ්හනත්ථාය අඪ්ඪ කවිඤ්ච මහාරහුලොවාද අම්බඨසදිසෙ එසෙ කථාමග්ගෙහා- සඛ්ඛහත්ත මඛිලාමඛිලෙසු අනුමොදනත්ථාය තිස්සො අනු- මොදනා, උපොසථ පවාරණාදි ඤානත්ථං කම්මාකම්ම විනිච්ඡ යෙ, සමණධම්මකරණත්ථං සමාධි වසෙන වා විපස්සනා වසෙන වා අරහත්ත පරියොසාන මෙකං කම්මඨානං, එත්තකං උගණ්හෙතබ්බං"**

යනු දැක්වූ බැවින් විනයෙන් උගතයුතු "මෙ මාතිකා (භික්ෂු භික්ෂුනී ප්‍රාතිමොක්ෂ) කම්මාකම්ම විනිච්ඡය යනු හැර සූත්‍රානුතයෙන් සතර ඛණවරෙක, පරිකථා පිණිස එක් කථාමාර්ගයෙක, අනුමොදනාය* සමාධි විදර්ශනා කමටහන්ද, යන සියලු උගත යුතු දහම් කොටස් සූත්‍රදේශනා සත සන්හිත "චතුභාණවාරපාළි" යෙන් (පිරිත්පොතෙන්) සම්පූර්ණ වනු බැවින් මෙය **නිස්සය මුඛවනඤ්ච** ධර්ම සංග්‍රහයක් ද වන සේ සඞ්ඝෘතීන් යයි සැලකිය යුතුය. මෙසේ උපසම්පන්නයන් විසින් **නිසඛණදහම්** පොතක් වශයෙන් ද සාමණේරයන් විසින් **සාමණේර ඛණදහම්පොතක්** වශයෙන් ද සියුවතක් පිරිස විසින් **භාරඤ්ඤදෙශනා** පොත වශයෙන් ද පිරුවත- පිරිවහන පොත හෙයින් **පිරුවානා** පොත් නම් ද විය. පුරාණ එළඅකාරාදියෙහි **පිරි- වුම් කිම් කියවීම- අනුශාසනාවෙහි** මේ ආඛ්‍යානාවිය සූත්‍රානන්ත ධර්ම දෙශනාව "මේ වැඩවුන් දෙදෙනා වහන්සේ ඇතුළු මහා සඞ්ඝයා

---

* අනුමොදනා—"ඒහාරාදිම්ඪඛලෙ මඞ්ඝල සූත්‍රාදිඅනුමොදනා" (පා. මූ. වි. ටී.) "මඟුලවම්මුලෙහි අනුමෝචනාව රාවණසුත් මහමඟුල්සුත්. නිරොකුඩ්ඩසුත් යන මෙතුන් සුනමැ" (සි. ම. ටී.)

වහන්සේ ලවා **පිරුවා වචන සේඛ**" සහරසංවරසීලයෙහි "හදරන බණ දන්නවුන් ලවා සියවාගෙන පුහුණු කිරීමය, "පුහුණුබණ තෙමැලිව **පිරුවිම්**" **දිනවරියාවෙහි** "අසන **පිරි-වහන** දෙයවන ඡොත් කොටලා. චතුපාරිශුද්ධිශීලය **පිරිවහාගෙන**" **ධම්මපද පුරාණ සන්නයෙහි** "අසජඣායය මලා මන්තා" යන ගාථාවෙහි අරුත් දැක්වී මෙහි දී මන්තා, හදරත ලද ශාස්ත්‍රයෝ; අසජඣායය මලා, **නොපිරවීම** මල කොට ඇත්තාහ; හදල බණවත් ශාස්ත්‍රවත් **නොපිරවීමෙන්** අනුයෝග තොකිරීමෙන් **තස්තේ** හෝ ය, නොවැටහෙන්නේය., **වෙදබ්‍රහ්ම ජාතකයෙහි** 'එක්තරා බමුණෙක් වෙදබහ තම් මන්ත්‍රයක් දන්නේය. ඒ මන්ත්‍රය **පිරුවා**"- යනාදියෙහි දක්වන සේ **පිරුම නා** යන්නෙහි අරුත් දතයුතු වේ-

පිරුවානාපොත සංග්‍රහ කරන ආචාර්‍යවරයෝ සරණ ගමන, දස සිකඛාපද, සාමණෙරපඤහ, වත්තනිංසාකාර, මඞ්ගලසුත්ත, **කරණීය** මෙත්ත සුත්ත- යනු **බුදදඝ පාඨයෙන්** ද පච්චවෙක්ඛණා, දසධම්ම සුත්ත, ඛඩ්ග පරිත්ත, මෙත්තසූත්ත, (මෙත්තානිසංසසුත්ත)ගිරිමානන්ද සුත්ත- යනු **අඞ්ගුත්තර නිකායෙන්** ද මිත්තානිසංස, මොරපරිත්ත- යනු **ජාතඝ පාළියෙන්** ද වඤපරිත්ත, සුරියපරිත්ත. බොජ්ඣඞ්ග පරිත්ත- යනු **සංයුත් සඟියෙන්** ද ඉසිගිලි සුත්ත- යනු **මැදුම් සඟියෙන්** ද ආටානාටිය සුත්ත- යනු **දිඝ් සඟියෙන්** ද ගෙන පස්මහ සඟිය සම්බන්ධ කොට පස්මහසඟිබලය සංග්‍රහ වන සේ චතුභාණවාර පාළිය සංග්‍රහ කළහ. එසේම සූත්‍ර දෙශනා හතෙන් දම්සක් පැවතුන් සූත්‍රය **සංයුත්තනිකායෙන්** ද, මහාසමය සූත්‍රය **දීඝනිකායෙන්** ද, පරාභව ආළවක අඟුලිමාල රතනාදිත්‍රය (වසල) කසීභාරද්වාජ සූත්‍රයන් **බුදදඝනිකායට** අයත් සුත්තනිපාතයෙන් ද, සච්චවිභඞ්ග සූත්‍රය- **මජ්ඣිමනිකාය** යෙන් දැයි මෙසේ පස්මහනිකායයන්ගෙන් ගෙන නිස්සිපාය ඝ.

වාචුගඝතා ච පගුණ උභයෙ දෙපි මාතිකා
සුත්තතතතතෙ ච චත්තාරෙ භාණවාරා පකාසිතා

යනු **විනය** නියමයි. සූත්‍රපිටකයෙන් සතරබණවරක් වාචොද්ගතව ම පුහුණුකිරීම උපසම්පන්න නිස්සය මුච්චනක **පිරිත් පුහුණු කිරීම** නිස්‍රුවට නියමය. **ඣම්මට්ඨානං ච භාඝිතං** යි එසේම කම්ටහනක් ද නියමිතය. පිරුවානා පොත පුහුණු කිරීමෙන් එම විනයනියමය ද පිරිත් ප්‍රයොජනය ද සිදුවන හෙයින් මෙය වාචොද්ගතව ම පුහුණු කළයුතු වේ. ඉගෙනීමේ දී උදෙස පරිපුච්ඡා වශයෙන් පෙළ කියවා ඇනීම ය අර්ථ පිළිවිසීම ය යන ක්‍රමයෙන් උගතයුතුය.

තවදැ:- **සුතා ධතා වචසා පරිචිතා,- මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුපටිවිද්ධා**-යි වදුළ බැවින් ශ්‍රවණය-ධාරණය-වචනයෙන් පරිචය කිරීමය- සිතින් බැලීමය- නුවණින් මනාව අවබොධ කර-ගැනීමය යන ශාසනධනය සම්පූර්ණ වියයුතු වූ ක්‍රම ද මෙහි ලා දත යුතුය. පිරිත පිළිබඳව බුදුහු **උග්ගහණාථ පරියාපුණාථ ධාරෙථ** යී උගනිව් පුහුණු කරව් සිත්හි ලා ධරව් යයි වදුළහ. අටුවාහි- **අත්ථම්පි පාළිම්පි විසංවාදෙන්තා සබ්බසෝ වා පන අපගුණං කත්වා භණනනස්ස හි පරිත්තං නෙව්වනනං නහොති සබ්බසෝ පන පගුණං කත්වා භණනනස්ස ච පරිත්තං නෙව්වනනං හොති**''- යී අර්ථය ද පාළිය ද වරදවා, සම්පූර්ණයෙන් පුහුණු නොකොට කියන්-නහුගේ පිරිත නෙදවත් නොවේ සම්පූර්ණයෙන් පුහුණු කොට කියන්නහුගේ පිරිත නෙදවත් වේ යයි දක්වූහ. මෙසේ හෙයින් පිරිත නම් පාළි වශයෙන් ද අර්ථවශයෙන් ද පුහුණු කළ යුතු ද පුහුණු කොට කියයුතු ද වේ. එසින් ආරක්ෂාව ද නික්ලේ ප්‍රතිපත්ති පූරණය ද වේ.

පිරිත් දේශනා කිරීම

බුදුරජාණන් වහන්සේ විස්සඨය මඤ්ජුය විසෙසඥය සවණීයය අවිසාරිය බින්දුය ගම්භීරය නින්නාදී ය යන අඤ්ඣාභ සම්පෙත මධුරස්වරයෙන් ධර්ම දෙශනා කර වදුළසේක. ශාසනික ධර්ම දෙශනායෙහි විධි දැනෙකි- එනම් **ඕසාරණය කථනය සරභඤ්ඤය** යනුයි. එහි පළුව අර්ථ කියන්නට කැමති බැවින් සූත්‍රයාගේ ඕසාරණය (කිරීම) **ඕසාරණා** නම්. ඒ සූත්‍රයාගේ අර්ථ ප්‍රකාශකරිම **කථන** නම්. සූත්‍රයාගේ හෝ එම සූත්‍රාර්ථයාගේ සවරයෙන් බිණීම **සරභඤ්ඤ** නම්. උදාත්ත සවරයෙන් යොදා කරන සජ්ඣායනය **සරභඤ්ඤ** නම් යි ද මෙහි තවත් අර්ථයෙකි.

අනුජානාමි භික්ඛවෙ සරභඤ්ඤනති වචනතො පන සරෙන ධම්මං භණිතුං වට්ටති සරභඤ්ඤ කිර තරඛඟවත්ත දෙඛක වත්ත ගණඛවත්තාදිනි දවතතිංස වත්තානි අපි තෙසු යං ඉච්ඡති තං කාතුං වට්ටති— යනු **විනය** නියමයි. මහණෙනි සරභඤ්ඤය අනුදනිමැ යි වදුළ හෙයින් සවරයෙන් ධර්මය කියන්නට වටියි. සරභඤ්ඤයෙහි වතාහි තරඛඟවෘත්තය දෙඛකවෘත්තය ගණක වෘත්තය යනාදී වෘත්ත දෙතිසක් වෙති. එසින් යම්ක් යමක් කරන්-නට කැමති නම් එය වටනේය යනු භාවයි. **ඛන්ධෙ පන සුත්තන්ත වත්තං නාම අත්ථි- ජාතකවත්තං නාම අත්ථි- ගාථාධම්මං නාම අත්ථි** ධර්මයෙහි සූත්‍රාන්ත වෘත්තයෙක් නම් ඇති ජාතක වෘත්තයෙක් නම් ඇති, ගාථා වෘත්තයෙක් නම් ඇති යයි ද දක්වූහ.

එහෙයින් සරභඤ්ඤයට ඇතුළත් වෘත්තානුකූලව සූත්‍රානුවෘත්ත ගාථා වෘත්ත ඇතිව පිරිත් දෙසිය යුතු වේ. **න හිකඛවෙ ආයතනෙන ගීතස්සරෙන ධම්මො භාසිතබ්බො** යි වදළ බැවින් ආයතගීතස්වරයෙන් ධම්ය නොකියයුතු වෙ- මෙහි **ආයතනෙකා ගීතස්සරෝ නාම තං තං වත්තං සිද්ධිකා.අකඛරානි විනාසෙත්වා පවත්තනා** යි දක්වනලද බැවින් ආයතක ගීතස්වරය නම් ඒ ඒ වෘත්ත බිඳ අකුරු විනාශ කොට පැවති ස්වර විශෙෂයකි. පිරිත්ධම්ය දෙසීමේ දී එබඳු ගීතස්වර ලක්ෂණය වර්ජිතය කළයුතු වේ.

අප බුදුහු පිරිත් කරනු සඳහා විසල් පුරයට වැඩිදිනයෙහි **මහාජනො නගරමජ්ඣෙ සන්ථාගාරං සබ්බගන්ධෙහි පිරිත් ධම් ශාලාව ලිම්පිත්වා විතානං කත්වා සබ්බා ලඞකාරෙහි අලඞකරිත්වා තත්ථ** බුදුරජාණන් වහන්සේ **බුද්ධාසනං පඤ්ඤපෙත්වා භගවන්තං ආනෙසි, තත්ථ භගවා තදෙව රතනසුත්තං අභාසි.** මහජනයා නුවර මැද සන්ථාගාරශාලාව සියලු සුවඳින් ආලෙප කොට වියන් බැඳ සිංහලු අලඞකාරයෙන් සරසා එහි බුද්ධාසනයක් පනවා භාග්‍යවතුන් වැඩම විය. එහි දී භාග්‍යවතුන්වහන්සේ සියල්ලන්ටම එම රතනසූත්‍රය වදාළසේක. (පිරිත් දෙසූහ) යනු අදහස් යි. එසේ හෙයින් බුදු කාලයේ පටන් මේ කාලය දක්වා පිරිත් ධර්මශාලාව විසිතුරු කොට සරසා ගැනීම සිරිතක් ව පවතියි.

මෙ මෙ හිකඛවෙ යාගා-ආමිසයාගො ච ධම්මයාගො ච යි

මහණෙනි මේ යාග දෙකෙකි. ආමිස යාගය ද ධර්මයාගය ද යන දෙකය. මෙහි ධර්මදානයම ශ්‍රේෂ්ඨයෙන් යාග නමැයි වදාළහ. පිරිත ද ධර්මදානයකි, ධර්මයාගයකි. ඊට පිළියෙළ කරන මණ්ඩපය ධර්මයාග මණ්ඩපසඞ්ඛ්‍යාත **පිරිත්මණ්ඩපය** යි.

පිරිත් මණ්ඩපය

මෙය බුදුරජාණන් වහන්සේ උපදෙස් කොට ඇත්තේ ය. බුදුකාලයෙහි ළදරු බමුණු කුමරුවකුගේ ජීවිතවිපත්තිය සත්දිනකින් සිදුවන බව ඇසූ පියබමුණා එයින් මුදාගන්නා උපායක් බුදුන් වෙතින් ඇසූ කල්හි **සචෙ තවං අත්තනො ගෙහද්වාරෙ මණ්ඩපං කාරෙත්වා තස්ස මජ්ඣෙ පීඨකං කාරෙත්වා තං පරිකම්මකතෙනා අට්ඨ වා සොළස වා ආසන්නානි පඤ්ඤපෙත්වා තෙසු මම සාවකෙ නිසීදාපෙත්වා සත්තාහං නිරන්තරං පරිත්තං කාතුං සක්කුණෙය්‍යාසි.** බමුණ ඉදින් තොප තමාගේ ගෙදොර මණ්ඩපයක් කරවා එය මැද පීඨිකාවක් කරවා එහි අටක් හෝ සොළසක් හෝ අසුන් පනවා ඒ

ආසකයන්හි මගේ ශ්‍රාවකයන් වඩා හිදුවා සත්දවසක් නිරතුරුව (නොසඩව) පිරිත් කරන්නට. හැක්කෙහි නම් මෙසේ ඔහුගේ අන්තරාය නැසෙන්නේය- නොවන්නේය යි වදාළහ. යනු අදහස යි. මෙයින් පිරිත සඳහා මණ්ඩපයක් සාදා ගැනීම බුදුහාමුදුරුවන්ගේ උපදේශය අනුව සිදුකරන්නක් බව දත යුතු ය.

අප බුදුහු **පාචීන දිසාභිමුඛෝ නිසීදිත්ථ** යනුවෙන් නැගෙනහිරට මුහුණ ලා වැඩහිඳ බොමැඩ දී බුදුව නිවන් සිරි ලත්හ. එසේම **අනන්තරෙන යමක සාලානං උත්තරද්වාරසාඛං මස්සුඛං පඤ්ඤත්තං පවිසි** යනුවෙන් යමක සාලයන් අතර උතුරට හිස ලා පරිනිර්වාණ මඤ්චකය පැනවීය එහි සැතපී නිවන් පුර පත්හ. මෙසේ බුදුන්ගේ බුදුබව පිළිබඳ මූල අග දෙකරුණට නැගෙනහිර හා උතුර බුදුහු ම නියමකරගත්හ-

මණ්ඩපයෙහි දෙරණොඩ නැබීම

ප්‍රථම ධර්මසඞ්ගායනා කාලයෙහි **තස්මිං මහාමණ්ඩපෙ පඤ්ච සතානං භික්ඛූනං අත්ථාය පඤ්ච පල්ලඞ්ක සතානි පඤ්ඤපෙත්වා දක්ඛිණභාගෙ නිස්සාය උත්තරාභිමුඛං ථෙරාසනං පඤ්ඤපෙත්වා මණ්ඩපමජ්ඣෙ පුරත්ථාභිමුඛං බුද්ධස්ස භගවතෝ ආසනාරහං ධම්මාසනං පඤ්ඤපෙත්වා දන්තබ්බිතං විජනිං වෙත්ත ඨපෙත්වා ඡිත්තුස්සඞ්ඝස්ස ආරොචෙසි නිසීතං භන්තෙ මම කිච්චන්ති** යි අජාසත් මහරජු විසින් ධර්ම සඞ්ගායනාව සඳහා කරවූ ඒ මණ්ඩපයෙහි පන්සියයක් භික්ෂූන්ට අතහි පසතුරුණු පන්සියයක් පනවා දකුණු භාගය ඇතුරු කොට උතුරට අභිමුඛ ව ථෙරාසනය ද නැගෙනහිරට අභිමුඛව භාග්‍යවත් බුදුරජුනට සුදුසුවූ ධර්මාසනයක් ද පනවා දන්ත-ඛව්ච (දන්ත රචිත- දතින් කළ) විජනි පතක් ද තබා සංඝස්වාමීනි මාගේ කටයුතු නිමකරනලදැ යි භික්ෂුසඞ්ඝයාට දන්විය යනු හාවයි. ධර්ම සඞ්ගායනාව සඳහා නැගෙනහිරට හා උතුරට මුහුණ ලා අසුන් පැනවූ බැව් මෙයින් පැහැදිලිය- මේ ආදි උපදේශයෙන් පිරිත් මණ්ඩපයෙහි ප්‍රධාන දෙරකොඩ නැගෙනහිරට හෝ උතුරට හෝ තැබීම ද ඒ ඵලා සුගාසනය පැනවීම ද කරනු ලැබේ.

පිරිත් මණ්ඩපයේ ඉඳුකිලය

ඉඳුඛිල ශබ්දයෙන් එසිකාස්තම්භය ද එළිපත ද වාචක වේ. නුවර දෙර සවිකරන පිණිස එළිපත ඇතුළෙහි රියන් අටක් හෝ දහයක් හෝ පොළොව සාරා සිටුවනලද අරටු ලීකණුව ඉන්ද්‍රඛිල නම් වේ. මෙය සතර දිගින් හමතා සුළඟින් කම්පාකරනට හෝ සොලවන්නට හෝ නොහැකි ශක්තිමත් බිලයකි.

පාලි ඉන්ද ශබ්දය ශක්‍ර අධිපති යන අර්ථයන්හි වැටේ. එසින් මනින්ද තරින්ද, සුරින්ද, දුම්න්ද, යනාදියෙහි අධිපති (ප්‍රධාන) යන අර්ථය ප්‍රකාශ වේ. එහෙයින් ඉන්ද්‍රයාගේ බීජය ඉන්ද්‍රකීල ය සි ද, අධිපතිවූ ප්‍රධාන වූ බීජය ඉන්ද්‍රකීලය සි ද අරුත් ලැබේ. පිරිත් ධර්මයාගමණ්ඩපයෙහි පිරිත් හූ බැඳීම් ආදී ප්‍රයෝජන නසා කරන ප්‍රධානසාධනය ප්‍රධාන කණුව ඉන්ද්‍රබීජයක් වැනි නුසි හෝ ප්‍රධාන සීලය නුසි හෝ ඉන්ද්‍රකීල නම්. විය- මෙය පිරිත් දෙසන මූලස්ථානයවූ ප්‍රාගප්‍රාප්ති හා එකාබද්ධ කොට සාදනු ලැබේ.

මීට පැළවන සූරිය ආදී අමූලිවගීයක් ගන්නේ ශබ්දාකර්ෂණයට හේතු බැවිනු දු සත්දවසක් නොමැලවී නිබ්බයසුතු බැවිනු දු යනාදි කරුණු නිසාය-සූරිය වනාහි ශාසනයෙහි දී ගෙම්දුලෙහි වර්ධනයුතු රුක්වෙසෙසක් වශයෙන් කියනලද සාරදරුයුක්ත රොගබීජනාශ නොපකාරවූ දරුවගීයකි- මේ ලිය පිරිසුදු වස්ත්‍රයකින් වසා බැඳ ගනුයේ අපිරිසිදුතත්වය මනහරවා පිරිත්තුව බැඳීමට සුදුසු කර ගැනීමටය.

පිරිත් මණ්ඩපයේ උඩ එල්ලීමට නාගලතා, නාගපල්ලව, නාගවල්ලි යන නාග නාමයෙන් ව්‍යවහාර වන බුලන් කැණති, නාදලු, ආදිය ද උපහාර පූජා වශයෙන් පුවක්මල් ද යොදා ගැනීම චාරිත්‍රය සි. යම් යම් ක්‍රියා සඳහා මල් බුලන් යොදාගැනීම ලක්දිව ඉතා ප්‍රසිද්ධය. අතීතකාලයෙහි මඟුල සම්මතවූ ද පූජා සම්මතවූ ද ක්‍රියාවන්හි දී වියන් බැඳ පුෂ්පාවලම්බනය කරගැනීම සිරිත් බව ග්‍රන්ථයන්හි පෙනේ-පුවක් මල් ඒ අර්ථය ද සිදු කෙරෙයි. දින කිහිපයක් හෝ සතියක් නොපරව මිලාන නොවී තබා ගැනීමට ද පුවක්මල් වෙන මල් වලට වඩා යොග්‍යය.

බුලන්කැනති නාදලු නාගවල්ලි

බුලන් කැනයි ද වහා නොමැලවෙන වගීයකි. නාදලු නාගවල්ලි ද වහා නොමැලවෙන අලඞ්කාර දෙවගීයකි. බුලන් වෛද්‍ය ශාස්ත්‍රයෙහි දී විෂ නාශනයට හා රොගබීජනාශනයට හිතවූ වශ්‍යද්‍රව්‍ය විශෙෂයක් මෙන් ප්‍රකාශිතය. පුවක්මල් හා නාදලු සඤ්ඣාග්‍රහණය කරන (හඳි පුරුද්දන) ආනුභාව සම්පන්න බෙහෙත්වගී දෙකෙකි. වෘක්ෂලතා පල්ලව පත්‍ර පුෂ්පයෙන් මණ්ඩපමණ්ඩනය කොට රත්නත්‍රයොපහාරය මෙසින් අභිප්‍රේත වේ.

පෙරදිග ආර්‍යයන්ගේ මඟුල සම්මත ක්‍රියාවන්හි දී පුන් කලස් හා ලදපස්මල් ගැනීම චාරිත්‍රයකි.

"තොරණද්ධජ පුප්ඵේහි-ගන්ධ පුණ්ණඝටෙහි ච
විහාරං ච සමන්තා ච- මණ්ඩිතං යොජනත්තයං"
"අට්ඨුත්තර සහස්සං ච ඨපාපෙසි තවේ සබ්බේ"

"රුවට වගුරුලි පෙළට මලලොඹු දෙරටුවල සැදි පුන්කලස්" යනාදිය හා "ලාජාපඤ්චම පුප්ඵානි විකිරිත්වා" යනාදිය ද මීට සාධකයි. විළඳ, අඹ, සිහින්සහල්, පිළඟකුපපි, ඊතණ යනු ලදපස්මල් ය. මණ්ඩපයෙහි උඩ ද බිම ද හාත්පස ද වාරිත්‍රානුකූලවූ බුලත්කැනති තාදලු තාගවල්ලි පුන්කලස් ලදපස්මල් යනාදි පූජාද්‍රව්‍ය යොදා තුනුරුවන් පුදසලස්වාලීම මෙහි ප්‍රධාන අදහස වේ.

පුන්කලස් හා ලදපස්මල්

බුදුහු **විසාලා** මහනුවරට වැඩ පිරිත් කළ අයුරු මෙසේ එයි **උපද්දවානං පවිසාතඤ්ඤාය වුත්තනයිදං රතනසුත්තං උගණ්හෙත්වා ආයස්මා ආනන්දෝ පරිත්තඤ්ඤාය භාසමානෝ භගවතෝ පත්තෙන උදකං ආදාය සබ්බනගරං අභිහුකාරනෙනා අනුවිචරි** යනුවෙන් උපද්‍රව වළකනු පිණිස වදාළ මේ **රතනසූත්‍රය** ඉගෙන ආයුෂ්මත් **ආනන්දස්ථවිරයන් වහන්සේ** පිරිත් පිණිස කියමින් බුදුරජුන්ගේ පාත්‍රයෙන් පැන් ගෙන සියලු නුවර පිරිත්පැන් ඉසිමින් හැසිරුනුසේක. යනු භාව සිද්ධ වේ.

පිරිත් පැන් හා පිරිත්නූල්

මනුස්සා උදකං ච සුත්තං ච ගහෙත්වා නිසීදිත්වා පරිත්තං භණන්ති වදන්ති ඝාතෙන්ති යනුවෙන් මිනිස්සු පැනුත් නූලුත් ගෙන පිරිත් කළ මැන වැ සි කියත් ද පිරිත් කළ යුතුයි යනු **විනයනියමය** වේ.

මෙසේ බුද්ධකාලයේ පටන් පිරිත්පැන් පිරිත්නූල් භාවිතාව එන හෙයින් පිරිත්මණ්ඩපයට පැන් හා පිරිත් නූල් තබාගනු ලැබේ. පිරිත්හුය යනුදු ප්‍රධාන පිරිත්නූලය. එය තුනුරුවන්ට සම්බන්ධකොට ගෙන වදාරන පිරිත්වචන පිරිත්පැන් හා, පිරිත්නූල්වලට ආකර්ෂණය වන පරිදි පාවිච්චි කරන ධර්මයාගසූත්‍ර විශෙෂය සි.

පිරිවහන පොතෙන් පිරිවැහීමට යුගාසනයක් ද ගණසජ්ඣායනාව (මහපිරිත)සඳහා අවට අසුන් ද පනවා පෙර දිගට ප්‍රධාන මණ්ඩපද්වාරය නම් ඊට දකුණෙන් ද උතුරට ප්‍රධාන මණ්ඩපද්වාරය නම් ඊට දකුණුවූ ඉසාන (ඊශානී) යෙන් ද බුද්ධාසනය (ධාතු ආසනය) තබා ඊළඟට ථෙරාසනාදිය පිහිටුවා ගතයුතුය. අසුන් සඛ්‍යාව **අට්ඨ වා සොළස වා** සි අටක් හෝ

මණ්ඩපයේ අසුන් පැනවීම

සොළසක් සී අට්ඨවාහි දැක්වූ බැවින් එලෙස හෝ "වා" ශබ්දඊ විසින් ඊට අඩුවැඩිගණනක් හෝ පතවාගනු ලැබේ. මෙහි අන්‍ය වාරිත්‍ර විධි **බණපිරිත් කතිකාවත** තම් ග්‍රන්ථයෙහි අඩංගු වේ.

මණ්ඩපයට තුනුරුවන් වැඩමවීම

බුදුරජාණන් වහන්සේ වෙනුවට ධාතුකරඬුව ද ධර්මරත්නය වෙනුවට පිරුවානා පොත්වහන්සේ ද සඞ්ඝරත්නය වෙනුවට ඊට ප්‍රමාණ ව්‍යක්ත භික්ෂු සමූහයක් ද වැඩමවා ගනිමින් මණ්ඩපය තුනුරුවන්ගේ ම වාසස්ථානයක් කරගනු ලැබේ.

පිරිත් දේශකයෝ

පිරිත වනාහි සිව්වනක් පිරිස විසින් ම ආත්මාරක්ෂාව හා පරාරක්ෂාදිය පිණිස පුහුණු කළයුතු ද පැවැත්විය යුතු ද වේ. එසේ වුව ද මෙහි ප්‍රධාන දේශකයෝ භික්ෂූන්වහන්සේලා ය- පිරුවානා පොත ප්‍රධාන වශයෙන් සංග්‍රහ කර තිබෙන්නේ භික්ෂුප්‍රතිපත්තිය උඩය- මෙය නිසසය මුවවනක භික්ෂුවකගේ ධර්මඥතය හා කර්මට්ඨන් ආදිය පිණිස ද සඞ්ඝගීතය යනු පළමුව අපි විසින් කියන ලදි. කරණීය මෙත්ත සූත්‍රය සඳහා **ඉමං පරිත්තං උගණ්හාථ එතං හි වෝ පරිත්තං ච කම්මට්ඨානං ච භවිස්සති හි ඉමං සුත්තමභාසි** යනුවෙන් "මේ පිරිත උගනිව් මෙය වනාහි තොපට පිරිත ද භාවනා කර්මට්ඨානක් ද වන්නේ යයි මේ සූත්‍රය වදළසේක." යනු අටුවා සි. කර්මට්ඨානින් තොර ධර්මදේශනාවක් තම් නැත යනු දු අටුවා අදහසකි. පිරිත්දේශනාව ද ධර්මදේශනාවකි-කරණීය මෙත්තසූත්‍රාදිය විශෙෂ කර්මට්ඨාන්ය. එහෙයින් මෙය ශුඛ ශ්‍රමණප්‍රතිපත්තිය ගහී කොට ඇති හෙයින් ප්‍රධාන වශයෙන් පිරිත්දේශකයෝ භික්ෂූහුමය. සාමාන්‍යයෙන් සියුවනක් පිරිසය. පිරිත්දේශක වූ භික්ෂූන් විසින් කරුණා මෛත්‍රී පෙරදැරි කොට පිරිත් දෙසියයුතු බව අටුවා නියමය සි. තවද පිරිත පිළිබඳ සියලු කටයුතු පිරිසිදුවම පැවැත්විය යුතු බැවින් හඳුන් කිරිපැන් ආදියෙන් පිරිසුදුවීම් ද තුනුරුවන් ප්‍රධාන කොට දෙවරාධනාදිය ද ඇතිව පවත්වන මේ උත්තම දේශනාවට වඩිනු සඳහා ආරාධනා කිරීමේ දී **මුදුකා බෝ තාවාහං කඤ්ඤ පටපිලොතිනං සංඝාටි** යනාදීන් මහසුප් මහතෙරුන් ධැරූ සිවුරු වැනි කැපසරුප් පටසිවුරු ද ධර්මසංගායනා කාලයෙහි **දන්ත බවිත්තං චිත්තවිජනිං ගහෙත්වා** යනාදීන් ප්‍රකාශවන කැපසරුප් විජිනිපත්වැනි වටාපත් හා පාත්‍ර ද රැගෙන වැඩිය මැනවැ සි දේශක භික්ෂූන්ට හසුන්පත් යැවීම පුරාණ චාරිත්‍රයෙකි-

පිරිත් පේ කිරීම යනු ප්‍රසිඩය. පිරිතට පළමුව පවත්වන මේ පිරිත් පේකිරීම පිළිබඳ තොයෙක් මතාන්තර වෙත්. ඒට පවසන ධම්මකොට්ඨාශය "අවිජ්ජා– පච්චයා සඞ්ඛාරා —පෙ— රක්ඛං බන්ධාමි සබ්බසෝ" යි (පටිච්චසමුප්පාදය– ඉතිපි සෝ– සවාක්ඛාතෝ– සුපටිපන්නෝ යන වචන මුල් කොට ඇති අනුස්සති ගාථා තුන ජයමඞ්ගල ගාථා කරණීය මෙත්තසූත්‍ර– රතනසූත්‍ර– ඛන්ධපරිත්තං– සබ්බ බුද්ධ බලප්පත්තා යනුයි) මෙහි සාධුසම්මත වෙනත් ක්‍රම ද වෙත්—"පඨමං සික්ඛාපදන්ති ආහාපෙත්වා සීලෙ පතිට්ඨිතස්ස පරිත්තං කාතබ්බං" යනු අටුවා බැවින් පළමුව පන්සිල් දී මේ පිරිත් පේකිරීම චාරිත්‍ර යයි. මෙයින් අදහස් කරනුයේ පිරිතට පළමුව පිරිත පිළිබඳ සියලු දෙය ගුණයුක්ත කොට තැබීම හා **රක්ඛං බන්ධාමි සබ්බසෝ** යනුවෙන් සවිප්‍රකාරයෙන් ආරක්ෂා බැඳ තැබීම යි. පේකිරීම යනු තේරුම් ගැනීමට පේවස් විසීම, පේව විසීම, පේවීම, යන්ත්‍ර පේකිරීම්, පොල්පේක්රීම් යනාදිවචන ද සාධක වේ. පාලි උපොසථ උපවාස ශබ්දයන්ගෙන් පොහෝ–පෝ– පෙහෙ– පේ– යන වචන නිපන්නය. උපොසථශබ්දය ද නානාඅර්ථ ඇත්තේය. එය උපවාසාර්ථ ද වේ උපවාස යනු පෙහෙව විසීමය, පවින් වෙන්ව සියලු භොගයෙන් තොරව ගුණ හා සමග වාසය යි.

යො පාපෙහි උපාවත්තෙතා – වාසෙ සද්ධිං ගුණෙහි සෝ උපවාසෝ නි විඤ්ඤෙය්‍යෝ – සබ්බභොග විවජ්ජිතෝ යනු අභිධාන යි. ලාමක අකුශලධර්මයන්ගෙන් උපාවෘත්තව අනාවෘත්තව පිහිටව සියලු ආහාරපාන භොගාදියෙන් වර්ජිත ද වී යම් වාසයක් වසනයක් සන්තානයක් වෙයි ද; එය උපවාසය යි දතයුතුය යනු භාව යි– උපවාසාර්ථවූ උපොසථ ශබ්දය ද–

උපවසන්ති එත්ථාති උපොසථෝ යි වාක්‍ය ද **උපවසන්ති සීලෙන වා අනසනෙන වා උපෙතා හුත්වා වසන්තා නි අත්ථෝ** යි අර්ථ ද දක්වා සීලයෙන් හෝ අනසනයෙන් (නොවැළඳීමෙන්) යුක්තව විසීම උපොසථ යයි දක්වයි. දේශනා පෙළෙහි **උපොසථං උපවසන්ති** යන්නට **උපොසථඞ්ගානි අධිට්ඨහන්ති** යනු අටුවා යි. මෙසේ හෙයින් 'පේ' කිරීම යන්නෙන් උපවාසාර්ථවූ පෙහෙය වාච්‍ය වේ. "යන්ත්‍ර පේකිරීම" යයි කීකල ඉරි ඇඳ අකුරු පිහිටවූ පත්‍රිකාවක් පූජාවිධි යොදා යම්කිසි මන්ත්‍රයකින් ජප කොට ගුණ පිහිටුවා ගැන්ම ද, පොල් පේ කිරීම යන්නෙන් පොල් ඵල කහදියරින් තාවා ඒ පිණිසවූ වාක්‍යාදිය කියා ගුණ පිහිටුවා තබා

ගැනීම ද, පේවස් විසීම-පේවීම-යන්නෙන් සිලාදි ගුණ පිහිටුවා ගැන්ම ද අදහස් කරනු ලැබේ-

පිරිත් මණ්ඩපයට පිරිත්පොත හා සඟුන් වැඩමවා පිරිත් නූල බොබැඳ පිරිත් පේ කිරීමේ බණ කොටස පටන් ගෙන **රක්ඛං බන්ධාමි සබ්බභයා** යී ආරක්ෂා බල ඇතිකොට ගුණයුක්ත කොට පිරිත්නූල ද බැඳතබාගැනීම හා තදනුලෝම පේවිධි ද මෙහි පේ කිරීම යයි දතයුතුය- මෙය පිරුවාතාපොතින් පිරිත්දෙසීමට පළමු ක්‍රියා විශෙෂයකි. මේ සඳහා ප්‍රාරම්භකර්ම, ප්‍රාක්කර්ම, පූර්වකරණ, පාතුකරණ යනාදියෙන් ප්‍රකාශකරන නානාවිධ මත ඇතත් මෙහි දක්වන ලද්දේ එක් මතයකි.

ගණ සජ්ඣායනා නම්වූ මහපිරිත දවසට තුන්වරක් දෙශනාකරයි.

මහපිරිත සෙන් පිරිත්

සූත්‍රදෙශනා

ආටානාටිය (හමාර) දෙශනා

හත්දවසේ බණපිරිත සඳහා- **පඨම මෙමෙ යි ආටානාටියසුත්තං න භණි- තබ්බං මෙත්තසුත්තං රතනසුත්තං ධජග්ගසුත්තං ඉති ඉමානි සත්තාහං භණි- තබ්බානි** යි දැක්වූ බැවින් පළමුව ආටානාටිය සූත්‍රය නොකියයුතු වේ- මෙත්තසූත්‍ර රතනසූත්‍ර ධජග්ගසූත්‍ර යන මේ සූත්‍රයන් සත්දිනක් කියයුතු යයි කිහ. පිරිත්කාලයෙහි මේ සූත්‍ර දවසක් පාසාම කියවේ- මෙත්තසූත්‍ර රතන සූත්‍ර යන දෙක මහපිරිත් වශයෙන් හා යුගපිරිත් වශයෙන් ද ධජග්ග- සූත්‍රය යුගපිරිත්වශයෙන් ද කියවේ-පිරිත්පොත සඞ්ගෘහිත පුරාතන ආචාර්යයන් හෝ පිරිත්අටුවාව ලියූ ආචාර්යවරයන් ද මේ අටුවාපාඨය දක්නාලද්දේය— එමනිසා මේ සූත්‍ර අනිත් පිරිත්සූත්‍ර පවසන අතර පැවසීමෙන් එම නියමය ඉටුවීම කල්පනාකරතලද බව හැඟෙයි-

භික්ෂුවක් විසින් විනයේ ප්‍රකාර පිරිවෙස් වත පිරිමේ දී **යාවතිහං ජානං පවිස්සාදෙති තාවතිහං තෙන භික්ඛුනා අඤ්ඤා පරිවත්තබ්බං** යි යම්තාක් දවස් දැන දැන ඇවත වසා නම් එතෙක් දවස් පිරිවස් පිරියයුතු යයි කියූ තන්හි දී අරුණට පළමුව වතසමාදන්ව අරුණු නැගීමෙන් පසු වත්තනික්ඛෙපය කිරීමෙන් දිනය පුරවාගන්නා විනයක්‍රමය මෙන් මේ සූත්‍ර අනිත් පිරිත් සූත්‍ර සමඟ දිනපතා දෙසූ කල්හි යථොක්ත කියවීන ඉටුකලා වේ.

තවද:- **ඛන්ති පරිත්ත**- මෙත්තානිසංස- මිත්තානිසංස පිරිත්- **මෙත්තසුත්තානුලෝමව** ද- "ආකඞ්ඛමානා සොභනං" "සබ්බත්ථ සොත්ථිං" යනාදි සොත්ථිභාවය ප්‍රකාශකරන. මඞ්ගල සූත්‍රය "සුවත්ථි හොතු" යනාදි සාත්ථිභාවය ප්‍රකාශකරන **රතනසුත්තානුලෝමව** ද එසේම රොගභය ව්‍යපසමනය වූ බොජ්ඣඞ්ග හිරිමානන්ද සූත්‍රයන් **රෝගභය** සංසිඳ වූ **රතනසුත්තානු ලෝමව** ද- "නමත්ථු බුද්ධානං"- "නමෝ තෙ බුද්ධවීරත්ථු" පවෙචකබුද්ධා—පෙ—වන්දථ අපපමෙය්‍යෙ" යනාදි බුද්ධ නමස්කාර-බුද්ධගුණානුස්මරණ ඇති මෝරපරිත්ත වන්ද සුරිය පරිත්ත- ඉසිගිලිසූත්‍රයන් බුද්ධගුණානුස්මරණ ආදිය ඇති **ඛජ්ගභ සූත්‍රානුලෝමව** ද සලකා නික්ඛිප්ත බව හැඟෙන හෙයින් ද මෙත්ත සුත්තාදී ත්‍රිකය මෙන් අනික් සූත්‍ර ද සත්තාභ භණ්ඩිතයට යොග්‍ය වේ. එසේම ඒ සූත්‍රයන්ගෙන් විශෙෂ ප්‍රයොජන ද අටුවාවේ දක්වන ලදහ. තවද හත්දිනක් එම පිරිත් බිණිය යුතුය යි කීම අවධාරණ රහිත ප්‍රකාශයක් බැවින් අනික් සූත්‍රපිරිත් ඒ අතර තොකිය යුතුයයි හෝ පන්සිල්වත් නොදිය යුතුය යි හෝ නිගමන යට අනවකාශ වේ.

තවද:- **ආටානාටිය පරිත්තං පුබ්බ පුබ්බ පරිත්තානුභාවා සෙවනොපචාරෙහි තෙජොබලං භාභාපෙතුං සබ්බපඨමං නික්ඛිත්තං** යි පිරිත් පොතේ දක්වන පුළු පුළු පිරිතුන්ගේ ආනුභාවය ආසෙවන උපචාර වශයෙන් තෙදබල ගැන්වීමට සියල්ලට පසුව ආටානාටිය පිරිත නික්ඛිප්තය යි කියතලදි. මෙත්තසූත්‍රාදි ත්‍රිකය ඇතුලු සියලු පිරිත් සූත්‍ර ආටානාටියට පළමු දෙසියයුතුබව හැඟෙන හෙයින් එලෙසින්ම ආචාර්‍ය්‍ය පරම්පරාගෙහි පැවත එයි.

මහාමඞ්ගල සූත්‍රය වත්‍රාහි "බහූ දෙවා මනුස්සා ච මඞ්ගලානි අචින්තයුං" යනු බැවින් දසදහසක් සක්වළ බොහෝ දෙවියන් ද සියලු දඹදිව මිනිසුන් ද, සිතූ මඞ්ගලප්‍රශ්නය විසඳූ දෙසූ දෙවි මිනිසුන්ට ඉතාප්‍රියමනාප සූත්‍රයෙකි. **පරිණාකාරථාය මහා මඞ්ගල ගාථා** වුත්තා යනාදීන් අමනුෂ්‍ය දේවාදීන්ට පින්පඬුරු පිණිස මේ සූත්‍රය ප්‍රකාශකිරීම ද **මඞ්ගලසුත්තෙන අත්තරක්ඛා** යනු බැවින් මඞ්ගල සූත්‍රයෙන් ආත්මාරක්ෂාව සිදුවීම ද ප්‍රකාශිතය **නිස්සා අනුමොදනා** යනුවෙන් විනයෙහි දැක්වූ ත්‍රිවිධ අනුමෝදනාවට ද මඞ්ගලසූත්‍රය ඇතුළත් වේ.

එහෙයින් පිරිත් පුණ්‍යකර්මකාලයෙහි දිනපතා දෙවියන්ට පින් පැහැරු දීමය, ආත්මාරක්ෂාය, දශකාඛ්‍යමෝදනාය, යනාදියෙහි සප්‍ර-ඡෝජන වූ මඞ්ගලසූත්‍රය හා රතනසූත්‍ර මෙත්තසූත්‍රයන් මහපිරිතට යොදාගැනීම සූක්ෂ්මබුද්ධිමත් පුරාතනාචාර්‍යසම්ප්‍රදායයෙකි.

චතුභාණවාර පාළියෙහි ඉසිගිලි සූත්‍රාවසාන පිරිත්කොටස් සෙත්පිරිත් වශයෙන් ද, ධම්මචක්ක සූත්‍රය ආදි කොට සච්චවි-භඞ්ගසූත්‍රය අවසාන කොට ඇති සූත්‍ර- සූත්‍රදේශනා වශයෙන් ද, ආටානාටිය සූත්‍රය හමාර දේශනා වශයෙන් ද පවත්වනු ලැබෙත්. මෙහි සෙත්පිරිත් නානාවිධ ප්‍රයෝජන සඳහා බව අටුවාවෙහි ප්‍රකාශිතය. සූත්‍රදේශනාව වනාහි විශේෂයෙන් දෙවියන්ට ප්‍රියමනාප බවට ද, බුද්ධාගමේ චතුරාර්‍යසත්‍යය ආදි ප්‍රධාන ධර්ම ශ්‍රවණය කරවීමට ද යනාදි ප්‍රයෝජන සඳහා ද, ආටානාටිය (හමාර) දේශනාව අමනුෂ්‍ය උවදුරු වළක්වාලීම සඳහා ද පවත්වනු ලැබෙත්. මේ දේශනා කොටසුන්ගෙන් සෙත්පිරිත ලලිතවෘත්ත තරඞ්ගවෘත්ත දෙක ඇති කොට ද, ආටානාටිය දේශනාව තරඞ්ගවෘත්ත ඇති කොට ද, පිරිත් වශයෙන් දේශනා කිරීම පුරාණ සිට පැවතගෙන එන චාරිත්‍රයෙකැ යි වෘද්ධ මහාසථවිරයන් වහන්සේලාගෙන් අසන්නලද ප්‍රකාශයකි.

සත්තාභපරිත්තාදි වශයෙන් පරිකර්ම සහිතව ආටානාටිය දෙසීමේ දී සතරතමක්ව ද, ඇතැම් තැනක අටතමක්ව ද, දෙසීම චාරිත්‍රයෙකි. පිරිත බොහෝසෙයින්ම ගණසජ්ඣායනා වශයෙන් දේශනාකිරීම පුරාණ සිටම පැවතගත එයි. පුද්ගලිකව දෙසීමට වඩා සංඝයා වී හෙවත් සතර තමක් හෝ පස්තමක් වී පිරිත් දෙසීම බලසම්පන්න වේ.

විශේෂයෙන් ආටානාටිය සූත්‍ර දේශනා කාලයෙහි සජ්ඣායනා-පාතය කොට දෙසීම ආටානාටිය පරිකර්ම දක්වන අටුවා විස්තරයෙහි එයි. "විකාලේ චිත්තබ්බන්ති සබ්බසන්නිපාතං කොසෙත්වා අට්ඨවීසති යක්ඛසේනාපතයෝ කථේතබ්බා" යනු අටුවා යි. විකාලේ චිත්තබ්බං යනු එම විහාරයෙහි හෝ එම ග්‍රාමක්ෂේත්‍රයෙහි යියලු සංඝයා රැස්වීමට කොමා කොට අටවිසි යක්සෙනෙවියන්ට අඩ ගා කිය යුතුය යනු කීවයි.

මේසේ ආටානාටිය ප්‍රථාණ විශයෙන් සංඝයා වී දෙසීම අභිමතා කැවින් සතරනමක් ව හෝ වැණිව හෝ බලසම්පන්න ව දේශනා කිරීම මහා විහාරාඛ්‍යායාගත උතුම් චාරිත්‍රයෙකැ යි සැලකියයුතුයි. භික්ෂූහු සතරනමක් වූ විට ඒ වත්‍රවඤ්ඤසංඝයා සි. මෙහි ලා දෙසීමේ පහසුවට සතරනමක්ව දෙණි යනු එක්තරා ආචාර්‍ය්‍ය මතයකි. සරභඤ්ඤ යුක්තව තරඛ්ඛවෘත්ත ඇති ව මෙය දේශනා කිරීම ද චාරිත්‍රයෙකි.

උජ්ඣාපෙතබ්බං ඛිකඛාපේතබ්බං විරවිතබ්බං යි ආ සූත්‍රයෙහි ම **අයං ඔකඛා ගණඝාති** යනාදීන් යඤ්ඤසේනාපතීන්ට දුන්විය. යුතුය, අඩ ගා කිව යුතුය, මුරගා කියයුතුය සි දේසිත බැවින් උදාත්ත සවර ඇති ව හඬ නගා කිම අමනුෂ්‍ය දූරිකරණය සඳහා වේ. එසේ දෙසීම මනුෂ්‍යයන් පළවා හැරීමට නොව අමනුෂ්‍යයන් පළවා හැරීමට කරන උජ්ඣාපන ඛිකඛාපන විරාව විධියකි.

මෙහි ලා ඇතැම්හු එය නුසුදුසු යයි කියතත් එය සූත්‍රයෙන්ම ප්‍රතිෂිද්ධය. **මෙත්තචිත්තං පුරෙචාරිකං කත්වා** යන අවවාද සිත තබා පිරිත් දෙසීමේ දී ඒ දෙසීම උද්ධච්චසහගත විකිත්ත චිත්ත යෙකැ යි හෙවත් උඩඟුවූ එඩිතර සිතින් යයි ඇතැම්හු කියති.

එසේ නම් හඬ නොනගා හෙමින් කෙදිරි ගාන්නාක් මෙන් කිම **චිතමිද්ධානුපනිත සංඛිත්ත චිත්තයෙකැ** යි හෙවත් හැකුළුණු අලස සිතෙන් යයි කිවයුතු වේ. මේ දෙකම එසේ නොවී යථාබල යථාපරිවය පරිදි (ශරීරශක්තිය හා කිමේ පුරුද්දත් හැටියට) සිදුවන්නකි.

ආටානාටිය දේශනාවේ දී සූත්‍රයෙහි එන පරිදි හඬනගා කිම ද පිරිත් පින්කම් පවත්වන අවස්ථායෙහි මහාසෙනඟ රැස්වත් බැවින් ඇසෙන සේ කිම ද යුකතියුක්ත වේ. කායසවරිතවූ හෙවත් කපුටු වකුගේ හඬට බදු හඬක් ඇති **උදය** තෙරුන් නිදන කොට චිතයෙහි දී **අනුජානාමි භික්ඛවෙ පාතිමොක්ඛුද්දෙසඤ්ඤෙන වාය මිතුං කථං සාවෙය්‍යන්ති වායමන්තස්ස ආපත්තිති** යි පාමොක් උදෙසීමේදී මහණෙනි, උදෙසන්නහු විසින් කෙසේ අනුසාවනය කෙරෙම් දැයි හෙවත් භික්ෂූන්ට කවරපරිද්දකින් ඇසෙන සේ කියම් දැයි වැයම් කරන්ට අනුදනිමි. එසේ වැයම් කරන්නහුට ඇවැත් නැතැයි වදාළ අවවාද සිත තබා **මෙත්තචිත්තං පුරෙවාරිකං කත්වා චිත්තබ්බං** යි කියූ පරිදි මෙත් සිත් පෙරදැරිව පිරිසට ඇසෙන සේ මහන්සි ගෙන හෝ ආටානාටිය ආදි පිරිත් දෙසිය යුතු සි.

බුද්ධකාලයේ පටන්ම හත්දවසේ බණ පිරිත හා වෙනත් පිරිත් ක්‍රම පැවතියහ. හත්දවසේ බණපිරිතේ කාලය

සත්දවසේ බණ පිරිත් හා වෙනත් පිරිත්

හයදවසකින් හෝ හයදවසකුත් භාගයකින් පවත්වයි– හත්දවසේ බණ පිරිතට දින හතක් ද එහි දවල් හතක් හා රෑ හතක් ද සම්පූර්ණව අරුණු අටක් ද සම්බන්ධ වියයුතු වේ– මාසයේ 1 වෙනිදා රෑ පිරිත පේ කෙළේ නම් 2 වෙනිදාට අරුණු නැඟ එන වේලෙහි **විපත්ති පටිබාහාය—පෙ—පරිත්තං** බ්‍රැහ්ම මඬලං යනාදීන් ආරාධනා ඇතිව පිරුවාණා පොතෙන් පිරිත් දෙශනාව පටන්ගෙන මාසයේ අට වෙනිදා රෑ පිරිත හමාර කිරීමෙන් දවල් හා රෑ හතකින් සප්තාහයාගේ සම්පූර්ණවීම් ද, දෙවෙනි දින උදය අරුණ ද නව වෙනි දින උදය අරුණ ද යන දෙ අරුණේ සම්බන්ධය ද සිදුවේ යනු නිදර්ශිතයි–මීට පිරිත පේකළ රාත්‍රිය දිනයක් ලෙස ගැනීම සුදුසු නො වේ. **භික්ඛූ සත්තරත්තිඤ්ඤිවං නිරන්තරං පරිත්තං භණිංසු– සත්තමෙ දිවසෙ සායං සත්ත පි ආණඤ්ඤි– සත්තාපි ඛඛරත්තිං පරිත්තං අභාසි– සත්තාහෙ විතිවත්තෙ අවරුද්ධා දුරභං න ලභි– අට්ඨමෙ පන අරුණෙ උගතමත්තෙ දුරභං ආනෙත්වා සත්ථාරං වන්දාපෙසුං– භික්ෂූහු රෑ දවල් හතක් නිරතුරුව පිරිත් කිහ. සත්වන දවසෙහි සවස ශාස්තෘන් වහන්සේද වැඩිසේක. ශාස්තෘන් වහන්සේ ද සියලු රෑයෙහි පිරිත් කළසේක. සත්දවස ඉක්මුණුකල්හි අවරුඬතෙම දරුවා නොලද්දේය, අටවන අරුණ නැගිකෙණෙහි දරුවා ගෙනවුත් බුදුන් වැන්දවූහ–** යනු දීඝාඅු කුමාරවත පිළිබඳ අටුවා හි.

මේ අටුවා පාඨයෙහි ප්‍රකාශවන සත්දවසේ පිරිත "**සත්තාහෙ–සත්තරත්තිඤ්ඤිවං – සත්තම දිවසෙ සායං–අට්ඨමෙ පන අරුණෙ උග්ග–තමත්තෙ**" යන වචනානුසාරයෙන් රෑ දවල් හතක් ද අටවන අරුණට අවසානවීම් ද ඉතාම පැහැදිලිය–මෙහි ලා හත්දවසේ පිරිත් පටන් ගැනීමේ දී රෑ පේකර තබා අරුණෝදය කාලයේ, "පිරුවාණා පොත ඇරඹීම හා පේකළ පිරිත නොකීයා තැබීම" ද මීට සාධකයකි. පිරිත් පේකොට නොකීම පිළිබඳ හේතුවට නානාවිධ මත පලවෙතත් හේතුව නම් හෙට අරුණු නැඟ එන වේලෙහි අරඹන පිරිතට අද රෑ

සියලු කටයුතු නිමවා පේකර නිමකර තිබීමය. මෙසේම හත්වේලේ යයි කියන තිස්පැහතේ පිරිත ද පේකර නොකියා හැරියේ නම් සයවේලේ පිරිතක් වත බව ද අනුශාසනා ප්‍රකාශයෙහි දී තිස්පැහතක් යි කීමට සුදුසුකම් නොලබන බව ද සැලකිය යුතුය.

අනෙතාගාමෙ පි ගිලානසඝස්ස විහාරං පෙසෙන්ති පරිත්තං භණන්තු ති භණිතබ්බං යනු විනය නියම බැවින් ඇතුල් ගමෙහි දු ගිලනුන් පිණිස පිරිත් කියත්වා යි දන්වා එවත් ද කිය යුතුයි- යනු හැවයි. මෙසේහෙයින් තිස් පැ පහ, තිස් පැ තුන, තිස් පැස, වරු, යනාදීන් පවත්වන සියලු පිරිත් ආගමානුකූල වේ.

ආටානාටිය පරිතණ්ඩනයට පළමුව ආටානාටිය සූත්‍රතත්ත්වය දත යුතුය. ආටානාටිය වනාහි අමනුෂ්‍ය උවදුරු වළක්වාලීමට පිරිතකි. අප බුදුහු රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වසන කල්හි වෙසවුණු ආදි සතරවරම් දෙවිරජහු බුදුන් කරා එළඹ එකත්පස්ව හුන්හ. වෙසවුණුතෙම නිදුකාණන් වහන්සේ! යක්ෂයෝ බොහෝසෙයින් බුදුන්ට අප්‍රසන්නයහ. බුද්ධධර්මයෙහි අප්‍රසන්නවූ ඒ යක්ෂයන්ගේ ප්‍රසාදය පිණිස ද සිවුවණක් පිරිසගේ ආරක්ෂාදිය පිණිස ද මේ ආටානාටිය පිරිත පිළිගත්තු මැනව යි ආරාධනා කොට "විපස්සිස්ස නමත්ථු" යනාදි ආටානාටිය පිරිත කීය.

එහි අවසානයෙහි දී නිදුකාණන්වහන්ස, භික්ෂු භික්ෂුණ්‍යාදි යමෙක් මෙය ඉගෙන පුහුණු කෙළේ නම්- යම්කිසි අමනුෂ්‍යයෙක් ප්‍රදූෂ්‍යයිත් ඇති ව යන සිටින හිඳින සැතපෙන ඒ ආටානාටිය පුහුණු කළහුට ළංව සැම් ආදියක් කෙළේ නම්- ඒ අමනුෂ්‍යයා ගම්නියම්හම්හි සත්කාර ආදියක් හෝ ආලකමන්දවෙහි විසීමක් හෝ යක්ෂසමාගමයට යන්නට හෝ නොලබයි. ඔහුට අමනුෂ්‍යයෝ කීදු කොට ඛණින්නාහ. වධ ද කරන්නාහ. සවාමීනි වණ්ණවූ රෞද්‍ර වූ සතරවරම් මහරජුන්ට පසම්තුරු වූ අමනුෂ්‍යයෝ ද ඇත්තාහුය. ඒ යම්කිසි අමනුෂ්‍යයෙක් ප්‍රදූෂිත සිත් ඇති ව සිවු විනක් පිරිසෙහි කවරකු අනුව යෑම් සිටීම් හිඳීම් වැදහෙව්ම් කෙළේ නම් මේ යක්ෂසේනාධිපතීන්ට "අයං යකෙඛා ඛණ්ණාති" යනාදීන් අඩ හඬ මුර හඬ කියයුතුය.

එකල්හි මහා යක්සෙනෙවි ආදීහු **යක්ඛාණත්තිය** කරම්හ සි උත්සාහ ඇතිවෙත්- නිදුකාණන් වහන්ස; මේ ආටානාටිය පිරිත සිවුවණක් පිරිසගේ ආරක්ෂාව පිණිස යෙහෙන් විසිම පිණිස පවත්නේ යයි දන්වා සතරවරම් මහරජදරුවෝ පිරිස් සහිතව අතුරුදහන් ව ගියහ. මෙසේ ආටානාටිය පිරිත අමනුෂ්‍ය උවදුරු දුරු කිරීම සඳහා පළමුව වෛශ්‍රවණාදීන් විසින් කියනලද පසුව බුදුන් විසින් අනුමත කොට වදාරනලද පිරිතකි.

එයින් අමනුෂ්‍ය උවදුරු සඳහා පිරිත් පැවැත්වීමේදී කළයුතු පරිකම්විධි ආටානාටියපරිකම් යයි **අට්ඨවාවේ** දක්වනලදි. **පරිකම්මන්ති පුබ්බාපචාරං** යනු විකා හෙයින් පරිකම් නම් පූර්ව උපචාර ක්‍රියා සි.

පඨමමේව හි ආටානාටියසුත්තං න භණිතබ්බං සි පළමුව වදාහි ආටානාටිය සූත්‍රය නොකිය යුතුය සි දැක්වූ බැවින් මේ පිරිත පිරිත්අවසානයෙහි කියනු ලැබේ. ආටානාටිය පරිකම් වශයෙන් විහාරඅස්න ද, දේවාලය තල්පත ද, දේව පෙරහර ද පවත්වනු ලැබේ. **විහාරස්ස උපචාරෙ ජෙට්ඨකරුක්ඛා නාම හොන්ති තත්ථ භික්ඛුසඞ්ඝා තුම්හාකං ආගමනං පතිමානෙන්ති පතිඛණිතබ්බං** යනු වෙන් විහාරයට සමීපවත්තයෙහි ප්‍රධාන රුක්කෙක් වෙයි. එහි භික්ෂුසඞ්ඝයෙම යුෂ්මතුන්ගේ ඒම කැමති වේ යයි හස්තක් යැවිය යුතුයි.

මෙහි "පතිඛණිතබ්බං" යන්නෙන් හස්තක් යැවිය යුතුබව ද ඒ ගෙනයන්නෙක් ඇතිවියයුතුබව ද ප්‍රකාශ වේ. **හස්ත** නම් වාක්‍ය සහිත දේවාලය තල්පත් ය. හස්ත ගෙනයන්නා නම් **දේව දූතයා** ය. **විහාරඅස්නෙහිදී** "මේ දේවාලයෙහි අධිගෘහිත දෙවිමහරජාණන්... දෙවියනුත් නොහැර කැඳවාගෙන මඟුලසූත්‍රාදි බණ අසනු පිණිස ඒම සමග මහා සඞ්ඝයාවහන්සේට අභිමත සි සඞ්ඝායණත්තිය නූගුලුවා ඉය යුතු' යයි- දක්වනුයේ මේ **අට්ඨවා** පාඨයෙහි, **භික්ඛුසඞ්ඝා තුම්හාකං ආගමනං පතිමානෙන්ති** යන වචනයන්ගේ අදහස් ගෙන ය. විහාරස්ථාන රාශියක නම් විස්තර කොට ප්‍රකාශ කරන්නේ එහි අධිගෘහිත දෙවියනුත් සිහිපත් කිරීම හා කැඳවාගැනීම පිණිස ය.

දේවාලය තල්පතේ ලියනු ලබන වාක්‍ය විහාරඅස්නෙහි මූල අග සඳහන් වාක්‍ය බැවින් මේ දෙක ම අට්ඨකථා උපදෙශයෙන් නැනූ වාක්‍ය බව දතයුතු ය. මීට තල්පතක් ගනු ලබන්නේ අමනුෂ්‍ය උවදුරු සඳහාය. **තාලපණ්ණං පන පරිත්තසුත්තං වා හත්ථෙ වා**

පාදෙ වා ඔක්කිනඛං යන **අටුවා** පාඨයන්හි අමනුෂ්‍ය උවදුරු සඳහා තල්කොළ බැඳීම් කියනලද හෙයින් ද අයෝඝර ජාතකාදි–යෙහි අමනුෂ්‍ය උවදුරු නවතාලිමට පූජාකාලයෙහි ද තල්කොළ භාවිත කළ බැව් දක්වා තිබීම් ආදි කරුණු ද උපදෙස් කොට ගෙන ය.

දේවපෙරහර ද **පහිණිතඛඛං** යන්නෙන් භගවත දේවදූතයා ජෙට්ඨකරුකඛය කරා ගමන් කිරීමෙහි පවත්වන පෙරහර ය. එහි දී දේවදූතයා ගෙන යන දේවාල තල්පත් සතරවරම් දෙවියන් වෙනුවට සතරක් ලියා එය ගෙනයාමට සුදුසු පරිදි තනාගන්නා සික්කා (සාල්ල) දෙකකින් යුත් කාජඝටරූපයකට **හේමඤ්ඤ** යයි කියනුලැබේ.

මෙසේ හෝ නැතහොත් අවු තල් කොළ ලිපි අවු වැනි සුළු යන ආදියෙන් බේරා ගැනීම පිණිස වස්ත්‍රාවරණයක් පිළියෙළ කොට ගෙනයාම මෙයින් අදහස් කෙරෙයි. මෙය කදක් වැනිව කළ සැරසීමක් හෙයින් කද යයි ව්‍යවහාරයට ගත්තාක් මෙන් ම සඛණ්ඩාදි අර්ථවාචක හේම යන්නකින් වෙසෙසා **හේමඤ්ඤ** යයි ද ව්‍යවහාර කළහ.

(1) හේම (ස්‍නෙහවූ නිහීයවූ) කද **හේමඤ්ඤ** යි, (2) හේමවණ්ණ (රන්වන්) කද **හේමඤ්ඤ** යි, (3) හේම බදු (රතක් බදු ශ්‍රෙෂ්ඨ) කද **හේමඤ්ඤ** යි. (4) සෝම බදු (අමෘතයක් බඳු) කද **හේමඤ්ඤ** යි, (5) සෝමන් වලින් සැරසූ කද **හේමඤ්ඤ** යි, (6) රුසි වශයෙන් හෝ **හේමඤ්ඤ** යනු මේ සඳහා මතානන්තර වශයෙන් සලකනු ලැබේ. ආඛ්‍යානාවිය පරිකම්ම විභයෙහි වූ සියලු කවයුතු අමනුෂ්‍ය ඕතාරය වළක්වන ක්‍රියාවිශෙෂයන්ගෙන් යුක්ත ය. මෙහි දී **දිවා ච රත්තෙ ච හරන්ති යෙ බලිං තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා** යි රතනසූත්‍රයෙහි ද **යෙ මනුස්සා විත්තකමම. කථඤ්ඤ කම්මාදිහි දෙවතා ඤත්වා චෙතියරුක්ඛාදීනි ච උපසංකම්මිත්වා දෙවතා උද්දිස්ස දිවා බලිං කරොන්ති, දීපපූජං ච ඤාලපක්ඛාදිසු රත්තිබලිං කරොන්ති** යනාදීන් රතනසූත්‍ර අටුවාවෙහි ද දැක්වූ උපදෙශ ආශ්‍රයෙන් දේවපූජා විධියක් ද සම්පූර්ණ කරනු ලැබේ. රතනසූත්‍ර අටුවාවෙහි ම **භගවා නගරචාරෙ ඨත්වා ආනන්දත්ථෙරං ආමන්තෙසි, ඉමං ආනන්ද රතනසුත්තං උග්ගහෙත්වා බලිකම්මූපකරණානි ගාහාපෙත්වා ලිච්ඡවිකුමාරෙහි සද්ධිං වෙසාලියා තිසුපාකාරන්තරෙසු විවරන්තෙ පරිත්තං කරොහි ති** යි දැක්වූහ. 'මෙහි **බලිකම්මූපකරණානි** යන්නෙන් දේවපූජා උපකරණ ද, **හරන්ති යෙ බලිං** යන්නෙන් දේවපූජාව ද, **ගාහාපෙත්වා**

ආනන්දත්ථෙරං යන්තෙන් භික්ෂූන් ද උපදෙස් කොට ගෙන දෙවඳුරා උපකරණ ද දෙවදූතාදි පිරිස් ද ඇතිව **මේ දේවපෙරහර** පවත්වනු ලැබේ. **පරිත්තකාරකෝ භික්ඛු විහාරතෝ සරං නෙතෙනහි ඵලකාවුධෙහි පරිවාරෙත්වා නෙතබ්බා** යනු අටුවා බැවින් පිරිත් කරන භික්ෂුව විහාරයේ සිට ගෘහයට කැඳවා ගෙන යන්නවුන් වීසින් ඵලකාවුධයන්ගෙන් පිරිවරා කැඳවාගෙන යායුතු යයි උපදේශයකි.

එය ඇසුරු කොට අමනුෂ්‍ය උවදුරු දුරුකරනු සඳහා පවත්වන ආටානාටිය පරිකර්මය වූ දේවපෙරහරෙහි ගමන් කරන භික්ෂු-දෙවදූත ආදීන්ගේ ආරක්ෂා පිණිස ඵලකාවුධ ආදිය පිරිවරා පෙරහර පිළිබඳ ගමනාගමනය සිදුකරනු ලැබේ. මෙහි දී ඵලකාවුධ ගැනීම අමනුෂ්‍යයන් වැනසීම පිණිස නොව **ආවුධහත්ථෙහි සම්පරිවාරිතෙන මෙත්තචිත්තං පුරෙවාරිභාං කත්වා වත්තබ්බං** යනු අටුවාවෙහි ද **පරිත්තකාරකෝ, -පෙ- සම්පරිවාරිතෙන, ති ඉදං පරිත්තකරණං බාහිරං රක්ඛාසංවිධානං, මෙත්තචිත්තං වත්ත-බ්බන්ති ඉදං අබ්භන්තරං රක්ඛාසංවිධානං, එවං හි අමනුස්සා පරිත්තකරණස්ස අන්තරායං කාතුං න ච්ඡහන්ති** යනු ටීකායෙහි ද කියනලද බැවින් ආවුධ ගත් අත් ඇත්තන් වීසින් පිරිවරනලදුව මෙත් සිත් පෙරදැරිව එහෙයින් බාහිරාරක්ෂා ද අභ්‍යන්තරා රක්ෂා ද ඇතිව **ආටානාටිය** බිණිය යුතුයි.

මණ්ඩප දොරකඩ සිට මහාසඞ්ඝයාට සැලකරනා අස්න **දොරකඩ අස්න** නම් වේ. මෙය ද ආටානාටිය පරිකර්ම විශෙෂයකි. මහාසඞ්ඝයාගේ ආණත්තියෙන් දෙවාරාධනාව සඳහා දෙවදූත නාමයෙන් ගියහු විසින් යැවූ අස්නට පිළිතුරු දෙන පිණිස පවසන වාක්‍යාදිය දොරකොඩ අස්නෙහි එයි. **සඞ්ඝසන්නිපාතට්ඨානෙ අනාගතං නාම න ලභති** යනු අටුවා යි. ආටානාටිය ආරක්ෂා ක්‍රමය සතරවරම් දෙවියන්ගේ ද, අට්ටවිසි යක්ෂසේනාපතීන්ගේ ද කැමැත්ත පරිදි විහිත ආරක්ෂාක්‍රමයකි. ඊට ඔවුන්ගේ සම්බන්ධය සැමවිට ම ඇතිබව **සූත්‍ර-අටුවා** දෙකින් ම පැහැදිලි වේ. ඊට පරිකර්ම වශයෙන් සඞ්ඝාණත්තිය ඇතිව දෙවාරාධනා යැවූ පසු දෙවියන්ගේ පැමිණීම එකාන්තයෙන් සිදුවියයුතු ය. සඞ්ඝපතිමාන්තණය සඞ්ඝා-ණත්තිය නිරොධසමාපත්තියට පැමිණියහු පවා කඩ නොකෙරෙත්.

එහෙයින් දෙවියන්ගේ පැමිණීම ද වියයුතු බැවින් සියලු සඞ්ඝයාගේ සන්නිපාතස්ථානයෙහි නොපැමිණෙන්ට නම් නො ලැබේ යයි අටුවා ප්‍රකාශය විය. මෙසේ දෙවියන්ගේ පැමිණීම

අසඞ්කීත හෙයින් "දෙව්යොත් අවුදු"යි පිළිවිසි ප්‍රශ්නයට දෙවදූතයා "දෙව්යෝ සහ පිරිවරින් වැඳසේකි"යි මහාසඞ්ඝයාට දන්වා සිටීම දෙරකඩ අස්නෙහි පිණ්ඩාර්ථය වේ. මෙසේ මෙය අර්ථකථා උපදේශානුගත විචිත්‍ර වාක්‍යනිර්දේශයකි. මෙය පූර්ව සිංහල බෞද්ධ නරෙන්ද්‍රයන් දවස ඇගමාන්නකුල ව තත්කාලානුරූප ව ඝටිත බැවින් වර්තමාන කාලානුරූපව මඳ වෙනස්කම් ඇති කොට කියයුත්තක් සේ තද්වාක්‍යාර්ථ ගවේෂණයෙන් ප්‍රතීත වේ. මේ සඳහා නානා මතභේද ඇත ද ඒවා මෙහි අනාදෘත ය.

මහා සඞ්ඝාණත්තියෙන් රැස්වූ දේව අමනුෂ්‍යාදීන්ට පුණ්‍යානුමෝදනා සහිතව කරන අනුශාසනය **අනුශාසනී** නම්. මෙ ද ආඛ්‍යාතාවිය පරිකර්මයකි. එසේම මෙය ආඛ්‍යාතාවිය සූත්‍ර අටුවාවේ අදහස් ගෙන ගළපතලද ගද්‍ය බන්ධයෙකි. පළමුව පිරිත පවත්වන තන්හි රැස් වූ දෙවියන්ට පින් දී "පින්අනුමෝදන්වූ දිව්‍යසමූහයා විසින් පින්කම කරවන දායක කාරකාදීන්ට දුෂ්ට **අනුශාසනාව** අරිෂ්ට අමනුෂ්‍ය කෙනෙක් ඇත් නම් ඔවුන්ට අවවාදානුශාසනා කොට ඍද්ධිබලයෙහි පිහිටුවා දායකකාරකාදීන්ගේ පිඩා සන්සිඳුවා සකලෛශ්වර්‍යෝපභෝගාදී වර්ධනය කරවයුත්තේය" යි දෙවියන්ට අනුශාසනා කිරීම ද එසේ අවවාදක්ෂම නොවන අමනුෂ්‍ය කෙනෙක් වූහු නම් "සත්තධාපිස්ස මුද්ධං ඵාලෙය්‍යං" යන ප්‍රකාර අමනුෂ්‍යදණ්ඩන දැක්වීම ඇති ආඛ්‍යාතාවිය පිරිත කියනු ලැබේ යයි කීමට පළමුව අවවාදානුශාසනා කිරීම ද මෙහි අනුශාසනාක්‍රමය බව අන්‍යතෙහි වූ වාක්‍යාදියෙන් ස්ථිර ය.

භික්ඛුසඞ්ඝෙන තුච්ඡං පණ්ණාකාරත්ථාය මහාමඞ්ගල ඝාථා වුත්තා යන අටුවා පාඨය උපදෙස් කොට "මෙතැන්හි රැස් වූ දෙවියන්ට පඬුරු පිණිස —පෙ— මහාසඞ්ඝයාවහන්සේ —පෙ— මඞ්ගල සූත්‍රය ගණසජ්ඣායනා කොට වදාළසේක." යනු අනුශාසනා-වෙහි දැක්වේ. **මාලාගණ්ඨාදිසු පතති, ආසනපූජාය පතති, පිණ්ඩපාතෙ පතති දිනනා, ගන්ධමාලාදිසු පතතිං දත්වා පරිනතං භණ්ඩකඛං** යන අටුවා වාක්‍යාදිය උපදේශ කොට "බුද්ධාදි රත්නත්‍රය විෂයෙහි පවත්වනලද දීපපූජා ධූපපූජා පුෂ්පපූජා සුගන්ධපූජා වන්දනමානනාදි සත්කාර කරණයෙන් ජනිත වූ පින්-අනුමෝදන් විය යුත්තේ ය" යනාදි අනුශාසනා වාක්‍ය නිබන්ධිත ය.

එසේම සුවඳපූජා, මල් පූජාදියෙහි පින් දී ආඛ්‍යාතාවිය පිරිත බිණිය යුතුය යි කියූ බැවින් සවිසතර විචිත්‍ර වාක්‍යයන්ගෙන් පුණ්‍යානුමෝදනා කිරීම මෙහි වාක්‍ය ඛණ්ඩයන්ගෙන් ප්‍රකාශ වේ. පිරිත්

පින්කමෙහි පුණ්‍යානුමෝදනා කොට අර්ථකථා උපදෙශානුසාරයෙන් දේව අමනුෂ්‍යයන්ට අනුශාසනය කොට ආටානාටිය සූත්‍රය කියා අමනුෂ්‍ය උවදුරු දුරුකර ගැන්ම දක්වීම අනුශාසනාවෙහි පිණ්ඩාර්ථය යි. මෙය ආටානාටිය සූත්‍ර තදර්ථකථා තථිටිකා අදහස් ගතී කොට ඇති එහි අනුවාදයක් බඳු ආගමානුකූල විචිත්‍ර පුණ්‍යානුමෝදනා සහිත **අනුශාසනාවකි.**

ඉමිස්සාපි ගාථාය ආණ කොටිසතසහස්ස චක්කවාළෙසු අමනුස්සෙහි පටිගහණිතා යනු අටුවා යි. රතනසූත්‍රයෙහි බුඩ භාසිත එක් එක් ගාථාවෙක **ආණ** කෙළ **පිරිත් තත්ථය** ලක්ෂයක් සක්වළ අමනුෂ්‍යයන් විසින් පිළිගන්නාලදැ යි කියනලදි. **යස්ස ආණා-කෙඛත්තෙන කොටිසතසහස්ස චක්කවාළෙසු ආනුභාවෝ වත්තති** යනාදීන් ධජග්ගසූත්‍රාදියෙහි ආනුභාවය ද බුඩාඥා-ක්ෂේත්‍රය වූ කෙළ ලක්ෂයක් සක්වළ පවත්නා බව ප්‍රකාශිත ය.

එසේ හෙයින් පිරිත්ධර්මය අනීන් ධර්ම මෙන් නොව විශෙෂ ආරක්ෂක අණබලයකින් යුක්ත ය. ගාථා කොටස් සොළසක් කොට කොටු සොළසක ලියාගන්නා වූ ද අකුරු දහසකින් යුක්ත බැවින් කොටු දහසක් කර ලියාගන්නා වූ ද. රතනසූත්‍රයේ ක්‍රමය වැනි ආශ්චර්‍යක්‍රම ඇති මේ පිරිත් ධර්මය අද්භූත බුඩමන්ත්‍ර විශෙෂයකි. **මෝරපරිත්ත** අටුවාවෙහි **රක්ඛාවරණත්ථාය බ්‍රහ්මමන්තං බන්ධිත්වා උදෙතයන්ති ආදිමාහ** සී මෝරපරිත්තය බ්‍රහ්මමන්ත්‍ර යයි ව්‍යවහාර කර තිබේ. **දීඝායුකුමාර** වස්තුවෙහි දී මණ්ඩපය මැද හුන් සත්හැවිරිදි කුමරුට සත් දිනක් බුඩශ්‍රාවකයෝ පිරිත් කළහ. එහි දී කුමරුගේ ධර්මශ්‍රවණයකින් ම ලද ආරක්ෂාවක් නොව පරිත්තානුභාවයෙන් පරිත්ත ශබ්දවිශ්ලාර වශයෙන් ලද ආරක්ෂා-වක් බව කුමරුවාගේ ළදරු තත්වයෙන් ම අවබෝධ වේ.

එසේම විසල්පුරයට වැඩි ආනන්දමහතෙරුන් විසින් **රතන-සුත්තං උග්ගණ්හිත්වා ආයස්මා ආනන්දෝ පරිත්තත්ථාය භාස-මානෝ —පෙ— අනුව්‍යඩි** රතනසූත්‍රය ඉගෙන ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ පිරිත් පිණිස කියමින් නුවර හැසුරුණු සේකැ යි පිරිත් පැවැත් වූ ක්‍රමය ධර්මදෙශනා කිරීම්, ධර්මශ්‍රවණය කිරීම් වැනි ක්‍රමයක් නොව ප්‍රධාන වශයෙන් පරිත්ත ධර්මානුභාවය පැහැරවීමකැ යි පැහැදිලි ය. **බන්ධපරිත්ත** අටුවාවෙහි **අතීතෙපි මහාසත්තෝ බ්‍රාහ්මණ මහාසාරකුලෙ උප්පජ්ජිත්වා විඤ්ඤුතං පත්තෝ පබ්බජිත්වා අභිඤ්ඤා උප්පාදෙත්වා වනෙ වසන්තෝ**

අත්තනෝ අනෙතවාසික තාපසානං දීඝජානිකි උපද්දවං දිස්වා ඉදමේව පරිත්තමද්දසාසි අතීතයෙහි දු මහාබොධිසත්ව තෙම බ්‍රාහ්මණ මහාසාර කුලයෙහි ඉපද ප්‍රාඥබවට පැමිණ පැවිදිව අහිඤ්ඤ උපදවා වනයෙහි වෙසෙමින් තමාගේ අනෙතවාසික තාපසයන්ට දීඝජානින්ගෙන් වන උපද්‍රව දැක මේ ඛන්ධපරිත්තය ම දැක්වීය සි ප්‍රකාශිත ය.

එසේම මයුර යෝනියෙහි උපන් බෝධිසත්වතෙම ගෝචර භූමියෙහි තමාගේ ආරක්ෂාව පිණිස **උදෙතයං චක්ඛුමා එකරාජා** යනාදීන් මෝරපරිත්තය භාවිතා කළ බව ද කථිත බැවින් පිරිත් ධර්මාරම්භය බොධිසත්ව කාලයෙහි ම ය.

බුදුරජාණන් වහන්සේ විසින් පිරිත් වශයෙන් ද ධර්මවශයෙන් ද වදාළ රතන සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය, ඛන්ධ පරිත්තය ධජග්ග පරිත්තය යනාදිය ඉගෙන පැවැත්විය යුතු බව තත් සූත්‍ර සූත්‍රාංශ කථාදියෙන් ම ප්‍රකට වන බැවින් පිරුවානා පොහට ඇතුළත් පරිත්ත සූත්‍රයන් පිරිත් වශයෙන් මුඛපාඨ වශයෙන් සංග්‍රහවීම ද පැවැත්වීම ද බුඩකාලයෙහිම සිදු වූ බව **සත්තාහං නිරන්තරං කත්වා පරිත්තං භණිංසු** යනාදි බුඩකාලික පිරිත් වලින් දතයුතු වේ.

ලංකා විජයාවතරණ ප්‍රවෘත්තියෙහි දී **පරිත්ත සුත්තතෙජෙන භක්ඛිතුං සා න සක්කුණී** යනුවෙන් අතබැඳි පිරිත් නූ තෙදින් ඒ යක්ෂණියට විජය ඇමතියන් කන්ට නොහැකි වී යසි ද ඇමතියන් සහිත **විජය** කුමරු පිරිත්පැන් පිරිත්නූල් ලද බව ද කියනලද හෙයින් පිරිත්ධර්මය ලංකායෙහි මනුෂ්‍යවාසාරම්භයට පරමොපකාරව සිංහලජාතියෙහි සියලු ආදිපුරුෂයන්ගේ ජීවිකාරක්ෂාව සිදුකෙළේ ය. පිරිත්ධර්මය නැති නම් සිංහලජාතියක් නැති බව ඉතිහාසානුගතව සැලකිය යුතු ය.

රුවන්මැලි සෑයේ ධාතු නිධානාවසථායෙහි **දුටුගැමුණු** මිහිපති තෙම වසත්‍රයන් හා උක්සකුරු ගිතෙල් ආදිය සංඝයාට දී මුළු රැය භික්ෂූන් ලවා ගණසජ්ඣායනාව කරවූයේ යසි ප්‍රකාශිත ය. (ගණසජ්ඣායනාව නම් භික්ෂුසමූහයක්ව හදාරන පිරිතට ද නමෙකි.) **භාතිය** රාජකාලයෙහි **ගණසජ්ඣායසද්දං සුත්වා ධාතුගබ්භමහි තාදිනං** යනුවෙන් රුවන්මැලි සෑ ඇතුළෙහි රහතුන්ගේ ගණසජ්ඣායනා ශබ්දය ඒ **භාතිය** රජ අසා යසි දැක් වූ බැවින් මේ පිරිත් ධර්ම රහතන්වහන්සේලාගේ වත්පිරිත් වශයෙන් ද පැවැති

බව ප්‍රකට වේ. අපිකථාකාල සමීපයෙහි වූ **උපතිස්ස** රජුගේ කාලයෙහි ලක්දිව උපන් දුර්භික්ෂ රෝගපීඩා සඳහා එම රජතෙම තෙමේත් සිල්සමාදන්ව මහජනයා ද සිල්සමාදන් කරවා මිහදන් හා සියලු ප්‍රාණීන්ට අභය ද පවත්වා නුවර දෙවිපුරයක් සේ මනහර කොට සරසා ලක්දිව වැසි සියලු භික්ෂූන් රැස්කරවා මහවෙයට බවුසේය. එකල්හි රැස්වූ භික්ෂූහු රුවන්සුත බෙණෙමින් රජගෙයය, වේමගය, පවුරය, යන තන්හි දියඉසිමින් පැදකුණු කෙරෙමින් ඇවිද්දහ. තුන්යම් රාත්‍රිය අවසන්හි අරුණු නැඟ එන කල මිහිතෙලෙහි මහාමේඝයක් වැස්සේය. සියලු රෝගාතුරයෝ සුවපත් වූවාහු සැණකෙළි කෙළියහ.

රජතෙමේ "මතු ලක්දිව්හි යම් කලෙක දුර්භික්ෂ භයාදියක් වන්නේ නම් මෙසේ කෙරෙත්වා සි නියෝග කෙළේ ය." යන ප්‍රවත **මහාවංශයෙහි** පෙනේ. මෙයින් පිරිත් පැවැත්වීම පෙර සිංහල රාජනීතිගත චාරිත්‍රයක් බව ද ඔප්පු වේ. ටිකාකාලය වූ පොළොන්නරු **මහාපරාක්‍රමබාහු** රාජකාලයෙහි එම රජතෙම බෞද්ධ භික්ෂූන් විසින් දෙනලද පිරිත් පැන් පිරිත් නූ ගන්නා පිණිස මන්දිර පන්සැත්තැවක් පුලස්තිපුරයෙහි ම කරවී යයි **මහාවංශයේ** එන බැවින් එකල ලක්දිව පැවති පිරිත් ධර්මප්‍රචාරය ආශ්චර්‍ය්‍ය ය. දඹදෙණිපුර **පණ්ඩිත පරාක්‍රමබාහු** කාලයෙහි සියලු ලක්දිව එකම උතුම් පූජාවක් කරවා පුද පෙරදැරි කොට මහබික්සහු එක්කොට පිරිතුදු බැණවිය යන මෙයින් එම මහරජහු විසින් කියවනලද පිරිත් ප්‍රකාශ වේ.

මෙසේ පෙර ද පසු ද උත්තම පිරිත්ධර්මයාගේ පැවැත්ම අති ප්‍රසිද්ධ ය. සම්‍යක් සම්බුද්ධ ප්‍රභව වූ ඒ ධර්මය ප්‍රථම සංගීතියෙන් පසු පස්මහසඟියට ඇතුළත් කොට සංගීතව ලංකාවේ පුස්තකාරූඪ සංගීතියෙහි දී පුස්තකාරූඪ විය. **පිරිත්පොත** වශයෙන් පිරිත් ධර්මය වෙන්ව ලියාගැනීම ද එතැන් පටන් සිදුවිය සි සැලකිය යුතු වේ. පිළිසිඹියාපත් රහතුන් ප්‍රමුඛ ථෙරවාද පරම්පරායෙහි මුඛපාඨාගත සාර්ථකථා ත්‍රිපිටකය පුස්තකාරූඪවූ පසු දඹදිව ද ලිඛිත පුස්තක වශයෙන් **චතුභාණවාර පාළිය** විසිර ගියේ ය.

ජම්බුද්වීපික **බෙවත** මහාස්ථවිරයන් වහන්සේ සමීපයෙහිදී **බුද්ධඝෝෂ** මාහිමියන් ත්‍රිපිටකය ඉගෙන දඹදිවදී ම එහි පැවති ධම්මසංගණී ප්‍රකරණයට අට්ඨසාලිණී අට්ඨකථාව ලියා **පිරිත්අටුවාව** ද ලියන්ට ආරම්භ කරනලදී. පසුව සම්පූර්ණ ත්‍රිපිටක පොත් හා අට්ඨකථා

පොත් ආදිය ලස්දිවයෙ, එහි ගොස් අටුවා ලියයුතු යයි සඟරුවනේ ප්‍රේරණයෙන් ලක් වැඩ පාළිඅටුවා ලියන ලදහ. මෙයින් අටුවා කාලයෙන් පෙර ම **පිරිත්පොත** පැවතියේ යයි ද බුඩකාලයේ පටන් පවත්වමින් මුඛපාඨවශයෙන් ගෙනා පිරිත්ධර්මය ප්‍රඥාකාරුඨ සංගීතියෙන් පසු පිරිත්පොත් බවට පැමිණියේ යයි ද කියයුතු ය.

කීර්ති ශ්‍රී රාජසිංහ රාජකාලයෙහි වැඩ විසූ **වැලිවිට ශ්‍රී සරණඩකර සංඝරාජ** මාහිමියන් විසින් පිරිත්පොතට **සතර බණවරසන්න** නම් ව්‍යාඛ්‍යානය කර වදරනලදි. මෙකල කොළඹ පැලියගොඩ විද්‍යාලඩකාර පරිවෙණාධිපති **කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර** ප්‍රධාන නායක සඟමිණ්ඩුයන් වහන්සේ විසින් චතුභාණවාර ඨඨකථාව හා වෙනත් ධර්ම ප්‍රකරණ ද බලා ශ්‍රද්ධා බුද්ධිසම්පන්න බෞද්ධ මහාජනතාවගේ උභයාර්ථ සංසිද්ධිය සලකා මෙම චතුභාණවාර පාළිය හා ධර්මවිස්තර සහිත සිංහලපිරිත්පොත සම්පාදනය කරනලදි.

මෙසේ පොෂිත වූ පිරිත්ධර්මය පිළිබඳ තත්වය දැන ධර්මවශයෙන් අතිවිශිෂ්ට ධර්මසංග්‍රහයක් වූ ද, පිරිත් විසින් අතිවිශිෂ්ට ආරක්ෂක දෙශනාසංග්‍රහය වූ ද, **පිරුවානාපොත** අටුවා, ව්‍යාඛ්‍යාන, සහිතව උද්ග්‍රහණ, ධාරණ, ප්‍රවර්තන, ශ්‍රවණාදියෙන් සවාර්ථ පරාර්ථ සංසිඩියෙන් ලොව් ලොවුතුරා සැපත් සිඩ කටයුතු සි.

විද්‍යාලඩකාත්‍යධිශඝ්‍ය ශ්‍රීමන්නෙතුරනුඥයා
ඔවිවිග්‍රාමජෝ ධර්මඝකෙඛා ලෙඛිදිමාං යතිඃ.

චතුභාණවාර පාළිය

හා

දහම් දිසනර සහිත

සිංහල පිරිත් පොත

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස

සරණගමනං

බුද්ධං සරණං ගච්ඡාමි.
ධම්මං සරණං ගච්ඡාමි.
සඞ්ඝං සරණං ගච්ඡාමි.

දුතිය මපි බුද්ධං සරණං ගච්ඡාමි.
දුතිය මපි ධම්මං සරණං ගච්ඡාමි.
දුතිය මපි සඞ්ඝං සරණං ගච්ඡාමි.
තතිය මපි බුද්ධං සරණං ගච්ඡාමි.
තතිය මපි ධම්මං සරණං ගච්ඡාමි.
තතිය මපි සඞ්ඝං සරණං ගච්ඡාමි.

සරණගමනං නිට්ඨිතං

සිංහලානුවාදය

(මම) බුදුන් පිහිට කොට සලකමි.
,, ධර්මය පිහිට කොට සලකමි.
,, සඞ්ඝයා පිහිට කොට සලකමි.
දෙවනුව ද ,, ,, ,,
තෙවනුව ද ,, ,, ,,

මෙහි **ගච්ඡාමි** යනු ක්‍රියාපදය යි. එය "ගමු-ගතිම්හි" (යෑමෙහි) ධාතුවෙන් සිද්ධ යි "යෙසං ධාතූනං ගති අත්ථෝ බුද්ධි පි තෙසං අත්ථෝ" යනු **සනර බණවර** අවුවා යි. ඒ අනුව ගමනාර්ථ ධාතු අවබොධාර්ථ ද වන හෙයින් ගච්ඡාමි යන්නට දනිමි යන අර්ථය ගෙන (මම) බුදුන් සරණ ය යි දනිමි, ධර්මය සරණ ය යි දනිමි, සඞ්ඝයා සරණ ය යි දනිමි යි කියාත් අර්ථය ගත හැකි බව දතයුතු.

බුදුන් මට පිහිට ය යි සලකා මම උන්වහන්සේ සෙවනය (ඇසුරු) භජනය (ඇසුරු) පයිරුපාසණය (නැවත නැවතත් උන්වහන්සේ කරා එළඹීම) කරමි යනු මෙයින් අදහස් කෙරෙයි.

සරණගමන පරිත්තයෙහි සිංහල අනුවාදය නිමි.

දහම් විසතර

1 මේ තුන්සරණය කවරකු විසින් දෙසනලද ද?
2 කොතැන්හි දී දෙසනලද ද?
3 කවර කලෙක්හි දෙසනලද ද?
4 කුමන කාරණක් නිසා දෙසනලද ද?
5 කුමක්හෙයින් මෙහි පළමු කොට දෙසනලද දැ යි ප්‍රශ්න පසෙකි.

බුදුරජාණන් වහන්සේ විසින් ම වදාරනලදි. අන්කිසි ශ්‍රාවකයකු විසින් හෝ ඍෂියකු විසින් හෝ දෙවියකු විසින් හෝ ප්‍රකාශකරනලද්දේ කොවෙසි යනු පළමුවන ප්‍රශ්නයට පිළිතුරු යි.

බරණැස්නුවර මිගදය නම්වූ **ඉසිපතනාරාමයෙහි** වැඩවසන සමයෙහි දී ය යනු දෙවෙනි ප්‍රශ්නයට පිළිතුරු යි.

ආයුෂ්මත් **අස්ස** සථවිරයන් වහන්සේ හා රහත්වූ යහළුවන් පනස්නතර දෙනා ද එයවත් පළමුව පැවිදිව රහත්වූ **පඤ්චවග්ග** මහණුන් දැ යි මෙසේ සැවක් මිහ රහතන් වහන්සේලා මහජන යාට හිත වැඩ පිණිස දහම් දෙසන කල්හි වදාළේය යනු තුන් වෙනි ප්‍රශ්නයට පිළිතුරු යි

"අනුජානාමි භික්ඛවෙ ඉමෙහි තීහි සරණාගමනෙහි පබ්බජ්ජං උපසම්පදං ච" යනු වදාළ හෙයින් මෙ සස්නෙහි කුලපුත්‍රයන්ගේ **පැවිදි උපසම්පද** දෙක පිණිස වදාරනලදි යනු සතරවෙනි ප්‍රශ්නයට පිළිතුරු යි.

යම් හෙයකින් මේ තිසරණය හේතුකොටගෙන දිව්‍ය මනුෂ්‍යයෝ උපාසක භාවයෙන් හෝ ප්‍රව්‍රජ්‍යාභාවයෙන් සම්බුද්ධ ශාසනයට ඇතුළත් වෙත් ද බුදු ශාසනයට බැස ගැනීමට මෙය පූර්භාග ප්‍රතිපදාව වෙත් මූලික මාගීය වන හෙයින් බුදුදහ පාඨයෙහි මුලින් ම සඳහන්වූ **සරණාගමනය** මේ පිරිත්පොතෙහි පළමු කොට කියනලදි යනු පස්වැනි ප්‍රශ්නයට පිළිතුරු වේ.

මෙහි සරණය, සරණගමනය, සරණගතය, සරණගමන ප්‍රභේදය, සරණගමන ඵලය, සරණගමන සංක්ලෙශය, සරණ ගමන භේදය යන මෙතෙක් කරුණු දත්යුතු ය.

ලෝකයාගේ සියලු භය, සන්ත්‍රාස, දුර්ගති, දුක්, උවදුරු සියල්ලක් හිරු දුටු පිනි මෙන් වැනසීමට– නැති කිරීමට සමර්ථ යි සරණ නම් වේ මේ කරුණුවලින් බුද්ධ ධම්ම සංඝ යන රත්නත්‍රය ද සරණ නම් වන්නේ ය.

සරණගමන නම් බුද්ධාදි රත්නත්‍රය දෙවිමිනිසුන්ගේ ආමිස පූජා ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු වන බැවින් ද, මෙතෙක් වටනේ යයි අගය නො කටහැකි බැවින් ද, ශීල සමාධි ප්‍රඥාදි ගුණයෙන්

තමන් වහන්සේ හා සමසතළ හැකි අනිත් සෙනකුන් ලෝක යෙහි නොමැති හෙයින් ද, කලකින් ලෝකයෙහි පහළවන හෙයින් හැම කලකම දක්නට නො ලැබෙන වස්තුවක් හෙයින් ද පෙරුම් පිරූ උත්තමයන් විසින් ම ප්‍රයෝජන ගතයුතු හෙයින් දැ සි මෙසේ විත්‍රීකෘත මහාඛී අතුල්‍ය දුර්ලභදර්ශන අලාමක සඋපරිභොග වන හෙයින් රත්න නම් වේ. රත්න භාවයෙන් හා සරණ භාව යෙන් ද සලකා එහි ශ්‍රද්ධාව හෙවත් ප්‍රසාදය ඉපදවීම සරණ ගමන යයි.

වෙය ආත්මසන්නිර්‍යාතනය, තත්පරායනතාය, ශිෂ්‍යභාවොප ගමනය, ප්‍රණිපාතය සි සියුවැදූරුම් වේ. **ආත්මසන්නිර්‍යාතන** නම් තමන්ගේ ආත්මය හෙවත් ශරීරය හෝ ජීවිතය තුනුරුවන් වෙත නතු කොට සරණ යාම සි **තත්පරායනතා** නම් තුනුරුවන් හැර මට අන් කිසිවකුගේ පිහිටක් නැතැ සි සලකා සරණ යාම සි **ශිෂ්‍යභාවොපගමන** නම් තමන් තෙරුවනට ශිෂ්‍යයකුව සරණ යාම සි. **ප්‍රණිපාත** නම් වැඳීම්, පිදීම්, ගරුකිරීම් වතාවත් කිරීම් ආදි හැම දෙයක් ම තෙරුවන් විෂයෙහි පැවැත්වීමෙන් සරණ යාම සි.

මේ **ප්‍රණිපාතය** ද ඤාති, භය, ආචාර්‍ය්‍ය, දක්ෂිණීය වශයෙන් සියුවැදූරුම් වේ. බුදුන්වහන්සේ මාගේ නෑයෙකැ සි සලකා හෝ උන්වහන්සේ කෙරෙහි භයෙන් හෝ මාගේ ගුරුවරයෙකැ සි සලකාගෙන හෝ සරණ යන්නකුට සරණය නො පිහිටයි. දක්ෂිණීය ප්‍රණිපාතයෙන් හෙවත් තුන්ලෝකයෙහි ම පිළිගතයුතු ගරුසළ යුතු නිසොලෙස් උත්තමයා නම් බුදුරජාණන් වහන්සේ යයි මෙසේ ගරුබුදෙයන් සලකා සරණ යාම **සරණගමනය** වන බවත් මෙසේ සරණ ගිය තැනැත්තේ **සරණඝන** නම්වන බවත් දතයුතු.

ලෞකික සරණගමනය ලොකොත්තර සරණගමන යයි **සරණ ගමන ප්‍රභේදය** දෙවැදූරුම් වේ **ලෞකික සරණගමනය** පෘථග් ජනයාහට සරණගමන පකෙලනයන් හෙවත් සරණගමනය පිණිස ඇති වන උවදුරු මැඩපවත්වා අරමුණු විසින් තව අහරාදි බුදුගුණ අරමුණු කොට සිදු වෙයි.

වස්තු විසින් හෙවත් කරුණු වශයෙන් ශ්‍රද්ධා ප්‍රතිලාභය හා ශ්‍රද්ධාමූලකවූ සම්‍යක්දෘෂ්ටිය දශපුණ්‍යක්‍රියා වස්තූන්හි දෘෂ්ටිය ඒදි නෑති කර ගැනීම් ඇත මෙකී සඟපත් ගුණ ද සිදු වෙයි.

ලෞකොත්තර සරණගමනය නම් චතුස්සත්‍යාවබෝධයෙන් ලැබෙන ශ්‍රොතාපත්‍යාදි මාර්ගඵලයෙහි. සරණගමනොපක්ලෙශ යන් සහමුලින් ම නැති කොට අරමුණු වීසින් නිවන් අරමුණු කොට කෘත්‍ය වීසින් තෙරුවන්හි ගුණ දැන පැහැදීම් වශයෙන් ඇති වන්නකි.

සරණගමන ඵලය ද ලෞකිකය ලොකොත්තර ය යි දෙ වැදෑරුම් වේ. **ලෞකික** ඵලය නම් භවසම්පත් හා භොග සම්පත් ද ලැබීම යි.

ලොකොත්තර සරණගමන ඵලය ද විපාකඵලය, ආනිසංස ඵලය යි දෙවැදෑරුම් වේ. එහි **විපාකඵලය** නම් සෝවාන් ආදි සතර මග සතර ඵලයෙන් නිවන් පසක් කිරීම යි. **ආනිසංසඵලය** නම් සියලු සසරදුක් නැතිකිරීමෙන් නිරුපධිශෙෂ පරිනිර්වාණ යෙන් පිරිනිවීම යි

ලෞකික සරණගමනය තෙරුවන්හි ගුණ නො දැනීමෙන් හා තෙරුවන් කෙරෙහි සැකයෙන් ද මිථ්‍යාඥානයෙන් ද කිලිටි වෙයි නොහොත් බිඳෙයි **ලොකොත්තර සරණගමනයෙහි** කිලිටි වීමෙක් හෝ බිඳීමක් නැත්තේ ය.

සම්හෙයකින් තිසරණ ගත් උපාසක උපාසිකා නෙතෙක් **අන්‍ය** තීර්ථකයන් කෙරෙහි පැවිදි වූ නැයකු දැක 'මුහු අප නැයහ'යි වඳින් ද, නො පැවිදි වූ කුලදෙටුවන්ව වඳින් ද, රජකු දැන හෝ රජු බදු ශ්‍රෙෂ්ඨයකු දැන නො වැන්දහොත් මොහු නපුරක් කෙරෙති යි භයින් වඳින් ද, කිසියම් ශිල්පශාස්ත්‍රාදියක් උගැන්වූ තීර්ථක යකු දැන 'මේ මාගේ ආචාර්‍ය්‍ය තෙමේ'යි වඳින් ද ඔවුන්ගේ ද සරණ නො බිඳෙයි.

සරණගමන පරිත්‍යාගයෙහි දොෂ විස්තරය නිමි.

දස සික්ඛාපදානි

1 පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං
2 අදින්නාදානා වෙරමණී සික්ඛාපදං
3 අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං
4 මුසාවාදා වෙරමණී සික්ඛාපදං
5 සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං
6 විකාලභොජනා වෙරමණී සික්ඛාපදං
7 නච්ච ගීත වාදිත විසූකදස්සනා වෙරමණී සික්ඛාපදං

8 මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණි සික්ඛාපදං

9 උච්චාසයන මහාසයනා වෙරමණි සික්ඛාපදං

10 ජාතරූප රජත පටිග්ගහණා වෙරමණි සික්ඛාපදං

දස සික්ඛාපදානි නිට්ඨිතානි

සිංහලානුවාදය

(මෙයේ දක්වනලද ක්‍රම ඇති සරණාගමනයෙන් බුදුසස්නට බැසගැනීමට අවකාශ දක්වා දැන් ශාසනාවතිණ්වූ හෙවත් ශාසන යට බැසගත්තාවූ උපාසක උපාසිකාවන් විසින් හෝ පැවිද්දන් විසින් යම් ශික්ෂා කොටසෙක්හි පළමුකොට හික්මිය යුතු ද ඒ **ශික්ෂාපදයෝ** දක්වනු ලැබෙත්.)

1 ප්‍රාණඝාතයෙන් හෙවත් සතුන් මැරීමෙන් වැළකීමේ ශික්ෂාපදය

2 සොරකම් කිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය

3 අශ්‍රේෂ්ඨචර්‍යාවෙන් හෙවත් ලාමක හැසිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය

4 බොරුකීමෙන් වැළකීමේ ශික්ෂාපදය

5 මත්වීමට හා ප්‍රමාදයට හේතුවූ මත්කරවන දෙය බීමෙන් වැළකීමේ ශික්ෂාපදය

6 විකල්බොජුනෙන් හෙවත් ඉර හැරුණු පසු වැළදීමෙන් වැළකීම් ශික්ෂාපදය

7 නැටීම්, ගී කීම්, වැයීම්, විපුළු දැකීම් යන මෙයින් වැළකීමේ ශික්ෂාපදය

8 දූසමින් ආදි මල්ය, සුවඳ දූය, සබා සඳුන් ආදිවූ අඹරා ඇඟ ගාන ඡවිරාග කරන දූය යන මේතෙක් දෙය දැරීමය, අඹුනැන් බල බලා නැවත නැවත සැරසීමය, ඡවිරාග වශයෙන් ඉවසා සැරසීමය යන මේ කරුණු වලින් වැළකීමේ ශික්ෂාපදය

9 උසසුන් මහඅස්නෙන් වැළකීමේ ශික්ෂාපදය

10 රන් රිදී මසු සහවණුපිළිගැනීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය

දස සික්ඛාපද පරිසතගෙකි සිංහලානුවාදය නිමි

දහම් දිසාර

මේ දශශික්ෂාපදයෝ **රාහුල** කුමාරයා පැවිදි කොට කපිලවස්තු පුරයෙන් නික්ම සැවැත්නුවරට පැමිණ දෙවිරම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන්වහන්සේ සාමණේරවරුන්ට ශික්ෂා පද නියම කොට ව්‍යවස්ථා කරනු පිණිස වදාළහ.

එකල්හි අපට **ශික්ෂාපද** කෙතෙක් ද? කෙපමණෙක්හි අප විසින් භික්මියයුතු දැයි යන මෙබඳු අදහසක් සාමණේර වහන්දූට පහළ විය. ඒ බව බුදුන්ට දැන්වූහ එවිට බුදුහු "අනුජානාමි භික්ඛවෙ සාමණෙරානං දස සික්ඛාපදානි, තෙසු ච සාමණෙරෙහි සික්ඛිතුං" යනුවෙන් මහණෙනි සාමණේරයන්ට දශශික්ෂාපදයන් පතවම් සාමණේරයන් විසින් එහි භික්මියයුතු යයි වදාළහ.

මෙහි මුල් ශික්ෂාපද නවය පෙහෙවස් සමාදන්වූ කල උපාසක උපාසිකාවන්ට හා, නිත්‍යශීල වශයෙන් සාමණේර භික්ෂූන්ට ද සාධාරණය. එහෙත් 7, 8 වෙනි ශික්ෂාපද දෙක එකක් කොට ගෙන සාමණේරයන්ට පමණක් විශෙෂවූ ජාතරූපරජත පදය හැර දමා අෂ්ටාංග උපොසථ ශීලයෙහි ශික්ෂාපද අටෙකි.

නවද ලෝකයෙහි අකුසල් හෙයින් ම පව් නිසාම **ප්‍රාණඝාතාදි** පසෙන් වෙන්වියයුතු. විකාලභෝජනාදි පස ප්‍රඥප්ති වශයෙන් දැයි හෙවත් මෙසින් වැළකියයුතු යයි වදාළ නියමය වශයෙන් දැයි මෙසේ ලෝකවද්‍ය ප්‍රඥප්තිවද්‍ය වශයෙන් ව්‍යවස්ථා කටයුතු යි.

"වෙරමණී සිකඛාපදං" කියා සමාදන්වීම විරති සියල්ලන්ට ම සාධාරණ ය. "වෙරං මනතීති වෙරමණී" යනු වාක්‍ය හෙයින් වෛරය දුරු කෙරේනු යි වෙරමණී නම "විරමති වා එතාය කරණභූතාය වෙරමහා පුග්ගලො ති විකාරසස වෙකාරං කත්වා වෙරමණී" යන වාක්‍ය විසින් පුද්ගල තෙම මේ හේතුකොට ගෙන වෛරයෙන් වැළකේනු යි වියන්නට වේකාර කොට වේරමණී යනු සිද්ධ වේ. "විරමණී සිකඛාපදං" කියා හෝ "වේර මණී සිකඛාපදං" කියා හෝ දෙපරිද්දෙන්ම මෙය සංඥායනා කෙරෙති. මෙහි වේරමණී යන්නෙන් කාමාවචර කුසල්සිත්හි යෙදුණු විරති චෛතසිකය දක්වයි. මේ වේරමණීය ලොකොත්තර සිත්හි දු ලැබෙයි. එසේදවුවත් "සමාදියාමි" හෙවත් සමාදන් වෙමි යනුවෙන් කියනලද හෙයින් ලොකුත්තර චිත්තයෙහි යෙදෙනු විරතිය සමාදන්වීම් වශයෙන් පැවැත්වීමට නුසුදුසු නුයි කාමාවචර කුසලචිත්තයෙහා හා යෙදුණු විරති චෛතසිකය ම මෙහි කියනලදී.

භික්ෂූන් සිව් හෝ භික්ෂුණියවුහු නුසි ශික්ෂා තමුන්. නිවන් ලැබීමට මේ ශික්ෂා පිහිටවන හෙයින් හෝ කොටස්වශයෙන් පවිත්‍රතා හෙයින් පද නම් වේ. ඕ වනාහි අධිශීල ශික්ෂාය, අධිචිත්ත ශික්ෂාය, අධිප්‍රඥා ශික්ෂා යයි ත්‍රිවිධය මේ අර්ථයෙහි විරති ශීලයත්, ලෞකික විදර්ශනාවත්, රූපාරූපාවචර ධ්‍යානත්, ආර්‍යමාර්ගයත් ශික්ෂා නම් වෙත්.

දස සික්ඛාපද පරිත්‍රාණයෙහි දහම් විසඳුම නිමි

සාමණේර පඤ්හා

1 එකා නාම කිං? සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා,
2 දෙ නාම කිං? නාමඤ්ච රූපඤ්ච
3 තීනී නාම කිං? තිස්සො වෙදනා
4 චත්තාරි නාම කිං? චත්තාරි අරියසච්චානි
5 පඤ්ච නාම කිං? පඤ්චුපාදානක්ඛන්ධා.
6 ඡ නාම කිං? ඡ අජ්ඣත්තිකානි ආයතනානි
7 සත්ත නාම කිං? සත්ත බොජ්ඣඞ්ගා
8 අට්ඨ නාම කිං? අරියො අට්ඨඞ්ගිකො මග්ගො
9 නවු නාවු කිං? නවසත්තාවාසා
10 දස නාම කිං? දසහඞ්ගෙහි සමන්නාගතො අරහා ති වුච්චති ති.

සාමණේර පඤ්හා නිට්ඨිතා

සිංහලානුවාදය

1 එක නම් කිම්? හැම සත්වයෝ ආහාරයෙන් ජීවත් වෙති
2 දෙක නම් කිම්? නාමය හා රූපය යි
3 තුන නම් කිම්? ත්‍රිවිධ වේදනාවෝ යි
4 සතර නම් කිම්? චතුරාර්‍ය සත්‍යය යි
5 පස නම් කිම්? පස්වැදෑරම් උපාදානස්කන්ධයෝ යි
6 සය නම් කිම්? ආධ්‍යාත්මික ආයතන සය යි
7 සත නම් කිම්? සප්ත බොධ්‍යඞ්ග ධර්මයෝ යි
8 අට නම් කිම්? ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ග ය යි
9 නවය නම් කිම්? නව සත්ත්වාවාසය යි
10 දසය නම් කිම්? අඞ්ග දසයකින් යුත් ශ්‍රමණ තෙමේ රහත් යයි කියනු ලැබේ.

සාමණේර පඤ්හ පරිත්‍රාණයෙහි සිංහලානුවාදය නිමි

... දහම් විසතර

භාග්‍යවතුන් වහන්සේට **සොපාක** නම්වූ මහාශ්‍රාවක තෙනෙක් වූහ. ඒ වහන්දු උපන් සත්හැවිරිදිදෙනි ම ප්‍රඥ බහුල දුය. රහත්භාවමෙහි දු උපනිශ්‍රය සම්පත් ඇත්තෝ වූහ. බුදුහු උන්වහන්සේ ලවා ප්‍රශ්න විසඳවා උපසම්පදාවට අවසර දෙනු පිණිස "එක නාම කිං" යන ආදි ප්‍රශ්න දශයක් ඇසූ සේක. වහන්දු ද ඒ ප්‍රශ්න විසඳ බුදුන් සිත් හත්හ. තුන් සරණයෙහි පිහිටා ඉක්බිති දස ශික්ෂාපදයන් පිරිමෙන් සිල්වත් ව සාමණේර භූමියෙහි සිටි ඒ සත්හැවිරිදි කුමාරයන්ට පවා සර්ඥතාඥනය හා සසඳ ප්‍රශ්න විසදීමට හැකි විය. ශාසන සම්පත්තිය අහෝ ආශ්චර්‍යයි යෙකැ යි සඤ්ඣායනා කරන්නවු ථ හා අසන්නවුන්ටත් බුදුසස් නෙහි ප්‍රසාද උපදවනු සඳහා මේ ප්‍රශ්නව්‍යාකරණය සෙසු තන්හි කුමාර ප්‍රශ්න නාමයෙන් කියතලද ද මේ පිරිත් පොතෙහි ශික්ෂා පදයන්ට අනුරූව **සාමණේර ප්‍රශ්න** නාමයෙන් තබතලදු යි දතයුතු.

සාම්ණේරයන් වහන්සේ "සියලු සත්ත්වයන් ආහාරය නිසා ජීවත් වෙති" යි පුච්ඡාලාභිධාන (පුද්ගලයකු සලකාගත්) දේශනා වෙන් පළමුවන ප්‍රශ්නය විසදුසේක. ලෝකයෙහි හැම සත්ත්වයන් ගේ ම පැවැත්මට හේතු වූ එකම කාරණය ආහාරය මුත් අනිකක් නොවේය යි හැඟවීමට මෙසේ පිළිතුරු දුන්හ.

එතැනින් මේ ආහාරය සසර කළකිරීමට හේතු වේ. ගමන් වශයෙන් ද, සොයාගැනීම් වශයෙන් ද, ප්‍රයෝජන ගැනීම් වශයෙන් ද, දිරවීම් වශයෙන් ද, තැන්පත්වීම් වශයෙන් ද, නො පැසීම් වශයෙන් ද, තරකට පැසීම් වශයෙන් ද, ප්‍රතිඵලය වශයෙන් ද, නවදොරින් වැගිරීම් වශයෙන් ද, ශරීරයෙහි තැවරීම් වශයෙන් දු යි මෙසේ කබලිංකාරා හාරයෙහි භගවත් තම තමන් අනුභව කරන බත් කොමු ආදි කවර කමුත් භෝජන වශී යන්හි දස ආකාරයකින් පිළිකුල් වශයෙන් සැලකීම කළකිරීමට හේතු වේ. මෙහි විස්තර කැමැත්තවුන් විසින් **විශුද්ධිමාර්ග** යෙහි සමාධි නිර්දේශය බැලියයුතු.

ආහාර සතරෙකි. කබලිංකාරාහාරය, ඵස්සාහාරය, මනෝ සඤ්චේතනාහාරය, විඤ්ඤාණාහාරය යනුවෙනි. පිඬු වශයෙන් අනුභව කළයුතු බත් කොමු ආදි වශී කබලිංකාරාහාර නම් වේ. චක්ඛුසම්ඵස්සාදි සවැදෑරුම් ස්පර්ශය ඵස්සාහාර නම් වේ. කුසල් අකුසල් වශයෙන් රැස්කරන චේතනාව මනෝසඤ්චේතනාහාර නම් වේ. ප්‍රතිසන්ධිවිඤ්ඤාණය විඤ්ඤාණාහාර නම් වේ.

ආහාරය යනු ප්‍රත්‍යය හෙවත් සත්වයන්ගේ පැවැත්මට හේතු වන කරුණය යන අර්ථ යි. සත්වයන්ගේ පැවැත්මට හේතු කරුණු තව බොහෝ කොට තිබිය දී කුමක් නිසා මේ සතර පමණක් කියන ලදද යත්?:- ආධ්‍යාත්මිකවූ නාමරූපයන්ගේ පැවැත්මට මෙය ම මුත් අනිකක් විශෙෂයෙන් ප්‍රත්‍යය නොවන හෙයිනි. ආහාරයෙන් යැපෙන සත්වයන්ගේ රූපකය පවත්වා ගැනීමට කබලිංකාරාහාරය විශෙෂයෙන් හේතු වේ. නාම කය ඇසුරු කොට හෙන පවත්නා ත්‍රිවිධ වේදනාවන්ට සඵස්සාහාරය විශෙෂයෙන් හේතු වේ. ප්‍රතිසන්ධි විඥානයට මනොසඤ්චෙතනාහාරය විශෙෂයෙන් හේතු වේ. නාමරූපයන්ගේ පහළවීමට විඤ්ඤාණාහාරය විශෙෂයෙන් හේතු වේ.

එහෙයින් වදාළහ

"සෙය්‍යථාපි භික්ඛවෙ අයං කායො ආහාරට්ඨිතිකො ආහාරං පටිච්ච තිට්ඨති, අනාහාරො නො තිට්ඨති යථා; එසසපච්චයා වෙදනා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං" යි.

නාමරූප:-

අරමුණක් කරා නැමෙන හෙයින් සිතට ද, නැමෙන ගතිය ඇති හෙයින් සියලු අරූප ධර්මයන්ට ද, **නාම** යයි කියනු ලැබේ. පෙළන හෙයින් සතර මහාභූතයන්ට ද, ඒ නිසා කටගත් රූපවිසි ඔතරකට ද රූප යයි කියනු ලැබේ. මේ නාමරූප ධර්මයන් තත්ත්වාකාරයෙන් නුවණින් දක්නා වූ පුද්ගල තෙම එහි කලකිරී විදසුන් වඩා මාර්ගඵලාවබෝධයෙන් දුක් සැනි කෙරෙයි

එහෙයින් වදාළහ

"දිට්ඨු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො —පෙ— දුක්ඛස්සන්තංකරො හොති, කතමෙසු දිට්ඨු? නාමෙ ච රූපෙ ච" යි.

ත්‍රිවිධ වේදනාව:-

සුඛ වේදනාව, දුක්ඛ වේදනාව, උපෙක්ඛා වේදනාව යන තුනසි "යං කිඤ්චි වෙදයිතං සබ්බං තං දුක්ඛස්මින්ති වදාමි" යි වදාළ සූත්‍රානුසාරයෙන් වේදයිතවූ හෙවත් විඳුනා ගමක් වේ ද ඒ සියල්ල දුක යයි කියමි. යන මේ වශයෙන් හෝ

"යො සුඛං දුක්ඛතො අද්දක්ඛි දුක්ඛමද්දක්ඛි සල්ලතො
අදුක්ඛ මසුඛං සන්තං අද්දක්ඛි නං අනිච්චතො"යි

වදාළ ලෙසින් යම් යෝගාවචරයෙක් සැප වේදනාව දුක වශයෙන්

දුටුයේ වේ ද, දුක සල්‍යකාමී- සැප්කාම කරන කල්හි වීදුනා දුකක් වශයෙන් දුටුයේ වේ ද දුක් නොවූ සැපත් නොවූ හෙයින් අදුකඛම සුඛ නම්වූ ඒ ශාන්ත අවස්ථාව අනිත්‍ය වශයෙන් හෝ දුටුයේ වේද, හෙතෙම මෙසේ දුකඛදුකඛ විපරිනාම දුකඛ සංඛාර දුකඛ වශයෙන් වේදනාවන්ගේ ත්‍රිවිධ දුඃඛස්වභාවය දැකීමෙන් සැපසංඥව දුරු කොට දුකඛසංඥව උපදවා සසර කලකිරි දුක්නැති කරන්නේය යි දතයුතු.

එහෙයින් වදළහ

'තිසු භික්ඛවෙ ඛවේදනාසු භික්ඛු සම්මා නිබ්බින්දමානො-පෙ දුක්ඛස්සන්තංකරෝ හොති, කතමෙසු තිසු, තීසු වෙදනාසු" යි

චතුරාර්‍ය සත්‍යය

දුඃඛ, දුඃඛහේතු, සුඛ, සුඛහේතු යන සතර චතුස්සත්‍යය යි. දුකත්, දුකට හේතුවත්, නිවන් සැපයත්, සැපයට හේතුවත් යන සතර චතුරාර්‍යසත්‍යය යි. මේ සතරට ඛම්යෙහි දුකඛ, සමුදය නිරොධ, මඟඟ යයි කියනු ලැබේ. ප්‍රධාන බෞද්ධ දර්‍ශනය මෙය වේ.

ලෝකයෙහි දර්‍ශන නමින් නොයෙක් බාහිර ශාස්ත්‍රයන් ඇත ද එය ලෞකික බුද්ධිමතුන් විසින් නිපදවූ හෙයින් අසම් පූර්ණ ප්‍රතිඵල ඇත්තේ ය. ඔවුන්ගේ මොක්ෂයෙහු දු දුක් කෙළවර නො වේ. සර්‍වඥතාඥානයෙන් පිරිසිඳ අවශබාධ කොට දෙසූ චතුස්සත්‍යය ඵල හේතු පිළිවෙළින් බැසගත හැකි ය; බවදුක් කෙළවර කොට ශාන්තවූ නිර්‍වාණ පදය අවබොධකළ හැකි ය; එහෙයින් සාන්දෘෂ්ටිකවූ හෙවත් මේ ආත්මයෙහි ම ප්‍රත්‍යක්ෂ කළ හැකි අලෞකික ප්‍රතිඵල ඇති ශ්‍රෙෂ්ඨ දර්‍ශනයකි.

එහෙයින් වදළහ

"තයිදං භික්ඛවෙ දුක්ඛං අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං -පෙ- දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං, උච්ඡින්නා භවතණ්හා, ඛීණා භවනෙත්ති, නත්ථි දානි පුනබ්භවෝ'යි.

පඤ්චුපාදානස්කන්ධ

උපදින යනු කාමාදි කෙලෙසුන්ට නමෙකි. එයින් හටගත් රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පස පඤ්ච උපාදාන ස්කන්ධ නම් වේ. මෙහි උදය-(ඉපදීම) ව්‍යය (විනාශය) සලකන යොගාවචර තෙම එයින් විදර්‍ශනාව උපදවා දුක නැති කෙරෙයි.

එහෙයින් වදළහ

"පඤ්චඞ්ග භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො -පෙ- අනන්තකරො හොති. කතමෙසු පඤ්චසු? පඤ්චසුපාදානක්ඛන්ධෙසු, ඉමෙසු ඛො භික්ඛවෙ පඤ්චඞ්ග ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො -පෙ- දුක්ඛස්සන්තංකරො හොති" යි

ආධ්‍යාත්මික ආයතන සය

තමා සතන්හි වූ චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය, මන යන මේ සය ආධ්‍යාත්මික ආයතන යි. සසර දුක රැස්කරන හෙයින් හා එයට පමුණුවන හෙයින් ද, **ආයතන** නම් වේ. මේ ෂඩායතන යන් කෙරෙහි කලකිරුණු භික්ෂුතෙම දුක් නැති කෙරෙයි.

එහෙයින් වදළහ

"ඡසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො -පෙ- දුක්ඛස්සන්තංකරො හොති, කතමෙසු ඡසු? ඡසු අජ්ඣත්තිකෙසු ආයතනෙසු, ඉමෙසු ඛො භික්ඛවෙ ඡසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො -පෙ- දුක්ඛස්සන්තංකරො හොති" යි.

සප්තබොධ්‍යඞ්ගය

යම් ධර්මසමූහයක බලයෙන් ආර්‍යශ්‍රාවක තෙම මාගීඵලාව බොධය කොට තමාසතන්හි වූ කෙලෙසනිද්‍රාවෙන් නැගිටී ද ඒ සතර මාගී සතර ඵල නිර්වාණ සංඛ්‍යාත බොධියට අඞ්ග හෙයින් **බොජ්ඣඞ්ග** නම් වේ. සති ධම්මවිචය, විරිය පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා වශයෙන් එය සත් ආකාර වේ. මේ ධර්මයන් භාවනා වශයෙන් පුරුදු කරන ලඬන යෝගාවචර තෙම සසර කලකිරීමෙන් මෙලොව දී ම දුක් නැති කෙරෙයි.

එහෙයින් වදළහ

"සත්තිමෙ භික්ඛවෙ බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති" යි.

ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය

නිවන් කැමැත්තවුන් විසින් යායුතු වූ ආර්‍යභාවය හෙවත් නිසොලෙස් බව ඇතිකර දෙන අඞ්ග අටකින් යුත් මාර්ගය යි.

එනම්:— සම්මාදිට්ඨි (හොඳ දැනීම) සම්මාසංකප්ප (නිවැරදි කල්පනා) සම්මාවාචා, (නිවැරදි වචන) සම්මාකම්මන්ත (නිවැරදි කම්කාන්ත) සම්මාආජීව, (නිවැරදි ජීවත්වීම) සම්මාවායාම (හොඳ උත්සාහය) සම්මාසති, (හොඳ සිහිය) සම්මාසමාධි, (හොඳ එකඟකම්) යන අට යි.

මෙය වඩන යොගාවචර තෙම අවිද්‍යාව නැති කොට විද්‍යාව උපදවා නිවන් පසක් කොට දුක් නැති කෙරෙයි.
එසින් වදාළහ

සාජඝලා නම් රහත් මෙහෙණිහු "අට්ඨසු අවුසො ධම්මෙසු භික්ඛු සම්මා සුභාවිතචිත්තො දිට්ඨෙවධම්මෙ දුක්ඛස්සන්තංකරෝ හොති, කතමෙසු අට්ඨසු? අරියෙ අට්ඨඞ්ගිකෙ මග්ගෙ, ඉමෙසු ඛො ආවුසො අට්ඨසු ධම්මෙසු භික්ඛු සම්මා සුභාවිතචිත්තො දිට්ඨෙවධම්මෙ දුක්ඛස්සන්තංකරෝ හොති" යි.

නවසත්ත්වාවාස

1 නානත්තකායා නානත්තසඤ්ඤී සත්ත්වාවාස

අපමණ සක්වළවල අපමණ මිනිසුන්ගේ ශරීරවර්ණ සටහන් ආදියෙන් දෙදෙනකු එක සමාන නො වූ හෙයින් ද. ඔවුන්ගේ ප්‍රතිසන්ධි චිත්තය ත්‍රිහේතුක, ද්විහේතුක, අහෙතුක වශයෙන් වෙනස් ප්‍රභේද ඇති හෙයින් මනුෂ්‍යයන් ද, සදෙව්ලොව වැසි දෙවියන් ද, විනිපාතික අසුරයන් දැ යි මෙසේ සාය සිත දෙක්හිම වෙනස් ගති ඇති සඳ කොටස මෙයින් ගැනෙයි

2 නානත්තනානත්තා එකත්තසඤ්ඤී සත්ත්වාවාස

ශරීරයෙන් වෙනස්වුවත් ධ්‍යානසංඥා වශයෙන් නො වෙනස් වූ හෙවත් එකක් වූ ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති බ්‍රහ්මපාරිෂද්‍ය, බ්‍රහ්ම පුරොහිත, මහාබ්‍රහ්ම යන ප්‍රථමධ්‍යාන බඹතලයෙහි වසන බ්‍රහ්ම යෝ ද වෙනස් වෙනස් වූ ශරීර ඇති අකුශල විපාකාහේතුක වශයෙන් නො වෙනස් වූ ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති සතර අපායෙහි සත්වයෝ ද මෙයින් ගැනෙත්.

3. එකත්තකායා නානත්තසඤ්ඤී සත්ත්වාවාස

එක ම සභාව වූ ශරීර ඇති, ධ්‍යාන සිත් වශයෙන් වෙනස් වෙනස්වූ ප්‍රතිසන්ධි විඤ්ඤාණ ඇති, පරිත්තාභ අප්පමාණාභ ආභස්සර යන තුන් බඹලොවාසීහු මෙයින් ගැනෙත්.

4 එකත්තකායා එකත්තසඤ්ඤී සත්තාවාසය

එකම ආකාරවූ ශරීර ඇති, ධ්‍යානසංඥ වශයෙනුත් එකම ආකාරවූ ප්‍රතිසන්ධිවිඥන ඇති, පරිත්තසුභ අප්පමාණසුභ සුභකිණ්ණ වෙහප්ඵල යන සතර බඹතල වාසීහු හා අවිගය අතප්පය සුදස්සය සුදස්සීය අකනිට්ඨය යන පඤ්ච ශුද්ධාවාස බ්‍රහ්මයෝ ද මෙයින් ගැනෙත්.

5 අසඤ්ඤත්තත සත්තාවාසය

චතුර්ථධ්‍යානය වඩා ආරම්මණ මනසිකාර ඡඤ්ඤාදීන්ගේ නානාත්වයෙන් සංඥව ඇතත් නැතුවාක් මෙන් උපදනාවූ අසංඥ සත්ව තම් බඹතලවාසී බ්‍රහ්මයෝ මෙයින් ගැනෙත්.

6 ආකාසානඤ්චායතන සත්තාවාසය

රූපසංඥව ඉක්මවා ප්‍රතිඝසංඥව දුරුකොට නානාත්වසංඥාවන් මෙනෙහි නොකිරීමෙන් අරූපී ව උපදනාවූ ආකාසානඤ්චායතන අරූපබඹතලවාසීහු මෙයින් ගැනෙත්.

7 විඤ්ඤාණඤ්චායතන සත්තාවාසය

ආකාසානඤ්චායතන සිත ඉක්මවා විඤ්ඤාණය අනන්තය යි භාවනා කොට උපදනා විඤ්ඤාණඤ්චායතන බඹතල වාසීහු මෙයින් ගැනෙත්.

8 ආකිඤ්චඤ්ඤායතන සත්තාවාසය

විඤ්ඤාණඤ්චායතන සිත ඉක්මවා කිසිවක් නැතැ යි භාවනා කොට උපදනා ආකිඤ්චඤ්ඤායතන බඹතලවාසීහු මෙයින් ගැනෙත්.

9 නෙවසඤ්ඤානාසඤ්ඤායතන සත්තාවාසය

ආකිඤ්චඤ්ඤායතන සිත ඉක්මවා භාවනා වඩා උපදනාවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන බඹතලවාසීහු මෙයින් ගැනෙත්.

මේ නව සත්තාවාසය යි.

දසාඛහය

සම්මාදිට්ඨි ය, සම්මාසංකප්පය, සම්මාවාචා ය, සම්මාකම්මන්තය සම්මාආජීව ය, සම්මාවායාම ය, සම්මාසති ය, සම්මාසමාධි ය, සම්මාඤාණ ය, (කුසලසහගත නුවණ) සම්මා විමුත්තිය (රහත් ඵලය) යන දශය යි. මේ අශෛක්ෂ නම් වූ රහතන් වහන්සේලාගේ ගුණදහම් දශයෙකි.

ආචාර්ය ප්‍රශ්නපරිත්‍රාණයෙහි දහම් විස්තර නිමි.

දවත්තිංසාකාරෝ

අත්ථි ඉමස්මිං කායෙ කෙසා, ලොමා, නඛා දන්තා, තචෝ, මංසං, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජා, වක්කං, හදයං, යකනං, කිලොමකං, පිහකං, පප්ඵාසං, අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, පිත්තං, සෙම්හං, පුබ්බෝ, ලොහිතං, සෙදෝ, මේදෝ, අස්සු, වසා, ඛෙලෝ, සිඞ්ඝාණිකා, ලසිකා, මුත්තං, මත්ථකෙ මත්ථලුඞ්ගන්ති

ඉති ද්වත්තිංසාකාරෝ නිට්ඨිතෝ

සිංහලානුවාදය

මේ ශරීරයෙහි කේශයෝ ඇත. රෝමයෝ ද නියපොතු ද දත් ද සමෙක් ද මස්පිඬු ද නහර ද ඇට ද ඇටමිදුලු ද වකුගඩුවක් ද හෘදයමාංසයක් ද අක්මාවක් ද දලබුවක් ද බඩදිවක් ද පපුවක් ද බඩවැලක් ද අතුණු බහනක් ද උදරයක් ද අහරමලයෙක් ද පිතක් ද සෙමක් ද සැරව ද ලෙයද සෝදිය ද මේද තෙල ද කදුලු ද වුරුණුතෙල ද කෙළ ද සොටු ද සඳමිදුලු ද මූත්‍ර ද හිසමුදුනෙහි හිස්මොලය ද යි යන මේ දෙතිස්කුණපයෝ මේ සිරුරෙහි ඇත්තාහ.

ඉති ද්වත්තිංසාකාරපරිත්තයෙහි සිංහලානුවාදය නිමි

දහම්විසඳර

(යම් හුවණකින් පිරිසිඳ **සෝපාක** සාමණේරයන් වහන්සේ ප්‍රශ්න විසඳූසේක් ද එයට පදසථාන වූ හෙවත් ළං වූ යම් සමාධියක් වේ ද එය උපදවා ගැනීමට සුදුසුවූ බුදොත්පාදකාලයක මුත් එසින් පෙර නො පැවැත්තාවූ තිර්තථකයන්ට විෂය නො වූ හෙවත් අගෝචරවූ බුදුරජාණන් වහන්සේ විසින් නොයෙක් අයුරින් පසස්නාලද කායගතාසතිභාවනාව ඇතුළත් වූ **ද්වත්තිංසාකාර** කම්මට්ඨානය සාමණේරප්‍රශ්නයට අනතුරු ව කියනලදි.)

කුමක් හෙයින් මෙය කියන ලද ද යත්?:-

පත්ලෙන් උඩ හිස්මුදුනෙන් යට තමන්ගේ බඹයක් පමණ වූ මේ ශරීරයෙහි හැම කොටසෙකම හැම තැනෙක ම සැලකිල්ලෙන් පරිකර්මකාර බලන යෝගාවචරයා හට මුතු හෝ මැණික් හෝ පබළු හෝ වෛදූර්‍ය්‍ය හෝ නො ද පෙනෙයි. සඳුන් අගිල් කොකුම් කපුරු, සවඳ, සුනු ආදි සුවඳ ද සුවඳ වගීයක් නො පෙනෙයි හුදෙක් අනිශයින් දුගඳවූ පිළිකුල් වූ නිසසිරිකාවූ දූකුම්

ඇති, කෙස් ලොම් ආදි නානාප්‍රකාර අසුචියක් මී පෙනෙයි යනු සලකා නුවණින් භාවනා කොට අමත වූ නිවන් පසක් කරනු සඳහා ය.

කායගතාසති භාවනාව වූ කලි මහත්ඵල මහානිසංස දායක ය. මෙය නියමිත පරිදි විවේකසථානයක් ඇසුරු කොට පිරිසිදු ව එකහසිතින් වැඩිය යුතු ය මෙහි ආනාපාන— ඉරියාපථ— චතු සම්පජඤඤ– පටික්කූලමනසිකාර– නවසිවථික යයි පළි (කොටස්) සයෙකි. කරුණු තුදුසෙකි. මෙසින් කායගතාසති කමීසථාන භාවනායෙහි පටික්කූලමනසිකාර පළියට ඇතුළත්වූ ද්වත්තිං සාකාරය දැක්වෙයි.

"වචසා මනසා වෙව වණණසණඨානතො දිසා
ඔකාසතො පරිවෙඡදා සත්තධා ගහණං විදූං"

යනුවෙන් වචනයෙන් හා සිතින් ද, වණී සංසථාන වශයෙන් ද, දිශා වශයෙන් ද, අවකාශ වශයෙන් ද, පරිවෙඡද වශයෙන් දැසි සත් පරිද්දෙකින් ඉගෙන ගතයුතු යයි කමටහන් පුරුදු කරන්නෝ දනිති.

පළමුකොට වචනයෙන් සජඣායනා කරන යෝගාවචරයාහටම මේ කමීසථානය ප්‍රකටව අවබොධ වෙයි එසේ කරන්නහු විසින් යළිත් පසඋස ඡක්ක වශයෙන් බෙදා ගෙන අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කොට කියමින් පුරුදු කළ යුතු යි.

අනුලොම තචපඤචකය

කෙසා ලොමා නඛා දනතා තචෝ

පටිලොම

තචෝ දනතා නඛා ලොමා කෙසා

අනුලොම චක්ක පඤචකය

මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤජා වක්කං

පටිලොම

වක්කං අට්ඨිමිඤජා අට්ඨී නහාරු මංසං තචෝ දනතා නඛා ලොමා කෙසා

අනුලොම ඡපථාස පඤචකය

හදයං යකනං කිලොමකං පිහකං පපථාසං

පටිලෝම

පපඵාසං පිහකං කිලොමකං යකනං හදයං වකකං අටසිමිඤඤ
අටසි නහාරු මංසං තචො දනතා නඛා ලොමා කෙසා

අනුලෝම මත්ථලුඞ්ග පඤ්චකය

අනතං අනතගුණං උදරියං සරිසං මත්ථලුඞ්ගං

පටිලෝම

මත්ථලුඞ්ගං සරිසං උදරියං අනතගුණං අනතං පපඵාසං පිහකං කිලොමකං යකනං හදයං වකකං අටසිමිඤඤා අටසි නහාරු මංසං තචො දනතා නඛා ලොමා කෙසා—

අනුලෝම මේද ඡක්කය

පිතතං සෙමහං පුබබො ලොහිතං සෙදෙ මෙදෙ

පටිලෝම

මෙදෙ සෙදෙ ලොහිතං පුබබා සෙමහං පිතතං මත්ථලුඞ්ගං සරිසං උදරියං අනතගුණං අනතං පපඵාසං පිහකං කිලොමකං යකනං හදයං වකකා අටසිමිඤඤා අටසි නහාරු මංසං තචො දනතා නඛා ලොමා කෙසා—

අනුලෝම මුත්තඡක්කය

අසසු වසා ඛෙලො සිංඝානිකා ලසිකා මුත්තං

පටිලෝම

මුත්තං ලසිකා සිංඝානිකා ඛෙලො වසා අසසු මෙදෙ සෙදෙ
ලොහිතං පුබබා සෙමහං පිතතං මත්ථලුඞ්ගං සරිසං උදරියං
අනතගුණං අනතං පපඵාසං පිහකං කිලොමකං යකනං හදයං
වකකං අටසිමිඤඤා අටසි නහාරු මංසං තචො දනතා නඛා ලොමා
කෙසා—

මෙසේ පඤ්චක වශයෙන් සතරකට හා ඡක්කය වශයෙන් දෙසකටත් බෙදූ අනුලොම ප්‍රතිලොම ක්‍රමදෙකෙන් කලක් සිහින් සිතමින් වචනයෙන් කියන්නාහට ද්වත්තිංසාකාර කම්ඵඨාන මනාව ප්‍රගුණ වේ. ශරීරයෙහි කුණප කොටස් ද ප්‍රකට වෙත්. වණ්ණාදි වශයෙනුත් මෙසේ වෙන් වෙන් ව සැලකිය යුතුයි. එසේම

'නිමිත්තතො ලකඛණතො ධාතුතො සුඤඤතො පි ච
ඛන්ධාදිතො ච විඤ්ඤෙය්‍යා ද්වත්තිංසාකාර නිච්ඡයො"

සනුවෙන් කොටස් වශයෙන් හා ලක්ඛණ වශයෙන් ද, ධාතු වශයෙන් හා සුඤඤතා වශයෙන් ද, ස්කන්ධාදි වශයෙන් දැයි මෙසේත් ද්වාත්තිංසාකාරයෙහ පරිචය ඇතිකරගත යුතු යි.

ද්වත්තිංසාකාරපරිත්තෙහි දහම් විඤ්ඤාපනි නිමි.

පච්චවෙක්ඛණා

පටිසංඛා යොනිසෝ චීවරං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය; උණ්හස්ස පටිඝාතාය; ඩංසමකසවාතාතපසිරිංසප සම්ඵස්සානං පටිඝාතාය; යාවදෙව හිරිකොපීනපටිච්ඡාදනත්ථං,

පටිසංඛා යොනිසෝ පිණ්ඩපාතං පටිසෙවාමි, නෙව දවාය; න මදාය; න මණ්ඩනාය; න විභූසනාය; යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා; යාපනාය; විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය; ඉති පුරාණං ච වෙදනං පටිහංඛාමි; නවං ච වෙදනං න උප්පාදෙස්සාමි; යාත්‍රා ච මෙ භවිස්සති; අනවජ්ජතා ච; ඵාසුවිහාරෝ චා ති.

පටිසංඛා යොනිසෝ සෙනාසනං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය; උණ්හස්ස පටිඝාතාය; ඩංසමකසවාතාතපසිරිංසප සම්ඵස්සානං පටිඝාතාය; යාවදෙව උතුපරිස්සය විනොදනං; පටිසල්ලානාරාමත්ථං.

පටිසංඛා යොනිසෝ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවාමි, යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය; අබ්‍යාපජ්ඣපරමතාය ති.

පච්චවෙක්ඛණා නිට්ඨිතා

සිංහලානුවාදය

නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට හෙවත් සිත තැසීම් ආදිවූ ඒ ඒ ප්‍රයෝජන වෙන් කොට සලකා සිවුරු වැළඳගනිමි. යම්තාක් ශරීරය ඇතුළත ධාතු කෝපයෙන් හෝ පිටත ඍතුපරිවර්තනයෙන් හෝ උපන් සීත නසනු පිණිස, එබඳුවූ උෂ්ණ නසනු පිණිස, ඩැහැලේ බොන ඇටමැසි ය විදලේ බොන මදුරු ය සුළඟ ය අවුව ය සර්පාදි දිඝීජාතිය යන මොවුන් පිළිබඳ සපඊයන් නසනු පිණිස, යම්තාක් හෙවත් හැම වේලෙහිම ලජ්ජාස්ථාන වසාගන්නා පිණිස සිවුරු වැළඳගනිමි යනුයි.

නුවණින් පරීක්ෂා කොට හෙවත් අහර වැළඳීමෙන් වන ඒ ඒ ප්‍රයෝජන වෙන් කොට සලකා පිඬු වළඳමි, ගම්දරුවන් සෙල්ලා සඳහා නොවළඳමි, බල මිද පුරුෂමද වඩනා සඳහා ද නොවළඳමි, අන්තඃපුර වෙශ්‍යාදීන් මෙන් අඩහ ප්‍රත්‍යඩහ ප්‍රිණනයෙන්

අලඞ්කාර කරනු පිණිස නොවළඳමි, නළුවන් මෙන් සිව්පැහැය වැඩිවීමෙන් සැදුම් පිණිස නොවළඳමි, යම්තාක් සතර මහාභූත යන් නිසා පවත්නා මේ කායප්‍රතිබද්ධ ජීවිතයාගේ පැවැත්ම පිණිස, යැපීම පිණිස, වණයෙහි ලත බෙහෙදක් සෙයින් ශීතෝෂ්ණයට කරන පිළියමක් සෙයින් බඩගිනි වේදනා නසනු පිණිස, ගඟට පසුරක් සෙයින් මුහුදට නැවක් සෙයින් බඹසර සපයනු පිණිස, මේ අඟර වළඳමි. මෙසේ කී පරිද්දෙන් ප්‍රත්‍යවෙක්ෂා කොට අඟර වළඳ නොවැළඳුම් හේතුවෙන් උපදනා පරණ දුක් වේදනා ව ද නසන්නෙමි. වඩා වැළඳීමෙන් වන අලුත් දුක් වේදනාවක් ද නූපදවමි. සතර ඉරියවුවෙහි මාගේ පැවැත්ම ද, කුසුදුසු සෙවීම් දුරුමකාව දූහැමෙන් සෙමෙන් උපන් බැවින් නිවරද බැව් ද, සැප අඟර පමණ දැන වැළඳීමෙන් කායබල ලදින් යෙහෙන් විසීම ද වන්නේයයි සලකා මේ අඟර වළඳමි.

නුවණින් සිත නැසීම් ආදි ඒ ඒ ප්‍රයෝජන වෙන් වෙන් කොට සලකා මේ සෙනසුන් වැළඳගනිමි, යම් තාක් සිත පිඬා නසන පිණිස, උෂ්ණ පිඬා නසන පිණිස, බැහැ ලේ බොන මැස්සන් විද ලේ බොන මදුරුවන් සුළඟ අව්ව සප්පායදුක ඇති මොවුන්ගේ දුක්පහස් නසන පිණිස, හැමවේලෙහි ම සෘතු උපද්‍රව නසන පිණිස, සිත එකඟකිරීමෙහි ඇලෙනු පිණිස, සෙනසුන් වැළඳගනිමි.

නුවණින් ඒ ඒ ප්‍රයෝජන සලකා ගිලන්පස බෙහෙත් වළඳමි. හැමවේලෙහි ම උපන් සිරුර පෙළන්නාවූ දුක් වේදනාවන් නසනු පිණිස නිදුක්බව උතුම්බැවින් වැළඳගනිමි.

ප්‍රත්‍යවේක්ෂා පරිත්‍රාණයෙහි සිංහලානුවාදය නිමි

දහම් විසඳුර

(දෙතිස් කුණපඅකාරයන්ගේ වශයෙන් අසාරවූ ආත්මභාවය යම් ප්‍රත්‍යයක් නිසා පවතී ද ඒ ප්‍රත්‍යයන් සිඟිනුවණින් යෙදී ලොභාදිපාපධර්මයන් නොවඩනාලෙස පරිභොග කරන විධි දක්වනු පිණිස ප්‍රත්‍යවේක්ෂා ධර්මක්‍රමය මෙහි නික්ෂිප්තය.)

ප්‍රත්‍යවේක්ෂාව නම් තමන් ප්‍රයෝජන ගන්නා සියුපසය ගැන නුවණින් වෙන් වෙන්ව ම සලකා බැලීම යි. හේ මෙවැදූරුම් වේ. විවර ආදිය ලබනවිට ද ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ය. ප්‍රයෝජන ගන්නා කල්හි ද ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ය.

විවර ආදි ප්‍රත්‍යයන් ලැබෙන අවස්ථායෙහි ඒ ඒ ප්‍රත්‍යයන්ව අයත් ධාතුමාත්‍ර වශයෙන් හෝ මේ කුණු ශරීරයෙහි ප්‍රයෝජනයට යොදුගත් කල්හි පිළිකුල් වශයෙන් හෝ එයට කියනලද ප්‍රත්‍යවේක්ෂා ක්‍රමයෙන් පස්විකා අනුභව කරන්නහුගේ පරිභොගය නිරවද්‍ය වේ.

ථෙය්‍යපරිභොග ය, ඉණපරිභොග ය, දායජ්ජපරිභොග ය, සාමිපරිභොග යයි පරිභොග සතරෙකි.

සඟමැද භිඳ වළඳන්නාවූ දුශ්ශීලයාගේ පරිභොගය ථෙය්‍ය පරිභොග නම්. බුදුරජාණන්වහන්සේ විසින් සිල්වත්නට සිපුපසය අනුදත් බැවිනු දු දායකයන් ද සිල්වත්නට දෙමිය යි දෙන බැවිනු දු සිල්වතුන් අයත් පසය දුසිල්හු සඟමැද භිඳ වළඳතු දු ඔහුගේ පරිභොගය ථෙය්‍යපරිභොග නම් වේ.

සිල්වත්හුගේ නො පස්විකු පසය වැළඳීම ඍණපරිභොග නම්. ප්‍රතිග්‍රාහකයා කෙරෙන් දක්ෂිණා විශුද්ධිය නොවන හෙයින් නොපස්විකා වැළඳීම ණයට හෙන වැළඳීමක් වන හෙයිනි.

පිණ්ඩපාතය ආලෝපයක් හෙවත් පිඬක් පාසා ප්‍රත්‍යවේක්ෂා කළයුතු ය. එසේ කරනුව නොපොහොසත්හු විසින් පෙරබත ය, පසුබත ය; පෙරයම ය, මිදුම්යම ය, පැසුළුයම ය යන මේ අවස්ථා වන්හි වත් පස්විකිය යුතුයි. එසේ පස් නොවිකන්නාහට පස් නොවිකන තෙක් ඍණපරිභොග ස්ථානයෙහි ම සිටියි. සෙස සුන් ද පරිභෝජනයක් පාසා පස්විකියයුතු යි. බෙහෙත් පිළිගැනීමෙහි ද ප්‍රයෝජන ගැනීමෙහි ද ප්‍රත්‍යවේක්ෂා සමෘතිය ඇතිකළ යුතුයි. සිහිය ඇති කල්හි වේදනාව ඉවසා ඉන ගැකි කල්හි පස්විකාම පිළිගත යුතුද ප්‍රයෝජන ගතයුතු ද වේ. එසේ නොකරනුහට ඇවැත් වේ. පිළිගැනීමෙහි ප්‍රත්‍යවේක්ෂා සමෘතිය ඇති නොකළ ද ප්‍රයෝජන ගන්නා අවස්ථායෙහි හෝ ප්‍රයෝජන ගත් පසුව හෝ ශක්තිය ඇති කල සිහිකරන්නහුට ඇවැත් නොවේ.

ප්‍රත්‍යවේක්ෂා පරිත්‍රාණයෙහි දහම්විසඳුර නිමි

දසධම්ම සුත්‍රාන්තං

එවං මේ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්‍ස ආරාමෙ, තත්‍රඛෝ භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච–

දස ඉමේ භික්ඛවේ ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා.

කතමේ දස ?

1 වෙවණ්ණියං හි අජ්ඣුපගතෝ හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

2 පරපටිබද්ධා මේ ජීවිකා හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

3 අඤ්ඤමේ ආකප්පෙ කරණීයෝ හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

4 කච්චි නු ඛෝ මෙ අත්තා සීලතෝ න උපවදතී හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

5 කච්චි නු ඛෝ මං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතෝ න උපවදන්ති හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

6 සබ්බේහි මේ පියෙහි මනාපෙහි නානාභාවෝ විනාභාවෝ හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

7 කම්මස්සකොම්හි කම්මදායාදෝ කම්මයෝනි කම්මබන්ධු කම්ම පටිසරණෝ යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදෝ භවිස්සාමි හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

8 කථංභූතස්ස මේ රත්තිං දිවා වීතිපතන්ති හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

9 කච්චි නු ඛෝ හං සුඤ්ඤාගාරෙ අභිරමාමී හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

10 අත්ථි නු ඛෝ මෙ උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සන විසෙසෝ අධිගතෝ, සෝ හං පච්ඡිමෙ කාලෙ සබ්‍රහ්මචාරීහි පුට්ඨෝ න මඞ්කුභවිස්සාමී හි පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං

ඉමේ ඛෝ භික්ඛවේ දස ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා හි

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති

සිංහලානුවාදය

මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවරට ළං වූ ජේත නම් රාජකුමාර යාගේ උයනෙහි (කරවන ලද) අනේපිඬු මහසිටුහුගේ ආරාම යෙහි වැඩවසනසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන්ව කථාකළසේක. ඒ භික්ෂූහු එසේය ස්වාමීන් වහන්ස යි භාග්‍යවත්හට ප්‍රතිවචන දුන්නාහුය. භාග්‍යවතුන් වහන්සේ (මේ මතු දක්වන) ධර්මය වදාළසේක.

මහණෙනි මේ දශ ධර්මයෝ කෙවත් කරුණු දශය ගිහිගෙය හැර පැවිදිවූවහු විසින් එක්වන් (නිතර) නුවණින් සැලකිය යුත්නාහු ය.

ඒ දශධර්මයෝ කවරහු ද යත්?:-

1 (මම) විවණීබවට පැමිණියෙමි යි පැවිදිවූවහු විසින් නිරන්තරයෙන් සැලකියයුතු යි.

2 මාගේ දිවිපැවැත්ම අනුන් අයත් ය යි පැවිද්ද විසින් නිතර සැලකියයුතු යි.

3 මා විසින් අන්‍යවූ ආකල්පයෙක් කවයුතුය යි පැවිද්ද විසින් නිතර සැලකියයුතු යි.

4 කිම මාගේ සිත සීලයෙන් උපවාද නො ලබා ද? යි පැවිද්ද විසින් නිතර සැලකියයුතු යි.

5 කිම නුවණැති සබ්‍රහ්මචාරීන් වහන්සේලා මා හැන සීලයෙන් පරිහව නොකෙරත්ද යි පැවිදිවූවහු විසින් නිතර සැලකියයුතු යි.

6 ප්‍රියවූ මනවඩන්නාවූ සියල්ලෙන් නොඉක්ම හැමදෙනා කෙරෙන් මාගේ නානාභාව ය, මරණයෙන් විනාභාව ය කෙවත් වෙනස්වීම හා වෙන්වීම වේ යයි පැවිද්ද විසින් නිතර සැලකියයුතු යි.

7 (මම කර්මය අයත් කොට ඇත්තෙක් වෙමි කර්මය දායාද කොට ඇත්තෙමි (මා සතු වැසුව නම් කර්මය මය යනුයි) කර්මය ම යොනි කොට කෙවත් උපකරණ කොට ඇත්තෙමි, කර්මය නෑ කොට ඇත්තෙමි (සියලු වැඩට සහාය වන බුද්ධිහු කර්මය මය යන අර්ථයි) කර්මය පිළි සරණ කොට

ඇත්තෙමි (මව පිහිටවනුයේ කමියම ය යන අර්ථයි) යහපත් වූ හෝ අයහපත් වූ හෝ යම් කමියක් කෙරෙමි ද එයට හිමියෙමි හෙවත් ඒ කමිය විසින් දෙන ලද්දට අයිති කාරයෙක් වෙමි යි පැවිද්දෑ විසින් නිතර සැලකිය යුතු යි.

8 එසේ වූ මව රැ දුවල් දෙන ඉක්මෙත් දෝ හෝ යි පැවිද්දෑ විසින් නිතර සැලකිය යුතු යි.

9 කිමෙක් ද මම සූනයාගාරයෙක්හි හෙවත් මහජනයාගෙන් කිස්වූ පෙදෙසක සියලු ඉරියවුවෙහි හුදකලාව ඇලෙමි දෝ හෝ යි පැවිද්දෑ විසින් නිතර සැලකිය යුතු යි.

10 මා සතන්හි උතුරුමිනිස්දම්ගුණ ඇත් දෝ හෝ යි ම විසින් ආශ්චර්යාවයට සුදුසුවූ ඥනදර්ශන විශෙෂයෙක් ලබන ලද්දේ දෝ හෝ යි ඒ මම මරණමඤ්චකයෙහි හොත් කල්හි සබ්‍රහ්මචාරීන් විසින් විචාරන ලද්දෙම් තේජස් රහිත නොවෙමි දෝ හෝ යි පැවිද්දෑ විසින් නිතර සැලකිය යුතු යි

මහණෙනි මේ දශධර්මයෝ ගිහිගෙය හැර මහණවූවහු විසින් එක්වන් පස්විකිය යුත්තාහ හෙවත් නිරන්තරයෙන් සැලකිය යුත්තාහු ය.

භාග්‍යවතුන්වහන්සේ මේ දේශනාව මෙසේ වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව අසා විශෙෂයෙන් සතුටු වූහ.

දශධර්මසූත්‍ර පරිත්‍රාණයෙහි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

1 "මෙහි වෙවණ්ණියං" යනුවෙන් විවණ්ණභාවය (අලංකාරයක් නැතිබව) විරූපභාවය ප්‍රකාශ කෙරෙයි. හෙ වනාහි ශරීර වෛවර්ණ්‍යය, පරිෂ්කාරවෛවර්ණ්‍යය යි දෙවැදෑරුම් වේ. හිසකෙස් රැවුළු කැපීමෙන් ශරීර වෛවර්ණ්‍යය වේ.

පෙර ගිහිකාලයෙහි නොයෙක් පැහැ ඇති සියුම් වස්ත්‍ර හැන්දත් රන් රිදී බදුන්වල රසමසවුලෙන් යුත් අහර අනුභව කළත් ගිතෙල් වෙඩරු ආදියෙන් බෙහෙත් කළත් පැවිදිවූ තැන් පටන් වස්ත්‍ර කපා මසා කසව රඳා වර්ණවිකාරයට පමුණුවා හැන්ද යුතු ය. යකඩ හෝ මැටි පාත්‍රයෙක්හි මිශ්‍රකාහාරය වැළඳිය යුතු ය. රුක් මූල් ආදි සෙනස්නෙහි මැස්සක හෝ තණ ඇතිරි

ආදියක සැනපිය යුතු ය. සම්කඩ පත්කඩ ආදියෙහි හිඳිය යුතු ය. ගෝමූත්‍ර අරළු ආදියෙන් බෙහෙත් කළ යුතු ය. මේසේ මෙහි පරිෂ්කාර වෙවණ්‍යිය දතයුතු. මෙසේ සලකනුවනට කිසිවක් නිසා දෙම්නසක් හෝ මානයක් නොඋපදී ය.

2 "පරපටිබද්ධා මෙ ජීවිකා" යනුවෙන් මගේ ජීවිකාව අනුන් අයත්ය. සියුපසය අනුන්ගෙන් ලැබෙන්නකැ යි මෙසේ සල කන භික්‍ෂුවගේ ඉරියවු පැවතුම් ශ්‍රමණසාරුප්‍ය වේ. ආජීවය ද පිරිසිදු වේ. පිණ්ඩපාතය ද පිදියයුතු තැනැව් පත් වේ. සියුපස පරිභොගය ප්‍රත්‍යවෙක්‍ෂාවෙන් ම කරනලද්දේ වේ.

3 අඤ්ඤෙ මෙ ආකප්පෙපා කරණීයෝ" යන මෙහි ආකල්පය නම් යහපත් අන්දමින් ඉරියවු පැවැත්වීම යි, අන්‍යවු ආකල් පය නම් යිහියන්ගේ ඉරියවුවලින් වෙනස් ව පැවිද්දන්ට නිසි ඉරියවු ය. යිහියන් සේ නොසන්සුන් ඉරියවු නැතිව සන්හුන් ඉදුරන් ඇති ව විශදබු පමණ බලා විසම වූ පාරක ගමන් කරන දිය පිරවූ ඇළක් සෙයින් සන්සුන් ව යා යුතු යයි සලකන මහණහට ශ්‍රමණසාරුප්‍යවූ ම ඉරියවු ඇති වෙයි. ත්‍රිවිධ ශික්‍ෂාව ද පිරෙයි.

4 ඔබගේ සීලය පිරිසිදු නොවේය යි තමාගේ සිතට තමා විසින් ම අපවාද කිරීමට ඉඩක් නැත්ද යි සලකා බැලිම යි. මෙසේ සලකන භික්‍ෂුවට තමාහතන්හි ලජ්ජාව උපදියි. ඒ ලජ්ජාව තුන්දෙර සංවරණය කෙරෙයි; එයින් සියුපිරි සුදු සිල් පිරෙයි; ඒ චතුපාරිශුද්ධි ශීලයෙහි පිහිටි මහණ තෙම විදසුන් වඩා රහත් වෙයි.

5 දනුමැනි භික්‍ෂූනු මා ඔබ සිතා නිදු පරිහව නොකෙරෙත් ද යි සලකන භික්‍ෂුවට භය උපදියි. එයින් තුන්දෙර පිරි සුදුව චතුපාරිශුද්ධි ශීලයෙහි පිහිටා විදසුන් වඩා රහත් වෙයි.

6 සියලු ප්‍රියමනාප වස්තූන්ගෙන් වෙන්වෙමි යි සිතන භික්‍ෂු වට මරණභයය වැවහෙයි.

7 කමිය තමා සන්තක යයි සිතන්නහුට කම්මස්සකත ඤාණා දිටසියෙන් සියලු අකුසල කම්යන්ගෙන් වෙන්දීම වෙයි.

8 කිම මා වත් පිළිවත් පිරීමෙන් හෝ නොපිරීමෙන්, බුද්ධ වචනය ප්‍රගුණ කිරීමෙන් හෝ නොකිරීමෙන්, යොනි

සොමනසිකාරයෙන් (සුවණින් මෙනෙහි කිරීමෙන්) හෝ අයොණිසොමනසිකාරයෙන් (අසුවණින් මෙනෙහි කිරීමෙන්) රැ දුවල ගෙවෙන්නේදැ යි සලකන්නහුට අප්‍රමාද ගුණධර්මය වැළඹියි.

9 විවේකසප්පායක ඉරියවු පැවැත්වීමෙහි සිත් අලවන භික්ෂුවට කාරණවිවේකය පිරෙයි.

10 ඔබ තුළ උත්තරිමනුස්සධර්මයක් හා ඥනදර්ශන විශෙෂයක් ඇත් දැ යි පසුකාලෙක සබ්‍රහ්මචාරීන් විසින් පුළුවුස්නාලද මම එයින් දුර්මුඛ නොවෙමි යි සලකන භික්ෂුවගේ කාලක්‍රියාව නොසිස්වෙයි.

උත්කෘෂ්ට මනුෂ්‍යයන්වූ ඛ්‍යාසීන්ගේ හා ආර්‍යයන්ගේත් දශ කුශලකර්මපථ සංඛ්‍යාත මනුෂ්‍යධර්මයෙන් අතිශයින් ශ්‍රෙෂ්ඨවූ අතිශයින් විශිෂ්ටවූ ධ්‍යාන විදර්ශනා මාර්ග ඵල ධර්මයන්ට උතුරු මිනිස් දම් ය යි කියනුලැබේ. එයම කෙලෙස් දුරුකිරීමෙහි සමර්ථවූ ආර්‍යයන්ගේ චතුස්සත්‍යාවබෝධය සඳහා පිරිසිදු ඥනදර්ශන ගුණ විශෙෂයක් වූයේ නු යි ඥනදර්ශන විශෙෂ නම් වේ.

දසධම්ම සුත්ත පරිත්තයෙකි දහම්විසඳාරිය නිමි

මහා මඞ්ගල සුත්තං

එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජේතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකම් උපසංකම්ත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

1 බහූ දෙවා මනුස්සා ච මඞ්ගලානි අචින්තයුං
ආකඞ්ඛමානා සොත්ථානං බ්‍රූහි මඞ්ගලමුත්තමං

2 අසෙවනා ච බාලානං පණ්ඩිතානඤ්ච සෙවනා
පූජා ච පූජනීයානං එතං මඞ්ගලමුත්තමං

3 පතිරූපදෙසවාසො ච පුබ්බෙ ච කතපුඤ්ඤතා
අත්තසම්මාපණිධි ච එතං මඞ්ගලමුත්තමං

4 බාහුසච්චං ච සිප්පං ච විනයො ච සුසික්ඛිතො
සුභාසිතා ච යා වාචා එතං මඞ්ගලමුත්තමං

5 මාතාපිතූ උපට්ඨානං පුත්තදාරස්ස සඞ්ගහෝ
අනාකුලා ච කම්මන්තා එතං මඞ්ගලමුත්තමං

6 දානං ච ධම්මචරියා ච ඤාතකානං ච සඞ්ගහෝ
අනවජ්ජානි කම්මානි එතං මඞ්ගලමුත්තමං

7 ආරති විරති පාපා මජ්ජපානා ච සඤ්ඤමෝ
අප්පමාදෝ ච ධම්මේසු එතං මඞ්ගලමුත්තමං

8 ගාරවෝ ච නිවාතෝ ච සන්තුට්ඨි ච කතඤ්ඤුතා
කාලේන ධම්මසවණං එතං මඞ්ගලමුත්තමං

9 ඛන්තී ච සොවචස්සතා සමණානං ච දස්සනං
කාලේන ධම්මසාකච්ඡා එතං මඞ්ගලමුත්තමං

10 තපෝ ච බ්‍රහ්මචරියා ච අරියසච්චානදස්සනං
නිබ්බාණසච්ඡිකිරියා ච එතං මඞ්ගලමුත්තමං

11 ඵුට්ඨස්ස ලෝකධම්මේහි චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං එතං මඞ්ගලමුත්තමං

12 එතාදිසානි කත්වාන සබ්බත්ථ මපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තේසං මඞ්ගලමුත්තමන්ති.

මහාමඞ්ගලසුත්තං නිට්ඨිතං

(සරණගමනය ආදිකොට දසධම්මසූත්‍රය කෙළවර කොට ඇති පරිත්‍රාණ ධර්මයන්ගෙන් බුද්ධශාසනයට බැසගැනීමෙහි පටන් උත්තරි මනුෂ්‍යධර්මයන්ගේ අවබෝධය කෙළවර කොට ඇති සිලාදි ක්‍රමය දක්වනලදි. මේ සියල්ල මි පරම ශ්‍රේෂ්ඨ මඞ්ගලය වේ.

ඉම්හෙයකින් මෙලෝ-පරලෝ දෙක්හි ම මහුල් කැමැත්තහු විසින් මෙහි යෙදිය යුතු ද, ඔහුගේ ඒ මඞ්ගලභාවය මේ සූත්‍රානුසාරයෙන් දතයුතුබව දක්වනු පිණිස දසධම්මසූත්‍රයට අනතුරුව මේ මඞ්ගලසූත්‍රය තබනලදි.)

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රදේශනාව මෙසේ අසනලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම්වූ අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි වැඩවසනසේක. එකල්හි එනාහි කාමාවචරයන් අප්‍රමාණවූ එක්තරා දිව්‍යපුත්‍රයෙක් ප්‍රථම

ස්වාමිය ඉකුත්වූ කල්හි යහපත් ශරීරවර්ණය ඇතිව සියලු ජේතවනය බබුළුවාගෙන යම් තැනෙක්හි භාග්‍යවතුන් වහන්සේ වසනසේක් ද, එතැනට එළඹියේ ය. එළඹ භාග්‍යවත්හු වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පස්ව සිටියාවූ ඒ දිව්‍යපුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් කරුණක් සැලකෙළේ ය.

මේ කෙෂස්දයන් :-

1 මේලොව පරලොව දෙක්හි සැප පතන්නාවූ බොහෝ දෙවියෝ ද මනුෂ්‍යයෝ ද මඟුලයන් සිතූහ. (දෙවියන්ගේ අනුමතය ඇතිව මනුෂ්‍යයන් කෙරෙහි අනුග්‍රහයෙන් මා විසින් පුළුවුස්කාලද භාග්‍යවතුන්වහන්සේ අප හැමටම අනුකම්පා පිණිස) උතුම් මඟුලයක් වදාරනු මැනව.

(මෙසේ ඒ දිව්‍යපුත්‍රයාගේ වචනය අසා මිගුල් වදාරන්නාවූ බුදුරජාණන් වහන්සේ :-)

2 අඥානයන් නොඉහොත් අසත්පුරුෂයන් සේවනය නොකිරීම ද, පණ්ඩිතයන් නොහොත් සත්පුරුෂයන් සේවනය කිරීම ද, පිදිය යුතු උතුමන්ට පිදීම ද, යන මෙය උතුම් මංගලයක් වේ.

3 සුදුසු ප්‍රදේශයක විසීම ද, පෙර කළ පින් ඇති බව ද, සිත මනාව පිහිටුවීම ද යන මෙය උතුම් මඟුලයක් වේ. (3 + 3 = 6)

4 බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද, ශිල්ප දැනීම ද, මනාව හික්මුණු විනය ඇති බව ද, යම් වචනයක් සුභාෂිත නම් එය කිම ද යන මෙය උතුම් මඟුලයක් වේ. (6 + 4 = 10)

5 මවුව උපස්ථාන කිරීම ද, පියාව උපස්ථාන කිරීම ද, අඹු දරුවන්ට සංග්‍රහ කිරීම ද, නිරවුල් කම්කටොළු ඇති බව ද යන මෙය උතුම් මඟුලයක් වේ. (10 + 4 = 14)

6 දන් දීම ද, දහකුසලයෙහි හැසිරීම ද, නෑයන්ට සංග්‍රහ කිරීම ද, නිරවද්‍ය ක්‍රියා ද යන මෙය උතුම් මඟුලයක් වේ. (14 + 4 = 18)

7 පාපයෙහි නොඇල්ම හා පවින් වැළැක්ම ද, මත්පැනින් වැළකීම ද, කුශලධර්මයෙහි අප්‍රමාදය ද යන මෙය උතුම් මඟුලයක් වේ. (18 + 3 = 21)

8 ගරුකළයුත්තන්ට ගෞරව කිරීම ද, යටත් පහත් පැවතුම් ඇති බව ද, ලදදෙයින් සතුටුවීම ද, කෙළෙහි ගුණ දන්නා බව ද, සුදුසු කාලයෙහි බණ ඇසීම ද යන මෙය උතුම් මඟුලයක් වේ. (21 + 5 = 26)

9 ඉවසීම ද, කීකරුකම ද, ශ්‍රමණයන්ගේ දැකීම ද, සුදුසු කාලයෙහි ධර්මසාකච්ඡාව ද යන මෙය උතුම් මඟුලයක් වේ. (26 + 4 = 30)

10 සීලය ද, යහපත් හැසිරීම ද, චතුස්සත්‍යයන්ගේ අවබෝධය ද, නිවන් ප්‍රත්‍යක්ෂ කිරීම ද යන මෙය උතුම් මඟුලයක් වේ. (30 + 4 = 34)

11 අෂ්ටලෝකධර්මයෙන් වළඳනාලද යමකුගේ සිත කම්පා නොවේ ද, එමෙයින්ම ශෝක රහිත ද, රාගාදි ක්ලේශ රහිත ද, නිර්භය ද යන මෙය උතුම් මඟුලයක් වේ. (34 + 4 = 38)

12 (අසත්පුරුෂයන් ඇසුරු නොකිරීම් ආදි) මෙබඳු මඟුල යන් කොට සියලු තැන නොපැර ද සියලු තැන සැපයට යෙත් ද එය ඔවුන්ට උතුම් මඟුලය වේ.
මඟුලසූත්‍ර පරිත්‍රාණයෙහි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

මෙයින් "අසෙවනා ච බාලානං" යන ආදි ගාථා දශයකින් අවසිස් මඟුලයක් වදාරන ලද්දේය "දේශනාවසානයෙහි කෝටි ලක්ෂයක් දේවතාවෝ රහත්වූහ. සෝවාන් සකෘදාගාමි අනාගාමි ඵලයන්ට පත්වූවන්ගේ ගණනෙක් නොවීය. බුදුරජාණන් වහන්සේ දෙවන දවස ආනන්දමහතෙරුන් අමතා "ආනන්දය, මේ ගතවූ රාත්‍රියෙහි එක්තරාදෙවියෙක් මා කරා එළඹ මඟුලප්‍රශ්නය විමැලේ ය. එකල්හි මම ඕහුට අවසිසක් මඟුල් කීයෙමි. ආනන්දය, මේ මඟුලපරියාය ධර්මදේශකයාව උගනුව. උගෙන භික්ෂූන්වත් පුහුණු කරව" යි වදාළසේක. තෙරුන්වහන්සේ ද ඉගෙන සෙසු භික්ෂූන්ට ද ඉගැන්වූහ. ඒ මේ ධර්මය ආචාර්‍යපරම්පරාවෙන් අද දක්වාත් පැවත එන්නේ ය.

දැන් මේ මඟුල ධර්මයන්හි දක්ෂතාවය ඇතිවනු පිණිස මූල පවන් අග දක්වා මෙහි යෝජනා ක්‍රමය මෙසේ දතයුතු.

මේලෝ පරලෝ දෙක්හි සැප කැමති සත්‍යයෝ බාලජන සේවනය කම්වූ අසත්පුරුෂාශ්‍රය දුරුකොට, පණ්ඩිතවූ සත්පුරුෂයන් ඇසුරුකොට, පිදිය යුතු වැඩිහිටියන් පුදමින්, ප්‍රතිරූප දේශයෙහි විසීමෙන් හා පෙර කළ පින් ඇතිබැවින් ද කුශලක්‍රියාවෙහි සිත මෙහෙයවමින් සිත මතා කොට පිහිටුවා බහුශ්‍රැත බවෙන් හා ශිල්ප ඉගෙනීමෙන් සුශික්ෂිත ව, සැරසුණු අත්බැව් ඇතිව, විනයානුරූප ලෙස සුභාෂිත වචන කියමින්, ගිහිජීවිතය අත හොඳරි නාකාක් මවුපියන්ට උපස්ථාන කිරීමේ ණයෙන් නිදහස්ව, අඹු දරුවන්ට සංග්‍රහ කිරීමෙන් අලුත් ණයමුලක් ඇති කොට, නිරවුල් කම්කටයුත්ත ඇති බැවින් ධනධාන්‍යාදියෙන් සෘද්ධිමත් ව, දන් දීමෙන් වස්තුවෙහි සාරයත් ධර්මයහි හැසිරීමෙන් ජීවිතයෙහි සාරයත් දැන, ඥාති සංග්‍රහයන් සවකිය ජනයාට හිතවැඩත් නිරවද්‍ය කම්කටයුතුවලින් අන්‍යජනයාට හිත වැඩත් සලසමින්, පවින් වැළකීමෙන් අනුන්ගේ විනාශයත් මත්පැනින් වැළකීමෙන් තමන්ගේ විනාශයත් දුරුකොට, ධර්මයෙහි අප්‍රමාදවීමෙන් කුශල පක්ෂය දිසුණු කොට, වැඩූ කුසල් ඇතිබැවින් ගිහිවේශය හැර පැවිදිව, එතැන්පටන් බුද්ධ බුද්ධශ්‍රාවක උපාධ්‍යාය ආචාර්‍යාදීන් කෙරෙහි ගෞරවයෙන් හා යටත් පැවැත්මෙන් ද වත්සම්පන්නව ලදදෙසින් සතුටුවීමෙන් ප්‍රත්‍යයෙහි ලොල්බව දුරුකොට, කෙලෙහි ගුණ දන්නා බැවින් සත්පුරුෂභූමියෙහි පිහිටා බණ ඇසීමෙන් සිතෙහි මැලිබව දුරුකොට, ඉවසිමෙන් සියලු උවදුරු මැඩ, සුවව බැවින් තමන් සනාථව, ශ්‍රමණයන් දැකීමෙන් ප්‍රතිපත්ති පූරණය දැක, ධර්මසාකච්ඡාවෙන් සැක දුරුකොට, ඉන්ද්‍රියසංවර සීලයෙන් සීලවිසුද්ධිය ද, මහණදම් පිරීමෙන් හා බ්‍රහ්මචරියවාසයෙන් චිත්ත විසුද්ධිය ද, එයින් මත්තෙහි අනික් සතරවිශුද්ධි ද සපයමින් මේ ප්‍රතිපදාවෙන් චතුස්සත්‍යාවබෝධය කෙළවර කොට ඇති ඤාණ දස්සන විසුද්ධියට පැමිණ අර්හත්ඵල කම්වූ නිවන ප්‍රත්‍යක්ෂ කෙරෙති.

මොවුහු ගම් නිවනක් ප්‍රත්‍යක්ෂ කොට වාත මේඝයකින් මහා මේරු පර්වතය නොසැලිය හැක්කා සේ අෂ්ටලෝක ධර්මයෙන් අකම්පිත සිත් ඇතිව ශෝක නැතිව කෙලෙස් නැතිව නිර්මල වෙත් ද, ඔවුහු සියලුතන්හි මේ එක ගුණයකිනුදු නොපැරදුණාහු වෙති. සියලුතන්හි සැපතට පැමිණෙත්. එය ඔවුන්ට උතුම් මඟඵලය වේ.

එහෙයින් වදාළහ

"එතාදිසානි කත්වාන සබ්බත්ථ මපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තෙසං මඞ්ගල මුත්තමං"යි

මඞ්ගල පරිත්තදෙශනා දහම් විසෘතරය නිමි.

රතන සුත්තං

1 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ,
සබ්බෙව භූතා සුමනා භවන්තු
අථොපි සක්කච්ච සුණන්තු භාසිතං.

2 තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරෝථ මානුසියා පජාය,
දිවා ච රත්තා ච හරන්ති යෙ බලිං
තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා.

3 යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසු වා යං රතනං පණීතං,
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

4 ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො,
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

5 යම්බුද්ධසෙට්ඨා පරිවණ්ණයි සුචිං
සමාධිමානන්තරිකඤ්ඤ මාහු
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

6 යෙ පුග්ගලා අට්ඨසතං පසත්ථා
චත්තාරි එතානි යුගානි හොනති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදමපි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

7 යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්කාමිනෝ ගොතමසාසනම්හි
තෙ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදමපි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

8 යථින්දඛීලෝ පථවිංසිතෝ සියා
චතුබ්භි වාතෙහි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදමපි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

9 යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදමපි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

10 සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වා පි යදත්ථි කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තෝ
ඡ්චාභිඨානානි අභබ්බෝ කාතුං
ඉදමපි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

11 භිඤ්ඤවාපි සෝ කම්මං කරොති පාපකා
කායෙන වාචා උද චෙතසා වා
අභබ්බා සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

12 වනපපගුම්බෙ යථා ඵුසිතග්ගෙ
ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්මවරං අදෙසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

13 වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු!

14 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ,
තථාගතං දෙවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු!

15 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ,
තථාගතං දෙවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු!

16 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ,
තථාගතං දෙවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හොතු!

රතන සූත්‍රය නිමියි.

සිංහලානුවාදය

1 මෙතැන්හි රැස්වූ පොළොවෙහි වූ හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය ප්‍රකෘතියක් ඇත් ද, ඒ සියල්ලෝ සතුටු සිත් ඇත්තෝ වෙත්වා! තවද මාගේ වචනය සකස්ව අසත්වා!

2 අමනුෂ්‍යයෙනි, යම්කෙයකින් වෙනත් කවුරුත් හැර බණ ඇසීම් සඳහාම නුඹලා පැමිණියාහු ද එකෙසින් මාගේ වචනය (නුඹලා)අසව්. සියල්ලෝ ම මනුෂ්‍යප්‍රජාව කෙරෙහි මෛත්‍රී කරව්. යම් තෙනෙක් දවල් ද රෑ ද නුඹලාව පූජා සත්කාර කෙරෙත් ද එහෙයින් (නුඹලා) ඒ මිනිසුන් අප්‍රමාදව රකිව්.

3 මෙලොව ද නාගසුපණ්ණාදි ලොකවල ද යම්කිසි වස්තුවක් වේ ද සඟගෙහි හෝ යම්කිසි උතුම් රත්නයක් වේ ද (ඒ වස්තු දෙකම) සමිඳුන් වහන්සේ හා සමාන කොවේ. බුදුන්වහන්සේ කෙරෙහි මේ රත්නභාවය ද උතුම්ය. මේ සත්‍යයෙන් සත්නට සැප වේවා!

4 එකඟවූ සිත් ඇති ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේ (රාගාදි කෙලෙසුන් දුරුකරන හෙයින්) ක්ෂය නම්වූ (තණ්හාව නැති හෙයින්) විරාග නම්වූ (මරණයක් නැති හෙයින්) අමෘත නම්වූ යම්කිසි නිවනක් අවබෝධකළසේක් ද ඒ නිර්වාණය හා සමවූ කිසි ධර්මයෙක් නැත. ධර්මයෙහි මේ රත්නභාවය ද උතුම්ය මේ සත්‍යයෙන් සත්නට සැප වේවා!

5 තථාගතයන් වහන්සේ පිරිසිදුවූ යම් ආර්‍යමාර්ගයක් වදාළසේක් ද යම් මාර්ගයක් ආනන්තරික සමාධි යයි දෙසූසේක් ද ඒ සමාධිය හා සමානවූ අනික් සමාධියෙක් නැත. ධර්මයෙහි මේ රත්නභාවය ද උතුම්ය. මේ සත්‍යයෙන් සත්නට සැප වේවා!

9 යම් අෂ්ටාර්‍ය පුද්ගල කෙනෙක් (බුදුහාදි උතුමන් විසින්) පසස්නා ලද්දාහු ද නොඉක්මවා යම් එකසිය අවක් ආර්‍යපුද්ගලයෝ පසස්නා ලද්දාහු ද මොහු හැමදෙනම යුග වශයෙන් සතරෙක් වෙත්. බුදුන්ගේ ශ්‍රාවකවූ ඒ ආර්‍ය පුද්ගලයෝ දක්ෂිණාවට හෙවත් දන් පිළිගැනීමට සුදුසු වෙත්. මුන්වහන්සේලා කෙරෙහි දෙන ලද වස්තුහු මහත් අනුසස් ඇත්තාහ. සංඝයා කෙරෙහි මේ රත්නභාවය ද උතුම්ය මේ සත්‍යයෙන් සත්නට සැප වේවා!

7 යම් කෙනෙක් සිරවූ සිතින් මනාකොට ගෞතම නම්වූ තථාගත ශාසනයෙහි සියලු කෙලෙසුන් දුරලන්නාවූ මිදුණාහු ද ඔව්හු නිවනට බැස නොමිලඟේ ලත්

නිවන්සැප වළඳන්කාහු රහත්ඵලයව පැමිණියාහු නම් වෙත්. සහුරුවන් කෙරෙහි මේ රත්න භාවය ද උතුම් ය. මේ සත්‍යයෙන් සත්නට සැප වේවා!

8 පොළොවෙහි යවට බැසගත් ඉන්ද්‍රකීලය තෙම් සතර දිගින් හමනලද සුළඟින් යම්සේ කම්පා නොකොට හැකි වේ ද යම් ආර්‍යපුද්ගලයෙක් චතුරාර්‍යසත්‍යය නුවණින් අවබොධ කෙළේ ද ඒ සත්පුරුෂයා ඉන්ද්‍රකීලය බදු යැයි කියමි. සංඝයා කෙරෙහි මේ රත්නභාවය ද උතුම් වේ. මේ සත්‍යයෙන් සත්නට සැප වේවා!

9 යම් ශ්‍රොතාපන්න ආර්‍ය්‍ය පුද්ගල කෙනෙක් සවිඥයන් වහන්සේ විසින් මනාකොට දෙසනලද චතුරාර්‍ය්‍ය සත්‍යයන් යම් මාගීඥානලෝකයෙන් තුමූ අවබොධ කෙරෙත් ද, ඔවුහු කිසිසේත් අතිශයින් පමාවූවාහු අටවන පිළිසඳක් නොගනිත්. සංඝයා කෙරෙහි මේ රත්න භාවය ද උතුම් ය. මේ සත්‍යයෙන් සත්නට සැප වේවා!

10 මේ සෝවාන් පුද්ගලයාගේ දර්‍ශනසම්පත්තිය හා සම්භ සත්කායදෘෂ්ටිය ද, විචිකිත්සාව ද, යම්කිසි ශීලව්‍රතපරා මර්‍ශියක් වේ නම් ඒ ද දුරුවූවාහු වෙත් ද තෙතෙම සතර අපායයෙන් මිදුණේ වේ. සවැදරුම් ඛරපතල පාපයන් කරන්නට නුසුදුස්සෙක් වේ. මේ ද සංඝයා කෙරෙහි උතුම්වූ රත්නභාවය වේ. මේ සත්‍යයෙනු දු සත්නට සැප වේවා!

11 සමහරවිට ඒ සෝවාන් පුද්ගල තෙම කිසිසේත් කයින් හෝ වචනයෙන් හෝ සිතින් හෝ යම් ලාමක අකුසල කර්‍මයක් කෙරේ ද තෙතෙම ඒ පාපය සඟවන්නට නුසුදුස්සෙක් වේ. ඒ සෝවාන් පුද්ගලයාගේ අකුසල් සැඟවීමෙහි අයොග්‍යබව වදරනලදි. සංඝයා කෙරෙහි මේ රත්න භාවය ද උතුම් ය. මේ සත්‍යයෙන් සත්නට සැප වේවා!

12 වතළඟැබ තෙමේ ග්‍රීෂ්මඍතුවේ පළමුවන මාසයෙහි මනාව පිපුණු අඟ ඇතිව යම්සේ සොභාමත් වේ ද, එබදුවූ නිවනව පමුණුවන උතුම්වූ ධර්‍මය තවත් පිණිස දෙසූ සේක. මේ ද බුදුන් කෙරෙන් උතුම්වූ රත්නභාවය වේ. මේ සත්‍යයෙන් සත්නට සැප වේවා!

13 උතුම්වූ, නිවන් දත්තාවූ,නිවන් දුන්නාවූ, නිර්‍වාණගාමිනී ප්‍රතිපදාව එළවූ, උතුම්වූ තථාගතයන් වහන්සේ යම් නව ලොකොත්තර ධර්‍මයක් දෙසූසේක් ද, මේ ද බුදුන් කෙරෙහි උතුම් රත්නභාවය වේ. මේ සත්‍යයෙන් සත්තව සැප වේවා!

14 යම් කෙනකුන්ට අතීතභවය සිදුණේ ද, අලුත් භවයක් නැත් ද, යම් කෙනෙක් මතුභවයෙහි තෘෂ්ණා සිත් ඇත්තාහු ද, ඒ ක්ෂීණාශ්‍රවයෝ ප්‍රතිසන්ධිවිඥාන නැසුවාහු පුනරුත්පත්තියෙහි ආසාවක් නැත්තා හු මේ පහන (නිවුණාක් මෙන්) නිවෙත්. මේ ද සංඝයා කෙරෙහි උතුම් රත්නභාවය වේ. මේ සත්‍යයෙන් සත්තව සැප වේවා!

15 මෙතන්හි රැස්වූ පොළොව ඇසුරු කළාවූ හෝ, අහස ඇසුරු කළාවූ හෝ, යම් අමනුෂ්‍ය කෙනෙක් වෙත් ද, ඒ අපි හැම දෙනම දෙවිමිනිසුන් විසින් පුදනලද තථාගත නම්වූ බුද්ධරත්නය වඳුමහ. එහෙයින් සත්තව සැප වේවා!

16 නවලොකොත්තර ධර්‍මරත්නය වඳුමහ එහෙයින් සත්තව සැප වේවා!

17 අට්ඨාර්‍ය පුද්ගල සංඝරත්නය වඳුමහ. එහෙයින් සත්තව සැප වේවා!

රත්න සූත්‍රපරිත්‍රාණයෙහි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

(මඞ්ගලසූත්‍රයෙන් ආත්මාරක්ෂාව කෙවත් තමන්ගේ ආරක්ෂාව සලස්වා රතනසූත්‍රයෙන් පරාරක්ෂාව හා අමනුෂ්‍යාදීන්ගෙන් ඇති වන උවදුරු වලින් වැළැක්වීම සලස්වනු පිණිසත් මඞ්ගල සූත්‍රයට අනතුරුව රතනසූත්‍රය ප්‍රකාශ කරනලදී.)

අතීතයෙහි විශාලා මහනුවර මහත් දුර්භික්ෂයක් ඇති වි ය. කෑම් බීමකමින් මිනිස්සු මැරෙන්ට වූහ. ඒ මලකුණු නුවරින් බැහැර කළහ. මිනීගඳින් අමනුෂ්‍යයෝ නුවරට ඇතුල්වූ හ. එයින් පසු තවතවත් මිනිසුන් මැරෙන්ට වි ය. ඒ හේතුවෙන් අතිවාඝක නම්වූ දරුණු රෝගයක් ඇති වි ය.

මෙසේ දුර්භික්ෂ භය, අමනුෂ්‍ය භය රෝග භය යන ත්‍රිවිධ භයෙන් උවදුරට පත් විශාලා මහ නුවර වැසි මිනිස්සු මෙපවතක් රජහට දන්වූහ. රජ තෙමේ නුවරවැස්සන් සන්සුන්කාරී ශාන්තිමත් කිරීම් කරවා තමන් අත වරදෙක් ඇත්ද සි ඇසිය යුතුය දේවයන්වහන්සැ සි කී කල්හි එසේවී නම් ලොවුතුරා බුදුරජාණන් වහන්සේ සියලු සත්තව හිත සැප පිණිස ලොව පහළවිසූහ. උන්වහන්සේ මේ නුවරට වැඩමවා ගත් කල්හි සියලු උවදුරු දුරු වන්නේය සි සාකච්ඡා කළහ. බිම්සර මහරජතුමන්ගේ කැමැත්ත ද ඇතිව ලිච්ඡවී රජවරු දෙදෙනෙක් බුදුන් කරා එළඹ "ස්වාමිනි තුන් ඕනකින් විපතට පත් අපරට වැස්සන්ගේ නිදුක් නිරෝගි බැව් පිණිස භාග්‍යවතුන් වහන්සේ අපගේ නුවරට වඩනා සේක් නම් අපට සැපතක් වන්නේ ය" සි ආයාචනා කළහ.

බුදුරජාණන් වහන්සේ එය පිළිගෙන වදාරා රතනසූත්‍ර දේශනා ඇසිනි අණතෙද කෙළලක්ෂයක් සක්වළ ආරක්ෂාව සිදු කරන්නේ ය සි ද එයින් මහත් පිරිසකට ධර්මාවබෝධය වන්නේය සි ද සලකා පන් සියයක් භික්ෂූන් සමඟ විශාලා මහ නුවරට වැඩ රුවන් පිරිත් දෙසූහ.

මෙකල්හි සිසූ දිගින්ම කළුවකාට නැගුණු මහා මේඝයෙන් මළකදන් ඉල්පවා ගෙන ගොස් ගංගා නම් ගඟට රොක වී පාවිය. විශාලා මහනුවර පිරිසිදු විය. පන්සිය යක් පමණවූ බුදු පාමොක් මහා සංඝයා වහන්සේ විශාලා මහනුවරට වඩින්ම ශක්‍ර දෙවේන්ද්‍රාදී ආනුභාව සම්පන්න දෙවිවරු ද පැමිණෙන්ට වන්හ. ඔවුහු පැමිණෙන්ම අමනුෂ්‍යයෝ ක්‍රමයෙන් ඉවත් වන්ට වූහ.

බුදුරජාණන් වහන්සේ රුවන්සුතුර වදාරා නුවර දෙරටුමඟ වැඩ සිට ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථා කොට "ඉමං ආනන්ද රතනසුත්තං උගණ්හෙත්වා, බලිකම්මූපකරණාය භාගා පෙත්වා ලිච්ඡවී කුමාරෙහි සද්ධිං චෙසාලියා තිසු පාකාරන්තරෙසු චීවරන්තා පරිත්තං කරොථ" යනුවෙන් ආනන්ද, මේ රතනසූත්‍රය උගෙන පිරිත් පැන් ආදී පූජොපකරණයන් ගෙන්වා ගෙන ලිච්ඡවී කුමරුවන් සමඟ විශාලා මහනුවර තුන් ප්‍රාකාරයන්හි වටා ගැසී රැකවරණ පිරිත් කරව සි වදාළහ.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද බුදුන්ගේ පාත්‍රාව පිරිත් පැන් ගෙන රුවන්සුතුර කියා කියා මුළු නුවරට ම පිරිත් පැන් ඉස්සාහ. "යං කිඤ්චි විත්තං" යනාදී ගාථා දෙසූ විගස ම සියලු අමනුෂ්‍යයෝ

පලා ගියහ. නුවර ආරක්ෂා සහිත වී ය. සියලු උවදුරු නැති වී ය. මිනිස්සු සුඛිත මුදිත වූහ. සුවාසුදහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය වී ය. භාග්‍යවතුන් වහන්සේ එම රතනසූත්‍රය දෙවන දවස් හි ද වදාළසේක. එවේලෙහි ද සුවාසුදහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය වී ය. මෙසේ පිළිවෙළින් සත්වන දවස දක්වා සත් දිනක් මේ රතනසූත්‍ර දේශනාව වදාළසේක. ඒ ඒ දවස්හි දු එසේම ධර්මාවබෝධය වී ය.

1 "යානීධ භූතානි සමාගතානි" යන්නෙන් විශෙෂයෙන් මෙතන්හි රැස්වූ අල්පේශාක්‍ය මහෙශාක්‍ය දෙවියන් ගැනෙතු දු සාමාන්‍යයෙන් මෙහි සඳහන් 'භූත'ශබ්දයෙන් සියලු අමනුෂ්‍යයෝම ඇතුළත් වෙති.

"සක්කච්ච සුණාතු භාසිතං" යනුවෙන් සකස් ව බණ පිරිත් අසත්වාසි නියෝග කළහ. මෙයින් ප්‍රයෝග සම්පත්තිය, යොනිසොමනසිකාරය, (නුවණින් මෙනෙහි කිරීම) පරතොඝොෂය, (ඔම්ශ්‍රවණය) එසේම අත්තසම්මාපණිධිය (සිත හොඳින් පිහිටුවා ගැනීම) බුද්ධාදි සත්පුරුෂයන්ගේ ආශ්‍රය යන මේ සම්පත් අතු රෙන් සමාධිය (සිත එකඟකරගැනීම) හා ප්‍රඥාවත් දියුණුකරගැනීම ව හේතුවූ සම්පත් ප්‍රතිලාභය සකස්ව පිරිත් බණ අසන්නවුන්ට ලැබෙන බව දැක්වූහ.

2 "තසමා හි භූතා නිසාමෙථ සබ්බෙ" යනාදිගයින් අමනුෂ්‍ය යෙනි, නුඹලා දෙව්විමන් හැර දමා මෙහි රැස්වූයේ කැටුම් ගැයුම් ඇදීමට නොව නුදෙක් බණ ඇසීමට ය. මාගේ ධර්මය අතිශයින් දුර්ලභය. ලෞකික ලොකොත්තර සම්පත් ප්‍රතිලාභයෙන් තොරෙක් අනුසස් ඇත්තේ ය. එහෙයින් සියල්ලෝ ම අසත්වා සිති නියම් කළහ. "මෙත්තං කරොථ මානුසියා පජාය" යන්නෙන් ත්‍රිවිධ උපද්‍රවයෙන් පීඩිතවූ මනුෂ්‍යප්‍රජාව කෙරෙහි මිත්‍රත්වය හෙවත් හිතවත් බව ඇති කරන ලෙස නියෝග කළ හ.

එසේම උවදුරු වළක්වා ගැනීමට කැමති මිනිස්සු සිතියම් වශයෙන් දේවරූප ඇඳගෙන හෝ ලියෙන් දේවරූප කපාගෙන හෝ වෙනත් විදි වලින් හෝ බෝගස් නුගගස් ආදි දේවාධිෂ්ඨිත පූජනීය වෘක්ෂ ඉහළමයන් කරා ගොසින් හෝ දවල් කාලයෙහි බතින් බුලතින් හෝ මදවියන් උදෙසා පුදපූජා කෙරෙති. දෙවියන් උදෙසා කළුවර පක්ෂයෙහි රාත්‍රියෙහි දු පහන් දල්වති. දිනකට

පාසා සලාකදන් පොළොය දන් ආදිය දී තමන් රක්නා දෙවියන් පටන් සියලු දෙව්බඹුන්ට පින්දෙති. ධජපතාකාදිය නංවා පහන් පූජා පවත්වා ධර්මදේශනා කරවා රාත්‍රි කාලයෙහි දු පින් දෙති.

මෙසේ දිවා රාත්‍රි දෙක්හි පින්දහම් තෙරමින් නුඹලාට පින් දෙන ඒ මනුෂ්‍යප්‍රජාව තොරක්ෂන් කුමන අකෘතඥතාවක් නිසා ද? එහෙයින් අමනුෂ්‍යවරුනි, කෙලෙසිගුණ සලකා ඒ මිනිසුන් රකිව්. ඔවුන්ගෙන් ලැබෙන උපකාරයන් අමතක නො කොට එය නිතර සිහි කෙරෙමින් ඔවුන්ට සිදුවන විපත් දුරහැර හිතවැඩ සලසව් යනු මෙයින් ප්‍රකාශ කෙරෙයි.

3 "යං කිඤ්චි විත්තං" යනාදීන් මේ මනුෂ්‍යලෝකයෙහි හෝ අවශෙෂ ලෝකවල හෝ දිව්‍යලෝක නාගලෝකාදියක හෝ යම්කිසි උතුම් රත්නයක් වේ ද එය තථාගත රත්නය හා සමාන නොවේ. මෙ ද බුදුරජාණන් වහන්සේ කෙරෙහි පවත්නා ශ්‍රෙෂ්ඨ රත්න භාවය යි. මේ සත්‍ය ක්‍රියාවෙන් සියල්ලන්ට සැප වේවා! යි සෙත් පතන ලදී.

සිතූ පැතූ සම්පත් සමෘද්ධ කර දෙන බැවින් ද, මා හැඟි බැවින් ද, අසමාන බැවින් ද, දුර්ලභව දක්නා බැවින් ද රත්න නම් වේ.

බුදුන් ලොව පහළ වූ කල්හි සැදැහැවත් දිව්‍යමනුෂ්‍යයෝ අනික් තැනකට මහාස් ගෞරවාදර බුහුමන් නො කෙරෙති. සහම්පති මහාබ්‍රහ්ම තෙමේ මහමෙරක් සා විශාලවූ රත්නදම්ගසින් බුදුන් පිදූයේ ය. බිම්සර, කෝසල, අනාථපිණ්ඩික, විශාඛා ආදි මනුෂ්‍ය යෝ ද නොයෙක් අයුරින් පිදූහ. ධර්මාශොක මහරජතෙම මුළු මහත් දඹදිව අසූහාර දහසක් විහාර කරවිය. බුදුන් පිරිනිවි පසු ද ලුම්බිනිය, මහබෝමැඩ, ඉසිපතනය, කුසිණාරාවය යන උත්පත්ති භූමිය, බුද්ධ භූමිය, ධම්මචක්ක භූමිය, පරිනිබ්බාණභූමිය දැ යි යන මෙකී උත්තමස්ථානයන් හා ප්‍රතිමා චෛත්‍යයන් උදෙසා ද බුදුන් ජීවමාන කල්හි මෙන් ගෞරවාදර කෙරෙති. මෙසේ පූජනීයත්ව යෙනු දු තථාගත රත්නය හා සම්වූ රත්නයෙක් ලෝකයෙහි නො මැත්තේ ය.

කසිසළු වතාහි වැඩි වටිනා කමක් ඇති වස්ත්‍ර විශෙෂයෙකි. එහෙත් යම් සැදැහැවතකු විසින් තථාගතයන් වහන්සේට පිරි නමනු ලබන පංසුකූල චීවරයක්, පිණ්ඩපාතයක්, සෙනසුනක්, ඖෂධ පසක් හෝ ඇත්ද එයින් ඔවුන්ට මහත්ඵල මහානිසංස ලැබෙ හි. මේ ද තථාගත රත්නයෙහි මහාඤ්ඤා වේ.

සක්විති රජතුට තමන් කළ පුණ්‍යානුභාවයෙන් චක්‍රරත්නය හා මාණික්‍යරත්නයක් ද පහළවෙති. මේ වතාහි සෙසු රත්න සත්ර වඩා ශ්‍රේෂ්ඨය. එය මෙපමණ ලක්ෂයක් කෝටියක් අගනේ ය යි තුලනාත්මක තීරණයකට බැසගත නො හැක්කේ ය. එසේ ද වුවත් සීල—සමාධි—ප්‍රඥා ආදි ගුණවලින් තථාගතයන් වහන්සේට සමාන කළ හැකි පුද්ගලයකු නැති හෙයින් අතුල්‍යාපි යෙනුත් තථාගත රත්නයම ශ්‍රේෂ්ඨ වේ.

සක්විති රජතුමන් හා ඔහුගේ රත්නයන් ද දුර්ලභව දකින්ට ලැබෙන වසතු ය. එසේ ද වුවත් එක කල්පයෙක්හි සක්විති රජුන් කිප දෙනකු වුවත් පහළ විය හැක්කේ ය. එබඳු කල්ප අසංඛ්‍යයක් ගතවුවත් ලෝකයෙහි ලොවුතුරා බුදුවරයකු පහළ විය නො හැක්කේ ය. එහෙයින් තථාගතයන් වහන්සේ දුර්ලභව දක්නට ලැබෙන පුද්ගලයකු හෙයින් දුර්ලභදර්ශනාර්ථයෙනුත් ශ්‍රේෂ්ඨ රත්නයෙකි.

ඇමිසේ දස සක්විතිවන් පිරූ සක්විති රජකු විසින් ම චක්‍ර රත්නය ආදි උතුම් වසතු පරිභොග කටහැකි වේ ද සෙසු ලාමක සත්වයනට ප්‍රයෝජන ගතහැකි නො වේ ද එසේම සසර පිරූ පෙරුම් ඇතිව උපනිශ්‍රය සම්පත්තියෙන් යුක්තවූවන් විසින් ම හෙවත් එබදු අලාමක සත්වයන් විසින් ම ඇසුරු කළ යුතු හෙයින් තථාගත රත්නයම ශ්‍රේෂ්ඨ වේ

මෙසින් භාග්‍යවතුන්වහන්සේ බුද්ධරත්නයෙහි ගුණ පවසමින් ඒ සත්‍යයෙන් සත්තට පෙත් වේවා! යි සත්‍යක්‍රියා කළ සේක.

4 "ඛයං විරාගං අමතං පණීතං" යන ආදියෙහි නිවනට ඛය, විරාග, අමත, පණීත යන නම් ඒ ඒ අර්ථයන් සලකා ව්‍යවහාර කරනු ලැබේ. නිවන ප්‍රත්‍යක්ෂ කිරීමේ දී අරමුණු කිරීම් වශයෙන් හෝ අරමුණුවල යෙදීම් වශයෙන් රාගාදි සෙලෙස් දුරුවන හෙයින් ඛය යයි කියනු ලැබේ. අරමුණුවල නොඇලෙන හෙයින් විරාග නම් වේ. ඉපදීම හා ජරාමරණ නැති හෙයින් අමත නම් වේ. උතුම් හෙයින් පණීත නම් වේ. ආර්‍යාෂ්ටාංගික සමාධියෙන් තැන් පත්වූ සිත් ඇති ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේ යම් නිවී සැනසීමකට පැමිණියේක් ද, තමන්වහන්සේගේ ඤාණබලයෙන් යම් නිවනක් අවබෝධ කළසේක් ද, ඒ නිර්‍වාණය අනික් කිසි ධර්මයක් හා තුල් කළ නො හැකි ය. මේ ද ධර්මයෙහි ප්‍රණීත රත්නභාවය වේ.

මෙයින් භාග්‍යවතුන් වහන්සේ මාගේ ධර්මයෙහි ගුණ පවසමින් මේ සත්‍යයෙන් සත්‍යට හෙත් වේවා! යි සත්‍යක්‍රියා කළසේක.

6 "යං බුද්ධසෙට්ඨා පරිවණ්ණයී" යනාදියෙහි ශ්‍රේෂ්ඨවූ බුදු රජාණන් වහන්සේ යම් පිරිසිදු සමාධියක් වර්ණනා කළසේක් ද, යම් සමාධියකව' ආනන්තරික සමාධිය' යි වදාළසේක් ද එයට සමානවූ අන්කිසි සමාධියක් නැත. මේ ද ධර්මයෙහි ප්‍රණීත රත්න භාවය වේ.

සමාධිය යනු සිත එකඟකර ගැනීමය. මෙය ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි ආර්‍ය සම්‍යක් සමාධි යයි කියනු ලැබේ. යම් ආර්‍ය සමාධියක් මාර්ගසිතක උපන්කල්හි එයට අනතුරුව ම ඵලය උපදවාදීම නො වැළැක්විය හැකි සිද්ධියක් හෙයින් ඊට ආනන්තරික සමාධි යයි කියනු ලැබේ. අහින් මාර්ගසමාධිය උපන්කල්හි අහිත් ඵලය කිසිදු බාධාවක් නැතිව උපදියි යනු ධර්මනියමය යි.

යවත් පිරිසෙයින් යම් ආර්‍යපුද්ගලයෙක් සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙහි පිළිපන්නේ වේ ද, එකල්හි ගින්නකින් කල්ප විනාශය වේගත එන අවස්ථාවක වුවද එම කල්පාන්ත වහ්නියව වත් ඔහුගේ ඵලසිතට බාධා කළ නො හැකිය. එහෙයින් "මග්ග සමඞ්ගිනො පන ඵලස්ස අන්තරායො න සක්කා කාතුං"යි අට්ඨකථා යෙහි දැක්වූහ.

යම් අවස්ථාවක මාර්ගසිත පහල වේ ද, ඉක්බිති මනොද්වාරා වර්ජන සිත උපදියි. එයින් පසු අනුලෝම සිත් තුනක් හා එක් ගොත්‍රභූ සිතක් ද, එක් මාර්ගසිතක් හා ඵලසිත් දෙකක් ද, ප්‍රත්‍යවේක්ෂා ජවන්සිත් පසක් ද, භවාඞ්ග නිරුද්ධ වන තෙක් කල්පාන්ත වහ්නිය වුව ද නො නැති නවත්නේ ය.

මේ සඳහා බාහිර උපමාවක් දක්වනු ලැබේ. ඉදින් සෝවාන් මාර්ගඵල පිළිපන් ආර්‍යපුද්ගලයකුගේ හිස මීතුවෙහි විශාල කළු ගලක් රැහැන් තුනකින් එල්ලා තැබූ කල්හි එයින් එක් ලනුවක් කැඩී ගියත් දෙකකින් එම ගල රැඳී පවත්නේ ය. දෙකක් කැඩුණු කල එකකින් රැඳෙන්නේ ය. එම රැහැනත් කැඩුණුකල වළා කුළක් මෙන් එම ගල අහස්කුස රැඳෙනු මිස ඒ ආර්‍යපුද්ගලයාගේ මාර්ගසිතට අනතුරු ව ලැබෙන ආනන්තරික සමාධි නම්වූ ඵලසිතට කිසිලෙසකිනුත් අන්තරායක් කළ නො හැකිවෙයි.

එකෙසින් රූපාවචර සමාධි, අරූපාවචර සමාධි නම්වූ සෙසු මහග්ගත සමාධින්ට වඩා ආනන්තරික සමාධි නම්වූ අර්හත්ඵල සමාධිය අතිශයින් අග්‍රය ශ්‍රේෂ්ඨ ය ප්‍රණීත යයි දත යුතු.

මෙයින් භාග්‍යවතුන් වහන්සේ මාර්ගධර්මයෙහි ගුණ පවසමින් ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා! යි සත්‍යක්‍රියා කළසේක.

6 "යෙ පුග්ගලා අට්ඨසතං" යනාදියෙහි බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා හා සෙසු දෙවිමිනිසුන් විසින් පසස්නාලද යම් එකසිය අවක් ආර්‍යපුද්ගල කෙනෙක් වෙත් ද, උන්වහන්සේලා යුග වශයෙන් සතරෙක් වෙත්. ඒ සියලු බුද්ධශ්‍රාවකයෝ දායක යන් විසින් කමියත් කම්ඵලයත් සලකා සැදැහැයෙන් දෙන දන වස්තූන් පිළිගැනීමට සුදුස්සෝ වෙත්. මුන්වහන්සේලාව සඵලප්‍ර වශයෙන් වුවත් දුන් දනය ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් දක්ෂිණා විශුද්ධිය වන හෙයින් මහත්ඵල මහානිසංස ඇත්තේ වේ. මේ ද සංඝයා කෙරෙහි ප්‍රණීත රත්නභාවය වේ.

මෙහි එකසිය අටක් ආර්‍යපුද්ගලයෝ ගණන් ලැබෙත්.

මේ කෙසේදයත්?

එකබීජී ය, කොලංකොල ය, සත්තක්ඛත්තු පරම යයි සෝවාන් ආර්‍යපුද්ගලයෝ තුන් දෙනෙකි. කාම, රූප, අරූප, භවයන්හි ලබනලද මාර්ග ඵල ඇති සකෘදගාමීහු තුන් දෙනෙකි. ඒ සදෙන ම දුක්ඛාපරිපදා දන්ධාභිඤ්ඤා ආදි සතර ප්‍රතිපදාවන්ගේ වශයෙන් විසිඅතර දෙනෙකි.

අනන්තරා පරිනිබ්බායී ය, උපහච්ච පරිනිබ්බායී ය, සසංඛාර පරිනිබ්බායී ය, අසංඛාර පරිනිබ්බායී ය, උද්ධංසෝත අකනිට්ඨ ගාමීය යි අවිහ බඹලොව අනාගාමීහු පස් දෙනෙකි. අතප්පය, සුදස්සය, සුදස්සීය යන බඹලෙවිහි ද එසේම ය. අකනිට්ඨයෙහි වනාහි උද්ධංසෝත ආර්‍යයා හැර සතර දෙනෙකැ යි අනාගාමීහු විසිඅතර දෙනෙකි.

සුක්ඛ විපස්සකය, සමථයානික යයි රහත්හු දෙදෙනෙකි. මාර්ගස්ථයෝ සතර දෙනෙකැ යි පනස්අතර දෙනෙකි. ඒ සියල් ලෝම ශ්‍රද්ධාධුර, ප්‍රඥාධුර වශයෙන් දෙගුණයක් වූ විට එකසිය අට දෙනෙකි.

මේ වූහු මාර්ගස්ථයෝ සතර දෙනය, ඵලස්ථයෝ සතර දෙන යයි සාමාන්‍යයෙන් අට දෙනෙකි. මේ අට දෙනම මාර්ගස්ථ ඵලස්ථ වශයෙන් යුගළ යුගළ කොට හත් කල්හි සතළොසකි.

මෙයින් භාග්‍යවතුන්වහන්සේ ආර්‍යඃඛඞ්ගරත්නයෙහි ලොකොත්තර ගුණ පවසමින් ඒ සත්‍යයෙන් සත්‍යට සෙත් වේවා! යි සත්‍ය ක්‍රියා කළසේක.

7 "යෙ සුපපත්තහා මනසා දළෙහන" යනාදීන් යම් ආර්‍ය්‍ය පුද්ගල කෙනෙක් පිරිසුදු කාය වාක් ප්‍රයෝග සංඛ්‍යාත ශීලයෙන් යුක්තවූවාහු, සිත් ඇති හෙයින් සමාධියෙන් යුක්තවූවාහු, කාය ජීවිත දෙක්හි අපෙක්ෂාවක් නැතිව ම්‍රියැසම්පන්නව නුවණින් සියලු කෙලෙසුන් කෙරෙන් මිදුණාහු ද, උන්වහන්සේලා බුද්ධ ශාසනයෙහි රහත්ඵලයට පැමිණියාහු නිවන් අරමුණු කොටගෙන නොමිලයේම ඵලසමාපත්ති නම්වූ නිවන්රසය බුක්ති විඳින් කාහු වෙති.

මෙයින් භාග්‍යවතුන් වහන්සේ ඵලසමවත් සුව විඳින ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාගේ වශයෙන් සඞ්ඝරත්නයෙහි ගුණ පවසමින් ඒ සත්‍යයෙන් සත්‍යට සෙත් වේවා! යි සත්‍යක්‍රියා කළසේක.

8 "යපිඳඛිලො පඨවිංසිඉතා සියා" යනාදීන් යම්සේ මහපොළොව යට හාරා සිටුවනලද ඉරය ඇති කණුවක් සතර දිශාවෙන් හමන සුළඟින් නොසැලෙන්නේවේද චතුරාර්‍ය්‍යසත්‍යය තත්වූ පරිදි නුවණින් දකින සත්පුරුෂයා ද එබදු ය. මේ ද සංඝයා කෙරෙහි ප්‍රණීත රත්නභාවය වේ.

මෙයින් භාග්‍යවතුන් වහන්සේ මඛාකෝ දෙනා අතර ප්‍රත්‍යක්ෂවූ සෝවාන් පුද්ගලයාගේ වශයෙන් සඞ්ඝරත්නයෙහි ගුණ පවසමින් ඒ සත්‍යයෙන් සත්‍යට සෙත් වේවා! යි සත්‍යක්‍රියා කළසේක.

9 "යෙ අරියසච්චානි විභාවයනති" යනාදීන් යම් ආර්‍යපුද්ගල ඵලඤාණයක් ගැඹුරුවූ නුවණ ඇති සැරියුත් මහරහන්සේ විසින් මනාකොට දෙසනලද චතුරාර්‍ය්‍යසත්‍යයන් ප්‍රකට වශයෙන් අවබෝධ කෙරෙත් ද ඔවුහු කිසිලෙසකිනුත් ප්‍රමාද නො වෙති. එසේම ඔව්හු අවවද අත් බැව්හි පිළිසඳ දෙනා ගනිත්. මේ ද සංඝයා කෙරෙහි ප්‍රණීත රත්නභාවය වේ.

එකබීජී ය, කොලංඝකාලය, සත්තක්ඛත්තුපරම යයි සෝවාන් පුද්ගලයෝ තිදෙනෙකැ යි ආර්‍ය්‍යපුද්ගල විභාගයේ දී කියා ඇත.

එහි ඇතැම් ආර්‍ය්‍යපුද්ගලයෙක් සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන තුන් සංයෝජනයන් දුරුකිරීමෙන්

සෝවාන් වේ නම්, හෙතෙම මිනිස්ලොව හෝ දෙව්ලොව හෝ එක් වරක් ඉපද දුක් කෙළවර කෙරෙයි. මොහුට තමන් විසින් මතු ලැබිය යුතු තුන්මාඟී තුන්ඵලයන් පිළිබඳ විදර්ශනාව බලවත් හෙයිනි. මේ එකබීජී නම් වූ ජ්‍යෙෂ්ඨ සෝවාන් ආර්‍යපුද්ගල තෙමේ යි.

යමෙක් සෝවාන් මාර්ඵලයන් ප්‍රත්‍යක්ෂ කළ තැන් පටන් දෙව් මිනිස් දෙගතියෙහි සතළුවර දක්වා හෝ සවන වර දක්වා හෝ ඉපද සෙසු තුන්මාඟී තුන්ඵලයන් ද ප්‍රත්‍යක්ෂ කොට දුක් කෙළවර කෙරේ ද හෝ කොලංකෝල නම්වූ මධ්‍යම සෝවාන් පුද්ගල තෙමේ යි.

යමෙක් සෝවාන් මාර්ඵල ලත් තැන් පටන් දෙව් මිනිස් දෙගතියෙහි සත්වන වර දක්වා හෙවත් සත්වන වරත් මිශ්‍රකවශයෙන් ඉපද සෙසු තුන්මාඟී තුන්ඵලයන් ද ප්‍රත්‍යක්ෂ කොට දුක් කෙළවර කෙරේ ද, හෙතෙම සත්තක්ඛත්තුපරම කනිෂ්ඨ සෝවාන් පුද්ගල තෙමේ යි.

මෙයින් භාග්‍යවතුන් වහන්සේ විශෙෂයෙන් සත්තක්ඛත්තුපරම නම්වූ කනිෂ්ඨ සෝවාන් පුද්ගලයාගේ ගුණය ඇසුරුකොට ඒ සත්‍යයෙන් සත්නව සෙත් වේවා! යි සත්‍යක්‍රියා කළසේක.

10 "සහාවස්ස දස්සනසම්පදාය" යන ආදි කථායෙහි මේ ආර්‍යශ්‍රාවකයා විසින් තමන් ලත් ශ්‍රොතාපත්තිමාඟීයෙහි දී සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන සංයොජනත්‍රයත් වෙතත් දුෂ්කර තපස් ඇත්නම් එවාත් දුරු කරනලද්දාහු වෙත්. එහෙයින්ම සතර අපායයෙන් මිදුණේ ද වේ. බලවත් පව්කම් සයක් කිරීමට නුසුදුස්සෙක් වේ මේ ද සංඝයා කෙරෙහි ප්‍රණීත රත්නභාවය වේ.

මෙහි දර්ශන සම්පත්තිය නම් සෝවාන් මාර්ඥානය යි. පළමු වරව නිවන් දක්නා හෙයින් සොතාපත්ති මඟඤාණය දස්සන ය යි කියනු ලැබේ.

සක්කායදිට්ඨි ය නම් පඤ්ච උපාදානස්කන්ධ සංඛ්‍යාත ශරීරය පිළිබඳව වරදවා ගත් විසිවැදෑරුම් මිථ්‍යාදර්ශනය යි. විචිකිච්ඡාව නම් බුද්ධාදි අවතැනක විමතිය හෙවත් සැකය යි. සීලබ්බතපරාමාස ය නම් මේ සස්නෙන් බැහැර මහණ බමුණන්ගේ සීලයෙන් ශුද්ධියෙක් ඇත, ව්‍රතයෙන් ශුද්ධියක් ඇතැ යි සලකා හෝසිල කුකුරු

සීලාදි ශීලත් ගෝවත කුකුරුවතාදි වුතත් උතුම් කොට පිළි ගැනීම් සි. තවත් නග්න මුණ්ඩාදි දුෂ්කර තපස් පෞත් තම් ඒ සියල්ලත් ගැනීම පිණිස මේ ගාථාවේ "ඉදඤ්චි කිඤ්චි" යනු වදාළහ.

මෙහි දුක්ඛසත්‍යාවබෝධයෙන් සත්කාය දෘෂ්ටියත්, සමුදය සත්‍යාවබෝධයෙන් විචිකිත්සාවත්, නිරෝධ—මාර්ග සත්‍යද්වය දැකීමෙන් සීලබ්බතපරාමාසයත් දුරුවීමෙන් මේ සෝවාන් පුද්ගලයාට කෙලෙසවෘතය දුරුවෙයි. කෙලෙසවෘතය නැති කල්හි විපාකවෘතය ද නැති වන බව දක්වනු පිණිස "චතූහපායෙහි ච විපමුත්තෝ" යි වදාළහ. මේ සෝවාන් අයිපුද්ගල තෙම නරක‍ය, තිරිසන් අපාය, ප්‍රේතලෝකය, අසුරකාය යන සතර අපාය යෙන් මිදුණෙක් වෙයි. විපාක වෘතය නැති හෙයින් එයට මූල් වූ කම්වෘතයත් නැති වන බව දක්වනු පිණිස "ඡවාභි ඨානානි අභබ්බෝ කාතුං"යි වදාළහ. ඒ සෝවාන් පුද්ගලතෙම සවකීය මව මැරීමය, පියා මැරීමය, රහතන් මැරීමය, බුදුන්ගේ ශරීරයෙන් ලේ සෙලවීමය, සංඝයා භේද කරවීමය, අනික් ශාස්තෘවරයකු ඇද හිමය යන මේ බලවත් අකුසල් සයක් නොකරන්නේ වේ. මේ ද සංඝයා කෙරෙහි ප්‍රණීත රත්නභාවය වේ.

මෙසින් භාග්‍යවතුන් වහන්සේ සෝවාන් ආර්‍යශ්‍රාවකයාගේ ගුණවිශෙෂයක් පෙන්වමින් සංඝ රත්නයෙහි ගුණ පවසා ඒ සත්‍ය යෙන් සත්නට සෙත් වේවා! යි සත්‍යක්‍රියා කළසේක.

11 "කිඤ්චාපි සො කම්මං කරොති පාපකං" යන ආදි ගාථා යෙහි ඒ ආර්‍යශ්‍රාවක තෙම පළමුවෙන් දක්වූ බලගතු අකුසල් සත තබා ප්‍රමාද විහරණයකින් සිහිමුළා බවට පැමිණ කුටිකාර සඟසෙයා දි ප්‍රඥප්ති වදුයක් නසින් කෙරේද, අනුපසම්පන්න යකුට පද පිළිවෙළින් පාලිධර්ම සහොවචාරණ වශයෙන් හැදෑරවීමෙන් සිදුවන ඇවතක් හෝ, දනුමැති පිරිමියකු ශ්‍රවණොපචාර යෙහි නැතිව මිනිස්මාගමකට බණ කීමෙන් වවනයෙන් සිදුවන ඇවතකට හෝ පැමිණේ ද, ලොභද්වෙෂයන් උපදවන ජාතරූප රජතයන් පිළිගැනීම් වශයෙන් හෝ, විවරාදි ප්‍රත්‍යයන් පරිභොග කරන කල්හි ප්‍රත්‍යවෙක්ෂා නොකිරීම් වශයෙන් සිසින් හෝ පාප කර්මයක් කෙරේද, හෙතෙම ර්මය අකැපය නො කවයුත්තෙකැ යි දැන මොහොතකවවත් ඒ පාපය නොවසන්වි කල්පනා කෙරෙයි.

ඇයි කුමක් කෙරේද යත්? එකෙණෙහි ම භාග්‍යවතුන් වහන්සේ කරා හෝ දනුමැති සබ්‍රහ්මචාරී භික්ෂූනමක් කරා හෝ එළඹ ඒ

ඇවත ප්‍රකාශකොට නියම පිළියම් කෙරෙයි. නැවත එසේ නොකරන්නෙමි යි සංවරණය වෙයි.

කුමක් කෙසිනයත්?:-

"අහබබතා දිට්ඨපදස්ස වුත්තා" යනුවෙන් දක්නාලද නිර්‍වාණ පදය ඇති ඒ සෝවාන් පුද්ගලයා එබන්දක් වැසීමට නුසුදුස්සකු වන හෙයිනි. මෙ ද ආශ්‍චර්‍යසංඝයා කෙරෙහි ප්‍රණීත රත්නභාවය වේ.

මෙයින් භාග්‍යවතුන් වහන්සේ කළ වරද නොවැසීමෙන් සෝවාන් පුද්ගලයාගේ සංවරගුණය පවසා ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!යි සත්‍යක්‍රියා කළසේක

12 "වනපපගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ" යන ආදිගාථායෙහි ග්‍රීෂ්මඍතුවෙහි සාරමාසය පිළිබඳ පළමුවන මාසයෙහි හෙවත් බක් මාසයෙහි මහාව පිපුණු අග්‍ර ඇති අතුපතර හවහත් මල් ඇති වන ලැහැබක් යම්සේ ද,එබඳුවූ නිවන්මඟ හෙළිකරන උතුම්වූ පර්‍යාප්ති ධර්මය සඬියන්ට හිත පිණිස දෙසුසේක. මෙ ද බුදුන් කෙරෙහි ප්‍රණීත වූ රත්නභාවය වේ.

මෙයින් භාග්‍යවතුන් වහන්සේගේ පර්‍යාප්තිධර්මය මල්පිපුණු වනලැහැබක් වැනිය යි දක්වා එය ඇසුරු කොට ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා! යි සත්‍යක්‍රියා කළසේක.

13 "වරෝ වරඤ්ඤූ වරදෝ, වරාහරෝ" යන ආදිගාථායෙහි උතුම්වූ අදහස් ඇත්තවුන් විසින් පිළිගත් හෙයින් ශ්‍රේෂ්ඨවූ, බොධිමූලයෙහි ප්‍රතිවේධ කළ නිවන් ඇති පඤ්චවර්ගීය තවුසන් සහිත සෙසු දෙව් මිනිසුන්ටත් නිවන් දුන්නාවූ, දීපංකර පාදමූලයෙහි පවත් සමනිස් පෙරුම් පුරමින් පෙර බුදුවරයන් විසිනුදු අනුගමනය කළ උතුම්වූ ආර්‍ය්‍යමාර්ගය හෙතහැර දක්වා වදලාවූ, සම්බුදුරජාණන් වහන්සේ සවාක්ඛාතතාදි ගුණයන් ප්‍රතිපාදිතවූ උතුම්වූ ධර්මයක් දෙසූ සේක් ද, මෙ ද බුදුන් කෙරෙහි ප්‍රණීත රත්න භාවය වේ.

තවද මේ සඳහා අනිකුදු ධර්මාර්‍යක් නම්:-උපසම්පදාදිෂ්ඨානයෙන් හෝ පුණ්‍යසම්පත්තියෙන් උතුම්වූ, ප්‍රඥාදිෂ්ඨානයෙන් හෝ ප්‍රඥාසම්පත්තියෙන් වරඳවූ. බුද්ධත්වය කැමැත්තවුන්ට ඒ පිළිබඳ උපාය සම්පාදනයෙන් වරදවූ, ප්‍රත්‍යේකබොධිය කැමැත්තවුන්ට

එයට උපාය දැක්වීමෙන් වරාහරවූ, අසදෘශඛයෙන් උතුම්වූ තථාගතයන් වහන්සේ නවලෝකොත්තර ධර්මයක් වදාළසේක්ද යනුයි.

මෙයින් භාග්‍යවතුන් වහන්සේ යම් ලොකොත්තර ධර්මයක් අවබෝධ කළ සේක් ද, යම් නිවනක් දුන් සේක් ද, යම් නිවන් මඟක් ගෙන ආ සේක් ද, එයට උපායවූ යම් ආශ්චර්යඅද්භූතික මාහාත්මයක් දෙසූ සේක් ද යි තමන් වහන්සේගේ ලොකොත්තර ගුණ සම්පත්තිය පවසමින් ඒ සත්‍යයෙන් සත්නව ගෙන් මිදිවා! යි සත්‍යක්‍රියා කළසේක.

14 "ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං" යන ආදි ගාථායෙහි සාමාන්‍ය සත්වයන්ගේ අතීතකාලික කර්ම තම්වූ පුරාණ කර්මබීජයන් තෘෂ්ණා තෘෂ්ණා නමැති ජලයෙන් තෙත්වූ හෙයින් නැවත ප්‍රතිසන්ධිය ගැනීමෙහි ශක්තිය ඇත්තේ ය.

රහතන් වහන්සේලා තෘෂ්ණා නමැති ජලය අග්‍රමාර්ගඥාන ගින්නෙන් වියලවූ හෙයින් ගින්නෙන් දවනලද බීජයක් මෙන් උන් වහන්සේලාගේ පුරාණ කර්ම මතු භවයෙහි විපාක දීමට අපොහොසත් ය. එහෙයින් උන්වහන්සේලා පුරාණ කර්ම ක්ෂය කළාහුය. රහතන් වහන්සේලා විසින් බුද්ධපූජා ධර්මශ්‍රවණාදි වශයෙන් කරනු ලබන අලුත් කුශලකර්මයෝ වෙත් ද, ඔවුහු ක්‍රියාමාත්‍ර හෙයින් මුල් සුන් ගසක මල් නොහැදෙන්නාක් මෙන මතු විපාක දීමෙහි අපොහොසත්හ. උන්වහන්සේලා පුනරුත්පත්තියෙහි නොඇලුණු සිත් ඇත්තෝ ය. සංසාරොත්පත්තිය දිගුකිරීමෙහි ආසාව නැත්තාහු ය. මෛධර්‍යී සම්පන්නවූ ඒ රහතන් වහන්සේලාගේ චරිමවිඤ්ඤාණය නිරුද්ධවීමෙන් මේ පඨන නිවුණාක් මෙන් නිවෙයි.

මෙහි මේ පඨන යනි වදාළේ මේ පිරිත් දෙසනාව වදාළ තැන නගර දේවතාවන්ට පුද පිණිස දැල්වූ පහන් අතුරෙන් නිවුණු එක් පහනක් සඳහා ය.

මෙයින් භාග්‍යවතුන් වහන්සේ අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙහි ගුණ පවසා මෙද ආශ්චර්යරත්නයෙහි ප්‍රණීත රත්නභාව යෙක. ඒ සත්‍යයෙන් සත්නව ගෙන් මිදිවා! යි සත්‍යක්‍රියා කළසේක.

ඉක්බිති ශක්‍රදේවේන්ද්‍ර තෙම තෙරුවන් ගුණ ඇසුරු කොට සත්‍යක්‍රියා කරනු කැමතිව, "ඛීණාසවා බුතානි සමාගතානි" යනාදි ගාථා තුනකින් නුවරට ගෙන් මිදිවේ ය.

15 මෙහි රැස්වූ භූමිනිශ්‍රිත යම් අමනුෂ්‍ය කෙනෙක් වෙත් ද, අහස ඇසුරුකළ යම් අමනුෂ්‍ය කෙනෙක් වෙත් ද ඒ අපි හැම දෙනම දෙව්මිනිසුන් විසින් පූදනලද තථාගත නම්වූ බුද්ධරත්නය වඳුමිහ. එහෙයින් සත්නට සැප වේවා!

16 සවලොකොත්තර ධම්මරත්නය වඳුමිහ. එහෙයින් සත්නට සැප වේවා!යි ද

17 අභාවයී පුද්ගල සංඝරත්නය වඳුමිහ. එහෙයින් සත්නට සැප වේවා!යි ද සෙත් වඩා භාග්‍යවතුන් වහන්සේට පැදකුණු කොට වැඳ රැස්වූ දෙවිපිරිස සමඟ දෙව්ලොවට ගියේ ය.

මේ රුවන්සූත්‍ර දේශනාවෙහි බුද්ධරත්නයෙහි ගුණ පවසා සෙත් කළ ගාථා 3 ක් ද ධම්ම රත්නයෙහි ගුණ පැවසූ ගාථා 3 ක් ද සංඝ රත්නයෙහි ගුණ පැවසූ ගාථා 7 ක්ද වෙත්.

රත්න සූත්‍ර පරිත්‍රාණයෙහි දහම් විස්තරය නිමි

කරණීයමෙත්ත සුත්තං

1 කරණීයමත්ථකුසලෙන— යන්තං සන්තං පදං අභිසමෙච්ච;
සක්කෝ උජූ ච සුජූ ච— සුවචොචස්ස මුදු අනතිමානී.

2 සන්තුස්සකෝ ච සුභරෝ ච-අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති;
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච— අප්පගබ්භෝ කුලෙසවනනු
ගිද්ධෝ.

3 න ච බුද්ධං සමාචරේ කිඤ්චි—යෙන විඤ්ඤූ පරේ උපව
දෙය්‍යුං,
සුඛිනෝ වා ඛෙමිනෝ හොන්තු—සබ්බෙ සත්තා භවන්තු
සුඛිතත්තා.

4 යෙ කෙචි පාණභූතත්ථි—තසා වා ථාවරා වා අනවසෙසා;
දීඝා වා යෙ මහන්තා වා—මජ්ඣිමා රස්සකා අණුකථූලා.

5 දිට්ඨා වා යෙව අදිට්ඨා— යෙව දූරෙ වසන්ති අවිදූරෙ;
භූතා වා සම්භවෙසී වා—සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

6 න පරෝ පරං නිකුබ්බෙථ — නාතිමඤ්ඤෙථ කත්ථචි නං
කඤ්චි;
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා — නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛ
මිච්ඡෙය්‍ය

7 මාතා යථා නියං පුත්තං—ආයුසා එකපුත්තමනුරක්ඛෙ;
එවම්පි සබ්බභූතෙසු— මානසං භාවයෙ අපරිමාණං.

8 මෙත්තඤ්ච සබ්බලොකසම්හි—මානසං භාවයෙ අපරිමාණං;
උද්ධං අධෝ ච තිරියඤ්ච—අසම්බාධං අවෙරං අසපත්තං.

9 තිට්ඨං චරං නිසින්නෝ වා—සයානෝ යාවතස්ස විගත
මිද්ධෝ;
එතං සතිං අධිට්ඨෙය්‍ය—බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු.

10 දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා—දස්සනෙන සම්පන්නෝ;
කාමෙසු විනෙය්‍ය ගෙධං—නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතී
තී කි.

මෙත්ත සුත්තං නිට්ඨිතං.

සිංහලානුවාදය

1 ශාන්තපදය යි කියනු ලබන නිර්වාණපදයට පැමිණ වසනු කැමැත්තකු විසින් යමක් කටයුතු ද, අභිවෘද්ධියෙහි දක්ෂයා විසින් එය කටයුතුයි. ඔහු කුදු මහත් කාශ්‍යයෙහි දක්ෂයකු විය යුතුය. ඍජු ගති ඇත්තකු විය යුතු ය. මනාසේ ඍජු ගති ඇත්තකු විය යුතුය. නිහතමානි ඇත්තකු විය යුතුය. මෘදුගුණ ඇත්තකු විය යුතු ය. අධික මාන නැත්තකු විය යුතු ය.

2 ලද දෙයින් සතුටු විය යුතුය. අනුන් විසින් පොෂණය කළ හැක්කෙක් විය යුතු ය. සැලල කටයුතු ඇත්තෙක් විය යුතු ය. සැහැල්ලු පැවතුම් ඇත්තෙක් විය යුතු ය. සන්සුන් ඉඳුරන් ඇත්තෙක් විය යුතු ය. නුවණැත්තෙක් විය යුතු ය. නොසරුප්කම් නැත්තෙක් විය යුතු ය. කුලඝන්හි නො ඇලුණෙක් විය යුතු ය.

3 යම් ක්‍රියාවක් හේතුකොටගෙන නුවණැති අන්‍යයෝ නින්ද, නො කෙරෙත් ද, එබදු කුඩා වරදකුදු නො කරන්නේ ය. සියලු සත්වයෝ සුවපත් වෙත්වා! නිර්භය වෙත්වා! සුඛිත සිත් ඇත්තෝ වෙත්වා!

4 හසින් ත්‍රස්තවූ හෝ නිශ්චය හෙයින් සිරවූ යම්කිසි සත්ව කෙනෙක් වෙත් ද, දික්වූ සිරුරු ඇත්තාවූ හෝ, මහත්වූ සිරුරු ඇත්තාවූ හෝ, මධ්‍යම ප්‍රමාණ වූ හෝ, ඉතා මිටිවූ හෝ, සියුම් වූ හෝ, සථූලවූ හෝ, සත්වයෝ වෙත් ද,

5 ඇසව පෙනෙන්නාවූ හෝ, නො පෙනෙන්නාවූ හෝ ඇත වසන්නාවූ හෝ, ළඟ වසන්නාවූ හෝ, භූත නම්වූ හෝ, සම්භවෙසි නම්වූ හෝ ඒ සියලු සත්වයෝ සුවපත් වෙත්වා.

6 අතිශෙක් අනිනකු කිසිතැනෙකත් නො රවටාවා! කිසි තැනෙකත් කිසිවකුට අවමන් නො කෙරේවා! කායවාක් චිකාර යෙන් වූ කෝපයෙන් ද, දොස හැඟීමකින් ද ඔවුනොවුන්ට දුකක් කැමති නොවේවා.

7 යම්සේ මවක් තම එක ම දරුවා දිවි පුදා නමුත් රක්නී ද, මෙසේ කැමි සතුන් කෙරෙහි අප්‍රමාණවූ මෙත්සිත වඩන්නේ ය.

8 සියලු ලෝකයා කෙරෙහි අප්‍රමාණවූ මෙත් සිත වඩන් නේ ය. උඩ දිශාව ද යට දිශාව ද සරස ද සම්බාධ (කරදර) නැති අප්‍රමාණවූ මෙත්සිත වඩන්නේය.

9 යම්තාක් තො නිදා ද ඒතාක් සිටිමින් හිඳිමින් යමින් සැතපෙමින් මේ මෛත්‍රීධ්‍යාන සිත වැඩියයුතු ය. (බුද්ධාදි උතුමෝ) මෙය මේ ශාසන යෙහි බ්‍රහ්මවිහාර යයි කියත්.

10 මේ බඹවිහරණයෙන් යුත් ආර්‍යශ්‍රාවක තෙම සත්කාය දෘෂ්ටියද් නො පැමිණ සිල් ඇතිව දර්‍ශන සම්පූ සෝවාන්මාර්ගඥාන යෙන් යුක්තව කාමතෘෂ්ණාව දුරුකොට කිසිකලෙකත් මවුකුසක පිළිසිඳ ගැනුම්ව නැවත නො පැමිණෙන්නෙක් වෙයි.

මෙත්තාසූත්‍රන පරිත්තයෙහි සිංහලානුවාදය නිමි

දහම් විසතර

සම්බෙයකින් රුවන්පිරිත සත්‍යක්‍රියා බලයෙන් මනුෂ්‍යයන්ව හිතවැඩ සලසමින් අමනුෂ්‍යොපද්‍රව වැළැක්වීම පිණිස දෙසනලද ද, මේ මෙත්තසූත්‍රයත් එසේම අමනුෂ්‍යොපද්‍රවයන් සංසිඳුවා සත්වයන්ට හිතවැඩ සැලසීම පිණ දෙසනලදී. එබැවින යම් ගුණ ඇත්තේ ය. රත්නසූත්‍රයට අනතුරුව මේ කරණීය මෙත්ත සූත්‍රය තබනලද්දේ ඒ නිසා ය.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙවිරම් වෙහෙර වැඩවසන කල්හි සසර කලක්‌ගණ ඔත් ඇති පන්සියයක් පමණ භික්ෂූන් වහන්සේලා බුදුන් වෙතින් කමටහන උගෙන හිමි ලය වන ප්‍රදේශයෙහි එක්තරා වනලැහැබක් ඇසුරු කොට වස් විසූහ. සිල්වත් භික්ෂූන්ගේ ගුණතේජසින් වෘක්ෂ දේවතාවෝ

තමතමන්ගේ දරුවන් ගෙන රැක්වීමන් වලින් බැස බොබ හැසිරෙන්ට වූහ. ඒ දේවතාවෝ මේ භික්ෂූහු සෙමෙක් මේහි වසති. එතෙක් අපට අපගේ දරුවන් රැගෙන හිඳිට බැස විසිය නොහැකිය. එහෙයින් භික්ෂූන්ට කිය උපදවන අරමුණු පෙන්වූ, භයජනක ශබ්ද නංවා කැති ගන්වමු"යි සිතා නානාප්‍රකාර භයානක යක්ෂ රාක්ෂස රූපයන් මවාගෙන ඉදිරියෙහි සිටින්ට වූහ. භික්ෂූහු බියට පත්වූහ; දුර්වර්ණවූහ; පඬුවන් සිරුරු ඇතිවූහ; සිත් එකඟකළ නොහැකිවූහ; සිහිසන් කැති වූහ. ඉක්බිති දෙවතාවෝ දුගඳ වහනය වන අරමුණු ඉදිරිපත් කළහ, එයින් බලවත් කිස් වේදනා ඇති විය. එසේ ද වුවත් එපුවත කිසි භික්ෂුවක් කිසි වකුට නොදුන් විය.

ඉක්බිති එක්දිනක් සියලු භික්ෂූන් සංඝස්ථවිරයන් දැක්මට පැමිණිකල්හි භික්ෂූන්ගේ මැලවුණු සිරුරු දැක "මේ වනලැහැබෙහි කිසියම් උවදුරක් ඇත්ද"යි සඞ්ඝස්ථවිරයන් වහන්සේ විචාළහ. එවිට ඒ භික්ෂූහු සියලු පුවත් සැලකළහ.

එකල සංඝස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂූන්ට අනුශාසනා කරනසේක් "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් පෙරවස් විසීමය, පසුවස් විසීමය යි වස් එළැඹීම් දෙකක් වදාරා තිබේ. අපට මේ සෙනසුන සැප නොවේ නම් ඒබව භාග්‍යවතුන් වහන්සේට සැලකොට වෙන සැප සෙනස්තක් ලබා ගනිමු" යි සාකච්ඡා කොට බුදුන් කරා එළඹ මේ පුවත් සැලකළහ

බුදුරජාණන් වහන්සේ ආවජ්ජනාකර බලා මේ හැර නුඹලාට සැපසෙනසුනක් නැතැයි වදාරා" ඉදින් නුඹලා ඒ දෙවියන්හෙන් නිර්භය කැමති වන්නහු නම් මේ පිරිත උගනිව්. මෙය නුඹලා ව පිරිතකුත් කමටහනකුත් වන්නේ ය. එහෙයින් මේ මෙත්තසූත්‍රය මයකට අටවරක් බණ අසන දිනයන්හි සජ්ඣායනා කරව්. මෙය ඇසුරුකොට ධම්කථා ධම්සාකච්ඡා හා අනුමෝදනා ද කරව්. මෙය කම්ඵස්ථානයක් වශයෙන් සලකා පුරුදුකරව්. භාවනාවක් මෙන් නැවත නැවතත් සිත්හි වඩව්. එකල අමනුෂ්‍යයන්ට බිය හැන් විය නොහැකි ය. ඔවුහු නුඹලාට වැඩ කැමති වෙති. හිතයක් කැමති වෙති"යි වදාළසේක.

ඒ භික්ෂූහු ද 'එසේය වහන්ස'යි පිළිගෙන බුදුන් වැඳ අවසර ගෙන එම සෙනසුන කරාම වැඩ මෙත් පිරිත් කළහ. එතැන්

පවත් ඒ සියලු දෙවතාවෝ සතුටුවම ඒ භික්ෂූන් ආරක්ෂාකළහ; භික්ෂූන්ට උපස්ථාන ද කළහ. භික්ෂූන්වහන්සේලා මේ සූත්‍රයෙන් මෙත් වඩා ධ්‍යාන උපදවා එය පාදක කොටගෙන විදසුන් වඩා ඒ තුනමස තුළදීම සියලු දෙනාවහන්සේ රහත්ව මහාපවාරණ දින යෙහි විසුද්ධි පවාරණය කළාහුය.

1 "කරණීයමත්ථකුසලෙන" යන ආදි ගාථායෙහි බුද්ධානුබුද්ධ ශ්‍රාවක මහාශ්‍රාවකාදීන් විසින් වර්ණිත නිර්වාණපදය ශාන්තය ප්‍රණීතය යි ලෞකික ප්‍රඥයෙන් දැන ලොකෝත්තර ප්‍රඥාවෙන් අවබෝධ කරනු කැමත්තහු විසින් කරණීය, අකරණීය දෙන හෙවත් කටයුතු දෙය හා නොකටයුතු දෙයත් හොඳින් දැනගත යුතු යි.

මෙහි සැතෙවින් අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥ යන ත්‍රිවිධ ශික්ෂාව කරණීය යි හෙවත් කටයුතු යි. සීලවිපත්ති, දිට්ඨිවිපත්ති, ආචාර විපත්ති, ආජීවවිපත්ති යන මේ ආදිය අකරණීය යි හෙවත් නො කටයුතු යි.

මේ මේ දේ කටයුතු යයි දත් භික්ෂුතෙම අර්කුසලය හෙවත් තමහටත් අනුන්වත් වැඩ සිදුකර ගැන්මෙහි හා දීමෙහි ද දක්ෂය. මේ මේ දේ නොකටයුතු යයි දත් භික්ෂු තෙම අනර්කුසලය, හෙවත් තමන්ටත් අනුන්වත් අවැඩ සිදුකරගැන්මෙහි හා සිදු කිරීමෙහි ද දක්ෂය.

මෙසස්තෙහි පැවිදිවූවෙක් තෙමේ හොඳින් සිල් නො රකී ද, එක්වීහි අනෙසනයෙන් ජීවිකාව කෙරේ ද, අනනුලෝමික හෙවත් පැවිද්දන්ට නුසුදුසු හීනිසංසර්ගයෙන් යුක්ත වේ ද, මෙතෙම අනර්කුසල වේ.

යමෙක් සැදැහැයෙන් මෙසස්තෙහි පැවිදිව, සැදැහැයෙන් ප්‍රාතිමෝක්ෂ සංවර සීලයත්, සිහියෙන් ඉන්ද්‍රියසංතීරණාශ්‍රිත සීලයත්, විශ්‍යෙන් ආජීවපාරිශුද්ධි ශීලයත්, නුවණින් ප්‍රත්‍යයසංවර සීලයත් යන චතු පාරිශුද්ධිශීලය රකී ද, හෙතෙම අර්කුසල වේ.

ශාන්තවූ නිවනට පැමිණෙනු කැමැත්තහු විසින් විශෙෂයෙන් ආරණ්‍යක භික්ෂුව විසින් කාය ජීවිත දෙක්හි අපේක්ෂා රහිතව ධ්‍යානාභිරතව හෙවත් ප්‍රථමධ්‍යානාදි මහද්ගත ගුණයෙහි ඇලී චතුසත්‍යාවබෝධයෙහි දක්ෂයකු විය යුතු. එසේම කිසුණු පිරියම් වත්සමාදන් වීම්, පාත්‍රසිවුරු පරිභොග කිරීම්, ආදි සබ්‍රහ්මචාරීන්ට

චුවමනා කුඩා මඟත් කවයුතු ඇම්පාදනයෙහි ද ඉක්‍යනයක් නොවත් දක්‍ෂනයක්, අනලසනයක් විය යුතු ය.

සඳ මාසා ගති නැති ඍජු පුද්ගලයෙක් වන්නේ ය. කායවාක් මනසා වංක ගති නැතිව තම ජීවිතාන්තය දක්වා එම ගුණය ලිහිල් නොකර ගැනීමෙන් සුජු වන්නේය.

සුවචසෙක් වන්නේ ය. යමකු "මෙබන්දක් ඔබ විසින් නොකළ යුතුය"යි අවවාද කළකල්හි, ඔහු "කිම, මා මෙබන්දක් කරන්නට දැ යි ඔබගේ ඇසින් දක්නාලද්දෙහි ද? කනින් අසනලද්දෙහි ද? මට මෙසේ අවවාද කරන්න ඔබ කිම මාගේ ගුරුවරයෙක් ද? උපාධ්‍යායයෙක් ද? මිත්‍රයෙක් දැ?"යි මෙසේ අකිකරු අන්දමින් කථානෙ විඛ්‍ය කිසිවක් කථා නොකොට තුෂ්ණීම්භූතව අවවාදය පිළිගන්නකු මෙන් ඔහවා නැවත ඒ කළ කී සැටියට එසේම කරගන්නේ වේ ද, නොතෙම දුර්වචසෙක; නිර්ගුණාවබෝධයෙන් ඇත්තු වෙකි.

මෘදු ගති ඇත්තෙක් වන්නේ ය. යම්හෙයකින් ගිහිජනයෝ තමන් ලවා ඔවුන්ගේ වැඩ පණිවුඩ කරවා ගැනීම වශයෙන් දූත සේවකවරක යොදවන්නට කැත් කරන්නේ වී නම්, එබන්දෙහි තමන්ගේ මෘදුකම් නො පෙන්විය යුතු ය. එහ පිළිවෙතෙහි හා, ශික්‍ෂා පූරණයෙහිත් මෘදු මෝසලෝක් ගති ඇත්තෙක් වන්නේ ය නොදින් මෘදු කොට මට්ටම් කොට ඔප් නැගූ රසක් මෙන් දැ සුත්තෙහි යෙදියහැක්කෙනක් වන්නේ ය. එසේම අකුටිල පැවතුම් ඇති, ඇඹුරු කොට පවත්වන මූහුණක් නැති, රළු පරුෂ හෝරෝසු හොඬගල් කථා නැති, පහසුවෙන් බැහැගත හැකි තොටු පලක් මෙන් පිළිසඳර පැවතුම් ඇත්තෙක් වන්නේ ය.

එසේම අනතිමාන ඇත්තෙක් නෙවත් අධික මාන අහංකාර නැත්තෙක් වන්නේ ය. ජාතිගොත්‍රාදියෙන් අනුන්ට අවමන් නොකරන්නෙක් වන්නේ ය.

ද "සන්තුස්සමානා ච සුභරා ච" යන ආදී ගාථායෙහි සඳහ මඬලපුත්‍රයන්හි සන්තුට්ඨි පදයෙන් දක්වූ ඉතාමත්වැදගත් ගුණාංගයෙන් යුක්ත පුද්ගලයෙක් වන්නේ ය.

මේ කෙසේදයත්?:-

පිණ්ඩියාලෝපභෝජනං නිස්සාය පබ්බජ්ජා,
පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා,
රුක්ඛමූලසේනාසනං නිස්සාය පබ්බජ්ජා,
පූතිමුත්තභෙසජ්ජං නිස්සාය පබ්බජ්ජා,

යනුවෙන් උපසම්පදා මාලකයේදී දුන් අවවාද අනුසාසනා පරිදි මේ මහණපැවිද්ද සිඟාගත් ආහාරය නිසා ද, පංසුකූල චීවරය නිසා ද, වෘක්ෂමූල සෙනාසනය නිසා ද, පූතිමූත්‍ර භෛෂජ්‍යය නිසාද පවතින බව සලකා සිල්පස්සලාභය ලිහිල් කොට ගෙන එක් එක් පසයෙක යථා ලාභ යථාබල යථාසාරූප වශයෙන් ත්‍රිවිධ සන්තෝෂයෙන් යුක්තයෙක් වන්නේ ය.

සුභරයෙක් හෙවත් පෝෂණය කළ හැක්කෙක් වන්නේ ය. යම් භික්ෂුවක් ප්‍රණීතවූ රසම්සවුලෙන් යුත් භෝජනයෙන් පාත්‍රය පුරවා දුන් කල්හිත් නොඅතුවක් ම පෙන්වා නම් මහතෙම දුභර යෙක් වේ. අයකයන් ඉදිරියෙහිදීම එබදු පිණ්ඩපාතයට අගරු කොට තමන් නො වළඳ, සාමණේර ගෘහස්ථාදීන්ට හෝ බලු කපුටු ආදීන්ට නොසැලකිල්ලෙන් දේ නම් හෙතෙම ද දුභර වේ. මෙබන්දකු දැක මිනිස්සු "මේ භික්ෂුව අපවැන්නවුන් විසින් පෝෂණය කළ නො හැක්කේය දුභරයෙකැ"යි ඇතින්ම දුරු කරති.

යමෙක් කටුක වූ හෝ ප්‍රණීතවූ සවලපවූ හෝ බොහෝවූ ආහාරයක් ලැබ ලැබුණු අන්දමකින් සතුටු වේ ද, ප්‍රසන්න මුහුණක් ඇතිව ගේ ද, හෙතෙම සුභර වේ. එබන්දකු දැක මිනිස්සු 'මුන් වහන්සේ නම් අපව පෝෂණය කළ හැකි ය. එහෙයින් අපි පෝෂණය කරමුමු' යයි ප්‍රතිඥා දී පෝෂණය කෙරෙති. මෙබඳු භික්ෂුව සුභරය යි දතයුතු.

අල්පඉච්ඡතා ඇත්තෙක් විය යුතු ය යන්නෙන් කම්මාරාමතා, භස්සාරාමතා, සඞ්ගණිකාරාමතාදි නොයෙක් කටයුතුවල ව්‍යාවෘත නොවන්නෙක් විය යුතු බව කියන ලදී. විහාරයෙහි නවකර්මාදිය දියෙහි ඇලී එහි ව්‍යාවෘතවීම කම්මාරාමතා නම් වේ. දුකැම් කථායෙන් වෙන්ව කෙලෙසුන් වැඩෙන රාජකථාදි අකුසල සංකල්පයන් දියුණුවන කථාවන්හි ඇලීම භස්සාරාමතා නම් වේ. සාමණේර ආරම්භාදීන් හා ඇලී බැඳී එක්ව විසීමෙහි කැමැත්ත සඞ්ගණිකාරාමතා නම් වේ.

මේ ආදි නො සරුප් පැවතුම්වලින් වෙන්ව තමාගේ ශරීරය පිළිබඳ උද්ධවිරේචන අධොවිරෙචනාදිය කිරීම හිසකෙස් රැවුල් නියපොතු ආදිය කැපීම්, පාත්‍රපිසීම්, සිවුරු හෙත්තම් පන්නම් කිරීම්, ආදි මහණදම් පිරීමට බාධා නො වන කරුණුවල පමණක් තත්පරවූවෙක් විය යුතුය යනු වදාළ අයුරු සි.

සල්ලහුකවුතනි යනුවෙන් සැඟැල්ලු පැවතුම් ඇත්තෙක් වන්නේය යි දැක්වූහ. බහුභණ්ඩික හෙවත් බොහෝ බඩුවිවිධ ඇති භික්ෂූහු යම් දිශාවකට යන කල්හි පාසිවුරු, ඇතිරිලි, තෙල්, සකුරු ආදි බොහෝ උපකරණ පොදි බැඳගෙන මිනිසුන් ලවා හිසෙන් හෝ කරෙන් උසුලවාගෙන නික්මෙති. සැඟැල්ලු පැවතුම් ඇති භික්ෂූහු එසේ කොව අවපිරිකර පමණක්ම ප්‍රයෝජනයට ගනිති. එයින් වැඩියක් වේ නම් ඒ භැම සෙසු භික්ෂූන්ගේ ප්‍රයෝජනයට බෙදා දෙති. යම්කිසි දිශාවකට යන කල්හි පියාපත් සහිතව සිසුදිගට ඉගිලී යන පක්ෂියකු මෙන් අවපිරිකර පමණක් ගෙන සැපසේ යෙති. එබඳු මහණ තෙමේ සල්ලහුකවුතනි නම් වේ හෙවත් ලඝුවූ පැවතුම් ඇත්තෙක් වේ.

ඉන්ද්‍රියෙසු යන්නෙහි ඉෂ්ටවූ අරමුණුවල රාගයත්, අනිෂ්ටවූ අරමුණුවල ද්වේෂයත්, නොඋදවමින් සත්හුන් චක්ෂුරාදි ඉඳුරන් ඇත්තෙක් වන්නේ යයි වදළහ.

නිපකා යන්නෙහි සිවුරු හෙත්නම් කිරීම් ආදි නිරවද්‍ය ශීලානුරක්ෂණ ප්‍රඥයෙන් හා, විවරවිචාරණ හෙවත් තමාගේ සිවුර ගැන විමසීම් තුවණින් ද ආචාර්‍යාදි සත්පුරුෂ සුදුසු සෙනසුන් පිළිබඳ තුවණින් ද යුක්ත වන්නේ යයි වදළසේක.

අප්පගබ්භා යන්නෙහි වදහළේ අවතැනෙක කය පිළිබඳ නොසරුප් බුනුවි කථායෙන් ද, සතර තැනෙක වාග් ප්‍රනල්භයෙන් ද, නොයෙක් තැන මනෝ ප්‍රගල්භයෙන් ද, යුක්ත නොවන සුතු බව ය.

හේ කෙසේද? යත්?

සංඝ, ගණ, පුද්ගල, භෝජනශාලා, ජන්තාඝර, නහානතොව, පිඬුසිඟන මාර්ග, ඇතුළගම යන මේ අවතන්හි නුසුදුසු පැවතුම් ඇත්බව ඝාඝපාතබහිය තම්වේ.

යමෙක් සඟවැද අයින් හෝ සිවුරෙන් අතවටු ලා නො සන් සුන්ව හිදී නම් එය සංඝයාට කරන අගෞරවයෙකි. සිසු පිරිස රැස්වන තැනෙක එසේ හිදී නම් එය ගණ අගෞරවයෙකි. චැඩිමහල්ලන්ට අගෞරව වන අන්දමින් හැසිරේ නම් එය පද්ගල අගෞරවයෙකි. භෝජනශාලායෙහි වැඩිමහල් නට සුදුසු අස්නක් නොදේ නම් නොවැ බාලවූ හෝ නවක භික්ෂූන්ට අසුන් නොදී නම් එය භෝජනශාලායෙහි දී කෙරෙන අගෞරවයෙකි.

ජනනාඝර යයි කියනු ලබන ගිනිකල්ගෙයෙහි වැඩිමහල්ලන් කෙරෙහි විචාරණ ගිහි මොලවා තම් ඒ ජනනාඝරයෙහි කෙරෙන අගෞරව යෙකි. නහන තොවෙහි ළදරුය, මහලුය, යන භේදයක් නැතිව පැමිණි පිළිවෙළින් නැමී සිරිත ය. එහෙත් එය කඩකොට පසු පසුව පැමිණ පළමුව ස්නානය කරන මහල්ලන් හා නවකයන් වෙහෙසට පමුණුවමින් ජලක්‍රීඩා කෙරේ නම් එය සුදුසු නොවේ. භික්ෂාචාරමාගීයෙහි අග්‍රාසනය, අග්‍රෝදකය, අග්‍රපිණ්ඩය, ලබනු පිණිස මහල්ලන් පසුකොට ඔවුන් ඇඟ ගැවෙමින් ඉදිරිව යේ නම් එය භික්ෂාචාර මාගීයෙහි කෙරෙන අගෞරවයෙකි. ඇතුළු ගමෙහි වැඩිමහල්ලන්ට පළමුව යේ නම්, ළදරුවකු මෙන් හැසිරේ නම් ඒ ඇතුළුගම කරන අගෞරවයෙකි. මේ ආදි නොසරුප් ක්‍රියා ඛාණප්‍රහල්හ නම් වේ.

මෙසේ ම සංඝ, ගණ, පුද්ගල, අනන්තරඝරයන්හි නුසුදුසු කථා කෙරේ නම් ඒ වාග්ප්‍රහල්හ නම් වේ. ඒ කෙසේදයත්? යමෙක් සඝමැද තොවිචාරා අවසර නැතිව බණ කියා නම්, එසේ ම ගණයා මැද වැඩිමහල්ලන් ඉදිරියෙහි අවසර නොගෙන බණ කියා නම්, පුළුවුත් ප්‍රශ්නයන්ට පිළිතුරු දේ නම්, ඇතුළුගමට වැද "මෙනම් ඇත්තිය, කුමක් ඇද්ද? කෑද හෝ කැවිලි ඇද්ද? බොජුන් ඇද්ද? මට කුමක් දෙන්නෙහි ද? කුමක් වළඳම්ද?" යි ප්‍රශ්න කෙරේද, ඒ නුසුදුසු වාග්ප්‍රහල්හ නම් වේ.

කය, වාක් ප්‍රහල්හ නැතත් සිතින් කාමවිතර්කාදි නානාප්‍රකාර නුසුදුසු සිතිවිලි සිතා නම්, ඒ මනඃ ප්‍රහල්හයෙක් නම් වේ.

"කුලෙසවනානුගිද්ධා" යන්නෙහි අදහස නම්:— ප්‍රත්‍යය ලැබීමෙහි ආශාවෙන් හෝ නුසුදුසු ගිහිසංසර්ග වශයෙන් කුලයෙහි තෙත ඇලෙන්නේය යනු යි. මෙහි නුසුදුසු ගිහිසංසර්ග නම් දුඃඛයකුට ශෝකයක් ඇතිවූ කල්හි තමාට වූ ශෝකයක් මෙන් ඔවුන්ට ඛඛවා එයට එකතුවීමය. එසේ ම සතුටක් ඇතිවූ කල්හි තමන්ට වූ සතුටක් මෙන් ඔවුන්ට ඛඛවා එයට සහභාගීවීම ය. මෙසේ දුඃඛයන්ගේ දුකෙහි දුක්වීමත් සැපයෙහි ප්‍රීතිවීමත් යන මේ දෙකම භික්ෂූන්ට සුදුසු නොවේ.

මෙහි අනුරාධපුරයෙහිදී ළදරුකල පැවිදිව මාගම්පුරයෙහි තිසසමිහවෙහෙරවි ඉගෙනීමට ගොස් තරුණවියෙහි ආපස වැඩම අලෙවක් භික්ෂූනම්ව මෙතිරි භික්ෂුවකැ යි සිතා වස්තෙම උපස්ථාන කල මදම්වුවියන්ට තමන් පුත්‍රවැව් මහාඛඛා උවවැ

ලැබ ආපසු ගිය පසු මවුපියන් ඒබව දැනගත ප්‍රශංසා කළ භික්ෂූන්වහන්සේ සිහිකොට කුලයා කෙරෙහි කොඇලියයුතු.

3 "නව බුද්දං සමාවසරෙ" යන ආදි ගාථාවෙන් ප්‍රකාශ වන්නේ ගම්මගයකින් නුවණැති අත්‍යෙයෝ උපවාද කොකෙරෙත් ද, එබදු කුඩා වැරැද්දකුත් නො කරන්නේය යනුයි

භික්ෂූන්ව චෝදනා කරන අනුවණයෝ නිවරද දෙය වරද කැපියවත් කුඩාවරද ලොකු වරදක් කැපියටත් පෙන්වා කථා කෙරෙති. ආගම දත්තෝ වැරැද්ද වැරැද්ද කැපියවත් නිවැරැද්ද නිවැරැද්ද කැපියවත් කථා කෙරෙති. ඔව්හු කරුණු විමසා මේ මෙය වරදය, මේ කුඩාවරදය යි විභාගකොට විමසා බලා නින්දුවට සුදුසු තැන නින්ද කෙරෙති. ප්‍රශංසාවට සුදුසු තැන ප්‍රශංසා කෙරෙති. එහෙයින් "විඤ්ඤූ පරෙ" යි වදළහ. "සුඛිතො වා බෙම්මතො හොනතු" යන ආදීන් මෙත් වඩන සැටි වදළහ. සියලු සත්වයෝ සුවපත් වෙත්වා! නිර්භය වෙත්ව.! සුඛිත යිත් ඇතතෝ වෙත්වා!

4—5 "යෙකෙචි පාණභූතත්ථි" යනාදි ගාථාද්වයෙහි තොයෙක් තොයෙක් අරමුණුවල පුරුදුකරනලද සිත මුල් අව දියේ එකෑවරම එක අරමුණක පිහිටුවිය නොහැකි හෙයින් සියලු සත්වයන් දවික සතරකටත් ත්‍රික තුනකටත් බෙදා දක්වූහ.

මෙහි තස ථාවර දුකය, දිටඨ අදිටඨ දුකය, දුර සන්තික දුකය, භූත සම්භවේසී දුකය, යන දවික සතරෙකි. දිස රස්ස මජ්ඣිම ත්‍රිකය, මහන්ත අණුක මධ්‍යම ත්‍රිකය, ථූල අණුක මධ්‍යම ත්‍රිකය යි ත්‍රික තුනකි.

'යම්කිසි ප්‍රාණීහු වෙත් ද' යන මෙයින් ආශ්වාස, ප්‍රශ්වාස ප්‍රතිබද්ධ පඤ්චවොකාර භවික සත්වයන් ගැනෙත්. 'යම්කිසි භූතයෝ වෙත්' ද යන මෙයින් එකවොකාර, චතුවොකාර භවික සත්වයන් ගැනෙනයි. එහෙයින් මේ ප්‍රාණ භූත යන වචන දෙකෙහි දවික ත්‍රික ප්‍රභේදවූ සියලු සත්වයෝ ඇතුළත් වෙති.

තණ්හා සහිත හය සහිත සත්වයෝ තස නම් වෙත්. තණ්හා භය දෙක දුරුකළ රහතන් වහන්සේලා ථාවර නම් වෙත්. සියලු සත්වයන් ම මේ පද දෙකට ඇතුළත් වන හෙයින් "අනවසෙසා" යි වදළහ

දික්වූ ශරීර ඇති නයි පොළඟා ආදීහු දීඝ නම් වෙත්. මහත්වූ සිරුරු ඇති හස්ති, ගාග, අසුර, ආදීහු මහත් ආත්ම භාව ඇත්තෝ වෙත්. අශ්ව, ගෝ, මහිෂ, සූකරාදීහු මධ්‍යම ප්‍රමාණ

ශරීර ඇති සත්වයෝ ය. කුඩා ශරීර ඇති සත්වයෝ හ්‍රස්වක නම් වෙත්. මිසැසට නො පෙනෙන තරම් කුඩා සත්වයෝ අණුක නම් වෙත්. මෘදු ශරීර ඇති මත්ස්‍ය ඉදිබු ආදි සත්වයෝ සථූල නම් වෙත්. තමාගේ ඇසට පෙනෙන සත්වයෝ දිට්ඨ නම් වෙත්. මිහුදෙන් එතර හෝ පළුත්‌තයෙන් එහා නැතහොත් පිට සක්වළ වසන සත්වයෝ අදිට්ඨ නම් වෙත්. තමන්ට ඇතින් වසන සත්වයෝ දූර නම් වෙත්. ළඟින් වසන සත්වයෝ අවිදූර නම් වෙත්. තමන්ගේ සිරුර අසුරු කෙරෙමින් වසන සත්වයෝ ද අවිදූර නම්. වෙනලෙසකින් කියතොත් සිමාවකින් ඈහැර වසන සත්වයෝ දූරනම් වෙත්. යම්කිසි සිමාවක වසන සත්වයෝ අවිදූර නම් වෙත්. තමන්ගේ විහාරයෙහි, ගමෙහි, ජනපදයෙහි, දිවපයෙහි, හෝ සක්වළ වසන සත්වයෝ අවිදූර නම් වෙත්. අන්‍යවිහාරයෙක, ගමෙක, ජනපදයෙක, දිවපයෙක, සක්වළෙක, වසන සත්වයෝ දූර නම් වෙත්.

භූත. සම්භවේසී යන ද්වාදශයෙහි අවී රාශියක් ඇත්තේ ය. නැවත සසර පිරිසිද නො ගන්නා සත්වයෝ භූත නම් වෙත්. එනම් රහතන් වහන්සේ සි. භවසංයෝජනයන් දූරු නොවූ හෙයින් නැවත උත්පත්තිය ලබන සත්වයෝ සම්භවේසී නම් වෙත්. එනම් සෙඛපුග්ගලයන් හා පෘථග්ජනයෝ සි.

වෙනත් අවීක්‍රමයක් අනුව අණ්ඩජාදි සතර යෝනියෙහි උප දනා සත්වයන් අතරෙහි අණ්ඩජ, ජලාබුජ, සත්වයෝ බීජකෝශය හා වැදුමටත් නොබිඳුනාතෙක් සම්භවේසී නම් වෙත්. යම් දවසක එදෙක බිඳගෙන පිටතට නික්මෙත් ද එතැන් පටන් භූත නම් වෙත්. සංසෙදජ ඕපපාතික සත්වයෝ පළමුවන චිත්තක්ෂණ යෙහි සම්භවේසී නම් වෙත්. දෙවැනි චිත්තක්ෂණයෙහි පටන් භූත නම් වෙත් යම් ඉරියවුවකින් යම් සත්වකොටසක් උපදී ද එයින් අන්‍ය ඉරියවුවකට මාරු වෙන තුරු සම්භවේසී නම් වේ. එයින් පසු භූත නම් වේ.

මෙසේ බුදුරජාණන් වහන්සේ "සුඛිනෝ වා" යනාදි ගාථා දෙකකමාරකින් කොයෙක් අයුරින් සත්වයන් කෙරෙහි හිතසුව පැතීම් වශයෙන්. මෛත්‍රී භාවනාව දක්වා වදරා දුන් සත්වයන් කෙරෙහි අහිත දුක් නො ඉපදවියයුතු අයුරු වදළහ.

6 "න පරෙ පරං නිකුබ්බථ" යන ආදි ගාථාවෙහි මහා ජනයා අතරෙහි හෝ අන්කිසිතැනක අහිතෙක් අහිකකු කොරවවන්නේ ය. අවමංගල්‍ය නොකරග්නේ ය. කඩ වචන සිත යන තුන් දොරින් ම සැරීමක් හෝ කෝපයක් නොකරන්නේ ය. ඔවුනොවුන්ව දුකක් කැමති නොවන්නේ ය. මෙයින් මෙසේත් මෙතෙහි කෙරෙමින් මෙත් වැඩීම දැක්වූ හ.

7 "මාතා යථා නියං පුත්තං" යන ආදි ගාථාවෙන් මෙත් වැඩීමට උපමා දැක්වූ හ. හේ කවරේදයත්?:- මවක් තමාගේ ජීවිතයත් නොඅලකා තම එකම පුත්‍රයා රැකගන්ව උත්සාහ කරන්නාක් මෙනි. මෙසේත් සියලු අප්‍රමාණ සත්ත්වයන් අරවුණු කොට මෙත් වඩන්නේ ය.

8 "මෙත්තං ච සබ්බලොකස්මිං" යන ආදි ගාථාව අනුව සියලු ලෝකයා කෙරෙහි අප්‍රමාණවූ මෙත් සිත වඩන්නේ ය. උඩ දිශාව ද, යට දිශාව ද, සරස ද, සතුරු මිතුරු දෙපක්ෂය කෙරෙහි ම සීමාවක් නැති වෛරයක් නැති සතුරකු නැති මෙත් සිත වඩන්නේ ය.

මෙහි "උද්ධං" යන්නෙන් අරූපලෝකය ද "අධො" යන්නෙන් කාමලෝකය ද "තිරියං" යන්නෙන් රූපලෝකය ද ගැනෙයි.

9 "තිට්ඨං චරං නිසින්නො වා" යන ආදි ගාථාවෙහි විසතර සලකන කල්හි නිද්‍රොපගතවනතුරු සතර ඉරියව්වෙහි මෛත්‍රී ධ්‍යානසමාධිය වඩන්නේ යි. "සුඛිතා වා ඛෙමිනො හොන්තු" යන තැන පටන් "එතං සතිං අධිට්ඨෙය්‍ය" යන තැන දක්වා වර්ණිතවූ මෛත්‍රීවිහාරය මේ ශාසනයෙහි ශ්‍රෙෂ්ඨ විහරණ යයි කිහු.

10 "දිට්ඨිං ච අනුපගම්ම සීලවා" යන ආදි ගාථාවෙහි විසතර මෙසේ යැ:- දෘෂ්ටියට නොබැස හෙවත් මෙසේ වණ්නා කරනලද මෛත්‍රීධ්‍යානයට සමවැද එයින් නැගිට එහි පැවති විතර්ක විචාරාදි ධ්‍යානාඞ්ග නාමධර්මයන් බවත් එය රූපකය ඇසුරු කොට පවත්නා බවත් මේ නාම් රූ දෙක හැර අන්කිසි සත්ත්වයකු නැති බවත් තුවණින් සලකා ලොකොත්තර සීලයෙන් සිල්වත්ව ශ්‍රොතාපත්තිමාර්ග සම්‍යක්දෘෂ්ටි සංඛ්‍යාත දර්ශනයෙන් යුක්තව විසූ කාමයන්හි පැවති කෙලෙසුකාමය සකෘදාගාම් මාර්ගයෙන් තුනී කොට අනාගාම්මාර්ගයෙන් දුරුකොට මෙයින් චුතව ශුද්ධාවාස බඹලොව ඉපද එළඳී රහත්ව පිරිනිවෙයි.

එහෙයින්

"කාමේසු විනෙය්‍ය ගෙධං
නහි ජාතු සබ්භවෙය්‍යං පුනරෙති" යි වදලසේක.

කරණීය මෙත්ත සූත්‍රයෙහි දහම් විසතරස නිමි.

ඛන්ධපරිත්තං

එවං මේ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තෙන ඛො පන සමයෙන සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨා කාලකතො හොති.

අථඛො සම්බහුලා භික්ඛු යෙන භගවා තෙනුපසංකමිංසු, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛු භගවන්තං එතදවොචුං.

ඉධ භන්තෙ සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨා කාලකතා ති. තත්‍ර නූන භොං භික්ඛවෙ භික්ඛු චත්තාරි අභිරාජකුලානි මෙත්තෙන චිත්තෙන එජ්. සචෙ හි සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අභිරාජකුලානි මෙත්තෙන චිත්තෙන එරෙය්‍ය, නහි සො භික්ඛවෙ භික්ඛු අහිනා දට්ඨා කාලං කරෙය්‍ය.

කතමානි චත්තාරි අභිරාජකුලානි? විරූපක්ඛං අභිරාජකුලං එරාපථං අභිරාජකුලං, ඡබ්‍යාපුත්තං අභිරාජකුලං, කණ්හාගොතමකං අභිරාජකුලං.

තත්‍ර නූන භොං භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අභිරාජකුලානි මෙත්තෙන චිත්තෙන එජ්, සචෙ හි සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අභිරාජකුලානි මෙත්තෙන චිත්තෙන එරෙය්‍ය, නහි සො භික්ඛවෙ භික්ඛු අහිනා දට්ඨා කාලං කරෙය්‍ය

අනුජානාමි භික්ඛවෙ, ඉමානි චත්තාරි අභිරාජකුලානි මෙත්තෙනාහි චිත්තෙන එරිතුං, අත්තගුත්තියා අත්තරක්ඛාය අත්තපරිත්තාණා ති.

ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා

1 විරූපක්ඛෙහි මෙ මෙත්තං - මෙත්තං එරාපථෙහි මෙ;
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං - මෙත්තං කණ්හාගොතමකෙහි ච.

2 අපාදකෙහි මෙ මෙත්තං-මෙත්තං දිපාදකෙහි මෙ;
චතුප්පදෙහි මෙ මෙත්තං - මෙත්තං බහුප්පදෙහි මෙ

3 මා මං අපාදමකා හිංසි – මාමං හිංසි දිපාදමකා;
මා මං චතුප්පදෙ හිංසි – මා මං හිංසි බහුප්පදෙ.

4 සබ්බෙ සත්තා සබ්බෙ පාණා – සබ්බෙ භූතා ච කෙවලා;
සබ්බෙ භද්‍රානි පස්සන්තු – මා කඤ්චි පාප මාගමා;

5 අප්පමාණෙ බුද්ධා අප්පමාණෙ ධම්මා අප්පමාණෙ
සංඝෝ.

පමාණවන්තානි සිරිංසපානි අහි, විච්ඡිකා, සතපදී,
උණ්ණනාභී, සරබූ. මූසිකා.

6 කතා මෙ රක්ඛා කත මෙ පරිත්තා පටික්කමන්තු භූතානි
සොහං නමො භගවතා නමො සත්තන්නං සම්මා
සම්බුද්ධාන නති.

ඛණ්ඩපරිත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රය මෙසේ අසනලදී එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු මහසිටුහු විසින් කරවා පිළිගන්වනලද ජේතවන නම්වූ ආරාමයෙහි වැඩ වසනසේක. එසමයහි වහාම සැවැත්නුවර එක්තරා භික්ෂු නමක් නයකු විසින් දෂ්ටකරනලදුව කලුරිය කෙළේ ය.

එකල්හි බොහෝ භික්ෂූන්වහන්සේලා භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක ද එතන්හි එළඹිස්ස්ලා ය. එළඹ බුදුන් වැඳ එකත්පසෙක හුන්සේස්ලා ය. එකත්පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු බුදුන්ට මෙපවත් දන්වූසේස්ලා ය.

"ස්වාමීනි මේ සැවැත් නුවර සමීපයෙහි එක්තරා භික්ෂුනමක් සර්පයකු විසින් දෂ්ටකරනලදුව කාලක්‍රියා කෙළේ ය"යනු හි. මහණෙනි, ඒ භික්ෂුතෙම මේ සතර සර්පරාජකුලයන් මෛත්‍රී සිතින් නොපැතිර වී යයි හඟිමි. මහණෙනි, ඉදින් ඒ භික්ෂුතෙම සතර සර්පරාජකුලයන් මෙත්සිතින් පතලේ වී නම් නොහොත් ඒ සර්පකුල සතරට මෛත්‍රීය වැඩුයේ වී නම් මහණෙනි, ඒ මහණ තෙම සර්පයකු විසින් දෂ්ටනලදුව කලුරිය නො කරන්නේ ය.

ඒ සතර සර්පරාජකුලයෝ කවුරුහුදයත්?:– විරූපාක්ෂ නම් සර්පරාජකුලය, එරාපථ නම් සර්පරාජකුලය, ඡබ්‍යාපුත්‍ර නම් සර්පරාජකුලය, කණ්හාගොතමක නම් සර්පරාජකුලය යන මේ සතර හි.

මහණෙනි, ඒ මහණතෙම ඒකාන්තයෙන් මේ සතර නාරද කුලයන් මෙත්සිතින් නොපැහිරවිය. මහණෙනි, ඉදින් ඒ භික්ෂු තෙම මේ සතර අභිරාජකුලයන් මෙත් සිතින් පහළේ වී නම් නොහොත් මේ සතර සපිරාජකුලයන් කෙරෙහි මෙත් සිත පැතිර වී නම් ඒ භික්ෂුතෙම සඳහකු විසින් ඔහුකු ලැබ කලුරිය නොකරන්නේ ය.

මහණෙනි, මේ සතර නාගකුලයන් මෙත් සිතින් පතුරුවන් නට නොහොත් මේ සතර නාගකුලයන් කෙරෙහි මෙත් සිත් පතුරුවන්නට අනුදනිම් මහවත් අවසර දෙමි. කුමක් හෙයින්ද යත්?:- තමාගේ සංවරණය පිණිස, තමහට ආරක්ෂාව පිණිස, තමහට පිරිත් පිණිස, පවත්නා හෙයිනැ සි වදළසේක.

භාග්‍යවතුන් වහන්සේ මෙය මෙසේ වදළසේක. සුගත තම්වූ ශාස්තෘන් වහන්සේ මෙය මෙසේ වදාරා යළිත් මත්තෙහි ගාථා වශයෙන් මේ පිරිත වදළසේක.

1 මාගේ මෛත්‍රිය විරූපාක්ෂ නම් සර්පකුලයන් සමග ය. මාගේ මෛත්‍රිය එරාපථ නම් නාගකුලයන් හා ය. මාගේ මෛත්‍රිය ඡබ්‍යාපුත්‍ර නම් නාගකුලයන් හා ය. මාගේ මෛත්‍රිය කණ්හා ගොතමක නම් සර්පකුලයන් හා ය.

(මෙසේ සතර සර්පකුලයන් සකරෙහි විශේෂයෙන් මෙත් වඩන්නට වදාරා දැන් සාමාන්‍යයෙන් සෙසු සියලු සත්වයන්ට ද මෛත්‍රී කරන්නට දක්වමින් "අපාදකාහි" යනාදිය වදළ හ.)

2 මාගේ මෛත්‍රිය පා නැති නයි, පිඹුරු, පොළොං ආදී දීර්ඝජාතීන් හා ය. මාගේ මෛත්‍රිය ඳදපා ඇති මිනිසුන් හා පක්ෂීන් සමග ය. මාගේ මෛත්‍රිය ඇසති, අශ්ව, ගෝ, මහිෂාදි සිවුපා සත්වයන් හා ය. මාගේ මෛත්‍රිය පත්තෑ, ගෝනුසු, ආදි බොහෝ පා ඇති සතුන් හා ය.

3 අපාදක (පා නැති) සත්වයෙක් මා නහමක් පෙළාවා! ගෙවත් නො පෙළවා.! ද්විපාදක (දෙපා ඇති) සත්වයෙක් මා නො පෙළාවා! සිවුපා සතෙක් මා නොපෙළාවා! බහුපාද සතෙක් මා නොපෙළාවා!

(මෙසේ ඔදිසක වශයෙන් මහාහොත් ඒ ඒ සත්ව කොවිස් වශයන් මෛත්‍රී කරන්නට දක්වා දැන් අනොදිසක වශයන් නොහොත් සියල්ලන් කෙරෙහි පොදු වශයෙන් මෛත්‍රී කරන්නට වදරන්නාහු "සබ්බෙ සත්තා" යන ආදිය දෙසූහ.)

4 හැම සත්හු ද, හැම ප්‍රාණීහු ද, හුදෙක් සියලු භූතයෝ ද සියන හැම දෙන යහපතක්ම දකින්වා! මොවුන් කෙරෙන් කිසිවකු කරාත් දුකක් නො පැමිණේවා!

(මෙසේ අනොදිසක වශයෙන් මෛත්‍රිය දක්වා වදරා දන් තෙරුවන් ගුණ සිහි කොට පිරිත් කරනු පිණිස "අපමාණෝ බුද්ධෝ" යන ආදිය වදාළේ සි.)

5 බුද්ධරතනය කොහොත් බුදුරුවන්හි ගුණ අප්‍රමාණ ය. දහම් ගුණ අප්‍රමාණ ය, සංඝ ගුණ අප්‍රමාණ ය, දිඝජාතීහු නම් ප්‍රමාණවත් හ. එනම් ඇපියෝ ය, ගෝනුස්සෝ ය, බොහෝ පා ඇති සර්පයෝ ය, මකුළුවෝ ය, සිකනල්ලු ය, මීයෝ ය යන මේ වශයෙනි.

6 තෙරුවන් ගුණ සිහිකිරීමෙනු දු මාවිසින් ආරක්ෂාව කරන ලද්දී ය. මා විසින් පරිත්‍රාණයෝ කරන ලද්දහු ය. මා කෙරෙහි අභිත අදහස් ඇති සත්වයෝ ඉවත් වෙත්වා! මා නො මවෙහෙසත්වා!

ඒ මම භාග්‍යවතුන් වහන්සේව වඳිමි. සත්බුදුවරයන්ට ද නමස්කාර කරමි යනු සි.

බඹ පරිනතයෙහි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

(ඇපිජාතීන් කෙරෙහි දු මෙත්කිරීමෙන් තමන්ගේ ආත්මභාව සංඛ්‍යාත සකලසත්වකාය පිළිබඳ ආරක්ෂාව සලස්වා ගැනීමට කරණීයමෙත්ත සූත්‍රයට අනතුරුව කඳපිරිත යොදන ලදී. එය එනමින් ම සැලකිය හැකි ය.)

දටඨ විසය, දිටඨ විසය, ඵුටඨ විසය, වාත විසය සි සපි කොටස් සතරෙකි. දෂ්ට කිරීමෙන් විෂ වදින සර්පයන් දට්ඨවිස නමින් ද, දැකීම් පමණකින් විෂ වදින සර්පයන් දිට්ඨවිස නමින් ද, ස්පර්ශ කළ පමණකින් විෂ වදින සර්පයන් ඵුට්ඨ විස නමින් ද, සුළඟින් විෂ වදින සර්පයන් වාත විස නමින් ද සලකනු ලැබේ. මේ සූත්‍රයෙහි කුලවිභාග වශයෙන් සර්පකුල සතරක් සදහන් කෙළේ දෘෂ්ටි කිරීමෙන් අනතුරු කරන සර්පයන් ගැනීම සඳහාය. ඔවුන් පමණක්ම මෙහි ඇතුළත් වේ.

සත්බුදුවරයෝ නම් විපස්සි ය, සිඛී ය, වෙස්සභූ ය, කකුසන්ධ ය, කොණාගමන ය, කස්සප ය, ගොතම ය යන බුදුවරයන් සත්දෙනා වහන්සේලා ය.

මෙකල අප සම්බුදුන් හැන කියනුම කවරේ ද? අතීත යෙහි දු අප මහාබොධිසත්වයන් වහන්සේ බමුණු මහසල් කුලයෙක්හි ඉපද දනුම්නි වියෙහිදී පැවිදිව පස් අභිඥ ගුණ උපදවා වනයෙහි වසනසේක් තමන්ගේ අතවැසි තවුසන්ට සර්ප ආදීන්ගෙන් සිදුවන උවදුරු දැන මේ පිරිත කීහ. එතැන්පටන් සර්පයෝ ඉවත්වූ හ. කිසිම උවදුරක් නොවී ය.

ධම්ම පරිත්තයෙහි දහම් විසඳරය නිමි.

මෙත්තානිසංස සුත්තං

එවං මේ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච.

මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානිකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය එකාදසානිසංසා පාටිකංඛා.

කතමෙ එකාදස?

(1) සුඛං සුපති (2) සුඛං පටිබුජ්ඣති, (3) න පාපකං සුපිනං පස්සති, (4) මනුස්සානං පියො හොති, (5) අමනුස්සානං පියො හොති, (6) දෙවතා රක්ඛන්ති (7) නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති, (8) තුවටං චිත්තං සමාධියති (9) මුඛවණ්ණො විප්පසීදති (10) අසම්මුළ්හො කාලං කරොති (11) උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති.

මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානිකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය ඉමෙ එකාදසානිසංසා පාටිකංඛා ති

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

මෙත්තානිසංස සුත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රය මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවත් තෙම සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඬුමහසිටු

හුගේ ආරාමයෙහි වැඩවාසය කෙරෙයි. එකල්හි භාග්‍යවත් තෙම මහණෙනි, සි භික්‍ෂූනාව ආමන්ත්‍රණය කෙළේය. එසේය පින්වතුන් වහන්ස සි කියා ඒ භික්‍ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් ඇස්වූ හ. භාග්‍යවත් තෙම මෙය වදාළේ ය.

මහණෙනි, ආදරයෙන් සෙවුනාලද එසේම වඩනාලද නැවත නැවත වැඩීම් වශයෙන් පුරුදුකරනලද යානාවක් මෙන් කරන ලද වසතුවක් මෙන් කරනලද නැවත නැවතත් උපදවනලද සියලු අන්දමින්ම පුරුදුකරනලද මොනවට පවත්ගන්නාලද මෛත්‍රී චෙතොවිමුක්තිය පිළිබඳ අනුසස් එකොළොසක් කැමතිවිය යුත්තා හ.

කවර එකොළොසෙක් ද යත්?:-

1 සැපසේ නිදයි 2 සැපසේ පුබුදියි. 3 නපුරු සිහයක් නො දකියි. 4 මිනිසුන්ට ප්‍රිය වෙයි. 5 නොමිනිසුන්ට ද ප්‍රිය වෙයි. 6 දෙවියෝ රකිති. 7 මේ මෛත්‍රී විහරණ ඇති පුද්ගලයාගේ ශරීරයෙහි ගිනි හෝ, විස හෝ, සැත් හෝ, නො වදියි. 8 වහාම සිත එකඟවෙයි. 9 මුහුණ පැහැපත් වෙයි 10 නො මුළාව කලුරිය කෙරෙයි. 11 මෛත්‍රී භාවනින් මත්තෙහි රහත් වන්නට නො හැකි වී නම් මරණින් මතු බඹලොව උපදියි.

මහණෙනි, මෛත්‍රීචෙතොවිමුක්තිය ආසෙවිත භාවිත බහුලීකෘත කළ කල්හි යානාවක් මෙන් වසතුවක් මෙන් කළ කල්හි එළඹසිටිකල්හි පුරුදුකළ කල්හි මොනවට පවත්ගත් කල්හි මේ එකොළොස් අනුසස්හු කැමතිවිය යුත්තාහු හ.

මෙතතානිසංස පරිතතයෙහි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙවැ මි වෙහෙර වැඩ වෙසෙද්දී ලොව බලනසේක් මෙබඳු සිදුවියක් දුටුසේක.

මා කොසොල්රට සැරිසරන කල්හි අඟුලිමාල සූත්‍රය දෙසීමෙන් සැවතමක් රහත්වන්නා හ. සැවතමක් කවින් උණුලේ වමාරන්නා හ. සැවතමක් සිවුරු හැර ගිහි වන්නාහ යනු යි මෙසේ දැන වදාරා මහත් භික්‍ෂු සමූහයක් පිරිවරාගෙන ගම්නියම්ගම් පිළිවෙළින් එරට සැරිසරනසේක් මහත්වූ බෙණයක් සහිත රුකක්

ඔන්නෙන් ඇවිලෙනු දැක මෙය අරඹුණු කෙරෙ දහම් දෙසුම් සි "පසසථ නො තුමෙහ භික්ඛවේ, අඹුං මහන්තං අග්ගික්ඛන්ධං" යන ආදින් අග්ගික්ඛන්ධොපම සූත්‍රය වදාළසේක. මෙසේ වදාළ කල්හි තමන්වහන්සේ මුලින්ම සැලකූ සිදුවිය එලෙසින්ම විය. උණුලේ වැමෑරූ භික්ෂූහු පැමිදිව සිවි කල්හි පරාජිතා වූවෝය. සිවුරු හළ භික්ෂූහු පළමු ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද මඩිමින් හැසිරෙන්නෝ වූහ. රහත්වූවෝ පිරිසිදු සිල් ඇත්තෝ ය.

භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව මේ තුන් ගොල්ලවම ප්‍රයෝජනවත් විය. රහත්වූවන්ට ප්‍රයෝජන වනු පුදුමයක් නො වේ. ඉතස්සන්ට වූ ප්‍රයෝජන නම් කවරේදයත්?:-

ඉදින් ඔවුහු මේ ධර්මදේශනාව නො ඇසුහු නම් ප්‍රමාදවිහරණයෙන් යුක්තව පව් වඩමින් අපායෙහි උපදනා හු ය. මේ ධර්මදේශනාව අසා සාමණේරභූමියෙහි සිට දසසිල් පුරා නුවණින් මෙනෙහිකොට භාවනා වඩා සෝවාන්, සකෘදගාමි, අනාගාමි වන්නාහු ය. සමහරෙක් දෙව්ලොව උපදින්නාහු ය. අනික් පක්ෂය මේ දේශනාව නො ඇසුවේ වී නම කල් යත් යත් සංඝාදිසෙස වලට ද පරාජිතාවන්ට ද පැමිණෙන්නාහු ය.

මේ ධර්මදේශනාව ඇසූ දුසිල් භික්ෂූහු "ආශ්චර්‍යය මේ ශාසනය, අප මහණවූයේ කෙලෙසුන් නැතිකිරීමට මිස කෙලෙසුන් වැඩීමට නොවේ. අපට දිවිහිම් කොට කෙලෙසුන් නැතිකරන පිළිවෙතක් පිරිය නො හැකි ය එහෙයින් සිවුරු හැර උවසුදම් පුරා දුෂකන් මිදෙමු" යි ගිහි වූ හ.

ඔවුහු තිසරණ පන්සිල් අවසිල් රැක ඇතැම් කෙනෙක් සෝවාන් වූහ. ඇතැම් කෙනෙක් සකෘදගාමි, අනාගාමි වූහ. ඇතැම් කෙනෙක් දෙව්ලොව උපන්හ. මෙසේ ඔවුන්ටත් මේ දේශනාව සඵල විය.

මේ දේශනාව හැර ආරඤ්ඤවිවූ භික්ෂූහු විසිදෙනා සැවදෙනා සියදහස් දෙනා වශයෙන් සිවුරු හැර ගිහිවූහ. මෙසේ බුදුහු දහම් දෙසුම්න් දනවු සැරිසරා නැවත දෙව්රම් වෙහෙරට වැඩ එම ගදකිළියෙහි අඩමසක් විවේකව එලසමවත් සුව විඳ පසුව අනඳ මහතෙරුන් සමග දෙව්රම් වෙහෙර බලා හැසිරෙනසේක් පෙර භාග්‍යය වසනුයෙන් බබළුමින් පැවති දෙව්රම් වෙහෙර අද හිස් වන්නට හේතු කවරේදැ යි ආනන්ද ස්ථවිරයන්වහන්සේගෙන් අසූහ.

අනදමඹතෙරුන්වඹන්සේ භාග්‍යවතුනවඹන්සේව මෙසේ සැලකරනසේක් "තුඹවඹන්සේ දනවු සැරිසරා වඩිද්දී අන්ගිකඛ කොපම සූත්‍රය වදුළ තැන් පවන් භික්ෂූහු්සංවේගයට පැමිණ අපව මේ ඔස්තෙහි පිළිවෙත් පිරිය නො හැකිය, නොමිනා පැවතුම් ඇති අප විසින් සැදැහැවතුන් විසින් දින් සලකා පිරිනමනු ලබන දන් වැළඳීම අසුතුය"යි සලකා සිවුරු හැර ගිය බවය. එවිට භාග්‍යවතුන් වඹන්සේව ධම්සංවේගයක් පහළ විය.

එකල්හි භාග්‍යවතුන්වඹන්සේ අනදමහතෙරුන් දමිතා ඇමි? මා එලසමවත් සුවයෙන්, විවේකව සිටියදිවත් මේහි දැසු සිවුරම් භික්ෂූනමක් මගේ දරුවන්ගේ සැනසීම පිණිස දෙවොදයක් නොකෙළේ ය. මහාගංගාවකට බසින්නවුන්ට බොහෝ තාටවල් ඇත්තාක් මෙන් මේ මාගේ ශාසනයෙහි සැනසෙන්නට බොහෝ දේ ඇත. එසෙයින් ආනන්දය, ගඳකිළි මලුවෙහි බුදුසන යක් පනවා භික්ෂූන් රැස්කරව සි නියම කළසේක

මේ කරුණ අවොත්පත්ති කොට ගෙන "අවිජ්‍රාසංඛාත මත්තනම්පි වෙ භිකඛවෙ භිකඛු මෙත්තනං චිත්තං අසෙවති අයං වුච්චති භිකඛවෙ, භිකඛු අරිත්තජඣානෙ විහරති සත්ථුසාසන කරො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති, කො පන වාදෙ යෙ නං බහුලීකරොනති" යනුවෙන් දිහංණති, මේ ශාසන යෙහි යම් භික්ෂූනමක් අසුරු සැනක් ඔසත සඵලා කාලයක් නමුදු සියලු සතුන් මකරෙහි මෙත් සිත වඩා නම් හෙවත් මෛත්‍රී කෙරේ නම් මහණෙනි, මේ භික්ෂූතෙම මේ ඔස්තෙහි නොසිස්වූ ධ්‍යාන ඇත්තකුව වසන්නෙකැ සි ද ශාස්තෘශාසනය පිළිපදින් තෙකැ සි ද අවවාදය පිළිගත්තෙකැ සි ද දායකයන් විසින් දෙනු ලබන රට්ඨපිණ්ඩය නොසිස්ව වළඳන්නෙකැ සි ද කියනු ලැබේ.

කෙතෙක් මේ මෙත්සිත තැවත තැවත පුරුදු කෙරෙත් නම් වඩත් නම් ඔවුන් ගැන කියනුම කවරේ දැ සි මෙසේ චුල්ල අවිජ්‍රා සංඛාත සූත්‍රය වදුරා මෛත්‍රී භාවනායෙහි සෙසු අනුසස්ද දක්වනු පිණිස මේ මෙත්තානිසංස සූත්‍රය වදුළසේක.

1 සුඛං සුපති = සැපසේ නිදයි.

ලෝකයෙහි සෙසු ජනයෝ ඒ මේ අත පෙරළි පෙරළි නන්

දෙඛමින් දස්මිකමින් දුකසේ ඇදෙයි. මෙත් වඩන්නෝ එසේ නොව නිත්දම වත් කල සමවතට සම වන්නවුන් සෙයින් සුවසේ නිදති.

මේ පළමුවන අනුසස යි.

2 සුඛං පටිබුජ්ඣති = සැපසේ අවදිවේ යි.

සෙසු ජනයා තතතමින් ඇඹෙමින් පෙරළෙමින් අත්ඝසමින් දඟලමින් දුකසේ ඇහැරෙයි. මෛත්‍රී භාවනා කොට නිදන තැනැත්තේ ඇහැරෙන කල්හි එසේ නොව පිපෙන පියුමක් මෙන් විකාර නැතිව සැපසේ පිබිදෙයි.

මේ දෙවන අනුසස යි.

3 න පාපකං සුපිනං පසසති=ලාමක සිහිනයක් නො දකියි.

සෙසු සත්වයන් නිද්‍රාපගත වන කල්හි තමන් සොරුන් විසින් පිරිවරන ලද්දවුන් මෙන් වණ්ඩමෘගයන් විසින් උපද්‍රවයන් මෙන් ප්‍රපාතයක වැටුණවුන් මෙන් දියෙහි ගැලුණවුන් මෙන් නපුරු සිහින දක්නා ලැබෙති. මෛත්‍රීභාවනාව පුරුදුකරන්නා එසේ නොව සිහිනයක් දක්නානම දඟලබක් වදනක්හු මෙන් මලක් පුදන්නකු මෙන් බණක් අසන්නකු මෙන් මෙසේ යහපත්වූ සිහිනයක් ම දකියි.

මේ තෙවන අනුසස යි.

4 මනුසසානං පියො හොති = මිනිස්නට ප්‍රිය වෙයි.

මෙත් සිත වඩන්නා ලෙහි බහාලූ මුත්හරක් මෙන් හිස පැළඳි මල්වඩමක් මෙන් මිනිසුන්ට ප්‍රිය වෙයි.

මේ සතර වන අනුසස යි.

5 අමනුසසානං පියො හොති = මිනිස්නට පමණක් නොව දෙවියන්ට ද ප්‍රිය වේ. විසාඛ තෙරුන් මෙනි. මුන්වහන්සේ වතාහි පැලලුප්තුවර උපන් කෙලෙඹි පුත්‍රයෙකි. මොහු තාම්‍රපර්ණී දිවයින හෙවත් ලඞ්කාද්වීපය වෛත්‍යයන්හෙන් සමලඞ්කෘතය, කාසාව වස්ත්‍රයෙන් උජ්වලිතය, කැමති කැමති තන්හි හිඳිනට හෝ සෝනට හැකි සෘතු සැප, සෙනසුන් සැප, පුද්ගල සැප, බණ ඇසුම් සැප යන මේ සියල්ලක් පහසුවෙන් ලැබෙයි යනු අසා තමන්සතු වසකුව අඹුදරුවන්ට පවරා එක කහවණුවක් පමණක් රෙදි කෙළවර බැඳගෙන ගෙන් නික්ම මුහුදුතෙරට යන නැවක් බලා හිදිමින් එක් මසක් ගතකළහ.

මොහු වෙළඳුම් කිරීමෙහි දක්ෂයකු බැවින් දැහැමි වෙළඳුමකින් එක්මාසයක් ඇතුළත කහවණු දහසක් රැස් කළ හ. පසුව නැව් නැගී ක්‍රමයෙන් අනුරාධපුර මහාවිහාරයට පැමිණ මහණකම් ඉල්විය. ඔහු පැවිදි කරනු පිණිස සංඝයා විසින් සිමාවට පැමිණවන ලද්දේය. විසාඛ ඒ දහසින් බැඳි පියල්ල ඔඩොක්කුවෙන් බිම හෙළා පියා.

සඞ්ඝයා මේ කුමක් දැ?යි ඇසූ කල්හි වහන්ස, කහවණු දහසෙකැ යි කීය. "උපාසකය, පැවිදිවූ තැන් පටන් රන් රිදී මසු කහවණු පිළිගන්නට හෝ ප්‍රයෝජන ගන්නට නොපිළිවන. දැන්ම එයට සුදුස්සක් කරව"යි සංඝයාවහන්සේ කිහ. විසාඛ තෙමේ තමන් මහණ වන තැනට ආරවෑ හිස්අතින් නොයෙත්වා! යි කැමති කැමති කෙනකුන්ට හෙන යා හැකි සේ සිමාමාලකයෙහි ඉස පියා පැවිදිව උපසම්පදා ද විය.

මෙතැන් පටන් මේ සප්විරයන් වහනසේ එක් එක් විහාර යෙක සාරමස බැගින් විසඟ මෙකාට ක්‍රමයෙන් සිතුල්පව්වට හොස් එහි දු සාරමසක් වැස හෙව අලුයම එතැනිනුදු නික්ම යන්නෙමි යි සතිටුහන් මෙකාව වැද හොත් හ.

ඉක්බිති සක්මන් මලුවෙයි මුල් කොණ මිදිල රුක අරක්ගත් එක්තරා දෙවිදුවක් තෙරුන් වහන්සේ හෙට එතැනින් යන බැව් දැන හඬන්ට වන. තෙරුන්වහන්සේ එය අසා "කුමක් නිසා හඬන්නෙහි දැ?"යි විවාළහ. නුඹවහන්සේගේ මේ සථානය හැර යාම නිසාය යි කීය. "මිා මෙහි විසිමෙන් නුඹට ලැබෙන ප්‍රයෝජනය කුමක් දැ?"යි තෙරුන් විවාළ කල්හි "නුඹවහන්සේ මෙහි වසන කල දෙවියෝ ඔවුනොවුන් කෙරෙහි මිතුරුව සිටිති. නුඹවහන්සේ වැඩිය කල නැවතත් ඔව්හු අඩදබර කෙරෙති. නපුරු කථා බෙණෙති. ඒ නිසා හැඬිමි" යි දෙවිදු කිවාය. උන්වහන්සේ ඉදින් මා මෙහි වසිමෙන් නුඹලාට පහසු විහරණයක් වේ නම් තව කලක් මෙහි වෙසෙමි යි තවත් සාරමසක් නැවතීමට ඉටාගත් හ. යළිත් තෙරුන්ට එතැන අත්හැර යාමට සිතක් උපන් කල්හි දෙවිදුව නැවතත් හඬන්ට වන. මේ ක්‍රමයෙන් විසාඛ තෙරුන්වහන්සේ ජීවිතාවසානය දක්වා එහිම වැස සිරිකිවිසෝ හ.

මේ දැස්වන අනුසස යි.

6 දෙවතා උක්ඛිපන්ති = දෙවියෝ රකිත්.

මවු පිය දෙදෙන දරුවන් රකින්නාක් මෙන් මෛත්‍රී විහරණයෙන් යුත් භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් දෙවි දෙවතාවෝ රකිති.

මේ සවන අනුසස සි.

7 නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති.
මොහුගේ ශරීරයට ගිනි හෝ විස හෝ ආයුධයක් හෝ නොවදි සි.

මෛත්‍රී විහරණයෙන් යුකතවූවහුගේ සිරුරෙහි උත්තර තම් උපාසිකාවගේ සිරුරෙහිගිනි නො වැදුණාක් මෙන්ද සංයුකත භාණක චුල්ලසිව සථවිරයන්ගේ සිරුරට විෂ විෂනොවූවාක් මෙන් ද සංකිච්ච සාමණේරයන්ගේ සිරුරෙහි අවිආවුධ නො වැදුණාක් මෙන් ද නොවදි සි.

එක කිරිදෙනකගේ කථාවසතුවක් ද මෙයට උදාහරණ වශයෙන් දතයුතු ය. එක් එලදෙනක් තම වස්සාව කිරිදෙමින් සිටියා ය. වැද්දෙක් ඒ ගවදෙන විද මරම් සි සිතා දික් දඹු ඇති තෙබකින් හෙවත් හෙල්ලකින් ඇන්නේ ය. ඒ අඩයවිය ඒ දෙනගේ ශරීරයෙහි වැදි තල්කොළයක් මෙන් හැකිළී ගියේ ය. මෙසේ වූයේ උපචාරධ්‍යාන බලයකින් ද නො මැ; අපිණාධ්‍යාන බලයකින්ද නොවේ. හුදෙක් දෙනගේ වසුපැටියා කෙරෙහි ඇති බලවත් මෘදු සිත, ප්‍රිය සිත හේතුකොටගෙන සිදුවූවකි. මෙසේ මෛත්‍රිය මහත් ආනුභාව ඇති කුශලයකි.

මේ සත් වන අනුසස සි.

8 තුවටං චිත්තං සමාධියති–වහා සිත එකඟවෙයි.

මෛත්‍රා විහරණය ඇත්තහුගේ සිත නීවරණයන්ගෙන් පහවූ බැවින් වහාම එකඟ වෙයි. එහි ප්‍රමාදවීමක් නැත.

මේ අටවන අනුසස සි.

9 මුඛවණ්ණෝ විපසීදති– මුහුණ පැහැපත් වෙයි.

කටුවෙන් ගිලිහුණු තල්ගෙඩියක් මෙන් මෛත්‍රීභාවනා වෙහි යෙදුණු යෝගීහුගේ මුහුණ පැහැපත් වේ.

මේ නව වන අනුසස සි.

10 අසම්මූළ්හෝ කාලං කරොති–මොමුළාව කලුරිය කෙරෙයි.

මෛත්‍රී විහරණයෙන් යුත් තැනැත්තහුට මුළාව සිදුවන මරණයෙක් නම් නැත්තේය. ඔහු මුළා නොවූයේ ම නිදන්තව වන් තැනැත්තකු මෙන් කලුරිය කෙරෙති.

මේ දසවන අනුසස සි.

11 උත්තරිං අපටිවිජ්ඣන්තා බ්‍රහ්මලෝකූපගා හොන්ති. මෙම ආත්මයෙහි රහත් බව නො හැකි වී තම් මරණින් මතු බඹ ලොව උපදියි.

මෛත්‍රී ධ්‍යානය වඩා එයින් මත්තෙහි රහත්බවට පැමිණීමට නො හැකිවූයේ නම් මේ අත්බැවින් චුතව නිදා එබිදියක්හු මෙන් බඹලොව උපදියි.

මේ එකාලොස් වන අනුසස යි.

මෙත්තානිසංස පරිච්ඡේදය නිමි.

මිත්තානිසංස සූත්‍රය

1 පහූත හකෙඛා හවති, විපවුත්ථෝ සකා ඝරා;
බහූනං උපජීවන්ති, යෝ මිත්තානං න දූහති.

2 යං යං ජනපදං යාති, නිගමෙ රාජධානියෝ,
සබ්බත්ථ පූජිතෝ හොති, යෝ මිත්තානං න දූහති.

3 නාසස චොරා පසහන්ති, නාතිමඤ්ඤන්ති ඛත්තියෝ;
සබ්බෙ අමිත්තෙ තරති, යෝ මිත්තානං න දූහති,

4 අකුතෝභයා ඝඤරං එති, සහාය පටිනන්දිතෝ;
ඤාතීනං උත්තමෝ හොති, යෝ මිත්තානං න දූහති.

5 සකකත්වා සකකතෝ හොති, ගරු හොති සගාරවෝ;
වණ්ණකිත්තී භතෝ හොති, යෝ මිත්තානං න දූහති.

6 පූජකෝ ලභතෙ පූජං, වන්දකෝ පටිවන්දනං,
යසසා කිත්තිං ච පපෙපාති, යෝ මිත්තානං න දූහති.

7 අග්ගි යථා පජ්ජලති, දෙවතා ච විරොචති;
සිරියා අජ්ඣිතෝ ඉසති, යෝ මිත්තානං න දූහති.

8 ගාවෝ තසස පජායන්ති, ඛෙත්තෙ වුත්තං විරුහති
වුත්තානං ඵලමස්නාති, යෝ මිත්තානං න දූහති.

9 දරිතෝ පබ්බතාතෝ වා, රුක්ඛාතෝ පතිතා නරෝ;
චුතෝ පතිට්ඨං ලභති, යෝ මිත්තානං න දූහති.

10 විරූළහ මූලසන්තානං, නිග්‍රොධම්ව මාළුතෝ;
අමිත්තා නපවහන්ති, යෝ මිත්තානං නදූහති.

මිත්තානිසංස සූත්‍රය නිට්ඨිතං

සිංහලානුවාදය

1 පඨම භෙක්ඛා භවති:—

යම් පුද්ගලයෙක් මිත්‍රද්‍රොහි නොවේ නම් හෙතෙම තමාගේ හෙයින් බැහැර යම් තැනකට ගියේ නමුත් බොහෝ දෑ කනු ඔබනු ලබයි. බොහෝ දෙනෙක් ඔහු ඇසුරු කොට ජීවත් වෙති.

2 යං යං ජනපදං යාති:—

යමෙක් මිත්‍රද්‍රොහි නොවේ ද හෙතෙම යම් යම් රටකට ගේ ද නියම් ගමනට නුවරකට යේ ද ඒ හැමතැනම (සිවලි මහ තෙරුන් සෙයින්) පුදනු ලැබේ.

3 නාස්ස චොරා පසහන්ති:—

යමෙක් මිත්‍රද්‍රොහි නොවේ ද ඔහුට සොරහු(සංකිච්ච සාම ණේරයන්ට ළං නොවූ සෙයින්) ළං නොවෙති. රජතෙමේ(ජොතිය සිවාණන්ට අවමන් නොකළාක් සෙයින්) අවමන් නො කෙරෙයි. ඔහු හැම සතුරන් මැඩ පවත්වති.

4 අක්කුද්ධා සඝරං එති:—

යමෙක් මිත්‍රද්‍රොහි නොවේ ද හෙතෙම නොඟැටුණු සිත් ඇතිව තමාගේ ගෙට එයි. මිත්‍රද්‍රොහි නොවන පුද්ගලයාගේ අප මණවූ ගුණ සභායෙහි පවා කියති. හෙතෙම නැයන්ට උතුම් වෙයි.

5 සක්කතා සක්කතෙහා භවති:—

යමෙක් මිත්‍රද්‍රොහි නොවේ ද හෙතෙම (අනුන්ට) සත් කාර කොට (තෙමේ අනුන්ගෙන් සත්කාර ලබන්නෙක් වෙයි. අනුන් තෙරෙහි ගෞරව සහිතවූයේ (තෙමේ ද ඔවුන් විසින්) හරු කට යුත්තු වෙයි. ලෝකයා තමාගේ ගුණවණ්නාව හා කීර්තිය ද උසස් කොට කගා සිටුවන්නේ වෙයි.

6 පූජෙතෙහා ලහතෙ පූජං:—

මිත්‍රයන් පුදන තැනැත්තේ තෙමේ ද ඔවුන් විසින් පුදනු ලබන්නෙක් වෙයි. බුද්ධාදි කල්‍යාණ මිත්‍රයන්ට වඳින තැනැත්තේ තෙමේ ද වැඳුම් ලබන්නෙක් වෙයි; (විත්ත ගෘහපතියා මෙන්) යසසට ද කීර්තියට ද පැමිණෙයි.

7 අගහි යථා පජ්ජලති:—

යමෙක් මිත්‍රද්‍රොහි නොවේ නම් හෙතෙම දිලියෙන ගිනි සෙයින් යස ඉසුරු පිරිවර සැපයින් උජ්ජ්වලිත වෙයි, දෙවියකු සෙයින් බබලයි; ශ්‍රී කාන්තාව විසින් අත් නොහරින ලද්දේ වෙයි.

8 ගාවෝ තස්ස පජාඅනති:—

ගෙරිහු ඕනට පල ප්‍රයෝජන දෙති. ක්ෂේත්‍රයෙහි වපුළ තාක් පැළ හදිගනියි. දරුඇප වළඳයි. හේ කවර තැනැත්තෙක් ද යත්? යමෙක් මිත්‍රද්‍රෝහී නොවේ නම් එතෙමේයි.

9 දමිනෝ සඛනානනෝ වා:—

දුදුරෙන්, පර්වතයෙන් හෝ ගසින් වැටුණාවූ, යම්කිසි ගිලිහුණු සතෙක්(චුල්ලපදුම ජාතකයෙහි බෝසත්හු සෙයින්) පිහිට ලබයි. හේ කෙබන්දෙක් ද යත්? යමෙක් මිත්‍රයන්ට ඒත වතුන්ට ද්‍රෝහ නොව විශ්වාස වී නම් හෙතෙමේයි.

10 විරුළහ මූල සනනානං:—

යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහනොකෙරේනම් යෙසෙම් වැඩුණු මුල් හා නුගඅරළු ඇති නුගරුකක් සුළඟින් සොලවා එළන්නට නොහැක්කා සේ සතුරන් විසින් ඔහු මඩනට නොහැකිවෙත්. (කුමාර සොණ සථවිරයන්ගේ මව්ගේ හෙට ඇතුල්වූ සොරහු මව මඩනට නොහැකි වූවාක් මෙනි)

මිතතානිසංස සුත්‍රයෙහි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

සිවලි මහරහතන් වහන්සේ

මහරහත් සිවලි සථවිරයන් වහන්සේ ලාභීන් අතුරෙහි අභ තැන්පත් වූහ. මුන්වහන්සේ පැවිදිවූ තැන් පටන් සෙසු භික්ෂූන් වත් කැමතිතාක් සියුපසඅ ලැබෙන්නට විය. මුන්වහන්සේ යම් රවකට, ගමකට, නියම්ගමකට, නුවරකට වැඩිසේක් නම් ඒ තැනැතැනකදීම පුද්සත්කාර ලැබෙනු පුදුමයක් නොවේ. පුදුමය නම් යම්කිසි මහාවනාන්තරයකට, දුගීමාගීයකට, කානතාර වැනි දුෂ්කර ප්‍රදේශයකට වැඩියත් ප්‍රත්‍යයෙන් කලානත නොවනබවයි.

එයට හේතුව නම් අතීතයෙහි විපසසි සම්මා සම්බුදුන් කල බන්ධුමති නුවර එක්තරා ගමක උපන් මොහු නුවරවැස්සන් මහ දන් පවත්වනු අසා එම දානශාලායෙහි මිහා කැවිදීත් තැතිබව දැන තමන් එවේලෙහි සථයා ගත් ඒ ද්‍රව්‍ය දෙකම කහවණු දහ සකට මිල කළහැකිව තිබියදීත් එසස් නොකොට සතෙම් ම ඒ දානශාලාවට පැමිණ ඉඨා සැදුහැයෙන් සියතින් ම එය පිළිගන්වා මෙසේ පැතීමය.

"මම වනාහි මේ කුශලකර්මයාගේ විපාකයෙන් උපනුපන් භව යෙහි ලාභයෙන් හා යසයින් ද අග්‍රප්‍රාප්ත වෙමිවා" යනුයි. එසෙයින් මොහු අප බුදුන් සමීපයෙහි ලාභීන් අතුරෙහි අග්‍රතැන්පත්ව සිවලි මහරහත් බවින් ප්‍රකට විය.

මුන්වහන්සේගේ මුල් ප්‍රාර්ථනාව විපස්සී සම්මා සම්බුදුන්වත් ඇත අතීතයෙහි සිදුවිය. මෙයින් කල්ප ලක්ෂයකට මත්තෙහි පියුමතුරා නම් සම්මාසම්බුදුන් සම්පයෙහි බඹ අසමින් සිටිය දී උන්වහන්සේ එක් භික්ෂුතමක් ප්‍රත්‍යයලාභීන් අතුරෙහි අග්‍රතන තුරෙක තබාවදුරනු දැක තමාත් මතු බුදුකෙනකුන් වහන්සේ සම්පයෙහි මෙබඳු අග්‍රතනතුරක් ලැබීමට ප්‍රාර්ථනාකළ විට ඒ භාග්‍යවතුන් වහන්සේ ද කොපමණ් මේ ප්‍රාර්ථනාව අනාගතයෙහි ගෞතම නම් සම්මා සම්බුදුන් සම්පයෙහි සමෘද්ධ වන්නේය යි විවරණදෙවා වදාළසේක.

සංකිච්ච සාමණේරයන් වහන්සේගේ කථාවසානය

මුන්වහන්සේ වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර මහරහතන්වහන්සේගේ සද්ධිවිහාරිකයකුවූ සත්හැවිරිදි සාමණේර නමකි. උන්වහන්සේගේ මැණියෝනම් සැවැත්නුවර පොහොසත් කෙනකුගේ දියණි කෙනෙක. ඒ දරුවා මවුකුස සිටියදි මැණියෝ එක්තරා රෝගයකින් මළහ. මළවුන් දවනවිට දරුවා පිහිටි බඩමස් ඉනි රිවී සෙසු මස් දැ ගියේය. මිනිදවන්නෝ බඩමස නොදැ තිබෙනු දැක එය දවනු පිණිස දරුසැයෙන් ඔත්තකොටගෙන හුලකින් දෙතුන් පලකට ඇනලූ ය. හුල් කෙළවර වැදුමසින් වැසී හොත් දරුවාගේ ඇතුළු ඇස නොඇනී ඇස් කෙළවර ඇනිණ.

සොහොන් දවන මිනිස්සු බඩමස ගිනි ඇවිලගත්තා ලෙසට සිදුරු කොපිලා අහුරුගොඩ මතුයෙහි ලා අහුරෙන් වසා යන්නට ගියෝ ය. ඉප්මසත් දැවී ගොස් රන්පිඩක් වැනි දරුවා රත්පියුම් ගබට වත් කංසපැටවකු සෙයින් වැද හොත්තේය.

එම අත්බැවෙහි රහත්වන උතුමකු මහමෙරෙන් යට කළත් රහත් නොවී මිය නොයෑම ධර්මතාවෙකි හුල ඇස් කෙළවර ඇනී කැලැල්වූ හෙයින් සංකිච්ච යයි නම් තැබූහ. පැවිදිවූ පසුත් උන්වහන්සේ එනමින් ම ප්‍රසිද්ධ වූහ.

පසුව සත්ඛවුරුදුවූ කල්හි තමන් හා එක්ව කෙළනා සෙසු දරුවන්ගෙන් මෙපුවත අසා ගිහිගෙහි තලකිරි සැරිසුත් මිහරණ තන් වහන්සේ වෙතට ගොස් පැවිදිව රහත් විය.

ජෝතිය සිවාණන්ගේ කථාවසතුව

අජාසත් රජතෙම එක් දිනක් "ජෝතිය සිවාණන්ගේ මාළිගාව පැහැර ගනිමි" යි සිතා යුද්ධයට සැරසි යන්නේ සිටුමාළිගා යෙහි මැණික් පවුරෙහි සිවුරහ සෙනහ සහිතවූ තමන්ගේ ජායාව දැක "සිවාණන් මා හා යුදකිරීමට බලඇණියක් පිළියෙළ කර තබා නික්මිණැ"යි සලකා බියපත් ව පලායන්නේ බුදුන් වැඩහිඳින විහාරයට ම ගියේ ය.

ජෝතිය සිවාණෝද එදවස් පෙහෙවස් සමාදන්ව උදුසනම බත් අනුභව කොට විහාරයට ගොස් බුදුන් ළඟ බණ අසමින් හුන්හ.

සිවාණෝ රජ්ජුරුවන් දැකලා "කිමෙක් ද? රජ්ජුරුවන් වහන්සැ?" යි කියා නැඟී සිටියහ. රජතෙමේ "සිවාණෙනි, තෙපි මා හා සටන් පිණිස පිරිස මෙහෙයවා මේහි පැමිණ බණ අසන්නකු මෙන් හඟවන නියාදූ?" යි විවාළේ ය.

සිවාණෝද ඒ වේලාව වනතුරු තමින් එබන්දක් නොදත් හෙයින් "කිම, නුඹවහන්සේ මාගේ මාළිගාවත් පැහැරගත්ව පැමිණියේක් දූ?" යි ඇසුහ. "එසේය" යි කීකල්හි "ඔබ එක්රජකු තබා දහස්ගණන් රජදරුවෝත් මාසෙනාකැමැත්තෙන් මහේකිසිම සම්පතක් පැහැර ගත නොහෙත් ය" යි කීහ. රජ්ජුරුවෝ එබසට කිපී "සෙසු රජදරුවන් කෙසේවෙතත් මම නොප නොනැමැත්තෙන් ම නොපගේ වසතුව පැහැර ගන්නෙම් දූ?" යි සිවාණන් ගෙන් ඇසුහ.

එසේ වී නම් රජ්ජුරුවන් වහන්ඔ, එය කලහැකි දූ? යි දූන්ම පරීක්ෂා කරගත හැකිය. "මාගේ ඇඟිලි දසයෙහි මුදු විස්සෙක් ඇත. මම එය රජ්ජුරුවන් වහන්සේට මගේ කිසි කැමැත්තකින් නොදෙමි. ඉදින් රජතුමාට ඔපන්කම් තිබේ නම් කැරගත මැනව" යි කීවූ ය. මහා ජව බල ඇති රජ්ජුරුවෝත් නොයෙක් ලෙස යත්න කොටත් වෙඤසට පැමිණ එක මුද්දකුත් ගළවා ගත නොහැකිවූ ය.

සිටාණෝ ද "මහරජ ඔබතුමාගේ සළුව අතුව ලුව මැනව" යි කියා ඇඟිලි දසක් ඒව තමා පැලූ ය. සිටාණන්ගේ දිමෙහි අදහස ඇතිවන්නා හා සමග ම මුදු විස්ස ම සළුව පිට වැතිරිණ. "රජ්ජුරුවන් වහන්ස, "මා සතු දෙයක් මා සොයා කැමැත්තෙන් හැරහැර නොහැකි නියාව ඔයින් ම දත මැනව" යි කියා සියලු සම්පත් හැර දමා බුදුන් ළඟ මහණව නොබෝකලකින් රහත්ව ජෝතිය තෙරහු යයි ප්‍රසිද්ධ වූහ.

චිත්ත ගහපති විසතුව

මච්ඡිකාසණ්ඩ නම් නුවර වැසි චිත්තගෘහපති සිටාණෝ පස්වග භික්ෂූන්ට ඇතුළත් මහානාම තෙරුන් සුපිළිසන්ව හැඳ පෙරව සිකා වඩනා නියාව දැක, උන්වහන්සේගේ සන්හුන් ඉරියව් වෙනි පැහැද පාත්‍රය හැරගෙන ගෙට වැඩමවා වළඳවා, වළඳා අවසන්හි තුමූ බණ අසා සෝවාන් ව නොසැලෙන සැදුහැ ඇතිව අම්බාටක වන නම්වූ තමන්ගේ උයන්හි සංඝාරාමයක් කරවා පිළිගන්වනු කැමතිව මහානාම තෙරුන් අතපැන් වත් කොට උයන පූජා කළහ. මහා සිටාණෝ එම උයනෙහි විහාරයක් ද කරවා සඟසතු කොට පිළිගැන්වූහ.

එසින් පසු සැරියුන් මහමුගලන් දැගසවුවන් වහන්සේ චිත්ත ගෘහපතිතුමාගේ ගුණකථාව අසා, ඕහට සංග්‍රහ කරනු පිණිස මච්ඡිකාසණ්ඩයට වැඩියාහු ය. චිත්ත සිටාණෝ උන්වහන්සේලා නුවරට වඩනා බව අසා පෙරගමන් කොට පිළිගෙන තමන්ගේ විහාරයට කැඳවාගෙන ගොස් ආගනාතුක සත්කාර කොට සැරියුත් මහතෙරුන්වහන්සේගෙන් බණ අසා අනාගාමී වූහ.

ඉක්බිති චිත්තසිටාණෝ "මම බුදුන් නොදැන ම සෝවාන්වීමි; සෙදගැමිත් වීමි; අනගැමිත් වීමි, බුදුනුත් දිවිම් තම් යහපතැ" යි සිතා දුනොපකරණාදියෙන් හා සිවුරු පිළි ආදිවූ මහපිරිකරින් ද හැල් පන්සියයක් පුරවා ගෙන සිවුපිරිස සහිතවූ තුන්දහසක් පිරිවර සහිතව බුදුන් දකිනු පිණිස සැවැත් නුවරට ගියහ.

සිටාණන් බුදුන් දක්නට යන බැව් අසා දෙවියෝ යොදුනෙන් යොදුන කඳවුරු බැඳගෙන සිටාණන් කැටුව යන සියලු දෙනාට සංග්‍රහ කළහ. මෙසේ මග තන්හි තන්හි රැස්ව සිටි දෙවිමිනිසුන් ගෙන් සත්කාර ගරු බුහුමන් ලබමින් මසකින් සැවැත් නුවරට ළඟා වූහ.

තුවරවැස්සෝ "මහත්වූ පුණ්‍යවතිමයක් ඇති චිත්ත නම් සිටාණ කෙනෙක් සැවැත්නුවරට අවුත් බුදුන් දිදිත් ද, දන් දෙත් ද, එතන්හි පෙළහරකුත් වේ ද, අපිත් ඒ ඔහ පිනැතියන් දකුම්හ, පුදම්හ," යි පුදපඹුරු ගෙන මඟ දෙපස සැරසී සිටියහ.

සිටාණෝ බුදුන් දක්නට එළඹ පසඟ පිහිටුවා වැඳගත් හ. එවේලෙහි සියල්ලන්ගේ සිත්තුළ ඇදහිලි උපදවමින් මල්වැසි වැස්සේය. බොහෝ දෙන සාධුකාර දුන්හ. මෙසේ සිටාණෝ මසක් ම දෙව්රම්වෙහෙර හුන්හ. ඒ මාසය මුළුල්ලෙහිම බුදුන් ප්‍රමුඛ භික්ෂුසංඝයා වහන්සේ පිඬුසිඟා නොයවා වෙහෙරම වඩා හිඳුවාගෙන මහදන් දුන්හ. තමන් හා කැටුව ආ සෙස්සනුත් ඇතුළුවෙහෙරෙහි ම නවත්වා ගෙන සංග්‍රහ කෙළේ ය. එකදව සෙකත් තමන්ගේ ගැල්වලින් විසඳම්වූ දෙයක් නැත. කරන විසඳමට පිවතින් ලැබුණු දෙයම ප්‍රමාණවත් වූහ

සිටාණෝ බුදුන් වැඳ "සවාමීනි, මම නුඹවහන්සේව දක්නට, පුදනට, වඳනට එන්නෙම් අතරමඟ මසක්ම ගතවිය. මෙහි පැමිණත් මසක් ගෙවුණේය. ගැල්පන්සියයක් පුරවා ගෙන ආ දෙයින් කිසිවකුත් විසඳම් නොවී ය. ඉදින් මම මෙහි හවුරුද්දක් හුන්නෙම් නමුත් කළ පින් නොගෙවෙන්නාසේ ම සම්පතුත් නොගෙවෙයි. එබැවින් ගැල් අවකාශ කොට ගෙන යනු කැමැත්තෙමි. ගෙනා දෑනොපකරණ දමා පියන තැනක් වදුළ මෙත් යහපතැ" යි බුදුරජාණන්වහන්සේට සැල කළහ.

බුදුහු තමන්වහන්සේට එය වදුරන්ට තරම් නොවන හෙයින් අනඳමහතෙරුන් අමතා "ආනන්දය, සිටාණන්ට දෑනොපකරණ තැන්පත් කිරීම පිණිස සුදුසු තැනක් අවකාශ කොට දී ලව" යි වදළසේක. තෙරුන්වහන්සේ එසේ කළහ.

මෙසින් පසු බුදුහු කැපකුවි අනුදන්සේහ.

සිටාණෝ තමන් හා කැටිව ආ තුන්දහසතු කැඳවාගෙන හිස් ගැළුත් ගෙන්වාගෙන යන්ට නික්මුණාහු ය. මඟ දෙපස බලාහුන් අය "ඇයි සවාමීනි, ඔබ කළ පින් හිස්ගැල් ගෙන්වාගෙන යන තරමට දැ?" යි කියමින් සත්රුවනින් ගැල්පන්සියය පුරාලූහ. වෙනත් උපකරණවලින් ද ගැල් පිරිහියේ ය.

අබුද්ධොත්පාද කාලයෙහි දනක් දෙන්ට සිතූ අඩකුර රජුගේ ගැල්පන්සියය සත්රුවනින් පුරාලී ය. දැන් බුදුපාමොක් සඟනට

දන් දී සහ සිවාණන්ගේ ගැල්පිරීම පුදුමයක් නො වෙයි. මුදල තිබියදී පොලියෙන් ම ප්‍රයෝජන විඳින්නා සේ ගැල් පුරා සත් රුවන් තිබුද්දි පිවතින් ලැබෙන දෙයින් ම මාහෝපකරණ පිරිහෙළුවිණි.

භාග්‍යවතුන්වහන්සේ ආනන්ද ස්ථවිරයන්වහන්සේට මෙසේ විමට විත්ත ගෘහපතියා විසින් කළ පින්කම් දක්වා වදාරනසේක් "මොහු පියුමතුරා නම් බුදුන් සමයෙහි උපාසකවරුන්ගෙන් අග්‍ර උපස්ථායකව එක්තරා බුදුකෙනකුන් වහන්සේට උපස්ථාන කරන්නට ලැබේවා"යි පතා පින්දහම් කොට දෙව්මිනිස් දෙගතියෙහි සැරිසැරුවේ ය.

මෑත කසුප් සම්මාසම්බුදුන් සමයෙහි වැදිකුලයක ඉපද මුවන් මරනු කැමතිව අඛයවියක් රැගෙන වනයට යන්නේ එක් ගල්තලාවෙක වැඩහුන් භික්ෂුනමක් දැක, මහණදම් පුරන ලීලාවට සතුටුව රසමසවුලෙන් යුත් දන් පිළිගන්වා සුවදැයි විනමලින් ද පිදුයේ ය. මෙසේ සත්කාර නොට එවේලාගෙහි එතැනට පිඬුසිඟා පැමිණි භික්ෂුනමකටත් එයින් ම දන්දෙන්ට සලස්වා "මා මෙසසර උපනුපන් තැන දහස්ගණන් පුද පඬුරු ගෙනවුත් මා ඔත සතුටු කෙරෙත්වා!" යි පැතුය.

මෙතැන් පටන් පස්පවින් වැලකී පින්කම් කෙළේ ය. ඒ පිනෙන් මොහු දෙව්ලොව උපන් කල්හිත් මල්වැසි වැස්සේ ය. උපනුපන් ජාතිවලත් එසේම විය. මේ ජාතියෙහි උපන් දවස මල්වැසි වැසීමත් මෙතැනට ආ දවස මල්වැසි වැසීමත් මහවතුරක් ගලා එන්නාක් මෙන් පුදපඬුරු රැගෙන එමත් සත්රුවනින් ගැල් පිරීමත් ඔහු විසින් කළ නානාවිධ පින්කම්වල ලෞකික විපාකය"යි වදාළසේක.

චුල්ලපදුම ජාතක කථාව

අතීතයෙහි බරණැස්නුවර බඹදත්රජු රාජ්‍යයකරන සමයෙහි අප මහා බොධිසත්වයන් වහන්සේ ඔහුගේ අගමෙහෙසුන් කුස පිළිසිඳ ගත්හ. නම් තබන මහුලෙහි පදුමකුමාර නමින් පලවූ හ. ඕහට අනිකුත් සහෝදරයෝ සදෙනෙක් ද වූහ.

මොහු සත්දෙන ම දනුමැති ව රාජසේවායෙහි යෙදී සිටින අතර රජුගේ උදහසින් භාග්‍යාවන් සහිතවූ මොහු සත්දෙන නුවරින් නික්ම ඇවිදින අතර ක්‍රමයෙන් වාලුකාකාන්තාරයකට

පැමිණියාහු ය. කුසඟිනි ඉවසාගත නො හැකි වූ හෙයින් එක එක දවසට ඔවුන්ගේ භාර්‍යාවන් එක් එක් කෙනා බැගින් මරා මස් බෙදාගෙන අනුභව කරන්නට කථා කරගත් හ.

චුල්ලපදුම කුමාර තෙමේ තමාගට හා භාර්‍යාවටත් ලැබුණු මස් දෙකොටසෙන් එක් කොටසක් ඉතුරු කරතබා ගෙන එක් කොටසක් ප්‍රයෝජනයට ගත්තේ ය. මේ නියායෙන් කිපදෙකාට සක් ම ඉතුරු කරගත්තේ ය. තමන්ගේ භාර්‍යාව මරන්ඩ වාරය පැමිණි කල්හි ඉතුරු කර තැබූ මස් කොටස් සියල්ලන්ට බෙදා දී සියල්ලන් නොදනුවත්ව ම භාර්‍යාවත් කැඳවාගෙන පලාගියේ ය.

බෝසතාණෝ බිරිඳව කාන්තාරයෙහි යා නොහැකිතන්හි කර තබාගෙන ද, පිපාසාව ඉවසාගත නොහැකිවූ කල්හි තමන් ගේ දකුණුලය පලා මල් දීමෙන් ද කාන්තාරය ගෙවා ගම්බිම ගකට පැමිණ පලාපල අනුභව කෙරෙමින් විඩා සන්සිඳුවාගෙන ගොස් ගඟ අසබඩ එක් තැනෙක අසපුවක් නොවගෙඟ වාසය කළාහුය.

මෙසේ කල් යවන කල්හි රාජපුරුෂයෝ රාජාපරාධකාර සොරකු අල්වාගෙන ඔහුගේ අත් පා කප්පවා ඔරුවක හිඳුවා ගඟ දියත් කළහ. ඒ අබිබාගත පුරුෂයා ද දුක්ඛඩින් කෑමොර ගසමින් ගඟ පහළ යන කල්හි බෝසත්හු ඔහු කෙරෙහි අනුකම්පා වෙන් ඉගාබව ගෙන බෙහෙත් කොට වණ සුව කළහ. පසුව බෝසත් භාර්‍යාව හා සමඟ ඔහු අසපුවහි තබා තෙමේ වනඇට ගොස් පලාපල ගෙනවුත් දී කොටා හා භාර්‍යාවත් පොෂණය කළහ.

ඉක්බිති ඒ සත්‍රිය නොබෝකලකින් කොටා කෙරෙහි පිළිබඳ සිත් ඇතිව බොධිසත්ත්වයන් මරන්නට සිතා ඔහු මුළා කොට කාන්තාරයේදී දෙවියන්ව වූ බාරයක් ඔප්පු කරන්නට යයි හඟවන්නාක් මෙන් පඨිතයක් මුදුනව ගොස් බොධිසත්ත්වයන් පඨිතයෙන් පහළට හෙලුවා ය.

බොධිසත්ත්වයන් වහන්සේ ඔස්ගොමුවක රැඳී දිවි ගලවාගෙන, වෙනෙහි වසන මහත්වූ නලගොයකුගේ උදව්වෙන් එක්තරා ගම කට පැමිණ බරණැස් රජු කලුරිය කළ කල්හි එහි ගොස් පදුම නමින් රජව දශරාජධර්මයෙන් රාජ්‍යය කරන්ට පටන් ගත්හ.

මේ රජතෙම සුවර සතර වාසල් දොර ද සුවර මැද ද රජ ගෙහි මහවාසල ද මහා දන්සැල් සයක් කරවා සුදිර බෙර පියවී

කරවා දුහී මහී යාවකාදීන්ට දන් දුන්නේය. අර පවිටු තැනැත්තිය ද බරණැස්රජ දන් දෙන්නේය හි අසා සිවසැමියා බව කෙසේවත් සිතාගත නොහැකිව තොටා පැහැක හිදුවා හිසමත කබා ගෙන සිහා කමින් රජ්ජුරුවන්ගේ දානශාලාව කරා ගියාය.

රජතෙමේ එය දැක මේ කුමක්ද සි අසා සත්‍රියගේ හිසින් පැස ඩාවා ඇය ළඟට කැඳවා හැඳිනගෙන මුල්තොරතුරු අසා "යම් තැනැත්තියක විසින් මම පළිහයෙන් හිමට පෙරළා දමන ලදුයෙම් නම් ඇය අනිකියක් නොවේ, මේ දුසිල තැනැත්තිය ම ය. ඒ වධ යට පැමිණි කෙටොත් අනිකෙක් නොවේ, මොහු ම ය"යි විනිශ්චය කොට කෝපය ඉවසාගත නොහැකිව ඔවුන්ට දඬුවම් නියම කොටත් කැමත ධර්මය මෙනෙහි කෙරෙමින් කෝපය සන්සිඳුවා ගෙන ඒ දෙදෙන ම තමාගේ රටින් නෙරපුයෙය.

එසමයෙහි සහෝදරවරු යදෙන නම් එක්තරා තෙරහුය. භාර්‍යාව නම් විසඳුවා මානවිකාය. කොටහු නම් දෙවිදුන් තෙරය. තලඟොයි රජා නම් ආනන්ද සථවිරයන් වහන්සේ ය. පදුමරජ නමවූ සේක් බුදුවූ තමන්වහන්සේ ම ය.

මිත්‍රානිසංස පරිත්‍රාණයෙහි දහම් විභාගය නිමි.

මොර පරිත්‍රාණං

උදෙතයං චක්ඛුමා එකරාජා, හරිසසවණණණා
පඨවිපභාසෝ;
තං තං නමස්සාමි හරිසසවණණං, පඨවිපභාසං තයජ්ජ
භුත්තා විහරෙමු දිවසං.
යෙ බ්‍රාහ්මණා වේදගූ සබ්බධම්මෙ, තෙ මෙ නමෝ! තෙව මං
පාලයන්තු;
නමත්ථු! බුද්ධානං නමත්ථු! බොධියා, නමෝ! විමුත්තානං
නමෝ! විමුත්තියා.
ඉමං සො පරිත්තා කත්වා, මෝරෝ චරති එසතා
අපෙතයං චක්ඛුමා එකරාජා, හරිසසවණණණා
පඨවිපභාසෝ;
තං තා නමස්සාමි හරිසසවණණං, පඨවිපභාසං තයජ්ජ
භුත්තා විහරෙමු රත්තිං;

යෙ බ්‍රහ්මණා වෙදගූ සබ්බධම්මෙ-නතෙ මේ නමෝ! නතුව මං පාලයන්තු;
නමත්ථු! බුද්ධානං නමත්ථු! බොධියා-නමෝ! විමුත්තානං නමෝ! විමුත්තියා;
ඉමං සො පරිත්තං කත්වා, මොරෝ වාසමකප්පයි.

මොර පරිත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

පළමුවන මොර පිරිත

ලෝකයෙහි අදුරු දුරු කොට ලෝවැස්සන්ට ඇස් පහදා දෙන හෙයින් වසඟ ඇති, ලෝකයාට එළිය දෙන්නවුන් අතරෙහි එකම රජෙක්වූ, රන්වන් ශරීර වර්ණ ඇති, මහ පොළොව බබුළුවන්නාවූ, ශ්‍රී සුඛ්‍යී තෙම නැඟෙයි. එමහයින් රන්වන්ව මහපොළොව බබුළුවන්නාවූ ඒ පින්වතාට වඳිමි. ඔබගෙන් අද ආරක්ෂාව ලැබූ අපි මෙදවස සතර ඉරියව්වෙන් ම යුක්තව සැපසේ වෙසෙමු.

මෙසේ මෙ පළමුවන ගාථාවෙන් තිරුවෙ නමස්කාර කොට දෙවන ගාථාවෙන් අතීත බුදුවරයන්ව ද නමස්කාර කෙරෙයි.

සවාසනා සකල ලෙලඝයන් දුරුකළ යම් බුදුකෙනෙක් සියලු දහයුතු ධර්මයන් දුන බුද්ධත්වය අවබොධ කළසේක් ද, උන්වහන්සේලාට මාගේ නමස්කාරය වේවා! උන්වහන්සේලාද මා ආරක්ෂා කෙරෙතවා! මාගේ වැඳීම ඒ අතීත බුදුවරයන් වහන්සේලාට ද පිරිනැමේවා! උන්වහන්සේලාගේ තව ලොවුතුරා බොධිගුණයට ද මාගේ නමස්කාරය වේවා! රහත්ඵලයට පැමිණ කෙලෙසුන් කෙරෙන් මිදුණාවූ ඒ අතීත බුදුවරයන්ට මාගේ නමස්කාරය වේවා!

ඒ මයුර තෙම මේ පිරිත් ආරක්ෂාව කොටගෙන තමහට බොදුරු සෙවීමහි හැසිරෙයි.

දෙවන මෝර පිරිතෙහි

අපෙතයං- අයං අපෙති, පළමු කියනලද පරිද්දෙන් මේ සුඛ්‍යී තෙම (අප අතරෙන්) අහක් වෙයි. ඔබගෙන් ආරක්ෂාව ලත් අපි (මේ මුළු රැයෙහි) සැපසේ වෙසෙමු. සෙස්ස පෙරසේ ය.

ඒ මෝණර තෙම මේ පිරිත කොට සැපසේ වාසය කෙළේය.
මොර පරිනතෂෙහි සිංහලානුවාදය නිමි.

දහම් පිසහාර

අප මහා බෝසතාණන් වහන්සේ බොධිසම්භාර ධර්මයන් පුරන කල්හි මිත්‍රයන්හට ද්‍රෝහ නොකරනු පිණිස කියකලද මිත්තාමිසංස සූත්‍රයට අනතුරුව මියුරයෝනියෙහි උපන් එක් අවස්ථාවෙක්හි තමහට සෙත්පිරිත් පිණිස ගොතා පිළියෙළ කොට පුරුදු කරනලද මෝරපිරිත මේ යතර බණවරෙහි ඇතුලත් කරන ලදි.

අතීතයෙහි බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි අප මහා බෝසතාණන් වහන්සේ මයුරයෝනියෙහි පිළිසිඳගෙන කිණිහිරිමිල් කැකුළක් බදු රන්වන් ශරීරය ඇත්තෝ වූහ. ඒ මෝණරතෙම තමන් දිවි රකිනු සඳහා පළිතවළලු තුනක් ඉක්මවා සතරවන පළිත වළල්ලෙහි දණ්ඩකහිරකැදැලු නම්වූ ගල්තලා මෙක්හි වාසය කරන්නට විය.

ඔහු රාත්‍රිය පහන් වේගත එන කල්හි පව්ව මුදුනෙහි සිව හිරු නැඟෙන දිශාව බලා ගොදුරු කිමෙහි දී තමහට උවදුරු නොවනු පිණිස උතුම් මන්ත්‍රයකින් ආරක්ෂා බඳනේ "උදෙතයං චක්ඛුමා එකරාජා" යන ආදි පළමු ගාථාවෙන් හිරු දෙව්යන්ට නමස්කාර කෙරෙයි.

"යෙ බ්‍රාහ්මණා වෙදගූ සබ්බධම්මෙ" යන ආදි දෙවන ගයින් අතීතයෙහි පිරිනිවි බුදුවරයන්ට හා උන්වහන්සේලාගේ නව අරහාදි බුදුගුණයන්ට ද වැඳ නමස්කාර කොට ගොදුරු සොයා යයි.

මෙසේ බෝසත් මොණරා මේ පිරිත් ආරක්ෂාව කරගෙන නොයෙක් කුඩාමහත් ඵලයන් සොයා අනුභව කොට දහවල් කාලය ගෙවා සවස්කාලයෙහි දුටපළිසය මුදුනෙහි හිඳ ගළිත් බැස ගන ගන හිරුමඬලදිසාව බලමින් පෙරසේ ම වැඳ නමස්කාර කොට පළමු බුදුවරයන්ගේ ද ගුණ මෙනෙහි කෙරෙමින් බ්‍රහ්ම මන්ත්‍රය තමවූ මේ උතුම් මන්ත්‍රයෙන් සෙත්පිරිත් කෙරෙමින් ආත්මාරක්ෂාව කරගන්නේ:

"අපෙතයං චක්ඛුමා එකරාජා
හරිසසවණ්ණා පඨවිපපභාසො"

ඝන ආදීන් කියා නවාතැන් ගනිසි.

එහෙයින් මහණෙනි, ඒ මොණරා පිරිතෙන් ආරක්ෂාව සලසා ගෙන විසූ ඔැවින් හවුරුදු සත්සියයක් එහි ආනුභාවයෙන් දිවා රෑ දෙක්හි කිසිම බියක් නැති ගැනීමක් උවදුරක් නැතිව සැපසේ වාසය කෙළේය යි වදළසේක.

මයූර පරිත්‍රාණයෙහි දහම් විසතරය නිමි.

චන්ද පරිත්තං

එවං මේ සුතං එකංසමයං භගවා සාවත්ථියං විහරති ජේත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ,තෙන ඛෝ පන සමයෙන චන්දිමා දෙවපුත්තො රාහුනා අසුරින්දෙන ගහිතො මහාති අථඛෝ චන්දිමා දෙවපුත්තො භගවන්තං අනුස්සරමාතෝ තායං වෙලායං ඉමං ගාථං අභාසි.

නමෝ තෙ බුද්ධවිරත්ථු විපමුත්තොසි සබ්බධි
සම්බාධපටිපන්නොඝම් තස්ස මෙ සරණං භවාති

අථඛෝ භගවා චන්දිමං දෙවපුත්තං ආරබ්භ රාහුං අසුරින්දං ගාථාය අජ්ඣභාසි.

තථාගතං අරහන්තං චන්දිමා සරණං ගතා
රාහු චන්දං පමුඤ්චස්සු බුද්ධා ලොකානුකම්පකාති

අථඛෝ රාහු අසුරින්දෝ චන්දිමං දෙවපුත්තං මුඤ්චිත්වා තරමාන රූපෝ යෙන වෙපචිත්ති අසුරින්දෝ තෙනුපසංකම් උපසංකමිත්වා සංවිග්ගෝ ලොමහට්ඨජාතෝ එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතං ඛෝ රාහුං අසුරින්දං වෙපචිත්ති අසුරින්දෝ ගාථාය අජ්ඣභාසි.

කින්නු සන්තරමානොව රාහු චන්දං පමුඤ්චසි
සංවිග්ගරූපෝ ආගම්ම කින්නු භීතොව තිට්ඨසි ති
සත්තධා මෙ එඵල මුද්ධා ජීවන්තෝ න සුඛං ලභෙ
බුද්ධාත්ථාභිගීතොම්හි තෝ වෙ මුඤ්චෙය්‍ය වන්දිමන්ති

චන්ද පරිත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රය මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේත නම් රාජ කුමාරයාගේ උයන්හි අනේපිඬුමහසිටුතුමා විසින් කරවනලද අරමෙහි වැඩවසනසේක. එසමයෙහි චන්ද දිව්‍යපුත්‍රතෙම රාහු අසුරේන්ද්‍රයා විසින් අල්වාගන්නා ලද්දේ විය ඉක්බිති චන්ද්‍රදිව්‍යපුත්‍ර තෙම එවේලෙහි බුදුන් සිහිකෙරෙමින් මේ ගාථාව කීය.

බුද්ධිවීරයන්වහන්ස, නුඹවහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් විශෙෂයෙන් මිදුණුසේක. එසේවූ නුඹවහන්සේව මාගේ නමස්කාරය වේවා. ඉම කරදරයට වැටී සිටිමි. ඒ මව පිළිසරණ වුව මැනව.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සඳු දෙව්පුත් අරහයා රාහු අසුරිඳුට මේ ගාථාවෙන් මෙසේ වදාළසේක.

රාහු අසුරේන්ද්‍රය චන්ද්‍රදිව්‍යපුත්‍ර තෙමේ නිකෙලෙසිවූ තථාගත යන් වහන්සේ සරණ ගියේය. බුදුවරයෝ වනාහි ලොවට අනුකම්පා කරන්නෝය. (එහෙයින්) සඳු අතහරුව යි වදාළසේක.

ඉක්බිති රාහු අසුරේන්ද්‍ර තෙම සඳු දෙව්පුතු අතහැර වේගයෙන් වේපචිත්ති අසුරේන්ද්‍රයා යම් තැනෙක ද එතන්හි එළඹියේය. එළඹ හැඳහත් සංවේග ඇතිව ලොමුදහගහත් ශරීර ඇතිව එකත්පසෙක සිටියේය. එසේ සිටියාවූ රාහු අසුරිඳුහට වෙපචිත්ති අසුරේන්ද්‍ර තෙම ගාථාවකින් මෙසේ කීය.

එම්බල රාහු අසුරේන්ද්‍රය, ඉක්මන්වුවකු මෙන් සඳු අත්හැරියේ කුමකට ද? කැලඹුණු හති ඇත්තෙක් ව අවුත් කියවූවකු මෙන් කුමක්හෙයින් සිටිනෙහිද? යනුයි.

එකල රාහු අසුරේන්ද්‍ර තෙම

බුදුන් විසින් සඳු අතහරුව යි ගාථාවකින් අස්වන ලද්දෙමි. ඉදින් සඳු අත නොහැරියෙම් නම් මාගේ හිස සත්කඩක්ව පැලෙයි. ජීවත්වුව ද සැපයක් නොලබම්. (එහෙයින් සඳු අත හැරියෙමි යි කීය.)

වන්දපරිත්තයෙහි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

පොළොව ඇසුරුකරගෙන වසන්නාවූ මනුෂ්‍යාදීන්ට ඇතිවන උවදුරු දුරුකිරීම පිණිස පිරිත් සූත්‍රයන් දක්වා දුන් මතු වාතුම්භා රාජික තාවතිංස යක දෙදෙව්ලෝවාසින්ට ඇතිවන භය දුරුකරනු පිණිස දේශනාකරනලද වඳපරිත්ත සූරියපරිත්ත ධජග්ග පරිත්ත යන පිරිත් සූත්‍ර තුන විශිෂ්ට විශිෂ්ටතර විශිෂ්ටතම යන පිළිලි අවළින් අඛංගු කරනු පිණිස මෝරපරිත්තයට අනතුරුව වඳ පරිත්තාදිය ගොදනලදි.

මෙහි නමෝ යන බුදුබවිරදුන් යන ආදි ගය රාහු විසින් ගිල ඔත් සඳු දෙව්පුත්හු විසින් බුදුගුණ සඳහන් කෙරෙමින් උන්වහන්සේගෙන් පිළිසරණ ඉල්වූ ගාථාව ය.

තථාගතං අරහන්තං යනාදිය සඳ දෙව්පුත්හු මුදනු පිණිස රාහු අසුරිඳුහට තථාගතයන් වහන්සේ විසින් වදාළ ගාථාවය. කිනනු සන්තරමානෙනාව යනාදිය සඳදෙව්පුතු අත්හැර වෙප විත්ත නම් අසුරේන්ද්‍රයා වෙත පැමිණි රාහුගෙන් අතාරතුරු ඇසූ ගාථාව ය. සන්තනඩා මේ එලෙ මුදඩා යනාදිය රාහු අසුරේන්ද්‍රයා විසින් වෙපවිත්තිව සඳු අත්හැරීමට සිදුවූ කරුණු පැවසූ ගාථාවය.

වඳ පරිත්තයෙහි දහම් විසතරය නිමි.

සූරිය පරිත්තං

එවං මේ සුතං එකංසමියං භගවා සාවත්ථියං විහරති ජේත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමේ තෙන ඛො පන සමයෙන සූරියො දෙවපුත්තොනා රාහුනා අසුරින්දෙන ගහිතො මහාතිඃඇථඛෝ සූරියෝ දෙවපුත්තනා භගවන්තං අනුස්සරමානෙ තායං වෙලායං ඉමං ගාථං අභාසි.

නමෙමා තෙ බුද්ධවිරත්ථු විපමුත්තොසා සි සබ්බධී
සම්බාධපටිපන්නාසම්හි තස්ස මේ සරණං භවාහි

අථඛෝ භගවා සූරියං දෙවපුත්තං ආරබ්භ රාහුං අසුරින්දං ගාථාය අජ්ඣභාසි

තථාගතං අරහන්තං සූරියෝ සරණං ගතෝ
රාහු සූරියං පමුඤ්චස්සු බුද්ධා ලොකානුකම්පකා හි.

යො අන්ධකාරෙ තමසි පභඞ්කරො
වෙරොචනො මණ්ඩලී උග්ගතෙජො
මා රාහු ගිලි චරං අන්තලික්ඛෙ
පජං මම රාහු පමුඤ්ච සූරියනති

අථඛො රාහු අසුරින්දො සූරියං දෙවපුත්තං මුඤ්චිත්වා තරමානරූපො යෙන වෙපචිත්ති අසුරින්දො තෙනුපසංකම්, උපසංකමිත්වා සංවිග්ගො ලොමහට්ඨජාතො එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො රාහුං අසුරින්දං වෙපචිත්ති අසුරින්දො ගාථාය අජ්ඣභාසි.

කින්නු සන්තරමානොව රාහු සූරියං පමුඤ්චසි
සංවිග්ගරූපො ආගම්ම කින්නු භීතොව තිට්ඨසි නි
සන්තඩා මෙ එලෙ මුද්ධා ජීවන්තො න සුඛං ලභෙ
බුද්ධගාථාභිගීතොම්හි නො වෙ මුඤ්චෙය්‍ය සූරියනති

සූරිය පරිත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

බුදුහු සැවැත්නුවර දෙවිරම්වෙහෙර අනන්පිඬු මහසිටුහුගේ අරමහි වැඩ වෙසෙන කල්හි සූර්‍යදිව්‍යපුත්‍ර තෙම රාහු අසුරේන්ද්‍රයා විසින් අල්වා ගන්නා ලද්දේ වෙයි. එකල්හි හිරු දෙව්පුත් බුදුන් සිහි කෙරෙමින් මේ ගාථාව කීයේය.

බුද්ධම්රයන් වහන්ස, ඔබව (මාගේ) නමස්කාරය වේවා, නුඹ වහන්සේහැමතන්හිම මිදුණුසේක් වෙහිය. මම (රාහුගේ කරදර සව) වැටුණෙමි. ඒ මව පිහිටවන්නැනව.

ඉක්බිති බුදුහු හිරුදෙවිපුත් ඇරබ රාහු අසුරිඳුව ගාථාමිකින් මෙය වදාළසේක.

එම්බා රාහු, හිරු දෙවිපුත් අර්හත්වූ තථාගතයන් වහන්සේ සරණ ගිහිය්ය. එසෙයින් ඔහු මුදව. බුදුවරයෝ ලොවට අනුකම්පා කෙරෙති.

යම් සූර්‍යයෙක් ගහදුරු දුරහැර එළිය කෙරේද බබළන මඩුලු ඇත්තේ ද මහා තේජස් ඇත්තේ ද එම්බල රාහුව එසේවූ අහස හැසිරෙන හිරු නොගිල එම්බා රාහුව් මාගේ පුත්‍රවූ සූර්‍යයා මුදව යි වදාළසේක.

ඉක්බිති රාහු අසුරේන්ද්‍ර තෙම හිරු දෙවිපුත් අත්හැර ගුහුසුලුව සෙවත් ඉක්මන්ව වෙපචිත්ති අසුරේන්ද්‍රයා යම් තැනක ද එතනට

එළඹියේය. එළඹ කලකිරුණු සිත් ඇතිව කියෙන් කැනිගත්තෙක්ව එකත්පස්ව සිටියේය. එසේ සිටියාවූ රාහු අසුරේන්ද්‍රයාහට වේප චිත්ති අසුරේන්ද්‍ර තෙම ගාථාවකින් මෙසේ කීය.

එම්බල රාහුව කිම ඉක්මන් වූවකු මෙන් හිරු අත හැරයෙහි ද? කුමක්හෙයින් කලකිරුණු ගතියෙන් යුක්තව (මෙහි) පැමිණ තැති ගත්තකු මෙන් සිටිතෙහි ද?

(එම්බල රාහුව හිරු මුදව යි) බුදුන් විසින් වදුළ ගාථා දෙකක් ඇසීම්. ඒ වදුළ වචනය ඉක්මවා ඉදින් හිරු අත නොහැරයෙම් නම් මාගේ හිස සත්කඩකට පැලෙන්නේය. දිවි නිබුණත් සුවයක් නම් නොලබම්. (එහෙයින් හිරු අත්හැරියෙම් යි කීය.)

සුබිස පරිතතයෙහි සිංහලානුවාදය නිමි

දහම් විසතර

චන්ද්‍ර සූර්‍ය දෙදෙන සඳු හිරු විමන් වැසි දිව්‍යපුත්‍රයෝ යි. මොහු දෙදෙන වතාහි මහාසමය සූත්‍රය දෙසූ කල්හි සෝවාන් වූහ. ඒ මාගධීඵල ප්‍රාජතයන් ආර්‍යපුත්‍ර විත බැවින් බුදුහු තමන්වහන්සේගේ දරුවන් කොට සලකා අත්හරුව යි වදුළසේක.

මෙහි නමෝ තෙ බුද්ධවීරත්ථු යනාදිය සූර්‍යදිව්‍යපුත්‍රයාගේ භාෂිතයෙක. නථාගතං අරහතනං යත භය භා සොං අනිකාරෙ යත ආදි ගය ද තථාගත භාෂිතය වේ. කින්නු සතතරමා නොව යනාදිය වේපචිත්ති අසුරේන්ද්‍රයාගේ භාෂිතයෙක. සත්තධා මෙ ඵලෙ මුද්ධා යනාදිය සූර්‍ය දිව්‍යපුත්‍රයාගේ භාෂිතයෙක.

රාහු වතාහි අසුර දෙවුවෙකි හෙවත් අසුරයන්ගේ ප්‍රධාන යෙකි එසේම මහත්වූ ශරීර ඇත්තෙකි. ඔහුගේ ශරීරය තරම් ඉතා විශාලවූ ශරීරයක් ලෝකයෙහි තවත් කිසිවකුට නැත්තේ ය. හෙතෙම සඳහිරු දෙදෙන ගමන් කරන විථියට බැස ඔවුන්ගේ තේජස්සම්පත්තියෙහි ඊර්ෂ්‍යායෙන් කට දල්වා සිටි කල්හි මහා තරක ඇතිව වැටුණවුන් මෙන් වැටී මිනත් දුකට පත්වෙති.

හෙතෙම ඇතැම්විට සඳහිරු විමන් අතින් වසයි. ඇතැම්විට හක්ක යට තබා ගනියි. ඇතැම්විටක දිවෙන් පිරිමදියි. ඇතැම්විටෙක ඇතෙක් පොල්ගෙඩියක් හක්කෙහි තබාගන්නාක් මෙන් තබා ගනියි. එසේදවුවත් සඳහිරු දෙදෙනාගේ ගමන් වේගය ඉතා ශීඝ්‍ර හෙයින් එය වළක්වන්නට ඔහුට නොහැකිය.

ඉදින් එසේ නැත් කෙළේ වී නම් ඔහුගේ හිස් මුදුන හෝ පළා නෙ පිවතට නික්මේයි. නැතහොත් ඔහුගේ ශරීරය හෝ නැමේයි. එහෙයින් ඔහු සඳහිරුවිමින් සමඟම යයි.

සුදිස පරිත්තයෙහි දහම් විසතරය නිමි.

ධජග්ග පරිත්තං

එවං මේ සුතං එකංසමයං භගවා, සාවත්ථියං විහරති ජේත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමේ, තත්‍රඛෝ භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො ති, භදන්තෙති තෙ භික්ඛූ භගවතෝ පච්චස්සොසුං, භගවා එතදවොච.

භූතපුබ්බං භික්ඛවෙ දෙවාසුරසඞ්ගාමො සමුපබ්බුළ්හො අහොසි, අථඛො භික්ඛවෙ සක්කා දෙවානමින්දෙ දෙවෙ කාව තිංසෙ ආමන්තෙසි, සචෙ මාරිස දෙවානං සඞ්ගාමගතානං උපප ජ්ජය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා තුය්හං පහිස්සති

තො වෙ මේ ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ පජාපතිස්ස දෙව රාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, පජාපතිස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා තුය්හං පහිස්සති.

තො වෙ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, වරුණස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා තුය්හං පහිස්සති.

තො වෙ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ ඊසානස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, ඊසානස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා තුය්හං පහිස්සති.

තං ඛො පන භික්ඛවෙ සක්කස්ස වා දෙවානමින්දස්ස ධජග්ගං උල්ලොකයතං, පජාපතිස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකය තං, වරුණස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, ඊසානස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා තුය්හං පහීයෙථා පි නො පි පහී යෙථ, තං කිස්සහෙතු?

සත්තකා භික්ඛවෙ දෙවානම්පෙ අවිතරාගො අවිතදෙසො අවිතමොහො හිරුවජ්ජගි උත්‍රාසි පලාසි නි,

අහං ච බො භික්ඛවෙ එවං වදාමි. සවෙ තුම්හාකං භික්ඛවෙ අරඤ්ඤගතානං වා රුක්ඛමූලගතානං වා සුඤ්ඤාගාරගතානං වා උපජ්ඣායස්ස භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා මමෙව තස්මිං සම්මෙ අනුස්සරෙය්‍යාථ,

ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධා විජ්ජාචරණ සම්පන්නා සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධා භගවාති.

මමං හි වොා භික්ඛවෙ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති, නො වෙ මං අනුස්සරෙය්‍යාථ, අථ ධම්මං අනුස්සරෙය්‍යාථ

සවාක්ඛාතො භගවතා ධම්මො, සන්දිට්ඨිකො, අකාලිකො එහිපස්සිකො, ඔපනයිකො, පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහි නි.

ධම්මං හි වොා භික්ඛවෙ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වං ලොමහංසො වා සො පහීයිස්සති.

නො වෙ ධම්මං අනුස්සරෙය්‍යාථ, අථ සංඝං අනුස්සරෙය්‍යාථ, සුපටිපන්නා භගවතො සාවකසංඝො, උජුපටිපන්නා භගවතො සාවකසංඝො, ඤායපටිපන්නා භගවතා සාවකසංඝො, සාමීචි පටිපන්නා භගවතො සාවකසංඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එස භගවතො සාවකසංඝො, ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤ ක්ඛෙත්තං ලොකස්සාති.

තං කිස්සහෙතු?

තථාගතො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධා වීතරාගො වීතදොසො වීතමොහො අභිරු අවජ්ජති අනුත්‍රාසි අපලාසි නි.

ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා—සුඤ්ඤාගාරෙව භික්ඛවො
අනුස්සරෙථ සම්බුද්ධං— භයං තුම්හාක නො සියා

නො වේ බුද්ධං සරෙය්‍යාථ— ලොකජේට්ඨං නරාසභං
අථ ධම්මං සරෙය්‍යාථ— නීය්‍යානිකං සුදෙසිතං

නො වේ ධම්මං සරෙය්‍යාථ— නීය්‍යානිකං සුදෙසිතං
අථ සංඝං සරෙය්‍යාථ— පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං

එවං බුද්ධං සරතානං—ධම්මං සංඝං ච භික්ඛවෝ
භයං වා ඡම්භිතත්තං වා— ලොමහංසෝ න හෙස්සති

ඛජ්ජනකපරිත්තං නිට්ඨිතං

පඨමක භාණවාරං

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රය මෙසේ අසනලදි. එක්සමයෙක්හි භාග්‍ය වතුන් වහන්සේ අනේපිඬුමහසිටුහු විසින් කරවනලද සැවැත්නුවර සම්පයෙහිවූ ජේතවනාරාමයෙහි වැඩවසතසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි කියා භික්ෂූන්ව ආමන්ත්‍රණය කළසේක. භික්ෂූහු එසේය වහන්ස යි කියා භාග්‍යවත්හට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මේ දේශනාව වදළසේක.

මහණෙනි, පෙර සිදුවූ දෙයක් කියමි. හේ කුමක්දයත්? දෙවියන් හා අසුරයන් අතර (දෙපෙනහාඑකතුවීමෙන්) යුද්ධයෙක් ඇති විය. මහණෙනි, එකල ශක්‍රදේවේන්ද්‍ර තෙම තව්තිසාවැසි දෙවියන් කැඳවිය. (කැඳවා මෙසේ කීය.) පින්වත්නි, ඉදින් යුද්ධයට පැමිණි දෙවියන්ට කියක් හෝ තැතිගැන්මක් හෝ ලොම්ඵළා ගැන්මක් හෝ උපන්නේ වී නම් එකල්හි මාගේම ධ්වජාග්‍රය බලව්. මාගේ ධ්වජාග්‍රය බලන්නාවූ තොපට භයක් හෝ තැතිගැනීමක් හෝ රෝමෝද්ගමයක් හෝ වේ නම් හේ දුරුවෙයි.

ඉදින් මාගේ ධ්වජාග්‍රය නොබලව් නම් එකල්හි ප්‍රජාපති දෙවිරජහුගේ ධ්වජාග්‍රය බලව්. ප්‍රජාපති දෙවිරජහුගේ ධ්වජාග්‍රය බලන තුඹලාට කියක් හෝ තැති ගැනීමක් හෝ ලොම්ඵළා ගැන්මක් හෝ වේ නම් හේ දුරුවෙයි.

ඉදින් ප්‍රජාපති දෙවිරජහුගේ ධ්වජාග්‍රය නොබලව් නම් එකල්හි වරුණ නම් දෙවිරජහුගේ ධ්වජාග්‍රය බලව්. වරුණ දෙවිරජහුගේ ධ්වජාග්‍රය බලන තුඹලාට යම් භයක් හෝ තැති ගැන්මක් හෝ ලොම්ඵළාගැන්මක් වේ නම් එය දුරුවෙයි.

ඉදින් වරුණ දෙවිරජහුගේ ධ්වජාග්‍රය නොබලන්නහු නම් එකල ඊසාන නම් දෙවිරජහුගේ ධ්වජාග්‍රය බලව්. ඊසාන දෙව්

රජහුගේ ධවජාග්‍රය බලව්. ඊසාන නම් දෙව්රජහුගේ ධ්වජාග්‍රය බලන තොපට යම් භයක් හෝ යම් තැතිගැනීමක් හෝ යම් රෝමෝදගමයක් හෝ වේ නම් හේ දුරුවෙයි.

මහණෙනි, සක්දෙවිරජහුගේ හෝ ඒ ධවජාග්‍රය බලන්නවුන්ට ප්‍රජාපති දෙව් රජහුගේ හෝ ඒ ධවජාග්‍රය බලන්නවුන්ට වරුණ දෙව් රජහුගේ හෝ ඒ ධවජාග්‍රය බලන්නවුන්ට ඊසාන දෙව්රජ හුගේ හෝ ධවජාග්‍රය බලන්නවුන්ට යම් භයක් හෝ තැතිගැනී මක් හෝ රෝමෝදගමයක් හෝ වේ නම් හේ දුරු වන්නේ හෝ වෙයි. දුරු නොවන්නේ හෝ වෙයි.

එයට හේතු කවරේදයත්?

මහණෙනි, ඒ සක්දෙවිරජ තෙමේ දුරු නොකළ රාග ඇත්තේ ය. දුරු නොකළ ද්වේෂ ඇත්තේ ය. දුරු නොකළ මෝහ ඇත්තේ ය. බිය වන සුලුය. තැතිගන්නා සුලුය. අසිහසින්ම කියවන සුලුය, පලා යන සුලු ය.

මහණෙනි, මම ද නුඹලාට මෙසේ කියමි. මහණෙනි, ඉදින් වනයට ගියාවූ හෝ රුක්මුලට ගියාවූ හෝ ගෙවලින් හිස් තැන කට ගියාවූ හෝ නුඹලාට භයක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදහගැන්මක් හෝ උපදනේ වී නම් එකල්හි මා ගැනම සිහි කරව්.

හේ කෙසේදයත්?

ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුදු රහත් නම් වනසේක. සම්‍යක්සම්බුද්ධ නම් වනසේක. විජ්ජාචරණ සම් පන්න නම් වන සේක. සුගත නම් වනසේක. ලොකවිදූ නම් වනසේක. අනුත්තර නම් වනසේක. පුරිසදම්මසාරථි නම් වන සේක. දෙවිමිනිසුන්ට ශාස්තෘ නම් වන සේක. බුද්ධ නම් වන සේක. භාග්‍යවත් නම් වනසේක කියා ය.

මහණෙනි මා සිහිකරන තොපට යම් භයක් හෝ තැතිගැන් මක් හෝ රෝමෝදගමයක් හෝ වේ නම් හේ දුරුවන්නේ ය.

ඉදින් (නුඹලා) මා ඔහි නොකරන්නහු නම් එකල්හි ධර්මය සිහිකරව්.

හේ කෙසේදයත්?

භාග්‍යවතුන් වහන්සේ විසින්(මේ) ධර්මය තෙම මනාකොට දේශනා කරනලද්දේ ය. තමා විසින් ම දක්ෂයුත්තේ ය. කල් නොහොසින් ම විපාක දෙන්නේ ය. එව, බලව, යයි කිමට සුදුසු ය. තමා තුළින්හි එළවා බැලිමට හෙවත් තම තමන් විසින් ම කල්පනාකර අවබෝධ කරගැනීමට සුදුසු ය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුත්තේ ය.

මහණෙනි, මෙසේ ධර්මය සිහිකරන තුඹලාට යම් භයක් හෝ තැතිගැන්මක් හෝ රෝමෝද්ගමයක් හෝ වේ නම් මේ දුරු වන්නේ ය.

ඉදින් ධර්ම සිහි නොමකරේ නම් එතැන්හි සංඝයා සිහිකරව්.

මේ කෙසේදයත්:

බුදුන්ගේ ශ්‍රාවකසංඝතෙම මනා පිළිවෙත්හි පිළිපන්නේ ය. බුදුන්ගේ ශ්‍රාවක සමූහතෙම අවඛ්ඩක ප්‍රතිපත්තියෙහි පිළිපන්නේ ය.බුදුන්ගේ ශ්‍රාවක සංඝතෙම නිවන් පිණිස පිළිපන්නේ ය. බුදුන්ගේ ශ්‍රාවක සමූහතෙම නිවනට අනුකූල පිළිවෙත්හි පිළිපන්නේ ය.

ඔවුහු කවරහුද යත්?:

යම් මේ පුරුෂ යුගල වශයෙන් සතර කොටසක් වෙත් ද, පුරුෂ පුද්ගල වශයෙන් අට දෙනෙක් වෙත් ද, බුදුන්ගේ මේ ශ්‍රාවක සංඝතෙම දුරසිටනු දු කැඳවා සියුපසඟ දීමට සුදුසු ය. අඹුතු අඹුතු ප්‍රත්‍යයන් ගෙන්වා ගෙන ගොස් පිළිගැන්වීමට සුදුසු ය දෙගොත් මුදුන් දී වැඳීමට සුදුසු ය, සිංහල ලෝවැස්සන්ට පින් හවගන්නා කෙතකැ සි කියා හි.

මේසේ සංඝයා සිහිකරන තුඹලාට යම් බියක් හෝ තැතිගැන්මක් හෝ රෝමෝද්ගමයක් හෝ වේ නම් මේ දුරුවෙ හි.

එයට කරුණු කිමද යත්?

මහණෙනි, සඵාඝතතෙම දුරු කළ රාග ඇත්තෙක, දුරුකළ ද්වේෂ ඇත්තෙක, දුරු කළ මෝහ ඇත්තෙක, බිය නොවන සුලුය,තැති නොගන්නා සුලුය, ත්‍රාස නොවන සුලුය, බියෙන් පලා යන සභාව නැත්තේ ය.

භාග්‍යවතුන් වහන්සේ මේ ධජග්ග පරිත්තය වදාළසේක. මේසේ වදාරා සුගත නම්වූ ශාස්තෘන් වහන්සේ නැවතත් ගාථා වශයෙන් මේය ම වදාළසේක.

මහණෙනි, වන සෙනස්සනකදී හෝ රුක්මුල් සෙනස්සනකදී හෝ ජනසමාජයෙන් විවේක සෙනස්සනකදී හෝ සම්‍යක් සම්බුදුගන් වහන්සේ සිහිකරවි එසේකල්හි නුඹලාට භයක් නොවන්නේ ය.

ඉදින් ලෝකාජ්‍යෂ්ඨවූ නරශ්‍රේෂ්ඨවූ බුදුන් සිහි නොකරන්නාහු නම් එකල්හි නෛයර්‍යාණිකවූ කෙවත් නිමන්මග සලසන්නාවූ මහාකොට දෙසනලද ධර්මය සිහි කරවි

ඉදින් නෛයර්‍යාණිකවූ මහාකොට දෙසනලද ධර්මය සිහි නොකරන්නාහු නම් එකල්හි පුණ්‍යක්ෂේත්‍රවූ උතුම්වූ අර්‍යාර්‍යපුද්ගල සංඝයා සිහිකරවි.

මහණෙනි, මෙසේ බුදුන් ද ධර්මය ද සංඝයා ද සිහිකරන්නාවූ නුඹලාට බියක් හෝ තැතිගැන්මෙක් හෝ රෝමෝද්ගමයෙක් හෝ නොවන්නේ ය.

ඛජ්ජනෙය පරිත්තසෙඛි සිංහලානුවාදය නිමි.

පළමුවන බණවර හි

දහම් විස්තර

දේවාසුර සංග්‍රාමයේ දී සක්දෙව්රජු විසින් තම දෙව්පිරිසට ආඥාකරනලද්දේ තමාගේ ධජාග්‍රය බලා සැනසෙන ලෙසට ය, එසේ නැතහොත් ප්‍රජාපති දෙවිරජහුගේ ධජාග්‍රය බලන ලෙසට ය, එසේත් නැතහොත් වරුණ හෝ ඊසාන දෙවිරජුන්ගේ ධජාග්‍රයන් බලන ලෙසට ය.

මොවුන්කොරෙහි ප්‍රධාන දිව්‍යපුත්‍රයා ශක්‍රදේවේන්ද්‍රයා ය. ප්‍රජාපති ඔහුගේ දෙවැන්නා ය. වරුණ තුන් වැන්නා ය. ඊසාන සතර වැන්නා ය.

දේවාසුර සංග්‍රාමය

අසුරභවනය පිහිටා තිබෙන්නේ මහමෙරව යටින් ය, එය යොදුන් දසදහසක් විශාල ය; තව්තිසා දෙව්ලොව ශක්‍රභවනය මෙන් බබලනසුලුය. තව්තිසාගෙහි පිහිටි පරසතුරුක මෙන් එහිදු 'මිත්‍රපාවලි' නම් වෘක්ෂයෙක් ඇත්තේ ය. එහි මිල් පිපෙනු දැක මේ අපගේ දිව්‍යලෝකය නොදෙයි. අප තව්තිසා දෙව්ලොව උපන් කල්හි එහි ඇති යම ඉසුරු සැප සම්පත් විඳිනා ලද්දේ ය. පරසතුරුක හා එහි යොදුන් සඟන්පැතුරුණු සුවඳ ඇති මල්ද දක්නා

ලද්දේය. මේ වෙන රැකොකි. වෙත මළෙකි. තව්තිසායෙහි විසූ ශක්‍රයා අප සුරාවෙන් මත්කොට මහාසමුද්‍රයට දම්මවා අපගේ දිව්‍යලෝකය පැහැරගත්තේ යයි සිතූ හ.

මේ කල අසුරයෝ තව්තිසායෙහි විසූහ. සක්දෙව් රජ ඔවුන් එයින් පලවා හැර තතියම තව්තිසා දෙව්ලොව අත්පත් කරගනු පිණිස අසුරයන්ව දිව්‍යසුරාව පොවා ඔවුන් එයින් මත්කොට මහ මේර පත්ලෙහි එලුබව සැබෑ ය.

අසුරයන් මහමේර යටටවූබව දතුයේ පලොල්ගස නිසා ය. අනික් යස ඉසුරු සැපයින් දැනගත නො හැකිවි ය. එහෙයින් අපි දෙවියන් හා යුද්කොට අපගේ දිව්‍යපුරය ගනුම්හ යි සිතා සක් දෙව් රජු හා යුද්ධයට සැරසුණේ ය දෙවිලන් හා අසුරයන් අතර දෙවාසුර සංග්‍රාමය සිදුවූයේ මේ අවස්ථාවේ ය.

මේ සංග්‍රාමය ඉතා විශාල ද භයානක ද විය. එහෙයින් වරක් අසුරයන් විසින් ශක්‍රයා බිය ගන්වනලදි. නැවත අනෙක් උපායකින් දෙවියෝ අසුරයන් මැඩ පවත්වා ශක්‍රපුරය නිදහස් කර ගත් හ එකල මරණභයින් බියපත්වූ අසුරයෝ අසුරභවනයට පලා ගියාහු ය.

අසුරයෝ වනාහි,දෙවියන් මෙන් නොඛබලන්නාහු නමුදු අදහස නමුදු නිර්ඝිත කම්මලින් අඩුවක් නැත්තාහු ය. මොවුහු ආදිම කල්පයෙහි තව්තිසායෙහි විසූ හෙයින් මොවුන්ට පුඛබදේව යයි කියනුලැබේ. ශක්‍රාදි දෙවියන් තව්තිසායෙහි පහළවූයේ ඉන් පසුවය. ඒ ආඛන්තුක දිව්‍යපුත්‍රයන් පිළිඹෙන ආඛන්තුක සත් කාර කොට ඔවුන් කෙරෙහි පැහැද අධිරාජ්‍යයෙන් ද පැවරූහ. අනික් අසීයත් තමා අයත්කර ගැනීමට සක්දෙව්රජුට සිතුණේ එයින් පසුව ය.

එතැන්පටන් දෙවියන්ට සතුරුවූ හෙයින් අසුරයන්ව සුරරිපු යයි කියනු ලැබේ. අසුරයන්ගේ ප්‍රධානයෝ මේ පිරිත් පොතෙහි ද නම් සඳහන් වන රාහු වෙපච්චිති පහාරාද යන තුන්දෙනායි.

"සක්කච්චං දානං අදාසීති සක්කෝ" යන නිර්වචන වශයෙන් සකස්ව දන් දුන් හෙයින් ශක්‍ර යයි කියනු ලැබේ. දෙවියන්ට ප්‍රධාන තුයි දෙවේන්ද්‍ර යයි ද, ශක්‍රවූයේත් මේ තෙමේ ය, දේවේන්ද්‍ර වූයේත් මෙතෙමේම යයි යන සමාසනාව වශයෙන් ශක්‍ර දේවේන්ද්‍ර යයි ද කියනු ලැබේ.

මොහුගේ ප්‍රධාන භාර්‍යාව "සුජා" නම් යයි ද, ඔහුගේ නුවර වල් "මඝකාසාර, වඝසඝාසාර, අමරාවතී යයි ද," ඔහුගේ ප්‍රාසාදය "වෛජයන්ත" යයි ද, ඔහුගේ රථවාහ්‍යයා "මාතලී" යයි ද, ඔහුගේ ඇතා "ඵෙරාවණ" යයි ද, ඔහුගේ ආසනය "පාණ්ඩුකම්බල ශෛලාසන" යයි ද, ඔහුගේ උයන් "නන්දන, මිස්සක, චිත්‍රලතා, ඵාරුසක" යන නම්වලින් ද, ඔහුගේ ආයුධය "වජ්‍ර" යයි ද, ඔහුගේ පුත්‍රයා "සුවීර" යයි ද, ඔහුගේ පොකුණ "නන්දා" යයි ද, කියනු ලැබේ.

ඔහුගේ රථය වනාහි දිගින් එකසිය පනස් යොදුනෙක. එහි සවිකර තිබෙන ධ්වජය උසින් තුන්සිය පනස් යොදුනෙක. කොඩිය සුළං බදන කල්හි පඤ්චාංගිකතූර්‍යනාදය මෙන් සිත් පිනවන සුලු ය. මේ කොඩිඅග බලා නිර්භය වන ලෙස හෙතෙම සෙසු දෙවියන්ට අණ දිණ.

මෙහිදී තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් වදාළේ ශක්‍රාදි දෙවියන්ගේ ධ්වජාග්‍රයන් බැලීමෙන් නිර්භීත ව නොසිටිය හැකි බව යි. එයට හේතුව නම්:- දේවේන්ද්‍රවූ ශක්‍ර තෙමේ දුරු නොකළ රාග, දෝෂ, මෝහ ඇත්තෙක, එහෙයින් බියවන සුලුය, තැතිගන්නා සුලුය, වෙහෙසින් කියවන සුලුය, අසුරයන් විසිනුදු පරදවනලද හෙයින් පැන ඇති ඇත්තෙක, යනුයි.

මහණෙනි, මෙහිදී මම නුඹලාට මෙසේ කියමි. වනගතවූ හෝ රුක්මූලකට ගියාවූ හෝ ජනයාහෙන් විවේක තැනකට ගියාවූ හෝ නුඹලාට කියමි, තැතිගැන්මක්, ලොම්දැහැගැන්මක් වේ නම් එකල "ඉතිපි සෝ භගවා අරහං" යන ආදි වශයෙන් මාගේ හෝ තැන හොත් "සඞ්ඝකම්මං භගවතා ධම්මෝ" යන ආදි වශයෙන් මාගේ ධර්මයෙහි හෝ ගුණ සිහිකරව්. එසේත් නැතහොත් "සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ" යනුවෙන් මාගේ සංඝයාගේ හෝ ගුණ සිහිකරව්. එසේ සිහිකරන්නාවූ නුඹලාට කියක් තැතිගැන්මක් ලොම්දැහැගැන්මක් නොවන බව යි.

භාග්‍යවතුන් වහන්සේ මේ ධ්වජාග්‍ර පරිත්‍රාණය මෙසේ වදාරා නැවත භාග්‍යවතුදු මේ අදහස ම වදාළසේක.

මේ ධ්වජාග්‍ර පරිත්‍රාණයෙහි ආනුභාව මහත්වය කෙළ ලඝුයක් සක්වළවල පවත්නේ ය. මෙය ආවර්ජිතා කොට නොහොත් මෙයින් පිරිත් කොට යක්ෂභය, වෛරභය, ආදි දුක්වලින් මිදුණවුන්ගේ

ගණන කෙළවරක් නැත. මේය පහන් සිතින් සලකන්නවුන්ට පොළොවෙහි පමණක් නොව අහසෙහි ද පිහිට ලැබෙයි.

දියවැඩි චෛත්‍යයෙහි සුනුපිරියම් කරන කල්හි එක් තරුණ භික්ෂූනමක් වේදිකාව මතවත් පලංචිය කැඩීමෙන් ලිස්සා මහපොළ ඇතුළට වැටුණේ ය. කිම ග්‍රහන් එක් භික්ෂූනමක් එය දැක ඇවැත්නි, ධජාග්‍ර පරිත්තය මතක්කරනු මැනවැ යි කිවේ ය. මරණභයින් තැතිගත් ඒ භික්ෂූනිය ධජාග්‍රපරිත්‍රාණය මා රකීවා! යි සැලකුවේ ය.

එ විගසම සැයතුළින් ගඩොලින් සැදුණු පියගැට පෙළක් මෙන් තරප්පුවක් මැවුණු කල්හි එයින් උඩට නැගුණු ඒ භික්ෂූව නැවත වැල්වලින් ගෙතුණු කූඩයකින් බිමට බැස්වි ය. අමුතුවෙන් මැවුණු පියගැට පෙළ ඉලමු තුබුණු අයුරු ම පිහිටියේ ය.

ධජාග්‍ර පරිත්‍රාණයෙහි දහම් විසඳුම නිමි.

සරණගමනය. දසසික්ඛාපදය, සාමණේර ප්‍රශ්නය, දුවත්තිංසාකාරය, ප්‍රත්‍යවේක්ෂණය, දශධර්මසූත්‍රය, මහාමංගලසූත්‍රය, රතනසූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය, ඛන්ධපරිත්තය, මෙත්තානිසංසසූත්‍රය, මිත්තානිසංස සූත්‍රය. මහාර පරිත්තය, චන්ද පරිත්තය, සූරිය පරිත්තය, ධජාග්‍ර පරිත්තය යන මේ සොළොස් (16) පිරිතින් යුත්

පළමුවන බණවර සි.

දුතියක භාණවාරං

මහාකස්සපත්ථේර බොජ්ඣඞ්ග සුත්තං

එවං මේ සුතං එකං සමයං භගවා, රාජගහෙ විහරති සීවථිවනෙ කලන්දකනිවාපෙ, තෙන ඛො පන සමයෙන, ආයස්මා මහාකස්සපො පිප්පලිගුහායං විහරති, ආබාධිකො දුක්ඛිතො බ්‍රූළ්හගිලානො.

අථ ඛො භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාකස්සපො තෙනුපසංකම්, උපසංකමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං මහාකස්සපං එතදවොච.

කච්චි තෙ කස්සප ඛමනීයං? කච්චි යාපනීයං; කච්චි දුක්ඛා වෙදනා, පටික්කමනති නො අභික්කමනති? පටික්කමනිමිත්තං පඤ්ඤායති නො අභික්කමනිමා?ති.

න මෙ භගවතා ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා, අභික්කමනති නො පටික්කමනති, අභික්කමනිමිත්තං පඤ්ඤායති නො පටික්කමනිමා ති.

සන්ති මෙ කස්සප බොජ්ඣඞ්ගා, මයං සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය, සම්බොධාය, නිබ්බානාය සංවත්තන්ති.

කතමෙ සත්ත?

සතිසම්බොජ්ඣඞ්ගෝ ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය, සම්බොධාය; නිබ්බානාය සංවත්තති.

ධම්මවිචය සම්බොජ්ඣඞ්ගෝ ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය, සම්බොධාය, නිබ්බානාය සංවත්තති.

විරියසම්බොජ්ඣඞ්ගෝ ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය, සම්බොධාය, නිබ්බානාය සංවත්තති.

පීතිසම්බොජ්ඣඞ්ගෝ ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය, නිබ්බානාය සංවත්තති.

පස්සද්ධිසම්බොජ්ඣඞ්ගෝ ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය, සම්බොධාය, නිබ්බානාය සංවත්තති.

සමාධි සම්බොජ්ඣඞ්ගෝ ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය, සම්බොධාය, නිබ්බානාය සංවත්තති

උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගෝ ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය, සම්බොධාය නිබ්බානාය සංවත්තා ති.

ඉමෙ ඛො කස්සප සත්තබොජ්ඣඞ්ගා, මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය, සම්බොධාය, නිබ්බානාය සංවත්තන්ති ති.

තස්ස භගවා බොජ්ඣඞ්ගා තස්ස සුගත බොජ්ඣඞ්ගා ති.

ඉදමවොච භගවා, අත්තමනෝ ආයස්මා මහාකස්සපෝ භගවතෝ භාසිතං අභිනන්දි.

වුට්ඨාහි වායස්මා මහාකස්සපෝ තම්හා ආබාධා, තථා පහීනෝ වායස්මතෝ මහාකස්සපස්ස සෝ ආබාධෝ අහොසි ති.

මහාසස්සපත්තෙර බොජ්ඣඞ්ගං නිට්ඨිතං

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රය මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සම්පයෙහි කලන්දකනිවාප නම්වූ වෙළුවන මහා විහාරයෙහි වැඩවසතසේක. එසමයෙහි ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිර තෙම පීඩිතව දුකව පත්ව දැඩි ගිලන් ව පිපථලිගුහාවහි වෙසසි,

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි ඵලසමවැරුන් කැඟිට ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ යම් තැනක වෙසේ ද එතැනට එළඹ පැනවූ අස්නෙක වැඩහුන්සේක. එසේ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මෙසේ වදළසේක.

කිමෙක් ද? කාශ්‍යපය, ඔබට ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? සෙවත් ඔබගේ ශරීරය පවත්වන්නට හැකි ද? කිම දුඃඛ වේදනාවෝ පිරිහෙත් ද? අඩු වෙත් ද? කිම දියුණු නොවෙත් ද? ඒ දුඃඛවේදනාවන්ගේ කෙළවරක් පෙනේ ද? වැඩීමක් නොපෙනේදැ යි මෙසේ විමාළසේක.

ඉක්බිති ගිලන්ව වැඩහුන් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සවාමීනි, මට ඉවසිය නොහැකි ය, සතර ඉරියවුවෙහි සිරුර පැවැත්විය නොහැකි ය, මාගේ දුඃඛවේදනාවෝ බලවත්හ. දියුණු වනු මිස අඩු නො වෙත්. වැඩි වනු මිස අඩුවක් නොපෙනේ යයි පිළිතුරු දුන් හ.

කාශ්‍යපය, මේ සප්තබොධ්‍යඞ්ග ධර්මයෝ මා විසින් මනාකොට කියනලදහ. වදහලදහ. නැවත නැවත පුරුදුකරන ලදහ. ඒ ධර්මයෝ චතුස්සත්‍යය ධර්මයන් විශිෂ්ටඥානයෙන් දැනගැනීම පිණිස චතුස්සත්‍යයාගේ මේ අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

ඒ සප්තබොධ්‍යඞ්ගයෝ කවරහුද යත්?

කාශ්‍යපය ස්මෘති සම්බොධ්‍යඞ්ගය මාමිසින් යහපත් කොට කියනු දි, වඩනලදි, නැවත නැවතත් පුරුදු කරනලදි. එය චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේම අවබොධය පිණිස නිවන් පිණිස පවතියි.

ධම්විචය සම්බොධ්‍යඞ්ගය, වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය, ප්‍රීති සම්බොධ්‍යඞ්ගය, ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය, සමාධි සම්බොධ්‍යඞ්ගය, උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය,

සෙස්ස පෙරසේමැයි.

කාශ්‍යපය, මේ සප්තබොධ්‍යඞ්ග ධර්මයෝ මා විසින් හොඳ හැටි කියනලදහ වැඩීම වශයෙන් පුරුදුකරන ලදහ. නැවත නැවතත් පුරුදුකරන ලදහ. ඒ සප්ත ධර්මයෝ විශිෂ්ටඥානය පිණිස, චතුස්සත්‍යාවබොධය පිණිස, නිවන් පිණිස, පවත්නාහ.

ඉක්බිති මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්ස, බොධ්‍යඞ්ග ධර්මයෝ නම් මැනව, බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් මැනව යි සැලකළහ.

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළසේක. එයට සතුටුවූ ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව පිළිගත්තේ ය.

ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරතෙම ඒ ලේඛෙන් නැගිට්ටේය ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ ඒ රෝගය නැවත නුපදනා පරිද්දෙන් නැති විය.

මහාකස්සපත්ථේර බොජ්ඣඞ්ගදේශි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

සප්ත බොජ්ඣඞ්ග ය

සප්ත යනු ධර්ම සතෙකි. එනම් සිහිය, නුවණ, වීර්‍ය්‍ය, ප්‍රීතිය, සන්සුන්ගතිය, එකඟකම්, මැදහත්කම් යන මොහුයි. මොවුහු කෙලෙසුන් මැඩ පැවැත්වීමෙහි ලා පූර්භාග ප්‍රතිපදා වශයෙන් ලෞකික සිත්වල ද, කෙලෙසුන් සහ මුලින්ම නැතිකිරීමෙහි ලා ලොකොත්තර සිත්වල ද උපදනා චෛතසික ධර්මයෝ යි.

මේ චෛතසික ධර්මයන් සුදුසු අන්දමට යෙදීම හේතුවකාව ගෙන ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම කෙලෙසුන් දුරු කෙරෙයි; චතුස්සත්‍යාව බොධය කෙරෙයි; නිවන ප්‍රත්‍යක්ෂ කෙරෙයි. සතරමඟ සතරඵල

නිර්‍වාණ සංඛ්‍යාත බෝධියෙහි හෙවත් ඵලඥානයෙහි අවයව වන හෙයින් බොජ්ඣඞ්ග නම් වෙත්.

නිවත්මහට පිළිපන් ආර්‍ය්‍යශ්‍රාවකයාගේ සිතහි පහළවන සමාහි චෛතසිකයම හෙවත් සිහියම ප්‍රශස්තවූ ඉහපත්වූ බෝධ්‍ය ඞ්ගයක් වන හෙයින් සතිසම්බොජ්ඣඞ්ග නමැයි කියනු ලැබේ. හෙ වනාහි මේ සතර සතිපට්ඨාන ය, මේ සතර සම්‍යක් ප්‍රධානය, යන ආදි වශයෙන් ඒ ඒ බෝධිපාක්ෂික ධර්‍මයන් වටහා ගැනීම හෝ හොත් වෙන්කර ගැනීම ලක්ෂණ කොට හෙවත් සවභාව කොට ඇත්තේය.

එසේම ප්‍රඥා චෛතසිකය හෙවත් නුවණ ධර්‍මවිචය සම්බොජ්ඣඞ්ග නම් වේ. හෙ වනාහි සිහියෙන් අරමුණු කරගත් ඒ ධර්‍මයන් නුවණින් විමසාබැලීම ලක්ෂණ කොට ඇත්තේ ය.

එසේම වීර්‍ය්‍ය චෛතසිකය හෙවත් කය පිළිබඳවූත් සිත පිළිබඳවූත් වීර්‍යය විරිය සම්බොජ්ඣඞ්ග නම්වේ. හත් අරමුණ තදින් අල්වාගැනීම එහි ලක්ෂණය වේ.

එසේම සිත පිනවන ප්‍රීති චෛතසිකය පීතිසම්බොජ්ඣඞ්ග නම් වේ. පැතිරීම එහි ලක්ෂණය වේ.

එසේම කය සිත දෙක්හි සන්හුන් ගතිය හි සලකනුලබන ප්‍රශ්‍රබ්ධි චෛතසිකය පස්සද්ධි සම්බොජ්ඣඞ්ග නම් වේ. සන්සිඳුවීම එහි ලක්ෂණය වේ.

එසේම එකාග්‍රතා නම්වූ චෛතසිකය හෙවත් එක් අර මුණෙක්හි සිත නවත්වාගැනීම සමාධිසම්බොජ්ඣඞ්ග නම් වේ. නො කැලඹීම එහි ලක්ෂණය වේ.

එසේම මැදහත් ගතිය නම්වූ උපෙක්ෂාචෛතසිකය උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග නම් වේ. සර්‍ව සංස්කාරයන් කෙරෙහි ඇල්මක් හෝ නොඇල්මක් හෝ නැති තත්වය එහි ලක්ෂණය වේ.

මේ සප්තබෝධ්‍යඞ්ග ධර්‍මයෝ ලෞකික ලොකොත්තර වශ යෙන් දෙවැදෑරුම් වෙති හි සැලකිය යුතු හි.

මෙහි ලෞකික බෝධ්‍යඞ්ගයෝ කවරහුද යත්?:

මෙ සස්නෙහි ගම් යෝගාවචරයෙක් සිහියෙන් යුක්ත වේ ද, උතුම්වූ සිහි නුවණ දෙකෙන්ම යුක්තවේ ද, තමා විසින් බොහෝ කලකට පෙර කී කළ දෙය පවා මතක නිබෙන තරම්

ප්‍රබල සිහිසකින් යුක්තවේ ද, එසෙයින්ම රූපා රූප ධර්මයන් මේ මේ යයි වෙන් වෙන් වශයෙන් අරමුණු කොට සිහි කරන්නට සමර්ථ වේ ද, මෙසේ මාගීඵලයන් උපදවා දීමේහි ශක්තිය ඇති විදශීනා සම්ප්‍රයුක්ත ස්මෘතීන්ද්‍රිය ස්මෘති සම්බොධ්‍යඞ්ග නම් වේ.

මෙබඳු සිහියෙන් යුත් ඒ යෝගාවචර තෙම් ඒ අරමුණු කර ඇත් නාම රූප ධර්මයන් අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් තුවණින් සැලකීමට සමර්ථ වේ ද, මාගී ඵල සංඛ්‍යාත සම්බෝධි ධර්මයන් උපද වන ඔහුගේ විදශීනා ප්‍රඥව ධර්මවිචය සම්බොධ්‍යඞ්ග නම් වේ.

ඒ නාමරූප ධර්මයන් අරමුණු කරගැන්මේහි හා තුවණින් සැලකීමෙහි ද ලිහිල් නොකරගත් හුවාගත් බෑධිපාක්ෂික විදශීනා සම්ප්‍රයුක්ත වීර්‍යය වීර්‍යසම්බොධ්‍යඞ්ග නම් වේ.

කාම වශයෙන් හෝ ලෝක විශයෙන් හෝ සංසාර වශ යෙන් හෝ කිසිම බැඳීමක් නැති නිවන කෙරෙහි නැඹුරුව පැවති විදශීනා සම්ප්‍රයුක්ත පිරිසිදු ප්‍රීතිය ප්‍රීතිසම්බොධ්‍යඞ්ග නම් වේ.

මෙසේ බොධ්‍යඞ්ග කුශල ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ වේදනා සංඥ සංස්කාර සංඛ්‍යාත නාමකයත් විඥානස්කන්ධ සං ඛ්‍යාත සිතක් යන සතර අරූපකන්ධයන් පිළිබඳව පැවති කෙලඹද රථය හෙවත් කෙලෙසුන් නිසා ඇතිවන විඩාව හෙවත් වෙහස දුරුකරන නිවන කෙරෙහි නැමුණු විදශීනා සම්ප්‍රයුක්ත ප්‍රඥාඉන්ද්‍රිය හෙවත් කෙලෙසුන් කෙරෙන් සන්හුන් ගතිය ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග නම් වේ.

මෙසේ සන්හුන් නාමකය ඇති බැවින් ඇතිවූ චිත්ත සැප යෙන් සුඛිතවූ ඔහුගේ සිත ධ්‍යානඵලට සම්මන්ත්‍රෝගාවචරයකුගේ සිතක් මෙන නිශ්චලව එක අරමුණක නොඇති වේ නම් ඒ නිවන් කෙරෙහි නැමුණු විදශීනා සම්ප්‍රයුක්ත සමාධිය හෙවත් එකඟබව සමාධි සම්බොධ්‍යඞ්ග නම් වේ.

එසේ සමාහිතවූ ඔහුගේ සිත ඒ යට කියනලද සවැදෑරුම් සංස්කාර ආදි බොධ්‍යඞ්ග ධර්මයන් කෙරෙහි තදින් බැස ගැන්මක්වත් එසේම ඒ බොධ්‍යඞ්ග ධර්මයන් කෙරෙන් තදින්ම වෙන් වීමක්වත් නැතිව පවතී නම් නිවනට අවතතවූ විදශීනාවේ හා සම්බන්ධවූ ඒ මධ්‍යස්ථ ගතිය උපේක්ෂා සම්බොධ්‍යඞ්ග යයි කියනු ලැබේ.

මේ සප්ත බොධ්‍යඞ්ගයන්ගේ ලෞකික අවස්ථාව වේ.

ශ්‍රෝතාපත්ත්‍යාදි ලෝකොත්තර මාගී චිත්ත වීථියෙහි යෙදුණු එම මාගීයන්ගේ අවයවයන්වූ ඔවුන්ව ඇතුළත්වූ සති ධම්මවිචය

ආදි සපත්ත චෛතසිකයෝ ලෝකෝත්තර බොධ්‍යඞ්ග නම් වෙති සි දතයුතු.

කුමක් හෙයින් නොඅඩුවත් නොවැඩිදත් බොධ්‍යඞ්ග ධර්‍ම සතක් ම වදළසේක්ද යත්? සිත පිළිබඳ ලීනය උද්ධච්චය හෙවත් මැලිකමය, ඇවිස්සීමය යන මේ අවස්ථා දෙකට ප්‍රතිපක්ෂ හෙවත් විරුද්ධ වශයෙන් හා සැමතැනටම ප්‍රයෝජනවත්ව යොදාගත යුතු ධර්‍මයක් ද ඇතුළත් විය යුතු හෙයිනි.

හේ කෙසේ ද යත්?

යෝගීහුගේ සිතෙහි මැලිකමක් ඇති වී නම් එකල ඔහු ධම්මවිචය විරිය පීති යන බොධ්‍යඞ්ග තුනෙන් එකක් වැඩිය යුතුය. නොසන්හුන් භතියක් වී නම් එකල පස්සද්ධි සමාධි උපෙක්ඛා යන තුනෙන් එකක් වැඩිය යුතුයි. එසේකල ලීනය හා උද්ධච්ච යන් දුරුව බොධ්‍යඞ්ග ධර්‍මයන් නිවනට ළංවන සේ කෙලෙසුන් දුරුවන සේ භාවනා වශයෙන් පුරුදු පුහුණු කළ හැකිය.

ව්‍යඤ්ජනාදියක් රසවත් කිරීමෙහි ලුණු දැමීම් හා තෙල් ඉසු කිරීමක් භෙවත් තෙම්පරාදුකිරීමක් මෙන්දැයිය ලු රාජකෘත්‍යයන්හි අශ්‍රාව්‍යවරයා මෙන් ද සෙසු සියලු ධම්මවිචය ආදි සවැදෑරුම් බොධ්‍යඞ්ග ධර්‍ම විෂයෙහි සතිසම්බොජ්ඣඞ්ගය ප්‍රධාන වන හෙයින් පළමුකොට වදාළේ ය.

මහාකාශ්‍යපස්ථවිර බොධ්‍යඞ්ග පරිත්‍රාණයෙහි
දහම් විසඳාදරණ නිමි.

මහාමොග්ගල්ලානස්ථවිර බොජ්ඣඞ්ග සූත්‍රය

එවං මේ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වේළුවනෙ කලන්දකනිවාපෙ, තෙන ඛෝ පන සමයෙන ආයස්මා මහා මොග්ගල්ලානෝ ගිජ්ඣකූටෙ පබ්බතෙ විහරති ආබාධිකෝ දුක්ඛිතෝ බාළ්හගිලානෝ,

අථඛෝ භගවා සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතෝ යෙනායස්මා මහා මොග්ගල්ලානෝ තෙනුපසංකම්, උපසංකම්ත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, නිසජ්ජ ඛෝ භගවා ආයස්මන්තං මහා මොග්ගල්ලානං එතදවොච

කච්චි තෙ මොග්ගල්ලාන ඛමනීයං, කච්චි යාපනීයං කච්චි දුක්ඛා වෙදනා, පටික්කමනන්ති නෝ අභික්කමනන්ති, පටික්කමෙ සාසනං පඤ්ඤායති නෝ අභික්කමෙ ති,

න මේ හඤ්ඤති ඛමනීයං න යාපනීයං බාල්හා මේ දුක්ඛා වේදනා, අභික්කමන්ති නෝ පටික්කමන්ති, අභික්කමේවාහං පඤ්ඤායති නෝ පටික්කමෝ ති.

සාහිඤ්ඤ මොග්ගල්ලාන බොජ්ඣඞ්ගා, මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. කතමේ සත්ත?

සති සම්බොජ්ඣඞ්ගෝ ඛෝ මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

ධම්මවිචය සම්බොජ්ඣඞ්ගෝ ඛෝ මොග්ගල්ලාන
—පෙ— සංවත්තති.

විරිය සම්බොජ්ඣඞ්ගෝ ඛෝ මොග්ගල්ලාන
—පෙ— සංවත්තති.

පීති සම්බොජ්ඣඞ්ගෝ ඛෝ මොග්ගල්ලාන
—පෙ— සංවත්තති.

පස්සද්ධි සම්බොජ්ඣඞ්ගෝ ඛෝ මොග්ගල්ලාන
—පෙ— සංවත්තති.

සමාධි සම්බොජ්ඣඞ්ගෝ ඛෝ මොග්ගල්ලාන
—පෙ— සංවත්තති.

උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගෝ ඛෝ මොග්ගල්ලාන
—පෙ— සංවත්තති.

ඉමේ ඛෝ මොග්ගල්ලාන සත්ත බොජ්ඣඞ්ගා, මයා සම්මදක්ඛාතා, භාවිතා, බහුලීකතා, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

තඤ්ච භගව බොජ්ඣඞ්ගා, තඤ්ච සුගත බොජ්ඣඞ්ගා ති.

ඉදමවොච භගවා අත්තමනෝ ආයස්මා මහාමොග්ගල්ලානෝ භගවතෝ භාසිතං අභිනන්දි.

වුට්ඨාහි ච ආයස්මා මහාමොග්ගල්ලානෝ තම්හා ආබාධා, තථා පහීනෝ චායස්මතෝ මහාමොග්ගල්ලානස්ස අහු ආබාධෝ අභවා සී ති.

මහා මොග්ගල්ලානත්ථේර බොජ්ඣඞ්ග සූත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රය මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කලන්දක නිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එ සමයෙහි වනාහි ආයුෂ්මත් මහ මුගලන් සථවිරතෙම හඩගත් ආබාධ ඇත්තේ හවගත් දුක් ඇත්තේ දැඩි ගිලන්වූයේ හෙවත් බලවත් රෝදුකින් යුක්තවූයේ හිඳුකුළුපවු වෙහෙරෙහි වෙසෙයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵලසමාපත්‍තියෙන් නැඟිසේක් ආයුෂ්මත් මහාමොග්ගල්ලාන සථවිරයන් යම් තැනෙක්හි ද එතැනට එළඹිසේක. එළඹ පැනවූ අස්නෙහි වැඩහුන් සේක. එසේ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන සථවිරයන්ට මෙසේ දැසුළසේක.

කිම මෞද්ගල්‍යායනය සැප ද? කිම ඉරයවූ පවත්නේ ද? කිම දුඃඛ වේදනාවෝ දුරුවෙත් ද? නො නැඟෙත් ද? බස්නැමඟ පෙනේ ද? නැඟෙන මඟ නො පෙනේ ද?

සවාමීනි මවිසින් ඉවසාගත නො හැක්කේ ය. නොහොත් මට ඉවසිය නොහැක්කේ ය, මාහට දුඃඛවේදනාවෝ බලවත්හ. (ඔවුහු) දියුණුවෙත්. අඩු නොවෙත්. වැඩිවත මඟ පෙනෙනු මිස අඩුවත මඟක් නො පෙනෙයි.

මෞද්ගල්‍යායනය, මේ සප්තබොධ්‍යඞග ධර්මයෝ මා විසින් මොනවට කියනලදහ. වඩනලදහ. නැවත නැවතත් වඩන ලදහ. ඔවුහු විශිෂට ඥනයෙන් දැනීම පිණිස සම්‍යක් සම්බොධිය පිණිස නිවන් පිණිස පවතිත්

ඒ සත කවරහුද යත්:?

මෞද්ගල්‍යායනය, සතිසම්බොජ්ඣඞගය මා විසින් මනාව කියනලදි. වඩනලදි. නැවත නැවතත් පුරුදු කරනලදි. එය දැනීම පිණිස මනාව දැනීම පිණිස නිවන් පිණිස පවත්නේ ය.

මෞද්ගල්‍යායනය, ධම්මවිචය සම්බොජ්ඣඞගය, විරිය සම්බොජ්ඣඞගය, පීතිසම්බොජ්ඣඞගය, පස්සද්ධි සම්බොජ්ඣඞගය, සමාධි සම්බොජ්ඣඞගය, උපෙක්ඛා සම්බොජ්ඣඞගය, සෙස්ස පළමු සේමය.

මෞද්ගල්‍යායනය, මේ බොජ්ඣඞග සත මා විසින් මනාව කියනලදහ. වඩනලදහ. නැවත නැවතත් පුරුදු කරනලදහ,

ඔව්හු යහපත් දැනීම පිණිස මනා අවබොධය පිණිස නිවන් පිණිස පවතිත්.

භාග්‍යවතුන්වහන්ස, බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් සත්‍යය හ. සුගතයන්වහන්ස, බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් සත්‍යය හ යනු යි.

භාග්‍යවතුන්වහන්සේ මේ දේශනාව වදළසේක. සතුටු වූ ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන සථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තේ ය.

ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන සථවිරතෙම ඒ ලෙසින් නැගිට්වේ ය. ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන සථවිරයන් වහන්සේගේ ඒ රෝගය එයින් ම දුරුවිය.

මහා මෞද්ගල්‍යායන සථවිර බොධ්‍යඞ්ගයෙහි සිංහලානුවාදය නිමි.

මහා චුන්දස්ථවිර බොජ්ඣඞ්ග සූත්‍රය

එවං මෙසුතං එකංසමයං භගවා රාජගහෙ විහරති වේළුවනෙ කලන්දකනිවාපෙ, තෙන ඛො පන සමයෙන භගවා ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානෙ.

අථ ඛො ආයස්මා මහාචුන්දො සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසංකම්, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මහාචුන්දං භගවා එතදවොච.

පටිහනතු තං චුන්ද බොජ්ඣඞ්ගා ති.
සන්ති මෙ භන්තෙ බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

කතමෙ සත්ත?

සත්තිමෙ බොජ්ඣඞ්ගා ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

ධම්මවිචය සම්බොජ්ඣඞ්ගෝ මෙ හනෙත
—පෙ— සංවත්තත ති.
විරිය සම්බොජ්ඣඞ්ගෝ මෙ හනෙත
—පෙ— සංවත්තත ති.
පීති සම්බොජ්ඣඞ්ගෝ මෙ හනෙත
—පෙ— සංවත්තත ති.
පස්සද්ධි සම්බොජ්ඣඞ්ගෝ මෙ හනෙත
—පෙ— සංවත්තත ති.
සමාධි සම්බොජ්ඣඞ්ගෝ මෙ හනෙත
—පෙ— සංවත්තත ති.
උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගෝ මෙ හනෙත
—පෙ— සංවත්තත ති.

ඉමෙ මෙ හනෙත සත්ත බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තනති.

තස්ස චුන්ද මෙ බොජ්ඣඞ්ගා, තස්ස චුන්ද මෙ බොජ්ඣඞ්ගා ති.

ඉදමවොචායස්මා මහාචුන්දෝ සමනුඤ්ඤුං සත්ථා අහොසි, වුට්ඨාහි ච භගවා තමහා ආබාධා, තථා පහීනෝ ච භගවතා සෝ ආබාධෝ අහොසි ති.

මහාචුන්දත්ථෙර බොජ්ඣඞ්ග සුත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රය මෙසේ අසනලදි. එක් සමයෙක්හි භාග්‍ය වතුන් වහන්සේ රජගහ නුවර ආසුරු කොට වේළුවන විහාරයෙහි වැඩි වසනසේක එකල්හිභාග්‍යවත් තෙම ගිලන් විය. දුඃඛිත වූ බලවත් ගිලන්බවට පැමිණියේය.

ඉක්බිති ආයුෂ්මත් මහාචුන්ද සථවිර තෙම සවස් භාගයෙහි එල සමවත් සුවෙනි හැඟිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනක නම් එතනට වැඩියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැද එකත් පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් මහාචුන්ද සථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

චුන්දය, ඔබට බොධ්‍යඞ්ග ධර්මයෝ වැටහෙත්වා නොහොත් සැලකෙත්වා යනුයි.

සවාමිනි භාග්‍යවතුන් වහන්ස, මේ සප්ත බොධ්‍යඞග ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට වදරතලදහ. වඩන ලදහ. නැවත නැවතත් පුරුදු කරතලදහ. ඔවුහු විශිෂ්ටඥතය පිණිස සම්‍යක්සම්බොධිය පිණිස නිවන් පිණිස පවසිත්.

මේ කවර සතක් දයත්?

සවාමිනි, සතිසම්බොජ්ඣඞගය භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳහැටි වදරන ලද්දේය, වඩන ලද්දේය, නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. එය මතාව දනිම පිණිස යහපත් අවබොධය පිණිස නිවන් පිණිස පවතියි. ධම්මවිචය සම්බොජ්ඣඞගය, විරිය සම්බොජ්ඣඞගය, පිතිසම්බොජ්ඣඞගය, පස්සද්ධි සම්බොජ්ඣඞගය, සමාධි සම්බොජ්ඣඞගය, උපෙක්ඛා සම්බොජ්ඣඞගය යනුයි. සෙස්ස පෙරසේ මැයි.

සවාමිනී, මේ සප්තබොධ්‍යඞගයෝ භාග්‍යවත්හු විසින් හොඳහැටි දෙසන ලද්දාහුය. වඩන ලද්දාහුය. නැවත නැවතත් වඩන ලද්දාහුය. ඔවුහු යහපත් දනීම පිණිස සම්‍යක්සම්බොධිය පිණිස නිවන් පිණිස පවත්වාහ.

චුන්දය, බොධ්‍යඞග ධර්මයෝ ඒකාන්තයෙන්ම සැබව, චුන්දය, බොධ්‍යඞග ධර්මයෝ ඒකාන්තයෙන් මේ සත්‍යය්හ යනුයි.

ආයුෂ්මත් චුන්ද මහරහතන් වහන්සේ මේ ධර්මය ප්‍රකාශ කළසේක. භාග්‍යවතුන් වහන්සේ එය සතුටින් පිළිගත්හ. භාග්‍යවත් තෙම ඒ ලෙඩෙන් නැංගේය භාග්‍යවතුන් වහන්සේගේ ඒ රෝහාබාධය එයින් ම සුවවිය.

මහා බුදුපියාණන් බොජ්ඣඞගයෙහි සිංහලානුවාදය නිමි.

ගිරිමානන්ද සුත්තං

එවං මේ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තෙන ඛෝ පන සමයෙන ආයස්මා ගිරිමානන්දො ආබාධිකෝ හොති දුක්ඛිතෝ බාළ්හගිලානෙ.

අථඛෝ ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නෝ ඛෝ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

ආයස්මා ඛෙතෝ ගිරිමානන්දෝ ආබාධිකෝ දුක්ඛිතෝ බාළ්හ ගිලානෝ, සාධු භන්තෝ භගවා යේනායස්මා ගිරිමානන්දෝ තේනුප සංකමතු අනුකම්පං උපාදාය ති.

සචේ ඛෝ පන ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනෝ උපසං කමිත්වා දසසඤ්ඤා භාසෙය්‍යාසි. ඨානං ඛෝ පනේතං විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනෝ දසසඤ්ඤා සුත්වා සෝ ආබාධෝ ඨානසෝ පටිප්පස්සම්භෙය්‍ය.

කතමේ දස?

අනිච්ච සඤ්ඤා, අනත්තා සඤ්ඤා, අසුභ සඤ්ඤා, ආදීනව සඤ්ඤා පහානසඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා, සබ්බලෝකෙ අන භිරතසඤ්ඤා, සබ්බසංඛාරෙසු අනිච්චසඤ්ඤා, ආනාපානසති.

කතමා චානන්ද අනිච්චසඤ්ඤා?

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉති පටිසංචික්ඛති. රූපං අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සංඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්ච නති. ඉති ඉමේසු පඤ්චුපාදානක්ඛන්ධෙසු අනිච්චානුපස්සී විහරති.

අයං වුච්චතානන්ද අනිච්චසඤ්ඤා

කතමා චානන්ද අනත්තසඤ්ඤා?

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤා ගාරගතෝ වා ඉති පටිසංචික්ඛති. චක්ඛුං අනත්තා, රූපං අනත්තා, සොතං අනත්තා, සද්දා අනත්තා; ඝාණං අනත්තා, ගන්ධා අනත්තා; ජිව්හා අනත්තා, රසා අනත්තා, කායෝ අනත්තා, ඵොට්ඨබ්බා අනත්තා, මනෝ අනත්තා, ධම්මා අනත්තා ති.

ඉති ඉමෙසු ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු අනත්තානු පස්සී විහරති.

අයං වුච්චතානන්ද අනත්තසඤ්ඤා

කතමා චානන්ද අසුභ සඤ්ඤා?

ඉධානන්ද භික්ඛු ඉමමේව කායං උද්ධං පාදතලා අධෝ කෙස මත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනෝ පච්ච වෙක්ඛති.

අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචෝ, මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං, හදයං යකනං කිලොමකං

පිඟකං පපඨාසං, අන්නං අන්නගුණං උදරියං කරිසං, පිත්තං සෙම්හං පුබ්බා ලෝහිතං සෙදෝ මේදෝ, අස්සූ වසා ඛේළා සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති

ඉති ඉමස්මිං කායෙ අසුභානුපස්සී විහරති අයං වුච්චතානන්ද අසුභසඤ්ඤා

කතමා චානන්ද ආදීනවසඤ්ඤා?

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසංචික්ඛති, බහුදුක්ඛා ඛෝ අයං කායෝ බහු ආදීනවෝ, ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා උප්පජ්ජන්ති සෙය්‍යථිදං? චක්ඛුරෝගෝ, සෝතරෝගෝ, ඝානරෝගෝ, ජිව්හාරෝගෝ, කායරෝගෝ, සීසරෝගෝ, කණ්ණරෝගෝ, මුඛරෝගෝ, දන්තරෝගෝ, කාසෝ, සාසෝ, පිනාසෝ, ඩහෝ, ජරෝ, කුච්ඡිරෝගෝ, මුච්ඡා, පක්ඛන්දිකා, සූලා, විසූචිකා, කුට්ඨං, ගණ්ඩෝ, කිලාසෝ, සෝසෝ, අපමාරෝ, දද්දු, කණ්ඩු, කච්ඡු, රඛසා, විත චිජිකා, ලෝහිතපිත්තං, මධුමේහෝ, අංසා, පිළකා, භගන්දලා,

පිත්තසමුට්ඨානා ආබාධා, සෙම්හසමුට්ඨානා ආබාධා, වාතසමුට්ඨානා ආබාධා, සන්නිපාතිකා ආබාධා, උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා, ඔපක්කමිකා ආබාධා, කම්මවිපාකජා ආබාධා සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරෝ පස්සාවෝ ති, ඉති ඉමස්මිං කායෙ අදීනවානුපස්සී විහරති.

අයං වුච්චතානන්ද ආදීනවසඤ්ඤා,

කතමා චානන්ද පහානසඤ්ඤා?

ඉධානන්ද භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තිකරොති අනභාවං ගමෙති; උප්පන්නං බ්‍යාපාදවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තිකරොති අනභාවං ගමෙති; උප්පන්නං විහිංසාවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තිකරොති අනභාවං ගමෙති; උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තිකරොති අනභාවං ගමෙති.

අයං වුච්චතානන්ද පහානසඤ්ඤා,

කතමා චානන්ද විරාගසඤ්ඤා?

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසංචික්ඛති, එතං සන්තං එතං පණීතං යදිදං

සබ්බසංඛාරසමථෝ සබ්බූපධිපටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ විරාගෝ නිබ්බානන්ති.

අයං වුච්චතානන්ද නිරෝධසච්චං

කතමාචානන්ද සබ්බලෝකෙ අනභිරතා සච්චං?

ඉධානන්ද, භික්ඛු යෙ ලොකෙ උපාදුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා තෙ පජහනෙනා විරමති න උපාදියනෙනා.

අයං වුච්චතානන්ද, සබ්බලෝකෙ අනභිරතසච්චං

කතමාචානන්ද සබ්බසංඛාරෙසු අනිච්චසච්චං?

ඉධානන්ද, භික්ඛු සබ්බසංඛාරෙහි අට්ටියති හරායති ජිගුච්ඡති.

අයං වුච්චතානන්ද, සබ්බසංඛාරෙසු අනිච්චසච්චං

කතමාචානන්ද ආනාපානසති?

ඉධානන්ද, භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා,

සෝ සතොව අස්සසති සතා පස්සසති. දීඝං වා අස්සසන්තා දීඝං අස්සසාමීති පජානාති. දීඝං වා පස්සසන්තා දීඝං පස්සසාමීති පජානාති, රස්සං වා අස්සසන්තා රස්සං අස්සසාමීති පජානාති. රස්සං වා පස්සසන්තා රස්සං පස්සසාමීති පජානාති. සබ්බකායප්පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සබ්බකායප්පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. චිත්තසංඛාර පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තසංඛාර පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. අභිපමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. අභිපමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. අනිච්චානුපස්සී පස්සසිස්සාමීති

සිකඛති. විරාගානුපස්සී අස්සසිස්සාමීති සිකඛති. විරාගානුපස්සී පස්සසිස්සාමීති සිකඛති. නිරොධානුපස්සී අස්සසිස්සාමීති සිකඛති. නිරොධානුපස්සී පස්සසිස්සාමීති සිකඛති. පටිනිස්සඝානුපස්සී අස්සසිස්සාමීති සිකඛති. පටිනිස්සඝානුපස්සී පස්සසිස්සාමීති සිකඛති.

අයං වුච්චතානන්ද ආනාපානසති.

සචෙ ඛො තුවං ආනන්ද, ගිරිමානන්දස්ස භික්ඛුනො උපසංකමිත්වා ඉමා දසසඤ්ඤා භාසෙය්යාසි. ඨානං ඛො පනෙතං විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනො ඉමා දසසඤ්ඤා සුත්වා සෙො ආබාධො ඨානසො පටිපස්සම්භෙය්‍ය.

අථඛො ආයස්මා ආනන්දො භගවතො සන්තිකෙ ඉමා දස සඤ්ඤා උග්ගහෙත්වා යෙනායස්මා ගිරිමානන්දො තෙනුපසංකමි උපසංකමිත්වා ආයස්මතො ගිරිමානන්දස්ස ඉමා දසසඤ්ඤා අභාසි.

අථඛො ආයස්මතො ගිරිමානන්දස්ස ඉමා දසසඤ්ඤා සුත්වා සෙො ආබාධො ඨානසො පටිපස්සම්භි. වුට්ඨාහි චායස්මා ගිරිමානන්දො තස්මා අබාධා, තථා පහීනො ච පනායස්මතො ගිරිමානන්දස්ස සෙො ආබාධො අහොසීති.

ගිරිමානන්ද සුත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මෙසේ මා විසින් අසනලදි. තොතොත් මාගේ ඇසිම මෙසේ ය. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීප යෙහි ජේතවන නම්වූ අනේපිඬුමහසිටුතුමාගේ ආරාමයෙහි වැඩ වසනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් ගිරිමානන්ද සථවිරතෙම ලෙඩ විය; දුකට පත්විය; දැඩි ගිලන් විය.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද සථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද සථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කෙළේ ය.

සවාමීනි භාග්‍යවතුන් වහන්ස, ආයුෂ්මත් ගිරිමානන්ද සථවිර තෙම ලෙඩවූයේ දුකට පත් වූයේ දැඩි ගිලන්වූයේ වෙතැයි. 'වහන්ස, ගිරිමානන්ද සථවිරතෙම යම් තැනකා සවසේ ද උන්වහන්සේට කරුණ පිණිස එතැනට එළඹෙනසේක් නම් මැනවැ'යි සැල කෙළේ ය.

ආනන්දය මේදින් භික්ෂූව වෙත එළඹ දශ සංඥා විධි කියන්නෙහි මේ නම් එය අසා ඒ ලෙඩ මහා සන්සිඳෙන්නේ ය. එය ඒ රෝගය සන්සිඳීමට හේතු වූ කාරණයක් ද වන්නේ ය.

කවර දසයෙක් ද යත්?

අනිත්‍ය සංඥාය, අනාත්ම සංඥාය, අසුභ සංඥාය, ආදීනව සංඥාය, ප්‍රහාණ සංඥාය, විරාග සංඥාය, නිරෝධ සංඥාය, සියලු ලෝකයෙහි කලකිරීම් සහගත සංඥාය, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥාය, ආනාපාන සතිය යනුයි.

ආනන්දය, අනිත්‍ය සංඥා තොමෝ කවරි ද?

ආනන්දය, මේ සස්නෙහි මහණෙක් වනයට හිඳේ හෝ රුකක් මූලකට හිඳේ හෝ හිස් ගෙයකට හිඳේ හෝ මෙසේ නුවණින් සලකයි. රූපස්කන්ධය අනිත්‍යය, වේදනා සංඥා සංස්කාර විඤ්ඤාණස්කන්ධ අනිත්‍යය, මෙසේ මේ පස් උපාදාන ස්කන්ධයන්හි අනිත් ලකුණු බලමින් වෙසෙයි. ආනන්දය, මේ අනිත්‍යසංඥාය යි කියනු ලැබේ.

ආනන්දය, අනාත්ම සංඥාව කවරි ද?

ආනන්දය, මේසස්නෙහි භික්ෂුතෙම වනයට හිඳේ හෝ ගසක් මූලට හිඳේ හෝ හිස්ගේකට හිඳේ හෝ මෙසේ නුවණින් සිතයි. චක්ඛු අනාත්මය, රූපය අනාත්මය, කන අනාත්මය, ශබ්දයෝ අනාත්මයහ, නාසය අනාත්මය, ගඳයෝ අනාත්මයහ, දිව අනාත්මය, රසයෝ අනාත්මයහ, ශරීරය අනාත්මය, ස්පර්ශයෝ අනාත්මයහ, සිත අනාත්මය, සිත්හි උපදනා ධර්මයෝ අනාත්මයහ යනුයි.

මෙසේ මේ ආධ්‍යාත්මික බාහිර ආයතනයන් කෙරෙහි අනාත්ම වශයෙන් සලකමින් වෙසේ ද, ආනන්දය, මේ අනාත්මසංඥා යයි කියනු ලැබේ.

ආනන්දය, අසුභසංඥා කවරිද යත්?

ආනන්දය, මෙසස්නෙහි මහණෙක් පත්ලෙන් උඩ කෙසගින් යට සිවියෙන් වට වූ නානාප්‍රකාර අසුචියෙන් පිරුණු මේ ශරීරය නුවණින් සලකයි.

මේ ශරීරයෙහි කෙස් ලොම් නියපොත්තු දත් සම් මස් නහර ඇට ඇටමිදුලු වකුගඩු හදමස් අක්මා දලබු බඩදිව් පපු අතුණු අතුණු බඩන් අමු අහර හා පැසුණු අහර මිත් සෙම් පුයා ලේ ඛඩදිය

මේදස්තෙල කඳුලු වුරුණුතෙල මකළ මුකුණු සඳහිදුලු මූත්‍ර ඇත් කාහු යයි මෙසේ මේ ශරීරයෙහි අසුබලකුණු අනුව බලමින් වෙසේද,

ආනන්දය, මෙය අසුභ සංඥය යි කියනුලැබේ.

ආනන්දය ආදීනව සංඥා නම් කවරී ද?

ආනන්දය මෙ සස්තෙහි මහණෙක් වනයකට හිඳ්යේ හෝ ගසක් මුලකට හිඳ්යේ හෝ ශූන්‍යාගාරයකට හිඳ්යේ හෝ මෙසේ තුවණින් සලකයි. මේ සිරුර බොහෝ දුක් ඇත්තේ ය. බොහෝ ආදීනව ඇත්තේය. මෙසේ මේ ශරීරයෙහි නොයෙක් රෝගයෝ උපදිත්. ඔහු කවරහුදයත්? ඇස්රෝගය, කන්රෝගය, නාසිකා රෝගය, දිවේ ඇති වන රෝගය, කයෙහි හටනන්නා රෝගය, හිසෙහි ඇතිවන රෝගය, කනමුල ඇතිවන රෝගය, මුඛයෙහි හටගන්නා රෝගය, දත්මුල ඇතිවන රෝගය, කාසය, ශ්වාසය, පිනාසය, දුවිල්ලය, උණය, බඩේ උපදනා රෝගය, සිහි මූර්ඡාවය, අතීසාරය, ඉදිමීමය, විසූචිකාය හෙවත් ඉදිකටු අගින් අනින්නාක් මෙනි රෝගය, කුෂ්ඨය, ගඩුය, කඛරය, ක්ෂයරෝගය, අපස්මාරය හෙවත් වස්මොරය, දදය, කණ්ඩුතිය නොහොත් කඩුවේගය, කවුළුනම්වූ කුෂ්ඨ විශෙෂය, නියෙන් කැසූ කැන හටගන්නා රෝගය, විතවජිකා නම්වූ කුෂ්ඨ විශෙෂය, රක්තපිතය, මිධුමේහය, අංසා නම්වූ රෝගය, පිඩකාය නොහොත් පිළිකා රෝගය, භගන්දරාය.

පිතෙන් හටගන්නා රෝගය, සෙමෙන් හටගන්නා රෝගය වාතයෙන් හටගන්නා රෝගය, තුන්දොසින් හටගන්නා රෝගය, සෘතුවිපර්‍යාසයෙන් ඇතිවන රෝගය, ඊසම පැවතුම් නිසා ඇති වන රෝගය, අනුන්ගේ උපක්‍රමවලින් ඇතිවන රෝගය, කම් විපාකයෙන් උපදනා රෝගය, සීතය, උෂ්ණය, බඩගිනිය, පිපාසාය, මලය, මූත්‍රය, යන මේ යි මෙසේ මේ ශරීරයෙහි ආදීනව ලක්ෂණ බලමින් වෙසෙති.

ආනන්දය, මෙය ආදීනව සංඥය යි කියනු ලැබේ

ආනන්දය, ප්‍රහානසංඥා නම් කවරී ද යත්?

ආනන්දය, මෙහිස්තෙහි මහණ තෙම උපන් කාමවිතර්කය නො ඉවසා ද, අත්හරී ද. වෙසසින් දුරු කෙරේ ද, සහමුලින් මැකී කෙරේ ද, අභාවයට පමුණුවා ද, උපන් ව්‍යාපාද විතර්කය,

උපන් විතිංසා විතක්ක, උපනුපන් ලාමක අකුසල ධම්මයන් -පෙ- අභාවයට පමුණුවා ද,

ආනන්දය මෙය ප්‍රහාණසංඥයයි කියනු ලැබේ.

ආනන්දය විරාගසංඥ නම් කවරි ද යත්?

ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂුවක් අරණ්‍යයට හිඳේ හෝ ගසක් මූලට හිඳේ හෝ ශූන්‍යාගාරයකට හිඳේ හෝ මෙසේ සිතා ද, මේ ශාන්තය, මේ ප්‍රණීතය, හේ කවරයත්? සියලු සංස්කාරයන්ගේ සංසිදීම ය, සියලු කෙලෙසුන් දුරලීමය, තෘෂ්ණාව නැති කිරීමය, තෘ වනය යනුයි.

ආනන්දය මේ විරාගසංඥය යි කියනු ලැබේ.

ආනන්දය නිරෝධසංඥ නම් කවරි ද යත්?

ආනන්දය මෙසස්තෙහි භික්ෂුවක් අරණ්‍යයට හිඳේ හෝ රුක්මූලකට හිඳේ හෝ ශූන්‍යාගාරයකට හිඳේ හෝ මෙසේ සිතයි. මේය ශාන්තය, මෙය ප්‍රණීතය, හේ කවරයත්? සියලු සංස්කාරයන්ගේ සංසිදීමය. සියලු කෙලෙසුන්ගේ දුරලීමය, තෘෂ්ණාව නැති කිරීමය, නිරෝධ නම්වූ නිවනය යනුයි.

ආනන්දය මේය නිරෝධ සංඥය යි කියනු ලැබේ.

ආනන්දය, මුළු ලොව නො ඇලීම් සංඥව කවරිද යත්?

ආනන්දය, මේ සස්තෙහි භික්ෂුවක් ලෝකයෙහි පඤ්චස්කන්ධය පිළිබඳ දුඃඛ ගැන්මක් හෝ සිත පිළිබඳ අරමුණු අනුව ඇති වන කෙලෙස් හෝ මෙවත් නම් ඔවුන් දුරු කරන්නන් වේ ද, දුඃඛ අල්වා නොගන්නේ වේද,

ආනන්දය මෙය සියලු ලෝකයෙහි අනභිරතසංඥය හෙවත් කලකිරීම් සහගත භාවය යයි කියනු ලැබේ.

ආනන්දය, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍යසංඥව කවරිද යත්?

ආනන්දය, මේ සස්තෙහි භික්ෂුවක් සියලුසංස්කාරයන් හේතු කොටසෙය හෙවත් නාමරූප ධම්මයන් කරණකොටගෙන පිඬාවට පත් වේ ද, ලජ්ජාවේ ද, පිළිකුලක් ඇති කෙරේ ද,

ආනන්දය, මෙය සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥය යයි කියනු ලැබේ.

ආනන්දය, ආනාපානසතිය කවරී ද?

ආනන්දය, මේ සස්නෙහි භික්ෂුවක් වනයට ගියේ හෝ රුක්මූලකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ පලක් බැඳ හෙවත් හසරම්ණිය (අරම්ණිය) ගොතා උඩු කය ඇද නැතිව පිහිටුවා හෙවත් ප්‍රවනවූ ඇට ගොනු සෑහට තබා අරමුණෙහි සිහිය එළවා හිදී ද,

හෙතෙම සිහියේ ඇතිවම ආශ්වාස කෙරෙයි හෙවත් හුස්ම ඉහළට නගයි. සිහිය ඇතිවම ප්‍රශ්වාස කෙරෙයි හෙවත් හුස්ම පහළට බහලයි. දික්කොට නාසිකාවාතය අදනේ දික් කොට නාසිකාවාතය නගමිහි දනියි. දික් කොට හෝ ප්‍රශ්වාස කරන්නේ හෙවත් හුස්ම පහතට හෙළන්නේ දික්කොට ප්‍රශ්වාස කෙරෙමියි දනියි ලුහුඬුව හෙවත් කෙටිව ආශ්වාස කරන්නේ කෙටිව ආශ්වාස කෙරෙමියි දනියි. කෙටිව ප්‍රශ්වාස කරන්නේ කෙටිව ප්‍රශ්වාස කෙරෙමියි දනියි. සියලු ආශ්වාස කය දන්නේ ආශ්වාස කෙරෙමියි හික්මෙයි. සියලු ප්‍රශ්වාස කය දන්නේ ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි කායසංස්කාරය හෙවත් ආශ්වාසය හික්මවා ගන්නෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි, කායසංස්කාරය හෙවත් ප්‍රශ්වාසය හික්මවා ගන්නෙම් ප්‍රශ්වාසකෙරෙමියි හික්මෙයිප්‍රීතියවිඳුනෙම් ආශ්වාසකෙරෙමියි හික්මෙයි ප්‍රීතිය විඳුනෙම් ප්‍රශ්වාසකෙරෙමියි හික්මෙයි සුවය විඳනෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. සුවය විඳිනෙම් ප්‍රශ්වාසකෙරෙමියි හික්මෙයි චිත්තසංස්කාරය දන්නෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි චිත්තසංස්කාරය දන්නෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සන්සිඳුවන්නෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි චිත්තසංස්කාරය සන්සිඳුවන්නෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. සිත් පහළ කරන්නෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. සිත් පහළ කරන්නෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. සිත්හි සතුට ඇති කරන්නෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. සිත්හි සතුට ඇති කරන්නෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. ආශ්වාසයෙහි සිත පිහිටුවන්නෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. ප්‍රශ්වාසයෙහි සිත පිහිටුවන්නෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. සිත මුදන්නෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. සිත මුදන්නෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. අනිත්‍ය ලක්ෂණ සලකන්නෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. අනිත්‍ය ලක්ෂණ සලකන්නෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. නො ඇලීම දන්නෙම් ආශ්වාස කෙරෙමියි

හික්මේ යි. තො ඇලීම් දන්නෙම් ප්‍රහාස කෙරෙමියි හික්මෙයි. නිරෝධය දක්නෙම් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. නිරෝධය දක්නෙම් ප්‍රශ්වාස නෙරෙමියි හික්මෙයි. මිදීම දක්නෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. මිදීම දක්නෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි.

ආනාපානය මෙය ආනාපාන සතිය යයි කියනු ලැබේ.

ඉදින් ආනන්දය, නුඹ ගිරිමානන්ද භික්ෂුව වෙතට එළඹ මේ දස සංඥා කියයි නම් ගිරිමානන්ද භික්ෂුවට මේ දසසංඥා අසා ඒ ආබාධය වහා සන්සිඳෙන්නේය යන මේ කාරණයි සිදුවන්නේ ය.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ දසසංඥාවෝ උගෙන ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂුව යම් තැනෙක ද එතැනට එළඹියේය. එළඹ ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂුවට මේ දශසංඥාවන් කියේය.

ඉක්බිති මේ දශසංඥා අසා ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂුවගේ ඒ අබාධය වහා සන්සිඳුණේ ය.

ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙම ඒ රෝගයෙන් නැගිට්ටේය. ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂුවගේ ඒ ලෙඩ එසේම සන්සිදී ගියේය.

ගිරිමානන්ද සූත්‍රයෙහි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේට වැලඳුණු රෝගය සන්සිඳවීමට ආනන්ද ස්ථවිරයන් වහන්සේට හැකිවූයේ භාග්‍යවතුන් වහන්සේගෙන් දශසංඥාවන් ඉගෙන ගොස් පිරිත් කීමෙනි.

දස සංඥා නම්

අනිත්‍යසංඥාවය, අනාත්ම සංඥාවය, අසුභ සංඥාවය, ආදීනව සංඥාවය, ප්‍රහාණ සංඥාවය, විරාග සංඥාවය, නිරෝධ සංඥාවය, සියලු ලෝකයෙහි කලකිරීම් සංඥාවය, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥාවය, ආනාපාන සතිය යන මොහුයි.

අනිත්‍ය සංඥා නම් කවරිද යත්? රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ යන මේ පඤ්චස්කන්ධයන් පිළිබඳ අනිත්‍ය වශයෙන් සැලකීම යි. හෙවනාහි ඉපදීමය, විනාශවීමය, මේ දෙක අතර වෙනස් වෙමින් පැවතීමය යි මෙසේ සැලකීම අනිත්‍ය සංඥා නමු. මෙසේ සලකන යෝගාවචරයාහට අනිත්‍යසංඥාව පුරුදුවීමෙන් තමන් පිළිබඳ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ආදී හැම දෙයක් කෙරෙහිම

සිත නො ඇලීම මැදහත්බව හෝ පිළිකුල් වෂයෙන් වැවසීම හේතුකොටගෙන නිවන් අවබොධ කළ හැක්කක් ය.

අනිත්‍ය කෙසින් ම දුක් වේ. "යදනිච්චං තං දුක්ඛං" යනුවෙන් යම්ක් අනිත්‍ය නම් හේ දුක ය යි වදළ කෙසින් දුඃඛසංඥාවත් මෙහිම ඇතුළත් වේ. නිරන්තරයෙන් පීඩා කිරීම් ආකාරය මෙහි දුඃඛ ලක්ෂණ යයි.

මේ අනිත්‍ය සංඥා යි

අනාත්ම සංඥා නම් කවරිදයත? දුක්වූ උඤ්චස්කඛ්ය තමා වස යෙහි නො පැවැත්විය හැකි කෙසින්අනාත්ම වශයෙන් සැලකිමයි. මෙසේ සලකන යෝගාවචර තෙමේ ඇසත් ඇසට හමුවන රූප යත්, කණත් ඊට හමුවන ශබ්දයත්, නාසයත් එයට හමුවන ගඤ්ඡ යත්, දිවත් ඊට හමුවන රසයත්, ශරීරයත් එයට හැටෙන ස්පර්ශ යත්, සිතත් සිතට අරමුණු වන ධර්මත් අනාත්ම යයි සලකයි.

මෙසේ නාම්රූප ධර්මයන් වෙන් කොට සලකා ඔවුන්ද, ධාතු මාත්‍ර වශයෙන් සලකා බැලූ කල්හි ආත්මයයි කියා හෝ ආත්මය ඇසුරු කොට මේ ස්කඛ්ධ පඤ්ච පවත්නේ ය යි කියා හෝ සලකා ගත නොහැක්කක් ය.

මෙසේ අනාත්ම යයි සලකන්නහුට මේ ශරීරයෙහි පමණක් නො ව බැහැර අරමුණුවලත් මම ය, මාගේය, යන ආත්මදෘෂ්ටිය හා තණ්හාවත් එසේම මානයත් දුරුවීමෙන් නිවන් අවබොධ වේ.

මේ අනාත්ම සංඥා යි.

අසුභ සංඥා නම් කවරිද යත්? කේශාදි දෙතිස්කුණප සොළු ආකාරයන් අසුභ වශයෙන් ගෙන සැලකීම යි.

මේ ශරීරයෙහි මුතු මැණික් ආදි ගතයුතු සාරවත් දෙයක් නැත්තේ ය. ඒකාන්තයෙන් ඇතුළත්හි දු අපවිත්‍ර දෙසින් යුක්ත ය. පිටත්හි දු කෙළ සෙම් සොටු ආදි අපවිත්‍ර දෑසින් යුක්තය. අභ්‍යන්තර කුණපයෙහි සවභාවය පිටතට නික්මෙන කුණපයන් ගෙන් පැහැදිලිවන හෙයින් මේ ශරීරය දෙතිස් කුණප රාශියකින් යුක්ත යයි සලකා එහි. නො ඇලීම් වශයෙන් උපදවන හැඟීම යි. මෙයින් තණ්හාව දුරු වීමෙන් නිර්වාණාවබෝධය වෙයි.

මේ අශුභ සංඥා යි

ආදීනව සංඥා නම් කවරිදයත්? මේ ශරීරය බොහෝ දුක් සහිත ය, බොහෝ අයුණු සහිතය, ඇස් රෝග ආදි නානාප්‍රකාර රෝග

යන්ට වාසස්ථානයෙකැ යි සලකා එහි නොඇලීම් වශයෙන් ඇතිකරන හැඟීම යි. මෙයිනුදු ශරීරකාන්තිය හෙවත් ශරීරය කෙරෙහි ඇලීම දුරුව නිවන් පසක් කෙරෙයි.

මේ ආදීනව සංඥා යි

ප්‍රහාණ සංඥා නම් කවරිද යත්? කාමවිතකී හෙවත් කාම සහගත කල්පනා, ව්‍යාපාද විතකී හෙවත් ක්‍රෝධ සහගත කල්පනා, විහිංසා විතකී හෙවත් අනුන්ට හිංසා කිරීමේ කල්පනා වෙනත් අයුරින් උපදනා අකුසලයසහගත කල්පනා යන මෙතක්කල්පනා පස්පරිද්දකින් දුරු කිරීම් වශයෙන් උපදවන හැඟීම්යි. එහි කෙසේදයත්?

නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තිකරොති, අනභාවං ගමෙති යනු ඒ දුරුකරනා පස්පරිද්දය.

මෙහි ''නාධිවාසෙති'' යන්නෙන් තමහට උපන් කාමවිතකීාදිය අකුසල්ය, එහෙයින් ම වරදය, දුක් උපදවන්නේය, තමහට හා අනුන්ටත් දුක් පිණිස පවත්නේ ය යි මෙසේ දෙස් වශයෙන් සලකා ඒ ඒ අරමුණු කෙරෙහි උපන් කාමවිතකීාදිය සිතට නොනඟයි. සිතින් නොඉවසයි. සිතට වැද්ද නොගනියි. සිත්හිම නවත්වා ගන්ට තැත් නොකෙරෙයි යනු දක්වයි.

දැලි කුමක් කෙරේදයත්? යම් හෙයකින් සිතට වැදුණ ද එය වහාම දුරු කෙරෙයි, සිතින් ඉවත් කෙරෙයි යනු ''පජහති'' යන්නෙන් දක්වයි.

මේ ඉවතලෑම් පැසකින් හෙවත් කුඩයකින් කුණුගොඩක් හෙන විසිකිරීමක් මෙන් බැහැර කිරීමක් නොවනබව 'විනොදෙති' යන්නෙන් දක්වයි. ඒ අකුශල විතකීාදිය සිත තුළින්ම අත්හරියි යනු මෙහි අර්ථයි.

මේ අත්හැරීම කෙවිටකින් ගොඩකු එළවීමක් මෙන් ඉවත් කිරීමක් නොවන බව ''බ්‍යන්තිකරොති'' යන්නෙන් දක්වයි. මූළු මිනින්ම සිතින් අස්කර දමයි යනු මෙහි අර්ථයි.

මේ කෙසේදයත්?

ඒ අකුශල කාමවිතකීාදිය සවල්ප මාත්‍ර වශයෙන් වත් සිත්හි නොනවත්වා සහ මූලින්ම විනාශකර දමයි යනු ''අනභාවං ගමෙති'' යන්නෙන් දක්වයි.

මේ ප්‍රහාණ සංඥා යි

විරාග සංඥා නම් කවරිදයත්?

නිවනට පැමිණ සියලු කාමාදි කෙලෙස් නැතිවේ ද, ඒ නිවන විරාග නම්වේ. නිවන් අරමුණු කොට උපදනා සංඥාව විරාගසංඥා නම්වේ.

මේ නිවන කෙලෙසුන් තෙරෙන් සන්හුන් බැසින් ශාන්තභාව, රහත්ඵල සමවතට සමවැදී දවසක් ගතකළ රහතන් වහන්සේගේ සිත වුවද ශාන්තභාව, සතියක් නිවන ඇසුරුකොට සමවන් ආයුෂ්මත් ප්‍රද්ගලයාගේ සිත්හි ශාන්තබව කියනුම කවරේද? එබැවින්ම ප්‍රඥාභාව, එහි සියලු කාය චාඞ් මනඃ සංස්කාරයන්ගේ සන්සිඳීම ඇති බැසින් නිර්ජරණය සඵිසංඥාවේදයිත සමථ නම් වේ.

භාවනාවෙන් නැමිවූ කාම්වස්තූන් මුල්කොට උපදනා කෙලෙස්ය බන්ධනවූ නම්වූ ස්කන්ධයන් මුල්ව උපදනා කෙලෙස්ය, කිලේසූපධි නම්වූ සතර අපායාදි දුකට හේතුවන කෙලෙස්ය, අභිසංඛාරූපධි නම්වූ යසර දුකට මුල් මින අවිද්‍යා තෘෂ්ණාදි හේතුධර්ම මෙහි නැති බැසින් නිවන සබ්බූපධිපටිනිස්සග්ග නම් වේ. නිවනට පැමිණ තණ්හාව දුරුවන බැසින් තණ්හක්ඛය නම් වේ.

මේ විරාග සංඥා යි

නිරෝධ සංඥා නම් කවරිදයත්? නිවනට පැමිණ සියලු සංස්කාරයෝ නිරුද්ධ වෙති යි නිවන් අරමුණු කොට උපදනා ඥාණ නිරෝධ සංඥා නම් වේ.

මෙහි දුක්වූ විරාගසංඥා නිරෝධසංඥා යන දෙකම එකලාවම නිවන අරමුණුකොට උපදනා බැසින් මෙසේ දෙපරිද්දක් වශයෙන් කුමක් බැසින් වදාළේද යත්?

විරාග පදයෙන් තමාගේ පඤ්චස්කන්ධය නිබිඳීම කාමාදි කෙලෙස් සන්සිඳුවන බැසින් සෝපධිශෙෂ නිර්ජරණ ධාතුවද, නිරෝධ පදයෙන් සියලු විපාකස්කන්ධයන්ගේ අභාවය දුක්වීමෙන් නිරුපධිශෂ නිර්ජරණ ධාතුව දැයි මෙසේ සොපාදිසෙස නිබ්බානය අනුපාදිසෙස නිබ්බානය යන දෙවැදෑරුම් නිර්ජරණ ධාතුව දක් වනු සඳහා ය.

මේ නිරෝධ සංඥා යි

සියලු ලෝකයෙහි අනභිරත සංඥා නම් කවරිදයත්?

මෙහි උපාය, උපාදාන, අධිට්ඨාන, අභිනිවෙස, අනුසය යයි කරුණු පසෙකි. මේ හැම ලෝකය විෂය කොට ආධාර කොට

පවත්නේ ය. උපාදා උපාදානා යන පද දෙක සන්ධි වීමෙන් උපාදුනා යි සැදී තිබේ.

උපාය නම් තෘෂ්ණා දෘෂ්ටි දෙකයි. මොව්හු සත්වයා සුගති දුර්ගති දෙකට පමුණුවන හෙයින් උපායයෝ යයි කියනු ලැබෙත් දුගතියට හෙත යන කර්මයට මිථ්‍යාදෘෂ්ටිය උපාය වේ. සුගතියට පමුණුවන කර්මයට භවතෘෂ්ණාව උපාය වේ පෘථග්ජන තෙමේ වනාහි දුගතිගාමී කර්මත් සුගතිගාමී කර්මත් යන දෙකම රැස් කෙරෙයි.

ලෝකයෙහි සියලු පැවතුම් උපාදානයන්ට හිතකරය. "උපාදානියෙසු භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සිනෝ විහරතෝ තණ්හා පවඩ්ඪති, තණ්හාපච්චයා උපාදානං" යනු වදාළ හෙයින් උපාදානීය හෙවත් උපාදානයන්ට හිතවූ ධර්මයන් මිහිරි වශයෙන් සලකන්න හුව තණ්හාව දියුණු වෙයි. තණ්හාව හේතුකොට හෙත උපාදාන යෝ ඇතිවෙත්. උපාදාන නම් දැඩි කොට ගැනීම හෙවත් තදින් අල්ලා ගැනීමයි. ස්ත්‍රියකුගේ පුරුෂයකු අල්ලා ගැනීමක් මෙනි. තුන් ලෝකය කෙරෙහිම කලකිරීම් සහගත නැගීම් ඇතිවූ කල මෙකී උපාදාන උපාදානයෝ දුරුවෙත්.

"වෙතසො අධිට්ඨානා" යන්නෙන් දැක්වූයේ සිත ඇසුරු කොට පවත්නා අයුරු යි. ආසය යනුවෙන් පවසන්නේ ද මේ අධිෂ්ඨානාවසථාව ම ය.

සිංහාදි තිරිසන් සත්වයෝ වෙත්ව යි මිනිස් ආදි සත්වයෝ චෙත්ව යි නානාවෙක් නැන ඕනෑ එපා කම් සඳහා හැසුරුණත් තම තමන් ලඟිනා තැන් කරා හෝ නිවෙස් කරාම එති.

එමෙන් පෘථග්ජන තෙමේ ද ශාශ්වතාවෙශ්ද දෘෂ්ටි දෙකෙන් එක්තරා දෘෂ්ටියක ලඟියි. සත්ත්වලෝකය මුළුල්ලම අස්තිභාව හා නාස්තිභාවයන් ඇසුරුණකාට පවතිය හි වදාළහ. අස්තිභාවය නම් සදහාලිකය යි සලකන ශාශ්වත දෘෂ්ටිය යි. නාස්තිභාවය නම් මරණින් පසු සත්වයෙක් නැතැයි සලකන උච්ඡේද දෘෂ්ටිය යි. අනභිරතසංඥාව ඇතිවූ කල්හි මේ තත්ත්වය තැනිකරගත නැකි වෙයි

"අභිනිවේස" නම් ආත්ම දෘෂ්ටිය යි, ආත්මයක් ඇත. ආත්මය කෙරෙහි පිහිටි දෙයක් ඇත. ආත්මය මේය, අත්මය නම් මේය, යන ආදි වශයෙන් තමන් තැන වරදවා සලකන සත්කාය දෘෂ්ටිය යි. අනභිරත සංඥයෙන් මේ ද දුරුවෙයි.

"අනුසය" නම් සසරතුනාකයෙහි යටපත්වූ මතු ඇති වන් නට පුළුවන් ශක්තිය ඇති කෙලෙස් සෑහකි. ඔව්හු නම් කාම

රාගානුසය, පටිඝානුසය, මානානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය භවරාගානුසය, අවිජ්ජානුසය යන සතයි.

ලෝකයෙහි ප්‍රියවූ රූපයක් දක්නට ලැබෙන කල්හි කාමරාගානුසය උපදියි. අප්‍රිය රූපයක් දකින්නට ලැබුණු කල ප්‍රතිඝානුසය උපදියි. මේ අනුසය වදක්හි ක්‍රියාවන්ට ඉතිරි අනුසය පසෙහි එකතුවෙයි. ධ්‍යානගුණ ඉපද වීමෙන් මේ අනුසය මැඩ පවත්වන්නට හැකි වුවද අරමුණු හැන්මෙහිදී ශරීරයෙහි යටපත්වූ ම විෂ මතු වන්නාක් මෙන් මේ අනුසයයන් මතුවිය හැකිය.

සියලු ලෝකයෙහි තෙ‍ා ඇලීම් සංඥාව ඇතිවූ සල මේ අනුසය දුරුවීමෙන් නිවන් අවබෝධ කළ හැකිය.

මේ අනභිරත සංඥා සි

සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍යසංඥා කවරිද යත්?

ඇසිල්ලෙන් ඇසිල්ලෙහි විඳෙනසුලු ස්වභාවයෙන් අස්ථිරවූ හේතු ප්‍රත්‍යයෙන් නිපන් ස්වභාවයෙන් උපදනාවූ සියලු සංස්කාරයෝ නො ඉක්ම කාමරූප ධර්මයෝ පිඬා කරන්නාහ, ලජ්ජා උපදවන්නාහ, පිළිකුල්හ යි මෙසේ උපදනා හැඟීම යි.

මේ සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥා සි.

ආනාපාන සතිය කවරිද යත්?

මෙය ඉතා සියුම් විෂයෙන් වැඩිය යුතු කම්ටඨානයකි. මෙයින් ම ධ්‍යාන, විදර්ශනා, මාර්ග, ඵලයන් ඉපදවිය හැකි හෙයින් සියුම් වූ භාවනා මාර්ගයෙකි. ආන අපාන යයි මෙහි පද දෙකෙකි. ඇතු ළට ඇදගන්නා නාසිකාවාතය ආන හෙවත් ආශ්වාස යයි ද, පිට නට හෙළන නාසිකාවාතය අපාන හෙවත් ප්‍රශ්වාස යයි ද කියනු ලැබේ. මෙය විවේකස්ථානයක හිඳ සිත එකඟකරගෙන සිහියෙන් යුක්තව ම කළ යුතු හෙයින් "සෝ සතොව අස්සසති, සතෝ පස්ස සති" යි වදළහ.

මේ ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කොට ගෙන භාවනාකරන කල්හි චතුර්ධ්‍යානය තෙක් රූපාවචරධ්‍යානයන් උපදවා ගත හැකියි. ඒ යෝගාවචරයාගට ධ්‍යානයෙන් නැඟිටි පසුත් ආශ්වාස ප්‍රශ්වාසයන් ම අරමුණු වෙයි. ධ්‍යානාඞ්ගයන් හෝ අරමුණු විය හැකියි.

එකල මේ ආශ්වාස ප්‍රශ්වාසයන් සුමක් ඇසුරු කොට පවත් නේදැ යි සලකනකල කරජකය ඇසුරු කෙරෙම්නැ යි හෙතෙම දනියි කරජකය නම් සතර මහාභූතයන් හා සුවියි උපාදාරූප මිය

අනිත්‍යක් නොවේය යි මෙසේ රූපස්කන්ධය ගැන සලකයි.

ඉස්මිනි එයට අරමුණුවූ ස්පර්ශාදී ධර්ම නාමය යි කියන මෙසේ මේ නාමරූපයන්ගේ පැවැත්මට හේතු සොයන කල්හි අවිද්‍යාදි ප්‍රත්‍යය පරම්පරාව දැක මෙහි ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ධර්මමාත්‍රය මිස සත්වයෙක් හෝ පුද්ගලයෙක් නැතැයි නිසැකව දැන මේ නාම රූපයන් අරමුණු කොටගෙනම අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් නිලකුණු මෙනෙහි කෙරෙමින් විදසුන් වඩා රහත්වෙයි

මේ ආනාපාන සතිසමාධිය "දීඝං වා අස්සසන්තෝ දීඝං අස්ස සාමී ති පජානාති, දීඝං වා පස්සසන්තෝ දීඝං පස්සසාමී ති පජානාති" යන මේ යුගළයෙහි පටන් "පටිනිස්සග්ගානුපස්සී අස්ස සිස්සාමී ති සික්ඛති. "පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී ති සික්ඛති" යන යුගළය දක්වා දෙකක් දෙකක් වශයෙන් ගත් කල සොළොස් වැදෑරුම් වේ. එකක් එකක් වෙන් වෙන්ව ගත් කල දෙතිස් වැදෑරුම් වේ.

මේ ආනාපාන භාවනා නම් වේ.

ගිරිමානන්ද සූත්‍රයෙහි දහම් විස්තරය නිමි.

ඉසිගිලි සූත්‍රය

එවං මේ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ඉසිගිලි සම්මං පබ්බතෙ, තත්‍රඛෝ භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවෝ ති, භදන්තෙනී තෙ භික්ඛූ භගවතෝ පච්චස්සොස්සුං භගවා එතදවොච. පස්සථ නො තුම්හෙ භික්ඛවේ එතං වෙහාරං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්ස පි ඛෝ භික්ඛවේ වෙහාරස්ස පබ්බතස්ස අසුඤ්ඤව සමසුඤ්ඤ අභොසි අසුඤ්ඤ පසුඤ්ඤතන්ති

පස්සථ නො තුම්හෙ භික්ඛවේ එතං පණ්ඩවං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්ස පි ඛෝ භික්ඛවේ පණ්ඩවස්ස පබ්බතස්ස අසුඤ්ඤව සමසුඤ්ඤ අභොස අසුඤ්ඤ පසුඤ්ඤතන්ති.

පස්සථ නො තුම්හෙ භික්ඛවේ එතං වෙපුල්ලං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්ස පි ඛෝ භික්ඛවේ වෙපුල්ලස්ස පබ්බතස්ස අසුඤ්ඤව සමසුඤ්ඤ අභොසි අසුඤ්ඤ පසුඤ්ඤතන්ති.

පස්සථ නො තුම්හෙ භික්ඛවේ එතං ගිජ්ඣකූටං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්ස පි ඛෝ භික්ඛවේ ගිජ්ඣකූටස්ස

පබ්බතස්ස අසුත්තා ව සම්සන්දා, අහොසි අසන්දා පසන්දනති. පස්සථ නෙතා තුමෙහ භික්ඛවෙ ඉමං ඉසිගිලිං පබ්බතන්ති? එවං භදන්ත, ඉමස්ස පි ඛෝ භික්ඛවෙ ඉසිගිලිස්ස පබ්බතස්ස එසාව සම්සන්දා අහොසි එසා පසන්දනති.

භූතපුබ්බං භික්ඛවෙ පඤ්ච පචෙචක බුද්ධසතානි ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ විරහිවාසිනො අහෙසුං, තෙ ඉමං පබ්බතං පස්සනතා දීසසතානි පස්සථා න දිසසතන්ති.

තමෙත මත්‍රුස්සා දිසවා එවමාහංසු. අයං පබ්බතො, ඉමෙ ඉසි ගිලතී ති ඉසිගිලි ඉසිගිලිමෙව සම්සන්දා උදපාදි.

ආවිකඛිස්සාම් භික්ඛවෙ පචෙචක බුද්ධානං නාමානි, දෙසෙස්සාම් භික්ඛවෙ පචෙචක බුද්ධානං නාමානි, තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති.

එවං භනෙනති ඛෝ තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

අරිට්ඨො නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පබ්බතෙ විරහිවාසී අහොසි.

උපරිට්ඨො නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මි පබ්බතෙ විරහිවාසි. අහොසි.

නගරසිබී නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පබ්බතෙ විරහිවාසී අහොසි.

සසසසී නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මි පබ්බතෙ විරහිවාසී අහොසි.

සුදස්සනො නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පබ්බතෙ විරහිවාසී අහොසි.

පියදස්සී නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පබ්බතෙ විරහිවාසී අහොසි.

පිසඛණ්ඩලො නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පබ්බතෙ විරහිවාසී අහොසි.

උපාසභො නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පබ්බතෙ විරහිවාසී අහොසි.

නිච්චො නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පබ්බතෙ විරහිවාසී අහොසි.

නච්චො නාම භික්ඛවෙ පචෙචක සම්බුද්ධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පබ්බතෙ විරහිවාසී අහොසි.

සුනවා කාම සිකඛාවේ පවෙවක සම්බුදධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පඛඛාත විරහිවාසි අහොසි.

භාවිතත්තා කාම සිඛඛාවේ පවෙවක සම්බුදධා, ඉමස්මිං ඉසි ගිලිස්මිං පඛඛාත විරහිවාසි අහොසි

1 යෙ ඝ තතසාරා අනීඝා නිරාසා
පවෙවකාවමවජඣඤ්ච සුඛාධිං
තෙසං විසල්ලානං කරුතතමාතං
කාමාහි මේ කිත්තයතො සුණාථ

2 අරිටඨා උපරිටඨා තඟරසිඛි ඨසසසි
සුදසසනෝ පියදසසි ච බුදධා
ගඤ්ඤරා පිණෙඩොලෝ උපාසභෝ ච
නීථෝ තථෝ සුතවා භාවිතත්තා

3 සුමෙධා සුභා මෙථුළා අථඛාමා ච
අථසසූ මෙඝා අනීඝා සුදඨෝ
පවෙවකබුදධා භවතෙතතිඛිණා
සිංඟ ච සිංහා ච මහානුභාවා

4 දෙජාලිතෝ මුනිතෝ අථඛාතා ච
අථ කොණඩලෝ බුදධා අථෝ සුබාහු
උපතතමිතා නෙමිතා සනතවිතතා
සබෙවා තථෝ විරජෝ පණීතෝ ච

5 කාලූපකාලා විජිතෝ ජිතෝ ච
අඛෝ ච-පඛෝ ච ගුතිජජිතෝ ච
පසසී ජහී උපධිං දුකඛමූලං
අපරාජිතෝ මාරබලං අජෙසි

6 සතථා පවතතා සරහතඛා ලොමහංසෝ
උවවඛගමායෝ අසිතෝ අනාසවා
මතාමායා මාතචජිඳ ච බන්ධුමා
තදාධිමුතෝතා විමලෝ ච කෙතුමා

7 කෙතුමෙබරාතඛා ච මාතඛා අරියෝ
අථවුතෝ අවුතගාම්බ්‍යාමකෝ
සුම්ඛලෝ දබ්බිලෝ සුපතිටඨිතෝ
අසයෝහා ඛෙමාභිරතෝ ච සොරතෝ

8 දූරතතයෝ සංඝා අථොපි උවවයෝ
අපරා මුනී සයෝහා අතොම නිකකමා

ආනන්ද නෙතු උපතෙතු ආදස
භාරද්වාජෝ අනාගීමදෙහධාරී

9 බොධී මහාතාමෝ අපොපි උත්තරෝ
කෙසි සිබී සුන්දරෝ භාරද්වාජෝ
තිසසුපතිසසා භවබන්ධඤ්ඡිදු
උපසිදරි තණ්හවජ්ජිදු ච සිදරි

10 බුද්ධා අහූ මඝලෝ විතරාගෝ
උසභවජ්ජු ජාලිනිං දුක්ඛමූලං
සන්තං පදං අජ්ඣගමූපනීතෝ
උපොසථෝ සුන්දරෝ සවහාමෝ

11 ජෙතෝ ජයනෙතා පදුමෝ උපසලා ච
පදුමුත්තරෝ රක්ඛිතෝ පබබතෝ ච
මානත්ථද්ධෝ සොභිතෝ විතරාගෝ
කණ්හෝ ච බුද්ධා සුවිමුත්තා විතණ්හා

12 එතෙ ච අසෙසුදු ච මහානුභාවා
පසවච්ඡබුද්ධා භවවනතති බිණා
තෙ සබබසඬ්ගාතිගතෙ මහෙසී
පරිනිබ්බුතෙ වන්දථ අපපමෙයෙ තී

ඉසිගිලි සුතනං නිට්ඨිතං
දුතියඤ්ච භාණවාරං

සිංහලානුවාදය

මේ දේශනාව මවිසින් මෙසේ අසනලදී තොසොත් මේ ඇසීම මෙසේය: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ඉසිගිලි පර්වතයෙහි වැඩවසනසේක. එහි වැඩවෙසෙන භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමතුසේක. ඒ භික්ෂූහු ද එසේය වහන්ස යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

මහණෙනි නුඹලා මේ වෙහාර පර්වතය දක්නහු ද? යනුයි. එසේය වහන්ස, මහණෙනි, පෙර මේ වෙහාර පර්වතයට අනික් නමෙක් විය. අනික් පැනවීමෙක් විය.

මහණෙනි, නුඹලා මේ පාණ්ඩව පර්වතය දක්නහු ද? එසේය වහන්ස, මහණෙනි පෙර මේ පාණ්ඩව පර්වතයට අනික් නමෙක් විය. අනික් පැනවීමෙක් විය,

මහණෙනි, නුඹලා මේ වෙසුලල පව්තය දක්නහුද? එසේය වහන්ස, මහණෙනි පෙර මේ වෙසුලල පව්තයව අනික් නමෙක් විය, අනික් පැනවීමෙක් විය.

මහණෙනි, නුඹලා මේ පෙතෙන ගිජ්ඣකූට පව්තය දක්නහුද? එසේය වහන්ස, මහණෙනි, පෙර මේ ගිජ්ඣකූට පව්තයට අනික් නමෙක් විය, අනික් පැනවීමෙක් විය.

මහණෙනි, නුඹලා මේ ඉසිගිලි පව්තය දක්නහුද? එසේය වහන්ස, මහණෙනි, පෙර මේ ඉසිගිලි පව්තයට මේ නම්මේ විය. මේ පැනවීම්ම විය.

මහණෙනි, පෙර සිදුවූ දෙයක් කියමි. එනම් පන්සියයක් පසේබුදුවරයෝ මේ ඉසිගිලි පව්තපෙහි බොහෝ කලක් විසූහ. උන්වහන්සේලා මේ ඉසිගිලි පව්වට වඳනාහු දක්නට ලැබෙති. වන්නාහු කෑ පෙතෙති.

මිනිස්සු එය දුක මෙසේ කිහ. මේ පව්තය තෙමේ මේ සෘෂීන් හෙවත් පසේ බුදුවරයන් ගිල ඝනිත් කියායි. එහෙයින් ඉසිගිලි ඉසිගිලි යයි මේ නම ඇතිවිය.

මහණෙනි, ඒ පසේ බුදුවරයන්ගේ නම් කියන්නෙමි. ඒ පසේබුදුවරයන්ගේ නම් දේශනා කරන්නෙමි. එය අසව් බොදින් සිත්වලට ගනිව්, කියන්නෙමි යනුයි.

මහණෙනි, අරිට්ඨ නම් පසේබුදුවර තෙම මේ ඉසිගිලිපව්වෙහි බොහෝකලක් විසූයේ විය. උපරිට්ඨ නම් පසේබුදුවර තෙම— සෙස්ස පෙර මෙනි. තගරසිඛි, යඝසසි සුදස්සන, පියදස්සි, ගන්ධාර, පිණ්ඩෝල, උපාසභ, නීථ.තථ, සුතවා, භාවිතත්ත නම් පසේබුදුවර තෙම මේ,ඉසිගිලි පව්වෙහි බොහෝකලක් විසූයේය.

1 නිදුක්වූ, ආසා නැත්තාවූ, යම් සත්වොත්තම කෙනෙක් වෙත වෙතම් නිවන් අවබෝධ කළ සේක් ද, රාහාදි කෙලෙස්හුල් උදුලාවූ ඒ පුරුෂෝත්තමයන්ගේ නම් පවසත මාගේ වචන අසව්

2 අරිට්ඨ ය, උපරිට්ඨ ය, තගරසිඛි ය, යඝසසි ය, සුදස්සන ය පියදස්සි බුදුය, ගන්ධාර ය, පිණ්ඩෝලය, උපාසභය, නීථය, තථය, සුතවාය, භාවිතත්ත ය,

3 සුමන ය, සුභය, මේථුල ය, අට්ඨම ය, එසේම අම්බය, අනීඝ ය, සුදර්ශය, ඝත මේ භවතාණෙණාව දුරුකල පුණ්‍ය බුදුවරියෝ ය, සිංගු ය, සිංගය යන නම් ඇති මහත් ආනුභාව සම්පන්න පසේ බුදුවරුය,

4 එසේම චුල්ලජාලීය, මහාජාලීය යන නම් ඇති බුදුවරු දෙනමී ය, අථර්කතය, තවද කොසොල බුඩය, එ ස්ම සුබාහු ය. උප තෙමිස ය, නෙමිතය, සනතවිතතය, සව්වය, තථය, විරජය, පණ්ඩි තය,

5 සාලය, උපකාලය, විජිතය, ජිතය, අංගය, පංගය, භූතිජජී තය, දුකව මුල්වූ කෙලෙස් දුරුකළ පස්සි නම් පසේබුදු තය, කෙ ලෙස් මාරබලය දිනූ අපරාජිතය,

6 සජ්ජාය, පවත්තාය, සරභංගය, ලොමහංසය, උච්චංගමා ය, අසි තය, අනාසවය, මනොමය ය, මානය දුරුකළ බන්ධුමතු ය, තදධිමුක්තය, විමල ය, කෙතුමා ය,

7 කෙතුම්බරාඛ ය, මාතඩගය, අරියය, තවද අව්වුතය, අව්වු තඛම්බ්‍යාමකය, සුමංගලය, සුපතිට්ඨිතය, අසය්හය, බෙමාහි රතය, සොරතය.

8 දුරන්නය ය, සංඝය, තවත් උච්චිය ය. අලාමක වියැති තවත් සග්ඝ නම් පසේබුදුවරය, ආනන්දය, නන්ද ය, උපනන්ද ය යන මෙනම්වලින් යුත් දෙලොස් පසේබුදුවරු ය, (ආනන්ද නමින් සතරනමෙක, නන්ද නමින් සතර නමෙක, උපනන්ද නමින් සතර නමෙක යනුයි) අවසන් ශරීරය දූරු භාරද්වාජ ය

9 බොඩිය, මහානාමය, යළිත් උත්තරය, සේසිය සිබියා සුන්දර ය, භාරද්වාජය, සංඝාර බඹුනය දුරුකළ නිසභය, උපනිසභ ය, තෘෂ්ණාව දුරුකළ උපසිදරිය, තෘෂ්ණාව සිඳ දැමූ සිදරිය,

10 දුරුකළ රාග ඇති මංගල නම් බුදුවරයෙක් වී නම් කෙ නෙමේය, දුකව මුල්වූ තණ්හා ව දුරුකළ උසභ නම් පසේ බුදුවර යෙක් වී නම් කෙනෙමේය. ඥානපදයට පැමිණි උපනීතය, උපෙ සථය, සුන්දරය, සව්වනාම ය,

11 ජේතය, ජයන්තය, පදුමය, උපලය, පදුමුත්තරය, රක්ඛිතය, පබ්බතය, මානත්ථද්ධය, මොඝිතය, මිතරාඛය, මනාව කෙලෙසුන්ගෙන් මිදුණු සිත් ඇති කණ්හ නම් බුදුන්ය,

12 පෙළෙහි ආ පරිදි මෙහි නම් සඳහන් පසේ බුදුවරයන් වහන්සේලාද, අපලෙහි තොආ මෙහි නම් කොකී මහානුභාව සම් පන්න පසේබුදුවරයෝ ද, භවතණ්හාව දුරු කළාහු වෙත්. සියලු කෙලෙස් සතුරන් දිනූ නිවන් මහවූ අපමණ ගුණ ඇති ඒ පිරිසිදු පසේබුදුවරයන් වඳිමි.

සිංහලානුවාදය නිමි.

දහම් විස්තර

රතන සූත්‍රාදී සෙසු පිරිත් මෙන් ඉසිගිලි පිරිත ද මහත් ආනුභාව සම්පත්තියෙන් යුත් හෙයින් පිරිත් පෙළට ඇතුළත් කරන ලදි. මේ හැර පසේබුදුවරයන්ගේ ගුණ පැවසූ ධර්මයක් මෙහි සඳහන් වී නැත. 'පච්චෙකබුද්ධා භවනෙතති බිණා' යනුවෙන් සියලු පසේබුදුන් වහන්සේලා ද සම්මා සම්බුදුවරුන් මෙන්ම තෘෂ්ණාදි භවබන්ධනයන් දුරු කළ උත්තමයෝ යි. එහෙයින් ම ඥානතවූ නිර්වාණ පදයට පැමිණි උත්තමයන් වහන්සේලා යි.

රජගහනුවර පිහිටි වේභාර, පණ්ඩව, වෙපුල්ල, ගිජ්ඣකූට, පච්තවල නම් වෙනස්වූවාක්, මෙන් මේ ඉසිගිලි පච්තයෙහි නම වෙනස් නොවිය.

එක්කලෙක සවස බුදුරජාණන් වහන්සේ ඵලසමාපත්තියට සමවැද එයින් නැගිව ගඳකිළියෙන් නික්ම භික්ෂුසංඝයා වහන්සේ පිරිවරා මේ පසුව පච්තයන් පෙනෙන මානයෙහි වැඩහිඳ වදාරා භික්ෂූන්ව එය ඇදුන්වා ලූසේක.

භාග්‍යවතුන් වහන්සේට සෙසු පච්තවලින් ප්‍රයෝජනයක් නැතත් ඉසිගිලි පච්තය හැඳිනවීමෙන් පන්සියයක් පසේබුදුවරයන්ගේ නම් හා පද්ධිවතී දේවියගේ ප්‍රාර්ථනාවත් පැහැදිලි වන හෙයින් පිළිවෙළින් සෙසු පච්තයන් ගැන ද සඳහන් කරන්නට සිදුවිය.

පන්සියයක් පසේබුදුවරයන් වහන්සේලා රජගහනුවර පිඬු සිඟා හැසිර ඉසිගිලි පච්තය දෙබෑ දෙරක් විවෘතත කරන්නාක් මෙන් විවර කොට ගෙන එහි තුළට පිවිස රෑ වසන තැන් හා දහවල් වසන තැනුත් පිළිගෙළ කොටගෙන වීසූහ. එය බලා සිටින වුන්ට එසේ පිවිසෙන පසේබුදුවරුන් දක්නට ලැබෙනු මිස පිටිසපසු දක්නට නො ලැබෙති. එහෙයින් මේ පච්තය තෙමේ සෘෂීන් ගිලගනියි යන ජනප්‍රවාදයෙන් ඉසිගිලි නම් විය.

මේ පසේ බුදුවරයෝ කෙසේ පහළවූහු ද? යත්:

අතීතයෙහි බරණැස් නුවර ඇසුරුකොට එක්තරා ගමෙක් කෙනක් රකිමින් වීසූ කුලසත්‍රියක් එක් පසේබුදුවරයන් වහන්සේ නමකට විලඳ සමඟ තෙළුම් මලක් පූජාකොට පන්සියයක් දරු වන් පැතුවා ය.

ඒකෙනෙහි ම පත්තියයක් මුවවැද්දෙ ද එම පසේබුදුවරයන් වහන්සේව ම රසමසවුලෙන් යුත් දනක් දී ඇසව පුතුන්වීමව පැතුහ.

ඒ උපාසිකා තොමෝ ද ආයුවිද දෙවිඳුලාව ඉපද එයින් චුතව එක්තරා විලක පියුම්ඟැබක උපන්නා ය, තාපසයෙක් ඇය දැක පෝෂණය කෙළේය. ඇය තමන් බිම පා තබන කල්හි පොළොවෙහි නෙළුම් මල් පිපෙයි.

මේ ආශ්චර්යය දුටු මිනිස්සු බරණැස් රජහට මෙපවත් දන්වූහ. රජතෙමේ ද ඇය ගෙන්වා අගමෙහෙසුන් කෙළේය. ඇයට දුව උපන් දරුවා මහාපදුමකුමාර නම් විය. ඉසිස්තෝ ගැබ් මල ඇසුරු කොට උපන්හ.

මොවුහු තරුණවයසට පැමිණ උයනෙහි නෙළුම්විලක ක්‍රීඩා කරන්නාහු පරවෙවී යන එක එක පියුමක්බලා පඤ්චස්කන්ධයෙහි අනිත්‍යතාවය මෙනෙහි කොට ප්‍රත්‍යකබෝධඥානය උපදවා ගත්හ.

මේ ඒ පසේබුදුවරයන් වහන්සේලා ය. ඉසිගිලි සූත්‍රය පිළිබඳ පෙළෙහි නම් සඳහන් පසේබුදුවරයෝ අරිට්ඨාදි තෙලෙස් (13) නමකි. උන්වහන්සේලාගේ නම් ඇතුළුව නමන් අසූනව (89) නමක් ඇත ඟාථාවල සඳහන්වෙයි. එවිට මෙහි සඳහන් පසේ බුදුවරයන්ගේ ගණන 102 නමකි.

ආනන්ද ආදි පසේබුදුවරයන් මෙන් එකනම ඇති පසේබුදුවරයෝ ගණනාවකි. උන්වහන්සේලාගේ නම් සිඟල්ලම ඇතුළත් නොකළඟැකි බැයින් "එතෙ ව අඤ්ඤෙ ව මහානුභාවා"යි වදළහ.

ඉසිගිලි සූත්‍රයෙහි දහම් විසඳුරය නිමි.

මහා කස්සපතේර බෝජ්ඣඞ්ගය, මහා මොග්ගල්ලානතේර බෝජ්ඣඞ්ගය, මහා චුන්දතේර බෝජ්ඣඞ්ගය, හිරිමානන්ද සූත්‍රය, ඉසිගිලි සූත්‍රය යන පස් පිරිතෙන් යුත් දෙවන විණ්ඩය නිමි.

ආටානාටිය සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා, රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ, අථ ඛො චත්තාරො මහාරාජා, මහතියා ච යක්ඛ

සෙසාය, මහතියා ච සක්කබ්බසෙසාය, මහතියා ච කුමහණ්ඩ සෙසාය, මහතියා ච සාගරසන්නාය, චතුද්දිසං රක්ඛං ඨපෙත්වා, චතුද්දිසං ගුම්බං ඨපෙත්වා, චතුද්දිසං ඔවරණං ඨපෙත්වා, අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා, කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා, යෙන භගවා තෙනුපසංකමිංසු උපසංකමිත්වා, භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, තෙපි ඛො යක්ඛා, අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ යෙන භගවා, තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො පෙසවණෝ මහාරාජා භගවන්තං එතදවොච.

සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො පසන්නා.

යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා, අප්පසන්නා යෙව භගවතො, තංකිස්සහෙතු, භගවා හි භන්තෙ පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති, අදින්නාදානා වෙරමණියා ධම්මං දෙසෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාදා වෙරමණියා ධම්මං දෙසෙති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති,

යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා, අප්පටිවිරතා යෙව පාණාතිපාතා, අප්පටිවිරතා අදින්නාදානා, අප්පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා, අප්පටිවිරතා මුසාවාදා, අප්පටිවිරතා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, තෙසං තං හොති අප්පියං අමනාපං, සන්ති හි භන්තෙ භගවතො සාවකා, අරඤ්ඤෙ වනපත්ථානි පන්නානි සෙනාසනානි පටිසෙවන්ති, අප්පසද්දානි අප්පනිග්ඝොසානි, විජන වාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි තත්ථ සන්නි උළාරා යක්ඛා නිවාසිනො, යෙ ඉමස්මිං භගවතා පාවචනෙ අප්පසන්නා, තෙසං පසාදාය, උග්ගණ්හාථ භන්තෙ භගවා ආටානාටියං රක්ඛං

භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං, ඉතෙතියා රක්ඛා,
ය අධිහාසාය එාසුවිහාරාය'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන,
අථ බෝ වෙස්සවණෝ මහාරාජා භගවතෝ අධිවාසනං විදිත්වා,
තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි.

විපස්සිස්ස නමත්ථු චක්ඛුමන්තස්ස සිරීමතෝ,
සිඛියස්'පි නමත්ථු සබ්බභූතානුකම්පිනෝ.

වෙස්සභුස්ස නමත්ථු නහාතකස්ස තපස්සිනෝ,
නමත්ථු කකුසන්ධස්ස මාරසෙනා පමද්දිනෝ.

කොණාගමනස්ස නමත්ථු බ්‍රාහ්මණස්ස වුසීමතෝ,
කස්සපස්ස නමත්ථු විපමුත්තස්ස සබ්බධි.

අඞ්ගීරසස්ස නමත්ථු සක්‍යපුත්තස්ස සිරීමතෝ,
යෝ ඉමං ධම්මමදෙසෙසි සබ්බදුක්ඛාපනූදනං.

යෙවාපි නිබ්බුතා ලොකෙ යථාභූතං විපස්සිසුං,
තෙ ජනා අපිසුණා මහන්තා වීතසාරදා.

හිතං දෙවමනුස්සානං යං නමස්සන්ති ගොතමං,
විජ්ජාචරණසම්පන්නං මහන්තං වීතසාරදං.

යතෝ උග්ගච්ඡති සූරියෝ ආදිච්චෝ මණ්ඩලී මහා,
යස්සවුග්ගච්ඡමානස්ස සංවරීපි නිරුජ්ඣති.

යස්ස වුග්ගතෙ සූරියෙ දිවසෝ'ති පවුච්චති,
රහදෝ'පි එත්ථ ගම්භීරෝ සමුද්දෝ සරිතොදකෝ.

එවං තං තත්ථ ජානන්ති සමුද්දං සරිතොදකං,
ඉතෝ සා පුරිමා දිසා ඉතිනං ආචික්ඛති ජනෙ,
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සි සෝ
ගන්ධබ්බානං ආධිපති ධතරට්ඨෝ ඉති නාමසෝ,
රමති නච්චගීතෙහි ගන්ධබ්බෙහි පුරක්ඛතෝ
පුත්තා'පි තස්ස බහවෝ එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකෝ ච ඛන්ධනාමා මහබ්බලා.

තෙවාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්ච බන්ධුනං,
දූරතෝ'ව නමස්සන්ති මහන්තං වීතසාරදං,
නමෝ තෙ පුරිසාජඤ්ඤ නමෝ තෙ පුරිසුත්තම.
කුසලෙන සමෙක්ඛන්ති අමිත්‍රසා'පි තං වදන්ති,
සුතං මනතං අභිණ්හසෝ තස්මා එවං වදෙමසෙ.

ජිතං වන්දථ භොතමං ජිතං වන්දාම භොතමං,
විජිතාවිරණ සම්පන්නං බුද්ධං වන්දාම භොතමං.

යෙන දෙවා පවුච්චන්ති පිසුණා පිටඨිමංසිකා,
පාණාතිපාතිනෝ ලුද්දා චොරා තෙකතිකාජනා.

ඉතො සා දක්ඛිණා දිසා ඉති සං ආචික්ඛති ජනතා
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සිභෝ.

කුම්භාණ්ඩානං ආධිපති විරූළ්හෝ ඉති නාමභෝ,
රමිති නච්චගීතෙහි කුම්භණ්ඩෙහි පුරක්ඛතෝ.

පුත්තා'පි තස්ස බහවෝ එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකෝ ච ඉන්දනාමා මහබ්බලා.

තෙවා'පි බුද්ධං දිස්වාන බුද්ධ ආදිච්ච බන්ධුනං
දූරතෝ'වනමස්සන්ති මන්තනං විතසාරදං.
නමෝ තෙ පුරිසාජඤ්ඤ නමෝ තෙ පුරිසුත්තම.

කුසලෙන සමෙක්ඛසි අමනුස්සා'පි තං වන්දන්ති,
සුතං තෙතං අභිණ්හසෝ තසමා එවං වදෙමසෙ.

ජිතං වන්දථ භොතමං ජිතං වන්දාම භොතමං,
විජිතාවරණ සම්පන්නං බුද්ධං වන්දාම භොතමං.

යත්ථ වොහඤ්ඤති සූරියෝ ආදිච්චෝ මණ්ඩලී මහා,
යත්ථ වොහඤ්ඤමානස්ස දිවසෝ'පි නිරුජ්ඣති.

යස්ස වොහාතෙ දූරතෙ සංවරිත්ව පවුච්චති,
රහදෙ'පි තත්ථ ගම්භීරෙ සම්බුද්ධා සරිතොදකෙ.

එවන්නං තත්ථ ජානන්ති සම්බුද්ධා සරිතොදකා,
ඉතො සා පච්ඡිමා දිසා ඉති සං ආචික්ඛති ජනතා,
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සිභෝ.

නාගානං ආධිපති විරූපක්ඛෝ ඉති නාමභෝ
රමිති නච්චගීතෙහි නාගෙහි පුරක්ඛතෝ.

පුත්තා' පි තස්ස බහවෝ එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකෝ ච ඉන්දනාමා මහබ්බලා.

තෙවා'පි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතෝ'ව නමස්සන්ති මන්තනං විතසාරදං,
නමෝ තෙ පුරිසාජඤ්ඤ නමෝ තෙ පුරිසුත්තම.

කුසලෙන සමෙක්ඛසි අමනුස්සා'පි තං වන්දන්ති,
සුතං තෙතං අභිණ්හසෝ තසමා එවං වදෙමසෙ.

ජිනං වන්දත මොතමං ජිනං වන්දම මොතමං,
ජිජාවරණ සමාහානං බුද්ධං වන්දම මොතමං.

යෙන උත්තරකුරුරම්මා මහාමෙරු සුදස්සනා,
මන්‍රස්සා තත්ථ ජායන්ති අම්මා අපරිගහා

න තෙ බීජං පවපන්ති නපි නීයන්ති නඞ්ගලං
අකට්ඨපාකිමං සාලිං පරිභුඤ්ජන්ති මානුසා.

අකණං අථුසං සුද්ධං සුඛං තණ්ඩුලපඵලං,
තුණ්හීභූතෙ පවිත්වාන තතො භුඤ්ජන්ති භොජනං.

ගාවිං එකබ්බුරං කත්වා, අනුයන්ති දිසා දිසං,
පසුං එකබ්බුරං කත්වා අනුයන්ති දිසො දිසං

ඉත්ථිවාහනං කත්වා අනුයන්ති දිසො දිසං,
පුරිසවාහනං කත්වා අනුයන්ති දිසො දිසං.

කුමාරිවාහනං කත්වා අනුයන්ති දිසො දිසං,
කුමාරවාහනං කත්වා අනුයන්ති දිසා දිසං.

තෙ යානෙ අභිරුහිත්වා සබ්බා දිසා අනුපරියන්ති පවාරා
(තසස රාජිනො)

හත්ථියානං අස්සයානං දිබ්බං යානං උපට්ඨිතං,
පාහාදෙ සිවිකා චෙව මහාරාජස්ස යසසිනො.

තස්ස ච නගරා ආහු අනතලිකෙඛ සුමාපිතා,
ආටානාටා කුසිනාටා පරකුසිනාටා නාටපුරියා
පරකුසිතනාටා.

උත්තරෙන කපිවන්තා ජනොඝමපරෙන ච,
නවනවතියෝ අම්බරඅම්බරවතියෝ ආලකමන්දූ නාම
රාජධානී.

කුවෙරසස බො පන මාරිස මහාරාජසස විසාණානාම
රාජධානී
තසමා කුවෙරො මහාරාජා වෙසසවණොති පවුච්චති.

පවෙච්ඡනෙත්තා පකාසෙන්ති තතොලා තත්තලා තතොතලා
ඔජසී තෙජසි තතොජසි සුරෝ රාජා අරිට්ඨෝ හෙම්.

රහදෙ'පි තත්ථ ඔරඤ්ඤානාම යතො සමිසා පවිසන්ති (වස්සා
යමිතා පතායන්ති
සභා'පි තත්ථ සගලවතී නාම යත්ථ යක්ඛා සන්නිරුපාසන්ති.

තස්මි සිවව ඵලා රුක්ඛා සාඛා දිජගණා යුතා,
මයූරකොඤ්චාභිරුදා සොභන්ති හිමවග්ගුහි.

ජීවඤ්ජීවකසද්දත්ථ අථෝ ඔට්ඨවචත්තනා,
කුකුත්ථකා කුලිරකා වනෙ පොක්ඛරසාතියා.

සුකසාලිනසද්දත්ථ දණ්ඩමාතවකානි ච,
සොභන්ති සබ්බකාලං සා කුඤ්ජර තලිනී සදා.

ඉතො සා උත්තරා දිසා ඉති නං ආචික්ඛති ජනෙ,
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සිසා

යක්ඛානං ආධිපති කුවෙරෙ ඉති හාමසා,
රමති තව්හගිනෙහි යක්ඛෙහි පුරක්ඛතා.

පුත්තා පි තස්ස බහවෙ එකත්තාමා'ති මෙ සුතං,
අසිතිං දස එකෙ ව ඉන්දනාමා මහබ්බලා

තෙ චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතෙ'ව නමස්සන්ති මහන්තං විතසාරදං,

නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම.

කුසලෙන සමෙක්ඛසි අමනුස්සා'පි නං වන්දන්ති,
සුතං නෙතං අභිණ්හසො තස්මා එවං වදෙමසෙ.

ජිතං වන්දථ ගොතමං ජිතං වන්දති ගොතමං,
විජ්ජාචරණ සම්පන්නං බුද්ධං වන්දාම ගොතමං.

අයං බො සා මාරිස ආටානාටියා රක්ඛා, භික්ඛූ නංභික්ඛුනීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායා'ති.

යස්ස කස්සචි මාරිස භික්ඛුස්ස වා භික්ඛුණියා වා, උපාසකස්ස වා උපාසිකාය වා, අයං ආටානාටියා රක්ඛා, සග්ගහිතා භවිස්සති සම්මතා පරියාපුතා, තෙසඤ්ච අමනුස්සෙසා; යක්ඛෙ වා යක්ඛිණි වා, යක්ඛපොතකෙ වා යක්ඛපොතිකා ව, යක්ඛමහාමත්තා වා යක්ඛ පාරිසජ්ජා වා යක්ඛපච්චත්ථිකා වා, ගන්ධබ්බා වා ගන්ධබ්බි වා, ගන්ධබ්බපොතකෙ වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බමහාමත්තා වා ගන්ධබ්බපාරිසජ්ජා වා ගන්ධබ්බපච්චත්ථිකා වා, කුම්භණ්ඩා වා කුම්භණ්ඩි වා, කුම්භණ්ඩ පොතකෙ වා කුම්භණ්ඩපොතිකා වා කුම්භණ්ඩ මහාමත්තා වා කුම්භණ්ඩපාරිසජ්ජා වා කුම්භණ්ඩපච්චත්ථිකා ව, නාගා වා නාගිනියා වා, නාගපොතකා වා නාගපොතිකා වා නාගමහාමත්තා වා නාගපාරිසජ්ජා වා නාගපච්චත්ථිකා වා, පදුට්ඨචිත්තා. ඔවජ්ජතං වා අත්‍රග්ගවිජ්ජය්‍ය, සීතං වා උපයිට්ඨ්‍ය,

නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, න මේ සෝ මාරිස අමනුස්සෝ ලභෙය්‍ය, ගාමෙසු වා නිගමෙසු වා, සක්කාරං වා ගරුකාරං වා, න මේ සෝ මාරිස අමනුස්සෝ ලභෙය්‍ය, ආලකමන්දස්ස රාජධානියා වත්ථු වා වාහං වා, න මේ සෝ මාරිස අමනුස්සෝ ලභෙය්‍ය, යක්ඛානං සම්මිං ගන්තු, අදිසසූනං මාරිස අමනුස්සා, අනවයහංපි නං කරෙය්‍යුං අවිදයහං, අදිසසූනං මාරිස අමනුස්සා, අත්තාහිපි පරිපුණ්ණා හි පරිහාණාහි පරිහාණෙය්‍යුං, අපියසූනං මාරිස අමනුස්සා රිත්තා පි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං, අපියසූනං මාරිස අමනුස්සා, සභාගධාපිසස බුද්ධං ඵාසුලය්‍යුං.

සන්නි හි මාරිස අමනුස්සා වණ්ඩා රුද්දා රභසා, තෙ තෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛෙ තෙ මාරිස අමනුස්සා, මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

සෙය්‍යථා'පි මාරිස රඤ්ඤො මාගධස්ස විජිතෙචොරා, තෙ තෙව රඤ්ඤො මාගධස්ස ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛෙ තෙ මාරිස චොරා, රඤ්ඤො මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති.

එවමෙව ඛෙ මාරිස සන්නි හි අමනුස්සා වණ්ඩා රුද්දා රභසා, තෙ තෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛෙ තෙ මාරිස අමනුස්සා, මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

යො හි කොචි මාරිස අමනුස්සෝ, යක්ඛෙ වා, යක්ඛිණිං වා යක්ඛපොතකෙ වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තා වා යක්ඛපාරිසජ්ජා වා යක්ඛපච්චාරෝ වා, ගන්ධබ්බෙ වා ගන්ධබ්බිං වා, ගන්ධබ්බපොතකෙ වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බ මහා මත්තා වා ගන්ධබ්බපාරිසජ්ජා වා ගන්ධබ්බපච්චාරෝ වා, කුම්භණ්ඩෙ වා කුම්භණ්ඩිං වා, කුම්භණ්ඩපොතකෙ වා කුම්භණ්ඩපොතිකා වා කුම්භණ්ඩමහාමත්තා වා, කුම්භණ්ඩපාරිසජ්ජා වා කුම්භණ්ඩපච්චාරෝ වා, නාගෙ වා නාගිනිං වා, නාගපොතකෙ වා නාගපොතිකා වා, නාගමහාමත්තා වා නාගපාරිසජ්ජා වා නාගපච්චාරෝ වා, පදුට්ඨචිත්තා, භික්ඛුං වා භික්ඛුණිං වා, උපාසකං වා උපාසිකං වා, ගවජ්ඣන්තං වා අනුබන්ධෙය්‍ය, ඨිතං වා උපනිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, ඉමෙසං යක්ඛානං

මහා යක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං විකඤ්ඤාපෙතබ්බං විරවිතබ්බං, අයං යක්ඛෝ හණතීති, අයං යක්ඛෝ ආවිසති, අයං යක්ඛෝ ඛෙළේති, අයං යක්ඛෝ විඡඹතීති, අයං යක්ඛෝ හිංසති, අයං යක්ඛෝ විහිංසති, අයං යක්ඛෝ න මුඤ්චතීති.

කතමේසං යක්ඛානං, මහා යක්ඛානං සෙනාපතීනං මහාසේනාපතීනං?

ඉන්දෝ සෝමෝ වරුණෝ ච භාරද්වාජෝ පජාපති,
චන්දනෝ කාමසෙට්ඨෝ ච කිනන්නුසණ්ඩු නිසණ්ඩු ච
පණාදෝ ඔපමඤ්ඤෝ ච දෙවසූතෝ ච මාතලී,

චිත්තසේනෝ ච ගන්ධබ්බා නලෝ රාජා ජනේසභෝ,
සාතාගිරා හෙමවතා පුණ්ණකා කරතියෝ ගුළෝ

සිවකෝ මුචලින්දෝ ච වෙස්සාමිත්තා යුගන්ධරා
හාපාලෝ සුපත්තඛෝ ච හිරිනෙත්ති ච මන්දියෝ

පඤ්චාලචණ්ඩා ආලවකෝ පජ්ජුන්නා සුමනෝ
සුමුඛෝ දධිමුඛෝ
මණී මානි චන්දෝ දීඝෝ අථෝ සෙරිස්සකෝ සහ.

ඉමේසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං, මහාසේනාපතීනං උජ්ඣාපෙතබ්බං විකඤ්ඤාපෙතබ්බං විරවිතබ්බං, අයං යක්ඛෝ හණතීති, අයං යක්ඛෝ ආවිසති, අයං යක්ඛෝ ඛෙළේති, අයං යක්ඛෝ විඡඹතීති, අයංයක්ඛෝ හිංසති, අයං යක්ඛෝ විහිංසති, අයං යක්ඛෝ න මුඤ්චතී' ති

අයංඛෝ සා මාරිස ආටානාටියා රක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරායා'ති.

සාධු වදති මයං මාරිස ගවජ්ජාම, බහුකිච්චා මයං බහුකරණීයා'ති, යස්සදානි තුම්හෙ කාලං මඤ්ඤථා' ති

අථ ඛෝ චිත්තාගිරා මහාරාජා උට්ඨායාසනා, භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු, තෙ'පි ඛෝ යක්ඛා උට්ඨායාසනා, අපෙපකඤ්චෙව භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු, අපෙපකඤ්චෙව භගවතා සද්ධිං සම්මෝදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා තත්ථෙවන්තරධායිංසු, අපෙපකඤ්චෙවයෙන භගවා, තෙනඤ්ජලිං පණාමෙත්වා තත්ථ

වන්තරධායිංසු, අපෙපකදේ නාමිදාතානං සාවෙන්ති තදහ වන්තරධායිංසු, අපෙපකවෙව තුණ්හිභූතා තදහවන්තරධායිංසූති.

තතියක භාණවාරං

අථ ඛෝ භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි, ඉමං භික්ඛවෙ රත්තිං චත්තාරෝ මහාරාජා, මහතියා ච යක්ඛසෙනාය —පෙ— යෙනාහං තෙනුපසංකම්ංසු —පෙ— උග්ගණ්හාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං, පරියාපුණාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං, ධාරෙථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං, අත්ථසංහිතාය භික්ඛවෙ ආටානාටියං රක්ඛං, භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ඵුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරාය ති. ඉදමවොච භගවා අත්තමනා තෙභික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ආටානාටිය සුත්තං නිට්ඨිතං

චතුත්ථක භාණවාරං නිට්ඨිතං

සිංහලානුවාදය

ආටානාටිය සූත්‍රය

(ආනන්දස්ථවිර නම් වූ) මා විසින් (මේ ආටානාටිය සූත්‍රය) මෙසේ අසන ලදී. එක්සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර සමීපයෙහි වූ නිජ්ඣකූට පර්වතයෙහි වැඩවාසය කර වදාරන සේක. එකල සතරවරම් මහරජදරුවරු මහත්වූ යක්ෂ, ගාන්ධර්ව, කුම්භාණ්ඩ, නාග සේනාවන්හෙන් සතර දිශාවෙහි ආරක්ෂා පිහිටුවා, සතර දිශාවෙහි අතුරු දෙදිග සහබල සෙනඟ පිහිටුවා, සතර දිගට මුහුණලා සොළොස් සතර දිශාන්තර ලෙස සේනා පිහිටුවා රාත්‍රියෙහි පෙරයම ඉක්මුණු කල්හි අභිරාම ශරීරවර්ණ ඇති වූ නිජ්ඣකූටය භාත්පසින් එකාලොක කොට බබුළුවා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ යම් තැනක ද, එතැනට එළඹියහු ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට එකත්පසෙක හුන්නාහු ය. ඒ යක්ෂයෝ ද සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේව ද එකත්පසෙක හුන්නාහු ය. සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටුවූවාහු ය. සතුටු විය යුතු වූ සිහිකට යුතු වූ කථාවෙන් පවත්වා එකත්පසෙක හුන්නාහු ය. සමහර කෙනෙක් බුදුරජාණන් වහන්සේ යම් තැනෙක ද, එතැන්හි දෙහොත්මුදුන් දී වැඳ එකත්පස්ව හුන්නාහු ය. සමහර යක්ෂ

කෙනෙක් (සම්සැමගේ) නාමඝොෂය කියා එක්පයෙක හුන්නා හු ය. අමනුෂ්‍ය යක්ෂ කෙනෙක් නිශ්ශබ්දව එකත්පස්ව හුන්නාහු ය. එකත්පසක හුන්නා වූ වෛශ්‍රවණ මහරජතෙම භාග්‍යවතුන් වහන්සේට මේ මාතු කියන වචනය කිවේ ය.

සවාමීනි, භාග්‍යවතුන් වහන්සේට අකැමැති මහේශාක්‍ය යක්ෂයෝ ඇත්තාහුම ය. සවාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පහන් මිහිතුකාව සමපන්න යක්ෂයෝත් ඇත්තාහු ය. සවාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙයි නො පහන් මධ්‍යම ආනුභාව ඇත්තාවූ යක්ෂයෝ ඇත්තාහු ය. සවාමීනි, භාග්‍යවතුන් වහන්සේට පැහැදුණු මධ්‍යම ආනුභාව ඇති යක්ෂයොත් ඇත්තාහු ය. සවාමීනි, භාග්‍යවතුන් වහන්සේට ප්‍රසන්න වූ අල්පේශාක්‍ය වූ යක්ෂයෝ ඇත්තාහු ම ය. සවාමීනි භාග්‍යවතුන් වහන්සේට ප්‍රසන්නවූ අල්පශාක්‍යවූ යක්ෂයෝ ඇත්තාහුම ය.

සවාමීනි, යක්ෂයෝ බොහෝ සේ වනාහි භාග්‍යවතුන් වහන්සේට අප්‍රසන්නයෝ ම ය. ඊට හේතු කවරේ ද යත්?:- සවාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහි ප්‍රාණඝාතයෙන් වැළකීම පිණිස ධම්දෙශනා කරන සේක; නුදුන්දෙය ගැන්මෙන් වැළකීම පිණිස ධම් දෙශනා කරන සේක; කාමමිථ්‍යාචාරයෙන් වෙන්වන පිණිස ධම් දෙශනා කරන සේක; බොරුකීමෙන් වෙන්වන පිණිස ධම් දෙශනා කරන සේක; ඒ ප්‍රමාදයට හේතුවන රහමේර පීමෙන් වෙන්වන පිණිස ධම්දෙශනා කරන සේක.

සවාමීනි, බොහෝ යක්ෂයෝ එකාභි යතුන් මැරීමෙන් නො වැළැක්ෂාහු ම ය; අදත්තාදානයෙන් නො වැළැක්ෂාහු ම ය; කාම මිථ්‍යාචාරයෙන් නො වැළැක්කාහු ම ය; බොරු කීමෙන් නො වැළැක්ෂාහු ම ය; මේයට හා ප්‍රමාදයට හේතුවන රහමේර පීමෙන් නො වැළැක්ෂාහු ම ය. යක්ෂයින්ට ඒ ධම්දෙශනාව අප්‍රිය වන්නේ ය. අමනාප වන්නේ ය.

සවාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වූ භික්ෂූ සංඝයා වහන්සේ ඇතිසේක් ම ය. ඒ ශ්‍රාවකයෝ අරණ්‍ය සේනාසන ද, මූලෘක්ෂාරාචාර ඉක්මවා පැවති සෙනසුන් ද, ප්‍රාන්ත සෙනසුන් ද, සේවනය කෙරෙති. ඒවා නිශ්ශබ්දය; කොලාහල නැත්තාහ; ජනවාසයෙන් උපදනා පවන් නැත්තාහ; මනුෂ්‍යයන්ගේ රහසට යොග්‍ය ය, විවේකකාග්‍රතාවට සුදුසු ය. ඒ අරණ්‍යාදි සේනාසන වල නිබඳ වාසය කරන්නාවූ ආනුභාව සම්පන්න යක්ෂයෝ ඇත්තාහ. ඒ යම් යක්ෂ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේගේ ශාසන

මෙහි තො පැහැදුණාහු ද, ඔවුන්ගේ ප්‍රසාදය ඇති කරවනු පිණිසය.

සවාමිනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ද, භික්ෂුණීන්ට ද, උපාසකවරුන්ට ද, උපාසිකාවන්ට ද, උදුරු වැලැක්වීම පිණිස, ආරක්ෂාව පිණිස, වවසෙස නොවන පිණිස, සෙසෙහෙන් විසීම පිණිස ආටානාටිය නම්වූ පිරිත ඉගෙන වදුරන සේක්වා යි දන්වූයේ ය, භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දතාවෙන් ඉවසා වදාළසේක. ඉක්බිති වෛශ්‍රවණ මහරජතෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන ඒ වේලාවෙහි මේ ආටානාටිය පිරිත ප්‍රකාශ කෙළේ ය.

පහැයින් හා රූපශ්‍රීයෙන් ද ඥානශ්‍රීයෙන් ද යුක්තවූ විපස්සි බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා, සියලු සත්වයන් කෙරෙහි පතළ කරුණාවෙන් යුක්තවූ සිඛි බුදුරජාණන් වහන්සේට ද නමස්කාර වේවා.

නිහතකෙලෙසී වූ තෙලෙස්සුන් තවන විසී ඇති වෙස්සභූ බුදුරජාණන්වහන්සේට නමස්කාර වේවා; පඤ්චමාරයන් මැදීනය කළා වූ කකුසඳ බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා;

බාහිතපාපී වූ වැස නිමවනලද මාඝීබ්‍රහ්මචරියා ඇති කොනා ගමන බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!; සියලු කෙලෙස් සුන්ගෙන් නිදහස්වූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා;

යම් බුදුවරයෙක් තෙම සියලු සතරදුක් දුරුකරන්නාවූ මේ ධර්මය දෙසී ද, රූපශ්‍රීයෙන් හා ඥානශ්‍රීයෙන් යුක්තවූ ශාක්‍යපුත්‍රවූ ශරීරාඛ්‍යයෙන් හා ඥානාඛ්‍යයෙන් නික්මෙන රශ්මි ඇති (ගෞතම බුදුරජාණන් වහන්සේව) නමස්කාර වේවා;

ලොකයෙහි යම් රහතන් වහන්සේ නමක් නෙලඟ පරිනිර්වාණයෙන් නිවීයේ ද, තත්වූ පරිද්දෙන් විදර්ශනා කෙළේ ද, ඒ රහතන් වහන්සේ පිසුණු බස් නොකියන්නාහ, මහත්බවට පැමිණියහ, විශාරදයහ. (මෙබදු ගුණයුක්ත රහතන් වහන්සේට ද නමස්කාර වේවා)

ත්‍රිවිද්‍ය, අෂ්ටවිද්‍ය, පසළොස් වරණධර්මයන්ගෙන් යුක්තවූ මහත් වූ ගුණානුභාවයෙන් යුක්තවූ විශාරදවූ දෙව් මිනිසුන්ට හිතවත් වූ යම් ගෞතම සම්බුදුරජාණන් වහන්සේ නමකට (සමස්ත ලොකවාසීහු)

නමස්කාර කෙරෙත් ද, ඒ සම්බුදුගන්වහන්සේට ද නමස්කාර වේවා;

ආදිත්‍ය පුත්‍රවූ දිලිසෙන මහත් මඩුලු ඇති සුසීමතම යම් දිශාවකින් උදව රාත්‍රිය අනතර්ධාන කෙරේ ද

දවසෑයි කියනු ලබන කාලය උදා කෙරේ ද, ඒ දිශාවෙහි ඇඹුරුවූ, පතළාවූ ජලය ඇති ජලනිධියක් ඇත්තේ ය.

එය සමුද්‍රය යි දනිති. මේ මේරුපර්වතයෙන් පූර්වදිශාව කෙයින් ජනතෙමේ ඒ දිශාවට පූර්වදිශාව (නැගෙනහිර) යයි කියයි

නැගෙනහිරය යි නම්ලත් යම් දිශාවක් වේ ද, ඒ දිශාව යස පිරිවර ඇත්තාවූ, ගන්ධර්වයන්ව අධිපතිවූ ධෘතරාෂ්ට්‍ර නම් මහරජ තෙම පාලනය කරයි.

හෙතෙම ගන්ධර්වයන් විසින් පිරිවරනලදුව නෘත්‍යගීතමයෙන් සිත් අලවයි ඔහුට එකතම් ඇති බොහෝ පුත්තු ඇත්තාහ යි මා විසින් අසනලදි.

ඉඳ නම් ඇති මහත්බල ඇති ඒ පුත්තු අසුවක් + දසයක් හා එකකි. හෙවත් එකානූවකි. ඔවුහු ද ආදිවම බඹුවූ බුදුන් දැක

මහත්බවට පැමිණි විශාරදවූ බුදුරජාණන්වහන්සේට "පුරුෂ ජානීයය ඔබවහන්සේට නමස්කාර වේවා, පුරුෂශ්‍රේෂ්ඨය ඔබ වහන්සේට නමස්කාර වේවා," යි දුරදීම වඳිත්.

නිරවද්‍ය වූ නිපුණවූ සම්බුදුකැතෙන් මහාජනයා බලන්නේ යයි කියා අමනුෂ්‍යයෝද ඔබවහන්සේට වඳිති යි අප විසින් නිතර අසනලදි. ඒ නිසා අපි පස්මරුන් දිනූ ගෞතම ගොත්‍රයෙහි වූ සම්බුදුන් වහන්සේට වඳිවි යයි යක්ෂයන්ට කියමු. ඔවුහු ද ගෞතම ගොත්‍රයෙන් උපන් ජිත නම්වූ සම්බුදුන් වහන්සේට වඳිමු; විද්‍යා චරණගුණයෙන් යුත් ගෞතමයන් වහන්සේට වඳිමු යයි කියති.

මළ සිරුරුත්, කේළාම් කියන්නොත්, අනභිමුඛයේ නිතු කරන්නොත් සතුන් මරන්නොත් රෞද්‍රයොත්, වෛරයොත් වඤ්චනිකයොත් බැහැරකිරීම පිණිස යම් දිශාවකින් ගෙනයනු ලැබෙනියි කියනු ලැබෙත් ද,

මහාමේරු පර්වතයන් දකුණෙහි වූ කෙයින් ඒ දිශාවට දකුණු දිග යයි ජනයා කියති. කුම්භාණ්ඩයන්ට අධිපති, යසස් ඇති විරූළ්හ නම් මහරජතෙම යම් දිශාවක් පාලනය කෙරේනම් හෙ ද මේ දකුණු දිශාවයි ඔහු එහි කුම්භාණ්ඩයන් විසින් පිරිවරන ලදුව නෘත්‍ය ගීතමයෙන් සිත් අලවා වෙසෙයි.

ඔහුව ද එක නමින් යුත් බොහෝ පුත්තු ඇතැයි මා විසින් අසනලදී. ඉඳු නමැති මහත් බලැති ඔවුහු ද අසුවක්, දසයක්, හා එකකි. කෙවත් එකානුජවකි.

ඔවුහු ද ආදිවම බඹුවූ බුදුන් දැක මහත්බවට පැමිණි විශාරද වූ උනාවහන්සේට "පුරුෂාජානීයය, ඔබවහන්සේට නමස්කාර වේවා, පුරුෂශ්‍රේෂ්ඨය, ඔබවහන්සේට නමස්කාර වේවා"යි දුරදීම වදින්.

ඔබ නිරවද්‍යවූ නිපුණවූ සර්ව්ඥ ඥානයෙන් මහාජනයා බලන සේකැ යි අමනුෂ්‍යයන් ද, ඔබ වහන්සේව වඳින බව අප විසින් නිතර අසනලදී. එහෙයින් පස්මරුන් දිනූ ගෞතම මහාන්ත්‍රික සර්ව්ඥයන් වහන්සේව නමස්කාර කරවුදැයි අප විසින් අසනලද යක්ෂයෝ "ගෞතම මහාත්‍රයෙහිවූ ජීන නම්වූ සර්ව්ඥයන් වහන්සේව වඳිමු, විද්‍යාචරණගුණයෙන් යුත් ගෞතමයන් වහන්සේව වඳිමු, යයි කියති.

අදිනි පුත්‍රවූ දිලිසෙන මහත් මඩුලු ඇති සුසීතෙම යම් දිසාව කින් අසනංගතව දවස නිරුද්ධ කෙරේ ද,

රාත්‍රිය යි කියනු ලබන කාලය ඇති කෙරේ ද, ඒ දිසාවෙහි ගැඹුරුවූත් පතළ ජලය ඇත්තාවූත් ජලනිධියක් ඇත්තේ ය.

එය සමුද්‍රය යි කියති මේ ඉහාමේරු පර්වතයෙන් පශ්චිම දිසාව හෙයින් ජනතෙමේ ඒ දියාවට පශ්චිම දිසාව හෙවත් බවභිරය යි කියති නාගයන්ට අධිපති මහා යශස් ඇති විරූපාක්ෂ නම් මහරජ තෙම යම් දිසාවක් පාලනය කෙරේ නම් ඒ සම් පශ්චිම දිසාව යි ඔහු එහි නාගයන් විසින් පිරිවරන ලදුව නෘත්‍ය ගීතයෙන් සිත් අලවා මවසෙයි.

ඔහුට ද එකම නමින් යුත් බොහෝ පුත්තු ඇත්තාහ යි මා විසින් අසනලදී. ඉඳු නමැති මහත් බලැති ඔවුහු ද අසුවක්, දහයක් හා එකෙකි හෙවත් එකානුජවෙකි.

ඔවුහු ද ආදිවම බඹුවූ මහත්බවට පැමිණි විශාරද වූ බුදුන් දැක "පුරුෂාජානීයය, ඔබවහන්සේට නමස්කාර වේවා; පුරුෂ ශ්‍රේෂ්ඨය ඔබ වහන්සේට නමස්කාර වේවා" යි දුරදී ම වඳින්.

ඔබ නිරවද්‍යවූ නිපුණවූ සර්ව්ඥතාඥානයෙන් මහාජනයා බලන සේකැ යි අමනුෂ්‍යයන් ද ඔබවහන්සේට වඳිනබව අප විසින් නිතර අසා ඇත එහෙයින් පස්මරුන්දිනූ ගෞතමමහාන්ත්‍රික සර්ව්ඥ

යන් වහන්සේට නමස්කාර කරවූදෑ යි අප විසින් අසනලදැ යක්ෂයෝ "අපි ගෞතම බොහෝ ජීන නම්වූ සම්බුදුහන් වහන්සේ වැඳිමු," විද්‍යාචරණගුණ සම්පන්න ගෞතමයන් වහන්සේට වැඳිමු" යයි කියති.

යම් දිගාවක රජ්ජුවූ උතුරුකුරු දිවයින ඒ ද සුදශීන වූ මහා මේරු පර්වතය වේ ද, එහි මමත්වයක් නැති දැඩි ගැන්මක් නැති මනුෂ්‍යයෝ උපදිත්.

ඒ මනුෂ්‍යයෝ ධාන්‍ය බීජ නොවපුරත්; නගුල පාවිච්චි නොකරත්, සැළියෙහි නොපිසූ ඇල්හාලේ ඔත් අනුභව කරත්.

ඒ ඇල්හාලේ කුඩු නැත, පොතු නැත, පිරිසිදුය, සුවඳවත්ය, ඵලය වී නොව සහල්මය; මනුෂ්‍යයෝ මේ හාල සඛණීහාජනයෙහි පිස අනුභව කරත්.

දෙන ඒකඛුරවාහන කොට (අසුපිට යන්නාක් මෙන්) දිශානුදිශාවෙහි සඤ්චාරය කෙරෙති නවද සිවුපාවුන් ඒකඛුරවාහන කොට දිශානුදිශාවෙහි හැසිරෙත්,

ස්ත්‍රීවාහනකොට දිශානුදිශාවෙහි හැසිරෙත්, පුරුෂවාහන කොට හැසිරෙත්.

කුමාරිකාවන් වාහනකොට රථයෙහි යොදා දිශානුදිශාවෙහි හැසිරෙත්, කුමාරවරුන් වාහන කොට රථයෙහි යොදා ද හැසිරෙත්.

ඒ වෛශ්‍රවණ රජුගේ පිරිවර යක්ෂයෝ හස්ත්‍යශ්වාදි වාහන වලවී හැඟි සියලු දිශා වටකොට ඇවිදිති.

යසස් ඇති ඒ වෛශ්‍රවණ රජුට හස්තියානා, අශ්වයානා, දිව්‍ය යානා, ප්‍රාසාද, සිවිකා ද ඵලඹ සිටින්නේ ය. ඒ රජහට අහසෙහි මොනවට මවනලද නගරයෝ වෙත්.

ඒ ආටානාටා, කුසිනාටා, පරකුසිනාටා, නාටපුරියා, පරකුසිත නාටා යන නගරයෝ ය. තවද උතුරුදිශාවෙහි කපිවන්ත නම් නුවරෙක, දකුණු දිශාවෙහි ජනෝඝ නම් නුවරෙක තවද ඔහුට නවතැවති, අම්බර අම්බරවති ආලකමන්දා නම් රාජධානීහු ද වෙත්. (කුවේර යනු ද ඔහුට නමෙකි) මේ කුවේරට විසාණා නම් රාජධානියෙක් වෙයි. ඒ නිසා ඔහුට වෛශ්‍රවණය යි කියනු ලැබේ

වෙන වෙනම් කරුණු පරීක්ෂා කරන යක්ෂයෝ වෙන වෙන මී කරුණු ප්‍රකාශ කෙරෙති, (ඒ යක්ෂයෝ නම්:-) තතොලා නම්

යක්ෂයෙක,[1] තත්තලා නම් යක්ෂයෙක,[2] තෙත්තලා නම් යක්ෂයෙක,[3] ඔජසි නම් යක්ෂයෙක,[4] තේජසි නම් යක්ෂයෙක,[5] තේජෝජසි නම් යක්ෂයෙක,[6] සුර නම් යක්ෂයෙක,[7] රාජ නම් යක්ෂයෙක,[8] සූරරාජ නම් යක්ෂයෙක,[9] අරිට්ඨ නම් යක්ෂයෙක,[10] තේමි නම් යක්ෂයෙක,[11] අරිට්ඨ නේමි නම් යක්ෂයෙක.[12]

ඒ විශාණ නම් රාජධානියෙහි විල ද ධරණී නම් වෙයි. වැස්ස වහින්නේත් පැතිරෙන්නේත් මේ විලෙනි. වේදිව යක්ෂයන් රැස් වන භගලවතී නම් සභාවක් විල වටේට වෙයි.

ඒ ශාලාව හාත්පස නිත්‍යඵල ඇති වෘක්ෂයෝ වෙත් ඒ ඒ නානාප්‍රකාර පක්ෂිසමූහයාගෙන් ආකුලය මොහර කොස්වාලිහිණි නාදවලින් යුක්තය.

මේ විල් අවට ජීවඤ්ජීවකයන්ගේ නාදය වෙයි ඔට්ඨවචිත්තක නම් පක්ෂීහු ද, විලිකුකුල්ලු ද, පියුම් වෙනෙහි රන්වන් සකුළුවෝ ද තල්රේරු ද හැසිරෙන්නා හ.

තවද මෙහි ගිරා, සැලලිහිණි, දණ්ඩමානවක පක්ෂීන්ගේ නාදය වෙයි. මෙසේ මේ කුවේරයාගේ පොකුණ සියලුකල්හි ශොභනය.

මේ මහාමේරු පර්වතයෙන් උතුරු දිසාව යි. ඒ නිසා ජනයා ද මෙයට උතුරු දිශාවය යි කියය යි. යසස් ඇත්තාවූත් යකුන්ට අධිපතිවූත් කුවේර මහරජ යම් දිශාවක් පාලනය කෙරේ නම් ඒ මේ උතුරු දිශාව යි. ඔහු එහි යකුන් පිරිවර කොට ඇත්තේ නෘත්‍ය ගීතයෙන් යුක්තව වෙසෙයි

ඔහුට දෘඪ නමැති, මහත්බලැති බොහෝ පුත්තු-එකානූ වක් පුත්තු ඇත්තාහ යි මා විසින් අසන ලදි.

ඔවුහු ද ආදිවචනක්‍රියාවූ මහත් බවට පැමිණි, විශාරදවූ බුදුන් දුරදීම දැක "පුරුෂාජානීයය, ඔබ වහන්සේට නමස්කාරවේවා; පුරුෂශ්‍රේෂ්ඨයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා" යි වදිත්.

නිරවද්‍යවූ සර්ව්ඥඥානයෙන් මහජනයා බලන්නේය යි කියා අමනුෂ්‍යයන් ද නිතර ඔබවහන්සේව වදින බව මා අසා ඇත. ඒ නිසා මා විසින් ගෞතමගොත්‍රික ජිනයන් වහන්සේ වදිවුදු යි අසන ලද යක්ෂයෝ ජිනයන් වහන්සේ, විද්‍යාචරණ සම්පන්න ගෞතම ගොත්‍රික බුදුරජාණන් වහන්සේ වදිමුය යි කියති.

නිදුකාණන් වහන්ස, මේ ආදිකාටිය පිරිත වනාහි භික්ෂු, භික්ෂුනී, උපාසක උපාසිකාවන්ට අභ්‍යන්තර බාහිර ආරක්ෂාව සඳ

හෝ සිංහාව නොවන පිණිසත් සැපවිහරණය පිණිසත් පවත් නේ ය. නිදුකාණන් වහන්ස, භික්ෂු, භික්ෂුනී, උපාසක උපාසිකා වන්දගෙන් යමකු විසින් මේ ආටානාටිය පිරිත යහපත්ව ඉගෙන ගන්නා ලද්දේ ද, පදව්‍යඤ්ජන නොපිරිහෙලා කියන ලද්දේ ද, යම්කිසි අමනුෂ්‍යයෙක් එනම්. යක්‍ෂයෙක්, යක්‍ෂණියක්, යක්‍ෂපැටියෙක්, යක්‍ෂ පැටියක්, යක්‍ෂමහාමාත්‍යයෙක්, යක්‍ෂ පිරිස්හිවූ සෙනෙක්, යක්‍ෂ මෙහෙකරුවෙක් හෝ, ගන්ධර්වයෙක්, ගන්ධර්වස්ත්‍රියක්, ගන්ධර්වපැටියෙක්, ගන්ධර්වපැටියක්, ගන්ධර්ව මහාමාත්‍යයෙන්, ගන්ධර්ව පිරිසෙහි වූවෙක්, ගන්ධර්ව මෙහෙකරුවෙක් හෝ, කුම්භාණ්ඩයෙක්, කුම්භාණ්ඩියෙක්, කුම්භාණ්ඩ පැටියෙක්, කුම්භාණ්ඩ පැටියක්, කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක්, කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක්, කුම්භාණ්ඩ මෙහෙකරුවෙක් හෝ, නාගයෙක්, නාගිනියක්, නාගපැටියෙක්, නාගපැටියක්, නාග මහාමාත්‍යයෙක්, නාගපිරිස්හි වූවෙක්, නාග මෙහෙකරුවෙක් ප්‍රදුෂ්‍ය සිත් ඇතිව යන, හිඳින සිටින. නිදන ඔවුන් අනුව (සොල්මන් කොට) යේද, ළඟ හිඳී ද, ළඟ සිටී ද, ළඟ නිදද නිදුකාණන්වහන්ස, ඒ අමනුෂ්‍යයා ගම්නියම්ගම්වල සත්කාර ගරුකාර නොලබන්නේ ය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යා ආලකමන්දා නුවරෙහි ගෙයක් හෝ විසිමක් වත් නොලබන්නේය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යතෙම යක්‍ෂ සමාගමට යාම ද නොලබන්නේය. නිදුකාණන් වහන්ස, තවද අමනුෂ්‍යයෝ ඔහු ආවාහ විවාහයට යොග්‍ය නොකෙරෙති. නිදුකාණන් වහන්ස, තවද ඔහුට අමනුෂ්‍යයෝ (කුලාර අඝ්‍රිය, කුලාර දන්තය ආදී වශයෙන්) ශරීර ලක්‍ෂණ අනුව පරිභාස වචනයෙන් නිදුකොට බණින්නාහ. නිදුකාණන් වහන්ස, තවද අමනුෂ්‍යයෝ (ඔහුගේ) ඔලුවෙහි භික්ෂාපාත්‍රයක් මුණින් තමන්නාහ. නිදුකාණන් වහන්ස, තවද අමනුෂ්‍යයෝ ඔහුගේ මුදුන සත්කඩක් කොට පළන්නාහ.

නිදුකාණන් වහන්ස, චණ්ඩ, රෞද්‍ර, එකතෙක කරන අමනුෂ්‍යයෝ ඇත්තාහු ය. ඒ අමනුෂ්‍යයෝ සතරවරම් රජවරුන්ගේ වචනය ආදරයෙන් නොගනිත්, ඔවුන්ගේ අමාත්‍යවූ අටළොස් යක්‍ෂසේනාපතීන්ගේ වචනය ද නොගනිත්, යක්‍ෂ සේනාපතීන්ව අයත් වෙත්ත් අයගේ කිම් ද නොගනිත්, නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ සතරවරම් රජවරුන්ගේ විරුද්ධකාරයෝය කියනු ලැබෙත්.

නිදුකාණන් වහන්ස, මගධාධිපති බිම්බිසාර රජුගේ රටවැසි මවත් තම් ඔවුහු මගධරජුගේ වචනය ආදරයෙන් නොගනිත්, ඇමතියන්ගේ කියමන ද පිළි නොගනිත්, ඇමතියන්

සම්බන්ධ අයගේ කිම්වලට ද ඇහුම්කන් දෙනා දෙත්, නිදුකාණන් වහන්ස, ඒ කොරු මගධ රජුගේ විරූධකාරයෝය කි ය නු ලැබෙත්.

එමෙන් ම නිදුකාණන් වහන්ස, වණඩ, රෞද්ර, එනවෙක කරන අමනුෂ්‍යයෝත් අප අතර ඇත්තාහ. ඔවුහු වරම් රජ වරුන්ගේ කිම්වත්, ඇමතියන්ගේ කිම්වත්. ඇමති පුරුෂයන්ගේ කිම්වත් පිළි නො ගනිත්. ඒ අමනුෂ්‍යයෝ අපේ හතුරෝය කි කියනු ලැබෙත්.

නිදුකාණන් වහන්ස, යම්කිසි අමනුෂ්‍යයෙක් යක්‍ෂයෙක්' යක්‍ෂණියක්, යක්‍ෂපැටියෙක්, යක්‍ෂපැටියක්, යක්‍ෂමහාමාත්‍යයෙක්, යක්‍ෂ පිරිසෙහිවූ කෙනෙක්, යක්‍ෂ මෙහෙකරුවෙක් හෝ ගාන්ධිබ්බයෙක්, ගාන්ධිබ්බියක්, ගාන්ධිබ්බ පැටියෙක්, ගාන්ධිබ්බ පැටියක්, ගාන්ධිබ්බ මහා මාත්‍යයෙක්, ගාන්ධිබ්බ පාරිෂද්‍යයෙක්, ගාන්ධිබ්බමෙහෙකරුවෙක්, කුම්භාණ්ඩයෙක්, කුම්භාණ්ඩියක්, කුම්භාණ්ඩ පැටියෙක්, කුම්භාණ්ඩ පැටියක්, කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක්, කුම්භාණ්ඩපාරිෂද්‍යයෙක්, කුම්භාණ්ඩ මෙහෙකරුවෙක් හෝ, නාගයෙක්, නාගිනියක්, නාග පැටියෙක්, නාග පැටියක් නාග මහාමාත්‍යයෙක් නාගපාරිෂද්‍යයෙක්, නාග මෙහෙකරුවෙක්- දුශ්‍යසිතැතිව යන, සිටින, හිඳින, නිදන හික්‍ෂු වක්, හික්‍ෂුණියක්, උපාසකයෙක් හෝ උපාසිකාවක් හොල්මන් වශයෙන් අනුව යේ නම් ළඟසිටි නම් ළඟහිඳිනම් ළඟ නිදාගනිනම් මතු සඳහන් දින යකුන්ව, මහා යකුන්ව, සෙනාපතීන්ව, මහා සේනාපතීන්ව "මේ යක්‍ෂතෙම මා අල්වා ගතියි, මේ යක්‍ෂ තෙම මට ආ විඟ වන්නේය, මේ යක්‍ෂතෙම මට පීඩා කරන්නේය, මේ යක්‍ෂතෙම මට බාධාපතළ පීඩා කරන්නේය, මේ යක්‍ෂතෙම් මට හිංසා කරන්නේය, මේ යක්‍ෂා මට තදින් හිංසා කරන්නේය, මේ යක්‍ෂා මා අත් නො හරනේය" කියා දැන්විය යුත්තේය. අඩකා කියය යුත්තේය, මුරකා කිය යුත්තේය.

ඒ කිනම් යකුන්ට ද? කිනම් මහායකුන්ට ද? කිනම් සෙනෙ විරත් කෙනෙකුන්ව ද? කිනම් මහසෙනෙවිරත් කෙනකුන්ව ද යත්?:-

ඉන්ද්‍ර, සොම, වරුණ භාරද්වාජ, පජාපති, වන්දන, කාමසෙට්ඨ කිනනුසණඬු, නිසණඬු, පණද, ඔපමඤඤ දෙවසුත, මාතලි, චිත්‍ර සෙන, ගඬබබ, නළ, රාජ, ජනෙසභ, සාතාගිර, හෙමවත, පුණණක, කරතිය, ගුල, සිවක, මුවලිඳ, වෙස්සාමිත්‍ර, යුගඬර, සොණ-පාල, සුපපගෙඛ, හිරිනෙතනි, මණිභ, පඤ්චාලචණඩ, ආලවක, පජ්ජුන්න, සුමන, සුම්බ, දධිමුඛ, මණිමාණිවර, දීඝ, සෙරිසක

යන මේ යක්‍ෂයන්ව, මහායක්‍ෂයන්ව, සෙනාපතීන්ව, මහා සෙනාපතීන්ව, "මේ යක්‍ෂයාතෙම මා අල්වා ගනියි, මේ යක්‍ෂයා මව ආවේශ වෙයි, මේ යක්‍ෂයා මිට පිඩා කරයි, මේ යක්‍ෂයා මට බරපතල පිඩා කෙරෙයි, මේ යක්‍ෂයාතෙම මට හිංසා කරයි, මේ යකා මට කඳින් හිංසා කරයි, මේ යකා මා අත් කොට කරියි" කියා දැන්විය යුත්තේය, අඩහා කිය යුත්තේය, මුරහා කිය යුත්තේය.

නිදුකාණන් වහන්ස, මේ ආටානාටිය පිරිත භික්‍ෂු, භික්‍ෂුණි, උපාසක, උපාසිකාවන්ට ගුප්තිය, ආරක්‍ෂාව, අවිහිංසාව, සැපවිහරණය පිණිස වන්නේය

"නිදුකාණන් වහන්ස, අපි බොහෝ කෘත්‍ය ඇත්තෝ වෙමු" බොහෝ කටයුතු ඇත්තෝ වෙමු, එබැවින් දැන් අපි යමු හිය" (මෙවෙශ්‍රවණ මහරජ බුදුරජාණන් වහන්සේට දැන් වීය)"වරම් මහ රජ දරුවෙනි, තෙපි දැන් යම් හමනක් සිතවු ද, එයට කල් දනුව" සි (බුදුරජාණන් වහන්සේ වදළහ.)

ඉක්බිති සතර වරම් රජ දරුවෝ, හුනස්නෙන් නැගිට බුදුරජාණන් වහන්සේට නැමිද පැදකුණු කොට එතැන්හි ම අන්තර්ධාන වූහ. ඒ යක්‍ෂයෝත් හුනස්නෙන් නැගී සමහර කෙනෙක් බුදුරජාණන් වහන්සේට වැඳ පැදකුණු කොට එහිම අතුරුදහන් වූහ, සමහරු බුදුරජාණන් වහන්සේ සමඟ සතුටු වූහ, සතුටු විය යුතු සිහි කටයුතු කථාවන් කොට එහි ම අතුරු දහන් වූහ. සමහරු තම් හොත් කියා එහිම අතුරු දහන් වූහ, සමහරු නිශබ්දව එහිම අතුරු දහන් වූහ.

තුන්වැනි බණවර සි.

ඉක්බිති බුදුරජාණන් වහන්සේ ඒ රාත්‍රිය ඉක්මුණු පසු භික්‍ෂූන්ට අඩහා වදළ සේක. ඉකුත් රාත්‍රියෙහි සිවුවරම් මහරජ දරුවන් ආ පරිදිත්, ඔවුන් නොයෙක් අයුරින් සිටි පරිදිත්, වෙස මුණි රජ නානා ප්‍රාකාර යක්‍ෂයන් ඇති බව ප්‍රකාශ කළ අයුරුත් සමහර යක්‍ෂයන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි නො පැහැදීමට වෙසමුණි රජ ප්‍රකාශ කළ හේතුත්, ඔහු සත් බුදුවරයන්ට නමස්කාර කළ අයුරුත්, සතර වරම් රජදරුවන්ගේ තතු දැන්වූ අයුරුත් සිවු පිරිසෙන් කෙනකුට අමනුෂ්‍යයකු උපද්‍රව කොළොත් ඒ සඳහා දුන් වරප්‍රසාද උපදේශත්, ආතුලත් තුන්වැනි බණවරේ සඳහන් සියල්ල විස්තර සහිතව ආටානාටිය පිරිත වෙසමුණු මහරජතුමා ප්‍රකාශ කළ පරිදිත් බුද්ධ ජ්‍යේෂ්ඨ පිණ්ඩපා ශ්‍රී මුඛයෙන්

වදාළසේක අවසානයේදී බුදුරජාණන් වහන්සේ, "මහණෙනි, ආවාහවිය පිරිත පදව්‍යඤ්ජන නොපිරිහෙලා ඉගෙන ගන්න, මහණෙනි, අවාහවිය පිරිත නිතර පුහුණු කරන්න, මහණෙනි, ආවාහවිය පිරිත සිත්හි දරන්න, මහණෙනි, මේ පිරිත මෙලෝ පරලෝ දෙක්හි දියුණුව ලබා දීමට සමර්ථ මෙයින් අර්ථවත්ය. භික්ෂූ, භික්ෂූණී, උපාසක, උපාසිකා පිරිසව අමනුෂ්‍යයන්ගෙන් වන "උපද්‍රව නිවාරණය පිණිස, ආරක්ෂාව පිණිස, පිබා නොවන පිණිස, සැපසේ වාසය කිරීම පිණිස වන්නේය" යි වදාළ සේක. ඉන්පසු මෙය ශ්‍රී මුඛදෙශනාවක් විය.

සතුටුසිත් ඇති ඒ ඇසූ භික්ෂූන් වහන්සේ සරීඳුන් වහන්සේගේ වචනයට සාධු! සාධු!! යයි කියා විශෙෂයෙන් සතුටු වූහ.

ආටානාටිය සූත්‍රයෙහි සිංහලානුවාදය නිමි

දහම් විසතර

ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන සතරවරම් මහ රජදරුවරු වෛශ්‍රවණ මහරජතුමාට අයත් 'ආටානාටා' නුවර දී සත් බුදුවරයන්ගේ ගුණ ප්‍රකාශක පිරිතක් පිළියෙළ කළහ. එයම බුද්ධාඥාවක්‍රයක් ද කරගනු සඳහා ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වූසු බුදුරජාණන් වහන්සේ වෙත පැමිණියහ.

මේ දෙවිවරු පැමිණි පසු ශක්‍ර දේවේන්ද්‍රයාගේ රැකවරණ කෙසේ සිදු වී ද? යත්

ගෝධ යක්ෂ සේනාවන්ගෙනුත්, ගාන්ධර්ව සේනාවන්ගෙනුත් කුම්භාණ්ඩසේනාවන්ගෙනුත්, නාගසේනාවන්ගෙනුත් රැකවරණ පිළියෙළ කළාහුය. සතරවරමුන් නැති ශක්‍ර දේවේන්ද්‍රයන්ට අසුරයන්ගෙන් වන කරදර නැවැත්වීම සඳහාය එසේ කළේ. යටොකත සේනා සතරින් සතර දිශාවේම රැකවල් ලූහ. බල කුම්භ පිහිටුවූහ. අතරක් නැති ව මහා බලසේනාව පිහිටුවූහ. සතර දිශාව ම සිවු පිරිසෙන් ආවරණ කරවූහ ඔවුහු සතර දිශාවට මුහුණ ලා සිටියහ. සතර වලල්ලකින් හා තුන් සක්‍රියෙකින් වට කරන ලදුව සිටියාහ. මේ ආකාරයෙන් ශක්‍ර දේවේන්ද්‍රයන්ට රැකවරණ සලස්වා ය සතර වරම් රජවරු බුදුරජාණන් වහන්සේ

වෙත පැමිණියේ. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණියවුන් නොසෙස් ලෙසින් එකත්පස්ව සිටියේ කුමක් නිසා ද?

සතරවරම් රජවරුන් සමඟ කිය පිරිසෙන් සමඟරු වැද එකත්පස්ව උන්හ. මේ බෞද්ධයෝ ය. සමඟරු සතුටු සාමීචි කථා සොව උන්හ. මේ අබෞද්ධ වුවත් සීලාචාර සම්පන්න අය ය. සමඟරු ඇඳිලි බැඳ එකත්පස්ව උන්හ. මේ කෙරාටික යෝ ය. මිථ්‍යා දෘෂ්ටිකයන් 'නුඹලා බුදුන්ව වැන්දහුය' සි වෝදනා කොළොත් කවුද වැන්දේ? ඇඟිලි එක් කොලාව වැන්දෑ' කියනු සඳහාත්, සම්‍යක් දෘෂ්ටිකයන් 'නුඹලා බුදුන් ළඟ ගිහිනුත් වැන්දේ නැහැනොවැ'සි කීවොත් මොකද අපි වැන්දෙනැත්තෙ, බිම පෙරළී වැන්දෙත් ද වැන්ද වෙන්නෙ' කියා දෙපැත්තව උත්තර දෙනු සඳහා එසේ කළහ. සමඟරු නම් හොත්කියා උන්හ. මේ ප්‍රසිද්ධ වනු කැමැත්තෝ ය. අපි අසුවල් ගෝත්‍රයේ අසුවලාගෙ අසුවලා වෙමු සි කීමෙන් වන්නේ ප්‍රසිද්ධි යකි. සමඟරු නිශ්ශබ්දවම උන්හ. මේ මෝඩයෝ ය, තැනේ කැරියට කටයුතු කළයුතු අන්දම නො දන්නෝ ය.

ආටානාටිය පිරිත ඉගෙන ගනු මැනව සි වෙසමුණි රජ කුමා බුදුරජාණන් වහන්සේට කියේ කුමක් නිසා ද?

මේ පිරිසේ කථානායකයා වෛශ්‍රවණය. සතරවරම් රජවරු ම එතැනට පැමිණි නමුත් වෛශ්‍රවණ බුදුරජාණන් වහන්සේ සමඟ විශ්වාස බැවින් මෙවෛශ්‍රවණම කථාවට ඉදිරිපත් විය. බුදුරජා ණන් වහන්සේට අමුතුවෙන් කාගෙන්වත් ඉගෙන ගත්ට දෙයක් නැත. සියල්ල අවබොධ කළ මෙයිනි. එසේ නිබිය දී ආටානා ටිය ඉගෙන ගන්න යයි කීයේ කථාවට ඉඩප්‍රස්තාව ලබා ගනු සඳහා ය.

මෙකී සත්බුදුවරුන්ගේ පමණක් නම් සඳහන් වන්නේ කුමක් නිසා ද?

ආටානාටිය සූත්‍රයේ ප්‍රධාන අදහස සත්බුදුවරයන් වහන්සේ ලාගේ ගුණ ප්‍රකාශ කොට ඒ ගුණානුභාවයෙන් අමනුෂ්‍යයන් ගෙන් වන උපද්‍රව නිවාරණය කිරීම ය. බුදුවරු බොහෝ වුහ. අප බුදුරජාණන් වහන්සේ විවරණ ලැබූ සුවිසි බුදු කෙනෙක් වුහ. එසෙ නමුදද් බුදුවරු සත් නමක් ගැන පමණක් මෙහි සඳහන් වූයේ කුමක් නිසාදැ සි විමසීම දිරි. මහාපදාන බුඩ සූත්‍රවල ද එනමෙන් මෙ සත්බුදුවරයන් ගැන පමිණි. මේ බුදුවරුන්ට සම-

බණකම් ඇති. මේ බුදුවරුන්ගෙන් බණ දහම් ඇසූ දෙවි බඹහු අදත් ඇත්තාහ. තමන්ට හුරු පුරුදු නිසා මේ බුදුවරුන්ගේ නම් කොත් ඇසීමට ඔවුහු කැමති ය. ඒ නිසාය බුදුවරු සත් නමක් ගැන පමණක් මෙහිත් වෙනත් කිප පොළෙකත් සඳහන් වන්නේ.

සතර වරම් මහ රජදරුවරු

සත්බුදුවරුන්ගේ ගුණ ප්‍රකාශය ළඟට මෙහි එන්නේ සතර වරම් රජුන් පිළිබඳ හැඳින්වීමෙකි.

ධෘතරාෂ්ට්‍ර වරම් රජ

කැලෙනගිර පාලනය කරන්නේ මේ රජතුමා ය. මේ රජ තුමාට 'ඉන්ද්‍ර' යන නම් ඇති පුත්‍රයෝ එකානුවක් වෙති. මොවුහු බුදුරජාණන් වහන්සේට නමස්කාර කරන්නාහු ය. (බාහිර සම යන්හි මහාබ්‍රහ්මයා නැගෙනහිර පාලනය කෙරෙති හි යෙති)

විරූඪක වරම් රජ

මහමෙරට දකුණෙන් පිහිටි දිසාව දකුණු දිසාව ය. මළුම්නී ගෙන යන්නන් වරද කරුවන් ගෙන යන්නේ මේ දිශාවෙනි කුම්භාණ්ඩයන්-කළලයක් වැනි මහ බඩක් හෝ රහසකුත් ඇති හෙයින් කුම්භාණ්ඩ නම් ඇත්තවුන්-පාලනය කරන්නේ මේ රජු ය. වෙන තැන්වල දකුණ අධිපතියා යමයයි කියතත් ආටානාටියට අනුව එදිශ අධිපතියා විරූඪක ය. ඔහුට 'ඉන්ද්‍ර නම් ඇති පුත්තු 91 දෙනෙක් වෙත්. ඔවුහු ද බුදුරජාණන් වහන්සේට නමස්කාර කරත්.

විරූපාක්ෂ වරම් රජ

වෙන තැන්වල වරුණ යයි කියතත් මේ සූත්‍රයට අනුව බටහිර දිග පාලකයා විරූපාක්ෂය, නාගයන්ගේ අධිපතියා යි ඔහුගේම 91 පමණ සිටින ඉන්ද්‍ර නම් ඇති පුත්තු බුදුරජාණන් වහන්සේට නමදිත්.

වෛශ්‍රවණ වරම් රජ

විසාණ නම් රාජධානියක් ඇති හෙයින් වෛශ්‍රවණ නම් විය. මහමෙරින් උතුරු දිශාවේ අධිපතියා යි උතුරු කුරු දිවයින පිහිටියේත් මෙහි ය. උතුරු කුරු දිවයින් වාසිහු දැඩි මම්බලයක් නැත්තෝ ය. විය නහුල් භාවිතයක්, හොවිතැන් බත් කිරීමක් එහි නැත. සැළිවල උයා පිහමනක් ද නැත. ඇල් සාලෙ බත් මිබුදිත්. ඒවාහි බොල් කුඩු නැත්තේ ය. ඒවා රන්බඳුන්වල ඉෂ්ඨි

පැහේ. එහි නානාවිධ වාහනයෝ වෙති. එකකුර දෙකුන්, එක කුර සිවුපාවුන් වාහන වශයෙන් ගනිති. සත්ත්ව, පුරුෂ, කෙලි, කොලු, වාහන ද ඇත. ඔවුන්ගේ පිළි උඩ ගමන් කෙරෙහි ඇත්, අස්, ප්‍රාසාද, රථසිවිගෙවල්, ආදී යානාවෝ ද ඇත.

මේ වෛශ්‍රවණට අයත් නගර කිපයෙකි ඒවා අහසෙහි මවන ලද්දේ ය. ආටානාවා, කුසිනාවා, පරකුසිනාවා, නාට පුරියා, පරිකුසිතනාවා යනු අහසේ මාළිගාවෝ ය..

උතුරෙන් සපිවනත නම් නගරයෙකි, දකුණෙන් ජනෝඝ නම් නගරයෙකි. තව ද නවනවති, අමබර, අමබරවති, ආලක මන්දවිසාණ නම් රාජධානි ද ඇත.

ඔහුට තතෝලා, තතතලා, තතෝතලා, ඕජසි,තේජසි, තතෝජසි, සූර, රාජ, සූර රාජ, අරිට්ඨ, නේමි, අරිට්ඨනෙමි යයි තොර තුරු සපයන්නෝ සිටිති.

විසාණාහි රමනීය විලෙක් ඇත. එය ධරණී නම් ඇත්තේය විල මැද හඟලවති නමැති රැස්වීම් ශාලාවෙකි. යක්ෂ සමාගම් පවත් වන්නේ මෙහි ය. විල අවටද ඉතා සිත්කලු ය. සදාකල්හිම මඟහි ඇති ගසින් පරිවාරිත ය; එහි නොයෙක් කුරුල්ලෝ නාදකෙරෙත් මොනර, කොස්වා ලිහිණි, කොවුල්, ජීවං ජීවක, (ජීවං, ජීවංයි නාද කරන්නෙත්) ඔට්ඨව චිත්‍රක, වක සැවුල්, රැවන්කකුළු පොං-කඛරසාති, ගිරා, සැළලිහිණි, දණ්ඩමාණවක (මනුෂ්‍යාකාර රැවන් දඬු හත්තෙත්) ආදී කුරුලු නාදයෙන් විසිතුරුය.

(සත්‍රීවාහන:- ගර්භිනී මවුවරුන්ගේ පිට උඩත්, අන්‍යයන් වාහනවල යොදත් යෙති. පුරිසවාහන:- පුරුෂයන් යානාවල යොදයි. මිට බෞද්ධයන් අසු නො වේ. පිටිසර බද අශීලාචාර මිනිසුන් හැනේ. එක්තරා මනුෂ්‍යයෙක් භික්ෂුවක් ළඟ නිදිකිරා වැටුණේය. කුමක් නිසා දැයි ඇසූ කල 'ඊයේ වෛශ්‍රවණ දූතයෝ මා වාහනයක යොදා කරදර කළාහුය යි' කීය.

කුවේර:- අබුද්ධාත්පාද කාලයෙක 'කුවේර' නම් බමුණෙකි. ඔහු උක් කෙතක් පිළියෙළ කෙළේය. යන්ත්‍ර සතක හිමියෙකි. එක යන්ත්‍රයකින් උපන් ආදායම දහවිශයෙහි යෙදීය. එයින් ආදා යම් වැඩි වූ නිසා ඉතිරි යන්ත්‍රවල ආදායමෙන් ද 20 000ක් අවුරුදු දන් දුන්නේය. එයින් මැරී ගොස් කුවේර නම් වරම් රජ ව උපන.

මේ කුවේරව ද 'ඉන්ද්‍ර' නම් ඇති පුත්‍රයෝ 91, දෙනෙකි. ඔවුහුත් බුදුරජාණන් වහන්සේව නමස්කාර කෙරෙත්.

මේ සිවුවරමුන් විසින් මේ සූත්‍රය පිළිගැයුළු කෙළේය. මෙහි අදහසත් පෙළත් නො දන්නාව එතරම් ප්‍රයෝජනවත් නො වේ. ලාභ තනා කියන්නාව ද වැඩක් සිදු නොවේ.

නොදින් ඉගෙන ගෙන ප්‍රකාශ කොළොත් ඔහුව යක්ෂ, ගාන්ධර්ව, කුම්භාණ්ඩ, නාග ආදී මොන ම අමනුෂ්‍යයකුගෙන් වත් කරදර සිදු නො වේ යමෙකුට අමනුෂ්‍යයකුගෙන් කරදර වුවොත් සතර වරම් රජවරු තම් පිරිසඟ ඔවුන් වැඳද නොගනිත්. ඔවුන සතර ආවාහ විවාහ සිදුවීමට ද ඉඩ ළඟා දෙත්. ඔවුන් පරයන්, ගැත්තරයන් ලෙස සලකනු ලබත්. සතරවරමුන්ව යමකු අකිකරු නම් ඔවුන්ගේ ඔළුවේ හිස් පාත්‍රයක් තමයි. මේ ඒ සමාජයේ කැවියට බරපතල ම දඩුවමෙකි. ඒත් අකිකරු නම් ඔවුන්ගේ ඔළුවද කැලි සතක් ව පලනු ලැබේ.

යම් අමනුෂ්‍යයෙයක් සිවුපිරිසඟත් කෙතකු අනුව ආවේශව යාම් ඊම් ආදිය කෙරේ නම් ඒ බව යක්ෂ සේනාපතීන්ට අඩ නඟා කෑගසා 'මේ යකා මට ආවේශ වෙයි; පීඩා කරයි' කියා කිය යුතුය.

ඒ යක්ෂසේනාධිපතිහු නම්:- ඉන්ද්‍ර, සෝම,වරුණ, භාරද්වාජ, පජාපති, චන්දන, කාමසෙට්ඨ, කින්නුගණ්ඩු, නිඝණ්ඩු, පනාද, ඕපමඤ්ඤ, දේවසූත, 'මාතලි, චිත්තසේන, ගන්ධබ්බ, නල, රාජ, ජනේසභ, සාතාගිර, හේමවත, පුණ්ණක, කරතිය, ගුල, සිවක, මුචලින්ද, වෙස්සාමිත්ත, යුගන්ධර, ගෝපාල, සුපගේධ, හිරිනෙත්ති, මන්දිය, පඤ්චාලචණ්ඩ, ආලවක, පජ්ජුන්න, සුමන, සුමුඛ,දධිමුඛ, මණිමානිවර, දීඝ යන මෙහුය.

මෙආටානාටිය පරිත්තයට කළ යුතු පරිකම් ද වෙයි. මුලින් ම මේ සූත්‍රය නො කිය යුතුය. මෙත්ත ධජග්ග රතන සූත්‍ර පළමු වෙන් දින සතක් කිය යුතුය. මේත් දෙවියන් සම්බන්ධ සූත්‍ර බැයින් ඉතුත් පසු අමනුෂ්‍ය උපද්‍රව ඇත් නම් ආටානාටිය කිය යුතුය.

මෙය කියන්නහු පිවිතුරු හෝ මස් සෑ කෑ යුතුය. මෑ-ලොහෙයි නො විසිය යුතුය, පිරිත් කියන තැන ලොම හා පිරිසිදු අඟුන් පහතා හිද ගත යුතුය. පිරිත සඳහා මිඩුවට වැඩමවද්දී මුරායුධ ඇතිව වැඩම විය යුතුය. මෙය එළිමහනේ සිව නො කිය යුතුය. මදර ජාතල් වහා මුරායුධ හස්තවුන්ගෙන් පිරිවරන ලදුව කිය යුතුය. පළමුවෙන් සිල් දී පිරිත් කිය යුතුය මේසේත් කියා ආවේශ වූ අමනුෂ්‍යයා යන්නේ නැත් නම් ආතුරයා විකාර

යටි කෙත යා යුතුය. මෙවන්න මිදුලෙහි සතප්පා, ආසන පූජා කරවා, පහන් දල්වා, පළමුවෙන් මඩහල හාථා ප්‍රකාශ කළ යුතුය. ත්‍රිභාරය ළඟ ලොකු ගහක් ඇතොත් අමනුෂ්‍යයාව ඒ ගසට එන ලෙස කිය යුතුය ආතුරයාගෙන් ඔබ කිතම් මූ දැ සි ඇසිය යුතුය. නම් කී කල ඒ සමින් මි කථා කළ යුතුය. මෙ නම් ඇති ඔබව අපි මේ මේ පින් දුනිමු. ඔබට පඬුරු සඳහා මඩහලහාථා කීමු. අප කෙරෙහි මහත්වයෙන් මොහු අත්හල යුතුය සි කිය යුතුය. ඒත් අත් නොහළොත් සතරවරම් දෙවිවරුන්ට කිය යුතුය. මොහු බුද්ධාඥා කෙ අසයි. ඔබලාට කැමැත්තක් කරන්න යයි කිය යුතුය.

ආටානාටිය සූත්‍රයෙහි දහම් විසතරය නිමි

සතර වෙනි බණවර නිමි

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ධම්මචක්කප්පවත්තන සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ, තත්‍රඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි.

දුවෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා, යොචායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, යොචායං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො.

එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

කතමා ච සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථිදං? සම්මාදිට්ඨි සම්මාසංකප්පා සම්මාවාචා සම්මාකම්මන්තා සම්මාආජීවා සම්මා වායාමො සම්මාසති සම්මාසමාධි

අයං ඛො සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

ඉදං බෝ පන භික්ඛවේ දුක්ඛං අරියසච්චං ජාතී පි දුක්ඛා ජරා පි දුක්ඛා ව්‍යාධි පි දුක්ඛා, මරණම්පි දුක්ඛං අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ පියේහි විප්පයෝගෝ දුක්ඛෝ යම්පිච්ඡං නලභති තම් පි දුක්ඛා සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා–

ඉදං බෝ පන භික්ඛවේ දුක්ඛසමුදයං අරියසච්චං යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී සෙය්‍යථිදං? කාමතණ්හා භවතණ්හා, විභවතණ්හා–

ඉදං බෝ පන භික්ඛවේ දුක්ඛනිරෝධං අරියසච්චං යෝ තස්සා යේව තණ්හාය අසෙසවිරාගනිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්තී අනාලයෝ.

ඉදං බෝ පන භික්ඛවේ දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරිය සච්චං අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ සෙය්‍යථිදං? සම්මා දිට්ඨි සම්මාසංකප්පෝ සම්මාවාචා සම්මාකම්මන්තෝ සම්මාආජීවෝ සම්මාවායාමෝ සම්මාසති සම්මාසමාධි.

ඉදං දුක්ඛං අරියසච්චන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

තං බෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

තං බෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාතන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

තං බෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහාතබ්බන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

තං බෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං, පහීනන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

ඉදං දුක්ඛනිරොධං අරියසච්චන්ති මේ හික්ඛවේ පුබ්බ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛනිරොධං අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මේ හික්ඛවේ පුබ්බ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛනිරොධං අරියසච්චං සච්ඡිකතන්ති මේ හික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකෝ උදපාදි.

ඉදං දුක්ඛනිරොධ ගාමිනී පටිපදා අරියසච්චන්ති මේ හික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවේතබ්බන්ති මේ හික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛනිරොධ ගාමිනී පටිපදා අරියසච්චං භාවිතන්ති මේ හික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකෝ උදපාදි.

යාවකීවඤ්ච මේ භික්ඛවේ ඉමේසු චතූසු අරියසච්චේසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි නෙව තාවාහං භික්ඛවේ සදේවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේවමනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධා පච්චඤ්ඤාසිං,

යතෝ ච ඛෝ මේ භික්ඛවේ ඉමේසු චතූසු අරියසච්චේසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි අථාහං භික්ඛවේ සදේවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේවමනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධා පච්චඤ්ඤාසිං ඤාණඤ්ච පන මේ දස්සනං උදපාදි අකුප්පා මේ චේතොවිමුත්ති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝති.

ඉදමවෝච භගවා අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති

ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො අඤ්ඤාකොණ්ඩඤ්ඤස්ස විරජං විතමලං ධම්මචක්ඛුං උදපාදි යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති.

පවත්තිතෙ ච පන භගවතා ධම්මචක්කෙ භුම්මා දෙවා සද්දමනුස්සාවෙසුං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති, චාතුම්මහාරාජිකානං දෙවානං සද්දං සුත්වා තාවතිංසා දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති. තාවතිංසානං දෙවානං සද්දං සුත්වා යාමා දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති, යාමානං දෙවානං සද්දං සුත්වා තුසිතා දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති. තුසිතානං දෙවානං සද්දං සුත්වා නිම්මානරතී දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති. නිම්මානරතීනං දෙවානං සද්දං සුත්වා පරනිම්මිතවසවත්තී දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති.

පරනිම්මිතවසවත්තීනං දෙවානං සද්දං සුත්වා බ්‍රහ්මපාරිසජ්ජා දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං සද්දං සුත්වා බ්‍රහ්මපුරොහිතා දෙවා සද්ද මනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති. බ්‍රහ්මපුරොහිතානං දෙවානං සද්දං සුත්වා මහාබ්‍රහ්මා දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති.

මහා බ්‍රහ්මානං දෙවානං සද්දං සුත්වා පරිත්තාභා දෙවා සද්ද මනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති. පරිත්තාභානං දෙවානං සද්දං සුත්වා අප්පමාණාභා දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා—පෙ— කෙනචි වා ලොකස්මින්ති අප්පමාණාභානං දෙවානං සද්දං සුත්වා ආභස්සරා දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා —පෙ— කෙනචි වා ලොකස්මින්ති.

ආභස්සරානං දෙවානං සද්දං සුත්වා පරිත්තාභානං දෙවා සද්ද මනුස්සාවෙස්සං එතං භගවතා —පෙ— කෙතවි වා ලොකසම්මතා. පරිත්තාභානං දෙවානං සද්දං සුත්වා අප්පමාණාභා දෙවා සද්ද මනුස්සාවෙස්සං එතං භගවතා —පෙ— කෙතවි වා ලොකසම්මතා. අප්පමාණ සුභානං සද්දං සුත්වා සුභකිණ්හකා දෙවා සද්ද මනුස්සා වෙස්සං එතං භගවතා —පෙ— කෙතවි වා ලොකසම්මතා.

සුභකිණ්හකානං දෙවානං සද්දං සුත්වා වෙහප්ඵලා දෙවා සද්ද මනුස්සාවෙස්සං එතං භගවතා —පෙ— කෙතවි වා ලොකසම්මතා. වෙහප්ඵලානං දෙවානං සද්දං සුත්වා අවිහා දෙවා සද්දමනුස්සාවෙස්සං එතං භගවතා —පෙ— කෙතවි වා ලොකසම්මතා.

අවිහානං දෙවානං සුත්වා අතප්පා දෙවා සද්දමනුස්සාවෙස්සං එතං භගවතා —පෙ— කෙතවි වා ලොක සම්මතා. අතප්පානං දෙවානං සද්දං සුත්වා සුදස්සා දෙවා සද්දමනුස්සාවෙස්සං එතං භගවතා—පෙ— කෙතවි වා ලොක සම්මතා සුදස්සානං දෙවානං සද්දං සුත්වා සුදස්සී දෙවා සද්ද මනුස්සාවෙස්සං එතං භගවතා —පෙ— කෙතවි වා ලොකසම්මතා. සුදස්සීනං දෙවානං සද්දං සුත්වා අකනිට්ඨකා දෙවා සද්දමනුස්සාවෙස්සං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකසම්මතා.

ඉති තෙන ඛණෙන තෙන මුහුත්තෙනන යාව බ්‍රහ්මලොකා සද්දෝ අබ්භුග්ගඤ්ඡි අයං ච දසසහස්සි ලොකධාතු සංකම්පි සම්පකම්පි සම්පවෙධි අප්පමාණෝ ච උළාරෝ ඔභාසෝ ලොකෙ පාතුරහොසි අතික්කම්ම දෙවානං දෙවානුභාවනති.

අථඛෝ භගවා උදානං උදානෙසි අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝ අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝ ති ඉතිහිදං ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤා කොණ්ඩඤ්ඤෝ ත්වෙව නාමං අහොසීති.

ධම්මචක්කප්පවත්තන සුත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මෙසේ පූජාකරන පරිද්දෙන් බුදු ධර්ම සංඝ සංඛ්‍යාත ත්‍රිවිධ රත්නයෙහි කෘ සියලු පසේබුදුවරයන් වහන්සේලාගේ ද ගුණානුභාවය පැවසූ පිරිත් සූත්‍රයන්ද අනතුරුව සත් බුදුවරයන් වහන්සේලාගේ ගුණ ඇතුළත් ආදාතාටිය පරිත්‍රාණදේශනාවසානයෙහි

බොහෝ සෙයින් මෙවැනි මිනිසුන්ට ඝන වැඩ සලසන ඔවුන්ගේ සතුට කෙතෙදෙන සූත්‍ර සතක් මහා විහාර වංසික මහ තෙරවරුන් වහන්සේලා විසින් පරිශීලට සංග්‍රහයක් වශයෙන් පිරිත්පොතට ඇතුළත් කරන ලදහ.

එහි පළමුවනු වූ දම්සක් පැවතුන් සූත්‍රයෙහි සිංහලානු වාදය මෙසේයි.

මා විසින් මේ සූත්‍ර දේශනාව මෙසේ අසන ලදි.

එක් සමයෙක්හි අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බරණැස් නුවර සමීපයෙහි ඉසිපතනයෙහි මිගදාය නම් වූ ආරාම යෙහි නොමොහොත් මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පස් වග භික්ෂූන් අමතා දම්දෙසුමක් කරනු කැමතිව ඔවුන්ව අඩහඟ වදාළසේක.

මහණෙනි, පැවිද්දකු විසින් නොසෙවියයුතු මේ අන්ත දෙකකි. එනම්: ලාමක වූ, ග්‍රාම්‍ය වූ, කෙවත් හම් වැස්සන්ට අයත් වූ, පෘථග්ජනයන් විසින් පුරුදු කරනලද, අනාර්‍ය්‍ය වූ, අවැඩක්ම ඇසුරු කරන්නා වූ, යම් මේ වස්තු කාමයන් කෙරෙහි උපදනා කෙලෙස් කාම සැපයාගේ සෙවීමය.

දුක් උපදවන්නාවූ, අනාර්‍ය්‍ය වූ, අනර්‍ථයක්ම ඇසුරු කරන්නාවූ, යම් මේ ආත්මකිලමථය කෙවත් නිවන් පතාගෙන ශරීරයට දුක් දීමය, යන මේ ලාමක කරුණු දෙකයි.

මහණෙනි, ඒ මේ අන්තදෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් මධ්‍යමප්‍රතිපදාවක් අවබෝධ කරන ලද්දීය. ඒ මධ්‍යමප්‍රතිපදාව ප්‍රඥාචක්ෂුස ඇති කරන්නීය. ඥාන ඇති කරන්නීය. කෙලෙසුන් සංසිඳවීම පිණිස, චතුස්සත්‍යය දැන ගැනීම පිණිස, ඔවුන්ගේ අවබෝධය පිණිස, නිවන් පැසක් කිරීම පිණිස පවත්නීය.

මහණෙනි; ප්‍රඥාව ඇතිකරන, ඥාන ඇති කරන, කෙලෙස්වැප සමය පිණිස, චතුස්සත්‍යඥානය පිණිස, චතුස්සත්‍යාවබෝධය පිණිස, නිවන් පිණිස පවත්නාවූ ඒ මධ්‍යම ප්‍රතිපදා කොමේ? ක්වරි ද යත්? මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය මැ යි.

ඒ කවරේද යත්?

සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය, යන මොහු යි.

මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කළ ඒ මේ මධ්‍යම ප්‍රතිපදා තොමෝ ප්‍රඥාචක්ෂුස ඇති කරන්නීය. ඥාන ඇති කරන්නීය. කෙලෙසුන්ගේ සංසිඳුවීම පිණිස, චතුස්සත්‍යයා ගේ දැනීම පිණිස. ඔවුන්ගේම අවබෝධය පිණිස, නිවන් පිණිස පවත්නීය.

මහණෙනි මේ වනාහි දුඃඛසත්‍යය වේ. ඉපදීම දුකය, ජරාව හෙවත් මහළුවීම දුකය, රෝගය දුකය, මරණය දුකය, අප්‍රිය වූවන් හා එක්වීම දුකය, ප්‍රියවූවන් කෙරෙන් වෙන්වීම දුකය, කැමති යමක් නොලැබීම දුකය, සැකෙවින් පඤ්ච උපාදාන ස්කන්ධයෝ දුක්වන්නාහ.

මහණෙනි මේ වනාහි දුඃඛසමුදය සත්‍යය වේ. යම් මේ තෘෂ්ණාවක් පුනරුත්පත්තිය ඇති කෙරේ ද, නන්දි රාගය හෙවත් ඒ ඒ දෙයෙහි ඇලීමෙන් බැඳීමෙන් යුක්ත ද, ඒ ඒ භවයෙහි විශේෂයෙන් සතුව ඇති කරන්නිද, ඕ තොමෝ කවරීද යත්? කාමතෘෂ්ණාවය, භාව තෘෂ්ණාවය, හෙවත් ශාස්වත දෘෂ්ටිය හා සෙදන තෘෂ්ණාවය, විභවතෘෂ්ණාවය හෙවත් උච්ඡේද දෘෂ්ටිය හා එක්ව සෙදෙන තෘෂ්ණාවය යන මොහුයි.

මහණෙනි, මෙය වනාහි දුඃඛනිරෝධාර්ය්‍ය සත්‍යය වේ. ඒ තෘෂ්ණාවගේ යම් මුළුමනින්ම නො ඇලීමක් නැති කිරීමක්ම වේ ද අත්හැරීමක් දුරලීමක් වේ ද මිදීමක් නො ඇලීමක් වේ ද මෙයයි.

මහණෙනි, මෙය වනාහි දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්ය්‍ය සත්‍යය වේ. එනම් මේ ආර්ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයම ය. ඒ කවරේදයත්, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මේ සි.

මහණෙනි, මට මේ දුඃඛාර්ය්‍ය සත්‍යයයි පෙර නො ඇසූ විරූ ධර්ම විෂයෙහි චතුස්සත්‍යඥාන චක්ෂුස පහළ විය. එහි දැනීම ඇති විය. ප්‍රඥාව ඇති විය. විද්‍යාව හෙවත් කෙලෙසුන් දුරු කිරීමෙහි ඥාන ඇති විය. අවිද්‍යාන්ධකාරය දුරුකරන ඥානාලෝකය පහළ විය.

මහණෙනි, ඒ මේ දුඃඛාර්ය්‍ය සත්‍යය පිරිසිඳ දත යුතුය යි-සෙස්ස පෙරසේමය. පිරිසිඳ දන්නා ලදුයි-සෙස්ස පෙරසේමය.

මේ දුඃඛ සමුදයාර්ය්‍ය සත්‍යයයි - ඒ මේ දුඃඛ සමුදය දුරුකළ යුතුය යි-ඒ මේ දුඃඛසමුදය දුරු කරනලදු යි සෙස්ස පෙරසේමය.

මේ දුඃඛ නිරෝධායැයි සත්‍යයයි – මේ දුඃඛ නිරෝධය තම් වූ නිවන නුවණින් ප්‍රත්‍යක්ෂ කළ යුතුයයි – මේ දුඃඛ නිරෝධායැයි සත්‍යය නුවණින් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේය යි. සෙස්ස පෙරසේමය.

මේ දුඃඛ නිරෝධගාමිනී ප්‍රතිපදායැයි සත්‍යය යි – මේ දුඃඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාව වැඩිය යුතුය යි-මේ දුඃඛනිරෝධ ගාමිනී ප්‍රතිපදාව මවිසින් වඩනා ලදැ යි පෙර නො ඇසූ ධර්මවිෂයෙහි ප්‍රඥා චක්ෂුස පහළ විය. චතුස්සත්‍යඥානය, එහි ප්‍රඥාව, විශිෂ්ට දැනීම, එසින් නිර්මාණාලෝකය, පහළ විය.

මහණෙනි, යම් තාක් කල් මට මේ චතුස්සත්‍ය ධර්ම විෂයෙහි ත්‍රිපරිවෘත්තයක් හා දෙළොස් ආකාරයක් ඇති තත්වූ පරිදි පිරිසිදු අවබෝධයක් නොවූයේ ද, මහණෙනි, දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, සත්ව ලෝකයෙහි ද මහණ බමුණන් සහිත දෙවි මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහි ද උතුම්වූ සම්‍යක් සම්බෝධිය ප්‍රත්‍යක්ෂ කෙළෙමි යැයි ප්‍රතිඥා නොකෙළෙමි.

මහණෙනි, යම් අවස්ථාවක පවත් මට මේ චතුස්සත්‍ය ධර්ම විෂයෙහි මෙසේ තුන් පෙරළියකින් හා දෙළොස් ආකාරයෙන්යුත් තත්වූ පරිදි ඥානදර්ශනය පිරිසිදුවූයේ ද මහණෙනි, එකල්හි මම දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් හා දෙවි මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහි උතුම්වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙමි යි ප්‍රතිඥා කෙළෙමි. චතුස්සත්‍ය ධර්මයන් කෙරෙහි මට ඥානදර්ශනය පහළ විය. මාගේ චෙතොවිමුක්ති තම්වූ අර්හත් ඵල සමාධිය අකෝප්‍ය විය හෙවත් තැන්පත් විය. මේ–තොමෝ අන්තිම උත්පත්තිය වන්නීය. දැන් (මට) පුනරුත්පත්තියක් නැත යනුයි. භාග්‍යවතුන් වහන්සේ මේ දම්සක් පැවතුන් සූත්‍ර ධර්ම දේශනාව වදාළසේක. සතුටු සිත් ඇති පස්වග භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාව සතුටින් පිළිගත්හ.

මේ ව්‍යාකරණ තම්වූ ගාථා මිශ්‍ර නොවූ මේ ධර්මය වදාළ කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට රාගාදී කෙලෙස් රජස් නැති පහවූ කෙලෙස් මල ඇති ධර්ම චක්ෂුස් තම්වූ ප්‍රථම මාර්ග ඥානය පහළ විය. යම් කිසිවක් ඇතිවිම සභාව ස්වභාව ඇත්තේ වී නම් ඒ සියල්ල නැතිවීම සභාව කොට ඇත්තේය යන නුවණැයි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ දම්සක් පැවැත්වූ කල්හි

භූම්‌‍යාශ්‍රිත දෙවියෝ සාධුකාර දුන්හ. භාග්‍යවතුන්වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායයෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ලෝකයෙහි අන්කිසිවකු විසින් හෝ කොපෑ වැස්වීය හැකි ධර්මචක්‍රය පවත්වන ලදැ සි කියාසි.

භූමි ස්‍රිත දෙවියන්ගේ සාධුකාර ශබ්දය අසා චාතුම්මහා රාජික දෙවියෝ ද, ඔවුන්ගේ සාධුකාර ශබ්දය අසා තාවතිංස දෙවියෝ දයාම තුසිත, නිම්මානරති, පරනිම්මිතවසවත්ති දෙවියෝ ද ඔවුන්ගේ සාධුකාර ශබ්දය අසා බ්‍රහ්මපාරිෂද්‍ය බඹලොව වාසී බ්‍රහ්මයෝ ද, බ්‍රහ්මපුරෝහිත, මහා බ්‍රහ්ම, පරිත්තාභ, අපමාණාභ, ආභස්සර, පරිත්තාසුභ, අපමාණසුභ, සුභකිණ්ණ, වෙහප්ඵල, අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨ, බඹලොව වාසී බ්‍රහ්මයෝ ද සාධුකාර දුන්හ.

මෙසේ එකෙණෙහි ඒ මොහොතෙහි අකනිට්ඨ බඹලොව දක්වා සාධුකාර ශබ්දය ඉතා උස්ව පැන නැංගේය. මේ දසසහස්‍රී ලෝක ධාතුව කම්පා විය. අතිශයින් කම්පා විය. වෙවුලන්ව පවත්නත්තේය. දෙවියන්ගේ දේවතානුභාවය ඉක්මවා අප්‍රමාණ වූ මහත්වූ ආලෝකයක් පහළ විය.

එකල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මෙසේ ප්‍රීති වාක්‍ය යක් පහළ කළසේක.

පින්වත් කොණ්ඩඤ්ඤතෙම වතුස්සත්‍යාවබෝධය කෙළේය. පින්වත් කොණ්ඩඤ්ඤ තෙම වතුස්සත්‍යාවබෝධය කෙළේය. යනවත් නිවන් දුටුවේය කියාසි.

මෙසේ මේ කාරණය නිමිත්තකොටගෙන ආයුෂ්මත් කොණ්ඩ-ඤ්ඤ සථවිරයන් වහන්සේව අඤ්ඤා කොණ්ඩඤ්ඤය යන නමෙක් විය යතුසි.

සිංහලානුවාදය නිමි.

දහම් විසතර

තුන් කල්හි සියලු බුදුවරයන් වහන්සේලා දම්සක් පවත්වනු සඳහා වැඩහිඳින සථානය මේ සූත්‍රයෙහි සඳහන්වූ බරණැස් නුවර ඉසිපතන මිගදාය සි.

පසේබුදුවරයන් වහන්සේලා තනිදෙමුලක ලෙන්හි දී සත් දව සක් නිරෝධසමාපත්තියට සමවැද එයින් නැගිට අකොතඤ්ඤවිලට ගොස් මුව දෑතෑ කිස නිමිවා අහසින් අවුත් මෙතන්හි බසින හෙයින් ද උපොසථ කර්මය සඳහා රැස්වන හෙයින් ද ගන්ධමාදන පර්වතයට යන එන කල්හි මේහි නවතින හෙයින් ද ඉසිපතන යයි කියනු ලැබේ. මුවන්ට අභයදානය දුන් හෙයින් මිගදාය නම් වේ.

අප මහා බෝසතාණන් වහන්සේ දීපඞ්කර පාදමූලයෙහි පටන් දානාදි පෙරුම් පුරමින් පිළිවෙළින් සසර ගෙවා අවුත් වෙස තුරු අත්බැව්හි මහපොළොව වෙවුල්වා ගුගුරුවා මහදන් දී එයින් චුතව තුසි දෙව්ලොව ඉපද එහි ආයු විද දේවාරාධනායෙන් එයින් චුතව සිද්ධාර්ථකුමාරව ඉපද මහාභිනික්මන් කොට පිළිවෙළින් මහාබෝමැඩ කරා පැමිණ මාරපරාජය කොට පළමුවන යාම යෙහි පූර්වේනිවාසානුස්සතිඥානය ද, මධ්‍යම යාමයෙහි දිබ්බ චක්ඛු ඤාණය ද පශ්චිම යාමාවසානයෙහි දස දහසක් ලෝධා තුමපා කෙරෙමින් සර්වඥතාඥානය ද ලැබ බුදුව සත්සතියක් මහ බෝමැඩ වෙත කල් යවා අවවන සතියෙහි නැවතත් අජපල් නුග රුක්මුල වැඩහුන් කල්හි මහබඹහු විසින් දහම් දෙසනු පිණිස කරන්නාලද ආරාධනා ඇතිව දිවැසින් ලෝබලා සත්ත්වලෝකයා කෙරෙහි අනුකම්පායෙන් බරණැස ඉසිපතනයට වැඩ පස්වග තවුසන් අමතා දම්සක් පවත්වන්නට පවත්ගත්සේක.

දම්සක් දේශනාවට ඇරඹූ තථාගතයන් වහන්සේ "දෙව මේ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා" යනුවෙන් කළ ආර මහය අවීචියෙහි පවත් භවාග්‍රය දක්වා දස දහසක් ලෝකධාතුව මුළුල්ලෙහි පැතිර සිටියේය.

එසමයෙහි මේ දම්සක් පැවැත්වූ තැනට මිනිසුන්ගෙන් පස් වග භික්ෂූන් හා දෙව්බඹුන්ගෙන් අවලොස් කෝළක් පමණ දිව්‍ය බ්‍රහ්මයෝ ද රැස්වූහ. බස්නාහිරින් හිරු බසිත්ම නැගෙනහිරින් සඳු නැගෙත්ම ඇසළ පුණුපොහෝ දිනයෙහි මේ දම්සක් පැවතුන් සූත්‍රය දේශනාකර වදාළසේක.

මෙහි 'දුක්ඛෙන කාමසුඛල්ලිකානුයොගය නම් ප්‍රියජනක වස්තූන් කෙරෙහි කෙලෙසකාම සැපයාශ්‍රේ යෙදීම යි, කායකොත් එහි ඇලීම ආසාව ඉපදවීම යි. මෙය වනාහි ලාමක බවත් ගම් වැස්සන්ගේ ගතියක් බවත් පෘථග්ජනයන්ට අයත් බවත් බුදුරා දී ආර්‍යයන් සතු නොවන බවත් අවැඩක්ම නපුරක්ම ඇතුරු කරන බවත් වදාළහ.

ආත්මඤ්ඤාතුයෝගය නම් නිවන් පතා නොහොත් නිවන් ලබන බලාපොරොත්තුවෙන් සැදුම්සිවල හිදීම් සැතපීම් ආදී යෙන් ශරීරයව දුක් දීමයි. මෙය දුකක් බවත් අනාර්ය්‍ය බවත් අන ර්‍ථයක් ඇසුරුකරන බවත් වදාරා මේ දෙකටම අයත් නොවූ මධ්‍ය ප්‍රතිපදා නම්වූ ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය කෙලෙසුන් නැති කිරීමෙන් නිවන් අවබෝධ කරවන එකම මාර්ගය හි වදාළහ.

මේ සූත්‍ර දේශනාවෙහි ඇතුළත්වූ චතුස්සත්‍යය ත්‍රිපරිවෘත්ත ද්වාදසාකාරයෙන් ප්‍රකාශය "ඉදං දුක්ඛං අරියසච්චං"යන ආදීන් මේ දුඃඛසත්‍යය මේ සමුදය සත්‍යය මේ නිරෝධ සත්‍යය මේ මාර්ග සත්‍ය යයි දුක්වූයේ සත්‍යඥානය වේ. දුඃඛසත්‍යය පරිඥේයය හෙවත් පිරි සිඳ දත යුතුය, සමුදය සත්‍යය (තණ්හාව) ප්‍රහාතව්‍යය හෙවත් දුරු කළ යුතුය, නිරෝධසත්‍යය (නිවන) ප්‍රත්‍යක්ෂ කළ යුතුය, මාර්ග සත්‍යය (ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය) වැඩිය යුතුය යි මෙසේ දුක්වූ කරුණු සතර චතුස්සත්‍යයාගේ කෘත්‍යඥානය වේ.

දුක මවිසින් පිරිසිඳ දන්නා ලද්දේය. සමුදය දුරුකරන ලද්දේය. නිරෝධය ප්‍රත්‍යක්ෂකරන ලද්දේය. මාර්ගය වඩන ලද්දේ යයි මෙසේ දුක්වූයේ චතුස්සත්‍යයාගේ කෘතඥානය යි.

මෙසේ මෙහි එන එක සත්‍යයක පරිවර්ත්තන තුනක් බැගින් ඇතිකොසින් ත්‍රිපරිවෘත්ත නම් වේ. යථාභූතඥාන දර්ශනය නම් මෙසේ එක් එක් සත්‍යයක් පිළිබඳ ත්‍රිපරිවෘත්ත වශයෙන් උපන් ඥාන සංඛ්‍යාත දර්ශනය යි.

මේ ධර්මදේශනාව ඇසීමෙන් ආයුෂ්මත් කොණ්ඩඤ්ඤසථවිර යන් වහන්සේට ධර්මචක්ෂුස නම්වූ සොවාන් මාර්ගඥානය පහළ විය. සෙසු තන්හි සොවාන් සකදාගාමි අනාගාමි යන තුන් මාර්ග තුන් ඵලයන් සඳහා ධම්මචක්ඛු යයි කියනු ලැබේ. මේ සූත්‍රයෙහි "ධම්මචක්ඛුං උදපාදි" යනුවෙන් ප්‍රකාශවූයේ ප්‍රථම වූ සොතාපත්ති මග්ග ඤාණයයි මාර්ගඥානය සමඟම ඵලඥානය ද එකම චිත්තක්ෂණ යෙහි ඇතිවීම ලෝකෝත්තර චිත්තයන්ගේ ධර්මතාවය වේ "ධම්මචක්ඛුං හි පටිවෙධඤාණං චේව දෙසනා ඤාණං ච" යනු අට්ඨ කතායින් ප්‍රතිවෙධඥානයට හා දේශනාඥාන යවත් ධම්මචක්ඛු යයි කියනු ලැබේ. මහාබෝමැඩ විදුරුසුන් අරා වැබහුන් සර්ව්ඥයන් වහන්සේට චතුරාර්ය්‍ය සත්‍ය ධර්මයන් කෙරෙහි පහළ වූ ද්වාදසාකාර ප්‍රතිවෙධඥානය ද බරණැස ඉසිපතනයෙහි

වැඩහුන් සමීඳුගන් වඳන්සේ විසින් ආදහනාකාර දේශනාවශයෙන් පවත්වනලද දේශනානුසාරය ද ධම්මචක්‍ර නමින් හඳුන්වනු ලැබේ

මේ සූත්‍රසම්පත් දෙකම බුද්ධසූත්‍ර විශෙෂයෝය. මේ දෙස් තෙන් බුදුන් විසින් දම්සක් පවත්වන ලද්දේ නම් වෙයි ඒ මේ දහම්සක අවලොස් කෙළක් බ්‍රහ්මයන් සහිතවූ ආයුෂ්මත් අඤ්ඤා කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට පළමුකොටම නිවන් අවබෝධ කරගැනීමට හේතු වීය. මෙතැන්හි රැස්වූ දෙව් බඹහු මෙහි ලා ආධිකාර දුන්හ. සමීඳුන්සූත්‍රාලෝකය දස දහසක් ලෝධාහි පැතිර පැවැත්තේය.

දහම් විසඳුරස නිමි.

මහාසමය සුත්තන්තං

එවං මෙ සුතං එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ, මහතා භික්ඛුසංඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසංඝං ච, අථඛො චතුන්නං සුද්ධාවාසකායිකානං දෙවානං එතදහොසි

අයං ඛො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ මහතා භික්ඛුසංඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි, දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසංඝං ච, යන්නූන මයමපි යෙන භගවා තෙනුපසංකමෙය්‍යාම, උපසංකමිත්වා භගවතො සන්තිකෙ පවෙදෙය්‍යාම ථා හාසෙය්‍යාම්හාති.

අථඛො තා දෙවතා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං සුද්ධාවාසෙසු දෙවෙසු අන්තරහිතා භගවතො පුරතො පාතුරහංසු.

අථඛො තා දෙවතා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

1 මහාසමයො පවනසම්මි දෙවකායා සමාගතා
ආගතම්හ ඉමං ධම්මසමයං දක්ඛිතායෙ අපරාජිතසංඝන්ති

අථඛෝ අපරා දෙවතා භගවතෝ සන්තිකෙ ඉමං ගාථං අභාසි

2 තත්‍ර භික්ඛවෝ සම්මදහංසු චිත්තං අත්තනෝ උජුඤ්ඣකංසු
සාරම්භි ච සඤ්ඤාති ගණ්හන්ථා
ඉන්ද්‍රියානි රක්ඛන්ති පණ්ඩිතා නි

අථඛෝ අපරා දෙවතා භගවතෝ සන්තිකෙ ඉමං ගාථං අභාසි

3 ඡෙත්වා බිලං ඡෙත්වා පලිඝං ඉන්ඛිලං උභච්ච මනෙජා
තෙ වරන්ති සූධා විමලා චක්ඛුමතා සුදන්තා සුසුනාගාති

අථඛෝ අපරා දෙවතා භගවතෝ සන්තිකෙ ඉමං ගාථං අභාසි.

4 යෙ තෙච් බුද්ධං සරණං ගතාසෙ න තෙ ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්ති නි

අථඛෝ භගවා භික්ඛූ ආමන්තෙසි, යෙභුය්‍යෙන භික්ඛවෙ දසසු ලොකධාතූසු දෙවතා සන්නිපතිතා තථාගතං දස්සනාය භික්ඛු සංඝා ච, යෙ පි තෙ භික්ඛවෙ අතෙසුං අතීතමද්ධානං අරහන්තෝ සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමා යෙව දෙවතා සන්නිපතිතා අහෙසුං සෙය්‍යථාපි මයහං එතරහි.

යෙ පි තෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තෝ සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමා යෙව දෙවතා සන්නිපතිතා භවිස්සන්ති සෙය්‍යථාපි මයහං එතරහි, ආවික්ඛිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි, කිත්තයිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි, දෙසෙස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි, තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවම්භන්තෙ ති ඛෝ තෙ භික්ඛූ භගවතෝ පච්චස්සොසුං භගවා එතදවොච.

5 සිලොකා මනුකස්සාමි යථා භූමා තදාසිතා
යෙ සිතා හිරිහබභාරං පහිතත්තා සමාහිතා

6 පුථූසිඛාව සල්ලිණා ලොමහංසා භිසමුනෙනා
බුද්ධ මනසා සුබා විපසන්නා මනාවිලා

7 භිය්‍යෝ පඤ්ච සතෙ සුත්වා වනෙ කාපිලවත්ථවෙ
තතෝ ආමන්තයි සත්ථා සාවකෙ සාසනෙ රතෙ

8 දෙවකායා අභික්කන්තා තෙ විජානාථ භික්ඛවෝ
තෙ ච ආතප්ප මකරුං සුත්වා බුද්ධස්ස සාසනං

9 තෙසං පාතුරහු සුම්භං අමනුස්සාන දස්සනං,
අදපපකෙ සත සමුදකබ්බිං සඛස්සං අථ සත්තකිං

10 සතං එකෙ සහස්සානං අමනුස්සාන මද්දසුං
අපෙපතෙ තනත්ත මද්දකත්තු දිසා සබ්බා ඵුවා අහු

11 තඤ්ච සබ්බං අභිඤ්ඤාය වවකඛිත්වාන චකඛුමා
තතෙතා ආමන්තයි සත්ථා සාවකෙ සාසනෙ රතෙ

12 දෙවකායා අභික්කන්තා ඉමං විජානාථ භික්ඛවෙ,
යෙ වෙ හං කිත්තයිස්සාමි හිරාහි අනුපුබ්බසො

13 සත්ත සහස්සා යක්ඛා භූත්වා කාපිලවත්ථවා,
ඉඩිමන්තෙතා ජුතීමන්තෙතා වණ්ණවන්තෙතා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සමිතිං වනං

14 ඡ සහස්සා හෙමවතා යක්ඛා නානත්ත වණ්ණිනෙතා
ඉඩිමන්තෙතා ජුතීමන්තෙතා වණ්ණවන්තෙතා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සමිතිං වනං

15 සාතාගිරා තිසහස්සා යක්ඛා නානත්ත වණ්ණිනෙතා
ඉඩිමන්තෙතා ජුතීමන්තෙතා වණ්ණවන්තෙතා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සමිතිං වනං

16 ඉවෙවතෙ සොළසසහස්සා යක්ඛා නානත්ත වණ්ණිනෙතා
ඉද්ධිමන්තෙතා ජුතීමන්තෙතා වණ්ණවන්තෙතා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සමිතිං වනං

17 වෙස්සාමිත්තා, පඤ්චවත්තා යක්ඛා නානත්තවණ්ණිනෙතා
ඉද්ධිමන්තෙතා ජුතීමන්තෙතා වණ්ණවන්තෙතා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සමිතිං වනං

18 කුමහිරෙ රාජගහිනෙතා වෙපුල්ලස්ස නිවෙසනං
භියෙය්‍යා නං සතසහස්සං යක්ඛානං පරිරූපාසති
කුමහිරෙ රාජගහිනෙතා සොපාග සමිතිං වනං

19 පුරිමං ච දිසං රාජා ධතරට්ඨා නං පසාසති
ගන්ධබ්බානං ආධිපති මහාරාජා යසස්සිනෙතා

20 පුත්තා පි තස්ස බහවෙ ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තෙතා ජුතීමන්තෙතා වණ්ණවන්තෙතා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සමිතිං වනං

21 දක්ඛිණං ච දිසං රාජා විරූළ්හෙතා නං පසාසති
කුම්භණ්ඩානං ආධිපති මහාරාජා යසස්සිනෙතා

22 පුත්තා පි තස්ස බහවෙ ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තෙතා ජුතීමන්තෙතා වණ්ණවන්තෙතා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සමිතිං වනං

23 පච්ඡිමං ච දිසං රාජා විරූපක්ඛෝ තං පසාසති
නාගානං ආධිපති මහාරාජා යසස්සිසෝ

24 පුත්තා පි තස්ස බහවෝ ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ වණ්ණවන්තෝ යසස්සිනෝ
මෝදමානා අභික්කාමුං භික්ඛූනං සම්තිං වනං

25 උත්තරං ච දිසං රාජා කුවේරෝ තං පසාසති
යක්ඛානං ආධිපති මහාරාජා යසස්සිසෝ

26 පුත්තා පි තස්ස බහවෝ ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ වණ්ණවන්තෝ යසස්සිනෝ
මෝදමානා අභික්කාමුං භික්ඛූනං සම්තිං වනං

27 පුරිමං දිසං ධතරට්ඨෝ දක්ඛිණේන විරූළ්හකෝ
පච්ඡිමේන විරූපක්ඛෝ කුවේරෝ උත්තරං දිසං

28 චත්තාරෝ තේ මහාරාජා සමන්තා චතුරෝ දිසා
ද්‍ය ලුම්බිනා අට්ඨංසු වනෙ කාපිලවත්ථවේ

29 තෙසං මායාවිනෝ දූසා ආගු වඤ්චනිකා සඨා
මායා කුදේණ්ඩු වෙමචණ්ඩු විටුවව විටුඩෝ සහ

30 වන්දනෝ කාමසෙට්ඨෝ ච කිනනුසණ්ඩු නිසණ්ඩු ච
පනාදෙ ඔපමඤ්ඤු ච දෙවසූතෝ ච මාතලී

31 චිත්තසෙනෝ ච ගන්ධබ්බා නළෝ රාජා ජනෙසභෝ
ආගු පඤ්චසිඛා චෙව තිම්බරූ සූරියවච්චසා

32 එතෙ ච ඤේඤ්ඤ ච රාජානෝ ගන්ධබ්බා සහ රාජූහි
මෝදමානා අභික්කාමුං භික්ඛූනං සම්තිං වනං

33 අථාගු සහසා නාගා වෙසාලා සහ තච්ඡකා
කම්බලසතරා ආගු පායාගා සහ කඳුකිහි

34 යාමුනා ධතරට්ඨා ච ආගු නාගා යසස්සිනෝ
එරාවණෝ මහානාගෝ සෝපාගෝ සම්තිං වනං

35 යෙ නාගරාජෙ සහසා හරන්ති
දිබ්බා දිජා පක්ඛි විසුද්ධචක්ඛූ
වෙහාසයා තෙ වතමජ්ඣපත්තා
චිත්‍රා සුපණ්ණා ඉති තෙසං නාමං

36 අභයං තදා නාගරාජා අකාසි
සුපණ්ණතා ධම්ම මකාසි බුද්ධා

සණ්හාහි වාචාහි උපවිඤ්ඤනත්තා
නාගා සුපණ්ණා සරණමගංසු බුද්ධං

37 ජිතා වජිරහත්ථේන සම්බුද්ධං අසුරාසිතා
භාතරෝ වාසවස්සෙත ඉද්ධිමන්තා යසස්සිනෙතා

38 කාලකඤ්ජා මහාභිංසා අසුරා දුන වෙඤසා
මෙපවිත්තී සුවිත්තී ච පහාරාදෙ නමුචී සහ

39 සතං ච බලිපුත්තානං සඛබ්බ වෙරොචනාමකා
සන්නාග්ගිබ්බා බලිං සෙකං රාහුභද්‍ර මුපාගමුං
සමියෝ දුනි භද්දනෙත භික්ඛුනං සම්තිං වනං

40 ආපෝ ච දෙවෙ පඨවී ච තෙජෝ වායෝ තදුගමුං
වරුණා වාරුණා දෙවා සොමො ච යසසා සහ

41 මෙත්තා කරුණා කායිකා ආහු දෙවා යසස්සිනෙතා
දසතෙ දසධා කායා සඛබ්බ නානත්තවණ්ණිනෙතා

42 ඉද්ධිමන්තෙතා ජුතීමන්තා වණ්ණවන්තා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සම්තිං වනං

43 වෙණහූ ච දෙවා සහලී ච අසමා ච දුවෙ යමා
චන්දසසුපනිසා දෙවා චන්ද මාහු පුරක්ඛනිා

44 සුරියසසුපනිසා දෙවා සුරියමාහු පුරක්ඛනිා
නක්ඛත්තානනි පුරක්ඛත්වා ආහු මන්ද වලාහකා

45 වසුනං වාසවො සෙට්ඨා සක්කො පාග පුරින්දදෙ
දසෙ තෙ දසධා කායා සඛබ්බ නානත්තවණ්ණිනෙතා

46 ඉද්ධිමන්තෙතා ජුතීමන්තෙතා වණ්ණවන්තෙතා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සම්තිං වනං

47 අථාහු සහහු දෙවා ජලමිගනි ඛ්ඛාරිව
අරිට්ඨකා ච රොජා ච උමමා පුපථ නිහාසිනෙතා

48 වරුණා සහ ධම්මා ච අවවුතා ච අනෙජකා
සුලෙය්‍ය රුචිරා ආනු ආහු වාසවනෙසිනෙතා

49 දසෙ තෙ දසධා කායා සඛබ්බ නානත්තවණ්ණිනෙතා
ඉද්ධිමන්තෙතා ජුතීමන්තා වණ්ණවන්තෙතා යසස්සිනෙතා
මොදමානා අභික්කාමුං භික්ඛුනං සම්තිං වනං

50 සමානා මහාසමානා මානුසා මානුසුත්තමා
බිඩ්ඩාපදූසිකා ආහු ආහු මනොපදූසිකා

51 අථාහු හරයෝ දෙවා යෙ ච ලොහිතවාසිනෝ
පාරඝා මිහාපාරඝා ආහු දෙවා යසස්සිනෝ

52 දසෙ තෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනෝ
ඉද්ධිමන්තා ජුතීමන්තා වණ්ණවන්තා යසස්සිනෝ
මොදමානා අභික්කාමුං භික්ඛුනං සම්මිසිං වනං

53 සුකඛා කරුම්හා අරුණා ආහු වෙඝනසා සහ
ඔදතඝයහා පාමොක්ඛා ආහු දෙවා විවක්ඛණා

54 සදා මත්තා හාරඝජා ඛිඩ්ඩකා ච යසස්සිනෝ
එතයං ආඝ පජ්ජුන්නෝ යෝ දිසා අභිවස්සති

55 දසෙ තෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනෝ
ඉද්ධිමන්තා ජුතීමන්තා වණ්ණවන්තා යසස්සිනෝ
මොදමානා අභික්කාමුං භික්ඛුනං සම්මිසිං වනං

56 ඛෙම්යා තුසිතා යාමා සුධ්ධා නා ච යසස්සිනෝ
ලම්බිතකා ලාමසෙට්ඨා පොක්ඛිනාමා ච ආසවා

57 නිම්මාණරතිනෝ ආහු අථාහු පරනිම්මිතා
දසසතා දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනෝ

58 ඉද්ධිමන්තා ජුතීමන්තා වණ්ණවන්තා යසස්සිනෝ
මොදමානා අභික්කාමුං භික්ඛුනං සම්මිසිං වනං

59 සට්ඨි සත දෙවනිකායා සබ්බෙ නානත්තවණ්ණිනෝ
නාමඤ්චෙත ආඝඤ්ඤුං යෙ චඤ්ඤෙ සදිසා සහ

60 පවුත්ථජාතිං අඛිලං ඔඝතිණ්ණං මිතාසවං
දෙවකඛ මොඝතරං නාගං වන්දං ච අසිතාතිගං

61 සුබ්‍රහ්මා පරමත්තා ච පුත්තා ඉද්ධිමතෝ සහ
සනංකුමාරෝ තිසෙසා ච සොපාග සම්මිං වනං

62 සඛස්ස බ්‍රහ්මලොකානං මඛාබ්‍රහ්මාභිඤ්ඤාත
උපපන්නා ජුතීමන්තා භිසමාඝාතයා යසයසිනෝ

63 දසෙව ඉසයරා ආහු පචෙචක වඝවත්තිනෝ
තෙසං ච මජ්ඣතා ආග හාරිතෝ පරිවාරිනෝ

64 තෙ ච සබ්බෙ අභික්කන්තා සඉන්දෙ දෙවෙ සබ්‍රහ්මකෙ
මාරසෙනා අභික්කාමි පසා කණ්හස්ස මද්දියං

65 එථ ගණ්හථ බන්ධථ රාගෙන බුද්ධමුපුත්තුවෙ
සමන්තා පරිවාරෙථ මා වෝ මුඤ්චිත්ථ කොචි නං

66 ඉති තථා මහාසෙනෝ කණ්හසෙනං අපෙසයි
පාණිනා ථල මාහවව සරං කත්වාන භෙරවං

67 යථා දාවුස්සකෝ භීමසෝ එකයනෙනා සවිජ්ජුසෝ
තදූ සෝ පවවුදවතති සංකුදෙධා අසයං වසි

68 තං ච සබබං අභියඤ්ඤාය වවකඛිත්වාන වකඛුමා
තතෝ ආමන්තයි සත්ථා සාවකෙ සාසනෙ රතෙ

69 මාරසෙනා අභික්කන්තා තෙ විජානාථ භික්ඛවෝ
තත ව ආතපප මකරුං සුත්වා බුද්ධස්ස සාසනං

70 විතරාමතහ පක්කාමුං න සං ලොමම්පි ඉඤ්ජයුං
යත්‍ථ බබ්බ විජිත සංගාමා භයාතීතා යසස්සිනෝ
මොදනති සහ භූතෙහි සාවකා තෙ ජනෙසුතා තී

මහාසමය සූත්‍රනං නිට්ඨිතං

සිංහලානුවාදය

මා විසින් මේ මහාසමයසූත්‍රාන්ත ධර්මය මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කපිලවස්තු නම් නගරාසන්නයෙහි (හිමාලය හා ඒකාබද්ධවූ) මහාවනයෙහි හැමදෙනා වහන්සේම රහත්වූ පන්සියයක් පමණවූ මහත් භික්ෂුසංඝයා සමඟ වැඩවාසය කරනසේක දස දහසක් සක්වළින් දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ හා භික්ෂුසංඝයාත් දැකීම පිණිස බෙහෙවින් රැස්වූවාහු වෙත්. ඉක්බිති ශුද්ධාවාස බඹලොව වාසය කරන දෙවියන් අතර දෙනකුන්ට මෙබඳු අදහසෙක් විය.

මේ භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත් පුර සමීපවූ මහාවනයෙහි සිඟල්ලන්ම රහත්වූ පන්සියයක් පමණ මහත් භික්ෂුසංඝයා සමඟ වැඩවාසය කරනසේක. දසදහසක් සක්වළ දෙවියෝ බුදුන් හා භික්ෂුසංඝයා දැකීම පිණිස බොහෝ සෙයින් රැස්වූවාහු වෙති. අපිදු භාග්‍යවතුන් වහන්සේ යම් තැනක නම් එතැනට එළඹෙමු. එළඹ භාග්‍යවත්හු සමීපයෙහි එක එක ගාථාවක් ප්‍රකාශ කරමු නම් යෙහෙක යනුයි.

ඉක්බිති ඒ දේවතාවෝ ශක්තිමත් පුරුෂයකු හකුළුවනලද අතක් දිගු කරන්නාක් මෙන් ශුද්ධාවාස දෙවියන් අතුරෙහි අතුරුදන් වූවාහු බුදුන් ඉදිරියෙහි පහළවූහ.

ඉක්බිති ඒ දේවතාවෝ බුදුන් වැඳ එකත් පසෙක සිටියාහුය. එකත්පසෙක සිටියාවූ එක් දේවතාවක් තොමෝ පළමුකොට එක් ශ්‍රාවකයෙක් බුදුන් සමීපයෙහි මේ ගාථාව කීය.

1 අද මේ වනලැහැබෙහි දිව්‍යසමූහයා රැස්වී මහාසමාගම යෙකි. අදම සියලු කෙලෙසුන් දුරු කොට රහත්වූ කිසිවකු විසිනුත් නොපරදවතලද භික්ෂුසංඝයා දැකීම පිණිස මේ ධර්මසභාවට පැමිණියෙමු යනුයි.

(ඒ ශ්‍රාවක තෙම මේ ගාථාව කියා නමස්කාර කොට පූර්වද්වාරවාට පවිත්‍ර මස්තකයෙහි හොස් සිටියේය.)

ඉක්බිති අනිකුදු දේවතාවෙක් බුදුන් සමීපයෙහි මේ ගාථාව කීය.

2 එහි රැස්වූ භික්ෂූහු තමතමන්ගේ සිත් සමාධියෙන් එකඟ කළාහුය. එසේම කායවඩකාදිය දුරු කොට ඇද නැතිකළාහුය. අසුන් කෙරෙහි මැදහත්ව රැඳෙන් ගත් රියසැරියකු මෙන් පණ්ඩිත භික්ෂූහු චක්ෂුරාදි ඉඳ්‍රියයන් රැක ගනිත්.

(මෙසේ කියා මෙතෙමේත් දක්ෂිණ වක්‍රවාට මස්තකයෙහි සිටියෙය.)

ඉක්බිති තවත් දේවතාවෙක් බුදුන් සමීපයෙහි මේ ගාථාව කීයේය.

3 රාගාදි හුල් සිඳ එබඳුවූම පලිඝය හෙවත් කෘතයම — දෙර අගුල සිඳ එසේම කෙලෙස් තමැනි ඉන්ද්‍රකීලය හෙවත් මාඉම් කනුව උදුරා තෘෂ්ණා රහිතව එසේම පිරිසිදු වූ නිම්ලවූ පසෑස් ඇති සමිඳුයන් වහන්සේ විසින් මනා කොට හික්මවූ තරුණ ඇත්පැටවුන් වැනිවූ ඒ තරුණ රහත් භික්ෂූහු මෙහි හැසිරෙත්.

(එසේ වූ භික්ෂූන් දැකීම පිණිස ආමඟ සි මෙතෙමේත් නමස්කාර කොට හොස් පශ්චිම වක්‍රවාට පවිත්‍ර මස්තකයෙහි සිටියේය,)

ඉක්බිති තවත් දේවතාවෙක් බුදුන් සමීපයෙහි මේ ගාථාව කීයේය.

4 යම් කිසිවෙක් නිබ්බෙමතික සරණගමනයෙන් හෙවත් නිසැකව සරණ යෑමින් බුදුන් සරණ ගියාහු ද ඔව්හු අපාය සංඛ්‍යාත දුගතියට නොයෙත්. මිනිස් කය හැර දිව්‍යකය හෙවත් දිව්‍යලෝකය සම්පූර්ණකරගන්නාහුය යනුයි.

(ඒ බ්‍රහ්ම තෙමේ ද මෙසේ කියා නමස්කාර කොට උතුරුදිග චක්‍රවාට පර්‍වත මස්තකයෙහි සිටියේය.)

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. මහණෙනි, දසදහසක් සක්වළ දෙවියෝ තථාගතයන් වහන්සේ හා භික්ෂු සඞ්ඝයා ද දැකීම පිණිස සබාහෝ ඉසියන් රැස්වූහ. මහණෙනි, අතීතයෙහි යම් ඒ අග්‍රත්වූ සම්‍යක් සම්බුදු-චරයන් වහන්සේලා වූහු ද ඒ භාග්‍යවතුන් වහන්සේලාට ද මට මේ කාලයෙහි මෙන් මෙපමණ වූ ම දෙවියෝ රැස්වූහ.

මහණෙනි, අනාගතයෙහි යම් ඒ බුදුවරයෝ පහළවන්නාහු ද උන්වහන්සේලාට ද එකල්හි මේපමණ දෙවියෝ රැස්වන්නාහුය. දැන් මට මෙනි. මහණෙනි, මෙතැන් සිට මෙහි රැස්වූ දෙවියන්ගේ නම් ගොත් කියන්නෙමි. මහණෙනි, ඒ දෙවියන්ගේ නම් මේ මේ යයි පහළ කරන්නෙමි, මහණෙනි, ඒ දිව්‍යසමූහයාගේ නම් විස්තර වශයෙන් දේශනා කරන්නෙමි, එය කවුරු යොමු කොට අසව් මනාකොට සිතට ගනිව්, විස්තර වශයෙන් දේශනා කරන්නෙමි යි වදාළසේක. එසේය වහන්ස යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවත්හු මෙසේ වදාළසේක.

5 අක්ෂර පද නියමිත ධර්මකොට්ඨාසයක් හෙවත් ගාථා ප්‍රබන්ධ වශයෙන් වර්ණනාසමූහයක් ප්‍රකාශ කරන්නෙමි, යම් කෙනෙක්හි භූමිෂ්ඨ දෙවිකෙනෙක් වෙත් ද, ඔව්හු ඒ ඒ සථාන ඇසුරුකළාහුය. යම් භික්ෂූකෙනෙක් පවිත්‍ර කුක්ෂි අසුරු කළාහු ද භාවනා සඳහා මෙමඟයවනාලද සිත ඇත්තාහු ද, නොකැලඹුණු සංකල්පත් එකඟවූ සිත් ඇත්තාහු ද;

6 බොහෝවූ ඒ භික්ෂූහු සැඟවුණු කෙහෙර සිංහරාජයන් මෙන් කාය චිත්ත විවේකයට පැමිණියාහු ද; රෝමෝද්ගමය අභිනවනය කොට හෙවත් නිර්‍මලයව සිටියාහු ද, නිමිල හෙවත් පිරිසිදු සිත් ඇත්තාහු ද, රාගාදීන් මුසු නොවූ සිත් ඇත්තාහු ද, වෙසෙසින් ප්‍රසන්නවූ නොකැලඹුණු සිත් ඇත්තාහු ද;

7 ඉක්බිති ශාස්තෘන් වහන්සේ කිඹුල්වත් පුරයෙහිවූ මහාවන යෙහි එකල සිටියාවූ සත්ත්වයන්හි ඇළුණාවූ භාග්‍යවතුන් වහන්සේ අධික කොට ඇති පන්සියයක් ශ්‍රාවකයන් දැන ආමන්ත්‍රණය කළ සේක.

8 මහණෙනි දිව්‍යතාමූහයා රැස්ව සිටියාහුය. ඔවුන් වෙසෙසින් දනිව්. ඒ භික්ෂූනු ද බුදුන්ගේ වචනය අසා (ඒ දෙව්බඹුන් දක්නා පිණිස) උපසාහ කළාහුය.

9 ඒ පන්සියයක් පමණ භික්ෂූන්ව දේවාදි අමනුෂ්‍යයන් දක්නා දිවැස් පහළ විය. එසින් ඇතැම් භික්ෂූහු ඒ ඝනුණය වූ පරිද්දෙන් සියගණන් දෙව්බඹුන් දුටුවහ. ඇතැම් භික්ෂූහු දහස් ගණන් ද, සම්හර දෙනාවහන්සේ ලැත්තෑ දහස් ගණන් ද;

10 තැවත සමහර භික්ෂූනු ලක්ෂගණන් ද, සමහර කෙනෙක් ප්‍රමාණයක් නැති දෙව්බඹුන් දුටුවාහුය. කවරහෙයින් ද යත්? සියලු දිනාදෝ දෙවි බඹුන්හෙරා පිරි පැවැත්තාහු ද එහෙයිනි.

11 පසැස් ඇති සමිඳුයන් වහන්සේ ඒ සියලු කාරණයන් දුන අස්ලෙහි දේවා මෙන් ප්‍රත්‍යක්ෂ වෘත්තයන් සලකා ඉක්බිති සස්තෙයි ඇලුණු ශ්‍රාවකවූ ඒ භික්ෂූන්ව ආමන්ත්‍රණය කළසේක.

12 මහණෙනි, දසදහසක් සක්වළ දිව්‍යසමූහයා රැස්වුහ. ඔවුන් භවණින් දනුව. මම නුඹලාට යම් දිව්‍යබ්‍රහ්ම කෙනකුන් සංඛ්‍යාවෂයෙන් වචනවලින් පිළිවෙළින් ප්‍රකාශකරන්නෙම් ද එහෙයිනි.

13 කිඹුල්වත්පුරය ඇසුරු කොට වසන භූමිනිස් ශ්‍රිතවූ දිව්‍ය මය සෘද්ධි ඇති, බැබළීම් ඇති, ශරීරවණී ඇති, යසස් ඇති, සත්දහ සක් පමණ දිව්‍ය සමූහයා සතුටු සිත් ඇතිව භික්ෂු සංඝයා දක්නා පිණිස මහාවනයට රැස්වූහ.

14 හිමාලයෙහි වසන සදහසක් පමණ යක්ෂයෝ කොළහාල් දෙවියෝ කෙයෙක් ශරීරවණී ඇත්තාහු සෘද්ධියෙන් යුක්තවූවාහු ආනුභාව සම්පත් ඇත්තාහු පැහැපත්වූවාහු යසපිරිවර ඇත්තාහු ඉතා ප්‍රසන්න සිත් ඇතිව භික්ෂූන් දැකීමට මහාවනයට රැස්වූහ.

15 සාතාගිර නම් පර්වතයෙහි වසන කාතාවණී ඇති —පෙ— තුන් දහසක් පමණ දෙවියෝ ද, මහාවනයට ආවාහුය.

16 මෙසේ කොළයෙක් වණී ඇති සොළොස් දහසක් පමණ භූමිනිස්ශ්‍රිත දෙවියෝ ද —පෙ— මහාවනයට පැමිණියාහුය.

17 වෙසාමිත්‍ර පර්වතයෙහි වසන —පෙ— පන් සියයක් පමණවූ දෙවියෝ මහාවනයට ආවාහුය.

18 රාජගහ නගරාසන්නයෙහි පිහිටි වෙපුල්ල පර්වතයෙහි වාසය කරන කුමහිර නම් යක්ෂ සේනාධිපති තෙම යක්ෂ සමූහයා.

අතුරෙන් ලක්ෂයකට වැඩි යක්ෂයන් ඇසුරු කෙරේද, රජතෙම නුවර වැසි ඒ කුම්භීර නෙමේත් තමන්ගේ පිරිවර සහිතව භික්ෂූ සම්ඝයා දැකීම පිණිස මහාවනයට පැමිණියේය.

19 (සියලු දිශාභාගයෙහි වසන සතර වරම් දෙවියන් අතුරෙන් පළමු කොට) පූර්ව දිශාභාගයෙහිවූ දිව්‍යමය යසස් ඇති ඍද්ධිමත්‍යන්ට අධිපතිවූ ධ්‍රතරාෂ්ට්‍ර නම් වරම් රජතෙම සියලු ඍද්ධිමත්‍යන්ට අනුශාසනා කෙරේනම් කෙතෙමේ ද;

20 ඒ ධ්‍රතරාෂ්ට්‍ර නම් දිව්‍යරාජයාගේ ශක්‍රයාගේ නම් දරන මහත් බල ඇති —පෙ— බොහෝ දහස් ගණන් පුත්‍රයෝ ද සතුටුව මහාවනයට ආවාහුය.

21 දකුණු දිග වසන දිව්‍යමය යසස් ඇති මහා රාජන්වූ කුම්භාණ්ඩයන්ට අධිපතිවූ විරූඪ රජ තෙම් ඒ සියලු කුම්භාණ්ඩ සමූහයාට අනුශාසනා කෙරේ නම් කෙතෙමේ ද;

22 ඒ විරූඪ මහරජහුගේ ශක්‍රයාගේ නම් දරන මහත් බල ඇති —පෙ— බොහෝ වූ පුත්‍රයෝ ද සතුටුව මහාවනයට ආවාහුය.

23 පශ්චිම දිශාභාගයෙහි වසන දිව්‍යමය යසසින් යුත් මහා රාජන් වූ නාගයන්ට අධිපතිවූ විරූපාක්ෂ නම් රජතෙම ඒ සියලු නාගයන්ව අනුශාසනා කෙරේ නම් කෙතෙමේ ද;

24 ඒ විරූපාක්ෂ නම් නාගරජුගේ -පෙ- බොහෝ වූ පුත්‍රයෝ ද සතුටුව භික්ෂූන්ගේ සමාගමයවූ මහා වනයට ආවාහුය.

25 උතුරු දිශාභාගයෙහි වාසය කරන දිව්‍යයසසින් යුක්ත මහා රාජන්වූ යක්ෂයන්ට අධිපති වූ කුවේර නම් වෛශ්‍රවණ රජතෙම සියලු යක්ෂයන්ට අනුශාසනා කෙරේ ද;

26 කෙතෙමේත් ඔහුගේ —පෙ— බොහෝවූ පුත්‍රයෝත් සතුටු සිත් ඇතිව භික්ෂූන්ගේ සමාගමවූ මහාවනයට පැමිණියාහුය.

27 ධ්‍රතරාෂ්ට්‍ර නම් වරම්දෙවිරජ තෙම පූර්වදිශා භාගයෙහි සියලු ගන්ධර්ව සේනාව පිරිවරා අවුත් රැස්ව සිටියේය. එසේම විරූඪ තෙම දකුණු දිගින් කුම්භාණ්ඩ සේනාව පිරිවරා අවුත් සිටියේය. විරූපාක්ෂ තෙම පශ්චිම දිශාභාගයෙහි සියලු නාගසේනාව පිරිවරා අවුත් සිටියේය. කුවේර තෙම උතුරුදිශාභාගයෙහි සියලු යක්ෂසෙනඟ පිරිවරා අවුත් සිටියේය.

28 ඒ සතර වරම් මහරජදරුවෝ කිඹුල්වත්පුර මහාවනයෙහි ශාක්‍යපුත්‍ර සතර දිශාවන්හි (පවිත්‍ර ස්ථානයෙහි නඟනලද වත්නිශාලයන් මෙන්) දිලිසෙමින් සිටියාහුය.

29 ඒ දෙවියන්ගේ (පාපක්‍රියාවන් ඇතවා වසන) මායා ඇති දූසභාවයට පැමිණි ඒ ඒ ක්‍රියාවලින් රැවටීමට සමර්ථවූ කෙරාටික වූ මායාකාරවූ කුවෙණඬුය වේවෙණඬුය විටුවිවිය විටුඛය යන නම් ඇති එක එක යක්‍ෂයෙක් ඒ දිව්‍යගමූහයා සමග මහාවනයට ආයේය.

30 වඳුනය කාමසෙට්ඨය කිංනුසණඬුය නිසණඬුය(යන මේ යක්‍ෂයෝ දූසයෝය. සෙසු සියල්ලෝ ම දිව්‍යරාජයෝය. ඔවුහු කවරහුද යත්?) පනාදය ඕපමඤඤය දිව්‍යරථාචාර්‍යවූ මාතලිය;

31 විත්තසේන නම් ගඬබිලී දිව්‍යපුත්‍රය, නලකාර නම් වූ දිව්‍යපුත්‍රය, ජනවසභ දිව්‍යපුත්‍රය, පඤ්චසිඛ දිව්‍යපුත්‍රය, තිම්බරු නම් ගඬබිලී දිව්‍යරාජය, ඔහුගේ දියණියවූ සුරියවච්චසා නම් ගඬබිලී කිනෑම ද (ඒ දවස ඒ මහා වනයට ආවේය.)

32 මේ නම් වශයෙන් කියනලද ගඬබිලී රජවරු ද අනිකුදු ගඬබිලී රජහු ද සෙසු රජුන් සමග සාදවූ සිත් ඇතිව භික්‍ෂූන්ගේ සමීපයවූ මහාවනයට රැස්වූහ.

33 ඉක්බිති ආකාශගංගා ආදියෙහි වසන දිව්‍ය නාගරාජ සමූහයා ද විසාලී නම් වූ නාගභවන වාසී නාගසමූහයා ද තවත්ක නම්වූ නාග පිරිවර සහිතව ඒ මහාවනයට ආවාහුය. කම්බල නම්වූ කුලයෙහි නාග රාජ සමූහයා ද (මොවුහු මහමේර පතුලෙහි වසන ඔරුඔයන් විසිනුදු අල්වා ගත නොහැකි මහත් ආනුභාව ඇති සම්‍යක්දෘෂ්ටික නාගරාජයෝය) පායාග නම් නාගභවනයෙහි වාසය කරන ඒ නාගසමූහයා ද, තම තමන්ගේ ඤාතීන් සමග ඒ සමාගමයට පැමිණියාහුය.

34 යමුනා වැසි නාගසමූහයා ද, ධෘතරාෂ්ට්‍ර කුලයෙහි උපන් නාගරාජයෝ ද, දිව්‍යමය ඇසින් යුක්තව ඒ මහාවනයට ආවාහුය. එරාවණ නමින් ප්‍රසිද්ධවූ මහා නාගරජතෙමේ ද (මේතෙම දිව්‍යලෝකයෙහි උපන් බැවින් නාගව්‍යවහාරයෙන් ප්‍රසිද්ධයි) ඒ ශ්‍රමණ සමූහයා දක්නා පිණිස මහාවනයට පැමිණියේය.

35 යම්කිසි සත්ත්වතෙනෙක් ගම් මේ වෙනාලාදි සියලු නාග සමූහයා ලොභාධික ආසාවෙන් වහා හැර ගනිද්ද, දිව්‍යවූ ආනුභාව ඇති දෙවරක් උපන් හෙයින් දිව්‍ය නම්වූ දිව්‍යමයවූ පියාපත් ඇති (ගොදුරන් සියයක් මහා දඹරක් අතර වසන නාගයන් දැකීමට සමර්ථ හෙයින්) විශුද්ධ චක්‍ෂුස් වූ ඒ පක්‍ෂිරාජයෝ අහසින් මේ

මහා වනමැදට පැමිණියාහුය. මනා විසිතුරු පියාපත් ඇති සෙයින් චිත්‍රා සුපර්ණා යනු ඔවුන්ට නමකි.

36 එකල්හි ඒ ඒ තැනින් රැස්වූ නාගයන්ට අභය වූයේය. සජීඳුයන් වහන්සේ ගුරුළුන් කෙරෙහි ඔවුන්ට වන බිය මැළකා ඔවුනොවුන් හා සමඟ ප්‍රියවචනවලින් ප්‍රිය මිත්‍ර බන්ධුභාවයට පමුණුවා නිර්භය බවට පැමිණවූයේය. එබඳු නාගයෝ ද ගුරුළෝ ද බුදුන් සරණ ගියාහුය.

37 ශක්‍ර දේවේන්ද්‍රයා විසින් සමුද්‍රය අසුරු කළාවූ අසුරයෝ පරදවනලද්දාහුය. මේ සියලු අසුරයෝ සක්දෙවිරජහුගේ සහෝදරයෝ වෙති. දිව්‍යමය සෘද්ධි ඇති දිව්‍යමය යසස් ඇති ඔවුහු ඒ මහාවනයට රැස්වූවාහුය.

38 කාලකඤ්ජක නම් අසුරයෝ මහත් වූ භයජනක ශබ්ද ඇතිව භයානක රූපයන් මවාගෙන ආවාහුය. දූතවේඝස නම් බහුසිර අසුරයෝ ද, වෙපචිත්ති අසුරේන්ද්‍රයා ද, සුචිත්ති නම් අසුරයා ද, පහාරාද නම් අසුරේන්ද්‍රයා ද නමුච් නම් වූ මාර දිව්‍යපුත්‍රයා හා සමඟ රැස්වූවාහුය.

39 බලි නම්වූ මහා අසුරයාගේ සියඟණන් පුත්‍රයෝ ද, ඒ සියල්ලෝම තමන්ගේ මාතුලවූ රාහු අසුරේන්ද්‍රයාගේ නම් දරන්නෝය. ඔව්හු තම තමන් විසින් කරනලද සත්තාභ සත්තභද්ධව රාහු අසුරේන්ද්‍රයා කරා පැමිණ පින්වත්නී දැන් ඔබතුමන් රැස්වූ මහාවනයට රැස්වීමට කල් එන්නේය යි දැන්වූහ.

40 ආපොකසිණ භාවනාව වඩා බඹලොව උපන් ආප නම් දෙවියෝ ද, එසේම පඨවී කසිණයට සමවැදීම් වශයෙන් උපන් පඨවි නම් දෙවියෝ ද, තේජෝ කසිණය වඩා උපන් තේජ නම් දෙවියෝ ද, වායෝ කසිණය භාවනා කොට බඹලොව උපන් වායු නම් දෙවියෝ ද, එදවස් ඒ මහාවනයට රැස්වූහ. එසේම වරුණ නම් දෙවියෝ ද, සෝම නම් දෙවිතෙමේ ද, යස නම්වූ දෙවියන් සමඟ රැස්වූවාහුය.

41 මෛත්‍රී ධ්‍යාන භාවනා කරුණාධ්‍යාන භාවනාවන් පුරුදු කිරීමෙන් උපන් ඒ සිහලු දෙවියෝ ද, දිව්‍යමය වූ යසසින් යුක්තාව දස කොටසක්ව දස දිසා භාසයෙන් හා වණ්ණයෙන් යුක්තව ඒ මහාවනයට රැස්වූහ.

42 ඒ සියල්ලෝ මහත් ඍද්ධි ඇතිව බබළන ශරීර ඇතිව පැහැපත් ශරීර ඇතිව යසස් ඇතිව සතුටුසිත් ඇතිව භික්ෂු සම්තිය ඇති මහාවනයට පැමිණියහ.

43 වෙණහු නම් දෙවියෝ ද, සහලී නම් දෙවියෝ ද, අසම නම් වූ දෙවියෝ ද, දොයමක නම්වූ දෙවියෝ ද, වඳුදිව්‍ය පුත්‍රයා පිරිවරා වසන සියලු දෙවියෝ ද, ඒ සඳ දෙව්පුතු ඉදිරිපත් කොට ගෙන එතැනට රැස්වූහ.

44 සූයඝී දිව්‍යරාජයා පිරිවරා වසන සියලු දෙවියෝ ද, සූයඝී දිව්‍ය පුත්‍රයා ප්‍රමුඛ කොට ඒ මහාවනයට රැස්වූහ. ඒ ඒ නක්ෂත්‍ර තාරකාවන්ට අධිපතිව වසන සියලු දෙවියෝ ද ඒ ඒ නකත් තරුවැසි සෙසු දෙවියන් පිරිවරා මහාවනයට රැස්වූහ. වස්සවලාහක වාතවලාහක උණ්හවලාහකාදි වලාහක පක්ෂයෙහිවූ සියලු දිව්‍යපුත්‍රයෝ ද ඒ මහාවනයට රැස්වූහ.

45 සියලු දෙවියන්ට අධිපතිවූ පුරින්දද නම් වූ ඒ සක්දෙවි රජ ද තමන් සහපිරිවරින් ඒ මහාවනයට පැමිණියේය. ආපෝ ආදි ඒ දස ප්‍රකාරවූ දිව්‍යසමූහයා දසදිහාභාගයෙන් රැස්ව සියල් ලෝම නානා වණ්ණයෙන් සැරසී—

46 ඍද්ධිමත්ව ද්‍යුතිමත්ව වණ්ණවත්ව යසවත්ව සතුටු සින් ඇතිව භික්ෂුසමාගමයවූ මහාවනයට රැස්වූහ.

47 තවත් සහභූ නම් දෙවියෝ ද, ගිනි සිළු මෙන් දිලිසෙන ශරීර ඇති ජලමහසිඛ නම් වූ දෙවියෝ ද, අරිට්ඨක නම් වූ ද, රෝජ නම් නම්වූ ද, මුහුණවල් මාලාවන් මෙන් මහත්වූ ශරීරරශ්මි ධාරාවන් ඇති හෙයින් උම්මාපුප්ඵනිභ නම්වූ දෙවියෝ ද, තම තමන්ගේ දිව්‍ය යසසින් ශ්‍රීකතව මහාවනයට රැස්වූහ.

48 වරුණය සහධම්මය අච්චුතය අනෙජකය සුලෙය්‍යය රුචිරය යන නම් ඇති දෙවියෝ ද, මහාවනයට ආහ. එසේම වාසවනෙසි නම් දෙවියෝ ද, ඒ සමාගමයට රැස්වූහ.

49 තථෝක්ත සහභූ දෙවියන් ඇතුළු ඒ දස පරිද්දෙන් වූ දිව්‍යසමූහයා සියල්ලෝම නිල පිතාදි නානා වණ්ණයෙන් ශ්‍රීකත ව ඉද්ධිමන්තා —පෙ— අභික්කාමුං මහාවනයාය රැස්වූහ.

50 සඤ්ඤ නම්වූ ද, මහාසඤ්ඤ නම්වූ ද, මානුස නම්වූ ද, මානුසුත්තම නම්වූ ද, ඒ සියලු දෙවියෝ මහාවනයට රැස්වූහ. ඛිඩ්ඩාපදුසික නම් වූ ද, මනොපදුසික නම්වූ ද, දෙවියෝ ඒ මහා වනයට රැස්වූහ.

61 ඉක්බිති ගරිදේව නම්වූ ද, යම් ලෝහිතවාසි දෙවිඝකඝනක් වෙත් නම් ඔව්හු ද, ඒ සමාගමට රැස්වූහ. පාරඝ නම්වූ ද, මිහා පාරඝ නමවූ ද, දෙවියෝ දිව්‍යමය යහසින් සුකතාව ඒ මහාවනයට රැස්වූහ.

62 යථොක්තවූ ඒ සමානාදි දසවැදුරුම් දිව්‍ය සමූහයා දස දිසාභාගයෙන් සඛබ —පෙ— අභික්කාමුං, මහාවනයට රැස්වූහ.

63 සුකක නම්වූ දිව්‍යපුත්‍රයෝ ද, කරුම්භ නම්වූ දිව්‍යපුත්‍රයෝ ද, අරුණ නම්වූ දිව්‍යරාජයා හා සමග වෙසකඝ නම්වූ දෙවිඝයෝ ද, ඒ මහා සමාගමයට රැස්වූහ. ඔදතඝග්ඝ නම්වූ ප්‍රධාන දෙවියෝ ද, විවඤ්ඤණ නම්වූ දෙවියෝ ද, ඒ මහාවනයට රැස්වූහ.

64 සදාමත්ත නම්වූ ද, හාරඝජ නම්වූ ද, දිව්‍යමය යසස් ඇති මිසඤක නම්වූ දෙවියෝ ද, ඔමෙක් දහස් ගණන් විදුලිය පැහැර යම් යම් දිසාභාගයෙක්හි මනා කොට වඩී කෙරේ නම් ඒ ප්‍රදයුම්න දිව්‍යපුත්‍ර ද, ඒ සමාගමයට රැස්වූහ.

65 මේ ඇතොක්ත සුකකාදි දශවිධ දිව්‍යසමූහයා දසදිසාභාග යෙන් සඛබ —පෙ— අභික්කාමුං, මහාවනයට රැසවූහ.

66 ඛෙමිඝ නම්වූ දෙවියෝ ද, තුසිත දෙවියෝ ද, යාම දෙවියෝ ද, දිව්‍යමය යහසින් යුත් සටඨක නම්වූ ද, ලම්බිතක නම්වූ ද, ලාමසෙටඨ නම්වූ ද, මහත් වූ ශරීරාලොකඝ ඇති හෙයින් ජෝති නාම නම්වූ ද ආසව නම්වූ ද, දෙවියෝ ඒ සමාගමයට රැස්වූහ.

67 නිම්මානරති දෙවිඝයෝ ද, මහාවනයට ආවාහුග. ඉක්බිති පරනිර්මිත වසවර්ති දෙවියෝ ද ආඝ. යථොක්ත ඒ ඛෙමාදි වූ දශවිධ දිව්‍යසමූහයා සියල්ලෝ නොයෙක් ශරීරවණී ඇතිව

68 ඉදධිමනෙතා —පෙ— අභික්කාමුං භික්ෂු සම්තිඝ ඇති මහාවනයට රැස්වූහ.

69 "ආපො ච දෙවා" ඝන ආදී ක්‍රමයෙන් දැක්වූ දශඝා සඝක් වූ මේ දිව්‍යනිකායඝෝ හෙවත් දේවකොටස් සියල්ල අනඝක ප්‍රකාර ශරීරවණී ඇතිව ඔවුනොවුන්ගේ කොටස්වලට අයත් නම් ශොත් වලින් යුකතව පැමිණියාහුග. ඇම් කිසි අනිකුදු දහසක් සක්වළ වැසි දෙවියන් හා එකතුව සමාගමියව රැස්වූහ.

70 ඉපදීම දුරු කළ හෙයින් පවුත්ථජාති නම්වූ රාහාදි කෙලෙස්හුල් උදුලා වූ කාමාදි සතර ඕඝයන් ඉක්මවූ කාමාදි සතර ආශ්‍රවයන් දුරුකලා වූ ආඝ්‍යඤඤරතනඝ ද, මේඝකුවගෙන් මිදුණු

වඳුයා මෙන් ඔබලම්හි වැඩහුන් වතුරොඝයන් තරණය කළ තථාගතයන් වහන්සේ ද, දක්නෙමු.

61 සුබ්‍රහ්ම නම් බ්‍රහ්මයෙක් ද, පරමත්ත නම් බ්‍රහ්මයෙක් ද, ඍද්ධිමත් බුද්ධපුත්‍රවූ ආර්‍ය්‍ය බ්‍රහ්මරාජයන් හා සමග රැස්වූහ. ඒ සුප්‍රසිද්ධ සනත්කුමාර නම් බ්‍රහ්ම තෙමේ ද, තිස්ස නම් බ්‍රහ්මතෙමේ ද, මහාවනයට පැමිණියේය.

62 යම් තැනෙක එක එක මහාබ්‍රහ්මයෙක් සෙසු බ්‍රහ්මයන් තමන්ගේ ආනුභාවයෙන් මිඩතට පොහොසත් ද, එබදු වූ දස දහසක් සක්වල දැහැතිලිවලින් ආලෝක කිරීමට සමර්ථවූ බ්‍රහ්මරාජයෝ දහසක් රැස්වූහ. මේ හැම බඹලොව උපන්නේය. ආනුභාව සම්පන්නය. මහා ශරීර ඇත්තේය. යශසින් සුකතය.

63 මේ දහසක් බ්‍රහ්මසමූහයෙහි වෙන් වෙන් වශයෙන් දස කොටසක් කොට එකි එකී කොටසක් තමා වසඟයට පමුණුවා වාසය කරන්නාවූ දසදහසක් සක්වල ඊශ්වරභාවයට පැමිණි ඒ මහාබ්‍රහ්මරාජයෝ දසදෙනා ද, රැස්වීමට ආවාහුය. ඔවුන් අත ඉරහි හාරිත නම් බ්‍රහ්මයා ද, සිය දහසක් බඹුන් පිරිවරා ඒ මහා වනයට පැමිණියේය.

64 ශක්‍රදේවේන්ද්‍රයා ප්‍රධාන කොට ඇති සියලු දිව්‍යසමූහයා ද, හාරිත නම් මහාබ්‍රහ්මයා ප්‍රධාන කොට ඇති සියලු බ්‍රහ්මසමූහයා ද, යන ඒ සියල්ලන්ම ඒ සමාගමට රැස්වූ කල්හි සියලු මාරයේනා ව ද, ඒ මහාසමාගමයට ආවාහුය. මෙහිදී ඒ මාරයාගේ අනුචරණ කමක සැටි බලව.

65 මෙහි වරෙව්,අල්වා ගනිව්,රාග නමැති පාසයෙන් බඳිව්. මේ සියලු දිව්‍යසමාගමය බඳනා ලද්දේම වේවා, වට කොට පිරිවරා සිටිව්. තෙපි ඒ දිව්‍යසමූහයා අතුරෙන් කිසිවකු මුදා නොහරිව් යයි ඒ මරදෙව්පුත් තමාගේ පිරිසට මෙසේ අණ කෙළේය.

66 මෙසේ ඒ සමාගමයෙහි මහත් සේනා ඇති මාර දිව්‍ය පුත්‍රතෙම අතින් පොලවට ගසා භයානක ශබ්දපවත්වා මරසෙනඟ දෙව්පිරිස් අතරට යැව්ය.

67 විදුලි සහිතව ඇත මැත හැටෙන්නාවූ වර්ෂා ඍතුවෙහි වූ මහාමේඝය තෙම හජිනා කරන්නේ යම්සේ ද, එපරිද්දෙන් එකල්හි ඒ මාරදිව්‍යපුත්‍ර තෙම බිහිසුණු ශබ්ද පවත්වමින් කිපුණු

ණේ තමහට කිසිවකු වසඟ කරගත නොහැකිව හැවතුණේය. නොබොත් ආපසු හැරී තමාගේ වාසඟවනයටම ගියේය.

68 පසැස් ඇති සම්බුදුයන් වහන්සේ ඒ සියල්ල දැන වදුරා නුවණින් සලකා ඉක්බිති සම්බුදු ශාසනයෙහි ඇදුණුවූ ශ්‍රාවකයන්ට කථා කළසේක.

69 මහණෙනි, මරසෙන්හු ඉක්ම ගියාහුය. නුඹලා තම තමන්ට අනුරූපවූ ඵල සමාපත්තියක් සලකව්. ඒ භික්ෂූන් වහන්සේලා ද සම්බුදුයන් වහන්සේගේ අනුශාසනය අසා ඵලසම වතට පැමිණීම පිණිස උත්සාහ කළාහුය.

70 (මාරයා හා ඔහුගේ අනුචරයෝ) චිතරාඟින් කෙරෙන් දුරුව ගියාහුය. රෝමකූපමාත්‍රයකුදු නොසෙල් විය හැකි වූහ. ඒ සියලු භික්ෂූහු දීනූ කෙලෙශ සංග්‍රාම ඇත්තාහු හෙවත් කෙලෙස් සතුරන් පරදවා ජයගත්, ඉක්මවූ භය ඇති, යසසින් යුත්, උතුමෝ වූහ. ජනයා අතරෙහි ප්‍රකටවූ ඒ ශ්‍රාවකයෝ සස්සෙහි උපන් ආර්‍යයන් සමඟ සතුටුව වෙසෙති සි වණීතා කෙරෙමින් ඒ මාර දිව්‍ය පුත්‍ර තෙම තමන්ගේ දෙව්ලොවට ගියේය.

මහාසමය සූත්‍රයෙහි සිංහලානුවාදය නිමි

දහම් විසතර

මේ මහාසමය සූත්‍රය විශෂයයෙන් දෙවියන්ට ප්‍රියමනාපවූ දේශනාවකි. මෙහි අලෙපශාක්‍ය මිහෙශාක්‍ය දෙවිබඹුන්ගේ නම් ගොත් මෙහෙවින් ඇතුළත් වන හෙයිනි. දස දහසක් සක්වළින් රැස්වූ දෙවියන්ගේ නම්ගොත් ප්‍රකාශ කිරීමට කරුණු නම් බුදු රජාණන් වහන්සේ අප අපගේ නම්ගොත් දේශනා කරනසේක් නම් එයෙහෙකැ සි සිතූ දෙවියන්ගේ අදහස් නොපැකිළ දනගත් හෙයිනි. මේ දේශනාව අසා සිටි කෝටි ලක්ෂයක් දෙවියෝ රහත් වූහ. සෝවාන්වූවන්ගේ ගණනෙක් නැත.

එහෙයින් දෙවියෝ මේ සූත්‍රය අසන්නට කැමති වෙති. කන් යොමුකිරීමට කැමති වෙති. පහන් සිතින් අසති. කවර කලෙක අසමුදු සි බලාපොරොත්තු වෙති. කරුණු මෙසේ හෙයින් දෙවියන්ට ප්‍රියවූ මේ මහාසමය දේශනාව අභිනව ගෘහ මන්දිරාදියෙහි

මතුල් පිරිතක් වශයෙන් කිවයුතුමි ය. අභිනව කම්මනත ශාලා ආදි අභිවෘද්ධි සාධක ස්ථානයන්හි දී ධම්මඤ්ඣායක් තනවා මලෝ ලොඹු එල්වා සුවඳ දුම් අල්වා ලද පස්මල් ඉස පූජෝපහාර විධි පවත්වා ගෞරවාදරයෙන් කියවිය යුතු ය. බණපිරිත් දෙසුම්හි කියත්‍ර කිම, දිවා රෑ දෙක්හි තිස් පෑ තුනක් පසක් සතක් වශයෙන් කියවෙන පිරිත්වලදි සුදුසු පරිදි කිව යුතු ය. දෙවියන්ගේ චිත්තාරාධනයට සුදුසු වන සේ ගෞරව සම්භාර ඊටි පැවත්විය යුතු ය.

මේ සූත්‍රය දෙවියන්ට ප්‍රිය මනාප බව දැක්වීමට මේ කථා වෙකි. අතීතයෙහි මේ ලක්දිව කෝටඹබඬ නම් විහාරයෙක් විය. එහි නාගඝලන නම්වූ ලෙන් දෙර පිඟිරි විශාලවූ නාගරාජයක්ද විය. එහි එක් දෙවිදුවක් අධිශාභිත ව සිටියා ය.

ඉක්බිති ඒ ගල්ලෙන විසූ එක් තරුණ භික්ෂූනමක් ගල්ලෙය තුළ හිඳ "එවං මෙ සුතං එකං සමයං භගවා සකෙසාසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ මහතා භික්ඛුසංඝෙන සද්ධිං පඤ්ච මත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහණෙහි" යන ආදීන් පටන්ගෙන මේ සූත්‍රයෙහි මූල මැද කොවරදවා කවපාඩමෙන් සජ්ඣායනා කරන්ට පවන්ගත්තේ ය.

එය අසා සිටි දෙවිදුව සූත්‍රය අවසාන කරන කල මහත්වූ සාධුකාරයක් පැවැත්විය.

එකෙණෙහි භික්ෂූන් "මේ කවරෙක්ද" යි විවාළේ ය. එකල ඕතොමෝ "ස්වාමිනි, මම මේ නාරැකෙහි වසන දෙවිදු වෙමි" යි පිළිතුරු දුන්නා ය. "කුමක් හෙයින් සාධුකාර දුන්නෙහි ද" යි භික්ෂූන්ගෙම් ඇසී ය. "ස්වාමිනි, බුදුරජාණන් වහන්සේ යම්කලෙක මාහවනයෙහි වැඩහිඳ මහාසමය දේශනාව වදාළසේක් නම් එකල්හි දී මම ඒ ධම්මය අසා සිටියෙමි. ඉන් පසු අද ඇසීමි. එදවස් බුදුහු වදාළ ලෙසින් එකම අකුරකුදු අඩුවැඩි නොකොට කොවරදවා වදාළ නියාව යෙහෙකැ යි" ඕ තොමෝ කීවා ය.

එකල්හි භික්ෂූන්ගෙම් "නුඹ බුදුන් විසින් දෙසූ දවස්හි මේ ඇසුයෙහි ද" යි ඇසී ය. "එසේය වහන්ස" යි ඕ තොමෝ පිළිතුරු දුන්නා ය. "එද දස දහසක් යක්වළ දෙවිබඹුන් රැස්වූයේ කොටද? නුඹ ඇසුයේ කොතැනක සිටද" යි භික්ෂූන්ගෙම් ඇසී ය.

"ස්වාමිනි, මම එදා මහාවනයට රැස්වූ දෙවියන් අතරමැ සිටියෙමි. මහඟාකාය දෙවියන් රැස්වන්නේ ම දඹදිව ඉඩ කොලැබ සිංහල දිවයිනට පැමිණ දඹ ඇතා පටුවෙහි සිට ඇසීමට උත්සාහ කෙළෙමි. දිව්‍යසේනාව බොහෝසේ රැස්වීමෙන් එහිදු ඉඩක් නොලැබ අනුක්‍රමයෙන් පසු බැස රුහුණු ජනපදයෙහි මාගමට එක්ටෙක ඇතා පිට බුහුදෙනි කළවලු පමණ දියෙහි සිට ඇසුයෙමි"යි ඕතොමෝ පිළිතුරු දුන්නා ය.

ඉක්බිති භික්ෂුතෙම "නුඹ සිටි තැනට බුදුහු වැඩහුන් ප්‍රදේශය ඇත කොවේදැ"යි විමසූ ය. 'ස්වාමිනි, කමක් අසනසේක් ද? භාග්‍යවතුන් වහන්සේ මහාවනයෙහි වැඩහිඳ ධර්මදේශනා කරන කල්හි නිරන්තරයෙන් මා දෙස බලා මට ම දහම් දෙසති යි සිත මින් තැමී හිඳ බණ ඇසීමි"යි ඕ තොමෝ පිළිතුරු දුන්නා ය.

"එදවස කෙළලක්ෂයක් දෙවියෝ රහත්වූහ නුඹත් එදවස රහත්වූයෙහි දැ යි භික්ෂුතෙමේ විමසූ ය. නැත ස්වාමිනි, එසේ නම් අනාගාමී වූයෙහි ද? නැත ස්වාමිනි, එසේ නම් සකෘදාගාමී වූයෙහි ද? කැත ස්වාමිනි, භාග්‍යවාන් එලඟට වත් පැමිණියෙහි දැ"යි විමසූ ය." එසේය ස්වාමිනි"යි දෙවිදු පිළිතුරු දුන්නාය

එවිට භික්ෂු තෙම "එම්බල දේවතාව තාගේ ශරීරය පෙන්වා ලිය හැකි දැ"යි විමසූ ය. "ස්වාමිනි, මුළු ශරීරය දැක්විය නොහැක. එක ඇඟිලි පුරුකක් පමණක් පෙන්වම්"යි දෙදර යතුරු කවුළුවෙන් ඇඟිලි කොණක් ලෙණතුළට ඇතුල් කළ විගසම හිරු දහස් සඳදහස් තැංහාසේ ලෙණතුළ ඒකාලෝක විය.

ඒ දෙවිදු තොමෝ "ස්වාමිනි මහණදම් පිරීමෙහි අප්‍රමාද වුව මැනව යි භික්ෂූන් වහන්සේට අවවාද කොට වැද අවසර ගෙන එතැනින් අතුරුදහන් වූවා ය.

මේ මහාසමය නම්වූ මහායමාගමයෙහි "සියලු දෙවියෝ බුදුන් දැකීමට හා බණ ඇසීමටත් භික්ෂුසංඝයා දැකීමටත් යවු"යි උද්ඝොෂණා කෙරෙම්ෑ මහාවනයට රැස්වූහ. ඔවුන්ගේ ඝඩ අඝ දසදහසක් සක්වළ දෙවියෝ රැස්වූහ.

"දසලොකධාතු" යනි මේ සූත්‍රයෙහි සඳහන්වූයේ දසදහසක් සක්වළ ගැන ය. "පඤ්චමත්තානි භික්ඛුසතානි සබ්බඤ්ඤුතඤාණස්ස අරහත්තානි" යනුවෙන් දැක්වූයේ එදවස රහත්වූ පන්සියයක් භික්ෂූන් සඳහා ය.

භාග්‍යවතුන් වහන්සේ මහාසම්මත වංශයෙහි උපන්සේක. මේ භික්ෂූහුත් එසේ ය. භාග්‍යවත්තෙම ක්ෂත්‍රිය වංශිකයෙකි. මේ භික්ෂූහු ද එසේය. භාග්‍යවත් තෙම රජකුලයෙන් පැවිදි විය. මේ භික්ෂූහු ද එසේ ය. භාග්‍යවත් තෙම අතව පත් සක්විතිරාජ්‍යය අත්හැර පැවිදි විය. මේ භික්ෂූහු ද අතව පත් රජසේසත් හැර පියා පැවිදි වූහ. මේසේ භාග්‍යවතුන් වහන්සේ මහාවනය වැනි පිරිසිදු තැනෙක තමන් වහන්සේත් නිකෙලෙස් වූ සේක් මි රාහාදි කෙලෙසුන්ගෙන් පවිත්‍රවූ පන්සියයක් භික්ෂූන් පිරිවරා වැඩහුන් අයුරෙහි ප්‍රසන්න වූ දෙව්බඹුහු මෙසේ රැස්වූහ.

එසේම අයංඥතල අරුතල බඹලෙව් වැසි දෙවියන් හැර භූමිනිශ්‍රිත දෙවියන්ගේ පවන් බඹලොව දක්වා රැස්වූ සියලු දෙවියන්ගෙන් මුළු සක්වළඟැබ පිරී සිටියේ ය. යමකුට නවමහල් ලෝවා මහාප්‍රාසාදය වැනි ගලක් බඹලොව සිට පෙරළිය හැකි වේ නම් ඒ ගල පොළවට බසින්ට සාරමසක් ගතවෙයි. මේ උපමායෙන් මේ සක්වළ ගැබ පවන් බඹලොව දක්වා මේසා මහත්වූ පරතරයෙහි මෙහි රැස්වූ දෙවියන්ගෙන් අතරක් සිදුරක් නොමැතිසේ පිරී පැවති අන්දම දතහැකි ය. මේසේ ඇතත් මොවුන්ගේ රැස්වීම භාග්‍යවතුන් වහන්සේට වත් භික්ෂුසංඝයා වහන්සේට වත් කරදරයට හිරිහැරයට හේතුවක් නොවිය. කොපමණ මහාජනයා රැස්වූවත් සක්විති රජු වසන තැනට අවකිරයක් ඇති නොවන්නාක් මෙනි.

මෙහි ශුද්ධාවාසකායික දෙවියන්ගේ සම්ප්‍රාප්තිය කෙසේවිද යත්? ශුද්ධාවාස නමින් හැඳෙන බඹලෝ පසෙකි. එනම් අවිහය, අතප්පය, සුදස්සය, සුදස්සිය, අකනිට්ඨය යනුයි. මෙහි වැසි අනාගාමී රහත් බඹුන් අතරෙහි මහාවනයට පැමිණි බඹුන් සතරදෙනා නීලකසිණ පීතකසිණ ලෝහිතකසිණ ඔදාතකසිණ යන් වඩා එය පාදක කොට ගත විදසුන් වඩා බඹලොව උපන්නෝ වෙති.

මෙවිහු තමන් පුරුදු කළ කසිණ බලයෙන් සමාපත්තීන්ව සමවැද එයින් නැඟිට බ්‍රහ්මඥවතය බැලූකල්හි කිසිවකු එහි නැති නියාව පෙනිණ. එයට හේතුව නම් සියලු බ්‍රහ්මයන් මහාවනයට රැස්වීම යි. "පුද පඬුරු නොගෙන හිස් අතින් මෙහි හිමයාත් අපව ඉන්වවත් තැනක් නො ලැබෙයි" යනු සලකා තුටු පඬුරු ගෙනයන්නවුන් සේ ගාථා සතරකින් බුදුගුණ ගයන්නෙමු"යි එක එක ගාථාවක් සකස් කොටගත මේ මහා සමාගමයට තමනුත්

පැමිණි බව භගවමින් තම තමා අයත් නීල පීත ලෝහිත ඔදාත රශ්මීන් විහිදුවා සතර දිශාවෙන් රැස්වූහ.

මේ සූත්‍රයෙහි දක්වන පන්සියයක් භික්ෂූහු තම ශාක්‍ය කොලිය දෙනුවර වැස්සන් අතර ඇතිවූ දියදබරය සන්සිඳුවනු සඳහා වැඩම වූ ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේව ඒ දෙනුවර වැස්සන් විසින් පැවිදි කරගැනීම සඳහා බාරදුන් තරුණ පිරිසකි.

මේ කථාව මනුෂ්‍ය සම්පත්ති ශීලසම්පන්න කිරීමට ප්‍රබලවූ සාර වත් උපදෙස් ඇසුරු කොට ඇති හෙයින් මෙහි ලා සැකෙවින් ඇතුලත් කරනු ලැබේ.

ශාක්‍ය කොලිය දෙනුවර වාසිහු කිඹුල්වත් පුරයවත් කෝලිය නුවරවත් අතර පිහිටි රෝහිණී නම් ගඟ එකම වේල්ලකින් අහුරාගෙන ශස්‍ය කෙරෙති.

ඉක්බිති පොසොන් මස මූල භොයම් මැලවී ගිය කල්හි දෙනුවර වැස්සන්ගේ කොයියෝ අමුණු බැඳීමට එක්වූහ. ඔවුන් අතරෙන් කෝලිය නුවර භොවිහු මේ ජලය දෙකොඩව ගෙන යන කල අප දෙපසෙයට ම පිරිමැස්මක් කොවෙයි. අපේ කුඹුරු එක් දියවර කින් ම පැහෙන හෙයින් ජලය අපට දෙව යි කීහ.

කිඹුල්වත්පුර භොවිහු "නුඹලා කුඹුරු වපුට අස්වැන්න ලබා ගෙන අටුකොටු පුරවා ගත්කල අපට රන්රුවන් මුතු මැණික් කහවණු හෙන මලු පැස් ආදිය රැගෙන ගඟදොරක් පාසා ඇවිදිනු කොහැකි ය. අපගේ කුඹුරුත් නුඹලාගේ කුඹුරු මෙන් ම එක් වරෙක ගත් දියෙන් ම පැහෙන්නේ ය. එහෙයින් මේ ජලය අපට දෙව" යි කීහ.

දෙනුවර වැස්සන් ම "අපි කොපට නොදෙමහ, අපි කොදෙම හ"යි ඔවුනොවුන් එකිනෙකා වාසි බස් බෙණෙමින් සැට හතර කල එකෙක් නැගිවඅනිකාට අතුල් පහරක් දුන්නේ ය. මෙප මණකින් නොනවත්නා ඔව්හු ජාති භොත්‍රයෙන් ද සවා කුලමල කියන්ට ද පවන්ගත්හ.

කොලිය නුවර වාසිහු "නුඹලා කිඹුල්වත්පුර වැස්සන්ගේ බලය ඉෂ්ට කරන්නහු ද? ඔව්හු බලු කැණහිලුන් මෙන් තමන්ගේ නැඟණි වරුන් හා එක්ව වාසය කළෝ නොවූහු ද? එබන්දන්ගේ ඇස් අස් පලිඟ ආවුධාදියෙන් අපට කුමක් කළ හැකිද" යි කිඹුල්වත්පුර වැස්සන්ට නිග්‍රහ කළහ.

කිඹුල්වත්පුර වැස්සෝද "තෙපි දැන් කුමට කොල්ලන් හෙන ඇදීනා කරන්නහු ද? පෙර යම් කෙනෙක් අනාථව අහරණ ව ඔබරඟසෙක වූසුහු නම් ඒ තෙපි නොවෙත් ද? එබන්දන්ගේ ආනුඛාදියෙන් අපව කුමක් නම් කළ හැකිද සි ශාක්‍යවාසීන්ට මෙසේ කථා කළහ.

ඉක්බිති ඔවිහු ඝොස් ඔවුන්ගේ කම්කරු ඇමතියන්ට කීහ ඔවිහු රජුන්ට දැන්වූහ. එකල්හි ශාක්‍යයෝ "නාඟණියන් සමඟ වාසය කළවුන්ගේ ශක්තියත් බලයත් කොල්ලයන්ට පෙන්වම්" සි සුද පිණිස සැරසි නික්මුණාහුය.

කොලියයෝ ද "කෝලරුකෙහි වූසුවන්ගේ බලය කාන්‍ය යන්ට පෙන්වමු" සි සුදයට සැරසී නික්මුණාහ. මේ දෙගොල්ලම බුදුරජාණන්වහන්සේගේ නැගෑනියෝය.

භාග්‍යවතුන් වහන්සේ මහාකරුණා සමාපත්තියෙන් නැගී ලෝව බලා වදුරන සේක් සුදයට සැරසී සිටින මේ දෙනුවර වැස්සන් දුටහ. එසේ දැන "මා මේ යුද්ධිමට වන් කල්හි මොවුන්ගේ වෛරය සන්සිඳෙයි. එහි පැමිණ දම් දෙසා දෙපක්ෂයම සන්සිඳුවම්" සි සිතා වදුරා කිසිවකුටත් නොදන්වා තමන්වහන්සේගේ පා සිවුරු රැගෙන එකලාවම අහසින් එතනට වැඩ දෙසෙනඟ අතර පලක් බැඳ සවනක් ගත බුදුරැස් විහිදුවමින් වැඩහුන්සේක.

දෙනුවර වැස්සෝම අපගේ ඤාතිශ්‍රෙෂ්ඨ වූ ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේ අපගේ කැදවීමක් නැතිවම මෙහි වැඩිසේක. කිමෙක් ද? අපගේ යුද්ධාරම්භය දැනගෙනවත් දෝ කෝ සි සිතා දෙපක්ෂයම ඕසවා ගත් යුද්ධායුධ පහතට හෙළා බුදුන් වැඳ හුන්හ.

එකල්හි බුදුහු කරුණු දැනවදාරනසේක්ම කථාව නඟනු පිණිස "මහරජ කවර කරුණක් නිසා තෙපි මෙහි පැමිණියහු දැ" සි විවාළසේක. "ස්වාමිනි මෙළඳු කවරකම් පිණිස නොවෙයි. අප දෙපක්ෂයම යුද්ධකරනු පිණිසය" සි පිළිතුරු දුන්හ.

තොපගේ සංග්‍රාමය කුමක් සඳහාදැ සි අසා වදාළහ. ස්වාමීනි, ජලයක් පිණිසය, මහරජ, ජලය කොපමණ අගනේ ද? ස්වාමිනි, සුවල්පයක් වටනේය. මහරජ, පොළොව කොතෙක් අගනේ ද? ස්වාමිනි පොළොවෙහි වටිනාකම බොහෝය. මහරජ, ක්ෂත්‍රියයෝ මෙකාපමණ අගකාහු ද? ස්වාමිනි, ක්ෂත්‍රියයන් නම් අගය නොහැකි කැස්කෝය.

මෙලෙසින් ප්‍රශ්නොත්තර වශයෙන් සාකච්ඡා කොට "මහරජ, සවල් යක් අහසා ජලය නිසා අතහිඳි ක්ෂත්‍රියයන් මරන්නහු ද"යි අසා මහරජ, ඔවුනොවුන් සමඟ මෙවැර නොකළ යුතුය. අතීත යෙහි එක් රෑක් දෙවියකු විසින් වලසකු සමඟ බදනාලද මෙවරය මේ කලපය මුලුල්ලෙහිමත් පවතීයයි එදැන් ජාතකය වදළසේක.

එසේම මහරජ, "අනුන්ගේ කථා, නොවිමසා" නොපිළිගත යුතුය. පෙර එක් භාවකු විසින් ඉපදවූ කථාවකින් යොදුන් තුන්දහසක් පමණවූ හිමාලය වැසි සිවුපාවෝ මුහුදට බත් වූහ යි පඨවි උද්‍රියන ජාතකය ද, මහරජ, ඇතැම්විට දුර්ලභයාට පවා බලවන්තයාගේ සිදුරු දැක ඔහුව විනාශකළ හැකිය. පෙර එක් කලෙක ලටුකික නම් පක්ෂී ඩෙඩුවා හෙවත් කැටකිරිල්ලක් මහා සත්තිරාජයකු මැරුවේයයි ලටුකික ජාතකය ද වදරා ඔවුන්ගේ වෛර සන්සිඳුවා සමඟිව සිටීමෙහි අනුසස් දක්වනු පිණිස රූකඩ ධම්ම ජාතකය හා වට්ටක ජාතකයත් වදරා යුද්ධය සන්සිඳවූ සේක. පසුව අත්තදණ්ඩ සූත්‍රයෙන් ද ධර්මදේශනා කළසේක.

ශාක්‍ය කෝලිය දෙනුවර වැස්සෝ දහම් අසා සතුටුව සමගි සම්පන්නවූහ. බුදුහු ශාක්‍යයන් පිරිවරා වෙසෙත්වා යි දෙනුවරින් දෙසිය පනස බැගින් සාක්‍යකුමාරයන් හාර කළහ. මෙදවස මහාවනයෙහි විසුවෝ ඒ පන්සියක් දෙනා වහන්සේ ය යි දතයුතු.

මහාසමය සූත්‍රයෙහි දහම් විසතරය නිමි.

පරාභව සූත්‍රය

එවං මේ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජේතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි

1 පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං,
භගවන්තං පුට්ඨුමාගම්ම කිං පරාභවතො මුඛං.

2 සුවිජානො භවං මොති සුවිජානො පරාභවො,
ධම්මකාමෝ භවං මොති ධම්මදෙයසි පරාභවං.

3 ඉතිහෙතං විජානාම පඨමෝ සෝ පරාභවෝ,
දුතියං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

4 අසන්තස්ස පියා හොන්ති සන්තෙ න කුරුතෙ පියං,
අසතං ධම්මං රොචෙති තං පරාභවතෝ මුඛං.

5 ඉති හෙතං විජානාම දුතියෝ සෝ පරාභවෝ,
නතියං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

6 නිද්දාසීලී සභාසීලී අනුට්ඨාතා ච යෝ නරෝ,
අලසෝ කොධපඤ්ඤාණෝ තං පරාභවතෝ මුඛං

7 ඉති හෙතං විජානාම තතියෝ සෝ පරාභවෝ,
චතුත්ථං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

8 යෝ මාතරං වා පිතරං වා ජිණ්ණකං ගතයොබ්බනං,
පහූසන්තෝ න භරති තං පරාභවතෝ මුඛං.

9 ඉති හෙතං විජානාම චතුත්ථෝ සෝ පරාභවෝ,
පඤ්චමං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

10 යෝ බ්‍රාහ්මණං වා සමණං වා අඤ්ඤං වා 'පි වණිබ්බකං,
මුසාවාදෙන වඤ්චෙති තං පරාභවතෝ මුඛං.

11 ඉති හෙතං විජානාම පඤ්චමෝ සෝ පරාභවෝ,
ඡට්ඨමං'භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

12 පහූතවිත්තෝ පුරිසෝ සහිරඤ්ඤෝ සභොජනෝ,
එකෝ භුඤ්ජති සාදූනි තං පරාභවතෝ මුඛං.

13 ඉති හෙතං විජානාම ඡට්ඨමෝ සෝ පරාභවෝ
සත්තමං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

14 ජාතිත්ථද්ධෝ ධනත්ථද්ධෝ ගොත්තත්ථද්ධෝ ච යෝ නරෝ,
සඤ්ඤාතිං අතිමඤ්ඤති තං පරාභවතෝ මුඛං.

15 ඉති හෙතං විජානාම සත්තමෝ සෝ පරාභවෝ,
අට්ඨමං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

16 ඉත්ථිධුත්තෝ සුරාධුත්තෝ අක්ඛධුත්තෝ ච යෝ නරෝ,
ලද්ධං ලද්ධං විනාසෙති තං පරාභවතෝ මුඛං.

17 ඉති හෙතං විජානාම අට්ඨමෝ සෝ පරාභවෝ,
නවමං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

18 සෙහි දූරෙඛ්‍ය සන්තුට්ඨා වෙසියාසු පදීසති,
දිස්සති පරදාරෙසු තං පරාභවතෝ මුඛං

19 ඉති හෙතං විජානාම නවමෝ සෝ පරාභවෝ,
දසමං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

20 අතීතයොබ්බනෝ පොසෝ ආනෙති තිම්බරුත්ථනිං,
තස්සා ඉස්සා න සුපති තං පරාභවතෝ මුඛං.

21 ඉති හෙතං විජානාම දසමෝ සෝ පරාභවෝ,
එකාදසමං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

22 ඉත්ථි සොණ්ඩිං විකිරණිං පුරිසං වා 'පි තාදිසං,
ඉස්සරියස්මිං ඨපයෙති තං පරාභවතෝ මුඛං.

23 ඉති හෙතං විජානාම එකාදසමෝ යෝ පරාභවෝ,
දවාදසමං භගවා බ්‍රූහි කිං පරාභවතෝ මුඛං.

24 අපපඤ්ඤෝ මහාතණ්හා ඛත්තියෙ ජායතෙ කුලෙ,
සෝ ව රජ්ජං පත්ථයති තං පරාභවතෝ මුඛං.

25 එතෙ පරාභවෙ ලොකෙ පණ්ඩිතෝ සම්වෙක්ඛිය,
අරියෝ දස්සනසම්පන්නෝ ස ලොකං භජතෙ සිවන්ති.

පරාභවසුත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මා විසින් දම් සූත්‍රදේශනාව මෙසේ අසනලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි වැඩවසනසේක. ඉක්බිති එක්තරා දේවතාවෙක් ගතවූ රාත්‍රියෙහි හෙවත් ප්‍රථම යාමය ඉක්ම ගොස් මධ්‍යම යාමය එළඹ සිටි කල්හි මනොඥ ශරීරවර්ණයෙන් සියලු ජේතවනය බබුළුවා හෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනක නම් එතැනට එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ ඒ දිව්‍යපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ සැල කෙළේය.

1 අපි පින්වත් ගෞතමයන් වහන්ස අතින් පිරිහෙන පුද්ගලයා කෙබඳුදැ යි විවාරමු. ඒ ඒ සක්වළින් රැස්වූ අපි පිරිහීමේ දෙරටු නොඅඩාක් කරුණු කියා දැ යි විවෘරා දැනගනු පිණිස පැමිණියෙමු යනුයි.

2 දියුණුවන පුද්ගලයා ද ඒ ඒ කරුණුවලින් දත හැකිවෙයි. පිරිහෙන පුද්ගලයා ද එසේම දත හැකි වෙයි. දශකුසල ධර්මයට කැමතිවූ පුද්ගල තෙමේ දියුණුවෙයි. ධර්මයට දෙවිශ කරන කැනැත්තේ පිරිහෙයි.

3 භාග්‍යවතුන් වහන්සේ විසින් වදළපරිද්දෙන් මේ කාරණය දනිමු. හේ පළමුවන පිරිහීම් දෙරටුව වේ. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතුවූ දෙවන කාරණය කුමක් දැයි වදළ මැනව.

4 මොහුට අන්‍ය ශාස්තෘහු ප්‍රිය වෙත් ද, බුද්ධාදි සත්පුරුෂයන් කෙරෙහි ප්‍රිය නොකෙරේ ද, දෙසැවක් මිථ්‍යාදෘෂ්ටි කම් වූ අසත්පුරුෂ ධර්මයට රුචි කෙරේ ද මේ කරුණු තුන පිරිහීමේ දෙවන දෙරටුව වේ.

5 මෙසෙයින් දෙවන පරිහානිය අපි දනිමු. භාග්‍යවතුන් වහන්ස, තුන්වන පිරිහීමට හේතුව කුමක් දැයි ප්‍රකාශ කරනු මැනව.

6 යම් මනුෂ්‍යයෙක් හුන් සිටි සැමතැනම නිදනසුලුද, හුන දෙනකුන් රැස්ව කථා කරන තන්හි ඇලුණේ ද, උට්ඨාන වීර්‍ය්‍ය නැත්තේ ද, උත්පතතියෙන් මි අලස ද, ක්‍රෝධයෙන් ප්‍රකට වේ ද, එය පිරිහීමට හේතු වේ.

7 මෙසෙයින් මේය අපි දනිමු. සෙ වනාහි තුන්වන පිරිහීම් කරුණය. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතුවූ සතර වන කරුණ කුමක් දැයි ප්‍රකාශ කරනු මැනව.

8 යම් පොහොසතෙක් මහළුවූ වයස්ගත වූ මව හෝ පියා හෝ පොෂණය නොකෙරේ ද, එය පිරිහීමට කරුණක් වේ.

9 අපි මෙය මෙසේ දනිමු. සෙ වනාහි සතරවන පිරිහීමේ කරුණ වේ. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතුවූ පස්වන කරුණ කුමක් දැයි වදළ මැනව.

10 යමෙක් පිදියයුතු බමුණකු හෝ ශ්‍රමණයකු හෝ අනික් යාචකයකු හෝ බොරුවෙන් රවවා ද, එය පිරිහීමට කරුණෙකි.

11 මෙය මෙසේය හි අපි දනිමු. හේ පස්වන පිරිහීමය. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතුවූ සවන කරුණ කුමක් දැයි වදළ මැනව.

12 බොහෝ වසතු ඇති කඩවණු ඇති කැම් පිම් ඇති පුරුෂයෙක් තමන් හුදකලාව මිහිරි භෝජනයන් අනුභව කෙරේ ද, එය පිරිහීමට කරුණෙකි.

13 මෙපරිද්දෙන් මෙය අපි දනිමු. හේ සවන පිරිහීමය. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතුවූ සත්වත කරුණ කුමක් දැයි වදාළ මැනව.

14 මම ජාති සම්පන්න යෙමි යි යන තද වූ මානය ඇති, ධන මානය ඇති, ගොත්‍ර මානය ඇති, යමෙක් තමන්ගේ කැයන්ව කොසලකා ද, එය පිරිහීමට හේතු වේ.

15 මෙය මෙසේ යයි අපි දනිමු. එය සත්වත පිරිහීම වේ. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතුවූ අට වන කරුණ වදාළ මැනව.

16 සන්‍ත්‍රීන් කෙරෙහි ද, සුරා වෙහි ද, දූ කෙළියෙහි ද, ඇලුණු යමෙක් උත් උත් දෙය විනාශ කෙරේ ද, එය පිරිහීමට හේතුවක් වේ.

17 මෙය මෙසේය යි අප දනිමු. හේ අටවන පිරිහීම වේ. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතුවූ නවවැන්න කුමක් දැයි වදාරනු මැනව.

18 යමෙක් සවකීය භාර්‍යාවන් හා අසතුටුව වෙශ්‍යාවන් කෙරෙහි පැළඹේ ද, පරසන්‍ත්‍රීන් කෙරෙහි ප්‍රකට වේ ද, එය පිරිහීමට හේතු වේ.

19 මෙසේ මේ කාරණය අපි දනිමු. එය නව වන පිරිහීම වේ. භාග්‍යවතුන් වහන්ස, දස වන පිරිහීම කුමක් දැයි වදාළ මැනව.

20 තරුණ වයස ඉක්මවූ පුරුෂයෙක් නොබොත් මහල්ලෙක් තරුණ දැරියක් සිය කිරින්ද වශයෙන් ගෙන ඒ ද, ඇය කෙරෙහි ඊර්ෂ්‍යායෙන් (තරුණයන් ගෙන් රැකීමට) නොනිදා හිඳිද, එය පිරිහීමට හේතුවෙකි.

21 මෙසේ මෙය දසවන පිරිහීම යයි දනිමු. භාග්‍යවතුන් වහන්ස, එකොළොස්වන පිරිහීමේ හේතුව වදාළ මැනව.

22 මනුෂ්‍ය මාංස මද්‍ය යන මෙහි ඇලුණු ඒ සදෙ‍ා වැලි මෙන් ධනය විසුරුවන සත්‍රීයක් හෝ එබදු පුරුෂයකු හෝ ඉසුරු බැවිහිතබා ද එය පිරිහීමට හේතු වේ.

23 මේ වදාළ ලෙසින් මෙය අපි දනිමු. හේ එකොළොස්වන පිරිහීමය. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතුවූ දෙළොස්වැන්න කුමක් දැයි වදාළ මැනව.

24 සවලාපවූ වසතු ඇති මහත්වූ වසතු තෘෂ්ණා ඇති යම්මක් ක්ෂත්‍රිය කුලයෙහි උපදී ද, හෙතෙමේත් රාජ්‍යය පතා ද, එය පිරිහීමට හේතු වේ.

25 ලෝකයෙහි ප්‍රාඥ තෙමේ මේ පිරිහීම් නුවණින් සලකා දැන දුරු කෙරේ ද ආර්‍ය්‍ය දියුණුව කෙවත් උත්තමයන්ගේ වැඩි දියුණුව දක්නාවූ හෙතෙම සෙමවූ ලෝකය කෙවත් නිවන ඇසුරුකෙරෙයි.

සිංහලානුවාදය නිමි

දහම් විසතර

එදා මංගල සූත්‍රය ඇසූ දෙවියන්ට අදහස් වූයේ මංගල සූත්‍රයෙන් වදාළේ මිනිසුන්ගේ දියුණුවට හේතුවූ මංගල්‍ය කරුණු අට තිසෙක් පමණය පිරිහීමට කරුණක් එහි සඳහන් නොවිය. එහෙයින් දියුණු මිනිසුන්ගේ මෙන් ම ඔවුන්ගේ පිරිහීමත් බුදුරජාණන් වහන්සේගෙන් මේ අසා දැනගත යුතුය යන්නය.

මෙසේ සැලකූ දසදහසක් සක්වළ දෙවියෝ සක්දෙව් රජුට මේ බව කියා ඔහුගෙන් ද අවසරය ලැබ දෙවිරමට රැස්වූහ. එසින් එක් දේවතාවෙක් "පරාභවන්නං පුරිසං මඤ්ඤ පුච්ඡාම ගොතමං" යනාදීන් භාග්‍යවතුන් වහන්සේගෙන් පරාභව ප්‍රශ්නය විචාළේය. එයට පිළිතුරු වශයෙන් මේ දේශනාව ප්‍රකාශිතය.

මෙහි දේවතාවා ඇසූ ප්‍රශ්නත් භාග්‍යවතුන් වහන්සේ විසින් ඊට දුන් පිළිතුරුත් එය එසේ යයි දෙවියන්ගේ පිළිගැනීමත් යන මේ කරුණු සියල්ලම ඇතුළත්ව මේ සූත්‍රය පරාභව නමින් ප්‍රකට විය.

පළමුවන පිරිහීම

දියුණුවන තැනැත්තාත් ඔහුගේ වැඩ පිළිවෙළින් දන හැකිය. පිරිහෙන තැනැත්තාත් එසේම දන හැකිය. ධර්මයට කැමති තැනැත්තේ දියුණු වෙයි. ධර්මයට සතුරුකම් කරන තැනැත්තේ පිරිහෙයි.

දෙවන පිරිහීම

අසාන්තවූ කාය වාක් මනස් ඇති අසත් පුරුෂවූ පූරණකස්සප ආදි මිථ්‍යා ශාස්තෘවරයන් හා සුනකඛත්ත අවෙලක කොරකඛත්තිය ආදී අන්‍ය තීර්ථක තවුසන් යම්කිසි ප්‍රිය වේ නම් බුදු පසේබුදු මහ රහත් ශ්‍රාවකයන් වැනි ශාන්තවූ සත්පුරුෂයන් කෙරෙහි ප්‍රිය නොවේ නම් මේ දෙවන පිරිහීම වේ.

මේ ගාථාවෙන් අසත් පුරුෂයන් ප්‍රිය කරන බවත්, සත් පුරුෂයන් කෙරෙහි අප්‍රිය බවත් අසත්පුරුෂ ධර්මයේ කැමති වීමත් යන මේ කරුණු තුනම දෙවෙනි පිරිහීමට ඇතුළත් වේ.

තුන්වන පිරිහීම

නින්දව ආසාව, නිකරුණේ මිනිසුන් රැස්වන තැන්වලට ගොස් සිටීම සහ ප්‍රලාප දෙඩීම, ගිහියන්ට අයත් නවයුතුවලත් පැවිද්දන්ට අයත් කටයුතුවලත් උනන්දුවක් කොදක් වීම, මැලි කමින් හුන් තැන හිඳීමත් සිටි තැන සිටීමත්, රථයක ගැසූ කොඩියක් මෙන් හින්නෙන් නගින දුමක් මෙන් පෙනෙන ක්‍රෝධයත්, යන මේ කරුණු පස මේයට ඇතුළත් වේ.

සතරවන පිරිහීම

තමන්ට ශක්තිය තිබියදීත් මහළුවූ දෙමව්පියන්ට නොසැලකීමයි. මව් පියන් නොරක්නා තැනැත්තේ අන් කවරකු නම් රකී ද? එබදු පුද්ගලයා නින්දාවටත්, වර්ජනය කටයුත්තකු බවටත්, මරණින් මතු අපායටත් පැමිණෙයි.

පස්වන පිරිහීම

යමෙක් "ඔබට සියු පසයෙන් ප්‍රයෝජනවත්වූ කැමති පසයක් හෝ වෙන යමක් වේ නම් එය මට කියනු මැනව, මම එය ඉටුකර දෙමි" යි බමුණකු හෝ ශ්‍රමණයකු හෝ වෙත යම් කිසි යාචකයකු හෝ පවරා පසුව කිසිවක් නොදී බොරුවෙන් රැවටීම යි.

සවන පිරිහීම

බොහෝ රන් රිදී මසු කහවණු ඇති එසේම රසමසවුලෙන්ම පිළියෙළ කොට අනුභව කරන ආහාර ඇති යමෙක් තමන් ලත් මිහිරිදෙයින් කිසිවකුට සංග්‍රහ නොකර තනිවම ප්‍රයෝජන ගැනීමයි.

මෙබදු කැමෙහි හික්මුකම් ඇති මසුරු පුද්ගලයෝ තමන් ප්‍රිණිත වන රසවත් දෙයින් තම දරුවන්ටවත් කොදී සහවාගෙන කනු කැමති වෙති.

සත්වන පිරිහීම

මම ජාතියෙන් උසස් වෙමි යි හෝ පොහොසතෙක් වෙමි යි හෝ උතුම් කුලමහාත්‍ර ඇත්තෙක් වෙමි යි හෝ හුළං පිරූ බෝලයක් මෙන් කිසිවකුටත් නොකැමි මානාභංකාර පරවශ ව සිය නැගන්නවත් අවමන් කෙරෙමින් උඩඟුව විසීම යි.

අටවන පිරිසිම

සත්‍රින් කෙරෙහිත් සුරාවෙහිත් දූ කෙළියෙහිත් ඇලී තමන් හරිහම්බ කරගත් දෙය විනාශකිරීම යි. පරසත්‍රින් කෙරෙහි ඇලුණු පුද්ගල තෙම ඇතිකාක් වසතුව කෙළවරක් කැති. සත්‍රින්ට දී විපතට මැරෙයි. සුරාවෙහි ලොල්වූ පුද්ගල තෙම තමන් සතු දෙය පවා උකස් කොට රා බොයි. දූ කෙළියෙහි ලොල්වූ කැකැත්තේ ඇදි වත පවා විකුණා සුදුකෙළිමින් විනාශයට පැමිණෙයි.

නවවන පිරිසිම

තමා අයත් භාර්‍යාව හැර අකමැතිව වෙශ්‍යාවන් සොයා යාම හා පරසත්‍රින් කරා පැමිණීම යි. මෙයින් වෙශ්‍යාවන්ට වසතුව දීමෙන් හා පරදුරසේවනයෙන් අනුන්ගෙන් හැඟැව කරදර විඳින්ට ලැබීම පමණක් නොව නීතියෙන් දඬුවම් ද ලබන්නෙක් වෙයි.

දසවන පිරිසිම

වෘධ වයසට පැමිණි පුරුෂයෙක් තරුණ කාන්තාවක් සරණ පාවා ගැන්මයි. මේ තරුණිය මහල්ලා නොපතයි. ඔහු හා විශ්වාස ද මැඟට රුචි නොවේ. එහෙයින් "ඇය නිතරම් තරුණයකු පත" යි යන ඊර්ෂ්‍යාවෙන් මුලුරුයම් නිදි නොලබයි.

මෙසේ කාමරාගයෙන් හා ඊර්ෂ්‍යා වෙන් ද දූවෙමින් තැවෙමින් කිසි වැඩක් පලකුදු නොකිරීමෙන් පිරිහීමට පත්වෙයි.

එකොළොස්වන පිරිහිම

කැම පිණ දෙක්හි ලොල්වූ ඒ හැන ම තමන්ගේ වසතුව මිය පෑහැදීම් කොට විනාශ කරන හති ඇති සත්‍රියක් හෝ එබදු පුරුෂයකු බලයට පමුණුවා ගම්කිසි උසස් තනතුරක් දීමයි.

දොළොස්වන පිරිහිම

තමනට කිසි ආදායමක් නැතත් වසතු තණ්හාවෙන් යුකතවූ යමෙක් රජකුලයෙහි ඉපද අන් සතු රාජ්‍යය ලබන්නට හිතා රාජ්‍යයත් නොලැබ තමා සතු සුලුදෙයත් නැති කෙරේ ද මේ දොළොස් වන පිරිහිම වේ.

විමසිම් නුවණින් යුත් තැකැත්තෙක් මෙහි සඳහන් පරිහානි කාරණයන් ඇලකා ක්‍රියා කෙරේ නම් මහ පල නිවන් පසක තබා හෙතෙම ආර්‍ය ගුණ ඇත්තෙක් ව පිරිහීම් පක්ෂයෙන් වැළකී

මෙහි උපාය කුසලවූ ප්‍රඥාවෙන් යුක්තව මරණින් මතු දෙව්ලොව උපදනේය.

මේ දේශනාවෙහි කෙළවර පරාභවමූඛයන් ඇසීමෙන් උපන් සංවේගයට සුදුසු අන්දමින් නුවණ දියුණු කොට නිවන් දුටු දෙවියෝ අපමණයහ.

මහාසමය, මංගල, සමචිත්ත පරියාය, රාහුලෝවාද, ධම්මචක්ක, පරාභව යන ධර්මදේශනාවන් ඇසීමට රැස්වූ දිව්‍යබ්‍රහ්මයෝ අනන්තයහ. නිවන් දුටුවන්ගේ ගණන් නියමයක් ද නැත.

එහෙයින් කිහ.

"මහාසමය සුත්තෙ ච අථො මඞ්ගල සුත්තකෙ
සමචිත්තෙ රාහුලොවාදෙ ධම්මචක්කෙ පරාභවෙ
දෙවතා සමිති තත්ථ අපමෙය්‍යා අනපපිකා
ධම්මාභිසමයො වෙත්ථ ගණනාතො අසංඛියෙ" ති,

දහම්විසතරය නිමි.

ආලවක සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා, ආලවියං විහරති ආලවකස්ස යක්ඛස්ස භවනෙ, අථඛො ආලවකො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං එතද වොච.

නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි. පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි. දුතියම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච, නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි. පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි. තතියම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච· නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි. පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි.

චතුත්ථම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච, නික්ඛම සමණාති, තඛවාහං ආවුසො නික්ඛමිස්සාමි, යං තෙ කරණීයං තං කරොහි ති.

පඤ්හං තං සමණ පුච්ඡිස්සාමි, සචෙ මෙ න ව්‍යාකරිස්සසි, චිත්තං වා තෙ ඛිපිස්සාමි, හදයං වා තෙ ඵාලෙස්සාමි, පාදෙසු වා හත්ථෙසු වා පාරගඞ්ගායං ඛිපිස්සාමීති.

නඛවාහනතං ආවුසො පසසාමි, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය, යෙ මෙ විත්තං වා විපරියය, භදයං වා එලෙය්‍ය, පදෙසු වා ඔතෙත්වා පාරඔඛාය විපරියය අපි ච ඉමං ආවුසො පුච්ඡ යදා කඞ්ඛසි ති.

අථඛො ආලවකො යකෙඛා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

1 කිං සුධ විත්තං පුරිසස්ස සෙට්ඨං
කිංසු සුවිමණ්ණා සුඛමාවහාති
කිං සු ඛවෙ සාදුතරං රසානං
කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨනති.

2 සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං
ධම්මො සුවිණ්ණා සුඛ මාවහාති
සච්චං ඛවෙ සාදුතරං රසානං
පඤ්ඤාජීවිං ජීවිත මාහු සෙට්ඨනති

3 කථංසු තරති ඔඝං කථංසු තරති අණ්ණවං
කථංසු දුකඛං අවෙචති කථංසු පරිසුජ්ඣති

4 සද්ධාය තරති ඔඝං අපපමාදෙන අණ්ණවං
විරියෙන දුකඛං අවෙචති පඤ්ඤාය පරිසුජ්ඣති

5 කථංසු ලභතෙ පඤ්ඤං කථංසු විත්දතෙ ධනං
කථංසු කිත්තිං පපොති කථං මිත්තානි ගන්ථති
අසමා ලොකා පරං ලොකං කථං පෙච්ච න සොච ති.

6 සද්දහානො අරහතං ධම්මං නිබ්බාණපත්තියා
සුස්සූසා ලභතෙ පඤ්ඤං අප්පමත්තො විචක්ඛණො

7 පතිරූපකාරී ධුරවා උට්ඨාතා විත්දතෙ ධනං
සච්චෙන කිත්තිං පපොති දදං මිත්තානි ගන්ථති

8 යස්ස තෙ චතුරා ධම්මා සද්ධස්ස ඝරමෙසිනො
සච්චං ධම්මො ධිති චාගො ස ච පෙච්ච න සොචති
අසමා ලොකා පරං ලොකං ස ච පෙච්ච න සොචති

9 ඉඞ්ඝ අඤ්ඤම්පි පුච්ඡස්සු පුථු සමණබ්‍රාහ්මණෙ
යදි සච්චා දමා චාගා ඛන්ත්‍යා භීරුත්‍යා න විජ්ජති

10 කථන්නුදානි පුච්ඡෙය්‍යං පුථු සමණබ්‍රාහ්මණෙ
සොහං අජ්ජ පජානාමි යො චත්ථො සම්පරායිකො

11 අත්ථාය වත මේ බුද්ධා වාසායාළවි මාගමි
සොහං අජ්ජ පජානාමි යත්ථ දින්නං මහප්ඵලං

12 සෝ අහං විචරිස්සාමි ගාමාගාමං පුරාපුරං
නමස්සමානෝ සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතන්ති.

එවං වුත්තෙ ආළවකෝ යක්ඛෝ භගවන්තං එතදවොච, අභික්කන්තං භොගොතම අභික්කන්තං භොගොතම, සෙය්‍යථාපි භොගොතම නික්කුජ්ජිතංවා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙවා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛන්ති ති එවමෙවං භොතාගොතමෙන අනෙකපරියායෙන ධම්මෝ පකාසිතෝ, එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භවං ගොතමෝ ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

ආළවක සූත්‍රාන්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මේ ආළවක සූත්‍රාන්ත ධර්මය මා විසින් මෙසේ අසනලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අළවිනුවර සමීපයෙහි වූ ආළවක යක්ෂසේනාධිපතියාහුගේ විමානයෙහි වැඩවාසය කරන්නේක. ඉක්බිති ආළවක යක්ෂ තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනක නම් එතන්හි එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මේ මතු ප්‍රකාශවන්න කාරණය කීයේ ය.

ශ්‍රමණය, මාගේ විමානයෙන් නික්මෙව යනු මැනවි. එසේය ආයුෂ්මත් යක්ෂය යි කියා නික්මුණේ ය. ශ්‍රමණය, මාගේ විමානයට ඇතුල් වෙව මැනවි කියා. පින්වත් යක්ෂය, එසේය යහපතැ යි කියා ඇතුල් විය. දෙවනවරත් මෙසේ ය. තුන්වන වරත් මෙසේ ය.

සතරවන වරත් ආළවක යක්ෂ තෙම ශ්‍රමණය, මාගේ විමානයෙන් නික්මෙව මැනවි කියා. එකල්හි පින්වත් යක්ෂය, මම නො නික්මෙමි. තා විසින් කළ හැකි යමක් වේ නම් ඒ තාගේ අභිමතාර්ථය කරව යි වදාළසේක.

ශ්‍රමණය, ඔබ අතින් විඳිය නොහැකි ප්‍රශ්නයක් විවාරමි ඉදින් මට පැහැදිලිව නොකියන්නෙහි නම් ඔබගේ සිත හෝ

පෙරළුම්, ළය හෝ පළුම්, දෙපය හෝ ගෙන මුහුදෙන් එතරව කොහොත් පරසක්වලට දමන්නෙමි සි. කීයේ ය.

පින්වත් යක්ෂය, දෙවියන් සහිතවූ, මාරයා සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ අවකාශ ලෝකයෙහි හෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ දෙවි මිනිසුන් සහිතවූ සත්ත්වලෝකයෙහි හෝ යමෙක් මාගේ සිත හෝ පෙරළා ද, ළය හෝ පළා ද, පරසක්වල හෝ හසා ද, එසේ කළ හැකි පුද්ගලයකු මම නො දනිමි. එතකුදුවුවත් පින්වත් යක්ෂය, ඉදින් නුඹ යමක් කැමැත්තෙහි නම් එය විචාරව, නොහොත් යමක් විචාරන්නට කැමැත්තෙහි නම් ඒ සියල්ල විචාරව සි වදළසේක.

ඉක්බිති ආළවක යක්ෂසේනාධිපති තෙම බුදුන්ට භාග්‍යයෙන් තමා විචාරන ප්‍රශ්න කීයේය, කොහොත් විචාළේ ය.

ප්‍රශ්නය:— 1 මේ ලෝකයෙහි පුරුෂයාහට කවර වස්තුවක් උතුම් දැ? නිතා කොට පුරුදු කරනලද කවර නම් සුචරිතයක් කායික වෛතසික හිත සැප එළවා ද? ඒකාන්තයෙන් රසයන් අතුරෙන් කවර නම් රසයක් ඉතා මිහිරි වේද? කවර අන්දමකින් ජීවත්වන්නහුගේ ජීවිකාවෘත්තිය උතුම් යයි කියත් ද?

පිළිතුර:— 2 මේ ලෝකයෙහි පුරුෂයාහට ශ්‍රද්ධා තොමෝ උතුම් වස්තුවෙක, මනාකොට පුරුදුකරනලද ධර්මය ලෞකික ලොකොත්තර සැප එළවා සි. රසයන් අතුරෙන් සත්‍යවචන නමැති රසය ඉතා මිහිරිය, නුවණින් ජීවත්වන්නහුගේ ජීවිතය ශ්‍රේෂ්ඨ යයි බුද්ධාදි උත්තමයෝ කියත්.

ප්‍රශ්නය:— 3 කවර ප්‍රකාරයකින් කාමාදි සතර ඕඝයෙන් එතර වේ ද? කවර ප්‍රකාරයකින් සංසාරසාගරයෙන් එතර වේ ද? කවර ප්‍රකාරයකින් සසරදුක් දුරු කෙරේ ද? කවර ප්‍රකාර යකින් පිරිසිදු වේ ද?

පිළිතුර:— 4 ශ්‍රද්ධාව කරණකොටගෙන සසර සැඩ පහරින් එතරවෙයි. අප්‍රමාදයෙන් සසරසයුර එතර කෙරෙයි. වීර්‍යය කරණකොටගෙන දුක දුරු කෙරෙයි. ප්‍රඥයෙන් පිරිසිදු වෙයි.

ප්‍රශ්නය:— 5 කවර පරිද්දකින් ප්‍රඥාව ලබන්නේ ද? කවර පරිද්දකින් වස්තුව ලබන්නේද? කවර පරිද්දකින් කීර්තියට පැමිණේ ද? කවර පරිද්දකින් මිතුරන් සම්බන්ධ කරගන්නේ ද? කවර පරිද්දකින් මෙලොවින් පරලොවට පැමිණ කොහොත් පරලෙව්හි දී ශොක නොකරන්නේ ද?

පිළිතුර:— 6 කුසලාකුසල ධම්යන්ගේ විපාක දන්නාවූ අප්‍රමාදවූ පුද්ගලතෙම රහතන් පැමිණි නිවනට පැමිණෙනු පිණිස ඉණ අසා ඇදහීම් ඇත්තෙක් ව ප්‍රඥව ලබයි.

7 අධිගම ලාභය සඳහා යෙදූ උපායඥාන ඇති, ඔහා තොතබ ලද විය්‍යී ඇති, ෘවන්ගත් විය්‍යී ඇති, පුරුෂ තෙම ලෞකිකවූ ද ලොකොත්තරවූ ද ධනය ලබයි. සත්‍ය වචනයෙන් කීර්තියට පැමිණෙයි. දෙන තැනැත්තේ මිතුරන් සපයයි.

8 ගිහිගෙහි වසන යම් සැදුහැවත් පුරුෂයකුහට සත්‍යය ද, ධම්ය ද, ධෛය්‍යීය ද, පරිත්‍යාගයද යි යන මේ සතර ධම්යන් ඇවත් නම් හෙතෙම ඒකාන්තයෙන් පරලෝකයෙහි ශොක නොකෙරෙයි. මේ ලොවින් පරලොවට පැමිණ නොනොත් ඒකාන්තයෙන් පරලෝකයෙහි ශොක නො කෙරෙ යි.

9 ඉදින් සත්‍යය, ඉන්ද්‍රියදමනය, පරිත්‍යාගය, ඉවසීමය යන මේ සතර ධම්යන්ට වඩා උසස්වූ ධම්යක් නැත්තේ ය. එහෙයින් අනිකුදු ධම් කෙනෙක් තවත් ඇත් නම් බොහෝ වූ මහණබමුණන් අතින් එය වහාම විචාරණ දුනගනුව යි වදළසේක.

10 අළුවි යක්ෂයාගේ ප්‍රළිහැනිම:— සාම්පරායිකවූ හෙවත් පරලොව විපාක දෙන්නාවූ යම් අර්ථයක් වේ නම් මම අද ඒ අර්ථය වදුල පරිද්දෙන් ම දනිමි. දැන් තොයෙක් මහණ බමුණන් අතින් කුමට විචාරම් ද?

11 සම්බුදුරජාණන් වහන්සේ මට වැඩ පිණිස අලවිනුවර මාගේ භවනයට වාසය පිණිස වැඩ වදළසේක. යම් කෙනෙක්හි දෙන ලද දානය මහත්ඵල වේ ද, ඒ අග්‍රදක්ෂිණෙය්‍යවූ භාග්‍යවතුන් වහන්සේ මම අද විශෂයෙන් දනිමි.

12 ඒ මම ගමක් ගමක් පාසා නුවරක් නුවරක් පාසා සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට ද, සද්ධර්මයට ද, සම්මුති සංඝයා සහිතවූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සංඝයාට ද වඳිමින් නුසුරුවන්හි ගුණ පවසමින් කැසෙරෙමි යනුයි.

මෙසේ කී කල්හි ආළවක යක්ෂසේනාධිපති තෙම භාග්‍ය වතුන්වහන්සේට මෙසේ සැල කෙළේ ය. හවත් ගෞතමයන් වහන්ස, නුඹවහන්සේගේ ධර්මදේශනාව ඉතා යහපත, හවත් ගෞතමයන් වහන්ස, නුඹවහන්සේගේ ධර්මදේශනාව ඉතා යහපත, හවත් ගෞතමයන් වහන්ස, යටිකුරු කොට තැබූ

භාජනයක් උඩුකුරුකර තබන්නාක් මෙන් යවපත්වූ නිඛානයක් විවෘතත කරන්නාක්මෙන් මං මුළාවූවකුට මඟ කියන්නාක් මෙන් "ඇස් ඇත්තෝ රූපදකිත්වා" යි අන්ධකාරයෙහි තෙල් පිරූ විලක් කුවක් දරන්නාක්මෙන් භාග්‍යවතුන්වහන්සේ විසින් නොයෙක් කරුණුවලින්ධර්මදේශනා කොට වදාරනලද්දේ ය. ඒ මම භාග්‍යවතුන්වහන්සේ ද, ධර්මය ද, භික්ෂුසංඝයා වහන්සේ ද, සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවිකෙළවර කොට සරණගියාවූ උපාසකයෙකැ යි සිත්හි ලා දරනසේක්වා.

සිංහලානුවාදය නිමි.

දහම් විසතර

ආළවී යනු රටටත් නුවරටත් ව්‍යවහාර කරන නාමයකි. බුදුරජාණන් වහන්සේ මේ අළවී නුවර සමීපයෙහි වැඩ විසූ හෙයින් "ආළවියං විහරති" යි නිදානපාඨයෙහි සඳහන් විය. අළවී නුවර රජ්ජුරුවෝ තම බල ඇණියත් සහිතව මුවදඬයමෙහි නිරතවූහ. සතියකට වරක් මුවදඬයම සඳහා යාම රජතුමාගේ සිරිත විය.

මොහු සොරසතුරන් වළක්වනු සඳහාත්, සතුරුරදුන් බිය ඇන්වනු සඳහාත්, යුද්ධ පුරුදු කරවනු සඳහාත්, ශරීරව්‍යායාමය පිණිසත් යන මේ කරුණු සලකා මුව දඬයමෙහි හැසිරෙත්. මේ රජතෙම කොතරම් උනන්දුවක් මේ සඳහා දැක්වූයේ ද යත හොත්— "යම්කු ළඟින් මුවකු පැනගියොත් ඌ මෙසේ නමුත් අල්ලාගැනිම් තමාටම අයත්" යයි මෙසේ කතිකාවතක් ද ඇති කර ගත්තේය.

මෙසේ කල එක්දවසක් මුවදඬයමෙහි යෙදෙමින් සිටිය දී රජ්ජුරුවන් ළඟින්ම මුවකු පැනගියේය. තමන් පැනවූ නීතිය තමාවම පිළිපදින්ට සිදුවූ හෙයින් දුන්න ගෙන මුවා පස්සපස්සෙහි ලුහුබැඳ ගියේය. මෘග තෙමේ ද තුන්යොදුනක් තැන් දුවගොස් කලානතව දියව බැස සිටියේය. රජ්ජුරුවෝ මුවා දැක විද මරා දෙකඩ කොට කපා තමන්ට මසින් ප්‍රයෝජන නැතත් "රජ්ජුරුවන්ට මුවා විදගන්ට බැරිවූයේය" යි යන නින්දයෙන් මිදෙනු පිණිස කදක් බැඳගෙන එන්නාහු විශාල නුගරුකක් දැක විඩා සන්සිදුවා ගෙන යම්හ යි සිතා ඒ නුගරුක් සෙවනට පැමිණියේය.

ඒ නුගරුක නම් අළුවියකාගේ වාසභවනයයි. හිර මුදුන් වේලෙහි ඒ ගසමූලට පැමිණියකු අල්වාගෙන අනුභව කිරීමට වෙසවුණු රජ්ජුගෙන් වරයක් ද ඔහු ලබාගෙන සිටියි.

එහෙයින් ආළවක යක්ෂතෙමේ ගසමූලට පැමිණි රජ්ජු දැක සතුටුව ඔහු අතින් අල්ලා ගත්තේය. රජ්ජුරුවෝ ද රාජඛෙය්‍යයි උපදවා ගෙන බියවූ බවක් නොහඟවා කථා කොට එම්බල යක්ෂය, මම මේ රටේ රජ වෙමි, බිලි නොගනුව. මම ඔබට දිනක් පාසා ඔත්තලියක් සහිත මිනිසකු එවන්ට ඇප වෙමි. නුදුන් දවසක් වේ නම් එදවස රජගෙට පැමිණ මා අල්ලා ගෙන අනුභව කරව යි ප්‍රතිඥ දී ඔහු අතින් ගැළවී නුවරට ගියහ.

එකල්හි කඳවුරු බැඳගෙන සිටි බලසෙනඟ දුර සිට එන රජ්ජුරුවන් දැක පිරිවරා ගත්තේය. රජ්ජුරුවෝ ද සිදුවූ දෙය කීහ. ඇමතියෝ ද දේවයන්වහන්ස, සෙල වික්‍රමයට වඩා කරගත් පොරොන්දුව ඉතා තපුරුය. රජ්ජුරුවන්වහන්සේ "මෙපතක් දවස් මේ බිල්ල දෙමි" යි කාලයක් නියම නොකොට්ම මෙසේ පොරොන්දුවීම අතිශයින්ම බේදජනකය. එසේදවුවත් දැන් කුමක් කරමෝදැ යි පසු තැවිලිවීමෙන් ද ප්‍රයෝජනයක් නැත. ඉශාක නොකර නොතැවී රජසැප විඳිනු මැනව. අපි එයට සුදුස්සක් කෙරුවු යි රජ්ජුරුවන් සතසා එතැන්පවන් ඒ යදෘෂ ක්‍රියාකරන්ට පවන්ගත්හ.

ඇමතිමඩුල්ල සාකච්ඡා කෙළේ සිරගෙයි වැටුණු වරද කරුවන් පළමුකොට බිලි දීමටය. පසුවදා අලුයම පටන් සූදානම්ව එසේ කරන ලෙස සඟරගුනනික ඇමතියාට නියෝග කෙළේය. ඇමතිතෙමේ ද එතැන්සිට "බඤ්ඤාගාරයෙන් මිදෙනු කැමැත්තෝ එක් එක් සෙනකු බැගින් පිළිවෙළින් දිනපතා පැමිණෙත්වා" යි අණ කොට එනකු අතට ඔත්තලියක් දී බිලි පිණිස යැවීය. මේ පිළිවෙළින් හිරගෙවල් හිස් වූහ.

"රජ්ජුරුවෝ සිරකරුවන් අල්ලා යකෙකුට බිලිදෙන්නාහයි" යන මේ පුවත රට මුළුල්ලෙහි පැතිරෙන්ට වීමෙන් වරද කරන්නවුන් නැති විය. නැවත සිදුවූයේ ළදරුවන් බිලි දීමටය. එය ද කරගෙන යන අතර රජ්ජුරුවන්ගේ කුමරුවාම බිල්ලට දීමට වාරය පැමිණියේය. ඒ දිනයෙහි අළුවියකාට බිලි පිණිස කුමරුවා සරසා යැවීය.

එදවස් සැවැත්නුවර දෙවරම් මහාවිභාරයෙහි වැඩවසන භාග්‍යවතුන් වහන්සේ අලුයම් ලොව බලා වදාරන්සේක් අද්‍ය

කුම්භීරුව අනාගාමිඵල ප්‍රාප්තිය පිණිස හේතු සම්පත් ඇති බවත්, අලවී යක්ෂයාව සෝවාන් ඵලයට පැමිණීමට හේතු සම්පත් ඇති බවත්, ඔවුන් දෙදෙනා උදෙසා වදුරන බණින් සුවාසූ දහසක් දෙනා නිවන් දක්නා බවත්, යන මේ සියල්ල දිවැසින් දැක ආලවක යක්ෂයාගේ විමානයට වැඩිසේක.

එ වේලෙහි ආළවක තෙම හිමාලය වනයෙහි යක්ෂයන්ගේ සමාගමයට ගොස් සිටි බැවින් ඔහුගේ විමානයෙහි සිටියේ මූරකරුවාවූ ගද්‍රහ යක්ෂයා පමණෙකි. එවිට ගද්‍රහ නම් වූ ඒ යක්ෂ තෙම බුදුන් කරා එළඹ "ස්වාමිනි, නුඹවහන්සේ නොකල්හි මෙතැනට වැඩ වදාළේ කුමක් සඳහා දැ" යි ඇසිය.

බුදුහු" ගද්‍රහය, මා මෙහි පැමිණියේ පැමිණිය යුත්තක්මා සඳහාය. ඉදින් නුඹ කැමැත්තෙහි නම් අද එක රැයක් මේ විමනෙහි වසනු කැමැත්තෙමි" යි වදාළෝය. ස්වාමිනි, "මහේ නම් එයට අකමැත්තක් නැත. එසේකුදුවුවත් ආලවක යක්ෂසේනාව තෙම ඉතා නපුරුය, කර්කශය, මවුපියන්ට පවා ගරු නොකරන්නේය. මා දන්නා තෙක් මෙහි පව්කම්ක් මිස පින්කමක් නැත. මේ බිම් ලෙයින් තෙමී ඇති සැටි බලනු මැනව. මේ මිනිස්සු කන කලට කව දෙකොණින් වැගුරුණු ලේය. රවක් පුරාලන මිනිසුන් කා නැති කෙළේය. ඔහුගේ භාර්‍යාවෝත් දැතුළු විමනෙහි වෙසෙති. ඔව්හු ද නුඹවන්සේගේ බුදුගුණ නොදනිති. ස්වාමිනි, කරුණු මේසේ හෙයින් නුඹවහන්සේගේ මෙහි වැඩ සිසිමට මම කැමති නොවෙමි" යි කීය.

එසේය ගද්‍රහය, ඔහුගේ නපුරුකම මම නොදන්නෙමි නොවෙමි. එයින් මට සිදුවිය අනතුරුදක් ද නැත. මම වශවර්ති මාරයාවවත් බිය නොවූයෙමි. දැන් යකකුටත් බිය වෙම් ද? ඉදින් නුඹ කැමැත්තෙහි නම් අද මේ රැය මම මෙහි වසමි යයි වදළසේක. දෙවනුවත් තෙවනුවත් මෙසේම කළා විය.

එසේ වී නම් සාමිනි; මම ඔබ මෙහි වසනබව ඔහුට දන්වමි. නැතහොත් ඒකාන්තයෙන් ඔහු මා මරයි. ඔහු කරා ගොස් දැනුම් දෙම් දැ යි විවාළේය. එවිට ගද්‍රහය, තෝ කැමතිලෙසක් යැව යි වදාළේය. එවිට ගද්‍රහ තෙම දෙර නොකැරම හිමවතට ගොස් මෙපවත් යක්ෂයාට දන්වීය.

බුදුරජාණන් වහන්සේ දෙර එලිපනට ශ්‍රීපාදය දිගුකළ විගසම දෙර විවෘත්ත විය. ඉඛේම ඇරුණු දෙරින් විමානයට ඇතුල්ව විමානය මුළුමනින්ම බැළුම්මෙන් යක්සෙන්පතිහුගේ

ප්‍රධානාසනයෙහිම වැඩහුන්සේක. යක්ෂාඩහනාවෝ ද බුදුරැසින් දිලිහි දිලිහී වැඩ හිඳිනා බුදුන් දැක වැඳ උන්වහන්සේ පිරිවරා බණ අසන්ව පවත්ගත්හ.

ගදුහයා ද යටත්ව නැමී නැමී හොස් කියෙන් මේ ප්‍රවිත ආළවක යක්ෂයාව කියේය. යකා ද ලජ්ජාවපි පැමිණ "ශ්‍රමණයාණන්ගේ රිස්සා කරිමි" යි වාසිබස් කියමින් සිටියේය. මේ අතර සානාගිර හේමවතා යන යක්සෙනෙවියන් දෙදෙනා ද ආළවක යක්ෂයාගේ විමානය උඩින් අහසින් සමාගමට යන්නාහු යා නොහැකිව බුදුන් වැඩ හිඳිනු දැක බිමට බැස වැඳ බණ අසා අවසර ගෙන රැස්වීමට ගියෝය.

ඒ දෙදෙනා ද හොස් ආළවකය, ඔබටවූ සේ මහත් ලාභයෙක, අපගේ බුදුහු නොපමේ විමානෙහි වැඩවසන්සේක. ඉක්මනින් යව, හොසින් පිළිගෙන උපස්ථාන කරවයි කිහ. ඒ ඇසූ ආළවකයා ගින්නෙහි බහාලූ ලුණු රැසක් මෙන් ක්‍රෝධයෙන් පිපිරි පිපිරි අවුත් "මම ආළවක යෙමි" යි නැගූ මහාඝඩ දඹදිව මුළුල්ලෙහි දෙර දෙර හැසූ සෙතඝඩක් සේ පැතිර ගියේය.

එසිනුදු බුදුහු බියගැන්වීය නොහැකිව "මේ මේ ලෙසින්වත් ශ්‍රමණ භවත් ගෞතමයා බිය ගන්වා පලවා හරිමි" යි මහත්වූ සුළඟක් ද, මහත්වූ මේඝයක් ද, ගල් වැස්සක් ද, ආයුධ වර්ෂාවක් ද, ගිනිඅඟුරු වැස්සක් ද, උණුඅලු වැස්සක් ද, උණුවැලි වැස්සක් ද, මඩ වැස්සක් ද, මහත්වූ ඝනාන්ධ කාරයක් ද යි මෙසේත් කළ යුද්ධඝන්ගෙන් බිය ගැන්වීය නොහැකිව තමන්ගේ චේලාසුඩය ද දමා හැසීය.

එකල්හි ආළවක තෙම මහත්වූ ලජ්ජාවට පැමිණ "මෙතෙක් කළ යුද්ධයෙනු දු මාගේ මහානුභාවඋපපන්න වේලාසුඩය දමා හැසීමෙනු දු මේ ශ්‍රමණයා මඩනව නොහැකි විය. එයට හේතුව නම් මොහුගේ මෛත්‍රීවිහරණය වන්නේය. මොහු කෙරෙහි කෝප උපදවා විනාශයක් කළ නොහැක්කෙමි" යි මහණ, තෙපි මාඝෙන් අවසරයක් නැතිව මාගේ ගෙට ඇතුල්ව ගෙනිමියකු මෙන් කිසි භයක් ලජ්ජාවක් නොමැති ව මාගේ අඹුවන් දරුවන් හිඳි නෙහි ද? මේ අදහනාදූහ පරිභොගය හා සන්‍රිසංසනීය ද නොපෙළේ මහණකම්ව සුදුසු නොවෙහි. ඉදින් තෙප මහණදම් පුරන්නහු නම් මාගේ භවනයෙන් නික්මියව යි නොයෙක් මැසිවිලි දොඩමින් "නික්ඛම සමණ" යනාදීන් මහණ මෙතැනින් නික්මෙව යි කීය.

බුදුහු ද "යහපත පින්වතාණෙනි" යි නිස්මුණාහ. ශ්‍රමණය, "විමතට ඇතුල් වෙව" යි කීය. බුදුහු ද ඇතුල් වූහ. තුන්වන වර දස්වා මෙසේ කිරේ භාග්‍යවතුන් වහන්සේ සුවව ද නැන්ද සි පරීක්ෂාකරනු සඳහාය. බුදුහු ඔහුගේ අදහස් දැන ආළවකයා කියනපරිදිම කළහ. ඉදින් එසේ නොකෙළේ වී නම් ඇබවින්ම සඳහැකි ඇති ඔහුගේ සිත තවත් දැඩිව ධම්දේශනාව පිළිගැනීමට අපොළොසත්වන බව දන්නා හෙයිනි.

ආළවක යක්ෂයා විසින් ඇසූ ප්‍රශ්න ඔහු කෙසේ දුනගත්තේ ද යත්? මොහුගේ මව්පියෝ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්න අවකින් යුත් ගාථා දෙකක් පිළිතුරුත් සමග දැන සිටියාහ. ආළවක කුඩා කලම ඒ ප්‍රශ්න වික පිළිතුරුත් සමගම උගන්වා මව්හු මිලාහුය. කල් යාමෙහි ආළවකට ගාථා දෙක පමණක් මතක තිබුණේය. පිළිතුරු අමතක විය. එකල්හි ආළවක මාගේ මව්පිය දෘයාදයක් වශයෙන් ඉගැන්නූ ප්‍රශ්න නොනැසී පවතිත්වාසි සිතා දුහිතුලෙන් හෙවත් සාදිලිංගම්වලින් රන් පතෙක ලියා තැබීය. මේ ප්‍රශ්න බුදුවරයකුව මිස සෙස්සනට විසඳිය නොහැකිය. තමන් සෙසු මහණ බමුණන් හෙන් අසා විසඳිය නෙ හැකිවූ කල්හි විතතවිඤ්ඤප සිත් කැලඹීම් ආදි නොයෙක් විපතට පමුණුවන්නාක් මෙන් බුදුන්වත් එසේ කරනු පිණිස "පඤ්හං තං සමණ පුවජිස්සාමි" යන ආදීන් කීයේ යි.

1 ප්‍රශ්නය-ආළවක:- කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං

මේ ලෝකයෙහි පුරුෂයකුව සතුව උපදවන හෙයින් විත්ත නම්වූ කවර නම් වස්තුවක් ශ්‍රෙෂ්ඨ ද?

පිළිතුර-බුදුහු:- සද්ධා විත්තං පුරිසස්ස සෙට්ඨං

මේ ලෝකයෙහි මනුෂ්‍යයාව ශ්‍රද්ධාව ශ්‍රෙෂ්ඨ වස්තුවකි.

ලෝකයෙහි රන්රිදි ආදි වස්තු උපභොග පරිභෝග සැපය ඇතිකරන්නාක් මෙන් ලෞකික ලොකොත්තර ශ්‍රද්ධාවෙන් දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සැප ද සිදුකර දෙන්නේ ය.

ඒ ශ්‍රද්ධා නොමෝ සම්පසාදන සද්ධා, සම්පක්ඛන්දන සද්ධා, සද්දහන සද්ධා, ඔකප්පන සද්ධා, ආගම සද්ධා, අධිගම සද්ධා යි පස් වැදෑරුම් වන්නීය.

යම්සේ වකාහි සක්විති රජකුගේ උදකප්‍රසාද මාණික්‍යය හෙවත් ජලය පහදවන මැණික කැලඹුණු වතුරකව දමූ කල්හි එහි ඇති මඩ රොල් ආදිය ඉවත් හෙරෙමින් වතුර පහදවා ද, එමෙන්

ශ්‍රද්ධාව උපන් කල්හි පඤ්ච නීවරණයන් ඉවත් වෙයි. කෙලෙස් සන්සිදුවයි. සිත ප්‍රසන්න කෙරෙයි. පැහැදුණු සිතින් දන් දෙයි. සිල් රකියි. අපහෙවස් සමාදත් වෙයි. භාවනා කෙරෙයි.

මෙහි සිත ජලය මෙනැයි ද. එහි ඇති මඩරොල් ආදිය කෙලෙස් මෙනැයි ද, සම්ප්‍රසාදන ශ්‍රද්ධාව කැලඹුණු වතුර පහද වන මැණික මෙනැයි ද දතයුතු යි.

යම්සේ හීරුක මිනිසුන් හෙවත් බියගුල්ලන් සමූහයක් කිඹුල් මෝරු ආදි වණඹ මසුන් ඇති මහා ගංඟාවකට පැමිණ එතරම්මෙහි බියෙන් මෙතෙරම පසුබසිමින් සිටිනා අතර සංග්‍රාමසූර මහායොධ යෙක් එහි පැමිණ ඔවුන් දැක තියුණු මුවහත් ඇති කඩුවක් ගෙන "තෙපි කිය කොව මිා පසුපස එව යි ගඟට බැස එන එන සැඹ කිඹුලුන් මරා සෙසු සියලු දෙනාත් සමග එතර වේ ද, එපරිද්දෙන දන් දෙන්නහුට සිල් රක්නහුට පෙහෙවස් වසන්නහුට බවුන් වඳින්නහුට ශ්‍රද්ධාව පෙරදැරි වන්නිය. මීට සම්ප්‍රසාදන ශ්‍රද්ධාව යයි කියනු ලැබේ. මේ සම්පසාදන, සම්පකඛන්දන යන දෙවැදෑරුම් ශ්‍රද්ධාව ලෞකිකය. ඔඝුතන, ඔකප්පන, ආගම අධිගම යන සතර ලොකොත්තර නම් වේ

එහි "ඔඝුතන ලකඛණා සද්ධා, ඔකප්පන ලකඛණා වා; පසාද භරසා උදකප්පසාද මණි විය, පකඛන්ද භරසා වා, ඔස්සුත්තරණා විය, අකාලුසිය පච්චුපට්ඨානා, අධිමුත්ති පච්චුපට්ඨානා වා; සද්ධෙය්‍යවත්ථු පදට්ඨානා, සොතාපත්තියඞ්ග පදට්ඨානා වා; සා හත්ථ චිත්ත බීජානි විය දට්ඨබ්බා"

යනුවෙන් තෙරුවන් ගුණ පිළිගැනීම ලක්ෂණ කොට ඇත්තී සද්දහන සද්ධා නම්වේ. තෙරුවන් ගුණයෙහි බැසගත් හැටිය ඔකප්පන නම්වේ. උදකප්‍රසාද මාණික්‍යය මෙන් සිත පැහැදවීම මෙහි රසය හෝ කෘත්‍යය යි. සැඹ පහරකින් එතර වන්නකු මෙන් සසරින් එතරවීම හෝ මෙහි කෘත්‍යය යි. තොකිලිටි හැටිය ඵලය යි. රත්නත්‍රය කෙරෙහි බැසගත් හැටිය හෝ මෙහි ඵලය යි. ඇදහිය යුතු බුද්ධාදි වස්තු තුන මිට ළංවූ කරුණු ය. ශ්‍රෝතාපත්ති මාර්ගඥානය උපදවා ගැනීමට ශ්‍රද්ධාව ආසන්න කාරණය වේ.

ඕතොමෝ "සද්ධාහත්ථෙන කම්මකඛයකරං ඤාණඵරසුං ගහෙත්වා සබ්බෙ අරා භඤ්ඤති අරහං" යනුවෙන් ශ්‍රද්ධා නමැති අතින් කර්මක්ෂය කරඳුන නමැති පොරොව ගෙන සංසාර වක්‍රයෙහි අරාදි කැපූ හෙයින් අර්හත් නම් වේයයි දක්වූ තන්හි ශ්‍රද්ධාව

දකුණු අත වැනි යයි ද, මේ සූත්‍ර දේශනායෙහිම "සද්ධිධ විත්තං" යන තන්හි වස්තුවක් වැනි යයි ද, "සද්ධා බීජං තපෝ වුච්චති" යන කසිභාරද්වාජ සූත්‍රයෙහි දක්වූ පරදි බීජුවරක් වැනි යයි ද "සද්ධා වුච්චති පාථෙය්‍යං" යන තන්හි ශ්‍රද්ධාව මාර්ගෝපකරණයක් වැනි යයි ද කියනලදි.

ආගමශ්‍රද්ධාව ද අදහන ශ්‍රද්ධාව මෙන් මේ තෙරුවන් ගුණ පිළිගත් ශ්‍රද්ධාවයි. අධිගම ශ්‍රද්ධා නම් මාර්ඵල ලැබූ ආර්‍යපුද්ගල යන්ගේ ශ්‍රද්ධාව යි. මෙහි දක්වූ අදහන ඔකප්පන ආගම අධිගම, යන සතරම් ලොකොත්තර ශ්‍රද්ධා නම් වෙති යි දතයුතු

2 ප්‍රශ්නය-ආලවක:- කිංසු සුවිණෙණං සුඛ මාවහාති

හොඳින් පුරුදු කළ කවර සුචරිතයක් කායික චෛතසික සැප එළවා ද?

පිළිතුර-බුදුහු:- ධම්මෝ සුවිණෙණා සුඛ මාවහාති

මනාව පුරුදු කළ ධර්මය තෙම ලෞකික ලොකොත්තර සැප එළවයි.

මෙහි ධර්මය නම් දන් දීම ය, සිල් රැකීම ය, භාවනා කිරීම ය, පින්අනුපත් දීම ය, පින් අනුමෝදන් වීම ය, වතාවත් කිරීම ය, වැඩි හිටියන්ට සැලකීම ය, බණ කීම ය, බණ ඇසීම ය, සම්‍යක්දෘෂ්ටිය යන දශපුණ්‍යක්‍රියා වස්තුව යි. මේ පින්කිරියවත් දසය දන, සිල, භාවනා යන තුන් පුණ්‍යක්‍රියාවස්තුවට ඇතුළත් වේ.

පින්දීම හා පින් අනුමෝදන්වීමත් යන දෙකම දානමය පුණ්‍ය ක්‍රියාවස්තුවෙහි ද, වැඩිහිටියන්ට සැලකීම හා වතාවත් කිරීමත් සීලමය පුණ්‍යක්‍රියා වස්තුවෙහි ද, බණකීම හා ඇසීමය සම්‍යක් දෘෂ්ටිය යන මේ තුන භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුවෙහිත් ඇතුළත් වේ.

මේ කුසලකම් සමාදන්වූයන් මහාණ රටඵපැල ආදි සිටුවරු යන්ට මෙන් මානුසික සැප ද, ශක්‍රදේවේන්ද්‍රාදීන්ට මෙන් දිව්‍ය සැප ද, මහාපදුම කුමාරාදීන්ට මෙන් නිවන් සැප ද සලහාදෙන හෙයින් දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ යන ත්‍රිවිධ සම්පත් සිද්ධකර දෙන්නේ ය.

3 ප්‍රශ්නය-ආලවක:- කිංසු ඝරෙ සාදුතරං රතනං

රජයන් අතුරෙන් කවර නම් රජයක් ඉතා මිහිරි ද?

පිළිතුර-බුදුහු:- සච්චං ඝරෙ සාදුතරං රතනං

රජයන් අතුරෙන් සත්‍යවචන නම්වූ රජය ඉතා මිහිරි ය.

දිවට මිහිරිවූ දෙය රසය යි. මේ කසට තික්ත ආදි වශයෙන් නානාවිධ ය. ඒ රස ජාතීන් අතුරෙන් සත්‍යවචනය තරම් මිහිරි දෙයක් නැත. පරමාර්ථ සත්‍යය, විරති සත්‍යය, වාක් සත්‍යය, සිත සත්‍යය තුන් වැදෑරුම් වේ. පරමාර්ථ සත්‍යය නම් චතුස්සත්‍යාවබෝධ නම්වූ නිර්වාණය යි. විරතිසත්‍යය නම් බොරුකීම් ආදි සතරවාග් දුශ්චරිතයෙන් වෙන්වූ යහපත් වචනය යි. වාක්සත්‍යය නම් විමුක්ති රසය ඇසුරු කළ කථායෙන් හෝ මුසාවාද විරති ආදි කුසල චේතනාවක් ඇසුරු කළ කථායෙන් හෝ පිටකරන වචන රැසකි. සත්‍යක්‍රියා නමින් පවසන්නේ ද මෙබඳු බලගතු වචන යනාව ය.

"සච්චෙන වාචෙනුදකම්හි ගාධති
විසම්පි සච්චෙන හනන්ති පණ්ඩිතා
යච්චෙන දෙවෝ එකඡං පවස්සති
තච්ච සීතා නිබ්බුතිං පත්ථයන්ති
යෙ කෙචිමෙ අත්ථි රසා පථව්‍යා
සච්චං තෙසං සාදුතරං රසානං
සච්චෙ සීතා සමණ බ්‍රාහ්මණා ච
තරන්ති ජාතිමරණස්ස පාරං"

යනුවෙන් මහාකපිනාදීන්ට මෙන් සත්‍යක්‍රියා බලයෙන් දිය උඩ සිටිය හැකි වෙයි. සාමකුමාරාදීන්ට මෙන් සත්‍යක්‍රියාවෙන් විෂ නැති කළ හැකිය. සත්‍යක්‍රියාවෙන් වැඟි වැස්සිය හැකි ය. සත්‍යබලයෙහි පිහිටි පුද්ගලයෝ නිවන පතත්.

පොළොව මතුපිට පිහිටි රස ජාතීන් අතරෙන් සත්‍යවචනය ඉතා මිහිරි වේ. සත්‍යබලයෙහි පිහිටි මහණබමුණෝ උත්පත්තිය හා මරණයෙන් සිමාවූ සංසාරසාගරයෙන් එතර වෙත්.

මූලරසාදි සියලු රසවලින් ශරීර යට සැප ඵලවත්තාක් මෙන් සත්‍යවචන නමැති රසය සමථ විපස්සනාදි භූතධම් වලින් සිත දියුණු කෙරෙයි. අමෘතරසය හා ධර්මරසයත් ගෙන දෙමින් කෙලෙස් සුන්ගෙන් තොකිලිටිවූ විමුක්තිරසය හෙවත් නිවන්රසය ඉහත දෙන්නේ ය.

4 ප්‍රශ්නය-ආලවක:- කථං ජීවිං ජීවිත මාහු සෙට්ඨං

කෙසේ නම් ජීවත්වන්නහුගේ ජීවිතය උතුම් යයි බුද්ධාදීන් උත්තමයෝ කියත් ද?

පිළිතුර=බුදුහු:- පඤ්ඤූ ජීවිං ජීවිත මාහු සෙට්ඨං

නුවණින් ජීවත්වන්නහුගේ ජීවිතය උතුම් යයි බුද්ධාදි උත්තමයෝ කියත්.

ඔහි ප්‍රතිපදාව ය, පැවිදි ප්‍රතිපදාවය යි ප්‍රතිපදා දෙකෙකි. ශාසනාවතරයෙහි යෙදුණු පුද්ගල තෙම පස්පවෙන් වැළකී සම්‍යක් කර්මාන්ත ඇත්තෙක් ව සරණාගමන සිලසමාදාන දන්දීම පෙහෝ දිනයෙහි පසළොවස් විසිම් ආදි ශාසන ප්‍රතිපදාවෙන් යුක්තවේ ද, පැවිද්දෙක් වී විපිළිසර නොව හෙවත් පසුතැවිලි නොව සිල විසුද්ධියෙහි පිහිටා එයින් මත්තෙහි චිත්තවිසුද්ධි ආදිය උපදවා මහ පල නුවණින් සිත් ගෙන ජීවත් වේ ද, ඔහුගේ ඒ ප්‍රඥාජීවිතය දුස් ලාබුවකුගේ ජීවිතය මෙන් සාර්ථක වුන්නේ ය. එයින් වෙනස් වූවන්ගේ ජීවිත අන්ධයන්ගේ හෝ එක් ඇසක් ඇත්තවුන්ගේ ජීවිත මෙන් නිසරු යයි ද දතයුතු.

"පඤ්ඤා සුත විහීනෝ—පඤ්ඤා කිත්තිසිලොක වඩ්ඪනී
පඤ්ඤා සහිතෝ නරෝ—ඉධ අපි දුක්ඛස්ස සුඛානි වින්දති"

යනුවෙන් කතාව ඇසුනු දෙය මේ හොඳ ය, මේ තරකය මේ වැඩ දායක ය. මේ අවැඩදායක යයි නිශ්චය කරගත හැක්කේ ප්‍රඥාවෙනි. එබඳු ප්‍රාඥයාගේ කිර්තිය සත්පුරුෂයන් අතරම වැඩෙන්නේ ය. මෙසේවූ ප්‍රඥාවෙන් යුත් මනුෂ්‍යතෙම සැබවින්ම දුක් සහිත මේ ලෝකයෙහි සම්‍යක් ප්‍රතිපත්තිය හේතුකොවෙන 'නිරාමිසවූ සැපයක් හෙවත් කෙලෙසුන්ගෙන් මිශ්‍ර නොවූ සැපයක් විඳියි. මෙයින් දස්වන ප්‍රාඥයා නම් කම්සථාන පුරුදු කිරීමේ නුවණ ඇතිව විදර්ශනා ප්‍රඥාව දියුණු කිරීමෙන් මාර්ග ඵල ප්‍රඥා ලැබූ තැනැත්තේ යි.

මේ ප්‍රශ්න සතර විසඳූ අයුරට සතුටුවූ යක් සෙනෙවි තෙම තමන් දැන ගෙන සිටි අනික් ප්‍රශ්න සතර ද ඇසීය.

5 ප්‍රශ්නාඤ-ආලවකඃ- කථංසු තරතී ඔඝං
කෙසේ නම් සතර ඕඝයෙන් එතරවන්නේ ද?

පිඨතුරු-බුදුහු:- සද්ධාය තරති ඔඝං

ශ්‍රද්ධාවෙන් ඕඝය තරණය කෙරෙයි. මෙහි කෙලෙස් රැසකට ඕඝය යි කියනුලැබේ. සෙ වනාහි කාමෝඝය, භවෝඝය, දිට්ඨෝඝය, අවිජ්ජෝඝ යයි සතරෙකි. මෙය සසර සසුරෙහි කෙලෙස් නමැති සැඩපහර සතරක් වැනි කොට වදාළහ.

අවබෝධාත්මයෙන් හා රාශ්‍යර්ථයෙන් ද ඕඝ නම් වේ. අවහනනය යනු යටට බැස්සවීම යි. මේ කෙලෙසුන්ට අසුවූ පුද්ගල තෙම දුගතියෙහි උපදවයි. උසස්වූ තැනට හෙවත් නිවනට යන්ට ඉඩ නොදෙමින් තුන් භවයෙහි, සතර යෝනියෙහි, පස්ගතියෙහි, සත් විඤ්ඤාණස්ථිතියෙහි, නව සත්ත්වාවාසයෙහි, උපදවමින් සසර සසුරෙහි මිහිල්වයි.

රාහ්‍යාර්ථයෙන් ඔය නම් වූයේ කෙසේද යත්? මේ වනාහි මහත්වූ කෙලෙස් රැසෙකි. යටින් අවීචියෙහි පවන් උඩින් භවාග්‍රය දක්වා මේ කෙලෙස් රැස පවත්නේය.

කාමොඝය නම් පස්කම්සැපයෙහි පැවති ඡන්දරාග යයි කෙවත් ඇලීමයි. මෙය අවවැදුරුම් ලොභසහගත සිත්වල උපදියි. රූප අරූප භවයන්හි ආසාව හා ධ්‍යානයන් කෙරෙහි ඇලීමත් භවොඝ නම් වේ. මෙය දෘෂ්ටිවිප්‍රයුක්ත හෙවත් දෘෂ්ටිය හා මුසු නොවූ සතර ලෝභසහගත සිත්හි උපදියි. දෙසැවක් මිථ්‍යාදෘෂ්ටිය දිට්ඨොඝ නම් වේ. මෙය දෘෂ්ටි සම්ප්‍රයුක්ත ලොභසහගත සිත් සතරෙහි උපදියි. චතුස්සත්‍යයෙහි නොදැනීම අවිජ්ජොඝ නම් වේ. මෙය දෙලොස් අකුසල් සිත්හි උපදියි.

සද්ධාය තරති ඔඝං යන මෙයින් දිට්ඨොඝතරණය වදාළේය. සෝවාන් මාර්ගඥානයෙන් දෘෂ්ටිය දුරුවන සඟයිනි. සෝවාන් ආර්ය්‍ය පුද්ගල තෙම දිට්ඨොඝය තරණය කෙළේ නම් වේ, හෙවත් දෘෂ්ටි නමැති සැඩපහරින් එතරවූයේ වේ.

6 ප්‍රශ්නය-ආලවක:- කථංසු තරති අණ්ණවං
කෙසේ සසර සයුරෙන් එතර වේ ද?

පිළිතුර-බුදුහු:- අපපමාදෙන අණ්ණවං
අප්‍රමාදයෙන් සසර සයුරෙන් එතර වේ

අශ්‍රද්ධාවත් තැනැත්තේ වතුරොඝයෙන් එතරවීම් විශ්වාස නොකරන හෙයින් ඔහු සසරසයුරෙහි ම ගැලෙයි පස්කම් සැප යෙහි ඔත යෙදවීමෙන් ප්‍රමාද වෙයි. ප්‍රමාදයෙන් එහි ගැලීම නිසා සසරසයුරෙන් එතර විය නොහැකිවෙයි. අප්‍රමාදයෙන් එය කළ හැකි හෙයින් "අපපමාදෙන අණ්ණවං" යි වදාළහ. සෝවාන් ආර්ය්‍ය ශ්‍රාවක තෙම අප්‍රමාද ප්‍රතිපදාවයෙන් භාවනා කොට සෝවාන් මාර්ගයෙන් දුරු කළ නොහැකි භවොඝය සකෘදාගාමි මාර්ගඥාන යෙන් දුරු කෙරෙයි. මෙහි අපපමාද පදයෙන් සකෘදාගාමි මාර්ගය හා එහි ඵලයත් එදෙකින් යුත් භවොඝතරණයන් ප්‍රකාශ වේ.

7 ප්‍රශ්නය-ආලවක:- කථංසු දුක්ඛං අවෙචගී
කෙසේ නම් දුක දුරු කරන්නේ ද?

පිළිතුර-බුදුහු:- විරියෙන දුක්ඛං අවෙචගී
වීර්‍ය්‍යයෙන් දුක දුරු කෙරෙයි.

සකෘදාගාමි ආර්ය්‍ය පුද්ගල තෙම තුන්වෙනි මාර්ගයවූ අනාගාමි මාර්ගඥානය උපදවනු සඳහා ඇත් වීර්‍ය්‍යයෙන් දුක නැති කෙරෙයි. මුලින් කියනලද සකෘදාගාමි මාර්ගයෙන් වසනුකාම කෙලඟකාමයන්

දුරු කොවන කෙසින් ඔවුන් දුරු කරනු සඳහා කාමච්ඡන්ද භාවනා කොට අනාගාමිමාර්ගඵලයෙන් උපදවා කාමෝඝයෙන් එතර වෙයි. මෙයින් අනාගාමි මාර්ගඵලය හා එය ඉපදවූ ආර්ය්‍ය පුද්ගලයාගේ කාමෝඝ තරණයන් ප්‍රකාශ වෙයි.

8 ප්‍රශ්නය-ආළවක:- කථංසු පරිසුජ්ඣති
කෙසේ පිරිසිදු වේ ද?

පිළිතුර-බුදුහු:- පඤ්ඤාය පරිසුජ්ඣති
නුවණින් පිරිසිදු වෙයි

අනාගාමී ආර්ය්‍ය පුද්ගල තෙම ච්‍යුතිඥාන ප්‍රඥාව හේතුකොට ගෙන සතරවෙනි අර්හත් මාර්ගප්‍රඥාව උපදවා අනාගාමිමාර්ගයෙන් දුරු කොටු අවිද්‍යෝඝය දුරු කොට රහත් වෙයි. මෙයින් රහත්-නුගේ අවිද්‍යෝඝතරණ ප්‍රකාශවෙයි.

මෙසේ රහත්ඵලය කුළු ගන්වා ප්‍රශ්න විසඳූ කල්හි මහපිතැති ආළවක යක්ෂසේනාධිපති තෙම මහ පැහැත්තෙක්ව දහසක් නයින් ප්‍රතිමණ්ඩිත සෝවාන් ඵලයෙහි පිහිටියේය.

දැන් අළවි යක්ෂසෙනෙවි තෙම තෙරුවන් ගුණයෙහි බෑසඟත් ලොකොත්තර ශ්‍රද්ධා ඇත්තෙක්ව තමහට ඇතිවූ ධර්මාවබෝධයෙහි පිහිටා "පඤ්ඤාය පරිසුජ්ඣති" යි වදාළ ප්‍රඥාපදය ගෙන ලෞකික ලොකොත්තර දෙකින් මිශ්‍රවූ ප්‍රශ්න අසන්නේ "කථංසු ලභතෙ පඤ්ඤං" යන මේ සපදගාථාවෙන් තවත් ප්‍රශ්න පසක් දිවාළේය.

ආළවක:- කථංසු ලභතෙ පඤ්ඤං
කවර පරිද්දකින් නුවණ ලබන්නේ ද?

බුදුහු:- සද්දහානෝ අරහතං ධම්මං නිබ්බාණපත්තියා
සුස්සූසා ලභතෙ පඤ්ඤං අප්පමත්තෝ විචක්ඛණෝ

සැදැහැති නුවණැති අප්‍රමාදවූ පුද්ගල තෙම බුද්ධාදි උතුමන් පැමිණි නිවනට පැමිණීම පිණිස බණ ඇසීමෙන් නුවණ ලබයි.

ශ්‍රද්ධාවෙන් ප්‍රඥාලාභයට හේතුවූ පිළිවෙත්හි ගමන් කෙරෙයි. සුස්සූසාවෙන් සකස්ව බණ අසයි. අප්‍රමාදයෙන් උගත් ධර්මය මතක තබා ගනියි. විවක්ෂණත්වයෙන් මෙවත් දෂකර්මයන් ඒ ධර්මය අඩු වැඩි නොවෙමින් වෙනස් නොකොට විස්තර කෙරෙයි. මෙසේ ශ්‍රද්ධාවෙන් ඵලලාභයෙහි පවත් ධර්මශ්‍රවණය කෙරෙන් සුස්සූසාව ලබයි.

ආළවකඃ- කථංසු විඳතෙ ධනං

කෙසේ නම් ධනය ලබන්නේ ද?

බුදුහුඃ- පතිරූපකාරී ධුරවා උට්ඨාතා විඳතෙ ධනං

ලෞකික ලොකොත්තර ධනලාභයට සුදුසු අන්දමින් ක්‍රියා කරන මෛතසික වියැී ඇති එසේම කායික වියැී ඇති තැනැත්තේ ධනය ලබයි.

"යො ච සීතං ච උණ්හං ච තිණා භියෝ න මඤ්ඤති" යනු වෙන් යමෙක් ශීතෝෂ්ණ දෙක තණපතක් තරමටවත් නොසලකා නොමැලිව කෘෂි වණිජ් කම්නාතාදියෙහි යෙදේ නම් ඒ තැනැත්තේ එක මල මියකුගෙන් නොබෝකලකින් දෙලක්ෂයක් ඇසුව ලැබූ චුල්ලසෙනවාසිකයා මෙන් ලෞකික ධනය ද, නිදිමත නැදෙන කල මතමූ පිදුරු වෙණියක් හිසමත තබාගෙන ගලවලු පමණ වතුරෙහි සිට භාවනා කොට දෙලොස් අවුරුද්දකින් රහත් වූ මිලකඛනිඤ්ඤ තෙරුන් මෙන් ලොකොත්තර ධනය ද ලබන්නේය.

මේ කථාවස්තු දෙක ජාතකපොතෙන් හා මිනොරථපූරණියෙන් ද විසතර වශයෙන් දත යුතුය.

ආළවකඃ-කථංසු කිත්තිං පපොති

කෙසේ නම් කීර්තියට පැමිණේ ද?

බුදුහුඃ- සචෙචන කිත්තිං පපොති

සත්‍යය කරණකොටගෙන කීර්තියට පැමිණෙයි. බුද්ධාදි උත්තමයෝ පරමාර්ථසත්‍යයෙන් දෙවියන් සහිත ලෝකයා අතරෙහි කීර්තියට පැමිණියහ.

ආළවකඃ- කථං මිත්තානි ගන්ථති

කෙසේ මිතුරන් ඔපයන්නේ ද?

සිතූ පැතූ දෙයක් අනුන්ට දෙන තැනැත්තේ ද දෙන්ට බැරිතරම් වූ දෙයක් නමුත් බලාපොරොත්තු වන්නවුන්ට දෙන තැනැත්තේ ද මිතුරන් ඇතිකර ගනියි. මෙහි දානය, ප්‍රියවචනය, අර්ථචර්‍යාවය, සමානාත්මතාවය යන සතර සංග්‍රහ වස්තුවම මිතුරන් ගැනීකිරීමේ උපායමාර්ගය වේ යයි දතයුතු.

ආළවකඃ- අස්මා ලොකා පරං ලොකං කථං පෙච්ච න සොචති

මෙලොවින් පරලොවට යන තැනැත්තේ කෙසේ පරලෙවිහි ශොක නොකෙරේ ද?

බුදුහු:- ආළවක යක්ෂයා විසින් මෙතෙක් ඇසූ ප්‍රශ්න ලෞකික ලොකොත්තර දෙකෙන්ම ශ්‍රේෂ්ඨ කොට විසඳූ වදුරා මේ කැඟූ පස්වෙනි ප්‍රශ්නය ගාථාසප්ත ප්‍රතිපදාවට අනුකූලව විසඳනසේක්

යස්සෙතෙ චතුරෝ ධම්මා සද්ධස්ස ඨිරමෙසිනෝ
සච්චං ධම්මෝ ධිති චාගෝ ස වෙ පෙච්ච න සොචති
ඉංඝ අඤ්ඤඳපි පුච්ඡස්සු පුථු සමණබ්‍රාහ්මණෙ
යදි සච්චා දමා චාගා ඛන්ත්‍යා භීරුත්ථි විජ්ජති ති වදුළහ.

ඒහිමෙයි වාසයකරන්න යම් කෙනෙකුට සත්‍යයත්, ධෘතියත්, ධෛර්‍යයත්, පරිත්‍යාගයත්, යන මේ සතර ගුණධර්මයෝ වෙත් නම් හෙතෙම එකාන්තයෙන් පරලෝකයේ ශෝක නොකෙරෙයි.

ඉදින් සත්‍යය, ඉන්ද්‍රියදමනය, පරිත්‍යාගය, ක්ෂාන්තිය යන මේ කරුණු සතරට වඩා අධිකවූ ලෞකික ලොකොත්තර ධර්මයක් නැත්තේය. නැඹ ආළවකය, අප කී දෙයෙහි ඔබට සැකයක් වේ නම් තවත් සෙසු මහණ බමුණන් ඇති බැවින් ඔවුන් අතින් විචාරා දැනගනුවයි වදාළසේක

මෙහි "සච්චන හිත්තිං පපෙපාති" යනුවෙන් වදාළ සත්‍යයත්,, "සුස්සූසා ලභතෙ පඤ්ඤං" යනුවෙන් ප්‍රඥා නාමයෙන් දක්වූ ධර්මයත්, "ධ්‍රුවා-උට්ඨානා" යන වචනවලින් දක්වෙන ධෛර්‍ය්‍ය-යත්, "දදං මිත්තානි ගන්ථති" යනුවෙන් දක්වූ පරිත්‍යාගයත් පළමු වන ගාථාවෙහි ඇතුළත් වේ.

දෙවනගාථාවෙහි චාග්සත්‍යයත්, "සුස්සූසා ලභතෙ පඤ්ඤං" යනුවෙන් උතුම්න් කරා එළඹ හොඳ තරක කුමක් දැයි ඇසීමෙන් ප්‍රඥාව ලැබේ යයි වදාළ ඉන්ද්‍රියදමනයත්, "දදං මිත්තානි ගන්ථති" යනුවෙන් වදාළ පරිත්‍යාගයත්, "ධ්‍රුවා උට්ඨානා" යන වචනවලින් ප්‍රකාශවූ පරිදි ඕජස්විඛ්‍යාන යෙන් නමා වෙත පැවරුණු බර ඉසිලීමත් යන මේ කරුණු ඇතුළත් වේ.

එවිට ආළවක යක්ෂ තෙම "කථන්නුදානි පුච්ඡෙය්‍යං" යන ආදීන් සාම්පරායිකවූ හෙවත් පරලෝකයේ සුගතිය වහී සම්පත් දෙන්නාවූ යම් අර්ථයක් වේ නම් එය අද මම කොදින් දැනගනිමි. එහෙයින් සෙසු මහණ බමුණන්ගෙන් ඇසීමෙන් මට ප්‍රයෝජන යක් නැතැයි ප්‍රකාශ කෙළේය.

සියල්ල දැනගත් සම්බුදුරජාණන් වහන්සේ මට වැඩ පිණිසම මාගේ භවනයෙහි විසීමට පැමිණියහ. යම් කෙනෙක දුන් දෙය මහත්ඵල මහානිසංස වේ නම් ඒ අග්‍ර දක්ෂිණෙය්‍යවූ තථාගතයන් වහන්සේ ඔව අද මම විශෙෂයෙන් අවබෝධකර ගනිමි.

ඒ මම සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට ද, සපඤ්ඤාපතික නවලොකොත්තර ධර්මයට ද, අසංඛ්‍යෙය්‍ය පුද්ගල මහාසංඝයා වහන්සේට ද, වඳිමින් ගමක් ගමක් පාසා නුවරක් නුවරක් පාසා හැසිරෙමි යි මෙසේ සතුති කෙළේය.

මෙයින් "සම්මාසම්බුද්ධා වත භගවා" යනුවෙන් ඒකාන්ත යෙන් බුදුහු සම්‍යක්සම්බුද්ධයහ, "සවාක්ඛාතෝ භගවතා ධම්මෝ," යනුවෙන් භග්‍යවතුන්වහන්සේ විසින් වදාළ ධර්මය සවාක්ඛාතය, "සුපටිපන්නා භගවතෝ සාවකසංඝා" යනුවෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝ තෙම සුප්‍රතිපන්න යයි මේසේ සතුති කොට වඳිමින් ධර්මඝොෂකයෙක් ව හෙවත් තෙරුවන් ගුණගයන් කෙනක් ව හැසිරෙමි යි යනු දක්වූ අයුරු සි.

මෙසේ මේ ධර්මදේශනාව කෙළවරවීමත්, ඒ සමඟම රාත්‍රිය ඉක්ම යාමත්, ඉර උදාවීමත්, දසදහසක් සක්වළින් පැමිණි දෙව් බඹුන්ගේ සාධුකාර නාදයත්, ආළවක යක්‍ෂයාට බිලි පිණිස රාජ පුරුෂයන් විසින් අල්වා කුමරා විමානයට ගෙන ඒමත් යන මේ කරුණු එකවිටම සිදුවූහ.

රාජපුරුෂයෝ වනාහි මෙබඳු සාධුකාර ශබ්දයක් බුදුවරයකු හැර අනෙකෙකු සඳහා නොනැගෙයි. කිම? බුදුහු වැඩසේක් දෝ හෝ සි බලන්නාහු උන්වහන්සේගේ ශරීරාලෝකය දැක නිසැකව අභිසම්බෝධිඥානයට වැද එහි වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ ද එවෙන හුන් යක්‍ෂයා ද දැක "එම්බල මහායක් සෙනෙවිය, ඔබව බිලියම් පිණිස මේ රාජකුමාරයා ගෙන ආයෙමි, එබැවින් මොහු කතොත් කා පියව, බොකතොත් බී පියව, අද පවත් අපෙන් ඔබට දිනපතා දෙන බිලිපූජාවක් නැතැයි" කිවාහුය.

එහෙයින් කිහ.

"ඉමං ඛෝ මහායක්ඛ කුමාරං ලොකපූජිතං
ඉතෝ පරං නත්ථිතුයහං බලිකම්මං දිනෙ දිනෙ" සි

යක්‍ෂ තෙමේ සෞම්‍යාන් වූ හෙයින් ලජ්ජාවට පැමිණ පෙම්බර මවක් මෙන් කුමරුවා දැතින් වඩාගෙන "අයං භන්තෙ කුමාරෝ මයහං පෙසිතෝ, ඉමාහං භගවතෝ දම්මි, හිතානුකම්පකා බුද්ධා, පතිගණ්හාතු භන්තෙ භගවා ඉමංදරකං ඉමස්ස හිතත්ථාය,සුඛත්ථාය" යනුවෙන් සාමිනි, මේ කුමරුවා මව හොඳුරු පිණිස එවනලද්- දේය. මම මොහු ඔබවහන්සේව පූජා කරමි, බුදුවරයෝ මාවැන්න

වුන්හේ මේබදු නපුරු හොදුරු නැති කොට සත්ලෝකයාව නිතානුකම්පා කරන්නෝය. සවාමිනි භාග්‍යවතුන්වහන්ස, මොහුට නිතසැප පිණිස මේ කුමරුවා පිළිඟෙන වදුරන සේක් වයි මේ ගාථාවෙනුදු සැලසෙළේය.

"ඉමිං කුමාරං සතපුඤ්ඤලක්ඛණං
සබ්බඞ්ගුපෙතං පරිපුණ්ණවයඤ්ජනං
උදග්ගචිත්තෝ සුමනෝ දදම් තෙ
පටිග්ගහෙ ලොකහිතාය වක්ඛුමා"

යනුවෙන් පෑසේ ඇති සම්පූර්ණ වහන්ස, සියලු ශරීරාවයවයෙන් හා සටහන්වලින් යුත් බොහෝ පින් ලකුණු ඇති මේ කුමරා ඔද වැඩි සිත් ඇති ප්‍රසන්න සිත් ඇති මම ඔබට දෙමි, ලොවට වැඩ පිණිස පිළිගනු මැනව යනු යි

රහල් කුමරුවා ද අතින් සපයිනොකළ භාග්‍යවතුන්වහන්සේ අළුවි කුමරුවා දෝතින් පිළිඟෙන වදුරා යක්ෂයාවත් කුමරුවාවත් සෙත් පිණිස ජයමඟුල් පිණිස මෙසේ වදුරනසේක්

"දීඝායුකො හොතු අයං කුමාරෝ
තුවං ච යක්ඛ සුඛිතෝ භවාහි
අබ්‍යාධිකා ලොකහිතාය තිට්ඨථ"

යනුවෙන් ගාථාධියක් වදළහ.

යක්ෂ සේනාපති තෙමේ ද කුමරුවා තිසරණ ගන්වමින් "අයං කුමාරෝ සරණ ගච්ඡති බුද්ධං, ධම්මං, සංඝං," යනුවෙන් අනික් අඩිය සම්පූර්ණ කෙළේය. හේ වනාහි

"දීඝායුකො හොතු අයං කුමාරෝ
තුවං ච යක්ඛ සුඛිතෝ භවාහි
අබ්‍යාධිකා ලොකහිතාය තිට්ඨථ
අයං කුමාරෝ සරණ ගච්ඡති බුද්ධං ධම්මං සංඝං" යනුයි,

මේ කුමාර තෙම දීඝායුෂ ඇත්තෙක් වේවා, යක්ෂය නුඹත් සුවපත් වෙව, දෙදෙනාම නිදුක්ව ලොවට යහපත පිණිස සැපදේ වසව්. මේ කුමාරතෙම බුදුන්, දහම්, සඟුන් යන තෙරුවන් සරණ ගියේ යනුයි.

භාග්‍යවතුන්වහන්සේ කුමරුවා පිළිඟෙන රාජපුරුෂයන් අතව දුන්සේක. මෙසේ මේ අළුවි කුමරා රාජපුරුෂයන් අතින් යක්ෂයාගේ අතට ද යක්ෂයාගේ අතින් බුදුන්ගේ අතට ද බුදුන්ගේ අතින් සැවතත් රාජපුරුෂයන් අතට ද දාන ප්‍රතිදාන වශයෙන් මාරුවූ හෙයින් හත්ථක ආළවක නමින් ප්‍රසිද්ධ විය.

යක්ෂ සෙමේ ද භාග්‍යවතුන් වහන්සේ පිටු සිහෑ වඩනා කල්හි උන්වන්සේගේ පාසිවුරු රැගෙන මදතැනක් පසුගමින් කොට තැවතුණේය. භාග්‍යවතුන්වහන්සේ ද දන් වළඳ ඉක්බිති නුවර දොර එක්තරා විවේක ගසක් මූල පනවනලද බුද්ධාසනයෙහි වැඩහුන්සේක. අලවිරට රජතෙමේ ද නුවරවැස්සන් සමඟ බුදුන් කරා එළඹ වැඳ පිරිවරා "සවාමිනි, මේසා රෞද්‍ර දරුණු යක්ෂයා දමනය කෙළේ කෙසේ දැයි විචාළහ.

භාග්‍යවතුන් වහන්සේ ද මූල පටන් සියල්ල විස්තර කොට වදළසේක. අලවිකවර තෙමේ ද දැනමිසි වයසට පත්වූ පසු "මම බුදුන් නිසා ජීවිතය ලබූයෙක් වෙමි" යි සලකා භාග්‍යවතුන් වහන්සේ හා භික්ෂුසංඝයා වහන්සේ ද ඇසුරු කෙරෙමින් නොබෝකලකින් අනාගාම්ඵලයෙහි පිහිටා පන්සියයක් උපාසක වරුන් පිරිවර කොට ඇත්තෙක් විය.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ "එතදග්ගං භික්ඛවේ මම සාවකානං උපාසකානං වතූහි සංගහවත්ථූහි පරිසං සඞ්ගණ්හනානානං යදිදං හත්ථකෝ ආළවකෝ" යනුවෙන් මහණෙනි, මාගේ ශාසනයෙහි උපාසක පිරියෙහි දීමය, ප්‍රියවචනයෙන් කථාකිරීමය වැඩ සලසන කථා කිරීමය, සමව පැවතීමය, යන මේ සතර සංග්‍රහ වස්තුවෙන් මහාජන සංග්‍රහය කරන්නවුන් අතුරෙන් හත්ථක ආළවක තෙම අග්‍ර යයි ඔහුව අග්‍රතනතුරු ද දෙවා වදළසේක.

මෙසේ මේ සූත්‍ර ධර්මදේශනාව පළමු කොට ආළවක යක්ෂයාව ද, නැවත අලවි රජු ඇතුළු මහාජනයාව ද, පසුව දෙවිරම වෙහෙරවි වැඩ අනඳ මහතෙරුන් අමතා ද වදළ හෙයින් සතීඳයන් වහන්සේ විසින් තුන්වරක් වදළ ආනුභාව සම්පන්න ශ්‍රීමුඛ දේශනාවක් විය. අලවි රජ්ජුරුවෝ ද සෝවාන්වූහ.

මේපුවත ඇසූ අලවිරජ තෙම ආළවක යක්ෂයා කෙරෙහි ආදර ගෞරවය ඇතිව ඔහු වෙනුවට දෙවොලක් කරවා දිනක් පාසං දීප ධූප පුෂ්ප ගන්ධාදියෙන් යුත් වැටුප් පවුරු සැලැස්විය. ආළවක යක්ෂසේනාධිපති තෙමේ ද එතැන් සිට නුවරම කිසි උවදුරක් සිදුවන්නට බොහෝ ආරක්ෂා ආවරණ සංවිධානාදියෙන් අලවි නුවර දියුණු කෙළේය.

ආළවක සූත්‍රදේශනි දහම්විසඳුරය නිමි.

අග්ගිකභාරද්වාජ සුත්තං

වසල සූත්‍රය වා

එවං මේ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජේත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමේ, අථඛෝ භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසි.

තෙන ඛොපන සමයෙන අග්ගිකභාරද්වාජස්ස, බ්‍රාහ්මණස්ස නිවෙසනෙ අග්ගිපජ්ජලිතෝ හොති ආහුති පග්ගහිතා.

අථඛෝ භගවා සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානෝ යෙන අග්ගිකභාරද්වාජස්ස නිවෙසනං තෙනුපසංකමි, අද්දසා ඛෝ අග්ගිකභාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවන්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන භගවන්තං එතදවොච-තත්‍රෙව මුණ්ඩක, තත්‍රෙව සමණක, තත්‍රෙව වසලක තිට්ඨාහීති,

එවං වුත්තෙ භගවා අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං එතදවොච්, ජානාසි පන ත්වං බ්‍රාහ්මණ වසලං වා වසලකරණෙ වා ධම්මෙති, නඛ්වාහං භො ගොතම ජානාමි වසලං වා වසලකරණෙ වා ධම්මං, සාධු මේ භවං ගොතමෝ තථා ධම්මං දෙසෙතු යථාහං ජානෙය්‍යං වසලං වා වසලකරණෙ වා ධම්මෙති.

තෙන හි බ්‍රාහ්මණ සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති, එවම්භොතී ඛෝ අග්ගිකභාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවතෝ පච්චස්සොසි භගවා එතදවොච්.

1 අකොධනෝ උපනාහී ච පාපමක්ඛී ච යෝ නරෝ
විපන්නාදිට්ඨි මායාවී තං ජානුසු වසලෝ ඉති.

2 එකජං වා ද්විජං වා පි යොධ පාණානි හිංසති
යස්ස පාණෙ දයා නත්ථි තං ජානුසු වසලෝ ඉති.

3 යෝ ඝනති පරිරුන්ධති ගාමානි නිගමානි ච
නිග්ගාහකෝ සමඤ්ඤානං තං ජානුසු වසලෝ ඉති

4 ගාමෙ වා යදිවා රඤ්ඤෙ යං පරෙසං මමායිතං
ථෙය්‍යා අදින්නං ආදියති තං ජානුසු වසලෝ ඉති.

5 යෝ හවෙ ඉණං මාදාය චුජ්ජමානෙසු පලායති
න හි තෙ ඉණමත්ථීති තං ජානුසු වසලෝ ඉති.

6 යෝ වෙ කිඤ්චික්ඛකම්‍යතා පත්ථයානං වජතං ජනං
හන්ත්වා කිඤ්චික්ඛ මාදෙති තං ජානුසු වසලෝ ඉති.

7 යෝ අත්තහෙතු පරහෙතු ධනහෙතු ව යෝ නරෝ
සක්ඛිපුට්ඨෝ මුසා බ්‍රූති තං ජානුසු වසලෝ ඉති.

8 යෝ ඤාතීනං සඛානං වා දූරෙපි පතිදිස්සති
සහසා සම්පියෙන වා තං ජඤ්ඤා වසලෝ ඉති.

9 යෝ මාතරං වා පිතරං වා ජිණ්ණකං ගතයොබ්බනං
පහූ සන්තෝ නභරති තං ජඤ්ඤා වසලෝ ඉති.

10 යෝ මාතරං වා පිතරං වා භාතරං භගිනිං සසුං
හන්ති ඵරුසෙති වාචාය තං ජඤ්ඤා වසලෝ ඉති.

11 යෝ අත්ථං පුච්ඡිතෝ සන්තෝ අනත්ථං මත්තසාසති
පටිච්ඡන්නෙන මන්තෙති තං ජඤ්ඤා වසලෝ ඉති.

12 යෝ කත්වා පාපකං කම්මං මා මං ජඤ්ඤාති ඉච්ඡති
යෝ පටිච්ඡන්න කම්මන්තෝ තං ජඤ්ඤා වසලෝ ඉති.

13 යෝ වෙ පරකුලං ගන්ත්වා භුත්වාන සුචිමහාජනං
ආගතං න පටිපූජෙති තං ජඤ්ඤා වසලෝ ඉති.

14 යෝ බ්‍රාහ්මණං වා සමණං වා අඤ්ඤං වා පි වණිබ්බකං
මුසාවාදෙන වඤ්චෙති තං ජඤ්ඤා වසලෝ ඉති.

15 යෝ බ්‍රාහ්මණං වා සමණං වා භත්තකාලෙ උපට්ඨිතෙ
රොසෙති වාචා න ච දෙති තං ජඤ්ඤා වසලෝ ඉති.

16 අසතං යොධ පබ්‍රූති මොහෙන පලිගුණ්ඨිතෝ
කිඤ්චිකඛං නීජගිංසානෝ තං ජඤ්ඤා වසලෝ ඉති.

17 යෝ චතුනානං සඞ්ඝකම්මෙ පරඤ්ඤ මවජානති
නිහීනෝ සෙන මානෙන තං ජඤ්ඤා වසලෝ ඉති.

18 රොසකෝ කදරියෝ ච පාපිච්ඡා මච්ඡරී සඨෝ
අහිරීකෝ අනොත්තාපී තං ජඤ්ඤා වසලෝ ඉති

19 යෝ බුද්ධං පරිභාසති අථවා තස්ස සාවකං
පරිබ්බාජං ගහට්ඨං වා තං ජඤ්ඤා වසලෝ ඉති.

20 යෝ වෙ අනරහා සන්තෝ අරහං පටිජානති
චොරෝ සබ්‍රහ්මකෙ ලොකෙ එස ඛ්‍රා වසලාධමෝ
එතෙ ඛ්‍රා වසලා වුත්තා මයා වෝ යෙ පකාසිතා.

21 න ජච්චා වසලෝ හොති න ජච්චා හොති බ්‍රාහ්මණෝ
කම්මනා වසලෝ හොති කම්මනා හොති බ්‍රාහ්මණෝ.

22 තදමිනාපි ජානාථ යථා මෙදං නිදස්සනං
චණ්ඩාලපුත්තෝ සොපාකෝ මාතඞ්ගෝ ඉති විස්සුතෝ.

23 සෝ යසං පරමං පත්තෝ මාතඞ්ගොයං සුදුල්ලභං
ආගඤ්ඡුං තස්සුපට්ඨානං බහවෝ බ්‍රාහ්මණා ඉමු

24 සෝ දෙවියාන මාරුයහා විරජං සෝ මහාපථං
කාමරාගං විරාජෙත්වා බ්‍රහ්මලොකූපගෝ අහූ

25 න නං ජාති නිවාරෙසි බ්‍රහ්මලොකූපපත්තියා
අජ්ඣායකා කුලෙ ජාතා බ්‍රාහ්මණා මන්තබන්ධූනං

26 තෙ ච පාපෙසු කම්මෙසු අභිණ්හා ඔපදිස්සරෙ
දිට්ඨෙව ධම්ම ගාරය්හා සම්පරායෙ ච දුග්ගතිං
න තෙ ජාති නිවාරෙති දුග්ගච්චා ගරහාය වා.

27 න ජච්චා වසලෝ හොති න ජච්චා හොති බ්‍රාහ්මණෝ
කම්මනා වසලෝ හොති කම්මනා හොති බ්‍රාහ්මණෝති.

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවන්තං එතදවොච අභික්කන්තං භොතගොතම අභික්කන්තං භොතගොතම, සෙය්‍යථාපි භොගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මෝ පකාසිතෝ, එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි. ධම්මං ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භවංගොතමෝ ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

වසල සූත්‍රය

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රය මෙසේ අසනලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම්වූ අනේපිඬු මහසිටුහුගේ අරමහි වැඩවාසය කරනසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙන සැවැත් නුවරහි පිඬු පිණිස වැඩිසේක.

එසමයෙහි එනැහි අග්නිකභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ ගෙදොර සමීපයෙහි ගිනි දල්වනලද්දේ වේ., අග්නිහෝමය පවත්ශන්නා ලද්දේ මය.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර පිඬුපිණිස හැසිරෙනසේක් අග්නිකභාරද්වාජ බ්‍රාහ්මණයාගේ ගෙය ඇම් තැනෙක නම් එතනට එළඹිසේක. අග්නිකභාරද්වාජ තෙමේ දුරසිටම එන්නාවූ භාග්‍යවත්හු දැක්කේය. දැක භාග්‍යවතුන්

වහන්සේට මෙසේ කියේය. මූණඩකය හෙවත් හිස මුඩු කළ තැනැත්ත, ශ්‍රමණකය හෙවත් නිදහස් හිඟන, වසලය හෙවත් චණ්ඩාලය එහිම සිටුව යනුයි.

මෙසේ කී කල්හි භාග්‍යවතුන්වහන්සේ අග්ගිකභාරද්වාජ බමුණාට මෙසේ වදාළහ. බමුණ, නුඹ වසලජාතිකයා හෝ වසල බව ඇතිකරන කරුණු හෝ දන්නෙහි ද ? යනුයි.

භවත් ගෞතමයන්වහන්ස, මම වසල ජාතිකයා හෝ වසල බැව් ඇතිකරන කරුණු හෝ නොදනිමි. යම්සේ මම වසලයා හෝ වසල බැව් ඇති කරන කරුණු හෝ දනිමි ද, භාග්‍යවතුන් වහන්සේ එසේ වූ ධර්මයක් දේශනා කරනසේක් නම් මැනව යනුයි.

එසේ වී නම් බමුණ අසව, හොඳින් මෙනෙහි කරව, ප්‍රකාශ කරන්නෙමි හි වදාළසේක. එසේය පින්වතැයි කියා අග්ගිකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්නේය. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.

1 යම් මනුෂ්‍යයෙක් කිපෙන ගති ඇත්තේ වේ ද, බැඳගත් වෛරයෙන් යුක්ත ද, පවිටු ගුණමකුවෙක් වේ ද, විනාශවූ සත්‍යක් දැක්ක ඇත්තෙක් වේ ද, හෙවත් මිථ්‍යාදෘෂ්ටික වේ ද, තමන්ගේ දෙස් වසන මායාවෙන් යුක්ත වේ ද, මෙබඳුවූ ඒ පුද්ගලයා වසල යෙකැයි දන්නේය නොමෙහෙත් වසලයෙකැයි දැනගනුව.

2 මේ ලෝකයෙහි යමෙක් එක්වරවම උපන්නාවූ හෝ දෙවරකට උපන්නාවූ හෝ ප්‍රාණීන්ව හිංසා කෙරේ ද, යම්කුඩ ප්‍රාණියකු කෙරෙහි අනුකම්පාවක් නැත් ද, ඔහු වසලයෙකැයි දන්නේය.

3 යමෙක් ගම් නියම්ගම් හා නගරයන් විනාශ කෙරේ ද, එසේ වැනසීමට සෙනඟ පොළඹවා ද, කැලඹීම් ඇතිකරන්නෙකැයි ලෝකයෙහි ප්‍රකට වේ ද, ඔහු වසලයෙකැයි දන්නේය.

4 හමෙහි හෝ ඉදින් වනයෙහි හෝ අනුන්ට අයිති යම් කිසි වස්තුවක් හොරෙන්හින් යම් කිසි ප්‍රයෝගයකින් ගන්නේ වේ ද, ඔහු වසලයෙකැයි දන්නේය.

5 යමෙක් එකෙනෙහියෙන් ණයක් ගෙන ණය හිමියන් විසින් චෝදනා කරනු ලබන්නේ නුමඟින් ගත් ණයක් නැතැයි මහඟරින්නේ ද ඔහු වසලයෙකැයි දන්නේය.

6 ඒ කාන්තාගෙන් යමෙක් සවලාවූ දෙයක්වත් ගැනීමේ බලාපොරොත්තුවෙන් මහ යන සත්‍රියක් හෝ පුරුෂයකු මරා හෝ කොවා හෝ කිසිවක් ගනී ද ඔහු වසලගෙකැයි දන්නේය.

7 යමෙක් තමන්ගේ දිවි පැවැත්ම නිසා හෝ අනුත් නිසා හෝ යම්කිසි ධනයක් හේතුකොටගෙන හෝ ශාක්ෂි විචාරනලදුව බොරු කියා ද හෙවත් බොරු ශාක්ෂි කියා ද, ඔහු වසලගෙකැ යි දන්නේය.

8 යමෙක් නැගන්ගේ හෝ මිත්‍රයන්ගේ හෝ භාග්‍යාවන් කෙරෙහි බලාත්කාරකමින් හෝ දෙදෙනාගේ ඉඟිකමින් හෝ අසාචාරගෙන් හැසිරේ ද ඔහු වසලගෙකැ යි දන්නේය.

9 යමෙක් තමාට ශක්තිය තිබියදීත් දුප්පත්වූ වයස්ගතවූ මව හෝ පියා හෝ පොෂණය නොකරේ ද ඔහු වසලගෙකැ යි දන්නේය.

10 යමෙක් මවට හෝ පියාට හෝ සහෝදර සහෝදරියන්ට හෝ නැදිමිසිලන්ට හෝ දබ්බුහුරු ආදිගෙන් පිඬා කෙරේ ද, පරුෂවචනගෙන් කෝප කෙරේ ද, ඔහු වසලගෙකැයි දන්නේය.

11 යමෙක් මෙලෝ පරලෝ දිහුණුව පිණිස කරුණු විචාරන ලද්දේ ඔසට අහිතයක් කියා ද, අවියක් වුවත් සහවා කථා කරන්නේ ද, ඔහු වසලගෙකැ යි දන්නේය.

12 යමෙක් භවිකමක් කොට (මා පවිකමක් කෙළේ යයි අනිකකු) දැන නොඇන්ම කැමති වේ ද, අනුන්ට සහවා කරන පාපක්‍රියා ඇත්තේ වේ ද ඔහු වසලගෙකැයි දන්නේය.

13 යමෙක් ඒකාන්තගෙන් සැදුනි මිත්‍රාදීන්ගේ කුලගවි ගොන් පවිත්‍රවූ ඔබාජුන් වළඳ තමාගේ ගෙට පැමිණියකුට ආහාර පානාදිගෙන් නොසලකා ද, ඔහු වසලගෙකැයි දන්නේය.

14 යමෙක් බමුණකු හෝ මහණකු හෝ අනික් යදියකු හෝ ඔබාරුවෙන් රවටා ද ඔහු වසලගෙකැ යි දන්නේය.

15 යමෙක් බමුණකු හෝ මහණකු හෝ ආහාර අනුභව කරන කාලගෙයි තමාගේ ළඟට පැමිණි කල්හි නුසුදුසු වචනගෙන් කෝප උපදවන කථා කෙරේ ද භෝජනයක් නබා තමන් හමුවී මිටවත් ඉඩ නොදේ ද, ඔහු වසලගෙකැ යි දන්නේය.

16 යමෙක් මේ ලෝකගෙයි මූලාගෙන් වෙළී යම්කිසි සවලාමාත්‍ර දෙයක් ඇනීම ගැන බලාපොරොත්තුවෙන් අසත් පුරුෂ වචන කියන්නේ නම් ඔහු වසලගෙකැ යි දන්නේය.

17 යමෙක් සඟකියා මානයෙන් අධර්මයෙක් ව තමන් උසස් කර පෙන්වීම් හා අනුන් පහත් කොට සැලකීමත් නෙරේ ද ඔහු—

18 යමෙක් නිතර කිපෙන සුලු ද, තද මසුරෙක් වූයේ ද, පවිටු අදහස් ඇත්තේ ද, මසුරු ද, මෛථුනික ද, ලජ්ජා නැත්තේ ද, භය නැත්තේ ද ඔහු—

19 යමෙක් බුදුන්ට හෝ තවත් උත්වහන්සේගේ ශ්‍රාවක යකුට හෝ පරිව්‍රාජකයකුට හෝ ගෘහස්ථයකුට හෝ පරිභව කෙරේ ද, ඔහු—

20 යමෙක් රහත් නොවූයේම රහත් යයි ප්‍රතිඥා කෙරේ ද, දෙවියන් සහිත ලෝකයෙහි මෙතෙම ඒකාන්තයෙන් මහා සොරෙකි, අධර්මවූ වසලයෙකි, ("යෙ වෝ මයා වසලා වුත්තා, එතෙ ඛෝ පකාසිතා" යි සම්බන්ධ කරනු) මා විසින් සුඛලාව වසල බැව් ඇති කරන කරුණු සැලකවින් මානෘකා වශයෙන් තබන ලද නම් දුන් ඔවුහු විසාර වශයෙන් දක්වන ලදහ.

21 ජාතියක් වශයෙන් වසලයෙක් නොවේ. ජාතියක් වශයෙන් බ්‍රාහ්මණයෙක් ද නොවේ, කර්මයෙන් වසලයෙක් වේ. කර්මයෙන් බ්‍රාහ්මණයෙක් ද වේ.

22 යම්සෙයකින් මාගේ මේ නිදර්ශනයෙක් වේද, එය මේ ප්‍රකාරයෙනුදු දැනගනිව්, හේ මෙසේදයත්? පසුව මාතඞ්ග යයි ප්‍රසිද්ධවූ සොපාක නම්වූ චණ්ඩාල පුත්‍රයෙක් විය.

23 ඒ මේ මාතඞ්ග පණ්ඩිත තෙම ඉතා දුර්ලභවූ උතුම්වූ යසසකට පැමිණියේය. බොහෝවූ ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද ඔහුට උවටැන්කිරීම් පිණිස පැමිණියහ.

24 සෙතෙම තොකිලිටිවූ බුද්ධාදි උතුමන් විසින් පිළිපන් මහා මාවතක්වූ අෂ්ටසමාපත්ති යානයට නැඟී කාමරාගය දුරු කොට බ්‍රහ්මලෝකයට පැමිණියේ විය.

25 ඔහුගේ සැබෑවාල් ජාතිය බඹලොව ඉපදීමට බාධා නොකෙළේය. වේද මන්ත්‍ර හදාරන කුලයෙහි උපන් මේදයම් නැසී කොට ඇති බවුදෑණෝ මෙත් ද

26 ඔවුහුත් පව්කම්හි නිතර දක්නා ලැබත් ද, ඉතාමත් මහිම ගැරහිය යුත්තෝ වෙත්, පරලෝවහි ද දුගතියට යෙත්. ජාතිය දුගතියෙන් හෝ නින්දයෙන් හෝ ඔවුන් නොවිලක්වයි.

27 ජාතියෙන් වසලයෙක් නොවේ. ජාතියෙන් බ්‍රාහ්මණයක් ද නොවේ. කර්මයෙන් (තමන්ගේ ක්‍රියාවට අනුව) වසලයෙක් වේ. කර්මයෙන් බ්‍රාහ්මණයෙක් වේ යනුයි.

මේසේ වදාළ කල්හි අග්ගිකභාරද්වාජ බමුණු තෙමේ (ආළවක සූත්‍රාවසානයෙහි කියනලද පරිද්දෙන්මේ) දතුටු විය. දිවිහිමි කොට සරණ ගිය උපාසකයෙක් ද විය.

සිංහලානුවාදය නිමි.

දහම් විසතර

මෙහි ඇතුළත්වූ පළමුවන ගාථාවෙන් කොඩකාදි කරුණු සයක් ද, දෙවෙනි ගාථාවෙන් සත්‍යභිංසාව ද, තුන්වෙනි ගාථාවෙන් ගම්භේද කිරීමෙන් විනාශකිරීම ද, සතරවෙනි ගාථා වෙන් අනුන් සතු දෙය සොරසිතින් ගැනීම ද, පස්වෙනි ගාථාවෙන් ණය කාරයන් රැවටීම ද, සවන ගයෙන්. මංකොල්ලා කෑම ද, සත්වන ගයෙන් බොරුශාක්ෂි කීම ද, අවවන ගයෙන් ඕත්‍රදොහී කම ද, නවවන ගයෙන් දුසීලවූ දෙමව්පියන්ව හා ගුරුවරුන්ද නොසලකන අකෘතඥකම් ද, දසවන ගයෙන් වැඩිහිටියන්ව කෝප උපදවා ඔවුන් වෙහසට පත්කිරීම ද, එකොළොස්වැනි ගයෙන් අවැඩදායක අනුශාසනාවලින් අනුන් නොමඟ යැවීම ද, දොළොස්වන ගයෙන් අනුන්ට සඟවා පවිකම් කිරීම ද, දහතුන් වන ගයෙන් අනුන්ට නොසැලකීම්ද, දසසතරවන ගයෙන් මහණ බමුණු ආදීන් බොරුවෙන් රැවටීම ද, පහළොස් වන ගයෙන් කන බොන වේලායෙහි පැමිණි දුගී මගී යාචක මහණ බමුණන්ට පරුෂවචනයෙන් බැණ වැදී යම් දෙයක් නොදී එළවා ගැනීම ද, දහසය වන ගයෙන් කිසිවක් දෙන්ට වේය යන මූලා වෙන් අසත්පුරුෂ වූවන කීම ද, දහහත්වන ගයෙන් තමා උසස් කෙනකු බව හැඟවීම හා අනුන් පහත් කොට කථා කිරීමත් යන කරුණු දෙක ද, දහඅටවන ගයෙන් රොසක(අනුන්ට ක්‍රොධකිරීම) ආදී කරුණු සතක් ද, දහනවවන ගයෙන් බුදුන්ට හා සංඝයාවිත් අපහාස කිරීමය යන කරුණු දෙක ද, විසිවන ගයෙන් ලෝකයෙහි ලොකුම භොරු දෑ හි යන මේසේ වැල බැව් දක්වන කරුණු තෙතිසක් (33) හෝ සූතිසක් (34) මේ සූත්‍රයෙහි වදාරා තිබේ.

එහෙයින්

"එතෙ බෝ වසලා වුත්තා මයා වෝ යෙ පකාසිතා" යි වදළහ.

ලෝකයෙහි මහාචොරු පස්දෙනෙකි. ඇතැම් මහා චොරකුව "මම කවදා තම් සිය දහස් ගණන් සෙනඟ පිරිවරාගෙන චොරදෙටු වෙක් ව ගම් නියම්ගම් රාජධානිවල අනුන්ව තලා පෙළා හිංසා කෙරෙමින් මරමින් කපමින් සතුන් මරා මස් ලැබ පිසගෙන කමින් මත්පැන් බොමින් හැසිරෙමිදැ"යි මෙසේ සිතක් පහළ වෙයි. ඔහු අදහස්වූ පරිදිමදන්ම එසේ කෙරෙයි.

එමෙන් මේ ශාසනයෙහි ද පවිටු අදහස් ඇති භික්ෂුවත් "මම ගණනාගණකමයක්ව භික්ෂුපිරිසක් පිරිවරාගෙන කෙසේ ලෝකයා ඉගන් ගරු බුහුමන් සැලකිලි ලබමින් සිවුපසය ලබමින් හැසිරෙම් දැ" යි සිතා එසේ කෙරෙයි. මේ මෙසස්තෙහි පළමුවන මහාචොරා යි.

එසේම ඇතැම් පවිටු භික්ෂුවක් ධර්මවිනය හොඳින් උගෙන එය තමන්ගේත් අනුන්ගේත් විනාශය පිණිස යොදයි මේ දෙවෙනි මහා චොරා යි.

තවත් පවිටු භික්ෂුවක් පිරිසිදු සිල් ඇති භික්ෂුනමකව අමුලික වූ බොරු චෝදනා වලින් නින්දා කෙරෙයි මේ තුන්වෙනි මහා චොරා යි

නැවතත් පවිටු භික්ෂුවි ආරාම, ආරාමවයතු, විහාර, විහාරවසතු ආදී විහාරාරාම සනතක සඟසතු දෙයින් තිහියන්ව සංග්‍රහ කෙරෙහි. මේ සතරවන මහා චොරා යි.

තවත් භික්ෂුවක් තමා තුළ නැති ධ්‍යාන සමාධි මාර්ග ඵල ප්‍රභේද ලෞකික ලොකොත්තර ගුණ ඇතිසේ මුලා කොට සිවු පසය ලබයි. මේ පස්වන මහා චොරා යි.

මෙහි ශාසනයට වැදී සිවින පස්මහාචොරුන් අතුරෙන් පළමුවැන්නා අනුන්ගෙන් සිවුපසය ලැබීම සඳහා අසුතු ප්‍රයත්න දරන තැනැත්තා යි. දෙවැන්නා තමන් උගත් ධර්මවිනය තොම කට හරවා ප්‍රකාශකරමින් තමනුත් වැනසෙන අනුනුත් වනසන තැනැත්තා යි. තුන්වැන්නා අනුන්ගේ සීලාදි ගුණධර්මයනට අසත්‍යයෙන් චෝදනා කරන තැනැත්තා යි. සතරවැන්නා සංඝික දේපල අසුතු ලෙස යොදන්නා යි. පස්වැන්නා නැති ගුණ, නැති සිල් හඟවන්නා යි. මොවුන් අතුරෙන් පස්වැන්නා දෙවියන් සහිත ලෝකයෙහි හැසිරෙන අධර්මවූ වසලයා බැව් දක්වනු සඳහා

"සෝ මව අකරහා සඤ්ඤා - අරහං පටිජානති
චොරෝ සබ්‍රහ්මකෙ ලෝකෙ - එස වෝ වසලාධමෝ" යනු වදළහ.

බුද්ධාදි ආර්‍යයන් වහන්සේලා පහසුවෙන් කොලැබියහැකි මිසියත් බව ලැබූ සත්‍රී පුරුෂයන් විසින් තමතමන් කරනු ලබන හීනකම් නම්වූ පව්කම් හේතුකොටගෙන වසලයන් වනු මිස, උත්කෘෂ්ට කම් නම්වූ මහාද පිරිසිදු ක්‍රියාවෙන් බ්‍රාහ්මණයන් වනු මිස, උත්පත්ති මාත්‍රයෙන් වසලයන් නොවන බවත් උත්පත්ති මාත්‍රයෙන් බ්‍රාහ්මණයන් නොවන බවත් පරමාර්ථ සත්‍යයක් වශයෙන් දේශිදි වදළහ.

එහෙයින්

"න ජච්චා වසලෝ හොති - න ජච්චා හොති බ්‍රාහ්මණෝ
කම්මනා වසලෝ හොති - කම්මනා හොති බ්‍රාහ්මණෝ"
යන්නෙන් එය පැහැදිලි වේ.

ඒ බව මේ මතු දක්වන නිදර්ශනයෙන් පැහැදිලි කොට දක්වනු පිණිස

තදමිනාපි විජානාථ යථාවෙදං නිදස්සනං යනුවෙන් පවත්ගත්හ.

අතීතයෙහි අප මහා බෝසත්හු සැබෑල් කුලයක උපන්හ. මහතෙම සිහිබෑමෙන් ජීවත්වන්නෙක, තමන්ගේ ආහාරය සඳහා මළ බල්ලන්ගේ මස් කපා පිස අනුභව කරන හෙයින් සොපාක නම් විය. පසුව මාතඞ්ග නම්වූදු ප්‍රකට විය.

එහෙයින්

"චණ්ඩාලපුත්තෝ සොපාකෝ මාතඞ්ගෝ ඉති විස්සුතෝ
යනු වදළහ.

ඒ මේ මාතඞ්ග පණ්ඩිත තෙම ආශ්චර්‍ය්‍ය වූ හෙවත් පුදුම එළවන අද්භූත වූ හෙවත් පෙර කිසිකලෙකත් සිදු නොවූ ඕර ක්‍රියාවෙන් ලෝකයෙහි ඉතා දැලීහවූ කීර්තියට පැමිණියේය.

එහෙයින්

සෝ යසං පරමං පත්තෝ - මාතඞ්ගෝ සුදුල්ලභං යනු වදළහ.

මාතඞ්ග පණ්ඩිත තෙම තමා උපායෙන් කැඳවාගෙන ආ දිට්ඨමංගලිකා නම් වූ සිටු භාර්‍ය්‍යාව සතසතු සඳහා "නී නුවරට ගොස් මාගේ හිමියා සැඩොලෙක් නොවෙයි. හේ මහා බ්‍රාහ්මණයෙමි ය"යි නිර්භයව ඇඬනගා කියන ලෙසට උපදෙස් දුන් හෙයින් ඇය නුවර තුළට ගොස් මෙයින් සත්දවසකින් එන පුර

පසළොස්වක්හි මගේ සැමියා වූ මහාබ්‍රහ්ම තෙමේ සඳමඬල පළාගෙන මා කරා එන සැටි බලව සිටියේය. සියල්ලෝ ම මෙය සැබවක් දැයි දැන ගැනීමට බලා සිටියහ.

දිට්ඨමංගලිකා තොමෝ නොබෝ නොපැකිළෑ දවසක් පාසාම මෙසේ කියන්වූ හෙයින් පොහෝ දිනට එලිවෙන්ව පළමුවම සම්මගය පටපිළියෙන් වසා බිම සුවඳින් ආලෙප කොට උඩ සුදු වියන් බඳවා අවට සරසා සුවඳමල් ගත් අත් ඇතිව ඔහු පිළි ගන්නට සැමෝම සූදානම්ව සිටියහ.

මහාබෝසත්තෙම පුණුපොහෝදිනයෙහි මහාජනයා මහ බඹ තෙමේ දැන් එයි, දැන් ඒ යයි අහස දෙස බලමින් සිටිය දී දෙළොස්යොදුන් පමණ වූ විශාල සිරුරකින් සත්වරක් අහස වට කොට ඇවිද ඒ විශාල ශරීරය මිනිස් පමණක් වනසේ කුඩා කොට මවාගෙන හැම දෙනාවම පෙනෙන්නට සඳමඬල පලාමගහි අහසින් බැස අවුත් සම්මගෙට පිවිසියේය.

එකල මේ ආශ්චර්‍යය බලන්නට රජ්ජු සිටි ක්ෂත්‍රියයන් හා බ්‍රාහ්මණයෝ ද සෙසු දඹදිවි වැස්සෝ ද අපමණ ඕල්වරසන් දෙමින් සාධුකාර පවත්වමින් මාතඛහ බෝසත්හට වඳින්නට පුදන්නට සත්කාර කරන්නට පැමිණියහ.

එහෙයින්

ආගඡුං නඡ්ඡුපට්ඨානං බහූනීඝා බ්‍රාහ්මණා බහූ යනු වදළහ.

අතීතයෙහි මාතඛහයයි ප්‍රසිද්ධවූ අප මහබෝසත්හු බරණැස් නුවර සම්පයෙහි එක්තරා සැඩොල් ගමක උපන්හ. ඒ නුවර සතළිස් කෙළක් ධනය ඇති සිටුකුලයෙක කාන්තාවක් උපන. ඕතාපමෝ නමින් දිට්ඨමඞ්ගලිකා විය. දුටුවන් පිනවන රූප සම්පත්තියෙන් හා කුල භෝග සම්පතින් ද යුක්ත වූවාය.

බොධිසත්වයන් වහන්සේ ඇය උපාසයෙන් තම බිරින්ද කොට ගත සම්මගෙට කැඳවාගෙන ගොස් ජන්මභේදය නොකොට ම තවුස් වෙස් ගෙන පැවිදිව කිසුණු පිරිසම් වඩා පස් අභිඥා හා අට සමවත් ද උපදවා පසුව ඇය සැඩොල් භාර්‍යාව නොව බ්‍රහ්මභාර්‍යා බවට පත්කෙළේය. ඇයගේ පය සේදූ දියෙන් මුළු මගත් දඹදිව සියලු රජුන් අභිෂේක ද කරවිය.

මෙහි විසතර කථාව ජාතකපොතේ මාතඛහ ජාතකයෙන් හා පිරිත් අටුවාවෙන් ද, බුදුකනිකාඝට්ඨකථාවෙන් ද, සිංහල අම්බතුරෙහි ගාඝපතිදමන නම්වූ සතරවන පරිවේදයෙන් ද දත හැකිය.

මේ මාතඞ්ක පණ්ඩිත තෙම තෙලෙස් දුවිලි නැති මහොහතමයන් විසින් හෙවත් බුද්ධාදි උතුමන් විසින් පිළිපන් මාර්ගයවූ මරණින් මතු බඹලොවට යාහැකිවූ අප්‍රමාපතනි ධ්‍යානයට නැති කාමවිරාග භාවනාවෙන් මරණින් මතු බඹලොව උපන්නේය.

එහෙයින්

සෝ දෙවයාන මාරුය්හ විරජං සෝ මහාපථං
කාමරාගං විරාජෙත්වා බ්‍රහ්මලොකූපගෝ අහු සි වදුළහ.

මාතඞ්ක පණ්ඩිතයාණන්ගේ සැබෑල් ජාතිය බඹලොව ඉපදවීමට බැඳ තොතෙළේය.

එහෙයින්

න නං ජාති නිවාරෙසි බ්‍රහ්මලොකූපපත්තියා යනු වදුළහ.

වේදමන්ත්‍රයන් හදාරන වේදය පිළිසරණ කොට ඇති බ්‍රාහ්මණකුලයෙහි උපන් බමුණෝ නිතර පව්කම් කෙරෙත් තම ඔවුහු මෙලොවත් ගැරහියහුතුබවට පරලොවත් දුගතියට යෙති. දුගතියෙන් මෝ මෙලෙව නින්දයෙන් මෝ නොවළකිත්.

එයට නිදර්ශනයක් නම්

එක්කලෙක කොකාලිය නම් භික්ෂුවක් "පාපිච්ඡා සාරිපුත්ත මෝග්ගල්ලානා, පාපිකානං ඉච්ඡිතං වසං ගතා" යනුවෙන් තම හට සිදුවූ අසුතු අලාභයක් නිසා සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ කෙරෙහි කෝපව උන්වහන්සේලා පාපිච්ඡයහ. පව්ටු කැළැකිවලට අවනතවූහ යි මෙසේ දෝෂාරෝපණය කරමින් දෙවරමට ගියේය.

මොහු භාග්‍යවතුන්වහන්සේ ළඟට ද පැමිණ මෙසේ කියන්ට පටන්ගත් කල උන්වහන්සේ එය නවත්වන්ට උත්සාහ කළ නමුත් නොහැකි විය. මේ භික්ෂු තෙම බුදුන් වැඳ ආපසු එන අතර ඇගේ කිබිලි හවගත්තේය. ක්‍රමයෙන් ඒවා අබ ඇට පමණට ද කහබෝ වේලාවකින් මුං ඇට පමණට ද කඩල ඇට පමණට ද, බෙබර (මසං) ඇට පමණට ද, තෙල්ලි පමණට ද, බෙලිඟැට පමණට ද, දියුණු වී පුපුරා ලේ සැරව ගලමින් ජේතවනාරාමයෙහි දොරටුව ළඟ ඇද වැටී බිම වැතිර ගෙනත් අඟසව් දෙනමට අපභාස කළේය.

දෙවරමට යන එක අය මොහුගේ අපභාෂාත්මක කථා අසා 'ඩික් මෝකාලික, ඩික් මෝකාලික, ' වී මෝකාලික වී මෝකාලික යයි අපභාස කරන්නට වූහ. මේ නින්දව මිනිස් ලොවින් දෙව් ලොව දක්වාත් දෙව්ලොවින් ඛඹලොව දක්වාත් පැතිරෙන්ට විය.

මේ කෝකාලික භික්ෂුවගේ ආචාර්ය්‍ය තෙම බ්‍රහ්මරාජයෙක් වි සිට මේ කථාව අසා සලකා බලන්නේ පෙර ජාතිගෙහි තමාගේ ගෝලයා බව දැන එතනවු පැමිණ අහසෙහි සිට "එම්බල කෝකා-ලිකය, සැරියුත් මුගලන් දෙනමට නොබනුව. උන්වහන්සේලා කෙරෙහි සිත පහදා ගනුව, උන්වහන්සේලා ප්‍රියශීලී උත්තමයෝ ය"යි අවවාද කෙළේය. එසේ ද වුවත් පළමු තමාගේ ගුරුවරයාව සිටි බ්‍රහ්මයාගේ අවවාදය ද නො පිළිගෙන බැන බැනම සිට එතන් හිදීම මිය ගොස් නිරයෙහි උපන්නේය.

චුල්ලකෝකාලික මහාකෝකාලික යයි කෝකාලික නමින් ප්‍රසිද්ධව සිටි දෙනමකි. මෙහි සඳහන් වූයේ චුල්ලකෝ කාලික භික්ෂුව හි. මෙතෙම සිටුකුලයෙන් පැවිදිවූවෙකි. මහාකෝකාලික බමුණුකුලයෙන් පැවිදිවූවෙකි. මොහු දෙවිදත් තෙරුන්ගේ ප්‍රධාන ශිෂ්‍යයා ය. දෙවිදත් තෙරුන් හා පවිකම් වලට සහභාගිවූවෙකි. මොවුන්ගේ උසස් ජාතිගොත්‍ර නිසාද, වෙන් හෝ දුගතියෙන් හෝ වළක්වාලන්ව සම්පී කොට්ය.

එහෙයින්

අජ්ඣායකා කුලේ ජාතා බ්‍රාහ්මණ මන්තබන්ධුනෝ-පප-න තේ ජාතිනිවාරෙන්ති දුග්ගතිවා භරභාය වා යත්‍ර වදලහ.

කරුණු මෙසේ හෙයින් මෙහි නිගමිතය කම් න ජච්චා වසලෝ හොති - න ජච්චා හොති බ්‍රාහ්මණෝ කම්මනා වසලෝ හොති කම්මනා හොති බ්‍රාහ්මණෝ යනුයි.

සිංහලානුවාදය නිමි.

කසීභාරද්වාජ සූත්‍රය

එවං මේ සුතං එකං සමයං භගවා, මගධේසු විහරති දක්ඛිණා-ගිරිස්මිං එකනාලායං බ්‍රාහ්මණගාමේ. තේන ඛෝ පන සමයේන කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පඤ්චමත්තානි නංගලසතානි පයුත්තානි හොන්ති වප්පකාලේ,

අථඛෝ භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යේන කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස කම්මන්තා තේනුපසඞ්කමි. තේන ඛෝ පන සමයේන කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පරිවේසනා වත්තති. අථඛෝ භගවා යේන පරිවේසනා තේනුපසඞ්කමි, උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි.

අද්දසා ඛෝ කසීභාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවන්තං පිණ්ඩාය ඨිතං දිස්වාන භගවන්තං එතදවොච, අහං ඛෝ සමණ කසාමි ච

වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමි, ත්වම්පි සමණ කසස්සු ච වපස්සු ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජස්සූති, අහම්පි බෝ බ්‍රාහ්මණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමීති.

න බෝ පන මයං පස්සාම ගොතමස්ස යුගං වා නඞ්ගලං වා ඵාලං වා පාචනං වා බලිවමද්දෙ වා, අථ ච පන භවං ගොතමෝ එවමාහ: අහම්පි බෝ බ්‍රාහ්මණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමීති. අථ බෝ කසීභාරද්වාජෝ බ්‍රාහ්මණෝ භගවන්තං ගථාය අජ්ඣභාසි,

1 කස්සකෝ පටිජානාසි න ච පස්සාම තෙ කසිං,
කසිං නෝ පුච්ඡිතා බ්‍රූහි යථා ජානෙමු තෙ කසිංති

2 සද්ධාබීජං තපෝ වුට්ඨි පඤ්ඤා මෙ යුගනඞ්ගලං,
හිරි ඊසා මනෝ යොත්තං සති මෙ ඵාලපාචනං

3 කායගුත්තෝ වචීගුත්තෝ ආහාරෙ උදරෙ යතෝ,
සච්චං කරොමි නිද්දානං සොරච්චං මෙ පමොචනං

4 විරියං මෙ ධුරධොරයහං යොගක්ඛෙමාධිවාහනං,
ගච්ඡති අනිවත්තන්තං යත්ථ ගන්ත්වා න සොචති.

5 එවමෙසා කසී කට්ඨා සා මහාති අමිතඵලා,
එතං කසිං කසිත්වාන සබ්බදුක්ඛා පමුච්චතීති.

අථ බෝ කසීභාරද්වාජෝ බ්‍රාහ්මණෝ මහතියා කංසපාතියා පායාසං වඩ්ඪෙත්වා භගවතෝ උපනාමෙසි,භුඤ්ජතු භවං ගොතමෝ පායාසං, කස්සකෝ භවං, යං හි භවං ගොතමෝ අමිතඵලං කසිං කසතීති.

6 ගාථා'භිගීතං මෙ අනභොජනෙය්‍යං
සම්පස්සතං බ්‍රාහ්මණ නෙස ධම්මෝ,
ගාථා'භිගීතං පනුදන්ති බුද්ධා
ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්ති රෙසා.

7 අඤ්ඤාත ච කෙවලිනං මහෙසිං
ඛීණාසවං කුක්කුච්ච වූපසන්තං,
අන්නෙන පානෙන උපට්ඨහස්සු
මෙත්තං හි තං පුඤ්ඤඵලස්ස භොතීති.

අථ ඛෝ භගවා 'හං භෝ ගොතම ඉමිං පායාසං දම්මීති, නඛවාභනන්තං බ්‍රාහ්මණ පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ

සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යස්ස සො පායාසො භූතෙනා සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය, අඤ්ඤත්‍ර තථාගතස්ස වා තථාගතසාවකස්ස වා තෙන හි තං බ්‍රාහ්මණ තං පායාසං අපහරිතෙ වා ඡඩ්ඩනි අපාණකෙ වා උදකෙ ඔපිලාපෙහීති.

අථඛො කසිභාරද්වාජො බ්‍රාහ්මණො තං පායාසං අපාණකෙ උදකෙ ඔපිලාපෙසි. අථඛො සො පායාසො උදකෙ පක්ඛිත්තෙනා විඝිට්ටායති විධිට්ටායති සන්ධූපායති සම්පධූපායති, සෙය්‍යථාපි නාම ථාලො දිවසසන්තතෙනා උදකෙ පක්ඛිත්තෙනා විඝිට්ටායති විධිට්ටායති සන්ධූපායති සම්පධූපායති.

එවමෙව සො පායාසො උදකෙ පක්ඛිත්තෙනා විඝිට්ටායති විධිට්ටායති සන්ධූපායති සම්පධූපායති.

අථඛො කසිභාරද්වාජො බ්‍රාහ්මණො සංවිග්ගො ලොමහට්ඨජාතො යෙන භගවා තෙනුපසඞ්කමි උපසංකම්මිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච.

අභික්කන්තං භොගොතම අභික්කන්තං භොගොතම සෙය්‍යථාපි භොගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තෙනා රූපානි දක්ඛිනන්තී ති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච, ලභෙය්‍යාහං භොතොගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති. අලත්ථ ඛො කසිභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං,

අචිරූපසම්පන්නා ඛො පනායස්මා භාරද්වාජො එකො වූපකට්ඨෝ අප්පමත්තෙනා ආතාපී පහිතත්තෙනා විහරන්තෙනා නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි, අඤ්ඤතරා ච ඛො පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

භාසිභාරද්වාජසුත්තං නිට්ඨිතං

සිංහලානුවාදය

මා විසින් මේ සූත්‍රදේශනාව මෙසේ අසනලදී. එක් සමයෙක්හි අප සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ මඟධ නම් ජනපදයෙහි එකනාලා නම් බමුණුගම දක්ෂිණගිර විහාරයෙහි වැඩවසන සේක. එසමයෙහි එනාහි කසිභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ කඹුරු වපුරන කාලයෙහි පන්සියයක් නඟුල් යොදනලද්දහු වෙත්.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පෙරව පාසිවුරු රැගෙන කසිභාරද්වාජ බමුණාගේ වැඩපළ යම් තැනෙක්හි ද එතන්හි හුදකලාවම එළඹිසේක. එසමයෙහි කසිභාරද්වාජ බමුණාගේ පරිවේෂනාව කෙවත් බත් බෙදා දී අනුභව කරවීම පවත්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනුභව කරන සථානයට වැඩිසේක. එළඹ එතත් පනෙක්හි වැඩහුන්සේක.

කසිභාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම භික්ෂාව පිණිස වැඩහුන් භාග්‍යවත්හු දුටුයේමය. දැක භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. ශ්‍රමණභවත් ගෞතමයන් වහන්ස, මම නම් සී සාන්නෙම් ද වෙමි, වපුරන්නෙම් ද වෙමි, සී සා වපුර ගෙන අනුභව කරමි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහනස, තුඹවහන්සේත් සීසානු මැනව, වපුරනු මැනව, සී සා වපුර ගෙන අනුභව කරනු මැනවයි කීයේය. බමුණ, මමත් සී සාන්නෙම් ද වෙමි, වපුරන්නෙම් ද වෙමි, සී සා ගෙන වපුර ගෙන අනුභව කෙරෙම් ද වෙමි යි වදළේය.

අපි භවත් ගෞතමයාගේ වියගහක් හෝ නඟුලක් හෝ සී වැලක් හෝ කෙව්විදණ්ඩක් හෝ ගවයන් හෝ නොම දකුම්හ. එතකුදුවුවත් භවත් ගගෞතමතෙම බමුණ, මමත් සාම්, වපුරමි, සා වපුර අනුභව කෙරෙමි යි මෙසේ කියයි. ඉක්බිති කසිභාරද්වාජ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ ගාථාවකිනුත් මෙසේ විවාළේය.

1 තුඹවහන්සේ කෂිකයෙකැයි නොවත් සී සාන්නෙකැයි ප්‍රතිඥා කරන්නෙහි ය. එහත් තුඹවහන්සේගේ යුගනඟුල් ආදි කෘෂිකර්මෝපකරණයක් අපි නොදකුම්හ. අප විසින් ප්‍රශ්න කරනලද්දේ ඒ කාරණය යි. අපි යම්සේ ඔබ්ගේ කෘෂිය දැන ගනුමැනවු ද, එපරිද්දෙන් කෘෂිකර්මෝප්කරණය වදුළ මැනව.

2 ශ්‍රද්ධා තොමෝ (මාගේ කෘෂිකර්මයෙහි) බීජවපනය වන්නීය, සීලය වීජෝත්පත්තියට හේතුවූ වර්ෂාජලය වන්නේය, මාගේ ඉඳුරන් ප්‍රඥාව හා මානීප්‍රඥාවත් විඥගන හා නඟුල වන්නේය. ලජ්ජා තොමෝ නඟුලිය වන්නීය. සිත වියබඳින වන්නේය. සිහිය මාගේ සිවැල හා කෙවිට වන්නේය.

3 මම ත්‍රිවිධ කායසුචරිතය ආරක්ෂා කෙළෙමි, චතුර්විධ වාක් සුචරිතය රැක්කේ වෙමි, ආහාරයෙහි නොඉහාත් සියුපසයෙහි හා උදරයෙහිත් පමණ දැන වළඳන්නෙක් වෙමි, සත්‍යයෙන් කෙලෙස් නමැති තෘණ කැපීම කරමි, අහිත් ඵලය මාගේ මිදීම වේ.

4 මාගේ වීර්‍යය ප්‍රඥ නමැති යුගනහුල් සංඛ්‍යාත ධුරය එසුලන්නේය. නිවනට අභිමුඛ කොට පමුණුවන්නේය. යම් තැනකට ගෙවත් නිවනට ඝොස් ඝඟාක නොගෙරේ ද, එ තැන දක්වා නොනැවතී යන්නේය.

5 මෙසේ මවිසින් ඒ මේ කෘෂිකර්මය කරනලද්දේය. ඒ කෘෂි තොමෝ අමෘතඵල ඇත්තීය. (යම් කිසිවෙක් මේ භීය කාන්නේ වේ ද, මහතෙම) මේ කෘෂිකර්මයෙන් සියලු දුකින් මිදෙන්නේ යයි වදළසේක.

ඉක්බිති කසිභාරද්වාජ බ්‍රාහ්මණ තෙම භාග්‍යවත් රන්තලියක ක්ෂීරපායාසය බහා භවත් ගෞතමයන්වහන්සේ පායාසය වළඳන සේක්වා, පින්වතුන්වහන්සේ කෂීක නම් වන සේක. යම් හෙයකින් භවත් ගෞතමයන් වහන්සේ අමාඵලයෙන් අවසන්වූ කෂීණය කරනසේක් යයි භාග්‍යවතුන් වහන්සේට පායාසය පිළිගැන්වීය.

6 බමුණ, මා විසින් හාථා ක්‍රියා ගුණවණීතා කොට ලබනලද ආහාරය නොවැළඳිය යුතුය. ආජීවපාරිශුද්ධිය දක්නාවූ බුදුවරයන්ගේ මේ චාරිත්‍ර ධර්මයෙක් නොවේ. බුදුවරයෝ හාථා ක්‍රියා ලබනලද භෝජනය ප්‍රතික්ෂේප කෙරෙත්, නොඉහාත් නොවළඳත්. බ්‍රාහ්මණය, ගුණධර්ම ඇතිකල්හි බුදුවරයනගේ මේ පැවැත්ම වේ.

7 සියලු ගුණයෙන් පිරුණාවූ මහර්ෂිවූ දුරුකරනලද කෙලෙස් ඇති සත්ත්වයන් කුකුස් ඇති රහතන් මේ ක්ෂීරපායාස යෙන් අන්‍යවූ ආහාරයෙන් හා පානයෙන් උපස්ථාන කරව, පින් කැමැත්තාහට එය පින්කෙතක් වන්නේය යි වදළසේක.

භවත් ගෞතමයන්වහන්ස, එසේ වී නම් මේ පායාසය කවරකුට දෙමිදැ යි විමසූලේය. බමුණ, මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත අවකාශ ලෝකයෙහි ද, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත සඳහලෝකයෙහි ද, තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ නමක් හෝ හැර යම්කු විසින් ඒ ක්ෂීරපායාසය වළඳනා ලද්දේ හොඳින් දිරවීමට යේ ද එබදු පුද්ගලයකු මම නොදක්නෙමි. බමුණ, එසේ වී නම් නුඹ ඒ පායාසය තණකොල හව නොගත් බිමක හෝ දමව, සතුන් නැති මිතුරක හෝ ඉල්පමා හරුව යි වදාළසේක.

ඉක්බිති කසිභාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ ඒ පායාසය සතුන් නැති වතුරෙහි ඉල්පමා හැරියේය. ඉක්බිති ඒ පායාසය වතුරෙහි බහාලන ලද්දේ විවි විට යන අනුකරණ ශබ්දය කෙරෙයි. විටි විට යන ශබ්දය කෙරෙයි. ඝාත්පසින්ම දුම් නගියි. අධිකව දුම් නගියි යම්සේ වනාහි දවල් මුළුල්ලෙහිම රත්වූ සිවැල ජලයෙහි බහාලනලද්දේ විවි විට-විටි විට යන ශබ්ද පවත්වන්නේ ද, ඝාත් පසින්ම දුම් නගින්නේ ද, අධිකව දුම් නගින්නේ ද, එපරිද්දෙන් ඒ පායාසය වතුරෙහි දමනලද්දේ විවි විට — විටි විට යන ශබ්ද පවත්වයි, ඝාත්පසින්ම දුම් නගියි, අධිසව ම දුම් නගියි.

ඉක්බිති කසිභාරද්වාජ බ්‍රාහ්මණ තෙම කල කිරුණු සිත් ඇත්තේ භවඝත් ලොව්දහැ හැඟුම් ඇත්තේ භාග්‍යවත්හු යම් කෙනෙක ද එතන්හි එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල හිසෙන් වැද වැටී භාග්‍යවතුන්වහන්සේට මෙය සැල කෙළේය.

භාග්‍යවතුන්වහන්ස, ඔබවහන්සේගේ දේශනාව ඉතා යහපත, භාග්‍යවතුන්වහන්ස, ඔබවහන්සේගේ දේශනාව ඉතා යහපත, භවත්ගෞතමයන්වහන්ස, යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නාක් මෙන් වැසූ දෙයක් විවෘත කරන්නාක් මෙන් මංමුළාවූවකුට මඟ කියන්නාක් මෙන් ඇස් ඇතිතැනැත්තෝ රූප දකිත්වා යි අඳුකාරයෙහි තෙල් පහනක් දල්වන්නාක් මෙන් භවත්ගෞතමයන්වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශකරන ලද්දේය. මේ මම භවත් ගෞතමයන් වහන්සේ ද, ධර්මය ද, භික්ෂුසංඝයා ද සරණ යමි, මම භවත් ගෞතමයන් වහන්සේ ළඟ පැවිද්ද ලබන්නෙමි, උපසම්පදාව ද ලබන්නෙමි යි සැලකෙළේය. (එසේම) කසිභාරද්වාජ බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ලැබීය, උපසම්පදාව ද ලැබීය.

උපසම්පදවූ තොබෝකල් ඇති කසිභාරද්වාජ බ්‍රාහ්මණ තෙම කායවිඤ්ඤත්තියෙන් හා විත්තවිඤ්ඤත්තියන්ද යුක්තවූයේ අප්‍රමාදවූයේ මකලෙසුන් තවත විඤ්ඤ ඇත්තේ කාය ජීවිත දෙක්හි නිරපේක්ෂ කව වාසය කරන්නේ තොබෝකලකින්ම යම් අගිත්ඵලයක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගෘහවාසයෙන් නික්ම සසුන් ගත වෙත් ද මෙවත් පැවිදි වෙත් ද, ඒ උතුම්වූ මාඝීබ්‍රහ්මචර්‍යාව කෙළවර කොට ඇති අගිත්ඵලය මේ ආත්මභාවයෙහි තෙමේම ප්‍රඥාවක්ෂුසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කෙළේය. පුනරුත්පත්තිය නැති කෙළේය. බඹසරවස් පුරා අවසන් කෙළේය. සතරමාඝී යෙන් කළ යුතු කටයුතු කෙළේය. මේ ආත්මයෙහි කෙලෙසුන් දුරුකිරීම පිණිස වැඩිය යුතු අනික් මාඝීභාවකෘත්‍යක් නැත්තේය යි ප්‍රත්‍යවේක්ෂාඥාන වශයෙන් දැනගත්තේය. ආයුෂ්මත් භාරද්වාජ සථවිරයන් වහන්සේ වනාහි මහරහතුන් වහන්සේලා අතුරෙන් එක්තරා මහරහත් තමක් වූසේක.

කසිභාරද්වාජ සූත්‍රයෙහි සිංහලානුවාදය නිමි

දහම් විසතර

මේ සූත්‍රයෙහි සඳහන්වූ දක්ඛිණාගිරිය වනාහි රජගහනුවර සව කොට පිහිටි එක්තරා පර්වතයෙකි. මේ ප්‍රදේශයටත් මේ පර්වත නාමය ප්‍රධාන කරගෙන දකඛිණාගිරි ජනපද යයි කියත්. මෙහි පිහිටි විහාරයටත් දක්ඛිණාගිරි විහාරය යි කියනු ලැබේ. එකනාලා යනු බමුණුගමට ව්‍යවහාර කරන නාමයකි. මෙහි මබාහෝ බමුණන් වාසය කළ හෙයින් බමුණන්ගේ නිවාදගමක් හැටියට මෙය සලකනු ලැබේ.

කසිභාරද්වාජ බමුණ රහත්භාවට උපනිශ්‍රය ඇත්තකු බව දත් සර්ව්‍වඥයන් වහන්සේ ඔහුගේ ඉන්ද්‍රියපරිපාකය හෙවත් ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ මේරීම් අවස්ථාව දක්වා මේ එකනාලා නම් බමුණු ගම් දක්ඛිණාගිරි විහාරයෙහි වැඩ වාසය කළසේක. මොහුගේ මාතෘගය වනාහි බ්‍රාහ්මණයන් අතර ඉතා උසස් වංශයෙන් සලකනු ලබන භාරද්වාජ ගොත්‍රය යි. කෘෂිකර්මයෙන් හෙවත් කුඹුරු මොහිතැනින් ජීවත්වන හෙයින් කසිභාරද්වාජ යයි ව්‍යවහාර කරනු ලැබේ.

භාග්‍යවතුන් වහන්සේ මේ බමුණ හමුවීමට වැඩියේ ඔහුගේ මිතෘවප්මගුල් දිනයෙහිය. කලල වප්පය, පංසු වප්ප යයි වප් දෙකකි. කලල වප්ප නම් මඩ කුඹුරු වැපිරීමයි, හෙවත් කුඹුරු

සහ මිඩ සොව පෝරු හා වැපිරීමයි. පංසුවප්ප නම් පුරන් කුඹුරු මිඩ කොකොව සා වී ඉස නැවිතත් සා වැඩ කිරීම යි. මේ වපට කැකුලන් ඉසීම යයි ද කියනු ලැබේ. සසිහාරද්‍රාජ බමුණාගේ වප්පය ද කැකුලමට වැපිරීම විය.

මෙහි හොන්නු තුන්දහසක් වූහ. නහුල් අඩුවැඩි නැතිව පන්සියයක් යොදා ඇත. හොන්නුන්ගේ අංවලව රත්රනින් සැදූ කොපු ද, රිදියෙන් කුර මකොපු ද වූහ. සියලු විභූහයෝ ජව බල සම්පන්නයහ. ඉතා ලක්ෂණයහ. නානා වණී ඇතියහ

හොසියෝ ද පන්සියයකි. සියල්ලෝම සුදු වස්ත්‍රයෙන් හා මල්මාලාවලින් ද සැරසී සිටියහ. එක හොන්නුවකව නහුල් දහස දහස බැගින් පිළිවෙළින් හමින් කරන්ව සැදුණේය. පළමු නහුලෙහි හොන්නු අව දෙනෙකි. දෙවෙනි තුන්වෙනි නහුල්වල සතර සතර දෙනා බැගින් යෙදූහ. සෙසු හවයන් වරින් වර මාරු කරන්ට සුදුනම් කරගෙන සිටි හරක්ය. එක එක හොම්මුවක නොහොත් කට්ටියක එක එක බිත්තර වී පිරූ ගැලක් පසුපස් හෙහි හමින් කරන්ව යොදා තිබුණේය.

එහි ඇතමෙක් සි සැනි. ඇතෙමක් වපුරති. කසිහාරද්‍රාජ් උදැසනම රුවුල කපා ස්නානය කොට සිරුරෙහි සුවඳ ගල්වා පන්සියයක් අඟනා වස්ත්‍රයක් හැඳ දහසක් අඟනා වස්ත්‍රයක් එකාංශ කොට පොරවා එක් එක් ඇඟිල්ලක රන් මුදු දෙක දෙක බැගින් ඇඟිලි මුදු විශ්සක් ද, දෙකනෙහි රන් කුණ්ඩලාභරණ ද, හිසේ අඟනා හිස්වේළුමක් ද, කරෙහි රන්මාලයක් ද බැඳ බමුණන් සමූහයක් පිරිවරාගෙන කවයුතු සංවිධානය කෙරෙමින් සැසිරෙයි.

මොහුගේ බැමිණියද සියඳුණන් හාජනවල කිරිබත් පුරවා ගෙන ගැල්වල පවවාගෙන සුවදපැනින් නා අඟනා ලක්ෂණ ආභරණවලින් සැරසී බොහෝ බැමිණියන් පිරිවරා එතැනට පැමිණියාය. බමුණාගේ ගෙය ද සුවද පිරිබඩ ගන්වා මලොලොඹු ඵල්වා සරසා තිබුණේය. පිරිවර කම්කරුවන් සහිතව එහි රැස්වූ සේනාව දෙදහසකට අධික විය. මෙහි රැස්වූ සියල්ලන්වම කිරිබත් පිළිගැලූ වී තිබුණේය.

මේ වේලාවේ දී බමුණා තමන්ගේ රන්තළිය සෝදා එහි පායා සහ පුරවා කිතෙල් උක්සකුරු මිපැනි ආදියෙන් සකස් කොට කඩඟලබලිකම් නමැවූ දේවපූජාව පළමුකොට කරවීය. බැමිණිය ද රන් රිදී කස් ලොහොං තඹ යකඩ ලෝහවර්ගවලින් කළ නානාවිධ

භාජකයන් හෙන්වාගෙන රන් සැන්දෙන් බෙද බෙදා පන්සියයක් ගොසියන් වළඳවමින් සිටියා ය. බමුණා ද බලිපූජා කොට අහසා මිරිවැඩි සඟළක් දමාගෙන රන් සැරයටිය අතින් ගෙන මෙතැනට කිරිබත්, මෙතනට ගිතෙල්, මෙතනට සක්කරා බෙදව යි විධාන කෙරෙමින් හැසිරෙයි.

මේ කල්හි භාග්‍යවතුන් වහන්සේ දක්ෂිණාගිරි විහාරයෙහි ගඳකිළියෙහි වැඩහුන්සේක් බමුණාගේ ඇඟිල්කයිය මෙලෙසින් පවත්නා බව දැන වදුරා කසිභාරද්වාජ බමුණා රහත්වීමට උපනිශ්‍රය ඇත්තකු බවත්, මා මෙහි පැමිණි කල කථාවක් ඇතිවන බවත්, මොහු උපදවන කථාවසානයෙහි මාගේ ධර්මදේශනාව අසා පැවිදිව රහත් වන බවත්, දැන වදුරා ඔහු නිවන් දක්වන්නට මේ සුදුසු කාලය යි සිවුරු හැඳ පෙරව පාත්‍රය අතින් ගෙන අතුත්තර පුරිසදම්මසාරථියකු මෙන් (උතුම්වූ පුරුෂයන් හික්මවීමෙහි දක්ෂ බුදුගුණය ඇත්තකු මෙන්) දක්ෂිණගිරි විහාරයෙන් පිටත් ව එතැනට වැඩිසේක.

භාග්‍යවතුන් වහන්සේ කැමෙති තිස්සව පැමිණෙන සිහන්තකු මෙන් මෙතැනට නොඑළඹියහ. දෙදහසක් පමණවූ ශාක්‍ය කොලිය දෙනුවර වැසි රාජ රාජමහාමාත්‍යාදිහු භාග්‍යවතුන් වහන්සේගේ නෑදෑයෝ ය. ඔවුන්ට තම තමන්ගේ පොහොසත් කම්වලින් දවසක් පාසා වුවත් දන් දිය හැක්කේය. භාග්‍යවතුන් වහන්සේ බත් පිණිස පැවිදි නොවූසේක. එසේ ද වුවත් පස්මහා පරිත්‍යාගයන් කෙරෙමින් පෙරුම් පුරා බුදුවූයේ තමන්වහන්සේත් කෙලෙසුන් කෙරෙන් මිදී ලෝකයාත් කෙලෙසුන්ගෙන් මිදවීමටය. තමන්වහන්සේත් දුකෙන් මිදී ලෝකයාත් දුකෙන් මිදවීමටය. එහෙයින් කසිභාරද්වාජ බමුණා නිවන් දක්වනු සඳහා මෙසේ වැඩිසේක.

එසේ වැඩිය භාග්‍යවතුන්වහන්සේ බමුණාව පෙනෙන සේ උස්වූ තිවංක සවනක්ඛන බුදුරැස් විහිදුවමින් වැඩහුන්සේක. බොජ්ඣන්කිස නිමවූ මිනිස්සු ශරීරකානතියෙන් දිලිහෙන බුදුන් දැක ප්‍රීතිමත්ව ඉක්මනින් අත්පා සෝදාගෙන එතැනට පැමිණ දෙගොඩ බුදුන් දී ඇදිලි බැඳගෙන සිටියාහුය.

කසිභාරද්වාජ බ්‍රාහ්මණ තෙම පිබිදි සිහා වැඩමවූ බුදුන් දැක ශ්‍රමණය, මම සී සාණ්, වපුරමි, සී සා වපුරාගෙන කමි, ඔබත් සිසා වපුව ගෙන අනුභව කරව යි කීයේ අප්‍රසාදයෙනි, එය නම් කිරිබත් සැන්දක් දෙන්ට ඇති. ලෝභකම් හෝ මසුරුකමක් නිසා

නොව එකැනට වැඩමවූ බුදුන් දැකිමට ආසාවෙන් වැඩ නැවැත්වූ පිරිස දැක මාගේ වැඩ නැතිකරන්ට ආ සතුරෙක යැයි අදහසිනි.

භාග්‍යවතුන්වහන්සේ ද බමුණ, මමත් සිසාම්, වපුරම්, සා වපුරා අනුභව කෙරෙමි යි වදාළසේක. එවිට තමන්වහන්සේත් කෘෂිකයෙක් වෙමි යි වදාළ වචනයට සතුටුවූ කසිභාරද්වාජ එසේ නම් දැන් අප නොදක්නා ඔබගේ නියට ගන්නා නඟුල් කෙවිටි ආදි උපකරණ කොහි දැයි විචාළේය.

එකෙසින් බමුණා ප්‍රශ්න කළ ගාථාව මෙසේ යි.

කස්සකෝ පටිජානාසි න ච පස්සාම තෙ කසිං
කසිං නෝ පුච්ඡිතෝ බ්‍රූහි යථා ජානෙමු තෙ කසිං යන්‍ති.

එයට පිළිතුරු වශයෙන් බුදුහු "සද්ධාබීජං තපෝ වුට්ඨි" යනාදි ගාථාවලින් පිළිතුරු දුන්සේක. බමුණාගේ ප්‍රශ්නය කෘෂි භාණ්ඩයන් හා කෘෂිකර්මයන් ඕනෑ කරන්නේ කුඹුරු වැපිරීමෙන් අස්වැන්නක් ලබාගනු සඳහාය. ගොවිහු බිත්තර වියක් තැනිකලට කුඹුරු නොවපුරති. කෘෂිකර්මයෙහි දක්ෂතාවය ඇති ගොවිහු තමන් ළඟ තිබෙන බිත්තරවීවල ප්‍රමාණයට කුඹුරු වපුරති. අඩුව හෝ වැඩිව හෝ නොසැති. කෘෂිකර්මයෙහි ප්‍රධාන ප්‍රයෝජනය එයම වෙසින් බමුණා විසින් ප්‍රශ්නයට නොගත් ඒ ප්‍රධාන කාරණය පළමුකොට පෙන්වාදීම බුදුවරයන්ගේ ප්‍රශ්න විසර්ජනා කුශලතාවය වෙවත් ප්‍රශ්න විසඳීමෙහි දක්ෂබව වෙසින් ශ්‍රද්ධාව වියට උපමා කෙරෙමින් මෙසේ පිළිතුරු දුන්බව දතයුතුයි.

එවෙසින් මේ ශාසනක්ෂෙත්‍රයෙහි ශ්‍රද්ධාව බිත්තර විය වශයෙන් සැලකිය යුතුයි. කුඹුරක් සා වී වපුල ද වැසි නැතිකල මැරෙයි. ගොයම් ඇටුඹුත් මැලවෙයි. පුණ්‍යක්ෂෙත්‍රයෙහි තපෝ කාමයෙන් දක්වන ඉන්ද්‍රිය සංවරසීලය වැසිදියට සමාන වේ සිල තමැති වර්ෂාජලයෙන් වැඩෙන ශ්‍රද්ධා තමැති කුශලවීජය මාර්ග ඵල නිර්වාණ තමැති ලෝකොත්තර අස්වැන්න ලබාදෙන වෙයිනි.

හේ කෙසේදයත්?

අද තමතමන්ගේ සිත්සතන්හි උපදනා සද්ධින්ද්‍රිය ආදි කුසල් බිජුවට සමරුකල ශ්‍රද්ධා නාමයෙන් කියන සෝවාන් මාර්ගය හා ඵලය, සකෘදාගාමි මාර්ගය හා ඵලය, අනාගාමි මාර්ගය හා ඵලය, අර්හත් මාර්ගය හා ඵලය යන මේ නම්වලින් පැසීමට පැමිණෙයි. මේ මාර්ගඵලවලට අරමුණු වන්නේ නිර්වනය. එවෙසින් සද්ධින්ද්‍රිය ආදි ධර්මපඤ්චකය විමුක්ති පරිපාවනීය වෙවත් නිර්වන් මෝරවන ධර්මය යි කියනු ලැබේ.

මෙහි ප්‍රඥාව මේ ලොකොත්තර ධර්මතාවෙහි හියට විය හා සඟුල වැන්නීය. මේ ප්‍රඥාව කාමාවචරාදි වශයෙන් තොයෙක් ප්‍රකාර වූවද මෙහි විදර්ශනා සඟිතවූ මාර්ගප්‍රඥාවම කියනලදි.

මෙහි ශික්ෂි නාමයෙන් දක්වන ලජ්ජාව නඟුලිස වෙයි. අකුසල් කිරීමට උපදනා පිළිකුල්ගතිය ලජ්ජාව යි. ලජ්ජාව සඳහන් කිරීමෙන් ම භය ද ගැනෙයි. හිරිඔතප් දෙක ඔවුනොවුන් එක්ව පවත්නා එකිනෙකට සම්බන්ධවූ ධර්ම තෙයිනි. මේබඳු ධර්ම කුසල් ඇදුත්තක් වනු තෙයින් යුගනද්ධ යයි කියනු ලැබේ.

මෙහි මනෝ නාමයෙන් දක්වන සිත යොතක් හා සමාන වේ. මේ පදයෙන් ගැනෙන්නේ සිත හා එක්ව යෙදෙන සමාධියයි. බමුණාගේ කෘෂියෙහි යොදන රැහැනින් වියනගුල් හා හරකුන් එකාබද්ධ කෙරෙයි. ශාසනකෘෂිත්‍ර කෘෂියෙහි එයදෙන සමාධි නමැති යොත ප්‍රඥා නමැති වියනගුල් හා කායික චෛතසික වීර්‍ය්‍ය නමැති ගවයන් බඳින වියබාන් වැනි වේ.

මෙහි සති නාමයෙන් දක්වන සිඟිය සිවැල හා කෙව්ව ද වැනි වෙයි. හිවැල එනම්— නඟුලේ යට පැත්තේ අල්ලා තිබෙන යකඩ තහඩුව නඟුල ආරක්ෂා කෙරෙයි. එසේම තොපැකිල ඉදිරියෙහි ගමන් කෙරෙයි. කෙව්ව ගවයන් තොමඟට යන්ට ඉඩ තොදෙමින් කම්මැලි වෙන්ට ඉඩ තොදෙමින් ආරක්ෂා කෙරෙයි.

භාග්‍යවතුන්වහන්සේගේ විදර්ශනා සම්ප්‍රයුක්තවූ ද මාර්ගසම්ප්‍ර-යුක්තවූ ද සිඟිය බමුණාගේ හිවැල හා කෙව්ව මෙනැ යි දතයුතු. හිවැල නඟුල ද ආරක්ෂා කෙරෙමින් තොපැකිල යන්නාක් මෙන් සිඟියත් කුසලයන්ගේ පැවැත්ම කෙසේ දැයි පරීක්ෂා කෙරෙමින් එක්ම අරමුණෙක්හි යොදවමින් ප්‍රඥා නමැති නඟුල ආරක්ෂා කෙරෙයි.

කෙව්ව ද හරකුන්ව ඔය උපදවමින් මැලිකම් කරන්ට ඉඩ තොදෙමින් නියම මාර්ගයෙහි හමින් කිරීමට සලස්වා ද එමෙන් සිඟිය ද සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය නමැති හරකුන්ව අපායභය දක්වමින් කුසිත බැවින් පසුබැසීමට ඉඩ තොදෙයි. පස්කම් නමැති අගෝචරයෙහි හැසිරීම වළක්වා කම්සථානයන්හි යොදමින් තොමඟ ගමන්කිරීම වළක්වයි. එහෙයින් සති මෙථාලපාවනං යි වදළහ. ඛාණෙගුතෙනා යන්තෙන් ත්‍රිවිධ කායදුච්චරිතයෙන්

වැලකී කායසුචරිතය පිරීමෙන් කායද්වාරය ආරක්ෂා කිරීම ද, වචීසුචරිතා යන්නෙන් චතුර්විධ වාක්සුචරිතයෙන් වැලකී වාක්සුචරිතය පිරීමෙන් වාක්ද්වාරය ආරක්ෂා කිරීමත් දක්වීමෙන් ප්‍රාතිමෝක්ෂ සංවරශීලය ප්‍රකාශ කරනලදි. ආහාරෙ උදරෙ යනා යන මෙහි ආහාර නාමයෙන් සියුපසඟම ගැනෙන බැවින් සතරපසයෙහි ම ප්‍රත්‍යවේක්ෂාඥනය ඉපදවීමෙන් ප්‍රත්‍යය-සන්නිශ්‍රිත ශීලය දක්වනලදි. එසේම උදර නම්වූ කුක්ෂියට ගත් බාදු හොඳු දි චතුර්විධ ආහාරයෙහි පමණ දැන වැළඳීම යයි කියනලද හොජනමාත්‍රඥතායෙන් ආජීවපාරිශුද්ධි ශීලය දක්වයි.

බමුණ, නුඹ වි වපුව කුඹුරෙහි ආරක්ෂාව පිණිස වැව බැඳ තබන්නාක් මෙන් මම ද ශාසනක්ෂෙත්‍රයෙහි ශ්‍රද්ධා නමැති කුසල් බීජුවව වපුරා නානාප්‍රකාරවූ කුශලධර්මයන්ගේ ආරක්ෂාව පිණිස කායද්වාර සංවරය, වාක්ද්වාර සංවරය, ආහාරමාත්‍රඥතාවය යන වැටවල් තුනක් බැඳීමෙන් රාගාදි අකුසල් නමැති එලඟරකුන් මිඟරකුන් ආදීන්ව වදින්ව ඉඩ නොදෙමින් කුශලශස්‍යය විනාශ වන්ව ඉඩ නොහරිමි හි දක්වූ අයුරැයි.

සවවං කතරාමි නිඤ්ඡනං යන්නෙන් කායවාක් ද්වාර දෙක්හිම යෙදෙන වාක්සත්‍යයෙන් රාගාදි කෙලෙස් නමැති තණකොළ පැලෑටි කපාහැරීම දක්වයි. අසත්‍යය කායද්වාර වාක්ද්වාර දෙකෙන්ම ප්‍රකාශ කළ හැකිය කායද්වාරයෙන් සිදුවන අසත්‍යය නම් — තමන් විරද කළ බව දැන දැනම එය විචාරද්දීත් කිසිවගක් නොදන්නකු මෙන් කථා නොකොට තූෂ්ණීම්භූතව සිටීමත්, අමූලික අසත්‍ය දේ ප්‍රවෘත්ති පත්‍රිකාගීයෙන් හෝ ලියකියවිලි වලින් හෝ පත්‍රිකාවලින් හෝ ලියා ප්‍රසිද්ධ කිරීමත් යන මෙබඳු අවස්ථාය.

බමුණ, නුඹ කුඹුර සා වපුව එහි හොයම්වලට බාධා කරන පැලෑටි ආදිය කපන්නාක් මෙන් මම ද යථාභූතඥන නමැති සත්‍යයෙන් මෙවත් සංස්කාර ධර්මයන් පිළිබඳ නියම තත්ත්‍ව පරිදි සැලකීමෙන් ආත්මදෘෂ්ටි නමැති තෘණාදීන් කපාදැමූ බව ප්‍රකාශ කෙරෙයි.

සොරච්චං මම පවමාවනං යන්නෙන් නිවන කෙරෙහි ඇලීම යයි කියනුලබන සොරච්චයෙන් ඒයන් නමැති ගවයන් මුදහැරීම දක්වයි.

බමුණ, නුඹ හැමට යෙදූ ගවයන් එදින වැඩගත හමුදහරින නමුත් ඔවුන් දෙවෙනි තුන්වෙනි දවස්වල ඉහ් නැතහොත් ලබන වර්ෂයේ හෝ නැවතත් කඹුරු වැපිරීමට ගොදුරුන්නේය. එහෙයින් නුඹ එසිහා නොමිදුණෙහි ග.

මම වනාහි දිවකුරු බුදුන්ගේ කාලයෙහි පවත් නුවණ නමැති නහුලෙහි වීර්‍ය්‍ය නමැති ඔවයන් යොදා, සාරාසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි ලොකුම තියක් හාමින් සිට බුදුවීම දක්වා එම තිය අත් නොහළ නමුත් යම් දවසක මාරපරාජය කොට අර්හත්ඵලය ලැබූ යෙම් ද, හෙවත් බුදුවූයෙම් ද, එකල්හි මම බුද්ධත්වය සඳහා යෙදූ සියලු උත්සාහයන් සංසිඳවීම් වශයෙන් වීර්‍ය්‍ය නමැති බලිවර්දයන් හෙවත් හරකුන් නැවත නොගන්නාව ම මුදුහළ බව ප්‍රකාශ කෙරෙයි. සොරවචස සුරත බව යන මෙයින් සාමාන්‍යයෙන් සිලය කියවෙතත් මෙහි සොරවච නාමයෙන් කියවෙන්නේ අර්හත්ඵලය බව දතයුතු.

විදිසං මෙ ධුරධොරයහං යනුවෙන් ප්‍රඥා නමැති ධුතහතුල් සංඛ්‍යාත ධුරය උසුලන්නේ තමන්වහන්සේගේ කායිකවීර්‍ය්‍යය හා චෛතසික වීර්‍ය්‍යයන් බව ප්‍රකාශ කෙරෙයි.

බමුණ නුඹ එක එක නහුලෙක හොනුන් සත් සත් දෙනා බැගින් වියෙහි බැඳ තණ මුල් පැලෑටි උදුරමින් සිසා ඝඤ්ඤමපතතිය ඇති කරේද, එසේම මමත් නුපන් අකුසල් නොඋපදවන උපන් අකුසල් දුරු කරන, නුපන් කුසල් උපදවන, උපන් කුසල් දිගුණු කරන, සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය නමැති ධුරය උසුලමින් අකුසල් හා අකුසල් මුල් සිදිමින් කුශලඝන්‍ය සම්පත්තිය සමෘද්ධ කරගත් බව දැන්වූ අයුරැයි

සොඝකෙඛමාධිවාහනං යනු එසේම මාගේ වීර්‍ය්‍යය යොඝ කෙඛම නම්වූ නිර්‍වාණයට අභිමුඛ කොටම පමුණුවයි.

බමුණ, වීය උසුලාගෙන නගුල ගෙන යන නුඹේ ගවයන් කුඹුරේ කෙළවරට පැමිණ නවතින්නාක් මෙන් මාගේ ඒ වීර්‍ය්‍යය දිපංකර බුද්ධකාලයෙහි පටන් නොනැවතම අවුත් කැපූ තණ කොල නැවත පැළවෙන්නාක් මෙන් නොව ඒ ඒ මාර්ගඥානයෙන් දුරුකළ කෙලෙසුන් නැවත නුපදනා ලෙසින්ම දුරු කෙරෙමින් යම් නැනකට පැමිණි කල ශොකය දුරු වේ ද ඒ නිවන කරාම ගවන් කෙරෙයි.

එහෙයින් ගච්ඡති අනිවත්තනතනං යත්ථ ගන්ත්වා න ශොචති යනු වදළහ.

මෙහි නිගමනය නම් මේ බුද්ධශාසන නමැති ක්ෂේත්‍රයෙහි මෙසින් හාකලද තිය මෙසේයි.

ශ්‍රද්ධෙන්ද්‍රිය නමැති කුසල් බීජුවට සිල නැමති වැස්සෙන් අනුග්‍රහලැබ ප්‍රඥානමැති විය හා නහුලත් ලජ්ජානමැති නහුලිහත් සමාධි නමැති රැහැනින් එක්කාබද්ධ කොට ඒ ප්‍රඥා නමැති

කහුලෙහි සිහිය තබාගනී සිවුල සම්පූර්ණ වශයෙන් එසේම ඒ සිහිය තබාගනී කෙවිට ද ඉතා කායඋජුභාවයෙන්, චිත්තඋජුභාවයෙන්, හොඳින්-මාත්‍රඥතා යන වැටවල් තුනකින් රැකවල් කොට සත්‍ය වචන තබාගනී දැයෙන් ඉවත් දුකෘත්වයන් කෙලෙස් නැති කෘෂ පැලැටි කපා වියළී නැති විය උසුලා සොරවම නැති අහීන්ඵල විමුක්තියෙන් සංසාරඅයෝගය ඉවත් සංසාරබන්ධනය දුරු කොට මේ සේ හිවන කරා නොකැවතී ගෙන ගිය මාගේ මේ කෘෂිය හෙවත් හිය සතරමඟ සතරඵල නැති නිවන් අස්වැන්න ලැබී මෙන් කෙළවර විය.

මෙසේ මේ හිය කාන්ත යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසක උපාසිකාවක් හෝ වේ නම් ඔවුහු සසර දුකින් මිදෙන් යයි නිවන් අවසන් කොට රහත්බව කුළුගන්වමින් මේ ධර්මදේශනාව නිමවා වදාළසේක.

එහෙයින්

එව මෙසා සෂි සථා සා හොති අමනපථලා

එතං සූසිං සෂිථාන සබබදුකඛා පමුච්චති යි වදාළහ.

ඉක්බිති භාරද්වාජ බ්‍රාහ්මණයා හැඬිරුවූ අපි ඇති මේ දේශනාව අසා පැහැදී ප්‍රසාදය පෙන්වීම පිණිස ක්ෂීරපායාසය භාග්‍යවතුන්වහන්සේට පිළිගැන්වීය. බුදුහු අකැප හෙයින් නොපිළිගත්හ. ගාථා කියා ලබාගත් භෝජනය නුසුදුසුබව දක්වනු පිණිස ගාථාභිගීතං මේ අනර්හාජනෙය්‍යං යි වදාළහ. උදෑසනම අවුත් කුඹුරලඟ සිට තමන්ගේ ඇතිතාක් ගුණ කියා ලබන ආහාරය නුවණින් යි කියා ක්‍රීඩා කොට ලබන අහාරයක් වැනිය. එබඳු ආහාරය බුදුවරයන්ට කැප නොවේ

මෙය තවත් විස්තර කරනොත්—පළමු කොට බුදුන් දැකීමේදී අප්‍රසන්නවූ බමුණා කිසිවක් නොදෙනු කැමැත්තෙන් සිට ගාථා වලින් බණ කියා දෙනු කැමත්තකු කොට බුදුහු පායාසය පිළිගත්හ. බමුණාට ධර්මදේශනා කොළේ ආමිසය පිණිස යයි කියන ලෝකයාගේ අපවාද කථාවලින් තමන් වහන්සේ මිදෙනු පිණිසත් බුදුවරයන්ගේ චාරිත්‍රධර්මය ආජීවපාරිශුද්ධිය බව දක්වනු පිණිසත්ය.

එහෙයින්

ධම්මෙන සඛී බ්‍රාහ්මණ වුත්තෝ රෙසා යතු වදාළහ.

එකල බමුණා බුදුහු මාණ්ඩ පායාසය ප්‍රතිග්‍රහණය කළසේක. මේ භෝජනය තමන් වහන්සේට අකැප යයි කියති. මම අවාසනා

වන්නෙක් වුයෙමි. මව දුතයක් දී හන්ව වත් නොලැබුණේ යයි සිත අමනාපකොටගෙන අනික් ප්‍රතිග්‍රාහකයකුවත් පිළිගතහොත් මැනව යි කැවත සිතුයේය.

භාග්‍යවතුන්වහන්සේ බමුණාගේ අදහස දන වදාරා මේ පිඩුසිඟන කාලය සලකා මේපමණ වේලාවකින් බණ කියා බමුණා පහදවන්නෙමි යි පැමිණියෙමි. දැන් ඔහුගේ පාෂාණය නොපිළිගත් හෙයින් සිත තරක් විය. තවදුරවත් මා කෙරෙහි ඔහුගේ අප්‍රසාදය දියුණුවුයේ නම් නිවීණවබොධයට එය බාධාවක් විය හැකිය යි. සලකා වදාරා කැවත පැහැදීම උපදවනු පිණිස බමුණ, සුඛ රහතන්වහන්සේලාට ක්ෂීරපායාසයෙන් අන්‍යවූ යම් යම් ආහාර පාන වර්ගයකින් සංග්‍රහ කරව, එය පින් කැමැත්තකුව උතුම් පින් කෙතක් වේ යයි වදාළහ.

එහෙයින්

අසෙඛස්ස ච සෙවලිනං මහෙසිං විණෂවං කුහාකුවවචූපසමනං-අන්නෙන පානෙන උපට්ඨහයසු බෙත්තං හි නං පුඤඤපෙඛස්ස හොති යනු වදාළහ.

බමුණුතෙම එසේ වී නම් ස්වාමීනි, මේ පායාසය කවරකුට පිරිනැමීම දැ යි විමසේය. එයට පිළිතුරු දෙන භාග්‍යවතුන් වහන්සේ තථාගතවූ හෝ තථාගත ශ්‍රාවක වූ හෝ නමක් හැර දෙවියන් සහිත ලෝකයෙහි මෙය පිළිගැනීමට සුදුස්සෙක් පිළි ගෙන වළඳා දිරවීමට ශක්තිය ඇත්තෙක් නැත්තේය. එයට හේතු කවරේද යත්? බමුණා බුදුරජාණන්වහන්සේට මේ පායාසය පිළිගන්වන්ට සුදුනම් වන විටම දෙවියෝ දිව්‍යඕජස් බහාලූහ. බුදුවන දවස සුජාතා දේවියගේ කිරිපිඬු දුනයටත් පිරිනිවන්පාන අවසථායෙහි චුන්දකම්මාරපුත්‍රයාගේ සූකරමද්දවයටත් යන ආදි මෙබඳු අවසථාවන්හි දෙවියෝ දිව්‍යඕජස් හෙවත් ඔවුන්ගේ දිව්‍යරසය බහාලූහ. මෙවියන්හට වනාහී මිනිසුන් කන බොන ආහාර නොදිරවයි. මිනිසුන්ට දෙවියන්ගේ ආහාර නොදිරවිය හැකිය. තථාගතයන්වහන්සේට වනාහී ප්‍රකෘති ශරීරයෙන්ම දිරවිය හැකිය. දශවිධ කායබලය ඇති හෙයිනි. රහතන්වහන්සේලාට පමණ දුන වැළඳුවොත් සමාධි බලයෙන් දිරවා ගත හැනිය. අනික් කෙනකුට නොහැකිය. මෙසේ වදාළේ එහෙයිනි.

එහෙයින් මේ පායාසය තණකොළ නොහැදුණ බිමක හෝ සතුන් නැති දියක හෝ දමව යි වදාළසේක. එසේ කළ කල්හි

බමුණාව දකින්ට ලැබුණේ ත්‍රාසජනක සිදුවීමෙකි. එනම් එසේ දැමූ පායාසය ශබ්ද කගමින් පුපුරන්ට පිමත් පුපුර පුපුරා දුම් නගින්ට පිමත්ය.

මෙය මෙසේ වූයේ ජලයෙහි හෝ පායාසයෙහි හෝ ඇති අමුත්තක් නිසාවත් බමුණාගේ හෝ අන්කිසි දේව යක්‍ෂාදීන්ගේ හෝ ආනුභාවයක් නිසාවත් නොව කසීභාරද්වාජ බ්‍රාහ්මණයාට ධර්මසංවේගය ඇතිකරවනු සඳහා බුද්ධානුභාවයෙන් සිදුවූවකි.

මෙය දුකිමෙන් සංවේගයට පැමිණි කසීභාරද්වාජ බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේට "සාධු සාධු හොගොතම" යනු වෙන් භවත් ගෞතමයන් වහන්ස, යහපත යහපතැ යි ප්‍රශංසා කොට සරණ ගතව එයින් නොබැවති පැවිදි උපසම්පදා ද ලැබ භාවනා කොට රහත් විය. භාරද්වාජ තෙරුන් වහන්සේය යි මහරහතන් වහන්සේලා අතර ප්‍රකට නමක් ද විය.

කසීභාරද්වාජ සූත්‍රයෙහි දහම් විස්තරය නිමි.

සච්චවිභඩග සුත්තං

එවං මේ සුතං එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ, තත්‍රඛෝ භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතොපච්චස්සොසුං, භගවා එතදවොච.

තථාගතෙන භික්ඛවෙ අරහතා සම්මාසම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පති වත්තියං සමණෙනවා බ්‍රාහ්මණෙන වා, දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං, යදිදං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.

කතමෙසං චතුන්නං? දුක්ඛස්ස අරියසච්චස්ස, ආචික්ඛනා —පෙ— දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස, ආචික්ඛනා —පෙ— දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස, ආචික්ඛනා —පෙ— දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චස්ස, ආචික්ඛනා —පෙ—

තථාගතෙන භික්ඛවෙ අරහතා සම්මාසම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං, සමණෙන වා බ්‍රාහ්මණෙන වා, දෙවෙන වා මාරෙන වා

බ්‍රහ්මුනා වා කෙනචි වා ලෝකසම්මිං, යදිදං ඉමෙසං චතුන්නං අරිය සච්චානං ආවිකම්මනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං, —පෙ—

සෙවෙථ භික්ඛවේ සාරිපුත්තසමොගඝලලාභෙ, භජථ භික්ඛවෙ සාරිපුත්තමොගඝලලභෙ, පණ්ඩිතා භික්ඛු අනුග්ඝාහකා බ්‍රහ්මචාරිකං, සෙය්‍යථාපි භික්ඛවෙ ජනෙත්‍රි එවං සාරිපුත්තෙනා, සෙය්‍යථාපි ජාතස්ස ආපාදෙතා එවං මොග්ඝලලානෙනා, සාරිපුත්තෙනා භික්ඛවේ සොතාපත්තිඵලෙ විනෙති, මොග්ඝලලානෙනා උත්තමත්ථෙ විනෙති, සාරිපුත්තෙනා භික්ඛවේ පඤ්ඤාති චත්තාරි අරියසච්චානි ඉත්ථාරෙන ආවිකාතුං දෙසෙතුං පඤ්ඤපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුන්ති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

තත්‍රඛා ආයස්මා සාරිපුත්තෙනා අචිරපක්කන්තස්ස භගවතො භික්ඛු ආමන්තෙසි ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛු ආයස්මතො සාරිපුත්තස්සපච්චස්සොසුං ආයස්මා සාරිපුත්තෙනා එතදවොච.

තථාගතෙන ආවුසො අරහතා සම්මාසම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙහිචි වා ලෝකස්මිං, යදිදං චතුන්නං අරියසච්චානං ආවිකම්මනා —පෙ— උත්තානීකම්මං; කතමෙසං චතුන්නං? දුක්ඛස්ස අරියසච්චස්ස, ආවිකම්මනා —පෙ— උත්තානීකම්මං; දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස ආවිකම්මනා —පෙ— උත්තානීකම්මං; දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස ආවිකම්මනා —පෙ— උත්තානීකම්මං; දුක්ඛනිරොධගාමිනිපටිපදා අරියසච්චස්ස ආවිකම්මනා —පෙ— උත්තානීකම්මං.

කතමඤ්චාවුසො දුක්ඛං අරියසච්චං? ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා දුක්ඛා, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා,

කතමාවාවුසො ජාති? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති, සඤ්ජාති, ඔක්කන්ති, අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො, ආයතනානං පටිලාභො, අය වුච්චතාවුසො ජාති.

කතමාචාවුසො ජරා? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා, ජීරණතා, ඛණ්ඩිච්චං පාලිච්චං, වලිත්තචතා, ආයුනො සංහානි, ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චති ආවුසො ජරා

කතමඤ්චාවුසො මරණං? යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති. චවනතා, භෙදො, අන්තරධානං මච්චු මරණං, කාලකිරියා, ඛන්ධානං භෙදො, කළෙබරස්ස නික්ඛෙපො ඉදං වුච්චතාවුසො මරණං.

කතමොචාවුසො සොකො? යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො' අන්තො පරිසොකො, අයං වුච්චතාවුසො සොකො.

කතමො චාවුසො පරිදෙවො? යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛ ධම්මෙන ඵුට්ඨස්ස, ආදෙවො, පරිදෙවො, ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං, පරිදෙවිතත්තං, අයං වුච්චතාවුසො පරිදෙවො.

කතමඤ්චාවුසො දුක්ඛං? යං ඛො ආවුසො කායිකං දුක්ඛං කායිකං අසාතං කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං, ඉදං වුච්චතාවුසො දුක්ඛං.

කතමඤ්චාවුසො දෙමනස්සං? යං ඛො ආවුසො චෙතසිකං දුක්ඛං අසාතං, මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං, ඉදං වුච්චතාවුසො දෙමනස්සං.

කතමොචාවුසො උපායාසො? යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො, උපායාසො, ආයාසිතත්තං, උපායාසිතත්තං, අයං වුච්චතාවුසො උපායාසො.

කතමඤ්චාවුසො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං? ජාතිධම්මානං ආවුසො සත්තානං. එවං ඉච්ඡා උපජ්ජති, අහොවත මයං න ජාතිධම්මා අස්සාම, න ච වත නො ජාති ආගච්ඡෙය්‍යාති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං,

ජරාධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උපජ්ජති, අහොවත මයං න ජරාධම්මා අස්සාම, න ච වත නො ජරා ආගච්ඡෙය්‍යාති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං

ව්‍යාධි ධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති, අහෝ වත මයං න ව්‍යාධිධම්මා අස්සාම, න ව වත නො ව්‍යාධි ආගච්ඡෙය්‍යාති, නඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං

මරණ ධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති, අහෝ වත මයං න මරණධම්මා අස්සාම නව වත නො මරණං ආගච්ඡෙය්‍යාති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං

සොක පරිදෙව දුක්ඛදෙමනස්සුපායාස ධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති, අහෝවත මයං න සොක පරිදෙව දුක්ඛදෙමනස්සුපායාසා ධම්මා අස්සාම්, නව වත නො සොක පරිදෙව දුක්ඛදෙමනස්සුපායාසා ආගච්ඡෙය්‍යුන්ති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පිඋම් පිච්ඡං නලභති තම්පි දුක්ඛං. ඉදං වුච්චතාවුසො දුක්ඛං අරියසච්චං.

කතමඤ්චාවුසො දුක්ඛසමුදයං අරියසච්චං, යා'යං තණ්හා පොනබ්භවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී. සෙය්‍යථිදං කාමතණ්හා භවතණ්හා විභවතණ්හා ඉදං වුච්චතාවුසො දුක්ඛ සමුදයං අරියසච්චං.

කතමඤ්චාවුසො දුක්ඛනිරොධං අරියසච්චං ? යො තස්සාඑව තණ්හාය අසෙසවිරාග නිරොධෝ චාගො පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ, ඉදං වුච්චතාවුසො දුඛනිරොධං අරියසච්චං.

කතමඤ්චාවුසො දුක්ඛනිරොධ ගාමිනීපටිපදා අරියසච්චං ? අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ. සෙය්‍යථිදං'

සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පෝ, සම්මාවාචා, සම්මාකම්මන්තෝ, සම්මාආජීවෝ, සම්මාවායාමෝ සම්මාසති, සම්මාසමාධි.

කතමාචාවුසො සම්මාදිට්ඨි? යං ඛො ආවුසො දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධ ගාමිනියා පටිපදාය ඤාණං, අයං වුච්චතාවුසො සම්මාදිට්ඨි

කතමොචාවුසො සම්මාසඞ්කප්පෝ! නෙක්ඛම්ම සඞ්කප්පෝ අව්‍යාපාද සඞ්කප්පෝ අවිහිංසා සඞ්කප්පෝ. අයං වුච්චතාවුසො සම්මාසඞ්කප්පෝ,

කතමාචාවුසො සම්මාවාචා! මුසාවාදා වෙරමණී පිසුණාවාචා වෙරමණී ඵරුසාවාචා වෙරමණී සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චතාවුසො සම්මාවාචා,

කතමෝ ච ආවුසෝ සම්මාකම්මන්තෝ! පාණාතිපාතා වෙරමණී අදින්නාදානා වෙරමණී කාමේසු මිච්ඡාචාරා වෙරමණී, අයං වුච්චතාවුසෝ සම්මාකම්මන්තෝ,

කතමෝ ච ආවුසෝ සම්මාආජීවෝ? ඉධ ආවුසෝ අරියසාවකෝ මිච්ඡාආජීවං පහාය සම්මාආජීවේන ජීවිතං කප්පේති, අයං වුච්චතාවුසෝ සම්මාආජීවෝ,

කතමෝ ච ආවුසෝ සම්මාවායාමෝ? ඉධ ආවුසෝ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනේති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහාණාය ඡන්දං ජනේති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනේති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යෝභාවාය වේපුල්ලාය භාවනාය පාරිපූරියා, ඡන්දං ජනේති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අයං වුච්චතාවුසෝ සම්මාවායාමෝ.

කතමා ච ආවුසෝ සම්මාසති? ඉධ ආවුසෝ භික්ඛු කායේ කායානුපස්සී විහරති, ආතාපී සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා, දෝමනස්සං, වේදනාසු වේදනානුපස්සී විහරති, ආතාපී සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං, චිත්තේ චිත්තානුපස්සී විහරති, ආතාපී සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣාදෝමනස්සං, ධම්මේසු ධම්මානුපස්සී විහරති, ආතාපී සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං, අයං වුච්චතාවුසෝ සම්මාසති,

කතමෝ ච ආවුසෝ සම්මාසමාධි? ඉධ ආවුසෝ භික්ඛු, විවිච්චේව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, විතක්ක-විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපේක්ඛකෝ ච විහරති, සතෝ ච සම්පජානෝ සුඛං ච කායේන පටිසංවේදේති, යන්තං අරියා ආචික්ඛන්ති උපේක්ඛකෝ සතිමා සුඛ විහාරී තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා, පුබ්බේව සෝමනස්ස දෝමස්සානං අත්ථංගමා, අදුක්ඛං අසුඛං

උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චතාවුසෝ සම්මාසමාධි, ඉදං වුච්චතාවුසෝ දුක්ඛනිරෝධ ගාමිනි පටිපදා අරිය සච්චං.

තථාගතෙන ආවුසෝ අරහතා සම්මාසම්බුද්ධෙන, බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං, සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලෝකස්මිං, යදිදං ඉමෙසං චතුන්නං අරිය සච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මන්ති.

ඉදමවොචායස්මා සාරිපුත්තෝ, අත්තමනා තෙ භික්ඛූ ආයස්මතෝ සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.

ධම්මචක්කප්පවත්තන සූත්‍රය නිමියි.

සිංහලානුවාදය

මෙසේ මේ සූත්‍රාන්තධර්මය මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ බරණැස ඍෂිපතනයෙහි මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි වැඩවාසය කරතසේක. එකල්හි වහාහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන්ට කථාකළ සේක. ඒ භික්ෂූහු ද එසේය පින්වතුන් වහන්ස යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ මතු ප්‍රකාශ වන කාරණය වදාළසේක.

මහණෙනි, තථාගතවූ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායයෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ලෝකයෙහි අන් කිසිවකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම්වූ ධර්මචක්‍රයක් ප්‍රවර්තනය කරන ලදී, එනම් ධර්ම මේ චතුරාර්‍ය සත්‍යයන්ගේ වෙන් වෙන් වශයෙන් දැක්වීම, දේශනා විශයෙන් ප්‍රකාශ කිරීම, පැහැදීම, කැබෑ හෝ පිහිටුවීම, විවෘත කිරීම, විභාග කොට දැක්වීම නොගැඹුරු අන්දමින් ප්‍රකට කිරීම යන මෙයට වඩා උසස් ධර්මයක් කැති නැතිව අනුත්තරවූ ධර්මචක්‍රය යි.

කවර සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ ද යත්? දුඃඛාර්‍ය්‍යසත්‍යය, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය, දුඃඛනිරෝධාර්‍ය්‍යසත්‍යය, දුඃඛනිරෝධ ගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය යන සතර ආර්‍ය්‍යසත්‍යධර්මයන්ගේ ය.

මහණෙනි තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායයෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ලෝකයෙහි අන්කිසිවකු විසින් හෝ නොපැවැත්විය හැකි යම් මේ චතුරාර්‍ය සත්‍යයන් පිළිබඳ වෙන් වෙන් කොට දැක්වීමය, ප්‍රකාශ කිරීමය, නියම කිරීමය, තැබීමය, විවෘත කිරීමය, බෙදා දැක්වීමය, නොගැඹුරු කිරීමය යන උතුම් ධර්මචක්‍රයක් දේශනා කරනලද්දේය.

මහණෙනි නුඹලා හැරියුත් මුගලන් දෙනම අසුරු කරව්, ගර්ජනය කරව්, උන්වහන්සේලා සබ්‍රහ්මචාරීන්ට අනුග්‍රහ කරන පණ්ඩිත භික්ෂූහුය. මහණෙනි ශාරිපුත්‍ර තෙම දරුවන්ට මවක් වැනිය. මෞද්ගල්‍යායන තෙම උපන් දරුවකු පොෂණය කරන කිරිමවක් වැනිය. මහණෙනි, ශාරිපුත්‍ර තෙම සෝවාන් ඵලයෙහි හික්මවයි. මෞද්ගල්‍යායන තෙම ඉතිරි මාර්ගඵලයන් සහිත වූ අර්හත්ඵලයෙහි හික්මවයි. මහණෙනි, ශාරිපුත්‍ර තෙම චතුරාර්‍ය සත්‍යයන් විස්තර කරන්නට දේශනා කරන්නට පනවන්නට පිහිටුවන්නට විවරණ කරන්නට සමර්ථ වේ. භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක. සුගත නම්වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා බුද්ධාසනයෙන් නැගිට ගඳකිළි විහාරයට වැඩිසේක

එකල්හි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේ විහාරයට වැඩමවූ කොබෝවේලාවකින් ආයුෂ්මත් භික්ෂුවරුනි යි භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු ද එසේය ආර්ය්‍යතුන්වහන්ස යි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම මෙසේ වදාළේය.

ඇවැත්නි, තථාගතවූ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායයෙහි ශ්‍රමණයකු විසින් හෝ —පෙ— අන්කිසිවකු විසින් හෝ නොපැවැත්විය හැකි අනුත්තර ධර්මචක්‍රයක් පවත්වනලද ද, එනම් යම් මේ චතුරාර්‍ය සත්‍යයන් පිළිබඳ ප්‍රකාශකිරීමය —පෙ— යන ධර්මචක්‍ර යයි.

ආර්‍ය්‍යයන්ගේ සත්‍යයවූ දුකය, දුකෙහි හේතුවය, දුක නැති කිරීමය, දුක නැති කිරීමේ මාර්ගය යන මේ චතුරාර්‍ය සත්‍ය ධර්මයන්ගේ ප්‍රකාශ කිරීම —පෙ— ලිහිල් නොවව දැක්වීමය යනුයි.

ඇවැත්නි දුඃඛාර්‍ය්‍යසත්‍යය නම් කවරේ ද? ඉපදීමත් දුකය, ජරාවත් දුකය, ව්‍යාධියත් දුකය, මරණයත් දුකය, ශෝකය, විලාපය, කායික දුකය, මානසික දෙමනස්සය, බලවත් ආයාසය

මොවුහු දුක්ඛ. කැමතිවූ ගම්දෙයක් නොලැබේ නම් හෙද දුකය, සැකෙවින් පස්වැදෑරුම් උපාදානස්කන්ධයෝ දුක් වන්නාහ.

ඇවැත්නි, උත්පත්ති නොමෝ කවරි ද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්වනිකායෙහි යම් ඉපදීමක් වේ ද, හටගැනීමක් වේ ද, බැසගැනීමක් වේ ද, විශේෂයෙන් ඉපදීමක් වේ ද, සකඳන්ගේ පහළවීමක් වේ ද, ආයතනයන්ගේ ලැබීමක් වේ ද, ඇවැත්නි මේ ඉපදීම් දුක යයි කියනු ලැබේ.

ඇවැත්නි, ජරා නොමෝ කවරි ද? ඒ ඒ සත්වයන් පිළිබඳ ඒ ඒ සත්වනිකායෙහි යම් දිරීමක් වේ ද, දිරණ ගතියක් වේ ද, දත් ඇට කැඩීමක් වේ ද, හිසකෙස් පැසීමක් වේ ද, ඇඟරුලි වැටීමක් වේ ද, ආයු හීනවීමක් වේ ද, ඉන්ද්‍රියයන්ගේ දැමිරීමක් වේ ද, මොනොමෝ ජරාදුක යයි කියනු ලැබේ.

ඇවැත්නි, මරණය කවරේ ද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්වනිකායෙන් යම් චුතවීමක් වේ ද, චුතවන බවක් වේ ද, ශරීරයාගේ බිඳීමක් වේද, අතුරුදහන් වීමක් වේ ද, මෘත්‍යු නම්වූ මරණයක් වේ ද, කාලක්‍රියාවක් වේ ද, සකඳන්ගේ බිඳීමක් වේ ද, ශරීරයාගේ බහා තැබීමක් වේ ද, ඇවැත්නි, මෙය මරණ දුක යයි කියනු ලැබේ.

ඇවැත්නි, ශොකය කවරේ ද? එක්තරා විපතකින් යුක්ත වූ එක්තරා දුකකින් වළඳනා ලද්දකුගේ යම් හැඬීමක් දෙඳ, විශේෂයෙන් හැඬීමක් වේද, හැඬීම් ආකාරයක් වේද, වෙසෙසින් හැඬීම් ආකාරයක් වේ ද, හැඬීම් ගතියක් වේ ද, වෙසෙසින් හැඬීම් ගතියක් වේ ද, ඇවැත්නි, මෙය පරිදෙව දුකයයි කියනු ලැබේ

ඇවැත්නි, ශරීරය පිළිබඳ දුක කවරේ ද? ඇවැත්නි, කය පිළිබඳ යම් දුකක් වේ ද, කය පිළිබඳ අමිහිරි ගතියක් වේ ද, අමිහිරි කොට විඳුනාවූ කායස්පර්ශයෙන් ඇතිවන දුකක් වේද ඇවැත්නි, මෙය කායික දුකය යි කියනු ලැබේ.

ඇවැත්නි දෙමනස කවරේ ද? ඇවැත්නි, සිත් හටගත් යම් අමිහිරි දුකක් වේ ද? චිත්ත ස්පර්ශයෙන් හටගත් අමිහිර වශයෙන් විඳුනාවූ දුකක් වේ ද ඇවැත්නි, මෙය දෙමනස් දුක යයි කියනු ලැබේ.

ඇවැත්නි, උපායාසය කවරේ ද? ඇවැත්නි, එක්තරා විපත් කියකිා යුක්තවූවහුගේ එක්තරා දුකකින් වළඳනාලද්දහුගේ යම් ආයාසයක් හෙවත් ශරීරයෙහි වෙහෙසක් වේ ද, බලවත් වෙහෙසක් වේ ද, කලානත ගතියක් බලහතු කලානත ගතියක් වේ ද, ඇවැත්නි, මෙය උපයාස දුක යයි කියනු ලැබේ.

'ඇවැත්නි, කැමති දෙයක් නොලැබීමේ දුක කවරේද? ඇවැත්නි, ඉපදීම් සභාවයෙහිම ඇති සත්වයන්ට මෙබඳු කැමැත්තක් උපදියි. අපි උත්පත්තිය සභාව කොට ඇත්තෝ නොවමු නම් ඉපදීම් දුක අප කරා නොපැමිණේ නම් ඉතා යහපතැයි යන සිතක් යි. මේය කැමැත්තෙන් නොලැබිය හැකි ය. මේද කැමති යමක් නොලබා නම් ඒ ඉවසාවිසාත දුක වේ.

එසේම ඇවැත්නි, ජරා දුක ඇති සත්වයන්ට අපි මහලු නොවී විනාශ කරමු නම් ජරාව අප කරා නොඑළැඹේ නම් ඉතා යහපතැයි යන කැමැත්තක් උපදියි. මේය කැමැත්තට අනුව නොලැබිය හැකිය. මේ ද කැමති යමක් නොලැබීමේ දුක වේ.

එසේම ඇවැත්නි, රෝගසභාවය ඇති ඇත්තන්ට අපි ලබන්නේ පෙළෙන්නේ නොවමු නම් රෝගදුකක් අප කරා නොපැමිණේ නම් ඉතා යහපතැයි යන කැමැත්තක් උපදියි. මේ ද කැමැත්තට අනුව නොලැබිය හැකිය. මෙය ද කැමති දෙයක් නොලැබීමේ දුක වේ.

මරණ සභාවය ඇති සත්වයන්ට අපි නොමැරී ජීවත්වමු නම් මරණය අප කරා නොපැමිණේ නම් ඉතා යහපතැයි යන සිතක් උපදියි. මේද කැමැත්ත ඉටු නොවීමේ දුක වේ.

එසේම ඇවැත්නි, ශෝකය විලාපය දුකය දෙම්නසය දුක් වෙහෙසය යන මේ සියල්ලක් සවිභාවකොට ඇති සත්වයන්ට ශෝකපරිදෙව දුක් දෙම්නස් අප කරා නොපැමිණේ නම් යහපතැයි යන කැමැත්තක් උපදියි. මෙය කැමැත්තට අනුව ලබාගිදුවිය හැකිය. මේ ද කැමති යමක් නොලැබීමේ දුකවේ.

ඇවැත්නි, සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධදුඃඛයෝ කවරහු ද?

රූපූපාදානස්කන්ධය, වේදනුපාදානස්කන්ධය, සඤ්ඤුපාදානස්කන්ධය, සංඛාරුපාදානස්කන්ධය, විඤ්ඤාණුපාදානස්කන්ධය යන මොහුයි. මොවුහු සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධ දුකඛයෝ යයි කියනු ලැබෙත්. මෙය දුඃඛාර්යසත්‍යය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුඃඛසමුදයආර්යසත්‍යය කවරේ ද?

යම්. මේ තණ්හාවක් පුනරුත්පත්තිය ඇතිකරන්නී ද, නන්දිරාගය හා සමග එක්ව සිටිනී ද, භවයෙහි ඇලීම් ඇති කරන්නී ද, ඕ තොමෝ කවරිද යත්? කාමතණ්හාවය, භවතණ්හාවය, විභව තණ්හාවය යනු යි.

ඇවැත්නි, මෙය දුකඛසමුදය සත්‍යය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුකඛ නිරොධ සත්‍යය කවරේද? ඒ තණ්හාවගේ යම් නිරවශෙෂ නොඇලීමක් හා නිරෝධයක් වේ ද, අත්හැරීමක් වේ ද, දුරලීමක් වේ ද, මිදීමක් වේ ද, ආලය අත්හැරීමක් වේ ද,

ඇවැත්නි, මෙය දුකඛනිරොධ සත්‍යය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුකඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය සත්‍යය කවරේද? මේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගය මේ වේ. එහි කවරේද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය සම්‍යක් ආජීවය. සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සමාධිය, සම්‍යක් සමාධිය යන මොහුයි.

ඇවැත්නි, සම්‍යක් දෘෂ්ටිය කවරි ද? ඇවැත්නි, දුකෙහි යම් දැනීමක් වේ ද, දුකඛ සමුදයෙහි දැනීමක් වේ ද, දුකඛ නිරොධයෙහි දැනීමක් වේ ද, දුකඛනිරොධ ගාමිනී ප්‍රතිපදාවෙහි දැනීමක් වේද,

ඇවැත්නි, මෝ නොමෝ සම්‍යක් දෘෂ්ටිය යි කියනු ලැබේ

ඇවැත්නි, සම්‍යක් සංකල්පය කවරේද? නිෂ්ක්‍රමණ සංකල්පය, අව්‍යාපාද සංකල්පය, අවිහිංසා සංකල්පය, ඇවැත්නි, මෙය සම්‍යක් සංකල්ප යයි කියනු ලැබේ.

ඇවැත්නි, සම්‍යක් වාක් නොමෝ කවරිද? බොරුවෙන් වැළකීම ය, කේලාම් කීමෙන් වැළකීම ය, රළු වචන කීමෙන් වැළකීමය හිස් කථා කීමෙන් වැළකීමය,

ඇවැත්නි, මෙය සම්‍යක්වචන යයි කියනු ලැබේ.

ඇවැත්නි, සම්‍යක් කර්මාන්තය කවරේ ද? සතුන් මැරීමෙන් වැළකීමය, සොරකම් කිරීමෙන් වැළකීමය කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමය,

ඇවැත්නි, මෙය සම්‍යක් කර්මාන්තයයි කියනු ලැබේ.

ඇවැත්නි, සම්‍යක් ආජීවය කවරේ ද?

ඇවැත්නි, මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවක තෙම වරදවූ ජීවිකාව හැර දමා නිවරදවූ ජීවිකාවෙන් දිවිපැවැත්ම කෙරේද?

ඇවැත්නි, මෙය සම්‍යගාජීවය යි කියනු ලැබේ.

ඇවැත්නි. සම්‍යක් ව්‍යායාමය කවරේද?

ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම නූපන් ලාමක අකුසල් හා ඉපදවීම පිණිස කැමැත්ත උපදවා ද, උත්සාහ කෙරේ ද වීර්‍යාරම්භ ඇති කෙරේ ද, සිතෙහි උදෙලගය ඇති කෙරේද, එහි

සිත පිහිටුවා ද, උපන් ලාමක අකුසල් දුරු කරදා පිණිස, කුපන් කුසල් ඉපදවීම පිණිස උපන් කුසල් විනාශ නොකර ගැනීම පිණිස වැඩිදියුණු කරනු පිණිස මෙත් කරනු පිණිස සිත්හි වැඩීමෙන් සම්පූර්ණ කිරීම පිණිස කැමැත්ත උපදවා ද, ව්‍යායාම කෙරේ ද වීර්‍යාරම්භ කෙරේද, සිත්හි ඔසවා තබා ගනී ද, සිත පිහිටුවා ද,

ඇවැත්නි, මේය සම්‍යක් ව්‍යායාම යයි කියනු ලැබේ

ඇවැත්නි, සම්‍යක් සමාහිත කවරිද?

ඇවැත්නි, මේ සස්නෙහි යෝගාවචර භික්ෂුතෙම් කෙලෙසුන් තවන වීර්‍යය ඇතිව කුසල ඇතිව සිහිය ඇතිව ශරීරසංඛ්‍යාත ලෝකයෙහි ලෝභය හා ක්‍රොධයත් දුරු කොට ශරීරය අනුව නුවණින් කල්පනා කර බලමින් වාසය කෙරේ ද, වේදනාවන්හි වේදනාවන් අනුව බලමින් වාසය කෙරේද, සිතෙහි සිත අනුව බලමින් වාසය කෙරේද, නීවරණාදි ධර්මයන් කෙරෙහි ධර්මය අනුව බලමින් වාසය කෙරේ ද,

ඇවැත්නි, මෝ තෙමේ සම්‍යක් සමාහි යයි කියනු ලැබේ.

ඇවැත්නි, සම්‍යක් සමාධිය කවරේ ද?

ඇවැත්නි, මේ ශාසනයෙහි යොගාවචර භික්ෂුතෙම් පඤ්ච කාමයන්ගෙන් වෙන්වම පඤ්චනීවරණ අකුසලයන්ගෙන් වෙන්ව විතකී සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් උපන්නාවූ ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යාන කුසල සිතට පැමිණ වාසය කෙරෙයි.

විතකීවිචාරයන්ගේ සන්සිඳීමෙන් තමා කෙරෙහි පැවති මනා පැහැදීම් ඇති සිත පිළිබඳ එකභාවයක් ඇති විතකීයක් නැති විචාරයක් නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි.

ප්‍රීතියෙහි ද නොඇලීමෙන් උපෙක්ෂකව සිහිවත්ව මැදහත්ව වාසය කෙරෙයි. සිහි ඇතිව නුවණ ඇතිව, නාමිකයින් ධ්‍යාන සැපය විඳියි. යම්බදු පුද්ගලයකු ගැන ආර්‍යයෝ සිහි ඇත්තෙක, ධ්‍යාන සැප විහරන ඇත්තෙකැ යි කියත් ද, ඒ තුන්වෙනි ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි.

කායික සැපය දුරුකිරීමෙන් හා කායික දුකඛය දුරුකිරීමෙන් පළමුකොටම සිත පිළිබඳ වූ සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිවී යාමෙන් දුකක් නැති සැපයක් නැති මධ්‍යස්ථභාවයෙන් වූ සිහි පිරිසිදු බැවි ඇති චතුර්ථධ්‍යාන කුසලසිතට පැමිණ වාසය කෙරෙයි.

ඇවැත්නි මෙය සම්‍යක්සමාධි යයි කියනු ලැබේ.

ඇවැත්නි, මෙය දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය සත්‍යය යයි කියනු ලැබේ.

ඇවැත්නි, තථාගතවූ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායයෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ලෝකයෙහි අන් කිසිවකු විසින් හෝ නොපැවැත්විය හැකි මේ චතුරාර්‍ය සත්‍යයන් දැක්වීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, විස්තර කිරීමය, බෙදීමය, නොගැඹුරු කිරීමය යන මේ උතුම් ධර්මචක්‍රය පවත්වන ලද්දේය.

ආයුෂ්මත් වූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ ධර්මදේශනාව වදාළසේක. සතුටු වූ ඒ භික්ෂූන්වහන්සේලා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ දේශනාව සතුරින් පිළිගත්හ.

සත්‍යවිභඞ්ග සූත්‍රයෙහි සිංහලානුවාදය නිමි.

දහම් විසතර

අප භාග්‍යවතුන්වහන්සේ බුදු වී පළමුකොට ම බරණැස මිගදාය නම්වූ ඉසිපතනයෙහි යම් ධර්මචක්‍රයක් පවත්වනලද නම් එය සැකෙවින් වදාළ දේශනාවකි. එහි චතුරාර්‍ය සත්‍යය ත්‍රිපරිවෘත්ත ද්වාදශාකාර වශයෙන් හා ආර්‍යාෂ්ටාංගිකමාර්ගය මාත්‍රකා වශයෙනුත් වදාළහ.

ඒ සංක්ෂිප්ත දේශනාව ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ලවා විස්තර කරවනු කැමතිවූ තථාගතයන්වහන්සේ භික්ෂූන්ව අඩතෙරවදුරා අග්‍රශ්‍රාවක මෙතැමියන්ගේ ගුණ කියා උන්වහන්සේලාව අසුරුකරන්නට අවවාද කොට චතුරාර්‍යසත්‍යය විස්තර කොට කීමෙහි ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ ඇති විශෂ සමර්ථභාවය දක්වා ගදකළියට වැඩිසේක.

මහණෙනි, කුඹලා සැරියුත් මුගලන් මෙතෙම අසුරු කරවි. ඒ දෙනම ඤාණවන්තයහ. භික්ෂූන්ව සංග්‍රහ කරන්නෝය. ශාරිපුත්‍ර තෙම වැදූ මව හා සමානය. මෞද්ගල්‍යායන තෙම කිරි මව හා සමාන යයි වදළහ.

යම්සේ මැණියෝ තමකුස කොත් දරුවා කෙරෙහි මෛත්‍රී ඇත්තා කරුණාවෙන් ද තවමසක් හෝ දසමසක් ලුණු ඇඹුල් පවා අත්හැර කමින් දුකසේ රැක සුදුසු කල්හි ප්‍රසව කෙරෙත් ද, කිරිමැණියෝ එකාන්පවත් කිරි මෙඩරු ආදිය කවමින්

පොවමින් පොෂණය කෙරෙත් ද, මෙසේ මව හා සිරිමවත් යන සදෙදෙනාගේ කරුණාගෙන් හා අනුග්‍රහයෙන් ද වැඩෙන දරුවා දිසුණුව සැපයේ වාසය කෙරෙයි.

මෙපරිද්දෙන් ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද තමන් වෙත පැවිදිවූ හෝ අනුන් වෙත හෝ පැවිදිවූවන්ට ආමිෂ සංග්‍රහයෙන් හා ධර්මසංග්‍රහයෙන් ද සංග්‍රහ කෙරෙමින් ශීලනුන්ට සංග්‍රහ කෙරෙමින් හා උපස්ථාන කෙරෙමින් ද ඔවුන් සමථයන්හි පිහිටුවා අවවාද දෙමින් සෝවාන් ඵලයෙහි පිහිටුවන්නේක. මෙසේ සංග්‍රහ කොට සෝවාන්ඵලය ලැබූ පසු සතර අපායයෙන් මිදුණුවම සලකා දැන් ඔවුනට මතු තුන් මාඝී තුන්ඵලයන් සඳහා වැඩ කරගත හැකි යයි ඔවුන් කෙරෙහි අපේක්ෂා රහිතව අනිකුදු කවක භික්ෂූන්ට අවවාද කරන්ට පවන් ගතිකි.

ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ තමන් වෙත හෝ අනුන් වෙත හෝ පැවිදිවූ කුලපුත්‍රයන්ට එසේම සංග්‍රහ කොට ඔවුන් කර්මස්ථානයන්හි හොඳවා උත්තේජිතවූ අතීත් ඵලාවබෝධය දක්වා සෙසු තුන්මාඝී තුන් ඵලයන්හි දු හික්ම වන්නාහ.

එහෙයින් මේ සූත්‍රයෙහි

සෙය්‍යථාපි භික්ඛවෙ ජණතති එවං සාරිපුත්තෙනා, සෙය්‍යථාපි ජාතස්ස ආපාදෙනා එවං මොග්ගල්ලානෙනා, සාරිපුත්තතා භික්ඛවෙසොතාපත්තිඵලෙ විනෙති, මොග්ගල්ලානෙනා උත්තමත්තෙ විනෙති යි වදළහ.

සවවවිහඩග සූත්‍රයෙහි දහම් විස්තරය නිමි

චතුභාණවාර පාළිය හා එහි සිංහලානුවාද දහම් විස්තර

සහිත

සිංහල පිරිත් පොත සමාප්තයි.

උපග්‍රන්ථය

බණ පිරින් කතිකාවතෙහි

සඳහන්

බණ පිරිත් විධිය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස

එගහූනමාසෙ කාළපක්ඛ එකාදසිදිවසෙ සබ්බෙ භික්ඛූ නායකාදයෝ රාජගෙහෙ සන්නිපතන්ති, සබ්බෙ අම්බවාදයෝ මඤ්චං වා මඤ්චපීඨං වා ඨපෙත්වා උදකකුම්භං වා මඞ්ගලසුත්තං වා රක්ඛන්තු පරිභොගං වා මඤ්චපීඨෙ ඨපෙන්ති. සබ්බෙ භික්ඛූ අඤ්ජලිමපණාමෙත්වා ධම්මං භණන්ති—

අවිජ්ජා පච්චයා—අවිජ්ජායඤ්ඤෙව— අනෙකජාති— ඉතිපි සෝ භගවා — සම්මාසම්බුද්ධෝ — සුපටිපන්නෝ — බාහුංසහස්ස — භවතු සබ්බමඟලං— නක්ඛත්ත යක්ඛ භූතානං; යාව තතියවාරං;—

නිට්ඨිතං—තුරියං පවත්තෙන්ති;

පුන භික්ඛූ සුත්තං ජපෙන්තා තාලවණ්ටං ගහෙත්වා පරිත්තං භණන්ති; කරණීයමෙත්තසුත්තං— යංකිඤ්චි විත්තං, යාව ඛිණං පුරාණං—යඤ්ඤනිමිත්තං—දුක්ඛූපසන්තා ච—සබ්බෙ බුද්ධා—

නිට්ඨිතං—තුරියං පවත්තෙන්ති;

එකෝ නායකෝ පරිත්තසුත්තං ගහෙත්වා මඤ්චං අනුපරියායති, එකෝ නායකෝ උදකභාජනං ගහෙත්වා අන්තෝ රාජගහෙ අභිහරති—

පුනදිවසෙ පච්චූසකාලෙ භික්ඛූ රාජගෙහෙ සන්නිපතන්ති, එකෝ අම්බවෝ පූජාසක්කාරං කත්වා විපත්තිපටිබාහාය සබ්බ සම්පත්තිසිද්ධියා— සබ්බභය—දුක්ඛ—රොගවිනාසාය පරිත්තං බ්‍රූථ මඟලන්ති—යාව තතියවාරං ආරාධනං කරොති

දෙ භික්ඛූ පරිත්තං භණන්තා පඨමක භාණවාරෙ— සරණ-ගමනං—දසසීලං— සාමණෙර පඤ්හං— චත්තිංසාකාරං— පච්ච-වෙක්ඛණා—දසධම්මසුත්තං නිධාපෙන්ති;

සබෙබ භික්ඛූ පරිත්තං භණන්තා මංගලසුත්තං—රතනසුත්තං කරණීයමෙත්තසුත්තං නිට්ඨාපෙත්වා—මහාසාරුණිකෝ—ජයනෙත්තා සක්කත්වා— සංකිංවිරහතං—තත්ථ මෙ—සබ්බිතියෝ - භවතු සබ්බ මංගලං— නක්ඛත්තයක්ඛභූතානං — යාව තතියවාරං නිට්ඨාපෙත්වා ආරාමං ගච්ඡන්ති— තූරියං පවත්තෙන්ති;

